ලෙනින්

තෝරාගත් කෘති

වෙළුම් දෙළහ

*

වෙළුම

11

තරුණ සංගම්වලට භාර කර්තව්‍යයන්
ද්‍රව්‍ය බද්ද
තැටිගත කරන ලද කථා

ප්‍රගති ප්‍රකාශක මන්දිරය

ලෙනින් * තෝරාගත් කෘති 11

වී. අයි. ලෙනින්ගේ තෝරාගත් කෘති 12 වැනි වෙළුමෙහි
පහත දැක්වෙන කෘති හා වෙනත් කෘතිද පළ වේ:
"ඔක්තෝබර් විප්ලවයේ හතරවැනි සංවත්සරය",
"සටන්කාමී ද්‍රව්‍යවාදයේ වැදගත්කම",
වී. අයි. ලෙනින්ගේ අවසාන ලියුම් සහ ලිපි

https://liberationbase.wordpress.com

සකල දේශවාසී නිර්ධනයිනි, එක්වව්!

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

LIBERATIONBASE

සූචිකරණ දත්ත

කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 11
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 304
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 11
කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
පිටු ගණන: 304
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

ලෙනින්

තෝරාගත් කෘති
වෙළුම් දොළහ

✻

වෙළුම
11

මොස්කව්
ප්‍රගති ප්‍රකාශක මන්දිරය
1981

අනුවාදය — උ. මු. අබයරත්න

В. И. ЛЕНИН
ИЗБРАННЫЕ ПРОИЗВЕДЕНИЯ В 12 ТОМАХ
ТОМ 11
На языке сингхала

© සිංහල අනුවාදය, ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව් 1981

සෝවියට් සංගමයේ මුද්‍රණය කරන ලදී

Л $\frac{10102—054}{014(01)—81}$ 865—81 0101020000

LIBERATIONBASE

පටුන

කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනය සඳහා ප්‍රවාද . . . 7
1. ජාතික සහ යටත් විජිත ප්‍රශ්න ගැන මූලික කෙටුම්පත් ප්‍රවාද . . . 7
2. ගොවිජන ප්‍රශ්නය ගැන ප්‍රාථමික කෙටුම්පත් ප්‍රවාද . . . 15
කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනය. 1920 ජූලි 19–අගෝස්තු 7 . . . 29
1. ජාත්‍යන්තර තත්ත්වය සහ කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ මූලික කර්තව්‍යයන් ගැන වාර්තාව. ජූලි 19 . . . 29
2. ජාතික සහ යටත් විජිත ප්‍රශ්න පිළිබඳ කොමිසමේ වාර්තාව. ජූලි 26 . . . 50
තරුණ සංගම්වලට භාර කර්තව්‍යයන් (රුසියානු තරුණ කොමියුනිස්ට් සංගමයේ තුන්වැනි සමස්ත රුසියා සම්මේලනයේදී 1920 ඔක්තෝබර් 2 දින කළ කථාව) . . . 57
නිර්ධන පංති සංස්කෘතිය ගැන. . . . 77
මහජන අධ්‍යාපනය පිළිබඳ ගුබෙර්නියා සහ උයෙස්ද් දෙපාර්තමේන්තුවල දේශපාලන අධ්‍යාපන ආයතනවල සමස්ත රුසියා සාකච්ඡා සභාවට කළ කථාව. 1920 නොවැම්බර් 3 . . . 80
“වෘත්තීය සමිතිවල කර්තව්‍යයන් සහ ඒවා ඉටු කරන විධි ක්‍රම” ගැන කෙටුම්පත් යෝජනාව . . . 92
අටවැනි සමස්ත රුසියා සෝවියට් සභාවල සම්මේලනය. 1920 දෙසැම්බර් 22-29 . . . 94
1. දේශීය සහ විදේශීය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ සහ මහජන කොමිසාර් මණ්ඩලයේ වාර්තාව. දෙසැම්බර් 22 . . . 94
2. විද්‍යුතනකරණය පිළිබඳ වාර්තාව ගැන (අටවැනි සෝවියට් සභා සම්මේලනයේ) යෝජනා කෙටුම්පත . . . 129

https://liberationbase.wordpress.com

වෘත්තීය සමිති, වර්තමාන තත්ත්වය සහ ට්‍රොට්ස්කි හා බුහාරින් සහෝදරවරුන්ගේ වැරදි ගැන නැවත වරක් 131
පක්ෂයට කාණ්ඩවාදී ප්‍රකාශයන් කිරීමේ අනතුර 132
විධිමාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදය සහ විප්ලවවාදී අවශ්‍යතාවය . . . 135
වෘත්තීය සමිති ව්‍යාපාරයේ භේදවීම් නිසා ඇති වන දේශපාලනමය අනතුර 136
ප්‍රතිපත්ති පිළිබඳ අසමථයන් 143
දේශපාලනය සහ ආර්ථිකය. දයලෙක්තික ක්‍රමය සහ සාරසංග්‍රහවාදය 146
දයලෙක්තික ක්‍රමය සහ සාරසංග්‍රහවාදය. "පාසැල" සහ "යන්ත්‍රය" 155
අවසානය 166
ඒකාබද්ධ ආර්ථික සැලැස්ම 176
රු. කො. (බො.) ප. දසවැනි සම්මේලනය. 1921 මාර්තු 8-16 . . 186
1. සම්මේලනය ආරම්භ කිරීමේ කථාව. මාර්තු 8 186
2. අතිරික්ත ධාන්‍ය අත්පත් කර ගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්ද ආදේශ කිරීම ගැන වාර්තාව. මාර්තු 15 188
3. පක්ෂ සමගිය ගැන රු. කො. ප. දහවැනි සම්මේලනයේ ප්‍රාථමික කෙටුම්පත් යෝජනාව 206
4. අපගේ පක්ෂය තුළ දක්නට ලැබෙන සම්මේලවාදී සහ අරාජිකවාදී අපගමනය ගැන රු. කො. ප. දහවැනි සම්මේලනයේ ප්‍රාථමික කෙටුම්පත් යෝජනාව . . . 210
ද්‍රව්‍ය බද්ද (නව ප්‍රතිපත්තියෙහි වැදගත්කම සහ එයට අදාළ කොන්දේසි) 215
හැඳින්වීමක් වෙනුවට 215
රුසියාවේ වර්තමාන ආර්ථිකය 216
ද්‍රව්‍ය බද්ද, වෙළඳාම් කිරීමේ නිදහස සහ අනුග්‍රහයන් . . 228
දේශපාලන සම්පිණ්ඩනය සහ නිගමන 247
අවසානය 255
තැටිගත කරන ලද කථා. 1921 අප්‍රේල් 25 257
1. පාක්ෂික නොවන අය හා සෝවියට් බලය 257
2. ද්‍රව්‍ය බද්ද හා අතිරික්ත ධාන්‍ය නිදහස් ලෙස හුවමාරු කිරීම 258
රු. කො. (බො.) ප. සමස්ත රුසියා දසවැනි සාකච්ඡා සභාව අවසන් කරමින් කළ කථාව. මැයි 28 260
සංස්කාරකගේ සටහන් 262
නාමාවලිය 286

කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනය සඳහා ප්‍රවාද

ජාතික සහ යටත් විජිත ප්‍රශ්න ගැන මූලික කෙටුම්පත් ප්‍රවාද

(කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනය සඳහා)

1

ජාතික සහ යටත් විජිත ප්‍රශ්න පිළිබඳ පහත දැක්වෙන කෙටුම්පත් ප්‍රවාද කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනයේදී සාකච්ඡා කිරීම සඳහා ඉදිරිපත් කරන මට, විශේෂයෙන්ම පහත සඳහන් කරුණු ගැන තම අදහස්, සංශෝධන, එකතු කිරීම් සහ නියත ස්වභාවයේ විවේචන, ඉතාමත් සංක්ෂිප්ත ආකාරයෙන් (පිටු දෙකකට හෝ තුනකට වැඩි නොවන ලෙස) ලැබෙන්නට සලස්වන සේ සියලුම සහෝදරවරුන්ගෙන්, විශේෂයෙන්ම, මෙම ඉතාමත් සංකීර්ණ ප්‍රශ්න අතුරෙන් කිසියම් එකක් හෝ ගැන නියත තොරතුරු දන්නා සහෝදරවරුන්ගෙන් ඉල්ලමි:

ඔස්ත්‍රියානු අත්දැකීම්.
පෝලන්ත-යුදෙව් සහ උක්‍රේනියානු අත්දැකීම්.
ඇල්සාස්-ලොරේන් සහ බෙල්ජියම.
අයර්ලන්තය.
ඩෙන්මාර්ක්-ජර්මන්, ඉතාලි-ප්‍රංශ සහ ඉතාලි-ස්ලාව් සම්බන්ධකම්.
බෝල්කන් අත්දැකීම්.
පෙරදිග ජනතාවන්.
සමස්ත ඉස්ලාම්වාදයට[1] විරුද්ධ අරගලය.
කොකේසියාවේ සම්බන්ධකම්.
බෂ්කීර් සහ ටාටර් සමූහාණ්ඩු.
කිර්ගීසියාව.
තුර්කිස්තානය, එහි අත්දැකීම්.
ඇමෙරිකාවේ නීග්‍රෝවරු යටත් විජිත.
චීනය — කොරියාව — ජපානය.

1920 ජූනි 5. එන්. ලෙනින්.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

1. සමානාත්මතාවය පිළිබඳ සාමාන්‍ය ප්‍රශ්නය සහ විශේෂයෙන්ම ජාතීන් අතර සමානාත්මතාවය පිළිබඳ ප්‍රශ්නය, වියුක්ත ලෙස සහ විධිමාත්‍ර ලෙස ඉදිරිපත් කිරීම ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වභාවයටම ආවේණික වූවකි. පුද්ගලයන් අතර පොදු සමානත්වය නැමති කඩතුරාව උපයෝගි කොට ගන්නා ධනපති ප්‍රජාතන්ත්‍රවාදය, දේපළ හිමියා සහ නිර්ධනයා අතරත්, සූරාකන්නා සහ සූරාකනු ලබන්නා අතරත්, විධිමාත්‍ර හා නීතිමය සමානාත්මතාවය ප්‍රකාශයට පත් කරමින්, එමගින් පීඩිත පංති ජනතාව සම්පූර්ණයෙන්ම රවටන්නේය. සියලුම මිනිසුන් සෑම ආකාරයෙන්ම සමානය යන කරුණ ඉදිරිපත් කරන ධනපති පංතිය, වෙළඳ භාණ්ඩ නිෂ්පාදන සම්බන්ධකම්වල පරාවර්තනයක් වන සමානාත්මතාවය පිළිබඳ අදහස, පංති නැතිකිරීමට විරුද්ධව කරන අරගලයේ ආයුධයක් බවට පරිවර්තනය කර ගනියි. සමානාත්මතාවය සඳහා වූ ඉල්ලීමේ නියම අර්ථය ඇත්තේ, එය පංති නැති කිරීමක් සඳහා ඉල්ලීමක් වීම තුළය.

2. ධනපති පංති වියගස ඉවත් කර දැමීමට කරන නිර්ධන පංති අරගලයට සම්පූර්ණයෙන්ම කැපවූ ප්‍රමුඛයා වන කොමියුනිස්ට් පක්ෂය ධනපති ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව සටන් කිරීමේ සහ එහි ව්‍යාජත්වය හා කුහකත්වය හෙළිදරව් කිරීමේ තම මූලික කර්තව්‍යය අනුව යා යුතු අතර, ජාතික ප්‍රශ්නයෙහිදී වුවද, එය පදනම් විය යුත්තේ වියුක්ත හා විධිමාත්‍ර ප්‍රතිපත්ති මත නොවේ. එය ප්‍රථමයෙන්ම පදනම් විය යුත්තේ නිශ්චිත ඓතිහාසික තත්වය හා විශේෂයෙන්ම ආර්ථික කොන්දේසි පිළිබඳ නිවැරදි අගය කිරීමක් මතය. දෙවැනිව, පීඩිත පංතිවල, වැඩ කරන සහ සූරාකනු ලබන ජනතාවගේ අවශ්‍යතාවයන්ද, පාලක පංතිවල අවශ්‍යතාවයන් පිළිබිඹු කරන ජාතික අවශ්‍යතාවයන් පිළිබඳ පොදු සංකල්පයද, යන දෙක අතර වෙනස පැහැදිලිව තේරුම් ගැනීම මතය. තුන්වැනිව, මූල්‍ය ප්‍රාග්ධනයේ සහ අධිරාජ්‍යවාදයේ යුගයේ ස්වභාව ලක්ෂණයක් වන වඩාත්ම ධනවත් සහ දියුණු රටවල් ඉතාමත් ස්වල්පයක් විසින් ලෝකයේ ජනගහනයෙන් අති බහුතරය යටත් විජිත සහ මූල්‍යමය වශයෙන් වහල් කර ගනු ලැබීම වසං කරන ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී බොරුවලට පිළිතුරු දීම සඳහා, පීඩිත ගැති සහ යටත් ජාතීන්ද, පීඩක, සූරාකන සහ ස්වෛරී ජාතීන්ද අතර වෙනස පැහැදිලි ලෙස තේරුම් ගැනීම මතය.

3. කීර්තිමත් ''බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රටවල'' වර්සයිල්ස් ගිවිසුම[2], ජර්මන් යුන්කර්වරුන්ගේසහ කයිසර්ගේ බ්‍රෙස්ට්-ලිතොව්ස්ක් ගිවිසුමට[4] ත් වඩා විෂම ලෙස දුර්වල ජාතීන්ට විරුද්ධව ගැසූ මිලේච්ඡ හා දුෂ්ඨ පහරක් බව හෙළිදරව් කළ 1914-1918 අධිරාජ්‍යවාදී යුද්ධය, එමගින් ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී වදන් මාලාවල ව්‍යාජ භාවය මුළු ලෝකයේ සියලුම ජාතීන්ට සහ පීඩිත පංතිවලට ඉතාමත් පැහැදිලි ලෙස පෙන්නුම් කළේය. ජාතීන්-

ගේ සංගමයෙන්[5] සහ එන්ටෙන්ට් මිත්‍ර ගිවිසුමේ[6] මුළු පශ්චාත් යුද්ධ ප්‍රතිපත්තියෙන්ද මෙම සත්‍යය පැහැදිලි ලෙස හා ඒකාන්ත ලෙස පෙනී යන්නේය. එනිසා දියුණු රටවල නිර්ධන පංතියේත්, යටත් විජිත රටවල සහ අධිරාජ්‍ය ගැති රටවල වැඩ කරන පොදු ජනතාවගේත් යන දෙකොටසෙහිම විප්ලවීය අරගලය සෑම තැනෙකදීම උත්සන්න වන්නේය. ධනපති ක්‍රමය යටතේ ජාතීන්ට සාමයෙන් සහ සමානාත්මතාවයෙන් පසුවිය හැකිය යන සුළු ධනේශ්වර-ජාතිකවාදී මායාමත බිඳ වැටීම එයින් ඉක්මන් වන්නේය.

4. ඉඩම් හිමියන් හා ධනපතියන් බලයෙන් පහ කිරීම පිණිස ඒකාබද්ධ විප්ලවීය අරගලයක් කරනු සඳහා සියලුම ජාතීන්ගේ සහ රටවල නිර්ධන පංතිකයින්ගේ සහ වැඩකරන ජනතාවගේ සමීප සමගියක් ඇති කිරීම මත කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ජාතික සහ යටත් විජිත ප්‍රතිපත්තිය පිහිටා තිබිය යුතුය යන්න මෙම මූලික සාධකය අනුව බැස ගත හැකි නිගමනය වන්නේය. ධනපති ක්‍රමය පරදවා ජයග්‍රහණය ලැබීම සහතික කළ හැක්කේ එවිට පමණකි. එසේ නොවුවහොත් ජාතික පීඩනය හා අසමානතාවය කිසිසේත් නැති කළ නොහේ.

5. දැන් පවතින ලෝක දේශපාලන තත්ත්වය විසින් නිර්ධන පංති ආඥාදායකත්වය යන මාතෘකාව අද දවසේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබේ. ලෝක දේශපාලන සිදුවීම් අද නො වැළැක්විය හැකි ලෙසම තනි එල්ලයක් අනුව සංකේන්ද්‍රණය වී තිබේ. ඒවා සංකේන්ද්‍රණය වී තිබෙන්නේ සෝවියට් රුසියානු ජනරජයට විරුද්ධව ලෝක ධනපති පංතිය ගෙනයන අරගලය වටාය. මෙහිදී, එක් අතකින් සියලුම රටවල දියුණු කම්කරුවන්ගේ සෝවියට් ව්‍යාපාරයන්ද, අනිත් අතින්, තමන්ගේ එකම ගැළවීම රඳා පවත්නේ ලෝක අධිරාජ්‍යවාදී ක්‍රමය පරදවා සෝවියට් ක්‍රමය ලබන ජයග්‍රහණය තුළය යන්න අමිහිරි අත්දැකීම් මගින් උගෙන ගන්නා යටත් විජිත රටවල හා පීඩිත ජාතීන් අතර වන සියලුම ජාතික විමුක්ති ව්‍යාපාරයන්ද අනිවාරණීය වශයෙන් සෝවියට් රුසියානු ජනරජය වටා එක්ව සිටිති.

6. ඒ අනුව බලන කල, විවිධ ජාතීන්ගේ වැඩ කරන ජනතාවන් අතර වඩාත් සමීප සමගියක් තිබීමේ අවශ්‍යතාවය පිළිගැනීමට හෝ ප්‍රකාශයට පත් කිරීමට දැන් සීමාවී සිටීම යමෙකුට කළ හැකි දෙයක් නොවේ. සියලුම ජාතික සහ යටත් විජිත විමුක්ති ව්‍යාපාර සෝවියට් රුසියාව සමග සමීපතම සන්ධානයකට පත් කරන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම අවශ්‍ය වේ. මෙම සන්ධානයේ ආකෘතිය තීරණය කළ යුත්තේ එක් එක් රටෙහි නිර්ධන පංතිය කොමියුනිස්ට් ව්‍යාපාරය සංවර්ධනය වී ඇති මට්ටම අනුව හෝ, නොදියුණු රටවල, නැතහොත්, නොදියුණු ජාතීන්ගේ කම්කරුවන්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගේ සහ ගෞවී ජනතාවගේ ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විමුක්ති ව්‍යාපාරයේ සංවර්ධන මට්ටම අනුවය.

7. ජාතීන්ගේ ඒකාබද්ධ සංගමයක් යනු, විවිධ ජාතීන්ගේ වැඩකරන ජනතාව අතර සම්පූර්ණ සමගිය ඇති කිරීම අරමුණු කරගත් පරිවර්තනීය ආකෘතියකි. ඒකාබද්ධ සංගමයක් ඇති කිරීම පිළිබඳ ශක්‍යතාවය, රු. ස. ඒ. සෝ. ස. සහ අනෙකුත් (ඉහතදී හංගේරියානු[7], පින්ලන්ත[8] සහ ලත්වියන්[9] හා දැනට අසර්බයිජාන් සහ උක්‍රේනියානු) සෝවියට් සමූහාණ්ඩු අතර සම්බන්ධකම්වලින්ද, ඉහතදී රාජ්‍ය තත්ත්වය හා ස්වතන්ත්‍රය භුක්ති නොවින්ද (නිදර්ශන වශයෙන් රු. ස. ඒ. සෝ. ස. ට ඇතුළත් පිළිවෙළින් 1919 හා 1920 පිහිටුවන ලද බෂ්කීර් සහ ටාටර් ස්වතන්ත්‍ර සමූහාණ්ඩු) ජාතීන්ට අදාළව රු. ස. ඒ. ස. තුළ බල පවත්වන සම්බන්ධකම්වලින්ද පෙනී ගොස් තිබේ.

8. මේ හා සම්බන්ධයෙන් වූ කල, සෝවියට් ක්‍රමය හා සෝවියට් ව්‍යාපාරය පදනම් කර ගෙන පැන නගින මෙම නව ඒකාබද්ධ සංගම් තවදුරටත් සංවර්ධනය කිරීම සහ පළපුරුද්දෙන් අත්හදා බැලීමත් කොමියුනිස්ට් ජාත්‍යන්තරයට භාර කර්තව්‍යය යි. ජාතීන්ගේ ඒකාබද්ධ සංගමය වූ කලී සම්පූර්ණ සමගිය කරා පරිවර්තනය වීම අරමුණ කොටගත් ආකෘතියක් බව පිළිගැනීමේදී, එන්න එන්නම වර්ධනය වන සමීප පෙඩරල් සමගියක් ඇති කිරීමට ප්‍රයත්න දැරිය යුතු වේ. එසේ කරන කල, ප්‍රථමයෙන්ම, යුද්ධමය ස්ථාවරය අනුව අපරිමිත තරම් වැඩි ශක්තියක් සහිත බව පෙනෙන අධිරාජ්‍යවාදී ලෝක බලවතුන් සමස්තය විසින් වට කරනු ලැබ සිටින සෝවියට් සමූහාණ්ඩුවල සමීපතම සන්ධානය නොමැතිව ඒවාට දිගටම පැවතිය නොහැකි බවද; දෙවැනිව, සෝවියට් සමූහාණ්ඩු අතර සමීප ආර්ථික සන්ධානයක් අවශ්‍ය බව හා ඒ නොමැතිව, අධිරාජ්‍යවාදය විසින් විනාශ කරන ලද නිෂ්පාදනීය බලවේගයන් ප්‍රකෘතිමත් කිරීම සහ වැඩකරන ජනතාවගේ ශුභ සිද්ධිය සහතික කළ නොහැකි බවද; තුන්වැනිව, අංග පූර්ණ සමස්තයක් වශයෙන් සහ පොදු සැලැස්මක් අනුව සියලුම ජාතීන්ගේ නිර්ධන පංතිය විසින් හසුරුවනු ලබන ඒකීය ලෝක ආර්ථිකයක් නිර්මාණය වෙත ඉලක්ක වුණු ප්‍රවණතාවයක් තිබෙන බවද සිත්හි දරාගෙන කටයුතු කිරීම අවශ්‍ය වේ. ධනපති ක්‍රමය යටතේ, මෙම ප්‍රවණතාවය දැනටම ඉතාමත් පැහැදිලි ලෙස මතු වී තිබෙන අතර, සමාජවාදය යටතේ එය තවදුරටත් වර්ධනය වී අංග සම්පූර්ණ වීම ඒකාන්ත වශයෙන් සිදු වනු ඇත.

9. තමන් ධනපති-ප්‍රජාතන්ත්‍රවාදීන් බව එක එල්ලේම පිළිගන්නා සහ (දෙවැනි ජාත්‍යන්තරයේ සමාජවාදීන් මෙන්) තමන් සමාජවාදීන් බව කියා ගන්නා යන දෙවර්ගයේම ධනපති-ප්‍රජාතන්ත්‍රවාදීන් ජාතීන්ගේ

සමානාත්මතාවය පිළිගැනීමේදී කිසිත් නොකරන, විධිමාත්‍ර ප්‍රකාශන කිරීමට පමණක් හු දෙක්ම සීමාවන නමුත්, වගකීමකට නොබැඳෙන ආකාරයට ඔවුන් ඊට සීමාවන නමුත්, රාජ්‍ය අභ්‍යන්තර සම්බන්ධකම් පිළිබඳ ක්ෂේත්‍රයේදී කොමියුනිස්ට් ජාත්‍යන්තරය අනුගමනය කරන ප්‍රතිපත්තිය එසේ සීමා කළ හැකි නොවේ.

ධනපති රටවල ''ප්‍රජාතන්ත්‍රවාදී'' ව්‍යවස්ථාවන් තිබුණේ වී නමුත්, එරටවල් සෑම එකකම ජාතීන්ගේ සමානාත්මතාවය හා ජාතික සුළු ජන කොටස්වලට සහතික කරදුන් අයිතිවාසිකම් නිරතුරුව උල්ලංඝනය කරනු දක්නට ලැබෙන හෙයින්, කොමියුනිස්ට් පක්ෂ පාර්ලිමේන්තුව තුළ හා ඉන් පිටත යන දෙ ආකාරයෙන්ම ගෙන යන ඒවායේ ප්‍රචාර සහ උද්ඝෝෂණ මගින් ඵ ගැන නිරතුරුවම හෙළිදරව් කළ යුතු වන්නේය. එපමණක් නොව, ප්‍රථමයෙන්, අවශ්‍ය වන්නේ, ධනපති පංතියට විරුද්ධව කරන සටනේදී මුලින්ම නිර්ධන පංති ජනතාව සහ ඊළඟට වැඩකරන මුළු මහත් පොදු ජනතාවමද එක්සත් කිරීම තුළින්, ජාතීන් අතර සැබෑ සමානාත්මතාවය ඇතිවීම සහතික කිරීමෙහි සමත් වන්නේ සෝවියට් ක්‍රමය පමණක් බව නිරතුරුවම පැහැදිලි කර දීමය. දෙවැනිව, අවශ්‍ය වන්නේ අධිරාජ්‍ය ගැති රටවල වරප්‍රසාද අහිමි ජාතීන්ගේ (නිදසුන් වශයෙන්, අයර්ලන්තය, ඇමෙරිකානු නීග්‍රෝවරු ආදිය) සහ යටත් විජිතවල විප්ලවීය ව්‍යාපාරවලට එක එල්ලේම කොමියුනිස්ට් පක්ෂවල ආධාර දීමය.

විශේෂයෙන්ම වැදගත් වන ඉහත කී දෙවැනි කොන්දේසිය ඉටු නොවන කල්හි, ගැති ජාතීන්ට හා යටත් විජිතවලට කරන පීඩනයට විරුද්ධව අරගල කිරීමත්, එමෙන්ම, එරටවලට හිමි ඉවත් වීමේ අයිතිය පිළිගැනීමත් යනු ව්‍යාජ සංඥ පුවරුවක් පමණකි.දෙවැනි ජාත්‍යන්තරයේ පක්ෂවලින්ද මේ බව පෙනී ගොස් තිබේ.

10. ජාත්‍යන්තරවාදය වචනමාත්‍ර වශයෙන් පමණක් පිළිගැනීම සහ ප්‍රචාරක, උද්ඝෝෂණ සහ ප්‍රායෝගික වැඩ කටයුතුවලදී ඒ වෙනුවට සුළු ධනේශ්වර ජාතිකවාදය සහ සමාදානවාදය ක්‍රියාවෙන් ආදේශ කිරීම,දෙවැනි ජාත්‍යන්තරයේ පක්ෂ අතර පමණක් නොව, එයින් ඉවත් වුණු පක්ෂ අතරද, දැන් තමන් කොමියුනිස්ට් යයි කියා ගන්නා පක්ෂ අතර වුවද, දක්නට ලැබෙන ඉතා සුලබ ලක්ෂණයකි. නිර්ධන පංති ආඥාදායකත්වය ජාතික ආඥාදායකත්වයක (එක රටක පවතින හා ජාත්‍යන්තර දේශපාලනය තීරණය කිරීමට අපොහොසත්) තත්ත්වයේ සිට ජාත්‍යන්තර ආඥාදායකත්වයක (සමස්තයක් වශයෙන් ලෝක දේශපාලනය කෙරෙහි තීරණාත්මක බලපෑමක් කිරීමෙහි සමත් වන, යටත්පිරිසෙයින්, දියුණු රටවල් කීපයක නිර්ධන පංති ආඥාදායකත්වයක) තත්ත්වයට පරිවර්තනය වීමේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කර්තව්‍යය ඉටු කිරීමේ අවශ්‍යතාවය වඩාත් හදිසි වීමත් සමගම, මෙම උවදුරට විරුද්ධව, එනම්, ඉතාමත් ගැඹුරට කාවැදුනු සුළු ධනේශ්වර ජාතික දුර්මතයන්ට විරුද්ධව සටන් කිරීමේ හදිසි අවශ්‍යතාවය වඩ වඩාත් තියුණු වන්නේය. සුළු ධනේශ්වර ජාතිකවාදය, ජාත්‍යන්තරවාදය යනුවෙන් ප්‍රකාශයට පත් කරන්නේ ජාතීන් අතර සමානාත්මතාවය හුදෙක්ම පිළිගැනීම මිස, ඊට වැඩි යමක් නොවේ. මෙම පිළිගැනීමද කට වචනයෙන් පමණක් කෙරෙන්නකි. එය එසේ වන අතරම සුළු ධනපති ජාතිකවාදය ජාතික ආත්මාර්ථය පළුදු විය නොදී රැක ගනියි. එහෙත් නිර්ධන පංති ජාත්‍යන්තරවාදය අනුව, ප්‍රථමයෙන්ම, කිසියම් එක රටක නිර්ධන පංති අරගලයේ අවශ්‍යතාවයන් ලෝක පරිමාණ වශයෙන් කෙරෙන එම අරගලයේ අවශ්‍යතාවයන්ට යටත් කළ යුතුය; දෙවැනිව, ධනපති පංතිය පරදවා ජයග්‍රහණය අත්පත් කර ගන්නා ජාතියක් තුළ, ජාත්‍යන්තර ප්‍රාග්ධනය පෙරළා දැමීම සඳහා ඉමහත් ජාතික පරිත්‍යාගයන් කිරීමේ හැකියාව හා කැමැත්ත තිබිය යුතුය.

මේ අනුව බලන කල, දැනටමත් සම්පූර්ණ වශයෙන් ධනපති ක්‍රමය තහවුරු වී තිබෙන හා නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණිය සේ සැබැවින්ම ක්‍රියාත්මක වන කම්කරු පක්ෂ තිබෙන රටවල, ජාත්‍යන්තරවාදී සංකල්පය හා ප්‍රතිපත්තිය පිළිබඳ වූ අවස්ථාවාදී සහ සුළු ධනපති-සමාදානවාදී විකෘති කිරීම්වලට විරුද්ධව අරගල කිරීම ප්‍රථමතම හා මූලික කර්තව්‍යයක් වන්නේය.

11. වැඩ වසම්, නැතහොත්, පීතෘ මූලික සම්බන්ධකම් සහ පීතෘ මූලික-ගොවි සම්බන්ධකම් ප්‍රබලව පවතින ,වඩාත් නොදියුණු ජාතීන් හා සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සිත්හි දරා ගැනීම විශේෂයෙන්ම වැදගත් වන්නේය:

පළමුව, සියලුම කොමියුනිස්ට් පක්ෂ මෙම රටවල ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විමුක්ති ව්‍යාපාරවලට ආධාර දිය යුතුය. ඉතාමත් ක්‍රියාශීලී ලෙස මෙම ආධාර දීමේ වගකීම පැවරෙන්නේ නොදියුණු ජාතිය යටත් විජිතමය හා මූල්‍යමය වශයෙන් ගැති කොට ගත් රටෙහි කම්කරුවන් වෙතය;

දෙවැනිව, නොදියුණු රටවල් තුළ බලපෑම් සහිත පූජකයන්ට හා වෙනත් ප්‍රතිගාමී සහ මධ්‍යකාලීන කොටස්වලට විරුද්ධව අරගලයක් කිරීම අවශ්‍යය;

තුන්වැනිව, යුරෝපීය හා ඇමෙරිකානු අධිරාජ්‍යවාදයට විරුද්ධව ගෙන යන විමුක්ති ව්‍යාපාරය ඛාන් වරුන්, ඉඩම්හිමියන්, මුල්ලාවරුන් යනාදීන්ගේ බලය ශක්තිමත් කිරීම හා සමග ඒකාබද්ධ කිරීමට යත්න දරන සමස්ත ඉස්ලාම්වාදය හා එවැනි ප්‍රවණතාවයන්ට විරුද්ධව සටන් කිරීම අවශ්‍යය;

හතරවැනිව, නොදියුණු රටවල ඉඩම් හිමියන්ට විරුද්ධව, වතුකාර ඉඩම් හිමිකමට විරුද්ධව සහ සියලු වැඩවසම් නෂ්ඨාවශේෂයන්ට විරුද්ධව, එරටවල ගොවිජන ව්‍යාපාරයට විශේෂ ආධාර දීම සහ බටහිර යුරෝපීය කොමියුනිස්ට් නිර්ධන පංතියත්, පෙරදිග රටවල, යටත් විජිතවල, පොදු වශයෙන් නොදියුණු රටවල විප්ලවීය ගොවිජන ව්‍යාපාරයත් අතර හැකි තරම් සමීප සන්ධානයක් ඇති කිරීමෙන් ගොවිජන ව්‍යාපාරයට ඉතාමත් විප්ලවීය ස්වරූපයක් දීමට උත්සාහ දැරිය යුතුය. පූර්ව ධනපති සම්බන්ධකම් පවතින රටවල "වැඩකරන ජනතාවගේ සෝවියට් සභා" ආදිය පිහිටුවීම මගින් එරටවල සෝවියට් ක්‍රමයේ මූලික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සෑම ධෛර්යයක්ම ගැනීම විශේෂයෙන් අවශ්‍ය ය;

පස්වැනිව, නොදියුණු රටවල ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවණතාවයන්ට කොමියුනිස්ට් වර්ණ කැවීමට දරන ප්‍රයත්නයන්ට විරුද්ධව අධිෂ්ඨාන සහගත අරගලයක් කිරීම අවශ්‍ය වන්නේය. කොමියුනිස්ට් ජාත්‍යන්තරය යටත් විජිත සහ නොදියුණු රටවල ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී ජාතික ව්‍යාපාරවලට ආධාර දිය යුත්තේ, එම රටවල ඇති, නාම මාත්‍ර වශයෙන් පමණක් නොවන සේ කොමියුනිස්ට් වන, අනාගත නිර්ධන පංති පක්ෂවල මූලික කොටස් එක්රැස් කොට ඔවුන්ගේ විශේෂ කර්තව්‍යයන්, එනම්, ස්වකීය ජාතීන් තුළ පවත්නා ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරවලට විරුද්ධ අරගලයේ කර්තව්‍යයන් අවබෝධ වන සේ ඔවුන් පුහුණු කිරීමේ කොන්දේසි යටතේ පමණකි. කොමියුනිස්ට් ජාත්‍යන්තරය යටත් විජිත සහ නොදියුණු රටවල ධනපති ප්‍රජාතන්ත්‍රවාදය සමග තාවකාලික සන්ධානයකට ඇතුළත් විය යුතුය. එහෙත් එය සමග සංයෝග නොවිය යුතුය. නිර්ධන පංති ව්‍යාපාරය එහි ප්‍රාථමිකතම කලල අවස්ථාවේ පවතින විට පවා, සෑම තත්වයක් යටතේම, එහි ස්වාධීනත්වය ආරක්ෂා කළ යුතුය;

හයවැනිව, දේශපාලන වශයෙන් ස්වාධීන රාජ්‍යවල වෙස් ගන්වා, අධිරාජ්‍යවාදී බලවතුන්ට ආර්ථිකමය, මූල්‍යමය හා යුද්ධමය වශයෙන් සම්පූර්ණයෙන්ම ගැති වූ රාජ්‍යයන් පිහිටුවීමට, අධිරාජ්‍යවාදී බලවතුන් ක්‍රමානුකූල ලෙස කරගෙන යන රැවටිල්ල ගැන සියලුම රටවල, විශේෂයෙන්ම නොදියුණු රටවල පුළුල්තම වැඩකරන ජනතා කොටස් වලට නිරතුරුවම පැහැදිලි කර දීම සහ හෙළිදරව් කර පෙන්වීම අවශ්‍යය. වර්තමාන ජාත්‍යන්තර තත්ත්වයන් යටතේ, සෝවියට් සමූහාණ්ඩු සංගමයකට එක්සත් වීම හැර වෙනත් ගැළවීමේ මගක්, අධිරාජ්‍ය ගැති සහ දුර්වල රටවලට නොමැත.

12. අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ආදි කාලයේ පටන්ම යටත් විජිත සහ දුර්වල ජාතීන් සූරාකනු ලැබීම නිසා, පීඩිත රටවල වැඩකරන ජනතා.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වන් තුළ ඇති වී තිබෙන්නේ පීඩක ජාතීන් කෙරෙහිවූ උතුරා හැලෙන එදිරිවාදූ කමක් පමණක් නොවේ. එනිසා ඔවුන් තුළ පොදු වශයෙන් එම ජාතීන් කෙරෙහි, එම ජාතීන්ගේ නිර්ධන පංතිය කෙරෙහි පවා අවිශ්වාසයක් ඇවිල ගොස් තිබේ. යටත් විජිත රටවල් පීඩාවට පත් කිරීමට සහ මූල්‍යමය වශයෙන් ගැති රටවල් මංකොල්ලකෑම "තමන්ගේ" ධනපති පංතියට ඇති "අයිතියට" පක්ෂ වීම වසං කර තබනු පිණිස "රට ආරක්ෂා කිරීම" යන සමාජ-ජාත්‍යොන්මාදවාදී පිරුවටයක් යොදා ගනිමින් එම පීඩක ජාතීන්ගේ නිර්ධන පංතියේ නිල නායකත්වයෙන් බහුතරය, 1914-1919 සමයේදී නින්දිත ලෙස සමාජවාදයට ද්‍රෝහී වීම, මෙම ඉතාමත් සාධාරණ අවිශ්වාසය වැඩි වීමට හේතු සාධක වූ බවට සැකයක් නැත. අනිත් අතට, රටක් නොදියුණු වූ තරමට, එහි සුළු පරිමාණ කෘෂිකාර්මික නිෂ්පාදනයේ ග්‍රහණයත්, පීතෘමූලිකවාදය සහ තනි වූ ස්වභාවයත් ශක්තිමත්ය. එනිසා, ඉතාමත් ගැඹුරට විහිදී තිබෙන සුළු ධනේශ්වර දුර්මත, එනම්, ජාතික ආත්මාර්ථය හා ජාතික පටු අදහස් අනිවාරණීය වශයෙන්ම ශක්තිමත් හා දුර්වාරණීය වේ. මෙම දූර්මතයන් පහව යන්නේ ඉතාමත් හෙමින්ය. ඒවා අතුරුදහන් විය හැක්කේ දියුණු රටවල අධිරාජ්‍යවාදය හා ධනපති ක්‍රමය අතුරුදහන් වූ විටද, නොදියුණු රටවල ආර්ථික ජීවිතයේ සම්පූර්ණ අත්තිවාරම මුළුමනින්ම වෙනස් වූ විටද පමණකි. එබැවින්, දීර්ඝ කාලයක් පීඩිතව සිටි රටවල හා ජාතීන් අතර ශේෂව පවත්නා ජාතික හැඟීම් ගැන විශේෂයෙන්ම ප්‍රවේසම් සහිතව හා අවධානයෙන් යුතුව සලකා බැලීම සියලුම රටවල පංති විඥනය ඇති කොමියුනිස්ට නිර්ධන පංතියේ යුතුකම වන්නේය. මෙම අවිශ්වාසය හා දූර්මතයන් වඩාත් සීඝ්‍ර ලෙස ජය ගැනීමේ අටියෙන් යම් යම් සහනයන් දීමද එසේම අවශ්‍ය වන්නේය. ලෝකය මුළුල්ලේම සියලුම රටවල සහ ජාතීන්ගේ නිර්ධන පංතිය සහ ඉන් අනතුරුව සියලු වැඩකරන ජනතාව, සන්ධානය සහ සමගිය සඳහා ස්වේච්ඡාවෙන්ම ප්‍රයත්නයක් දරන්නේ නම් මිස, ධනපති ක්‍රමය පරදවා සම්පූර්ණ ජයග්‍රහණය අත්පත් කර ගැනීමට නොහැකි වනු ඇත.

1920 ජූනි 5 ද ලියන ලදී.

1920 ජූලි 14 ද "කොම්මනිස්තිචෙස්කි ඉන්තෙර්නත්සියොනාල්" සඟරාවේ අංක 11 කලාපයෙහි පළ කරන ලදී.

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 41, පිටු 161-168

2

ගොවිජන ප්‍රශ්නය ගැන ප්‍රාථමික කෙටුම්පත් ප්‍රවාද

(කොමියුනිස්ට ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනය සඳහා)

ගොවිජන ප්‍රශ්නය සම්බන්ධයෙන් විප්ලවවාදී නිර්ධන පංතිය අනුගමනය කරන උපක්‍රම විස්තර කරනු තබා, එම ප්‍රශ්න නිසි ලෙස ඉදිරිපත් කිරීමට පවා, දැනට ජාත්‍යොන්මාදවාදී ජාත්‍යන්තරය[10] බවට පත්වී තිබෙන දෙවැනි ජාත්‍යන්තරය අපොහොසත් වීමට හේතු වූ කරුණු ගැන ඉතා හොඳ පැහැදිලි කිරීමක්, මර්ච්ලෙව්ස්කි සහෝදරයා ඔහුගේ ලිපියෙන්[11] ඉදිරිපත් කර තිබේ. ඊළඟට, ඔහු එම ලිපියෙන්, තුන්වැනි ජාත්‍යන්තරයේ කොමියුනිස්ට ගොවිජන වැඩ පිළිවෙළට අදාළ න්‍යායික මූලධර්ම ඉදිරිපත් කර ඇත.

1920 ජූලි 15 දින රැස්වන කොමියුනිස්ට ජාත්‍යන්තර සම්මේලනයේ ගොවිජන ප්‍රශ්නය පිළිබඳ පොදු යෝජනාවට පදනම වශයෙන් එම මූලධර්ම යොදා ගත හැකියයි (යොදා ගත යුතුයයි) මම අදහස් කරමි.

පහත දැක්වෙන්නේ එම යෝජනාවේ ප්‍රාථමික කෙටුම්පතකි.

1. ප්‍රාග්ධනයේ සහ වතුකාර දේපළ හිමිකමෙහි වියගසෙන්ද, ධනපති ක්‍රමය පවතින කල්හි නැවත නැවතත් අනිවාර්ය ලෙසම පැන නගින විනාශයෙන් හා අධිරාජ්‍යවාදී යුද්ධවලින්ද ගම්බද ප්‍රදේශවල සිටින වැඩකරන පොදු ජනතාව නිදහස් කර ගැනීමෙහි පොහොසත් වන්නේ කොමියුනිස්ට පක්ෂයේ නායකත්වයෙන් යුත් නාගරික හා කාර්මික නිර්ධන පංතිය පමණකි. කොමියුනිස්ට නිර්ධන පංතිය සමග ඇති කර ගන්නා සන්ධානයක් නොමැතිව, එමෙන්ම ඉඩම් හිමියන්ගේ (ලොකු වතුකාර දේපළ හිමියන්ගේ) සහ ධනපති පංතියේ වියගස ඉවත ලීමට එම නිර්ධන පංතිය ගෙන යන අරගලයට කැපවූ ලෙසින් ආධාර දෙන්නේ නැතිව, ගම්බද පෙදෙස්වල වැඩ කරන ජනතාවට අනුගමනය කළ හැකි වෙනත් විමුක්ති මාර්ගයක් නොමැත.

අනිත් අතට කාර්මික කම්කරුවන් තමන්ගේ ශිල්පයේ, නැතහොත්, කාර්මාන්තයේ පටු උවමනාවන්ගෙන් ඔබ්බට නොයා, සමහර විට සුළු ධනපති අර්ථයෙන් ඉවසිය හැකි දෙයක් වන තම තත්ත්වයන් වැඩි දියුණු කර ගැනීමට පමණක් සීමා වෙමින් ඔවුන් ආත්ම තෘප්තියෙන් කල් ගෙවතහොත්, මිනිස් වර්ගයා ප්‍රාග්ධනයේ වියගසින් සහ යුද්ධවලින් නිදහස් කර ගැනීම පිළිබඳ ඔවුන්ගේ ඓතිහාසික කාර්යභාරය ඉටුකිරීම ඔවුනට හැකි නොවේ. දෙවැනි ජාත්‍යන්තරයේ ඊනියා සමාජවාදී පක්ෂවල අරටුව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වන, දියුණු රටවල් බොහොමයක "කම්කරු රදළ පෙළෙන්තියට" නියත වශයෙන්ම සිදුවී තිබෙන්නේ එයයි. ඔවුහු ඇත්ත වශයෙන්ම සමාජවාදයේ දරුණු සතුරන් හා ද්‍රෝහීන්ද, සුළු ධනපති ජාත්‍යොන්මාදවාදීන් සහ කම්කරු පංති ව්‍යාපාරය තුළ සිටින ධනපති පංතියේ නියෝජිතයන්ද වෙති. නිර්ධන පංතිය සැබෑ විප්ලවවාදී පංතියක් වන්නේත්, සැබැවින්ම සමාජවාදී ස්වරූපයෙන් කටයුතු කරනවා වන්නේත්, එය වැඩකරන හා පීඩිත ජනතාවන්ගේ පෙරමුණු බල ඇණිය ලෙසින් හා සූරාකන්නන් බලයෙන් පහ කිරීමේ නායකයා ලෙසින් ඉදිරිපත් වී ක්‍රියා කරන විට පමණකි. එසේ වුවද, පංති අරගලය ගම්බද පෙදෙස්වලට ගෙන නොගියහොත්, ගම්බද වැඩකරන ජනතාව නාගරික නිර්ධන පංතියේ කොමියුනිස්ට් පක්ෂය වටා එක්සත් කර නොගතහොත්, නිර්ධන පංතිය විසින් එම ජනතාව පුහුණු කරනු නොලැබුවහොත්, නිර්ධන පංතියට එම කටයුත්ත සාර්ථක කළ හැකි නොවේ.

2. සෑම ධනපති රටකම නාගරික නිර්ධන පංතිය විසින් අරගලයට මෙහෙයවා ගත යුතු, නැතහොත්, කුමණ තත්ත්වය යටතේ වුවද දිනා ගත යුතු,ගම්බද පෙදෙස්වල වැඩකරන සහ සූරාකනු ලබන ජනතාව නියෝජනය වන්නේ පහත සඳහන් පංතිවලිනි:

පළමුවැන්න, කෘෂිකාර්මික නිර්ධන පංතියය, වේතන ශ්‍රමකරුවන්ය (අවුරුද්ද, කන්න, නැතහොත්, දින අනුව සේවයට බැඳෙන මොවුන් ජීවනෝපාය උපයා ගන්නේ ධනපති කෘෂිකාර්මික ව්‍යවසායයන්හි කුලියට වැඩ කිරීමෙනි. මෙම පංතිය (දේශපාලන, යුද්ධමය, වෘත්තීය සමිති සමුපකාර, සංස්කෘතික, අධ්‍යාපනික ආදී වශයෙන්) ස්වාධීන ලෙස හා ගම්බද ජනතාවගේ අනිකුත් කොටස්වලින් වෙන්කොට ගෙන සංවිධානය කිරීමත්, මෙම පංතිය අතර උත්සන්න ප්‍රචාරයක් හා උද්ඝෝෂණයක් කරගෙන යාමත්, සෝවියට් පාලනයට හා නිර්ධන පංති ආඥාදායකත්වයට එහි සහයෝගය දිනා ගැනීමත්, සියලුම රටවල කොමියුනිස්ට් පක්ෂවල මූලික කර්තව්‍යයක් වන්නේය.

දෙවැන්න, අර්ධ නිර්ධන පංතිකයන්, නැතහොත්, ඉතා කුඩා බිම් කොටස් ගොවිතැන් කරන ගොවීන්ය. ඔවුහු, ඔවුන්ගේ ජීවනෝපායෙන් අඩක් උපයා ගැනීමට කෘෂිකාර්මික හා කාර්මික ධනපති ව්‍යවසායයන්හි වැඩ කරන අතර ඉන් අනිත් අර්ධය සපයා ගැනීම සඳහා, ඔවුන්ගේ පවුල්වල ජීවනෝපායයෙන් කොටසක් පමණක් ගෙන දෙන, තමන්ගේම නැතහොත්, කුලියට ගත් ඉඩම් කොටස් ගොවිතැන් කරති. සියලුම ධනපති රටවල මෙම ගම්බද වැඩකරන ජන කොටස සංඛ්‍යාව අතින් ඉතා විශාලය. එම ජන කණ්ඩායමෙහි පැවැත්ම සහ එහි විශේෂ තත්ත්වය ගැන කරුණු ඉස්මතු වීම වලක්වනු පිණිස ධනපති පංතියේ නියෝජිතයෝ සහ දෙවැනි

ජාත්‍යන්තරයට අයත් ජාත්‍යොන්මාදවාදී "සමාජවාදීහු" උනන්දු වෙති. විටෙක උවමනාවෙන්ම කම්කරුවන් රැවටීමෙන්ද, විටෙක සාමාන්‍ය සුළු ධනපති දෘෂ්ටියට අන්ධානුකරණයෙන් යටවීමෙන්ද, මෙම ජන කොටස පොදු "ගොවිජන" ජනකාය සමග එකට කැටි කර දක්වීමෙන්ද ඔවුහු එසේ කරති. ධනපති ආකාරයෙන් එසේ කම්කරුවන් මුළා කිරීම වැඩියෙන්ම දක්නට ලැබෙන්නේ ජර්මනියේ හා ප්‍රංශයේය. ඇමෙරිකාවේ හා වෙනත් රටවලද එය දක්නට ලැබේ. මෙම අර්ධ නිර්ධන පංතිකයන් ගත කරන්නේ ඉතාමත් අසීරු ජීවිතයකි. සෝවියට් ආණ්ඩුවකින් හා නිර්ධන පංති ආඥාදායකත්වයෙන් ඔවුනට සිදුවිය හැකි වාසිය ඉමහත්ය. එනිසා කොමියුනිස්ට් පක්ෂයේ කටයුතු නිසි ලෙස සංවිධානය කර ගතහොත්, මෙම කණ්ඩායම එහි ස්ථිර ආධාර කරුවා බවට පත් වනු ඇත.

තුන්වැන්න, සුළු ගොවි ජනයාය. මොවුහු කුඩා පරිමාණ ගොවිතැනෙහි යෙදෙන ගොවීන් වෙති. ඔවුන්ට, ඔවුන්ගේ පවුල්වල, ගොවිපළවල අවශ්‍යතාවයන් සපයා ගැනීමට තරම් ප්‍රමාණවත් වන තමන්ගේම හෝ බද්දට ගත් ඉඩම් කොටස් ඇත. ඔවුහු පිටස්තර ශ්‍රමය කුලියට නොගනිති. මෙම පිරිස සමාජ ස්ථරයක් වශයෙන් ගත් කළ, නිර්ධන පංතියේ ජයග්‍රහණයෙන් එයට අත්වන්නේ වාසියක්මය. එම ජයග්‍රහණය නිසා ඔවුනට සම්පූර්ණයෙන්ම හා වහාම අත්වන වාසි මෙසේය: (අ) ලොකු ඉඩම් හිමියන්ට බදු කුලී හෝ අස්වැන්න පංගුව (නිදර්ශන වශයෙන්, ප්‍රංශයේ métayers නමැති අඳ ගොවියන් හා ඉතාලියේ හා වෙනත් රටවල එවැනි පිරිස්) දීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වීම; (ආ) උගස් බැඳීම්වලින් නිදහස් වීම; (ඇ) නිමක් නැති ක්‍රම අනුව (කැලෑ ඉඩම්, එවායේ උපයෝගිතාවය ආදියෙන්) ලොකු ඉඩම් හිමියන්ගෙන් විඳින්නට සිදුවන පීඩනයෙන් හා යටහත් පහත්කම්වලින් නිදහස් වීම; (ඈ) නිර්ධන පංති රජයෙන් ඔවුන්ගේ ගොවිපළවලට වහාම ලැබෙන ආධාර (නිර්ධන පංතිය විසින් රාජ්‍ය සන්තක කරන ලද ලොකු ධනපති ගොවිපළවල තිබෙන උපකරණ හා ගොඩනැගිලිවලින් කොටසක් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවද, ධනපති ක්‍රමය යටතේ ප්‍රධාන වශයෙන් පොහොසත් හා මධ්‍යම ගොවියන්ට සේවා කරන සංවිධාන ලෙසට පැවතෙන ගම්බද සමුපකාර සමිති හා කෘෂිකාර්මික සංගම් නිර්ධන පංති රජය විසින් ප්‍රධාන වශයෙන් දුප්පතුන්ට, එනම්, නිර්ධන පංතිකයන්, අර්ධ නිර්ධන පංතිකයන් හා සුළු ගොවීන්ට ආධාර කරන සංවිධාන බවට පරිවර්තනය කිරීමද, ආදිය) හා වෙනත් බොහෝ දේ.

ඒ අතරම, ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීමේ, එනම් නිර්ධන පංති ආඥාදායකත්වයේ මෙම කාලය තුළ මෙම ස්ථරය, නැතහොත්, යටත්පිරිසෙයින් ඉන් කොටසක්වත්, කිසිවකින් හෝ

https://liberationbase.wordpress.com

සීමා ඉනාවන, වෙළඳාම් කිරීමේ සහ පෞද්ගලික දේපළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ නිදහස පැත්තට අනිවාර්ණීය වශයෙන්ම නැඹුරුවන බව කොමියුනිස්ට් පක්ෂය පැහැදිලි ලෙසම අවබෝධ කර ගත යුතුය. එයට හේතුව, (ස්වල්ප වශයෙන් වුවද) පාරිභෝගික භාණ්ඩ අලෙවි කරන්නන් වීම නිසා, ලාභ ඉපයීම හා දේපළ හිමිකම් සම්බන්ධ පුරුදුකම්වලින් එම ස්ථරය දූෂණය වී තිබීමයි. එසේ වුවද, ස්ථිර නිර්ධන පංති ප්‍රතිපත්තියක් අනුගමනය කෙරේ නම්, ජයග්‍රාහී නිර්ධන පංතිය ලොකු ඉඩම් හිමියන් සහ ලොකු ගොවීන් තීරණාත්මක ලෙස විනාශ කර දමන්නේ නම්, මෙම ස්ථරයේ වැනෙනසුලු භාවය අඩුවන නිසා, සමස්තයක් වශයෙන් ගත් කල එය නිර්ධන පංතියේ පැත්ත ගැනීම එයින් වැලකෙන්නේ නැත.

3. ඉහත විස්තර කරන ලද කණ්ඩායම් තුන එක් කොට ගත් කල, සියලුම ධනපති රටවල ජනගහනයෙන් බහුතරය සමන්විත වන්නේ ඒවායිනි. නගරවල පමණක් නොව, ගම්බද පෙදෙස්වලද නිර්ධන පංති විප්ලවයේ සාර්ථකත්වය සම්පූර්ණයෙන්ම සහතික වන්නේ එනිසා ය එසේ වුවද ඊට ප්‍රතිවිරුද්ධ අදහස පුළුල් ලෙස පැතිරී තිබේ. එම අදහස නොනැසී පවතින්නේ, ප්‍රථමයෙන්ම, ගම්බද පෙදෙස්වල සිටින ඉහත සඳහන් ජන කණ්ඩායම්වලින් සූරා කන්නන්, එනම්, ඉඩම් හිමියන් සහ ධනපතියන් වෙන් කරන ගැඹුරු පරතරයද, එමෙන්ම, අර්ධ නිර්ධන පංතිකයන්ගෙන් හා සුළු ගොවීන්ගෙන් ලොකු ගොවීන් වෙන් කරන පරතරයද සැලකිල්ලට ලක්වීම වලක්වනු වස්, ධනපති පංතියේ විද්‍යාව හා සංඛ්‍යා ලේඛන මගින් ක්‍රමාන්විත ලෙස කරගෙන යනු ලබන රැවටිල්ල නිසාය. දෙවැනිව, එය පවතින්නේ, ජාත්‍යන්තරවාදී දෙවැනි ජාත්‍යන්තරයේ වීරයන් හා අධිරාජ්‍යවාදී වරප්‍රසාදවලින් දූෂිතව සිටින, දියුණු රටවල "කම්කරු රදළ පෙළැන්තිය", ගම්බද දුප්පතුන් අතර නියම වශයෙන් නිර්ධන පංතික විප්ලවවාදී ප්‍රචාරක, උද්ඝෝෂණ සහ සංවිධාන කටයුතු කරගෙන යාමට අසමත් වීම හා අකැමති වීම නිසාය. අවස්ථාවාදීන්ගේ අවධානය නිතරම යොමු වූනේ හා තවමත් යොමු වී තිබෙන්නේ ලොකු සහ මධ්‍යම (පහත සඳහන් කර ඇති) ගොවීන්ද ඇතුළත් ධනපති පංතිය සමග බේරුමකට පැමිණීම සඳහා න්‍යායික සහ ප්‍රායෝගික විසඳීම් සෙවීම කෙරෙහි මිස, නිර්ධන පංතිය විසින් ධනපති ආණ්ඩුව හා ධනපති පංතිය විප්ලවවාදී ලෙස බලයෙන් පහකර දමනු ලැබීම කෙරෙහි නොවේ. තුන්වැනිව, එම අදහස පවතින්නේ, මාක්ස්වාදී න්‍යායත්, රුසියාවේ නිර්ධන පංති විප්ලවයේ අත්දැකීමත් විසින් සම්පූර්ණයෙන්ම තහවුරු කරන ලද සත්‍යයක් වන, සියලුම රටවල, ඉතාමත් දියුණු රටවල පවා, ඇදහිය නොහැකි තරම් පීඩිතව, අසමගිව, යටපත්ව හා අර්ධ වනචාරී ජීවන තත්ත්වයන්ට ගොදුරුව සිටින ඉහත විස්තර කෙරුණු ගම්බද

ජනතා ප්‍රවර්ගයන් තුන, ආර්ථික, සමාජමය හා සංස්කෘතික වශයෙන් සමාජවාදයේ ජයග්‍රහණය ගැන කැමැත්තක් දක්වන්නේ වී නමුත් නිර්ධන පංතියට ස්ථිරසාර ලෙස සහයෝගය දීමේ හැකියාව ඒවාට ලැබෙන්නේ, එම පංතිය දේශපාලන බලය දිනාගත් පසුව පමණක් බවද, එය විසින් ලොකු ඉඩම් හිමියන් හා ධනපතියන් තීරණාත්මක ලෙස විනාශ කර දමන ලද පසු පමණක් බවද, මෙම පීඩිත ජනතාවන්ට ආධාර දීමටත්, නායකත්වය දීමටත්, නිවැරදි මග පෙන්වීමටත් තරම් ශක්තිමත් හා නොසැලෙන සංවිධානය් වූ නායකයෙක් හා වීරයෙක් ඇතැයි යනු එම ජනතාවන්ට ව්‍යවහාරයෙන් පෙනී ගිය පසු පමණක් බවද වටහා ගැනීම අසමත් වන නිසාය. ඒ වටහා නොගැනීම (ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී සහ පාර්ලිමේන්තුවාදී පූර්වමත සියල්ලක්ම හා සම්බන්ධ වූ) පූර්වමතයක් හා සමාන වන තරම් අන්ධානුකරණ ස්වභාවයකින් යුක්තය.

4. "මධ්‍යම ගොවීන්" යන්නෙන් යමෙක් ආර්ථික වශයෙන් වටහා ගත යුත්තේ, තමන්ගේම, නැතහොත්, බද්දට ගත් කුඩා ඉඩම් හිමිකරගෙන සිටින, එහෙත් (අ) ධනපති ක්‍රමය යටතේ පොදු ලෙස ස්වකීය පවුලට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය යම්තම්න් සැපයීමට හා අවම මට්ටමෙන් ගොවිපළ පවත්වා ගැනීමම පමණක් නොව, යටත්පිරිසෙයින් සාර්ථක ප්‍රතිඵල ලබන අවුරුදුවලදී හෝ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කරගත හැකි වන තරමින් අතිරික්ත නිෂ්පාදනයක්ද ලැබීමට සෑහෙන පමණ ඉඩම් හිමි කර ගෙන සිටින, (ආ) බොහෝ අවස්ථාවල (නිදර්ශනයක් වශයෙන් මෙම ගොවිපළවල් දෙකකින්, නැතහොත්, තුනකින් එකක) කුලී ශ්‍රමය යොදවා ගෙන සිටින සුළු ගොවීන්ය. දියුණු ධනපති රටක මධ්‍යම ගොවීන් පිළිබඳ මූර්ත්ත නිදර්ශනයක් ලෙසට ජර්මනියේ හෙක්ටෙයාර් පහ සිට දහය දක්වා වූ ගොවිපළවල් කණ්ඩායම ගත හැකිය. 1907 සංගණනය අනුව ඒවා අතුරෙන් කුලී ශ්‍රමය යොදවා ගත් සංඛ්‍යාව එම කණ්ඩායමේ මුළු ගොවිපළවල් සංඛ්‍යාවෙන් තුනෙන් එකකි*. ශ්‍රම උපයෝගිතාවය

---

*නිශ්චිත සංඛ්‍යාවන් මෙසේය: (මුළු ගොවිපළවල් 57,36,082 කින්) හෙක්ටෙයාර් පහ සිට දහය දක්වා වූ ගොවිපළවල් 6,52,798 කි. මෙම ගොවිපළවල නොයෙක් වර්ගයේ කුලී කම්කරුවන් 4,87,704 ක් යොදවාගන්නා ලද අතර, ඒවායේ වැඩ කළ ගොවීන්ගේ පවුල්වලට අයත් ශ්‍රමිකයන් (Familienangehörige) සංඛ්‍යාව 20,03,633 කි. ඔස්ත්‍රියාවේ 1902 සංගණනය අනුව මෙම කණ්ඩායමට ගොවිපළවල් 3,83,331 ක් අයත් විය. ඉන් 1,26,136 ක කුලී ශ්‍රමිකයන් යොදවා ගන්නා ලදී. එම ගොවිපළවල වැඩ කළ කුලී ශ්‍රමිකයන් ගණන 1,46,044 ක් වූ අතර ගොවි පවුල්වලට අයත් ශ්‍රමිකයෝ 12,65,969 ක් වූහ. ඔස්ත්‍රියාවේ මුළු ගොවිපළවල් සංඛ්‍යාව 28,56,349 කි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විශාල ලෙස අවශ්‍ය වන විශේෂ වගාවන්, නිදර්ශනයක් වශයෙන් මිදි වැනි වගාවන් කෙරෙන ප්‍රංශයේ මෙම කණ්ඩායම, පිටතින් කුලියට ගත් ශ්‍රමය යම් තරමක් දුරට වැඩියෙන් යොදවා ගන්නා බව පෙනේ.

යටත්පිරිසෙයින් නුදුරු අනාගතයේදී හෝ, නිර්ධන පංති ආඥාදායකත්වයේ මුල් වකවානුවේදී හෝ, මෙම ස්ථරය තමන් වෙත දිනා ගැනීමේ කර්තව්‍යය ඉටු කිරීම තමන් වෙත පවරා ගැනීම නිර්ධන පංතියට භාර ගත නොහැකි නිසා, එය කළ යුත්තේ, එම ස්ථරය මධ්‍යස්ථ කිරීම, එනම්, නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර කෙරෙන අරගලයේදී මධ්‍යස්ථ කිරීම පමණක් තම කර්තව්‍යය සේ සලකා කටයුතු කිරීමය. මෙම ස්ථරය-අනිවාරණීය වශයෙන්ම එම බලවේගයන් දෙක අතර එහා මෙහා වැනෙන්, නේය. නව යුගය ආරම්භයේදීත්, දියුණු රටවලත්, එය ප්‍රධාන වශයෙන් ධනපති පංතිය පැත්තට නැඹුරු වනු ඇත. එසේ වන්නේ මෙම ස්ථරය අතර දේපළ හිමියන්ගේ ලෝකාවබෝධය හා හැඟීම් බල පවත්වන නිසා, එය ලාභ ලැබීමත්, වෙළෙඳාම හා දේපළ හිමිකම සඳහා ''නිදහසත්'' පිළිබඳ නිශ්චිත උවමනාවක් ඇතිව, වේතන කම්කරුවන්ට කෙළින්ම ප්‍රතිවිරෝධී තත්ත්වයක සිටින නිසාය. ජයග්‍රාහී නිර්ධන පංතිය බදු කුලී හා උගස් අවලංගු කිරීමේ මාර්ගයෙන් මෙම ස්ථරයේ තත්ත්වය එක්වරම වැඩි දියුණු කරන්නේය. එසේ වුවද, ධනපති රටවල් බොහොමයක නිර්ධන පංතිය, එක්වරම පෞද්ගලික දේපළ සම්පූර්ණයෙන්ම අහෝසි නොකළ යුතුය. කුමණ හෝ තත්ත්වයක් යටතේ වුවද, සුළු ගොවීන්ට හා මධ්‍යම ගොවීන්ට ඔවුන්ගේ ඉඩම් කොටස තබා ගැනීමට පමණක් නොව, ඔවුන් සාමාන්‍යයෙන් බද්දට ගත් මුළු බිම් ප්‍රමාණයන්ද ඇතුළත් වන ලෙසට (බදු කුලී අවලංගු කිරීමෙන්) ඔවුන්ගේ ඉඩම් කොටස් විශාල වීමට ඉඩ සැලසෙන බවද නිර්ධන පංතිය සහතික කරයි.

එවැනි පියවරයන් ගන්නා අතරම, ඒ හා සමගම, ධනපති පංතියට විරුද්ධව නිර්දය අරගලයක්ද කිරීමෙන් මධ්‍යස්ථ කිරීමේ ප්‍රතිපත්තිය සාර්ථක වන බව සම්පූර්ණයෙන්ම සහතික වන්නේය. නිර්ධන පංති රාජ්‍යය, ඉතාමත් ප්‍රවේසම් සහිතව, නියත වශයෙන්ම, ඉතාමත් ක්‍රමානුකූලව, ආදර්ශයේ ශක්තිය පදනම කොට ගනිමින්, මධ්‍යම ගොවියාට බලකිරීමෙන් තොරව, ඔහු සාමූහික ගොවිතැනට පරිවර්තනය කළ යුතුය.

5. ලොකු ගොවියෝ ("Großbauern" කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින ධනපති ව්‍යවසායිකයෝ වෙති. ඔවුහු කුලී ශ්‍රමිකයන් කීප දෙනෙක් බැගින් සේවයෙහි යොදවා ගනිති. ඔවුන් ''ගොවිජනයා'' සමග සම්බන්ධ වී සිටින්නේ පහළ මට්ටමේ සංස්කෘතිය, ජීවන සිරිත් විරිත් හා ස්වකීය ගොවිපළවල වෙර වැඩ කිරීම මගින් පමණකි. විප්ලවවාදී නිර්ධන පංතියට

විවෘත හා අධිෂ්ඨාන සහගත ලෙස සතුරු වන විශාලතම ධනපති ස්ථරය සමන්විත වන්නේ මොවුන්ගෙනි. කොමියුනිස්ට් පක්ෂය ගම්බද පෙදෙස්වල කරන වැඩ කටයුතු සියල්ලෙහිදීම, මෙම ස්ථරයට විරුද්ධව අරගල කිරීමත්, ගම්බද ජනතාවට අයත් වැඩකරන හා සූරාකනු ලබන බහුතරය මෙම සූරාකන්නන්ගේ දෘෂ්ටිමය හා දේශපාලන බලපෑමෙන් නිදහස් කර ගැනීමත්, ආදිය කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතුය.

නගරවල නිර්ධන පංතිය ජයග්‍රහණය අත්පත් කර ගත් පසු, මෙම ස්ථරයේ විවිධාකාර ප්‍රතිරෝධයද, කඩාකප්පල් කිරීම්ද, එමෙන්ම, ප්‍රතිවිප්ලව ස්වභාවයේ අවිගත් සෘජු සටන්ද නොවැලැක්විය හැකි ලෙසටම මතු වන්නේය. එනිසා මෙම ස්ථරය සම්පූර්ණයෙන්ම නිරායුධ කිරීම සඳහාද, එමෙන්ම, කර්මාන්තයට අරක් ගත් ධනපතියන් පෙරළා දැමීම සමගම මෙම ස්ථරයේ ප්‍රතිරෝධයේ ප්‍රථම ලකුණු දුටු තැනම එයට ඉතාමත් දෘඪතර ලෙස, නිර්දය ලෙස හා සුනු විසුනු වන ලෙස පහර දෙනු සඳහාද අවශ්‍ය වන බලවේගයන් දෘෂ්ටිමය හා සංවිධානාත්මක වශයෙන් සූදානම් කිරීමට නිර්ධන පංතිය වහාම කටයුතු ආරම්භ කළ යුතුය. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා, ග්‍රාමීය නිර්ධනයන් ආයුධ සන්නද්ධ කර, ගම්බද පෙදෙස්වල සෝවියට් සභා ඇති කළ යුතුය. එම සෝවියට් සභා තුළ සූරාකන්නන්ට කිසිම ඉඩක් නොදිය යුතු අතර, නිර්ධනයින්ගේ හා අර්ධ-නිර්ධනයින්ගේ ප්‍රධානත්වය පවතින බව සහතික කළ යුතුය.

කෙසේ වුවද, ලොකු ගොවීන්ගේ ගොවිපළවල් සමාජ සන්තක කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය කොන්දේසිද, විශේෂයෙන්ම, තාක්ෂණික කොන්දේසිද, සමාජමය කොන්දේසිද තවමත් නොපවත්නා හෙයින්, ලොකු ගොවීන්ගේ දේපළ අසන්තක කිරීම වුවද, ජයග්‍රාහී නිර්ධන පංතියේ ක්ෂණික කර්තව්‍යයක් සේ කිසි ලෙසකින්වත් ගත හැකි නොවේ. එක් එක් අවස්ථාවල, සමහර විට විශේෂ අවස්ථාවල, ඔවුන් කුඩා කට්ටි වශයෙන් බදු දෙන ඔවුන්ගේ ඉඩම්, නැතහොත්, අවට සිටින සුළු ගොවී ජනතාවට විශේෂයෙන්ම අවශ්‍ය ඉඩම් රාජ්‍ය සන්තක කරනු ලැබේ. ලොකු ගොවීන්ට අයත් කෘෂිකාර්මික යන්ත්‍රවලින් කොටසකින් නිදහස් ලෙස ප්‍රයෝජන ගැනීමේ පහසුකම් ද කුඩා ගොවියාට සහතික කර දිය යුතුය. ඒ ආදී වෙනත් පියවරයන්ද ගත යුතුවේ. එසේ වුවද, සාමාන්‍ය ප්‍රතිපත්තියක් වශයෙන්, නිර්ධන පංති රජය ලොකු ගොවීන්ට ඔවුන්ගේ ඉඩම් තබා ගැනීමට ඉඩ දිය යුතුය. ඔවුන් වැඩකරන හා සූරාකනු ලබන ජනතාවගේ බලයට ප්‍රතිරෝධය දක්වුවහොත් පමණක් ඒවා රාජ්‍ය සන්තක කළ යුතුය. රුසියානු නිර්ධන පංති විප්ලවය කෙරෙහි බල පැවැත්වූ විශේෂ කොන්දේසි ගණනාවක් නිසා ලොකු ගොවීනට විරුද්ධව කරන ලද අරගලය සංකීර්ණ හා දිග්ගැස්සුනු එකක් බවට පත් විය. එසේ වුවද, එම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ස්ථරය දක්වන සුළුතම ප්‍රතිරෝධයේදීම එයට තදබල පාඩමක් උගැන්වූ පසු, නිර්ධන පංති රජයෙන් නියම කෙරෙන කර්තව්‍යයන් පක්ෂපාත ලෙස ඉටු කිරීමෙහිත්, වැඩකරන සියල්ලන්ම ආරක්ෂා කරන සහ අලස පොහොසතුන් කෙරෙහි අනුකම්පාවක් නොදක්වනා ආණ්ඩුව කෙරෙහි ප්‍රමාද වී හෝ ගෞරව සම්ප්‍රයුක්ත බවක් දක්වීමෙහිත් පවා එය සමත් වන බව එම විප්ලවයේ අත්දැකීම්වලින් පෙනී ගියේය.

රුසියාවේ ධනපති පංතිය පරාජය කිරීමෙන් පසුව, එහි නිර්ධන පංතිය ලොකු ගොවීනට විරුද්ධව ගෙන ගිය අරගලය සංකීර්ණ හා ප්‍රමාද කිරීමට ප්‍රධාන වශයෙන් හේතු සාධකවූ විශේෂ කොන්දේසි මෙසේය: 1917 ඔක්තෝබර් 25 (නොවැම්බර් 7) දිනෙන් පසුව, රුසියානු විප්ලවය, ඉඩම් හිමියන්ට විරුද්ධව සමස්තයක් වශයෙන් මුළු ගොවි ජනතාවගේම සහභාගිත්වය සහිත වූ "සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදී", නැතහොත්, මූලික වශයෙන් ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී වූ අවධිය ඔස්සේ ගමන් කළේය; නාගරික නිර්ධන පංතියේ සංස්කෘතික හා සංඛ්‍යාත්මක දුර්වලකම; අවසාන වශයෙන්, මහා දුර ප්‍රමාණයන් හා ගමනා-ගමනයේ ඉමහත් අපහසුකම්. දියුණු රටවල මෙම ප්‍රමාදකාරී කොන්දේසි බලපවත්නේ නැති හෙයින්, යුරෝපයේ හා ඇමෙරිකාවේ විප්ලවවාදී නිර්ධන පංතිය වඩාත් ශක්ති සම්පන්න ලෙස සූදනම් වී, ලොකු ගොවීන්ගේ ප්‍රතිරෝධය පරදවා සම්පූර්ණ ජයග්‍රහණය අත්පත් කර ගැනීම, ඔවුන්ට තිබෙන ප්‍රතිරෝධය දක්වීමේ ස්වල්පතම ඉඩ පහසුකම වුවද අවුරා දැමීම වඩාත් සීඝ්‍ර ලෙස, වඩාත් ස්ථිරසාර ලෙස හා සාර්ථක ලෙස ඉටු කළ යුත්තේය. මෙය ඉටු කරන තෙක්, එවැනි සම්පූර්ණ හා ඒකාන්ත ජයග්‍රහණයක් අත්කර ගන්නා තෙක්, ගම්බද නිර්ධනයන්, අර්ධ-නිර්ධනයන් හා සුළු ගොවීන් නිර්ධන පංති රජය සම්පූර්ණයෙන්ම ස්ථිර එකක් බව පිළිගන්නා තත්ත්වයට ගෙන ඒම අපහසු හෙයින්, එය අනිවාර්ය අවශ්‍යතාවයක් වේ.

6. ධනපති රටවල, කෙළින්ම හෝ බදුකාර ගොවීන් මගින් හෝ, වේතන ශ්‍රමය හා අසල් වැසි සුළු ගොවි ජනතාව (නොයෙක් අවස්ථාවල මධ්‍යම ගොවීන්ගෙන් කොටසක්ද) ක්‍රමාන්විත ලෙස සූරාකන, තමන්ම වෙර වැඩෙහි නොයෙදෙන, ප්‍රධාන වශයෙන් වැඩවසම් අධිපතියන්ගෙන් (රුසියාවේ, ජර්මනියේ හා හංගේරියාවේ වංශවතුන්ගෙන්ද, ප්‍රංසයේ යළි ඇති කරන ලද සීනියෝර්වරුන්ගෙන්ද, බ්‍රිතාන්‍යයේ ලෝඩ්වරුන්ගෙන්ද, ඇමෙරිකාවේ කලින් වහල් හිමියන් වූ අයගෙන්ද) පැවතෙන, නැතහොත්, මූල්‍යාධිකාරීන් වන, එසේත් නැතහොත්, මේ දෙවර්ගයේම සූරාකන්නන්ගේ හා පරපුට්ටන්ගේ සම්මිශ්‍රණයක් වන ලොකු ඉඩම් හිමියන්ගේ වතුකාර දේපළ සියල්ලම විප්ලවවාදී නිර්ධන පංතිය විසින් නොපමාව හා කොන්දේසි විරහිතව රාජ්‍ය සන්තක කරනු ලැබිය යුතුය.

ලොකු ඉඩම් හිමියන්ගෙන් රාජ්‍ය සන්තක කරන ලද ඉඩම් සඳහා වන්දි ගෙවන ලෙස කීම හෝ එය ක්‍රියාත්මක කිරීම හෝ කොමියුනිස්ට් පක්ෂවලට කිසිසේත් කළ හැක්කක් නොවේ. යුරෝපයේ හා ඇමෙරිකාවේ අද පවතින තත්ත්වයන් යටතේ එය සමාජවාදය පාවා දීමක්ද, කෝටිපතියන් සංඛ්‍යාව වැඩි කළ හා ඔවුන් තවත් පොහොසත් කළ යුද්ධය නිසා ඉතාමත් බරපතල අමාරුවට වැටී සිටින වැඩකරන හා සූරාකනු ලබන ජනතාව මත තවත් කප්පමක් පැටවීමක්ද වන්නේය.

ජයග්‍රාහී නිර්ධන පංතිය ලොකු ඉඩම් හිමියන්ගෙන් රාජ්‍ය සන්තක කළ ඉඩම් වගා කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන් වූකල, රුසියාවේ වඩාත් ප්‍රබල වූයේ එම ඉඩම් ගොවි ජනයාගේ ප්‍රයෝජනය සඳහා ඔවුන් අතර බෙදා දීමය. එසේ කිරීමට සිදු වූයේ රුසියාවේ ආර්ථික නොදියුණුකම නිසාය. කලින් පැවති වතු ඉඩම්වල රාජ්‍ය "සෝවියට් ගොවිපළවල්" සංවිධානය කර තිබෙන්නේ සාපේක්ෂ වශයෙන් කලාතුරකිනි. විශේෂ අවස්ථාවලදී පමණකි. එවැනි රජයේ ගොවිපළවල් රජයේ වියදමින් පවත්වා ගෙන යනු ලබන අතර, ඒවායේ කලින් වැඩ කළ වේතන කම්කරුවන් රජයේ කම්කරුවන් බවටද, රජය පාලනය කරන සෝවියට් සභා සමාජිකයින් බවටද පරිවර්තනය කර ඇත. දියුණු ධනපති රටවල විශාල කෘෂිකාර්මික ව්‍යවසායයන් බොහොමයක්ම කැබලි නොකර තබා රුසියාවේ "සෝවියට් ගොවිපළවල්" මෙන් පවත්වා ගැනීම නිවැරදි ක්‍රියාමාර්ගය වනු ඇතැයි කොමියුනිස්ට් ජාත්‍යන්තරය අදහස් කරයි.

එසේ වුවද, මෙම තීරණය අතිශයෝක්තියෙන් ගෙන හෝ, ඒකාකාර ලෙසම ක්‍රියාත්මක කළ යුත්තක් ලෙස ගෙන හෝ, කලින් අසන්තක කරන ලද අසන්තක කරන්නන්ට හිමිව තිබූ ඉඩම්වලින් කොටසක් අසල්වැසි සුළු ගොවීන්ට හා සමහර විට මධ්‍යම ගොවීන්ට නොමිළයේ දීම සම්පූර්ණයෙන්ම වැළැක්වීම බරපතල වරදක් වේ.

ප්‍රථමයෙන්ම, මෙයට විරුද්ධව ඉදිරිපත් කෙරෙන සාමාන්‍ය විරෝධය වන, මහා පරිමාණ ගොවිතැන තාක්ෂණික වශයෙන් උසස්ය යන තර්කය වූකලී, ප්‍රතික්ෂේප කළ නොහැකි න්‍යායික සත්‍යයක් වෙනුවට ආදේශ කෙරෙන ඉතාමත් නින්දිත අවස්ථාවාදයක හා විප්ලවය පාවාදීමක ස්වභාවය ගන්නා එකකි. මෙම විප්ලවයේදී සාර්ථකත්වය අත්කර ගැනීමට කටයුතු කිරීමේදී නිර්ධන පංතිය නිෂ්පාදනයේ තාවකාලික පසුබෑස්මක් ගැන බිය නොවිය යුතුය. 1863-1865 ඇමෙරිකානු සිවිල් යුද්ධය නිසා කපු නිෂ්පාදනයේ තාවකාලිකව පහත වැටීම ගැන උතුරු ඇමෙරිකාවේ වහල් ක්‍රමයට විරුද්ධවූ ධනපති පංතිය දැක්වූ බියට වඩා නිර්ධන පංතිය ඒ ගැන බිය වීමට හේතුවක් නොමැත. ධනපති පංතියට ඉතාමත් වැදගත් දෙය වන්නේ, නිෂ්පාදනය උදෙසාම නිෂ්පාදනය කිරීමය. වැඩකරන සහ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සූරාකනු ලබන ජනතාවට ඉතාමත් වැදගත් දෙය වන්නේ, සූරාකන්නන් බිලයෙන් පහකර දමා, ධනපතියන් සඳහා වැඩ නොකර, තමන්ම සඳහා වැඩ කරන තත්ත්වයක් උදාකර ගැනීමය. නිර්ධන පංති ජයග්‍රහණය සහ එහි ස්ථාවරත්වය සහතික කිරීම නිර්ධන පංතියේ ප්‍රථම සහ මූලික කර්තව්‍යය වන්නේය. නමුත්, මධ්‍යම ගොවි ජනයා මධ්‍යස්ථ නොකළහොත්, සුළු ගොවි ජනතාව සියලු දෙනාගේම, නැතහොත්, ඉන් සැලකිය යුතු කොටසක වත් සහයෝගය ලබා නොගතහොත්, ස්ථිර නිර්ධන පංති ආණ්ඩුවක් ඇති විය නොහැකිය.

දෙවැනිව, කෘෂිකර්මාන්තයෙහි මහා පරිමාණ නිෂ්පාදනය වැඩි කිරීමට පමණක් නොව, එය රැක ගැනීමට පවා, වෘත්තීය සමිති සහ දේශපාලන සංවිධාන කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් ඇති, සම්පූර්ණයෙන්ම වර්ධනයවුණු හා විප්ලවවාදී විඥානය ඇති ගම්බද නිර්ධන පංතියක් සිටිය යුතුය. මෙම කොන්දේසිය සම්පූර්ණ වී නොමැති තැනෙක, නැතහොත්, මෙම කර්තව්‍යය පංති විඥානය ඇති පුහුණු කාර්මික කම්කරුවන්ට පැවරිය නොහැකි තැන්වල, රජය මගින් පවත්වාගෙන යන විශාල ගොවිපළවල් පිහිටුවීමට දරන ඉක්මන්කාරී ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලය විය හැක්කේ නිර්ධන පංති ආණ්ඩුව අප්‍රසාදයට ලක්වීම පමණකි. එවැනි තත්ත්වයන් යටතේ "සෝවියට් ගොවිපළවල්" පිහිටුවන විට ඉතාමත් සුපරීක්ෂාකාරී ලෙස කටයුතු කළ යුතුය. ඉතාමත් අංග සම්පූර්ණ ලෙස ඒ සඳහා සූදනම් වීමේ කටයුතු කළ යුතුය.

තුන්වැනිව, සියලුම ධනපති රටවල, ඉතාමත් දියුණු ඒවායේ පවා, ලොකු ඉඩම් හිමියන් විසින් අසල්වැසි සුළු ගොවියන් සූරාකනු ලබන, මධ්‍යකාලීන, අර්ධ-වැඩවසම් ක්‍රමයේ නෂ්ටාවශේෂයන් තවමත් පවතී. ජර්මනියේ Instleute* ද, ප්‍රංශයේ Métayers වරුන්ද, එක්සත් ජනපදයේ (දකුණු ප්‍රාන්තවල මෙලෙසින් බහුල වශයෙන් සූරාකනු ලබන නීග්‍රෝවරුන් පමණක් නොව, සමහර විට සුදු මිනිසුන්ද ඇතුලත්වූ) පංගු ගොවීන්ද මේ පිළිබඳ නිදර්ශන වෙති. එවැනි අවස්ථාවල, වෙනත් ආර්ථික හෝ තාක්ෂණික පදනමක් නොපවතින හෙයින් හා එවැන්නක් එක පහරින් නිර්මාණය කළ නොහැකි හෙයින්, සුළු ගොවීන් කලින් බද්දට ගත් ඉඩම් ඔවුනට නිදහස්ව ප්‍රයෝජන ගැනීමට දීම නිර්ධන පංතියට පැවරී ඇති යුතුකමකි.

ලොකු ගොවිපළවලට අයත් උපකරණ නොවරදවාම රාජ්‍ය සන්තක කළ යුතුය. එසේ කළ යුත්තේ එක් ඒකාන්ත කොන්දේසියකට යටත්වය. එනම්, ලොකු රාජ්‍ය ගොවිපළවල අවශ්‍යතාවයන් ඉටු කරන ලද පසු ඒවා සුළු ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා නොමිළයේ හා නිර්ධන පංති රජය

*අඳගොවීන් — සංස්කාරක

නියම කළ කොන්දේසි ඉටු කිරීම මගින් ලබාගත හැකි වීමට යටත්වය.

නිර්ධන පංති විප්ලවයෙන් තදනන්තර කාලසීමාවේදී, ලොකු ඉඩම් හිමියන්ගේ වතු දේපළ අප්‍රමාදව රාජ්‍ය සන්තක කිරීම පමණක් නොව, එම ඉඩම් හිමියන් ප්‍රතිවිප්ලවයේ නායකයන්, නැතහොත්, මුළු මහත් ගම්වැසි ජනතාවගේම කෲරතර පීඩකයන් සේ සලකා එක්කෝ සියලු දෙනාම පිටුවහල් කළ යුතුය. නැතහොත් අඩස්සි කොට තැබිය යුතුය. එසේ වුවද, නගරවල මෙන්ම ගම්බද පෙදෙස්වලද නිර්ධන පංති රජය තහවුරු වීමත් සමග, මෙම පංතිය තුළ සිටින, වටිනා පළපුරුද්දක්, ශිල්පීය දැනුමක් හා සංවිධාන කුසලතාවයක් ඇති බලවේගයන් (ඉතාමත් විශ්වාසදයක කොමියුනිස්ට් කම්කරුවන්ගේ විශේෂ පාලනය යටතේ) මහා පරිමාණ සමාජවාදී කෘෂිකර්මාන්තය ගොඩ නැගීම සඳහා සේවයට යොදවා ගනු පිණිස ක්‍රමානුකූල ප්‍රයත්නයන් දැරීම අවශ්‍ය වේ.

7. ධනපති ක්‍රමය පරදවා සමාජවාදය ජයග්‍රහණය කළ බවත්, සමාජවාදය තහවුරු වූ බවත් සහතික වශයෙන් පිළිගත හැක්කේ, නිර්ධන පංති රාජ්‍ය බලය, එයට විරුද්ධ සූරාකන්නන්ගේ සියලු ප්‍රතිරෝධයක්ම සම්පූර්ණයෙන්ම මැඩ පවත්වා, ස්වකීය ප්‍රධානත්වය හා ස්ථාවරභාවය නිශ්චිත වශයෙන්ම ඇති කර ගෙන, මුළු මහත් කර්මාන්තයම මහා පරිමාණ සාමූහික නිෂ්පාදන සහ (සමස්ත ආර්ථිකයම විද්‍යුතනය කිරීම මත පදනම් වූ) නවීන තාක්ෂණික පදනමක් පිහිටුවා ප්‍රතිසංවිධානය කළ පසු පමණකි. කෘෂිකාර්මික සහ පොදු වශයෙන් ගොවිපළ ශ්‍රම කරුවන්ගේ ශ්‍රම ඵලදායකත්වය විශාල ලෙස උසස් වීමට හේතුවන සේද, උසස් ශ්‍රම ඵලදයකත්වයේ ආදර්ශයේ බලයෙන් හා ස්වකීය යහපත තකා මහා පරිමාණ,සාමූහික හා යාන්ත්‍රිකමය කෘෂිකර්මාන්තය පිළිගන්නා තැනට සුළු ගොවි ජනයා පෙළඹෙන සේද නොදියුණු හා විසිරී සිටින ගම්වැසි ජනතාවට තාක්ෂණික හා සමාජමය ආධාර දීමේ හැකියාව නගරවලට ලැබෙන්නේ එසේ කළ පසු පමණකි. ප්‍රතික්ෂේප කළ නොහැකි මෙම න්‍යායික සත්‍යය, සියලුම සමාජවාදීන් විසින් නාම මාත්‍ර වශයෙන් පිළිගනු ලැබුවත්, ජාත්‍යන්තරවාදී දෙවැනි ජාත්‍යන්තරයේද, ජර්මන් සහ බ්‍රිතාන්‍ය "ස්වාධීනයන්"[12], ප්‍රංශ ලොන්ගේවාදීන්[13] ආදීවූ නායකයන් අතරද බලපවත්නාවූ අවස්ථාවාදය නිසා ඇත්ත වශයෙන්ම විකෘති වන්නේය. මෙම විකෘතිය කෙරෙන්නේ සාපේක්ෂ වශයෙන් දුරස්තර, අලංකාර හා අපේක්ෂා සහිත අනාගතය කෙරෙහි අවධානය යොමු කිරීමේ මාර්ගයෙනි. දුෂ්කර ප්‍රායෝගික පරිවර්තනයේ සහ එම අනාගතයට සමීප වීමේ හදිසි කර්තව්‍යයන් කෙරෙන් අවධානය බැහැරට යොමු කිරීමෙනි. ව්‍යවහාරික වශයෙන් එය ක්‍රියාත්මක කෙරෙන්නේ ධනපති පංතිය සමග සම්මුතියකට සහ "පංති සමාදනයකට" පක්ෂව කරන දේශනා තුළිනි. එම විකෘති කිරීම වූකලී, යුද්ධය නිසා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සෑම තන්හිම ඇතිවී තිබෙන පෙර නොදක්නා ලද විරූ භායානක විනාශය හා දරිද්‍රතාවයක්, එම යුද්ධයෙන් මතු වූ කෝටිපතියන් අතලොස්සගේ අභූතපූර්ව ධනවත් වීම හා කර්කශ භාවයත් මධ්‍යයේ දූනට අරගලයක් කරගෙන යන නිර්ධන පංතිය සම්පූර්ණයෙන්ම පාවාදීමක් වන්නේය.

ගම්බද පෙදෙස්වලම සාර්ථක සමාජවාදී අරගලයක් කිරීමේ නියම ඉඩ ප්‍රස්ථාවක් විසින්, ප්‍රථමයෙන්ම, කැප කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අවබෝධයක් කාර්මික නිර්ධන පංතිය තුළට කාවැද්දීමේ සහ ධනපති පංති රජය බලයෙන් පහකර දමා නිර්ධන පංති බලය තහවුරු කිරීම පිණිස කැප කිරීම් සඳහා ඔවුන් සූදනම් කිරීමේ කටයුත්ත සියලුම කොමියුනිස්ට් පක්ෂවලින් ඉටුවීම අපේක්ෂා කෙරෙන්නේය. මන්දයත්, නිර්ධන පංති ආඥාදායකත්වය යනුවෙන් හඟවනු ලබන්නේ, වැඩකරන සහ සූරාකනු ලබන සියලුම ජනයා සංවිධානය කර ඔවුන්ට නායකත්වය දීමේ හැකියාව නිර්ධන පංතියට තිබීමත්, එම කටයුත්ත ඉටු කර ගැනීම සඳහා වැඩියෙන්ම කැප කිරීමට හා ඉහළම වීරත්වයක් පෑමට පෙරමුණු බල ඇණියට හැකියාවක් තිබීමත් වන හෙයිනි; දෙවැනිව, කම්කරුවන්ගේ ජයග්‍රහණයේ ප්‍රතිඵලයක් වශයෙන්, ගම්බද පෙදෙස්වල වැඩකරන සහ වඩාත්ම සූරාකනු ලැබූ ජනයාගේ තත්ත්වයෙහි අප්‍රමාද හා සැලකිය යුතු වැඩි දියුණුවක් ඇතිවීම එයින් අපේක්ෂා කෙරෙන්නේය. එම වැඩි දියුණුව සම්බන්ධයෙන් බර දැරිය යුත්තේ සූරාකන්නන්ය. එවැනි ක්‍රියාමාර්ගයක් නොගෙන, කාර්මික නිර්ධන පංතියට ගම්බද පෙදෙස්වල සහයෝගය ලබා ගත නොහැකි වනු ඇත. නගරවලට ආහාර සැපයීම සහතික කළ නොහැකි වනු ඇත.

8. ධනපති ක්‍රමය විසින් අන්ත අසරණ භාවයටත්, අසමගියටත්, බොහෝ විට මධ්‍යකාලීන ස්වභාවයේ දීනත්වයටත් හෙළනු ලැබ සිටින ගම්බද වැඩකරන පොදු ජනතාව විප්ලවවාදී අරගලයට සංවිධානය කර ගැනීම සහ පුහුණු කර ගැනීම අතිශයින්ම දුෂ්කර කාර්යයකි. එම නිසා කොමියුනිස්ට් පක්ෂවල විශේෂ අවධානය ගම්බද දිස්ත්‍රික්කවල වැඩ වර්ජන අරගලය වෙතට යොමු කිරීමත්, කෘෂිකාර්මික නිර්ධනයින්ගේ සහ අර්ධ-නිර්ධනයින්ගේ මහා වැඩ වර්ජනවලට වැඩි වැඩියෙන් ආධාර දීමත්, වැඩ වර්ජන ව්‍යාපාරය දියුණු කිරීමට සෑම ආකාරයකින්ම ආධාර දීමත් අවශ්‍ය වන්නේය. ගම්බද ප්‍රදේශයේ දක්නට ලැබෙන උදාසීනත්වය පලවා හැර, එහි උද්යෝගය කුළු ගැන්වීමටද, ගම්බද පෙදෙස්වල සිටින සූරාකනු ලබන පොදු ජනතාවට පංති සංවිධානයක අවශ්‍යතාවය ගැන වටහා දෙමින් හා නාගරික කම්කරුවන් සමග ඔවුන් ඇතිකර ගන්නා සන්ධානයෙහි වැදගත්කම සිත් කාවදින හා ප්‍රායෝගික ලෙසින් පැහැදිළි, කරමින්, එම ජනතාවගේ පංති විඥනය පුබුදුවා ලීමටද හැකි වන්නේ වර්ධනය වෙමින් පවතින මහා වැඩ වර්ජන අරගලයට (යම්යම් කොන්දේසි යටතේ ගම්බද සුළු ගොවි ජනයාද එයට ඇදගත හැකිය, ඇදගත යුතුය) පමණක්ය යන්න, 1905 හා 1917 රුසියානු විප්ලවවල අත්දැකීම්වලින් හා දැන් ඒවා තවදුරටත් තහවුරු කර හා ව්‍යාප්ත කර ඇති ජර්මනියේ සහ වෙනත් දියුණු රටවල අත්දැකීම්වලින් පෙන්නුම් කෙරේ.

ගම්බද ප්‍රදේශවල වැඩ වර්ජන අරගලය සම්බන්ධයෙන් උදාසීනව සිටීමට පමණක් නොව, එයින් පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය අඩු වෙතැයි යන තර්කය ඉදිරිපත් කරමින් (කාල් කෞට්ස්කි මෙන්) ඊට විරුද්ධත්වය දක්වීමට පවා සමත් වන ඒ සමාජවාදීන්, ද්‍රෝහීන් හා පාවා දෙන්නන් ලෙසට හංවඩු තැබීමට කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ මෙම සම්මේලනය තීරණය කරයි. එම ගණයට අයත් සමාජවාදීන්, ජාත්‍යාන්මාදවාදී දෙවැනි ජාත්‍යන්තරය තුළ පමණක් නොව, ඉන් ඉවත් වූ ඉතා වැදගත් යුරෝපීය පක්ෂ තුන තුළද සිටීම අවාසනාවක් වැනිය. නිර්ධන පංතිවිප්ලවය දියුණු කිරීමට සහ එහි ජයග්‍රහණය ලෝකයේ අන් සියල්ලටම වඩා ඉහළින් තැබීමටත්, ඒ සඳහා උත්කෘෂ්ටතම පරිත්‍යාගයන් කිරීමටත්, කොමියුනිස්ට් හා කම්කරු නායකයන් ඇත්ත වශයෙන්ම සමත් වන බව ව්‍යවහාරයෙන් ඔප්පු කරන්නේ නැත්නම්, වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කිරීමෙන් හෝ ගාම්භීරතම ප්‍රකාශයන් නිකුත් කිරීමෙන් හෝ වැඩක් සිදු නොවේ. එම විප්ලවය හැර සාගතයෙන්, විනාශයෙන් හා නව අධිරාජ්‍යවාදී යුද්ධවලින් නිදහස් වීමේ වෙනත් මාර්ගයක් නොමැත.

පැරණි සමාජවාදී ව්‍යාපාරයේ නායකයන් සහ "කම්කරු රදළ පෙළැන්තියේ" නියෝජිතයන් නිර්ධන පංති ව්‍යාපාරයට පක්ෂපාත වන්නේදැයි සොයා බැලීම සඳහාද, විප්ලවකාරී අරගලයේ සංවර්ධනය හා විප්ලවවාදී විඥනය ඉතාමත් ප්‍රකටව පෙනෙන්නාවූත්, ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ (ලොකු ගොවීන්ගේ, නැතහොත්, කුලාකයන්ගේ) ප්‍රතිරෝධය ඉතාමත් දරුණු ලෙස පවතින්නාවූත්, සමාජවාදී-එකඟතාවාදීන් හා කොමියුනිස්ට්වාදී-විප්ලවවාදීන් අතර වෙනස ඉතාමත්ම පැහැදිලි ලෙස පෙනෙන්නාවූත් කාර්යාංශවල වගකිව යුතු තැන්වලට ඔවුන් සුදුසුදැයි සොයා බැලීම සඳහාද, ඔවුන් පරීක්ෂණයට භාජනය කළ යුතු බව විශේෂයෙන් පෙන්වා දිය යුතුය. සීඝ්‍රයෙන් විප්ලවකාරී තත්ත්වයකට පත්වෙමින් සිටින කම්කරු ජනතාවන් අතර තමන්ගේ නම්බුව රැක ගැනීම පිණිස, "කම්කරු රදළ පෙළැන්තියේ" ඇත්තන් බොහෝ විට කොමියුනිස්ට්වාදයට එකඟ වන බවත්, නාමික වශයෙන් එයට පක්ෂපාතිත්වය පවා දක්වන බවත් මෙහිලා සඳහන් කළ යුතුය.

9. ගම්බද පෙදෙස්වල නියෝජිත සෝවියට් සභා පිහිටුවීම, ප්‍රථමයෙන්ම, කුලී ශ්‍රමකරුවන්ගේ සහ අර්ධ-නිර්ධනයින්ගේ සෝවියට් සභා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පිහිටුවීම හැකි තරම් ඉක්මණින් ආරම්භ කිරීම පිණිස කොමියුනිස්ට් පක්ෂ ඒවාට හැකි සෑම ධෛර්යයක්ම යොදා කටයුතු කළ යුතුය. සෝවියට් සභාවලට ඒවායේ කාර්ය භාරයන් ඉටු කළ හැකි වන්නේත්, සුළු ගොවි ජනයා කෙරෙහි බලපෑමට (හා පසුව ඔවුන් ඒකාබද්ධ කර ගැනීමට) සමත් වන සේ තහවුරු විය හැකි වන්නේත් ඒවා මහා වැඩ වර්ජන අරගලය හා ඉතාමත්ම පීඩිත පංතිය සමග සම්බන්ධ වුවහොත් පමණකි. එසේද වුවත්, වැඩ වර්ජන අරගලය තවමත් සංවර්ධනය වී නොමැති නම්, එමෙන්ම, ඉඩම් හිමියන්ගේ හා ලොකු ගොවීන්ගේ තදබල පීඩනයත්, කාර්මික කම්කරුවන්ගේ හා ඔවුන්ගේ සංගම්වලින් ලැබෙන ආධාරය මඳ වීමත් යන දෙ කරුණ නිසා කෘෂිකාර්මික නිර්ධන පංතියට තවමත් ශක්තිමත් සේ සංවිධානය විය නොහැකි නම්, ගම්බද පෙදෙස්වල නියෝජිතවරුන්ගේ සෝවියට් සභා පිහිටුවීම පිණිස, කුඩා වූ හෝ කොමියුනිස්ට් කණ්ඩායම් සංවිධානය කිරීමෙන්ද, කොමියුනිස්ට්වාදයේ ඉල්ලීම් ඉතාමත් සරල ලෙසින් ඉදිරිපත් කරමින්, සූරාකෑම හා පීඩනය පිළිබඳ ඉතාමත් පැහැදිලි නිදර්ශන ගෙන හැර පෑමෙන් ඒවා සනාථ කරමින් උත්කර්ෂවත් ප්‍රචාරයක් ගෙන යාමෙන්ද, ගම්බද දිස්ත්‍රික්කවලට කාර්මික කම්කරුවන් යැවීම් ක්‍රමානුකූල ලෙස සංවිධානය කිරීමෙන්ද, යනාදී මාර්ග තුළින් කෙරෙන දීර්ඝ සූදානම් වීමක් අවශ්‍ය වන්නේය.

1920 ජූනි මස මුල් භාගයේදී ලියන ලදී

1920 ජූලි 20 ද "කොමියුනිස්ති-චෙස්කි ඉන්තෙර්නත්සියොනාල්" සඟරාවේ අංක 12 කලාපයෙහි පළ කරන ලදී

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 41, පිටු 169-182

කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනය[14]

1920 ජූලි 19 — අගෝස්තු 7

1

ජාත්‍යන්තර තත්ත්වය සහ කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ මූලික කර්තව්‍යයන් ගැන වාර්තාව ජූලි 19

(ජය ඝෝෂා නැගෙයි. පැමිණ සිටින සියල්ලෝම නැගී සිට අත්පොළසන් දෙති. කථිකයා කථාව ඇරඹීමට උත්සාහ කරන නමුත්, අත්පොළසන් හා විවිධ භාෂාවලින් නැගෙන ඝෝෂාව නොනැවතෙයි. ජය ඝෝෂාව අඩු නොවෙයි). සහෝදරවරුනි, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ මූලික කර්තව්‍යයන් ගැන වූ ප්‍රශ්න හා සම්බන්ධ ප්‍රවාද සියලුම භාෂාවලින් පළ කර තිබේ. එය කිසිවක් හාත්පසින්ම විශේෂයෙන්ම රුසියානු සහෝදරවරුන්ට) අළුත් නොවේ. එසේ වන්නේ, අපගේ විප්ලවීය ව්‍යාපාරයේ පාඩම්වල සහ අපගේ විප්ලවීය අත්දැකීම්වල එක්තරා ප්‍රධාන අංග ලක්ෂණ බටහිර රටවල් කීපයකට, බටහිර යුරෝපයට එම ප්‍රවාද සැලකිය යුතු ප්‍රමාණයෙන් විහිදුවෙන හෙයිනි. එබැවින්, සංක්ෂිප්ත දළ සටහනක් වන මගේ වාර්තාවෙන් වැඩි කොටස වෙන් වන්නේ මගේ මාතෘකාවෙහි පළමු කොටස වන ජාත්‍යන්තර තත්ත්වය ගැන කරුණු දැක්වීමටය.

දැන් පවතින සමස්ත ජාත්‍යන්තර තත්ත්වයේම හරය සමන්විත වන්නේ අධිරාජ්‍යවාදයේ ආර්ථික සම්බන්ධතාවයන්ගෙනි. ධනපති ක්‍රමයේ මෙම නවතම, ඉහළම හා අවසාන අවධිය විසිවැනි ශතවර්ෂය මුළුල්ලේම සම්පූර්ණ වී සකස් විය. ප්‍රාග්ධනය යෝධ පරිමාණයෙන් සංවර්ධනය වී තිබීම අධිරාජ්‍යවාදයේ ඉතාමත් ස්වභාව නිරූපී සහ වැදගත්ම අංග ලක්ෂණය වන බව සැබැවින්ම ඔබ සියලු දෙනාම දන්නෙහිය. නිදහස් තරඟය වෙනුවට මහා ඒකාධිකාරයන් ආදේශ වී තිබේ. සමහර අවස්ථාවලදී ධනපතියන් ඉතා ස්වල්ප දෙනෙකුට, මුළු මහත් කර්මාන්ත අංශයන්ම තමන් අතට සංකේන්ද්‍රණය කර ගත හැකි වී තිබේ. මේවා, බොහෝ අවස්ථාවල ජාත්‍යන්තර ස්වභාවයක් දරන සංයෝජිත ව්‍යාපාර, කාටල, සම්මේල සහ සංගත ව්‍යාපාර අතට පත් වන්නේය. ඒ අනුව, මූල්‍ය, දේපළ,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හිමිකම සහ අර්ධ වශයෙන් නිෂ්පාදනයේද, ක්ෂේත්‍රයන් අරක් ගත් ඒකාධිකාරීහු, තනි රටවල පමණක් නොව, ලෝකය මුළුල්ලේම සමස්ත කර්මාන්ත අංශයන්ම අත්පත් කරගෙන සිටිති. ඉතාමත් නිදහස් සමූහාණ්ඩු පවා මූල්‍යමය රාජධානි බවට පරිවර්තනය කර ගත් මහා බැංකු, මූල්‍යාධිපතියන් හා මුදල් බලවතුන් ඉතා කුඩා අතලොස්සකට අභූතපූර්ව අධිපතිත්වයක් ක්‍රියාත්මක කිරීමට පදනම සකස් වූයේ මෙයිනි. කිසිසේත්ම විප්ලවවාදී නොවූ ප්‍රංශයේ ලිසිස් වැනි ලේඛකයින් පවා යුද්ධයට පෙර මේ බව ප්‍රසිද්ධියේම පිළිගත්තේය.

විවිධ අමුද්‍රව්‍ය සම්පාදන මාර්ගයන් සහ නිෂ්පාදන මාර්ගයන් ලොකුම ධනපතියන් විසින් අල්ලා ගනු ලැබීමේ අර්ථයෙන් පමණක් නොව, යටත් විජිත ප්‍රාථමික වශයෙන් බෙදා වෙන්කර ගැනීම සම්පූර්ණ කිරීමේ අර්ථයෙන්ද මුළු ලෝකයම බෙදා වෙන්කර ගන්නා ලද කල්හි, අතලොස්සක් ධනපතියන්ගේ පූර්ණ පරිමාණ සංවර්ධනය මුදුන් පත් විය. අවුරුදු හතළිහකට පමණ පෙර, යටත් විජිතවල ජනගහනය බලවත් ධනපති රටවල් හයකට යටත් 25,00,00,000 කට තරමක් අධික විය. 1914 යුද්ධයට පෙර යටත් විජිතවල ජනගහනය 60,00,00,000 ක් යයි ගණන් බලන ලදී. එවකට අර්ධ යටත් විජිත තත්ත්වයේ පැවති පර්සියාව, තුර්කිය හා චීනය වැනි රටවල්ද මෙයට එකතු කළහොත්, එවිට, ඉතාමත් පොහොසත්, ඉතාමත් ශිෂ්ටාචාර සම්පන්න සහ නිදහස්තම රටවල යටත් විජිත ස්වභාවයෙන් ගැති වීමෙන් පීඩිතවූ ජනගහනය සම්පූර්ණ සංඛ්‍යාවක් වශයෙන් සියක් කෝටියක් වනු ඇත. යටත් විජිත ගැති භාවයෙන් ඍජු දේශපාලනමය හා නෛතික යටත් භාවයට පමණක් නොව, ඊට අමතරව, මූල්‍යමය සහ ආර්ථික ගැති භාවයේ සම්බන්ධකම් රැසකටද බැඳීම හා යුද්ධ රැසකට හසු වීමද සිදුවන්නේය යන්න, කල් තබාම අදහස් වන බව ඔබ දන්නෙහිය. එම යුද්ධ වූ කලී, බොහෝවිට, ඉතාමත් නවීන විනාශකාරී ආයුධවලින් සන්නද්ධ යුරෝපීය හා ඇමෙරිකානු යුද්ධ හමුදා විසින් යටත් විජිත රටවල නිරායුධ සහ ආරක්ෂා විරහිත වැසියන් ඝාතනය කරනු ලබන හුදු සංහාරයන් වූ නිසා ඒවා යුද්ධ වශයෙන් නොසැලකිණ.

1914-1918 ප්‍රථම අධිරාජ්‍යවාදී යුද්ධය ඇති වූයේ මුළු ලෝකයම මෙසේ බෙදා ගැනීමේ, ධනපති ඒකාධිකාරවල මෙම ආධිපත්‍යයේ, එක් එක් රටක තිබෙන දෙකක්, තුනක්, හතරක් හෝ පහක් වූ ඉතා විශාල බැංකු ඉතා ස්වල්පයක් විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම මහා බලයේ අනිවාර්ය ප්‍රතිඵලය වශයෙනි. මෙම යුද්ධය කරන ලද්දේ මුළු ලෝකයම නැවත බෙදා ගැනීම සඳහාය. එම යුද්ධය කරන ලද්දේ සමස්ත ලෝකයම කොල්ලකෑමේ, එහි බෙල්ල ඇඹරවීමේ සහ එය සූරාකෑමේ අවස්ථාව ලැබිය යුත්තේ ලොකුම රාජ්‍යයන්ගේ කුඩා කණ්ඩායම් දෙක අතරින් කුමකටද

යනු, බ්‍රිතාන්‍ය සහ කණ්ඩායමටද, නැතහොත්, ජර්මනිය සහ කණ්ඩායමට ද යනු තීරණය කිරීමටය. බ්‍රිතාන්‍ය කණ්ඩායමට වාසි වන සේ යුද්ධයෙන් මෙම ප්‍රශ්නය විසඳුණු බව ඔබ දන්නෙහිය. එමෙන්ම මෙම යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් ධනපති ප්‍රතිවිරෝධතාවයන් සියල්ලම අපරිමිත පරිමාණයෙන් තියුණු වී තිබේ. යුද්ධය එක පහරින්ම ලෝවැස්සන් 25,00,00,000 ක් පමණ දෙනා යටත් විජිත හා සමාන තත්වයකට තල්ලු කර දැම්මේය. 13,00,00,000 ක් ලෙසට ගණන් ගත හැකි රුසියාවේ ජනගහනයද, මුළු ගණන 12,00,00,000 ක් වන ඔස්ත්‍රෝ-හංගේරියාවේ, ජර්මනියේ සහ බුල්ගේරියාවේ ජනගහනයද මෙයට ඇතුළත්ය. එයින් අදහස් වන්නේ එම 25,00,00,000 ක ජනගහනය සිටින රටවල් අතර ජර්මනිය වැනි ඉතාමත් දියුණු, ඉතාමත් උගත්, ඉතාමත් උසස් සංස්කෘතියක් ඇති ජනතාවන් සිටින හා නවීන තාක්ෂණික ප්‍රගතියට සමාන වන මට්ටමකට පත් රටවල් සමහරක්ද වන බවය. වර්සයිල්ස් ගිවිසුම මගින් යුද්ධය විසින් මෙම රටවල් මත පටවන ලද කොන්දේසි නිසා දියුණු ජනතාවන් යටත් විජිත ගැතිභාවයේ, දරිද්‍රතාවයේ, සාගතයේ, විනාශයේ හා අයිතිවාසිකම් අහිමි වීමේ තත්ත්වයට පහත හෙළන ලදී. ශීලාචාර ජාතියක් කිසි කලෙකත් නොවිසූ තත්ත්වයන් යටතට ඔවුන් පත්කරන මෙම ගිවිසුම පරම්පරා ගණනක්ම හසුවන සේ එම ජනතාවන් බැඳ තබයි. යුද්ධයෙන් පසු ලෝකයේ පින්තූරය මෙසේය: 125 කෝටියක් ජනයා එක පහරින්ම යටත් විජිත වියගසට බඳින ලදී. ලෝකය බෙදා ගැනීමට පෙර, ඒකාධිකාරයන්ගේ පාලනය ඇති වීමට පෙර, ධනපති ක්‍රමයට බලවත් යුද්ධ නොමැතිව සාපේක්ෂ වශයෙන් සාමකාමී ලෙස සංවර්ධනය වීමට හැකිව තිබුණු අවුරුදු පණහකට පමණ පෙර කාලයේ, වරක් සාමයට ලැදිකම ගැන පුරසාරම් දෙඩූ සහ එසේ කිරීමට කිසියම් අයිතියක්ද තිබුණු ධනපති ක්‍රමයේ මිලේච්ඡ සූරා කෑමට එම ජනයා හසු කරන ලදී.

මෙම "සාමකාමී" කාලයෙන් පසුව අද, භයංකර ආකාරයෙන් පීඩනය උත්සන්න කෙරෙන බවද, පෙරට වඩා ඉතාමත් දරුණු යටත් විජිතමය සහ යුද්ධමය පීඩනයක් දක්වා ආපසු ගමන් කරන බවද දක්නට ලැබේ. වර්සයිල්ස් ගිවිසුම විසින් ජර්මනිය සහ පරාජිත වූ අනෙකුත් රටවල් පත් කරන ලද්දේ ඒවායේ ආර්ථික පැවැත්ම කිසිසේත් ගෙන යා නොහැකි, ඒවාට අයිතිවාසිකම් සියල්ලම අහිමි වන හා ඒවාට අවමන් සිදුවන තත්ත්වයටය.

වාසි ලබාගත් ජාතීන්ගේ ගණන කීයද? මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමේදී, යුද්ධයෙන් සම්පූර්ණයෙන්ම වාසි ලබාගත් එකම රට වන හා ඉහතදී ණය බරින් මිරිකී සිටි, එහෙත්, දැන් පොදු වශයෙන් ණය හිමියෙක් බවට පත්ව සිටින එක්සත් ජනපදයෙහි ජනගහනය 10,00,00,000 කට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නොවැඩී බව සඳහන් කළ යුතුය. යුරෝපීය-ඇමෙරිකානු සංවිධානයෙන් ඉවත්ව සිටීමෙන්, දූවැන්ත ආසියා මහාද්වීපය ග්‍රහණය කොට මහත් වාසි සලසාගත් ජපානයේ ජනගහනය 5,00,00,000 ක් වේ. ඉහත රටවල් ලබට වැඩියෙන්ම වාසි ලබාගත් රටවූ බ්‍රිතාන්‍යයෙහි ජනගහනය 5,00,00,000 ක් පමණ ඇත. යුද්ධයෙන් ධනවත් වූ මධ්‍යස්ථ රටවල ඉතාමත් කුඩා ජනගහනයද මෙයට එකතු කළ හොත්, අපට 25,00,00,000 ක පමණ සම්පූර්ණ ගණනක් එකතුව වශයෙන් ලැබෙනු ඇත.

මෙහි ඔබ වෙත ඉදිරිපත් කර ඇත්තේ, අධිරාජ්‍යවාදී යුද්ධයෙන් පසු මතු වූ ලෝක පින්තූරයෙහි දළ සටහන්ය. පීඩිත යටත් විජිතවල, කැබලි-වලට වෙන් කරනු ලබන පර්සියාව, තුර්කිය හා චීනය වැනි රටවල සහ පරාජය වීමෙන් පසු යටත් විජිත තත්ත්වයට තල්ලු කර දමනු ලැබූ රටවල වැසියන් 125,00,00,000 ක් ඇත. පැරණි තත්ත්වය රැකගත්, එහෙත්, ආර්ථික වශයෙන් ඇමෙරිකාවෙන් යැපෙන තත්ත්වයට පත් වූ රටවල 25,00,00,000 කට ආසන්න ජනකායක් වෙසෙති. මුළු ලෝකයම සම්බන්ධ කර ගත් යුද්ධය, කිසිම රාජ්‍යයකට මධ්‍යස්ථව සිටීමට ඉඩ නොදෙන තත්ත්වයක් ඇති කළ පසු, යුද්ධ කාලය තුළ එම රටවල් යුද්ධමය වශයෙන් ගැති තත්ත්වයට පත්වූහ. අවසාන වශයෙන් ලෝකය බෙදා ගැනීමෙන් වාසි අත්කර ගත් එකම පිරිස, සැබැවින්ම ඉහළ ස්ථරයට අයත් ධනපති-යන් පමණක් වන රටවල වැසියන් 25,00,00,000 කට නොවැඩි සංඛ්‍යා-වක් ඇත. මේ අනුව, ලෝකයේ මුළු ජනගහනය වශයෙන් 175 කොටියක එකතුවක් අපට ලැබේ. විප්ලවය දක්වා මහ හෙළි කරන ධනපති ක්‍රමයේ සහ අධිරාජ්‍යවාදයේ ප්‍රතිවිරෝධතාවයන් සියල්ලද, අපේ සභාපතිවරයා සඳහන් කළ කරුණුවූ, දෙවැනි ජාත්‍යන්තරයට විරුද්ධව කරන ලද වේගවත් අරගලය දක්වා මහ පෙන්වූ කම්කරු පංති ව්‍යාපාරයේ මූලික ප්‍රතිවිරෝධතාවයන් සියල්ලද යන මේ හැම එකක්ම, ලෝකයේ ජනගහ-නය බෙදා වෙන්කර ගැනීම සමග සම්බන්ධ වී තිබෙන නිසා මෙම ලෝක පින්තූරය ඔබගේ සිහියට නගනු කැමැත්තෙමි.

මෙම සංඛ්‍යාවලින් ලෝකයේ පින්තූරය ඉදිරිපත් කෙරෙන්නේ ආසන්න සහ දළ සටහනක් ලෙසින් පමණක් බව ඇත්තය. එහෙත් සහෝදරවරුනි, මුළු ලෝක ජනගහනය මෙසේ බෙදී ගොස් තිබෙන විට, මූල්‍ය ප්‍රාග්ධනයේ, ධනපති ඒකාධිකාරයන්ගේ සූරාකෑම කීප ගුණය-කින් වැඩි වී තිබීම ස්වාභාවිකය.

සිදුවී තිබෙන්නේ යටත් විජිත සහ පරාජිත රටවල් ගැති තත්ත්වයට පහත වැටීම පමණක් නොවේ. සෑම ජයග්‍රාහී ජාතියක්ම තුළ ප්‍රතිවිරෝධ-තාවයන් තවත් උග්‍ර වී තිබේ. ධනපති ප්‍රතිවිරෝධතාවයන් සියල්ලම

උග්‍රවී තිබේ. නිදර්ශන කීපයක් ඉදිරිපත් කිරීමෙන් මම මෙය කෙටියෙන් පැහැදිලි කරන්නෙමි.

ජාතික ණය ගැන සිතා බලමු. 1914 හා 1920 අතර කාලය තුළ ප්‍රධාන යුරෝපීය රාජ්‍යයන්ගේ ණය සත් ගුණය ඉක්මවා වැඩි වූ බව අපි දන්නෙමු. තවත් ආර්ථික මූලාශ්‍රයක් ගැන, විශේෂයෙන්ම වැදගත් මූලාශ්‍රයක් ගැන සඳහන් කරන්නෙමි. බ්‍රිතාන්‍ය රාජ්‍යතාන්ත්‍රිකයෙක් හා "සාමයේ ආර්ථික ඵලවිපාක" නැමති කෘතියේ කතුවරයා වූ කීන්ස්, ඔහුගේ ආණ්ඩුවේ උපදෙස් අනුව වර්සයිල්ස් සාම සාකච්ඡාවලට සහභාගි වී, එහිදීම, ඉඳුරාම ධනපති දෘෂ්ටි කෝණයෙන් මාතෘකාව ගැන සවිස්තර ලෙස, පියවරෙන් පියවර අධ්‍යයනය කළ අතර, ආර්ථික විද්‍යාඥයෙක් ලෙසට සාකච්ඡා සභාවට සහභාගි විය. විප්ලවවාදී කොමියුනිස්ට්වාදියෙකුට හෝ බැස ගතහැකි ඕනෑම නිගමනයකට වඩා හරබර, ඊට වඩා සිත්, කාවදින හා වඩාත් උපදේශාත්මක වන නිගමන ඔහු විසින් ඉදිරිපත් කරන ලදී. ඔහු සුප්‍රසිද්ධ ධනපතියෙක්ද, බොල්ෂෙවික්වාදයේ පරම සතුරෙක්ද, බ්‍රිතාන්‍ය නොසන්ඩාලයෙක් වන ඔහුගේ සිතැඟි ලෙසට බොල්ෂෙවික්වාදය මහා භයානක, රෞද්‍ර සහ මෘග දෙයක් යයි සිතන්නෙක්ද වන නිසා ඔහුගේ නිගමන වැදගත් වන්නේය. වර්සයිල්ස් සාමයට පසුව, යුරෝපය සහ මුළු ලෝකයම බංකොලොත්භාවය කරා ගමන් කරන්නේ යයි කීන්ස් නිගම-නය කළේය. ඔහු ඉල්ලා අස්වී, "නුඹලා කරන්නේ පිස්සුවකි" යි කියමින් ඔහුගේ පොතෙන් ආණ්ඩුවේ මුහුණට දමා ගසා ඇත. ඔහු ගෙන හැර පාන සංඛ්‍යා විස්තර ඉදිරිපත් කරන්නෙමි. ඒවා පහත සඳහන් පරිදි සම්පිණ්ඩනය කළ හැකිය.

ප්‍රධාන බලවතුන් අතර වැඩී තිබෙන ණයකරු — ණය හිමි සම්බන්ධ-කම් මොනවාද? පවුමට රූබල් දහය බැගින් ගනිමින් මම රන් පවුම් රත්රන් රූබල්වලට පරිවර්තනය කර ගන්නෙමි. එවිට අපට ලැබෙන ගණන් හිලව් මෙසේය: ඇමෙරිකා එක්සත් ජනපදයට කෝටි 1,900 ක වත්කම් ඇත. වගකීම් කිසිවක් නැත. යුද්ධයට පෙර එය බ්‍රිතාන්‍යයට ණය වී තිබුණේය. දැන් ලෝකයේ ඇත්තේ ස්වාධීන ලෙස කටයුතු කිරීමෙහි පොහොසත් රටවල් දෙකක් පමණකැයි, එනම්, බ්‍රිතාන්‍යය හා ඇමෙරි-කාව පමණකැයි, ලෙවි සහෝදරයා, ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ මෑත පැවැත්වුන සම්මේලනයට ඔහු 1920 අප්‍රේල් 14 දින ඉදිරිපත් කළ වාර්තා-වෙන් නිවැරදි ලෙස පෙන්වා දුන්නේය. මුදල් අතින් නිරපේක්ෂ වශයෙන් ස්වාධීන වන්නේ ඇමෙරිකාව පමණකි. යුද්ධයට පෙර ඇය ණයකරු රටක් වූවාය. දැන් ඇය ණය හිමියෙක් පමණකි. ලෝකයේ ඇති අනිත් සියලුම බලවත් රටවල් ණය කරුවන් ය. බ්‍රිතාන්‍යයේ වත්කම් එකතුව කෝටි 1,700 ක් හා වගකීම් කෝටි 800 ක් වන තත්ත්වයට ඇය පහත

https://liberationbase.wordpress.com

වැටී තිබේ. ඇය ණයකාර ජාතියක් වීමේ තත්ත්වය දක්වා දැනටමත් අඩ දුරක් ගොස් ඇත. තවද, ඇගේ වත්කම්වලට, ඇට රුසියාව ණය වී තිබෙන කෝටි 600 ක් පමණ මුදලද ඇතුළත්ය. යුද්ධ කාලය තුළදී රුසියාව විසින් ලබා ගන්නා ලද යුද්ධ භාණ්ඩද මෙම ණය මුදලට අන්තර්ගත කර තිබේ. රුසියානු සෝවියට් ආණ්ඩුවේ නියෝජිතයා ලෙසට ක්‍රාසින් මැතදී ලොයිඩ් ජෝජ් සමග ණය ගිවිසුම් ගැන සාකච්ඡා කළ අවස්ථාවේදී, ඔහු විද්‍යාඥයන්ට සහ දේශපාලනඥයන්ට, බ්‍රිතාන්‍ය ආණ්ඩු නායකයන්ට පැහැදිලි ලෙස කීවේ, ඔවුන් මෙම ණය මුදල් ආපසු ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඔවුන් එයින් මහත් මුළාවකට පත්ව ඇති බවයි. බ්‍රිතාන්‍ය රාජ්‍ය තාන්ත්‍රික කීන්ස් දැනටමත් මෙම මුළාව අනාවරණය කර තිබේ.

මෙය වූ කලී රුසියානු විප්ලවවාදී ආණ්ඩුව මෙම ණය ගෙවීමට අකැමති වීම, නැතහොත්, ඊට කිසිසේත් සම්බන්ධ ප්‍රශ්නයක් නොවේ. මෙම ණය මුදල් ගිණි පොලියට දෙන ලද අතර, දැනට මුදල මෙන් විසි ගුණයක් ගෙවා තිබෙන හෙයින් කිසිම ආණ්ඩුවක් එය නොගෙවනු ඇත. රුසියානු විප්ලවීය ව්‍යාපාරයට කිසිම හිතවත්කමක් නොදක්වන ඒ ධනපති කීන්ස්ම මෙසේ කීවේය: ‘‘මෙම ණය මුදල් ගණනකට ගත නොහැකි බව පැහැදි-පැහැදිලිය.’’

ප්‍රංශය හා සම්බන්ධයෙන් කීන්ස් පහත දැක්වෙන සංඛ්‍යාවන් සඳහන් කරයි: ඇගේ වත්කම් කෝටි 350 ක් වන අතර ඇගේ වගකීම් කෝටි 1,050 කි! මෙම තත්ත්වයට වැටී තිබෙන්නේ වරක් ලෝකයට ණය දෙන්නා වශයෙන් ප්‍රංශවරුන්ම විසින් විස්තර කරන ලද රටක්ය. ඇ එසේ හඳුන්වන ලද්දේ ඇ සතුව තිබූ ‘‘ඉතිරි කිරීම්’’ එතරම් ඉමහත් වූ හෙයිනි. යටත් විජිතවලින් හා මූල්‍ය කටයුතු මගින් උදුරාගත් ධනය වූ යෝධ පරිමාණ ප්‍රාග්ධනයක් ඇය සතුව තිබුණ හෙයින්, විශේෂයෙන්ම රුසියාවට සිය කෝටි ගණනින් ණය මුදල් දීමට ඇයට හැකි විය. මෙම ණය මුදල්-වලින් අති දැවැන්ත ආදයමක් ලැබුණේය. එය එසේ වුවත්, ජයග්‍රහණය ලබා සිටියත් ප්‍රංශය ණයකාර තත්ත්වයට වැටී ඇත.

කොමියුනිස්ට්වාදියෙක් වන බ්‍රාවුන් සහෝදරයා ලියූ ඔහුගේ ‘‘යුද්ධ ණය ගෙවිය යුත්තේ කවුද?’’ (ලයිප්සිග්, 1920) යන පොතෙහි උපුටා දක්වා ඇති ඇමෙරිකානු ධනපති මූලාශ්‍රයක් අනුව ණය සහ ජාතික ආදයම් අතර අනුපාතය මෙසේ තක්සේරු කර ඇත: බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය යන ජයග්‍රාහක රටවල ණය ඒවායේ ජාතික ධනයෙන් සියයට 50 ට වැඩි අනුපාතයක් පෙන්වයි. ඉතාලියේ එය සියයට 60 හා 70 අතර වේ. රුසියාවේ සියයට 90 කි. කෙසේ හෝ වේවා, ඔබ දන්නා පරිදි, මෙම ණය මුදල් නිසා අප කැළඹෙන්නේ නැත. එසේ වන්නේ අප කීන්ස්ගේ අගේ ඇති

උපදේශය අනුව කටයුතු කළ නිසාය. ඔහුගේ පොත පළ වීමට මඳ කලකට පෙර අපි අපගේ ණය සියල්ලම අවලංගු කෙළෙමු. (අත්පොළසන්.)

නමුත් කීන්ස්, නොසන්ඩාලයාගේ සුපුරුදු ඔල්මාදය පෙන්නුම් කරන බව මෙහිදී සඳහන් කළ යුතුය. සියලුම ණය අවලංගු කළ යුතු බවට උපදෙස් දෙන ඔහු, ප්‍රංශයට නම් ඇත්ත වශයෙන්ම එයින් සිදුවන්නේ වාසියක් පමණක් බවත්, කොහොම නමුත් රුසියාවෙන් කිසිවක් ලබාගත නොහැකි නිසා බ්‍රිතාන්‍යයට නම් සැබැවින්ම විශාල පාඩුවක් නොවන බවත් වැඩිදු-රටත් කියයි. ඇමෙරිකාවට සෑහෙන අලාභයක් සිදුවෙනු ඇති නමුත්, ඇමෙරිකාව ‘‘ත්‍යාගශීලී’’ වනු ඇතැයි කීන්ස් අපේක්ෂා කරයි! මෙම කාරණයෙහිදී අපගේ අදහස් කීන්ස්ගේ සහ වෙනත් සුළු ධනපති සමාදාන-වාදීන්ගේ අදහස්වලට වඩා වෙනස් වන්නේය. ණය අවලංගු කිරීම සඳහා වෙනත් දෙයක් සිදුවන තෙක් සිටීමට ඔවුන් ප්‍රමාදී විය යුතු බවත්, ධනපති මහත්වරුන්ගේ ‘‘ත්‍යාගශීලී භාවය’’ ගැන විශ්වාසය තබනවා වෙනුවට වෙනත් පැත්තක් බලා වැඩ කිරීමට උත්සාහ කිරීමට සිදුවනු ඇති බවත් අපි කල්පනා කරමු.

ජයග්‍රාහී ජාතීන්ටද නොදැරිය හැකි තත්ත්වයක් අධිරාජ්‍යවාදී යුද්ධය නිසා ඇති වී තිබෙන බව මෙම සංඛ්‍යාවන් කීපයෙන් පෙනේ. වේතන සහ මිළ වැඩි වීම් අතර මහා පරතරයෙන්ද මෙය තවදුරටත් පැහැදිලි වේ. නැගී එන විප්ලවයෙන් ලෝකය මුළුල්ලේම ධනපති ක්‍රමය ආරක්ෂා කිරීමේ වගකීම පැවරී තිබෙන උත්තරීතර ආර්ථික මණ්ඩලය මෙම අවුරුද්-දේ මාර්තු 8 දින යෝජනාවක් සම්මත කළේය. එම යෝජනාව කෙළවර වූයේ ක්‍රමානුකූල භාවය, කාර්යශීලී භාවය සහ අරපිරිමැස්ම සඳහා කරන ආයාචනයකිනි. නමුත් මේවා කළ හැකි වන්නේ කම්කරුවන් ප්‍රාග්ධනයේ වහලුන් වී සිටියහොත් බවද එම යෝජනාවෙන් අදහස් විය. එන්ටෙන්ට් මිත්‍ර ගිවිසුමේ සහ මුළු ධනපති ලෝකයේම ආයතනය වූ උත්තරීතර ආර්ථික මණ්ඩලය විසින් පහත සඳහන් සාරාංශය ඉදිරිපත් කෙරිනි.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ආහාර මිළ සාමාන්‍යයෙන් සියයට 120 කින් ඉහළ ගිය අතර වේතන වැඩි වූයේ සියයට 100 කින් පමණකි. බ්‍රිතා-න්‍යයේ ආහාර මිළ සියයට 170 කින් ඉහළ ගිය අතර වේතන සියයට 130 කින් වැඩි විය. ප්‍රංශයේ ආහාර මිළ — සියයට 300, වේතන — සියයට 200. ජපානයේ ආහාර මිළ — සියයට 130 හා වේතන — සියයට 60 කි. (බ්‍රවුන් සහෝදරයාගේ පොතෙහි සඳහන් සංඛ්‍යාවන් සහ 1920 මාර්තු 10 දින ‘‘ටෛම්ස්’’ පත්‍රයේ[15] පළ කෙරුණු උත්තරීතර ආර්ථික මණ්ඩලයේ සංඛ්‍යාවන් ගැන මම විශ්ලේෂණය කෙළෙම්).

මෙම තත්ත්වයන් යටතේ කම්කරුවන්ගේ තත්ත්වය නොඉවසිය හැකි වන හෙයින් නැගී එන කම්කරු නොරිස්සුම, වර්ධනය වන විප්ලව-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වාදී චිත්ත වේගය හා අදහස් සහ වැඩි වන සාංසිද්ධික පොදුජන වැඩ වර්ජන වැලැක්විය නොහැකි බව පැහැදිලිය. ධනපතියන් යුද්ධය මගින් සුදුමාකාර තරමින් ධනවත් වී සිටින බව හා යුද්ධ වියදම් හා ණය බර කම්කරුවන්ගේ කර පිට දමන බව කම්කරුවන්ට ඔවුන්ගේම අත්දැකීම්වලින් අවබෝධ වන්නේය. ''භයානක උද්සෝෂකයන්'' ගෙන් නිදහස් වීමේ අටියෙන් තවත් කොමියුනිස්ට්වරුන් 500 ක් ඇමෙරිකාවෙන් නෙරපා රුසියාවට එවීමට එරටට උවමනා වී තිබෙන බව එහි සිට මෑතදී ලැබුණු කේබල් පණිවුඩයකින් අපි දැන ගත්තෙමු.

''උද්සෝෂකයින්'' 500 ක් නොව රුසියානු, ඇමෙරිකානු, ජපන් සහ ප්‍රංශ උද්සෝෂකයන් 5,00,000 ක් ඇමෙරිකාවෙන් නෙරපා අප රටට එව්වත්, බඩු මිළ හා වේතන අතර පරතරය තවදුරටත් පවතිනු ඇති නිසා, ඒ ගැන කිසිවක් කිරීමට ඔවුන් අපොහොසත් වන නිසා, එයින් වෙනසක් සිදු නොවනු ඇත. ඔවුන්ට ඒ ගැන කිසිවක් කළ නොහැකි වන්නේ එහි පෞද්ගලික දේපළ ඉතාමත් තදින් ආරක්ෂා කර, ''ශුද්ධත්වයට'' පත් කර තිබෙන හෙයිනි. එය අමතක නොකළ යුතුය. මන්දයත්, සූරාකන්නන්ගේ පෞද්ගලික දේපළ නැති කර තිබෙන්නේ රුසියාවේ පමණක් වන හෙයිනි. බඩු මිළ සහ වේතන අතර පරතරය ගැන ධනපතියන්ට කළ හැකි වන කිසිවක් නැත. එසේම, කම්කරුවන්ට කලින් ලැබුණු වේතනයෙන් ජීවත් වීමටද නුපුළුවන. මෙම උවදුරට විරුද්ධව ක්‍රියා කිරීමේ පැරණි විධික්‍රමවලින් වැඩක් නොවේ. ''පෞද්ගලික දේපළ ශුද්ධ වස්තුවක්'' වන නිසා තනි වැඩ වර්ජනවලින්, පාර්ලිමේන්තු අරගලයෙන්, නැතහොත්, ඡන්දයෙන් කිසි අර්ථයක් ඉටු කර ගත හැකි නොවේ. අනිත් අතට ධනපතියන් ගොඩ ගසා තිබෙන ණය කොතරම්ද යත්, මුළු ලෝකයම මිනිසුන් අතලොස්සකගේ බන්ධනයට හසු වී තිබේ. ඒ අතර, කම්කරුවන්ගේ ජීවන තත්ත්වයන් එන්න එන්නම වඩ වඩාත් නොඉවසිය හැකි වේ. සූරා කන්නන්ගේ ''පෞද්ගලික දේපළ'' අහෝසි කිරීම හැර වෙනත් ගැළවීමේ මගක් නැත. නිල කාර්මික කොටස් අපේක්ෂා කළාක් මෙන්-බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු අපනයන මිළ දෙගුණයක් වී තිබෙන බව ලැපින්ස්කි සහෝදරයා ඔහුගේ ''බ්‍රිතාන්‍යය සහ ලෝක විප්ලවය'' නැමති කුඩා පොතෙන් පෙන්වා දෙයි. එම පොතෙන් ගත් වටිනා කොටස් අපගේ ''විදේශ කටයුතු භාර මහජන කොමිසාර් අංශයේ නිවේදන පත්‍රිකාවේ'' [16] 1920 පෙබරවාරි කලාපය මගින් පළ කරන ලදී.

ලැන්කෂයර්හි තත්ත්වය කොතෙක් දුර ගොස් තිබේද යත්, කොටස් ආධිකාය සියයට 400 කට ඉහළ නැග ඇත. බැංකු ලාභ යටත්පිරිසෙයින් සියයට 40-50 තරම්වත් ඇත. බැංකු ලාභ තීරණය කිරීමේදී, ලාභවලින් ලොකු කොටස ලාභ වශයෙන් නොහඳුන්වා, ඒවා ප්‍රසාද දීමනා, කොමිස් මුදල්, ආදිය ලෙසට සඟවා තැබීම සියලුම බැංකුවල නිලධාරීන්ට කළ හැකි බවද අමතර වශයෙන් සටහන් කර ගත යුතුය. ඉතා සුළු අතලොස්සක් පිරිසකගේ ධනය විස්මය ජනක තරම් වර්ධනය වී තිබෙන බවත්, ඔවුන්ගේ සුඛෝපභෝගිත්වය වර්ණනා විෂයාතික්‍රාන්ත බවත්, ඒ අතර කම්කරු පංතියේ දුප්පත්කම දිගටම වැඩි වන බවත් මෙහිදීද අවිවාදී ආර්ථික කරුණුවලින් ඔප්පු වන්නේය. මා මෙහි ඉහත සඳහන් කළ ලෙවි සහෝදරයාගේ වාර්තාවෙන් ඔහු ඉතා හොඳින් පැහැදිලි කරන තවත් වැදගත් කරුණක් අපි විශේෂයෙන්ම සටහන් කර ගත යුත්තෙමු. එම කරුණ නම් මුදලේ අගය වෙනස් වීමය. ණය, නෝට්ටු මුදල් නිකුතුව ආදිය නිසා සෑම තන්හිම මුදලෙහි අගය අඩු වී තිබේ. ඩොලරය හා සමග සසඳන කල බ්‍රිතාන්‍යයේ ව්‍යවහාර මුදල්වල අගය තුනෙන් පංගුවකින් පමණ ක්ෂය වී තිබෙන බවත්, ප්‍රංශයේ හා ඉතාලියේ එය තුනෙන් දෙකකින් ක්ෂය වී තිබෙන බවත්, ජර්මනියේ එය ක්ෂය වීම සියයට 96 ක් තරම් අධික බවත් මා දැනටමත් සඳහන් කර ඇති ඒ ධනපති මූලාශ්‍රයම, එනම්, උත්තරීතර ආර්ථික මණ්ඩලයේ 1920 මාර්තු 8 දින ප්‍රකාශයම ගණන් බලා ඇත.

ලෝක ධනපති ආර්ථිකයේ ''යන්ත්‍රය'' කැබලිවලට බිඳී යන බව මෙම කරුණෙන් පෙනේ. ධනපති ක්‍රමය යටතේ අමුද්‍රව්‍යය ලබාගැනීමට හා වෙළෙඳ භාණ්ඩ අලෙවි කිරීමට පිටිහල් වන වෙළෙඳ සම්බන්ධකම් තවදුරටත් පැවතිය නොහැක. රටවල් ගණනාවක් එක රටකට යටත් වූ තත්ත්වය පදනම් කර ගෙන ඒවාට තවදුරටත් පැවතිය හැකි නොවේ. එයට හේතුව මුදල්වල අගය වෙනස් වී තිබීමය. ස්වකීය භාණ්ඩ විකුණා අමුද්‍රව්‍ය ලබා ගැනීමෙන් තොරව කිසිම ධනවත් රටකට පැවතීමට හෝ වෙළෙඳාම් කිරීමට හෝ නොපුළුවන.

මේ අනුව, සියලුම රටවලට අධිපති වූ, ඉතාමත්ම පොහොසත් රටක් වූ ඇමෙරිකාවට මිළට ගැනීම හෝ අලෙවිය හෝ කළ නොහැකි වන තත්ත්වයක් අපට දක්නට ලැබේ. වර්සයිල්ස් සාකච්ඡාවල සෑම කටයුත්තකටම සහභාගි වූ ඒ කීන්ස්ම, එම නොපුළුවන්කම පිළිගත්තේය. ඔහු ධනපති ක්‍රමය ආරක්ෂා කිරීමේ කොතරම් දෘඪතර අධිෂ්ඨානයකින් යුක්තව සිටියත්, ඔහු බොල්ෂෙවික්වාදය කෙරෙහි මහත් වෛරයකින් සිටියත් එය පිළි ගත්තේය. කිසිම කොමියුනිස්ට් ප්‍රකාශනයක්, නැතහොත්, කිසිම විප්ලවවාදී ප්‍රකාශනයක් කීන්ස්ගේ පොතෙහි, විල්සන් හා ''විල්සන්වාදය'' ක්‍රියාත්මක වන ආකාරය ගැන කියන පිටු තරම් බලවත් නොවන බව මම අදහස් කරමි. කීන්ස් වැනි නොසන්ඩාලයන්ගේ හා සමාදනවාදීන්ගේත් ''කරුණු දහතර''[17] වන්දනාමාන කළා වූ සහ විල්සන්ගේ ප්‍රතිපත්තියේ ''මුල්'' ගැන ''වියත්'' ග්‍රන්ථයන් පවා කළ දෙවැනි ජාත්‍යන්තරයේ (හා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

“දෙක හමාරේ” ජාත්‍යන්තරයේ[18] පවා) වීරයන්ගේත්, ආදර්ශ චරිතය වූයේ විල්සන්ය. විල්සන් “සමාජ සාමය” බේරා ගනු ඇතැයිද, සූරාකන්නන් හා සූරාකනු ලබන්නන් සමගි කරනු ඇතැයිද, සමාජ ප්‍රතිසංස්කරණ ඉටු කරනු ඇතැයිද ඔවුහු බලාපොරොත්තු වූහ. විල්සන් මෝඩයෙකු වූ සැටි හා ක්ලෙමන්සො සහ ලොයිඩ් ජෝජ් විසින් ප්‍රතිමූර්තිමත් කරන ලද ප්‍රාග්ධනයේ ප්‍රායෝගික, වෙළෙඳ සහ මුදලාලි ප්‍රතිපත්තිය සමග සට්ටනයවූ ප්‍රථම වතාවෙහිම මෙම මායා මත සියල්ලම සුනු විසුනු වී ගිය සැටි කීන්ස් විචිත්‍රාකාරයෙන් පෙන්නුම් කළේය. විල්සන්ගේ ප්‍රතිපත්තියේ “මුල්” රැඳී තිබුණේ වැදිබණ දෙඩීම, සුළු ධනපති වදන් හරඹය සහ පංති අරගලය ගැන වටහා ගැනීමට ඇති අන්ත නොහැකියාව තුළ බව කම්කරු පොදුජනතාවට ඔවුන්ගේම අත්දැකීම් තුළින් අන් කවර දටත් වඩා හොඳින් පැහැදිලි ලෙස දැක ගත හැකිය. හුදෙක් කීන්ස්ගේ පොත කියවූ පමණින් උගත් බොරු පණ්ඩිතයන්ට ඒ බව දැක ගත හැක.

මේ සියල්ලෙහිම ප්‍රතිඵලයක් වශයෙන්, නොවැලැක්විය හැකි ලෙසට හා ස්වාභාවික වශයෙන්ම ඉස්මතු වූ මූලික තත්ත්වයන් දෙකකි. එක් අතකින් පොදු ජනතාවගේ දුප්පත්කම විස්ම උපදවන තරමින් වැඩි වී තිබේ. මූලික වශයෙන්ම කෝටි 125 ක් ජනතාව අතර, එනම්, ලෝක ජනගහනයෙන් සියයට 70 ක් අතර දුප්පත්කම එසේ වැඩි වී තිබේ. මොවුහු, නීතිමය අයිතිවාසිකම් අහිමි වැසියන් සිටින යටත් විජිත සහ ගැති රටවල හා මූල්‍ය මංකොල්ල කරුවන්ට ආණ්ඩුබලය භාර කෙරුණු “භාර” රටවල ජනතාව වෙති. තවද, පරාජිත රටවල් වහල් තත්ත්වයට පත්කිරීම වර්සයිල්ස් ගිවිසුමෙන් හා රුසියාව සම්බන්ධ වූ රහස් ගිවිසුම්වලින්ද අනුමත කර තිබේ. නමුත් රුසියාව හා සම්බන්ධ එම ගිවිසුම්, සමහර විට වටිනාකම අතින් බලන කල, අප සිය කෝටි ගණනින් ණය වී සිටින බව කියන කඩදසිවලට සම වන බව ඇත්තය. එකම නීතිමය ක්‍රියාවක් මගින් කෝටි 125 ක් ජනයා මංකොල්ලයට, වහල්බවට, ගැතිකමට, දරිද්‍රතාවයට හා සාගින්නට ගොදුරු කෙරුණු බව ලෝක ඉතිහාසයේ ප්‍රථම වරට අපට දක්නට ලැබිණ.

අනිත් අතට, එක් එක් ණය හිමි රටෙහි කම්කරුවෝ නොඉවසිය හැකි තත්ත්වයකට පත්ව සිටිති. යුද්ධය නිසා අභූතපූර්ව පරිමාණයෙන් සියලුම ධනපති ප්‍රතිවිරෝධතාවයන් උග්‍ර වී තිබේ. මෙය නොනවතීම වර්ධනය වන උත්සන්න විප්ලවවාදී නොසන්සුන්තාවයක උල්පතවන්නේය. යුද්ධ කාලයේදී ජනතාව යුද්ධ විනය යටතේ තබන ලදී; මාර මුඛයට තල්ලු කරන ලදී, නැතහොත්, ක්ෂණික යුද්ධ කාලීන දඬුවමේ තර්ජනයට ලක් කරන ලදී. යුද්ධ තත්ත්වයන් පැවති නිසා ජනතාවට ආර්ථික යථාර්ථයන් දැක ගත හැකි නොවීය. ලේඛකයෝ, කවියෝ පූජකයෝ හා පුවත් පත්

සියල්ලම අන් හැම දෙයම අත හැර දමා යුද්ධයේ මහෝන්නතතාවය වර්ණනා කිරීමෙහි යෙදී සිටියහ. දැන් යුද්ධය අවසන් වී තිබෙන විට හෙළිදරව් කිරීම් ආරම්භ වී තිබේ. ජර්මන් අධිරාජ්‍යවාදයත්, එහි බ්‍රෙස්ට්-ලිතොව්ස්ක් සාම ගිවිසුමත් කෙබඳුද යනු අනාවරණය කර තිබේ. අධිරාජ්‍යවාදයට ජයග්‍රහණයක් බවට පත් විය යුතුව තිබුණු, එහෙත් එයට පරාජයක් වූ වර්සයිල්ස් ගිවිසුම කෙබඳුද යන්න හෙළිදරව් කර තිබේ. කීන්ස්ගේ ආදර්ශයෙන් පෙනෙන්නේ, යුරෝපයේ සහ ඇමෙරිකාවේ දස දහස් ගණන් සහ ලක්ෂ ගණන් සුළු ධනපති බුද්ධිමතුන් සහ යම් තරමක් උගත් හා අධ්‍යාපනයක් ලත් ජනයා ගමන් ගන්නේ, තනතුරෙන් ඉල්ලා අස්වී, ආණ්ඩුව විවේචනය කරන ස්වකීය පොතෙන් එහි මුහුණට දමා ගැසූ කීන්ස් ගත් මාර්ගය ඔස්සේ බවය. “නිදහස සඳහා යුද්ධය” ගැන කරන ලද සියලු කථා ආදිය හුදෙක්ම රැවටිල්ලක් වූ බව හා යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් අතලොස්සක් දෙනා පමණක් පොහොසත් වූ අතර අන් අය විනාශයට පත් වූ සහ වහල්භාවයට පත්වූ බව දහස් ගණන් හා ලක්ෂ ගණන් ජනතාවට අවබෝධ වූ කල, ඔවුන්ගේ සිත් තුළ සිදුවන්නේ හා සිදුවනු ඇත්තේ කුමක්ද යන්න කීන්ස් පෙන්වා දී තිබේ. ආරක්ෂාසහිත පැවැත්ම සහ බ්‍රිතාන්‍යයේ ආර්ථිකය විනාශයෙන් මුද ගැනීම පිණිස. ජර්මනිය සහ රුසියාව අතර වෙළෙඳ සම්බන්ධකම් යළි ඇතිවනු දැකීමට බ්‍රිතාන්‍යය කටයුතු කළ යුතුබව ධනපති කීන්ස් ප්‍රකාශ කරන්නේය යනු සත්‍යයක් නොවේද? මෙය සාර්ථක කළ හැක්කේ කෙසේද? එය කළ හැක්කේ කීන්ස් යෝජනා කරන ලෙසට සියලුම ණය අවලංගු කිරීමෙනි. මෙම අදහස වෙත එළඹ ඇත්තේ කීන්ස් පමණක්, ඒ උගත් ආර්ථික විද්‍යාඥයා පමණක් නොවේ. දශ ලක්ෂ ගණන් ජනයා එම අදහසට එළඹෙති. නැතහොත් එළඹෙනු ඇත. එමෙන්ම, ණය අවලංගු කිරීම හැර වෙනත් මඟක් නැතැයි යනුවෙන් ධනපති ආර්ථික විද්‍යාඥයන් කරන ප්‍රකාශයන්ගේ හඬ දශ ලක්ෂ ගණන් ජනතාවන්ගේ සවනෙහි වැකේ. එනිසා (ණය අවලංගු කර ඇති) “බොල්ෂෙවික්වරු නැසී යාදී” අපි ඇමෙරිකාවේ “කාරුණිකභාවය” පතා ආයාචනා කරමු!! — බොල්ෂෙවික්වාදය වෙනුවෙන් උද්ඝෝෂණ කටයුතු කර තිබෙන මෙම ආර්ථික විද්‍යාඥයන්ට කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ සම්මේලනය වෙනුවෙන් ස්තුති පණිවුඩයක් යැවිය යුතු යයි මම අදහස් කරමි.

එක් අතකින් පොදු ජනතාවන්ගේ ආර්ථික තත්ත්වයන් නොඉවසිය හැකි තරම් කටුක වී තිබේ නම් හා අනිත් අතට කීන්ස් විස්තර කරන ලෙසට ඉතා සුළු අතලොස්සක් වන සර්වබලධාරී ජයග්‍රාහක රටවල් අතර කැඩී බිඳී යාම ආරම්භ වී හා වර්ධනය වී යමින් පවතින්නේ නම්, එසේ නම්,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අප සිටින්නේ ලෝක විප්ලවයට අදාළ වන කොන්දේසි දෙකක් මෝරා යන තත්ත්වයන් යටතේය.

ලෝකය පිළිබඳව තරමක් දුරට වඩාත් අංග සම්පූර්ණ පින්තූරයක් දැන් අප හමුවේ ඇත. ඉවසිය නොහැකි තරම් දරුණු ජීවන තත්ත්වයන් යටතට පත් කරන ලද කෝටි 125 ක් ජනතාව පොහොසතුන් අතලොස්සකට ගැති වීම යනු කුමක්දැයි අපි දන්නෙමු. අනික් අතට, ජාතීන්ගේ සංගමය යුද්ධය කෙළවර කළ බවද, එය එවක් පටන් කිසිවෙකුට සාමය කඩ කිරීමට ඉඩ නොදෙන බවද ප්‍රකාශයට පත් කළ එම ජාතීන්ගේ සංගමයේ සම්මත තීරණය ජාතීන් හමුවට වන් විට හා සමස්ත ලෝකයේම වැඩකරන ජනතාවනගේ අන්තිම බලාපොරොත්තුව වූ මෙම සම්මත තීරණය වලංගු කෙරුණු විට එය අපට ලැබුණු පළමු පෙළේ ජයග්‍රහණයක් විය. එය වලංගු වීමට පෙර, ජර්මනිය වැනි රටකට බලපාන සේ විශේෂ කොන්දේසි නොපනවා සිටීම කිසිසේත් කළ නොහැකි බවත්, එහෙත් එම සම්මත තීරණය කෙටුම්පත් කරන විට සියල්ල හරියනු ඇති බවත් කීමට ජනයා පුරුදුව සිටියහ. එහෙත්, සම්මත තීරණය ප්‍රසිද්ධ කෙරුණු පසු, බොල්ෂෙවික්වාදයේ උග්‍රතම ප්‍රතිපාක්ෂිකයන්ට එය ඉවත දැමීමට සිදුවිය. සම්මත තීරණ ක්‍රියාත්මක කරන ලද විට එයින් මතු වූයේ, ධනවත්ම රටවල් ඉතා කුඩා කණ්ඩායමක්, එනම්, ක්ලෙමන්සෝ, ලොයිඩ් ජෝජ්, ඕර්ලන්ඩො සහ විල්සන් විසින් නියෝජනය කරනු ලබන ''මහ හතර දෙනා'' නව සම්බන්ධකම් නිර්මාණය කිරීමේ කාර්යයෙහි යොදන ලද මෙන් තත්ත්වයකි! සම්මත තීරණයට අදාළ යන්ත්‍රය ක්‍රියාත්මක කෙරුණු පසු එයින් සම්පූර්ණ බිඳ වැටීමකට මග පෑදුනි!

රුසියාවට විරුද්ධ යුද්ධවලින් අපි මෙය දුටිමු. දුර්වල, විනාශ වූ සහ සුන් කෙරුණු රුසියාව, එවැනි නොදියුණු රටක්, සියලුම ජාතීන්ට විරුද්ධව, ලෝකයට අධිපතිකම් කරන පොහොසත් හා බලවත් ජාතීන්ගේ සංගමයකට විරුද්ධව සටන් කර ජයගත්තේය. ඔවුන්ගේ හමුදාවලට කිසි ලෙසකින් හෝ සමාන වන හමුදාවක් ඉදිරිපත් කිරීමට අපට නොපුළුවන් වූ නමුත් අපි ජයගත්තෙමු. එසේ වූයේ මන්ද? එසේ වූයේ ඔවුන් අතර බිඳක්වත් සමගිය නොතිබුණු හෙයිනි. එක් බලවත් රටක් අනිකට විරුද්ධව කටයුතු කළ හෙයිනි. රුසියාව තමන්ට ගෙවිය යුතුවූ ණය ගෙවිය යුතු බවත්, ඇය ජර්මනියට විරුද්ධ බලවත් බලවේගයක් විය යුතු බවත් ප්‍රංශය අපේක්ෂා කළේය. රුසියාව බෙදා ගැනීමට අපේක්ෂා කළ බ්‍රිතාන්‍යය, බාකු තෙල් බිම් අල්ලා ගැනීමට සහ රුසියාවේ දේශ සීමා රාජ්‍යයන් සමග ගිවිසුමක් ඇති කර ගැනීමට උත්සාහ කළේය. සය මසකට පෙර, 1919 දෙසැම්බරයේදී, මොස්කව් සහ පෙට්‍රොග්‍රෑඩ් නගර ජයගැනීමට පොරොන්දු දුන් රටවල් සියල්ලම (මුළු ගණන රටවල් දහතරකි) අංග සම්පූර්ණ ලෙස

සඳහන් කරන වාර්තාවක් බ්‍රිතාන්‍ය නිල ලේඛන අතර ඇත. බ්‍රිතාන්‍යය මෙම රාජ්‍යයන් පදනම් කරගෙන එහි ප්‍රතිපත්තිය සකස් කර ගත් අතර, ඇය එරටවලට දශලක්ෂ ගණනින් ණය මුදල් දුන්නාය. මෙම ගණන් බැලීම් සියල්ලම දැන් වැරදී ගොස් තිබේ. එම ණය අයකර ගත නොහැකි තත්ත්වයක් උදා වී ඇත.

ජාතීන්ගේ සංගමය ඇති කර තිබෙන්නේ එවැනි තත්ත්වයකි. මෙම සම්මත තීරණයේ පැවැත්මේ සෑම දිනක්ම පාසා බොල්ෂෙවික්වාදයට ප්‍රචාරය සඳහා හොඳ කරුණු ලැබෙන්නේය. මන්දයත්, සෑම ප්‍රශ්නයකදීම, ධනපති ක්‍රමයේ ඉතාමත් බලවත් අනුචරයන් ඔවුන් එකිනෙකාගේ පය පටලවන හෙයිනි. තුර්කිය, පර්සියාව, මෙසොපොතේමියාව හා චීනය බෙදා ගැනීම සඳහා ජපානය, බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව සහ ප්‍රංශය අතර අල්ලනු ලබන්නේ දරුණු පොරයකි. කොල්ලකාගත් වස්තුව ස්වකීය දෙරකඩින්ම ගෙන යාමට ප්‍රයත්න දැරීම ගැන තම ''සගයන්ට'' විරුද්ධව දෙන විෂම ප්‍රහාරයන්ගෙන් සහ කෝපාන්විත ප්‍රකාශවලින් මෙරටවල ධනපති පුවත්පත් පිරී ඇත. ඉහළම තැන, ඉතාමත් පොහොසත් රටවල මෙම ඉතා කුඩා කණ්ඩායම අතර අංග සම්පූර්ණ දුස්සංගමය පවතින බව අපට පෙනේ. කෝටි 125 ක් ජනතාවකට, ''දියුණු'' සහ ශිෂ්ටාචාර ධනපති ක්‍රමය තමන් මත පැටවීමට කැමති වහල් තත්ත්වයන් යටතේ කිසිසේත් ජීවත් විය නොහැකිය. ඇත්තෙන්ම, මෙම ජනතාව ලෝක ජනගහනයෙන් සියයට 70 ක් නියෝජනය කරති. මෙම ඉතාමත් පොහොසත් රාජ්‍යයන් අතලොස්සට, නැතහොත්, බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව හා ජපානය (නැගෙනහිර ආසියාතික රටවල් කොල්ලකෑමෙහි ජපානය පොහොසත් වුවත්, වෙනත් රටක ආධාරය නොමැතිව එයට ස්වාධීන මූල්‍ය හා යුද්ධමය බලවතෙක් වීමට නොපුළුවන) යන මේ රටවල් දෙක තුනට, ඔවුනොවුන් අතර ආර්ථික සම්බන්ධකම් සංවිධානය කරගත නොහී, ජාතීන්ගේ සංගමය තුළ ඔවුන්ගේ සගයන්ගේ හා කොටස් කරුවන්ගේ ප්‍රතිපත්ති කඩාකප්පල් වන ආකාරයෙන් ස්වකීය ප්‍රතිපත්ති මෙහෙයවති. ලෝක අර්බුදයක් ඇති වී තිබෙන්නේ එහෙයිනි. කොමියුනිස්ට් ජාත්‍යන්තරය අත්පත් කර ගනිමින් සිටින දීප්තිමත් ජයග්‍රහණයන්ට ප්‍රධාන වශයෙන් හේතු සාධක වන්නේ මෙම අර්බුදයේ ආර්ථික ප්‍රභව මූලයන්ය.

සහෝදරවරුනි, අපගේ විප්ලවවාදී ක්‍රියාකාරිත්වයට පදනම වන විප්ලවීය අර්බුදය පිළිබඳ ප්‍රශ්නය වෙත අපි දැන් ළඟා වී ඇත්තෙමු. මෙහිදී අප ප්‍රථමයෙන්ම සටහන් කර ගත යුතු ප්‍රචලිත වැරදි දෙකක් ඇත. එක් අතකින්, ධනපති අර්ථික විද්‍යාඥයෝ මෙම අර්බුදය හඳුන්වන්නේ — හුරු බුහුටි බ්‍රිතාන්‍ය වදනකින් කියතොත් — ''නොසන්සුන්තාවය''

https://liberationbase.wordpress.com

යනුවෙනි. අනිත් අතට, මෙම අර්බුදය කිසිසේත් විසඳිය නොහැකි එකක් බව ඔප්පු කිරීමට විප්ලවවාදීහු උත්සාහ දරති.

මෙය වරදකි. සම්පූර්ණයෙන්ම නරක තත්ත්වයකැයි කිව හැකි දෙයක් නැත. ධනපතියන් හැසිරෙන්නේ උමතු වූ හා බිය සැක නැති මංකොල්ල කරුවන් මෙනි. ඔවුහු එක මෝඩකමකින් පසුව තව මෝඩකමක් කරති. එමගින් තත්ත්වය තව තවත් උග්‍ර කරමින් තමන්ගේ විනාශය ඉක්මන් කර ගනිති. ඒ සියල්ලම සත්‍යය. නමුත්, සූරාකනු ලබන්නන්ගෙන් අල්පතරයකට යම් යම් සුළු සහන දීමෙන් ඔවුන් අස්වැසීමටත්, පීඩිත සහ සූරාකනු ලබනවුන්ගේ යම් කොටසක යම් යම් ව්‍යාපාර, නැතහොත්, නැගී සිටීම් මර්දනය කිරීමටත් ධනපතියන්ට කිසිසේත් හැකි වන්නේ නැතැයි කිසිවෙකුටත් ''ඔප්පු කළ'' නොහැකිය. ගැළවීමේ ''කිසිම'' මගක් ඇත්තේම නැතැයි කල් තබාම ''ඔප්පු කිරීමට'' උත්සාහ දැරීම හුදෙක් අතිපණ්ඩිතකමක් පමණකි. නැතහොත්, සංකල්පයන් හා උගුල් වදන් යොදා ගනිමින් කරන ක්‍රීඩාවක් පමණකි. මේ හා වෙනත් එවැනි ප්‍රශ්න සම්බන්ධයෙන් සැබෑ ''සාක්ෂි'' වශයෙන් ප්‍රයෝජනවත් වන්නේ ව්‍යවහාරය පමණකි. මුළු ලෝකය සැම තන්හිම ධනපති ක්‍රමය දැවැන්ත විප්ලවීය අර්බුදයක් අත් දකිමින් සිටිති. මෙම අර්බුදය සාර්ථක, ජයග්‍රාහී විප්ලවයක් සඳහා උපයෝගී කරගැනීමට තරම් ප්‍රමාණවත් අවබෝධයක් හා සංවිධානයක්ද, සූරාකනු ලබන පොදු ජනතාව සමග සම්බන්ධකමද, අධිෂ්ඨානයද, දක්ෂකමද, තමන්ට ඇතැයි යන්න විප්ලවවාදී පක්ෂ දැන් ව්‍යවහාරිකව ''ඔප්පු කළ'' යුතු වේ.

LIBERATIONBASE

අප දැන් මෙම කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ සම්මේලනයට රැස්ව සිටින්නේ ප්‍රධාන වශයෙන් මෙය ''ඔප්පුකිරීමට'' කරුණු සූදානම් කරනු සඳහාය.

තුන්වැනි ජාත්‍යන්තරයට සම්බන්ධ වීමට කැමති වන පක්ෂ අතර තවමත් කොතරම් දුරට අවස්ථාවාදය පවතින්නේද යනු සහ සමහර පක්ෂ කරන කටයුතු මෙම විප්ලවීය අර්බුදයෙන් ප්‍රයෝජන ගැනීමට විප්ලවවාදී පංතිය සූදානම් කිරීමෙන් කොතරම් දුරස්තරද යනු ගෙනහැර දැක්වීම සඳහා, බ්‍රිතාන්‍ය ''ස්වාධීන කම්කරු පක්ෂයේ'' නායක රැම්සේ මැක්ඩොනල්ඩ් කියා ඇති කරුණක් ගැන සඳහන් කරන්නෙමි. දැනට අපගේ අවධානය යොමු වී තිබෙන මූලික ප්‍රශ්න සම්බන්ධයෙන් මැක්ඩොනල්ඩ් ලියූ ඔහුගේ ''පාර්ලිමේන්තුව සහ විප්ලවය'' නැමති පොතෙහි ධනපති සමාදානවාදීන්ගේ ජීව ගුණයකින් අද පවතින තත්ත්වය ගැන විස්තර කරයි. විප්ලවීය අර්බුදයක් තිබෙන බව සහ විප්ලවීය හැඟීම් වර්ධනය වන බව ඔහු පිළිගනියි. කම්කරුවන් සෝවියට් පාලනයට සහ නිර්ධන පංති ආඥාදායකත්වයට හිතවත් බවත් (මෙය කියන්නේ බ්‍රිතාන්‍යයට අදාළව බව සටහන්

කර ගන්න), වර්තමාන බ්‍රිතාන්‍ය ධනපති ආඥාදායකත්වයට වඩා කම්කරු පංති ආඥාදායකත්වය හොඳ බවත් ඔහු පිළිගනියි.

නමුත් මැක්ඩොනල්ඩ් හුරුපුරුදු ධනපති සමාදානවාදියෙක් සහ සම්මුතිවාදියෙක් වේ. පංතිවලට ඉහළින් සිටින ආණ්ඩුවක් ගැන සිහින දකින සුළු ධනපතියෙක් වේ. සියලුම ධනපති බොරුකාරයන්, විතණ්ඩවාදීන් සහ අති පණ්ඩිතයන් මෙන් මැක්ඩොනල්ඩ් ද පංති අරගලය පිළිගන්නේ හුදෙක්ම ''වර්ණනාත්මක කරුණක්'' ලෙසටය. පංතිවලට ඉහළින් සිටින්නේයයි කියන ''ප්‍රජාතන්ත්‍රවාදී'' ආණ්ඩුවක් ඇතිකිරීම සම්බන්ධයෙන් රුසියාවේ කෙරෙන්ස්කි, මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීන්[19] ලැබූ අත්දැකීම් හා හංගේරියාවේ,[20] ජර්මනියේ ආදී රටවල එවැනිම අත්දැකීම් ගැන ඔහු සැලකිල්ලක් නොදක්වයි. තමා සමාජවාදියෙක් ලෙසට, මෙම අමනයා නායකයෙක් ලෙසට පිළිගැනීමට තරම් අවාසනාවට වැටී සිටින කම්කරුවන් හා ස්වකීය පක්ෂය නැලවීමට මෙම ධනපති මැක්ඩොනල්ඩ් මෙසේ කියයි: ''මේ සියල්ලම (එනම්, විප්ලවීය අර්බුදය සහ විප්ලවවාදී උණුසුම) පහව යනු ඇති බව... සන්සුන් වී යනු ඇති බව අපි දනිමු.'' යුද්ධය නිසා නොවැළැක්විය හැකි ලෙසට අර්බුදය ඇති වූ අතර යුද්ධයෙන් පසු එක් වරම නොවුවත් ඒ සියල්ලම ''සන්සුන් වනු ඇතැ''යි ඔහු කියයි!

තුන්වැනි ජාත්‍යන්තරයට ඒකාබද්ධ වීමට අපේක්ෂා කරන පක්ෂයක නායකයා වන පුද්ගලයෙක් ලියා ඇති දේ එසේය. මොහුගේ ප්‍රකාශයෙහි ඍජු භාවය නිසා එය වඩාත් වටනේය. එනම්, නිරතුරුවම ප්‍රංශ සමාජවාදී පක්ෂයේ සහ ජර්මන් ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක කොටස් අතර දක්නට ලැබෙන දෙයම අනාවරණය වීමකි. එනම්, විප්ලවීය අර්බුදයෙන් විප්ලවවාදී අර්ථයෙන් ප්‍රයෝජන ගැනීමට ඇති නොහැකියාව පමණක් නොව නොකැමැත්තද අනාවරණය කිරීමකි. නැතහොත්, නිර්ධන පංති ආඥාදායකත්වය සඳහා පක්ෂය සහ පංතිය විප්ලවවාදී ආකාරයකින් ඇත්ත වශයෙන්ම සූදානම් කිරීමට ඇති නොහැකියාව හා නොකැමැත්ත යන දෙකම පෙන්නුම් කිරීමකි.

දැන් දෙවැනි ජාත්‍යන්තරය අත්හැර යන පක්ෂ බොහොමයකට වැළඳී ඇති නපුර මෙයයි. මා මෙම සම්මේලනයට ඉදිරිපත් කළ ප්‍රවාදවල, අන් සියල්ලටම වඩා නිර්ධන පංති ආඥාදායකත්වය සඳහා කටයුතු සූදානම් කිරීමේ කර්තව්‍යයන් ගැන කරුණු දක්වා ඇත්තේ සහ එම කර්තව්‍යයන් ගැන හැකි තරම් දුරට යථාභූත සහ නිශ්චිත පැහැදිලි කිරීමක් දී ඇත්තේ ඒකාන්ත වශයෙන්ම එම හේතුව නිසාය.

තවත් නිදසුනක් මෙන්න. බොල්ෂෙවික්වාදයට විරුද්ධව මෑතදී අළුත් පොතක් පළ කරන ලදී. දැන් මෙම වර්ගයේ පොත් අසාමාන්‍ය තරම් විශාල

https://liberationbase.wordpress.com

සංඛ්‍යාවක් යුරෝපයෙහි සහ ඇමෙරිකාවෙහි නිකුත් කරනු ලැබේ බොල්ෂෙවික් විරෝධී පොත් වැඩි වැඩියෙන් නිකුත් කළ තරමට, බොල්ෂෙවික්වාදය කෙරෙහි පොදුජන හිතවත්කම වඩාත් සීඝ්‍රලෙස වර්ධනය වන්නේය. මා සඳහන් කරන්නේ ඔටෝ බවර්ගේ ''බොල්ෂෙවික්වාදයද, නැතහොත්, සමාජවාදී-ප්‍රජාතන්ත්‍රවාදය ?'' යන පොත ගැනය. මෙන්ෂෙවික්වාදයේ සාරාර්ථය කුමක්ද යනු මෙම පොතෙන් ජර්මන්වරුන්ට පැහැදිලි ලෙස විස්තර කර දී තිබේ. රුසියානු විප්ලවයේදී එය ඉටු කළ නින්ද සහගත ක්‍රියා කලාපය ගැන සියලුම රටවල කම්කරුවෝ මැනවින් දනිති. ඔටෝ බවර් මෙන්ෂෙවික්වාදය කෙරෙහි ඇති තමන්ගේ හිතවත්කම වසං කරතත්, ඔහු සැම අතින්ම මෙන්ෂෙවික්වාදී වන පොත් පිංචක් ලියා තිබේ. කෙසේ හෝ වේවා, මෙන්ෂෙවික්වාදය කුමක්ද යනු දක්වන නිශ්චිත තොරතුරු යුරෝපය හා ඇමෙරිකාව තුළ වැඩියෙන් පතුරුවා හැරීම දැන් කළ යුතුව ඇත. එසේ කළ යුත්තේ, එය බොල්ෂෙවික්වාදයට විරුද්ධ සියලුම සමාජවාදී, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සහ වෙනත් පදවලින් විස්තර කෙරෙන උපනති හැඳින්වීමට යෙදූ ගන්නා වර්ග නාමයක් වී ඇති බැවිනි. රුසියානුවන් වන අප මෙන්ෂෙවික්වාදය කුමක්ද යනු යුරෝපීයයන්ට විස්තර කරන්නේ නම්, එම ලියවිලි රසවත් නොවනු ඇත. බවර්ගේ පොතෙන් ඔහු ඒ බව පෙන්වා තිබේ. එම පොත පළ කරනු ඇති සහ එය විවිධ භාෂාවලට පරිවර්තනය කරනු ඇති ධනපති සහ අවස්ථාවාදී ප්‍රකාශකයින්ට අපි කල්තබාම ස්තුති කරන්නෙමු. බවර් පොත කොමියුනිස්ට්වාදය පිළිබඳ පාඩම් පොත්වලට අමුතු ස්වභාවයේ වුවද ප්‍රයෝජනවත් අතිරේකයක් වනු ඇත. ඔටෝ බවර් පොතෙන් ඕනෑම ඡේදයක්, නැතහොත්, තර්කයක් ගෙන, එහි අන්තර්ගත මෙන්ෂෙවික්වාදය පෙන්නුම් කරන්න; සමාජවාදයට ද්‍රෝහී වූවන්ගේ, කෙරෙන්ස්කිගේ, ෂෙයිඩමාන්ගේ මිතුරන්ගේ, ආදීන්ගේ ක්‍රියාවන් වෙත මග පෙන්වන අදහස්වල මුල් මෙහි ඇත්තේ කොතැනද යනු පෙන්වා දෙන්න. එය වූ කලී කොමියුනිස්ට්වාදය හරි ආකාර ලෙස අවබෝධ කරගෙන තිබේද යන්න පරීක්ෂා කර බැලීම සඳහා පවත්වන ''විභාග'' වලදී ඇසීමට සුදුසු ඉතා ප්‍රයෝජනවත් ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට ඔබ අපොහොසත් නම්, ඔබ තවමත් කොමියුනිස්ට්වාදියෙක් වී නැත. එනිසා ඔබ කොමියුනිස්ට් පක්ෂයට නොබැඳිය යුතුය (අත්පොළසන්.)

ඔටෝ බවර් එක තනි වාක්‍යයකින් ලෝක අවස්ථාවාදයේ අදහස්වල හරය ඉතා විශිෂ්ට ලෙස ප්‍රකාශ කර තිබේ. අප කැමති පරිදි වියානාහිදී ක්‍රියා කළ හැකි නම් ඒ ගැන කරන සැලකිල්ලක් ලෙසට ඔහුගේ ජීවිත කාලයේදීම ඔහු වෙනුවෙන් සිහිවටනයක් ඉදි කළ යුත්තෙමු. නූතන ප්‍රජාතන්ත්‍රයන්හි කෙරෙන පංති අරගලයේදී බලහත්කාරය පාවිච්චි කිරීම

යනු ''බලහත්කාරයේ සමාජමය සාධකයන්ට විරුද්ධ ප්‍රචණ්ඩයක් වනු ඇතැයි ඔටෝ බවර් කියයි.

මෙය විකාරයක් හා ගත නොහැකි දෙයක් සේ පෙනේ යයි ඔබ සිතනු ඇත. මාක්ස්වාදය පිරිහෙළා තිබෙන ආකාරය පිළිබඳ නිදසුනක් ලෙසට එය ගත හැකිය. ඉතාමත් විප්ලවවාදී න්‍යාය නන්දෙඩවිල්ලක් සහ සූරාකන්නන් ආරක්ෂා කිරීමක් බවට පත්වන සේ කොතරම් දුරට පිරිහෙළීමට පුළුවන්ද යන්න එයින් පෙනේ. නොසන්ඩාලවාදයේ ජර්මන් ප්‍රභේදයක් අවශ්‍ය වී තිබේ. එනිසා ''බලහත්කාරයේ සමාජ සාධකයන්'' නම්, සංඛ්‍යාව, සංවිධාන මට්ටම, නිෂ්පාදනය සහ බෙදහැරීම තුළ හිමිකරගෙන තිබෙන තත්ත්වය ද, ක්‍රියාකාරිත්වය හා අධ්‍යාපනයද යනුයි කියන ''න්‍යාය'' ඔබ හමුවට පැමිණේ. ග්‍රාමීය කෘෂිකාර්මික ශ්‍රමකරුවෙක්, නැතහොත්, නාගරික කම්කරුවෙක් ඉඩම් හිමියෙකුට, නැතහොත්, ධනපතියෙකුට විරුද්ධව විප්ලවවාදී ප්‍රචණ්ඩය ක්‍රියාත්මක කරයි නම්, එය නිර්ධන පංති ආඥාදායකත්වය නොවේ. එය සූරාකන්නන්ට සහ ජනතාවගේ පීඩකයන්ට විරුද්ධව ක්‍රියාත්මක කරන ප්‍රචණ්ඩයක් නොවේ. අහෝ නැත! මෙය ''බලහත්කාරයේ සමාජමය සාධකයන්ට විරුද්ධ ප්‍රචණ්ඩයයි''.

සමහර විට මා ඉදිරිපත් කළ නිදර්ශනය කවටකමක් සේ පෙනෙන්නට පිළිවන. එසේ වුවත්, වර්තමාන අවස්ථාවාදයේ ස්වභාවය නිසාම බොල්ෂෙවික්වාදයට විරුද්ධව කරන එහි සටන කවටකමක් වන්නේය. ජාත්‍යන්තර මෙන්ෂෙවික්වාදය (මැක්ඩොනල්ඩ්ලා, ඔටෝ බවර් ලා සහ සමාගම) සහ බොල්ෂෙවික්වාදය අතර කෙරෙන අරගලයට කම්කරු පංතිය සහ එහි සියලුම චින්තාවන් කොටස් සම්බන්ධ කර ගැනීම යුරෝපයට හා ඇමෙරිකාවට ඉතාමත් ප්‍රයෝජනවත් සහ ඉතාමත් හදිසි කර්තව්‍යයක් වන්නේය.

එනිසා අපි මෙසේ ඇසිය යුත්තෙමු: යුරෝපයේ එවැනි උපනති නොනැසී පැවතීමට හේතුව කුමක්ද? මෙම අවස්ථාවාදය අප රටට වඩා බටහිර යුරෝපයේ ශක්තිමත් වන්නේ මන්ද? එසේ වන්නේ, සියක් කෝටියක් පීඩිත ජනතාවන් සූරාකෑමේ හැකියාව ඇති දියුණු රටවල සංස්කෘතිය එම හැකියාවේ ප්‍රතිඵලයක් වූ හා වන හෙයිනි. එසේ වන්නේ තමන්ගේම රටවල කම්කරුවන් කොල්ලකෑමෙන් ලබනවාට වඩා අතිශයින් විශාල ලාභයක් එරටවල ධනපතියන්ට මේ මාර්ගයෙන් ලබා ගත හැකි හෙයිනි.

යුද්ධයෙන් පෙර පොහොසත්ම රටවල් තුන වූ බ්‍රිතාන්‍යයට, ප්‍රංශයට හා ජර්මනියට, වෙනත් මාර්ගවලින් හැර ප්‍රාග්ධන අපනයනයෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පමණක් වසරකට ප්‍රෑන්ක් කෝටි අටසියයක් දහසක් අතර මුදලක් ලැබුණු බව ගණන් බලා තිබේ.

මෙම විශාල මුදලෙන් යටත්පිරිසෙයින් කෝටි පණහක්වත් කම්කරු නායකයන්ට සහ කම්කරු රදළ පෙළැන්තියට අස්වැසුම් දීමනා සඳහා, එනම්, නොයෙක් ආකාරයේ අල්ලස් දීම සඳහා වැය කළ හැකි බව කිවමනා නොවේ. මේ මුළු ක්‍රියාමාර්ගයම සරල කොට ගත් කල, එය අල්ලස මිස අන් කිසිවක් නොවන බව පෙනේ. එය දහසක් විවිධ මාර්ගයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ. විශාලතම මධ්‍යස්ථානවල සංස්කෘතික පහසුකම් වැඩි කිරීමද, අධ්‍යාපන ආයතන ඇති කිරීමද, සමූපකාර, වෘත්තීය සමිති හා පාර්ලිමේන්තු නායකයින්ට දහස් ගණන් සැප පහසු රැකියා දීමද මේ සඳහා යොදු ගනු ලැබේ. වර්තමාන ශිෂ්ටාචාර ධනපති සම්බන්ධකම් පවතින සැම තැනෙකම මෙය සිදු වන්නේය. කම්කරු පංති ව්‍යාපාරයේ අවස්ථාවාදයේ ආර්ථික පදනම සැපයෙන්නේ මෙම සියකෝටි ගණනින් ලැබෙන සුපිරි ලාභවලිනි. ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය හා ප්‍රංශය යන රටවල අවස්ථාවාදී නායකයන්ගේද, කම්කරු පංතියේ මුදුන් කබලුව, නැත හොත්, කම්කරු රදළ පෙළැන්තියේද නොමිනිය හැකි වඩාත් බලගතු විරෝධතාවයක් අපට දක්නට ලැබේ. ඔවුහු කොමියුනිස්ට් ව්‍යාපාරය කෙරෙහි වඩාත් දැඩි ප්‍රතිරෝධයක් දක්වති. අප රටේ සිදුවූවාට වඩා යුරෝපීය හා ඇමෙරිකානු කම්කරු පක්ෂවලට මෙම රෝගයෙන් මිදීම දුෂ්කර වනු ඇති බව පිළිගැනීමට අප සූදනම් විය යුත්තේ එබැවිනි තුන්වැනි ජාත්‍යන්තරය පිහිටුවීමෙන් පසුව මෙම රෝගයට ප්‍රතිකාර කිරීම අතින් ඉතා විශාල සාර්ථකත්වයක් ලබා තිබෙන බව අපි දනිමු. නමුත් අපි තවමත් කාර්යය නිම කර නැත්තෙමු. මුළු ලෝකයේම කම්කරු පක්ෂ කෙරෙන්, නිර්ධන පංතියේ විප්ලවවාදී පක්ෂ කෙරෙන්, ධනපති බලපෑම් තුරන් කර, ඒවායේ සාමාජිකත්වය තුළ සිටින අවස්ථාවාදීන් ඉවත් කර එම පක්ෂ පිරිසිදු කිරීම සම්පූර්ණ වීමට තවත් යා යුතු දුර බොහෝය.

අප එය කළ යුත්තේ කුමණ නිශ්චිත ආකාරයෙන්ද යන්න ගැන විස්තර කිරීමට මම යොමු නොවෙමි. පළ කරන ලද මගේ ප්‍රවාදවල ඒ ගැන විස්තර කර තිබේ. මට භාර වී තිබෙන කර්තව්‍යය නම් මෙම ප්‍රපංචයේ ගැඹුරු ආර්ථික මූලයන් පෙන්නුම් කිරීමය. මෙය කල් පවතින රෝගයකි. එය සුව කිරීමට ගත වන කාලය සර්ව ශුභවාදීන් බලාපොරොත්තු වූවාට වඩා දීර්ඝය. අවස්ථාවාදය අපගේ ප්‍රධාන සතුරා වන්නේය. කම්කරු පංති ව්‍යාපාරයේ ඉහළ පිරිස් අතර වන අවස්ථාවාදය ධනපති සමාජවාදය මිස නිර්ධන පංති සමාජවාදය නොවේ. අවස්ථාවාදී උපනතිය අනුගමනය කරන කම්කරු පංති ක්‍රියාශීලීන් ධනපති පංතිය ආරක්ෂා කිරීමේදී ධනපතියන්ටත් වඩා දක්ෂ බව පෙනී ගොස් තිබේ. ඔවුන් කම්කරු පංතියේ නායකත්වය

ගෙන සිටීමෙන් තොරව, ධනපතියන්ට බලයේ රැඳී සිටීමේ හැකියාවක් නැත. මෙය ඔප්පු වූයේ රුසියාවේ කෙරෙන්ස්කි පාලනයෙන් පමණක් නොවේ. ජර්මනියේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව යටතේ පැවති එහි ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවෙන්ද, එමෙන්ම, ඇල්බට් තෝමස් ඔහුගේ ධනපති ආණ්ඩුව කෙරෙහි දක්වූ ආකල්පයෙන්ද එය ඔප්පු විය. බ්‍රිතාන්‍යයේ සහ එක්සත් ජනපදයේ එවැනිම අත්දැකීම් මගින්ද එය ඔප්පු වී තිබේ. අපගේ ප්‍රධාන සතුරා ඇත්තේ මෙහිය. අපි එම සතුරා පරාජය කළ යුත්තෙමු. අප මෙම සම්මේලනයෙන් පිටව යායුත්තේ සැම පක්ෂයක්ම තුළ මෙම අරගලය අවසානය දක්වාම කරන බවට තරයේ අධිෂ්ඨාන කරගෙන ය. අපගේ ප්‍රධාන කර්තව්‍යය එයයි.

මෙම කර්තව්‍යය හා සමග සසඳන කල, කොමියුනිස්ට්වාදයේ ''වාම'' උපනතියේ වැරදි නිවැරදි කිරීම පහසු කටයුත්තක් වනු ඇත. රටවල් ගණනාවකම පාර්ලිමේන්තුවාද විරෝධය දක්නට ලැබේ. එය ආරම්භ කර තිබෙන්නේ සුළු ධනපති සම්භවයක් ඇති පුද්ගලයන්ට වඩා නිර්ධන පංතියේ යම් යම් දියුණු කණ්ඩායම් විසිනි. එම කණ්ඩායම් එයට යොමු වී තිබෙන්නේ බ්‍රිතාන්‍යයේ, ප්‍රංශයේ, ඉතාලියේ, සියලුම රටවල පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ හැසිරීම කෙරෙහි පැ සාධාරණ, නිසි හා අවශ්‍ය වෛරය නිසා පැරණි පාර්ලිමේන්තුවාදයට දක්වූ දැඩි විරෝධය අනුවය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයෙන් මග පෙන්වීම් නිකුත් කරමින්, රුසියාවේ අත්දැකීම් ගැන, නියම නිර්ධන පංති දේශපාලන පක්ෂයක ඇති වැදගත්කම ගැන වඩාත් හොඳින් සහෝදරවරුන්ට කරුණු අවබෝධ කර දිය යුත්තේය. අපගේ වැඩ කටයුතු සමන්විත වනු ඇත්තේ මෙම කර්තව්‍යය ඉටු කිරීමෙනි. නිර්ධන පංති ව්‍යාපාරයේ මෙම වැරදිවලට විරුද්ධව, මෙම දුර්වලකම්වලට විරුද්ධව සටන් කිරීම නම්, දෙවැනි ජාත්‍යන්තරයට අයත් පැරණි පක්ෂවලට ඇතුල් වී සිටිමින් හා තමන්ගේ කාර්යයන් සියල්ලම නිර්ධන පංතික හැඟීමකින් නොව ධනපති හැඟීමකින් කරමින් ප්‍රතිසංස්කරණවාදී වේශයෙන් පෙනී සිටින ධනපතියන්ට විරුද්ධව සටන් කරනවාට වඩා දහස් වරක් පහසු වනු ඇත.

සහෝදරවරුනි, අවසාන වශයෙන් ප්‍රශ්නයේ තවත් පැත්තක් ගැන කරුණු සඳහන් කිරීමට කැමැත්තෙමි. අප සම්මේලනය ලෝක සම්මේලනයක් සේ හැඳින්වීමට තරම් සුදුසු වන බව සභාපති සහෝදරයා කීවේය. ඔහුගේ අදහස නිවැරදි යැයි මම සිතමි. යටත් විජිත සහ නොදියුණු රටවල විප්ලවීය ව්‍යාපාරයේ නියෝජිතයන් බොහෝ දෙනෙක් මෙහි අප සමග සිටින නිසා විශේෂයෙන්ම එසේ කිව හැක. මෙය සුළුවෙන් පටන් ගැනීමකි. එහෙත් වැදගත් කාරණය වන්නේ ආරම්භයක් කර තිබීමයි. මෙම සම්මේලනයේදී, දියුණු ධනපති රටවල නිර්ධන පංතිකයන්ද, නිර්ධන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පංතියක් නැතැයි, නැතහොත් ඉතාමත්ම අල්ප වශයෙන් ඇතැයි කිව හැකි රටවල විප්ලවවාදී පොදු ජනතාව, එනම්, යටත් විජිත පෙරදිග රටවල සිටින ජනතාවද අතර සමගියක් ගොඩ නැගෙනු අපට දක්නට ලැබේ. මෙම සමගිය තහවුරු කිරීම රඳා පවත්නේ අපගේ කටයුතු මතය. අපට එය සාර්ථක කළ හැකි බව මට සහතිකය. සෑම රටකම සූරාකනු ලබන සහ පීඩිත වූ කම්කරුවන්, සුළු ධනපති කොටස්වල ප්‍රතිරෝධය සහ කුඩා කම්කරු රදළ මුදුන් කබලුවෙහි බලපෑම ජයගෙන දෙන විප්ලවීය ප්‍රහාරයන්, මෙතෙක් ඉතිහාස වේදිකාවෙන් එහා සිටි, ඉතිහාසයේ ඉලක්කය ලෙසට පමණක් සැලකුණු දස කෝටි ගණන් ජනතාවන්ගේ විප්ලවවාදී ප්‍රහාරයක් එකට සංයෝග වූ කල ලෝක අධිරාජ්‍යවාදය ඇද හැළෙනු ඇත.

මෙම අධිරාජ්‍යවාදී යුද්ධයෙන් විප්ලවයට රුකුලක් ලැබිණ. යටත් විජිතවලින්, නොදියුණු රටවලින්, තනි වූ තත්ත්වයේ පැවති එම රටවලින් මෙම අධිරාජ්‍යවාදී යුද්ධයට සහභාගි වීම සඳහා යුද්ධ භටයන් බඳවා ගැනීම ධනපතියන් විසින් කරන ලදී. ජර්මනියට විරුද්ධව බ්‍රිතාන්‍යය ආරක්ෂා කිරීම ඉන්දියානු ගොවි ජනතාවගේ යුතු කමක් බව, බ්‍රිතාන්‍ය ධනපතියෝ ඉන්දියාවෙන් බඳවා ගත් සොල්දාදුවන්ට ඒත්තු ගැන්වූහ. ප්‍රංශය ආරක්ෂා කිරීම ප්‍රංශ යටත් විජිතවලින් බඳවා ගත් සොල්දාදුවන්ගේ යුතුකම වන බව ප්‍රංශ ධනපතියෝ ඔවුනට ඒත්තු ගැන්වූහ. ඔවුහු ඔවුනට ආයුධ පාවිච්චිය උගැන්වූහ. මෙය ඉතාමත්ම ප්‍රයෝජනවත් උගැන්වීමකි. ඒ ගැන ධනපතියන්ට අපගේ බලවත් කෘතඥතාවය පළ කළ යුත්තෙමු. රුසියානු කම්කරුවන් හා ගොවි ජනයා වෙනුවෙන්, විශේෂයෙන්ම රුසියානු රතු හමුදාව වෙනුවෙන් අපගේ කෘතඥතාවය පළ කළ යුත්තෙමු. අධිරාජ්‍යවාදී යුද්ධය විසින් ගැති ජනතාවන් ඉතිහාසයේ වේදිකාවට ඇද දමා තිබේ. ධනපති නොවන රටවල සෝවියට් ව්‍යාපාරය සංවිධාන කිරීම පිණිස මුල්ගල තැබිය හැක්කේ කෙසේදැයි සලකා බැලීම දැන් අප මුහුණ පා සිටින ඉතාමත් වැදගත් කර්තව්‍යයන්ගෙන් එකකි. එරටවල සෝවියට් සභා ඇති කළ හැකිය. ඒවා කම්කරු සෝවියට් සභා නොවනු ඇත. නමුත්, ඒවා ගොවිජන සෝවියට් සභා, නැතහොත්, වැඩකරන ජනතාවගේ සෝවියට් සභා වනු ඇත.

බොහෝ වැඩ කළ යුතුව ඇත. වැරදි සිදුවීම වැළැක්විය නොහැකි වනු ඇත. මෙම මාර්ගයේ යන විට මුහුණ දෙන්නට සිදුවන දුෂ්කරතාවයන් නෝකාකාරය. දශ කෝටි ගණන් ජනතාව අතර, මේ දක්වා අසංවිධානාත්මක ආකාරයෙන් කරන ලද වැඩ කටයුතු සංවිධානාත්මක, අනුසන්ධානය සහිත සහ ක්‍රමානුකූල ආකාරයකින් කිරීම සඳහා ආධාරකාරී වන ප්‍රායෝගික ප්‍රතිපත්ති පැහැදිලි කිරීම හෝ ඉදිරිපත් කිරීම දෙවැනි සම්මේලනයේ මූලික කර්තව්‍යය යි.

දැන් කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ප්‍රථම සම්මේලනයෙන් පසු අවුරුද්දක් ඉක්මවා මඳ කලක් ගිය තැන, අපි දෙවැනි ජාත්‍යන්තරය පරදවා ජය ලබා ගෙන සිටින්නෙමු. සෝවියට් සභා පිළිබඳ අදහස පැතිර තිබෙන්නේ ශිෂ්ටාචාර රටවල කම්කරුවන් අතර පමණක් නොවේ. ඒ ගැන දැනගැනීමට හා අවබෝධ කර ගැනීමට හැකි වී තිබෙන්නේ ඔවුනට පමණක් නොවේ. ජර්මන් ක්‍රමවාදීන් රුචි ලෙස කියන සෝවියට් "ක්‍රමය" ගැන හෝ, බ්‍රිතාන්‍යයේ "ශ්‍රේණි" සමාජවාදීන්[21] කියන සෝවියට් "අදහස" ගැන හෝ, උගත් ලෙස, නැතහොත්, උගත් නියායෙන් තර්ක කරන බොරු පණ්ඩිතයින්ට සියලුම රටවල කම්කරුවෝ සරදම් කරති. එම බොරු පණ්ඩිතයන් බොහෝ දෙනා තමන් සමාජවාදීන් ලෙසට හඳුන්වා ගන්නෝ වෙති. සෝවියට් "ක්‍රමය" හෝ "අදහස" හෝ පිළිබඳ මෙම තර්කවලින් කම්කරුවන්ගේ ඇස් සහ සිත් වැසී යන අවස්ථා එමටය. එසේ වුවද, මෙම පණ්ඩිතමානී කුණු ඉවත් කර දමන කම්කරුවෝ සෝවියට් සභා විසින් සැපයෙන ආයුධය අතට ගනිති. සෝවියට් සභාවලින් ඉටුවන කාර්ය කොටස සහ ඒවායේ වැදගත්කම පිළිගැනීම දැන් පෙරදිග රටවල් දක්වා පැතිර ගොස් තිබේ.

පෙරදිග සෑම තැනකම, ආසියාවේ සෑම දේශයකම, සියලු යටත් විජිත ජනතාවන් අතරම සෝවියට් ව්‍යාපාරය සඳහා පසුබිම සකස් කර තිබේ.

සූරාකනු ලබන්නන් සූරාකන්නන්ට විරුද්ධව නැගී සිට ඔවුන්ගේ සෝවියට් සභා පිහිටුවා ගත යුතුය යන අදහස සංකීර්ණ එකක් නොවේ. අපේ අත්දැකීමෙන් අනතුරුවද, රුසියාවේ සෝවියට් සමූහාණ්ඩුවේ අවුරුදු දෙක හමාරක අත්දැකීමෙන් අනතුරුව, තුන්වැනි ජාත්‍යන්තරයේ ප්‍රථම සම්මේලනයෙන් අනතුරුවද ලෝකය මුළුල්ලේම පීඩකයන් විසින් පීඩිතව සිටින දශ කෝටි ගණන් ජනතාවන්ට මෙම අදහස අවබෝධ කර ගත හැකි තත්ත්වයක් ඇති වෙමින් පවතී. රුසියාවේ සිටින අප ජාත්‍යන්තර අධිරාජ්‍යවාදීන්ට වඩා දුර්වල නිසා, අපට බොහෝ විට බේරුම් කර ගැනීම්වලට එළඹීමටත්, අපේ ව්‍යවස්ථාව එන තෙක් බලා සිටීමටත් සිදුවේ. එහෙත්, අප යෙදී සිටින්නේ කෝටි එකසිය විසි පහක් ජනතාවගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කිරීමෙහි බව අපි දන්නෙමු. අවහිරකම්, දුර්මතයන් සහ අනවබෝධය දැනට අපට තාවකාලික බාධකයක් වී තිබේ. පැයෙන් පැයට, එම බාධකය අතීතයට එකතු වෙමින් දුරුවී යන්නේය. එයින් අවහිරකම් තිබුණේ වී නමුත්, අපි, ලෝක ජනගහනයෙන් මෙම සියයට හැත්තෑවෙහි, මෙම වැඩකරන සහ සූරාකනු ලබන ජනතාවෙහි නියෝජිතයන්ගේ තත්ත්වයට, සැබෑ ආරක්ෂකයන්ගේ තත්ත්වයට වැඩි වැඩියෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රථමයෙන්ම, අපේ ප්‍රවාද පත්ලෙහි තිබෙන මූලික අදහස කුමක්ද? එය නම්, පීඩිත සහ පීඩක ජාතීන් අතර ඇති වෙනස පිළිබඳ අදහසය. දෙවැනි ජාත්‍යන්තරය සහ ධනපති ප්‍රජාතන්ත්‍රවාදය මෙන් නොව, අපි මෙම වෙනස අවධාරණය කරන්නෙමු. අධිරාජ්‍යවාදයේ මෙම යුගයේදී යථාර්ථ ආර්ථික කරුණු නිශ්චය කරගැනීම සහ යටත් විජිත හා ජාතික ප්‍රශ්න සියල්ලම සම්බන්ධයෙන් වියුක්ත උපග්‍රහණයන් කෙරෙහි විශ්වාසය තැබීමෙන් තොරව යථාර්ථයන් මත පිහිටා කටයුතු කිරීම නිර්ධන පංතියට හා කොමියුනිස්ට් ජාත්‍යන්තරයට වැදගත් වන්නේය.

අධිරාජ්‍යවාදයේ ස්වභාව නිරූපී අංග ලක්ෂණය රැඳී පවතින්නේ, අපට පෙනෙන්නට තිබෙන සේ පීඩිත ජාතීන් විශාල ගණනක්ද, පීඩක ජාතීන් ඉතා ස්වල්පයක්ද වශයෙන් ලෝකය බෙදී තිබීම සහ මෙහි පසු කී ජාතීන්ට යෝධ ධනස්කන්ධයක් හා බලවත් යුද්ධ හමුදා හිමිව තිබීම මතය. අපි ලෝක ජනගහනය 175 කෝටියක් ලෙස ගන්නෙමු නම්, ඉන් සියක් කෝටියකට වැඩි අති බහුතරය, සමහර විට 125 කෝටියක්ම, වෙනත් වචනවලින් කියතොත්, සියයට 70 ක්ම පීඩිත ජාතීන්ට අයත් වේ. ඒවා එක්කෝ එක එල්ලේම යටත් විජිත ගැති භාවයට, නැතහොත්, පර්සියාව, තුර්කිය හා චීනය මෙන් අර්ධ යටත් විජිත තත්ත්වයට හෝ, එසේත් නැත-හොත්, කිසියම් මහා අධිරාජ්‍යවාදී බලවතෙක් විසින් ජයගනු ලැබීම නිසා සාම ගිවිසුම් කරනකොට ගෙන බොහෝ සේ ගැති වූ තත්ත්වයට හෝ පත්වූ ජාතීහු වෙති. ජාතීන් පීඩිත හා පීඩක වශයෙන් මෙසේ වෙන් කොට දැක්වීම ප්‍රවාද මුළුල්ලෙහිම දක්නට ලැබෙන දෙයකි. මගේ අත්සනින් මුලින් පළ කෙරුණු ප්‍රවාදවල මෙන්ම, රෝයි සහෝදරයා ඉදිරිපත් කළ ප්‍රවාදවලද එම ලක්ෂණය දක්නට ලැබේ. මෙයින් පසු කී ප්‍රවාද සකස් කරන ලද්දේ ප්‍රධාන වශයෙන්ම බ්‍රිතාන්‍යය විසින් පීඩිත ඉන්දියාව සහ අනෙකුත් විශාල ආසියාතික රටවල ස්ථාවරය අනුවය. අපට ඒවා බෙහෙවින් වැදගත් වන්නේ එහෙයිනි.

අධිරාජ්‍යවාදී යුද්ධයෙන් පසුව, දැනට පවතින ලෝක තත්ත්වයන් යටතේ ජනතාවනුත්, සමස්ත ලෝක දේශපාලන ක්‍රමයත් අතර සම්බන්-ධකම් නිගමනය වන්නේ අතලොස්සක් අධිරාජ්‍යවාදී ජාතීන්ගෙන් සමන්-විත කණ්ඩායමක් සෝවියට් ව්‍යාපාරයට සහ සෝවියට් රුසියාව ප්‍රධාන කොටගත් සෝවියට් රාජ්‍යවලට විරුද්ධව කරන අධිෂ්ඨාන සහගත අරග-ලය අනුවය යන්න, අපේ ප්‍රවාදවල අඩංගු දෙවැනි මූලික අදහසයි. අපි මෙය සිත්හි දරා නොගන්නෙමු නම්, එකම ජාතික හෝ යටත් විජිත ප්‍රශ්නයක් වත් හරි ආකාර ලෙස ඉදිරිපත් කිරීමට අපට නුපුළුවන් වනු ඇත. ලෝකයේ ඉතාමත් ඈත පිටිසර ප්‍රදේශයක් සම්බන්ධයෙන් වුවද තත්ත්වය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එයම වන්නේය. ශීලාචාර රටවලත්, නොදියුණු රටවලත් කොමියුනිස්ට් පක්ෂ දේශපාලන ප්‍රශ්න නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමේ හා ඒවා විසඳා ගැනීමේ හැකියාව එකසේ ලබනු ඇත්තේ මෙම උපග්‍රහණය මුල් කර ගෙන කටයුතු කරතොත් පමණකි.

තුන්වැනිව, නොදියුණු රටවල ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්නය ගැන විශේෂයෙන්ම අවධාරණය කරනු කැමැත්තෙමි. මෙය යම් යම් මත වෙනස්කම්වලට තුඩු දුන් කරුණකි. කොමියුනිස්ට් ජාත්‍යන්තරය සහ කොමියුනිස්ට් පක්ෂ, නොදියුණු රටවල ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට ආධාර දිය යුතු යයි කීම ප්‍රතිපත්තිය සහ න්‍යාය වශයෙන් හරිද, වැරදිද යන්න ගැන අපි සාකච්ඡා කර ඇත්තෙමු. අපේ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් ''ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී'' ව්‍යාපාර ගැන කථා කරනවා වෙනුවට ජාතික-විප්ලවවාදී ව්‍යාපාර ගැන කථා කිරීම සුදුසු බව අපි ඒකමතිකව තීරණය කෙළෙමු. නොදියුණු රටවල ජනගහනයෙන් ඉතා වැඩි බහුතරය ධනපති පංතික ධනපති සම්බන්ධකම් නියෝජනය කරන ගොවි ජනතාවගෙන් සමන්විත වෙන හෙයින්, එහි ඕනෑම ජාතික ව්‍යාපාරයක් ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක් මිස අනෙකක් විය නොහැකි බව නිසැක ලෙස කිව හැක. මෙම නොදියුණු රටවල නිර්ධන පංතික පක්ෂ ඇත්ත වශයෙන්ම මතුවිය හැකි නම්, ඒවා එම රටවල ගොවිජන ව්‍යාපාර සමග නිශ්චිත සම්බන්ධකම් ගොඩනගා ගන්නේ නැතිව සහ එම ව්‍යාපාරවලට ක්‍රියාත්මක ලෙස සහයෝගය දෙන්නේ නැතිව කොමියුනිස්ට් උපක්‍රම සහ කොමියුනිස්ට් ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ හැකියාව ඒවාට ලැබෙනු ඇතැයි සිතීම මනෝරාජිකය. එසේ වුවද, අපි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය ගැන කථා කරන්නෙමු නම්, එය ප්‍රතිසංස්කරණවාදී සහ විප්ලවවාදී ව්‍යාපාර අතර වෙනස සම්පූර්ණයෙන් මකා දමීමක් වනු ඇතැයි යන විරුද්ධත්වය ඉදිරිපත් වී තිබේ. එසේ නමුත්, පීඩිත ජාතීන් අතරත් ප්‍රතිසංස්කරණවාදී ව්‍යාපාරයක් රෝපණය කරනු පිණිස අධිරාජ්‍යවාදී ධනපති පංතිය එය සතු සෑම ශක්තියක්ම යොදා කටයුතු කරන හෙයින්, නොදියුණු සහ යටත් විජිත රටවල් අතරද මෑතදී මෙම වෙනස පැහැදිලි ලෙස පෙනී ගොස් තිබේ. පීඩක රටවල ධනපති පංතිය හා යටත් විජිතවල ධනපති පංතිය අතර එක්තරා සමීපතාවයක් ඇති වී තිබේ. එනිසා බොහෝ විට, සමහර විට වැඩි වශයෙන්ම, පීඩිත රටවල ධනපති පංතිය ජාතික ව්‍යාපාරයට ආධාර දෙන අතරම, අධිරාජ්‍යවාදී ධනපති පංතිය සමග සම්පූර්ණ එකඟත්වයකින් යුතුව කටයුතු කරයි. සියලුම විප්ලවවාදී ව්‍යාපාරවලට සහ විප්ලවවාදී පංතිවලට විරුද්ධව අධිරාජ්‍යවාදී ධනපති පංතිය සමග අත්වැල් බැඳ ගනියි. ප්‍රතික්ෂේප කළ නොහැකි ලෙසින් මේ බව කොමිසමෙහිදී ඔප්පු විය. එනිසා, මෙම වෙනස සැලකිල්ලට ගෙන, සෑම අවස්ථාවකදීම පාහේ ''ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී'' යන පාඨය වෙනුවට ''ජාතික-විප්ලවවාදී'' යන්න යෙදීම එකම නිවැරදි ආකල්පය වන බව අපි තීරණය කළෙමු. මෙම වෙනස් කිරීමේ අර්ථය වන්නේ, යටත් විජිතවල ධනපති විමුක්ති ව්‍යාපාර ඇත්ත වශයෙන්ම විප්ලවවාදී වන කල පමණක්, ගොවි ජනයාට සහ සූරාකනු ලබන ජනතාවට අධ්‍යාපනය දී ඔවුන් විප්ලවවාදී ජීවගුණයකින් යුතුව සංවිධානය කිරීමට අප කරන වැඩ කටයුතුවලට එම ව්‍යාපාරවල පක්ෂවාදීන් බාධා නොකරන විට පමණක්, කොමියුනිස්ට්වරුන් වශයෙන් අප ඒවාට ආධාර කළ යුතු බවයි. මෙම රටවල එවැනි තත්ත්වයක් නොපවතින්නේ නම්, ඒවායේ කොමියුනිස්ට්වාදීන් ප්‍රතිසංස්කරණවාදී ධනපති පංතියට විරුද්ධව සටන් කළ යුතු වේ. දෙවැනි ජාත්‍යන්තරයේ වීරයන් අයත් වන්නේද එම පංතියට බව මෙහිලා සඳහන් කළ යුතුය. යටත් විජිත රටවල දැනටමත් ප්‍රතිසංස්කරණවාදී පක්ෂ ඇත. සමහර අවස්ථාවල ඒවායේ නියෝජිතයෝ තමන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ලෙසට සහ සමාජවාදීන් ලෙසට හඳුන්වා ගනිති. මා සඳහන් කළ වෙනස දැන් ප්‍රවාද සියල්ලෙහිම සඳහන් කර තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපේ අදහස් දැන් ඉතාමත් පැහැදිලි ලෙස ඉදිරිපත් වී ඇතැයි මම සිතමි.

ඊළඟට ගොවිජන සෝවියට් සභා ගැන අදහසක් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. ඉහතදී සාර්වාදී යටත් විජිත ලෙසට පැවති තුර්කිස්ථානය ආදී රටවල කරගෙන යනු ලබන රුසියානු කොමියුනිස්ට්වරුන්ගේ ප්‍රායෝගික වැඩ කටයුතුවලදී පූර්ව-ධනපති කොන්දේසි පවතින තන්හි කොමියුනිස්ට් උපක්‍රම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන ප්‍රශ්නයට මුහුණ දීමට අපට සිදුවිය. මෙම රටවල තවමත් ප්‍රධාන තීරක අංග ලක්ෂණය වී තිබෙන්නේ පූර්ව-ධනපති සම්බන්ධතා බාහුල්‍යයි. එනිසා එම රටවල පිරිසිදු නිර්ධන පංති ව්‍යාපාරයක් තිබීමේ ප්‍රශ්නයක් මතු විය නොහැක. එරටවල කාර්මික ධනපති පංතියක් ඇත්තේම නැති තරම් ය. එසේ වුවත්, එහිදී පවා අපි නායක කාර්ය කොටස භාර ගත යුත්තෙමු. අපි එය භාර ගෙන ඇත්තෙමු. මෙම රටවල කටයුතුවලදී අති මහත් දුෂ්කරතාවයන් ජයගත යුතුව තිබෙන බව අපි අත්දැකීමෙන් දන්නෙමු. කෙසේ හෝ වේවා මෙම දුෂ්කරතාවයන් තිබුණේ වී නමුත්, නිර්ධන පංතියක් ඇත්තේම නැතැයි කිවහැකි තන්හි පවා ජනතාව තුළ ස්වාධීන දේශපාලන සිතුවිලි සහ ස්වාධීන දේශපාලන ක්‍රියාකාරිත්වය පිළිබඳ උනන්දුවක් දල්වාලීමට හැකි තත්ත්වයක් අපට ඇතැයි යනු අපගේ වැඩ කටයුතුවල ප්‍රායෝගික ප්‍රතිඵලවලින් පෙනී ගොස් තිබේ. මෙම කටයුත්තෙහිදී බටහිර යුරෝපීය රටවල සහෝදරවරුන්ට විඳින්නට සිදුවනවාට වඩා අමාරුකම් අපට විඳින්නට සිදුවිය. එසේ වූයේ රුසියාවේ නිර්ධන පංතිය රාජ්‍ය පරිපාලන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කටයුතුවල ඇළී ගැලී සිටින හෙයිනි. අර්ධ වැඩවසම් ගැති භාවයේ කොන්දේසි යටතේ ජීවත් වන ගොවි ජනයාට සෝවියට් සංවිධානය පිළිබඳ අදහස පහසුවෙන්ම සාක්ෂාත් කර ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට හැකි බව එක් වරම වැටහී යනු ඇත. පීඩිත ජනයාට, එනම් වෙළෙඳ ප්‍රාග්ධනය විසින් පමණක් නොව රදළවාදීන් සහ වැඩවසම් ක්‍රමය මත පදනම් වූ රාජ්‍යයක් විසින්ද සූරා කනු ලබන පීඩිත ජනයාට, අදාළ කොන්දේසි යටතේ මෙම අවිය, මෙම සංවිධාන වර්ගය යොදගත හැකි බවත් එසේම පැහැදිලිය. සෝවියට් සංවිධානය පිළිබඳ අදහස සරලය. එය නිර්ධන පංති සම්බන්ධකම්වලට පමණක් නොව, ගොවිජන වැඩවසම් සහ අර්ධ වැඩවසම් සම්බන්ධකම්වලටද ගලපා ගත හැකිය. මේ හා සම්බන්ධයෙන් අප මෙතෙක් ලබා සිටින අත්දැකීම් විශාල නොවේ. එසේ වුවද, ගොවිජන සෝවියට් සභා සහ සූරාකනු ලබන්නන්ගේ සෝවියට් සභා යනු ධනපති රටවල පමණක් නොව, පූර්ව-ධනපති සම්බන්ධකම් පවතින රටවල පවා යොදගත හැකි ආයුධයක් බව කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ප්‍රවාද මගින් පෙන්වාදීමේ අවශ්‍යතාවය, යටත් විජිත රටවල නියෝජිතයින් කීප දෙනෙකුගේද සහභාගීත්වය ඇතිව කොමිසමේදී සිදුවූ විවාදයෙන් නිසැක ලෙස පැහැදිලි විය. එනිසා ගොවිජන සෝවියට් සභාවලට හෝ වැඩකරන ජනතාවගේ සෝවියට් සභාවලට හෝ පක්ෂව, නොදියුණු සහ යටත් විජිත රටවල්ද ඇතුළුව, සෑම තන්හිම ප්‍රචාරක කටයුතු කිරීම කොමියුනිස්ට් පක්ෂවල සහ කොමියුනිස්ට් පක්ෂ පිහිටුවීමට බලාපොරොත්තු වන පිරිස්වල ඒකාන්ත යුතුකම වන්නේය. සුදුසු කොන්දේසි බලපවත්වන සෑම තැනෙකම වැඩකරන ජනතාවගේ සෝවියට් සභා පිහිටුවීමට ඔවුන් අප්‍රමාදවම ප්‍රයත්න දැරිය යුතුය.

අපගේ ප්‍රායෝගික වැඩ කටයුතු පිළිබඳ උනන්දුව ජනිත කරන සහ ඉතා වැදගත් වන ක්ෂේත්‍රයක් මෙයින් විවෘත වන්නේය. මෙතෙක් මේ සම්බන්ධයෙන් අප ලබා තිබෙන ඒකාබද්ධ අත්දැකීම් විශාල නොවේ. එහෙත් ක්‍රම ක්‍රමයෙන් තව තවත් දත්තයන් එකතු වනු ඇත. දියුණු රටවල නිර්ධන පංතියට නොදියුණු රටවල ජනතාවන්ට ආධාර කළ හැකි බවත්, ඔවුන් එය කළ යුතු බවත් විවාද රහිතව පිළිගත යුතුය. එමෙන්ම සෝවියට් සමූහාණ්ඩුවල ජයග්‍රාහී නිර්ධන පංතිය මෙම ජනතාවන් වෙත ආධාරයේ හස්තය දිගු කරන විට හා ආධාර දීමට හැකි තත්ත්වයකට පත්වූ විට නොදියුණු රටවලට ඒවායේ වර්තමාන සංවර්ධන මට්ටමෙන් ගොඩ ආ හැකි බව නිසැකය.

මෙම ප්‍රශ්නය ගැන කොමිසම තුළ ඉතාමත් උනන්දුව දනවන විවාදයක් ඇති විය. මා අත්සන් කළ ප්‍රවාද ගැන පමණක් නොව, ඊටත් වඩා රෝයි සහෝදරයාගේ ප්‍රවාද ගැන එසේ සාකච්ඡා කරන ලදී. රෝයි සහෝදරයාගේ ප්‍රවාදවලට යම් යම් සංශෝධන ඇතුළත් කිරීමට ඒකමතික ලෙස තීරණය විය. එම ප්‍රවාද නිවැරදි බව පෙන්වීමට ඔහු මෙහිදී කරුණු ඉදිරිපත් කරනු ඇත.

ප්‍රශ්නය මෙසේ ඉදිරිපත් කරන ලදී: දැනට විමුක්තියේ මාවතෙහි (ගමන් කරමින්) සිටින සහ යුද්ධයෙන් පසුව ප්‍රගතිය කරා කිසියම් ඉදිරි ගමනක යෙදෙන නොදියුණු ජාතීන් ආර්ථික සංවර්ධනයේ ධනපති අවධියට අනිවාරණීය වශයෙන්ම එළඹිය යුතු යයි ස්ථිර කොට කීම නිවැරදි සේ අපට සැලකිය හැකිද? අප එයට පිළිතුරු දුන්නේ, නැත යනුවෙනි. ජයග්‍රාහී විප්ලවවාදී නිර්ධන පංතිය එම ජාතීන් අතර ක්‍රමානුකූල ප්‍රචාරයක් ගෙන යයි නම්, එසේම සෝවියට් රාජ්‍යයන් තම ප්‍රයෝජනය සඳහා ඇති සියලුම මාධ්‍යයන් යොදගනිමින් ඔවුන්ගේ ආධාරයට එන්නේ නම් එවැනි තත්ත්වයක් යටතේ නොදියුණු රටවල් අනිවාරණීය වශයෙන්ම ධනපති සංවර්ධන අවධිය ඔස්සේ ගමන් කළ යුතු යයි සිතා ගැනීම වරදක් වනු ඇත. අප කළ යුතු වන්නේ සියලුම යටත් විජිත රටවල සහ නොදියුණු රටවල සටන්කරුවන්ගේ ස්වාධීන බල ඇණි සහ පක්ෂ සංවිධාන කිරීම පමණක් නොවේ. ගොවිජන සෝවියට් සභා සංවිධාන කිරීම පිණිස වහාම ප්‍රචාරක කටයුතුවල යෙදීම සහ ඒවා පූර්ව-ධනපති තත්ත්වයන්ට ගැලපීමට උත්සාහ දැරීම පමණක්ද නොවේ. නොදියුණු රටවල් ධනපති සංවර්ධන අවධිය ඔස්සේ නොයා, දියුණු රටවල නිර්ධන පංතියේ ආධාරය ලබමින් සෝවියට් ක්‍රමය වෙත එළඹීමටත්, යම් යම් සංවර්ධන අවධි මගින් කොමියුනිස්ට් ක්‍රමයට පිවිසීමටත් ඒවාට හැකිය යන ප්‍රස්තුතය නිසි න්‍යායික පදනමෙහි රුවා ඉදිරිපත් කිරීමද කොමියුනිස්ට් ජාත්‍යන්තරයෙන් ඉටු විය යුතුය.

මේ සඳහා අවශ්‍ය මාධ්‍යයන් මොනවාද යන්න කල් තබා දැක්විය නොහැක. මේවා ප්‍රායෝගික අත්දැකීම්වලින් පැහැදිලි වනු ඇත. එසේ වුවද, ඉතාමත් දුර බැහැර ජාතීන්ගේ වැඩකරන ජනතාවට පවා, සෝවියට් සභා පිළිබඳ අදහස වැටහෙන බවද, මේ සංවිධාන, එනම් සෝවියට් සභා පූර්ව-ධනේශ්වර සමාජ ක්‍රමයේ කොන්දේසිවලට ගලපා ගත යුතු බවද, එම අරමුණ සඳහා කොමියුනිස්ට් පක්ෂයේ කාර්යය ලෝකය මුළුල්ලේම අප්‍රමාදව ආරම්භ කළ යුතු බවද නිශ්චිත වශයෙන්ම තහවුරු වී තිබේ.

කොමියුනිස්ට් පක්ෂ තමන්ගේම රටවල පමණක් නොව, යටත් විජිත රටවලද, විශේෂයෙන්ම, යටත් විජිත ජනතාව යටපත් කර තැබීම සඳහා සූරාකන ජාතිය යොදා තිබෙන හමුදා අතරද විප්ලවවාදී වැඩ කිරීමේ වැදගත්කම ගැන මම අවධාරණය කරනු කැමැත්තෙමි.

බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ[23] ක්වෙල්ච් සහෝදරයා මේ ගැන අප

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොමිසමෙහිදී කථා කළේය. බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව, වහල් බැම්මට හසුවූ ජාතීන්ගේ නැගිටීම්වලට ආධාර කිරීම සාමාන්‍ය බ්‍රිතාන්‍ය කම්කරුවා විසින් සලකනු ලබන්නේ රාජද්‍රෝහිකමක් වශයෙනැයි ඔහු කීවේය. බ්‍රිතාන්‍යයේ සහ ඇමෙරිකාවේ අධිරාජ්‍යවාදී සහ ජාත්‍යොන්මාදවාදී අදහස් ඇති කම්කරු රදළයන් සමාජවාදයට මහත් අන්තරායක් වී තිබෙන බවත්, දෙවැනි ජාත්‍යන්තරයේ බල පවුරක් වී තිබෙන බවත් ඇත්තය. මෙහිදී, මෙම ධනපති ජාත්‍යන්තරයට අයත් නායකයන්ගේ සහ කම්කරුවන්ගේ විශාලම පවා දීමට මුහුණ පෑමට අපට සිදුවේ. යටත් විජිත ප්‍රශ්නය දෙවැනි ජාත්‍යන්තරයෙහිද සාකච්ඡා විය. එසේම, මෙම කාරණය සම්බන්ධයෙන් බාස්ල් ප්‍රකාශනයෙහි[24] ඉතාමත් පැහැදිලි ලෙස කරුණු දක්වා ඇත. දෙවැනි ජාත්‍යන්තරයේ පක්ෂ තමන් විප්ලවවාදී ක්‍රියාවන්හි යෙදෙන බවට ගිවිසගෙන ඇති නමුත්, ඔවුන් අවංක විප්ලවවාදී කටයුතු සම්බන්ධයෙන් හෝ පීඩක ජාතීන්ට විරුද්ධව සූරාකනු ලබන සහ ගැති ජාතීන් ගසන ඔවුන්ගේ කැරැල්ලට ආධාර දීම සම්බන්ධයෙන් හෝ කිසිම සංඥාවක් පවා කර නැත. දෙවැනි ජාත්‍යන්තරයෙන් ඈත් වූ සහ තුන්වැනි ජාත්‍යන්තරයට සම්බන්ධ වීමට අදහස් කරන පක්ෂ බොහොමයකටද මෙම කරුණ අදාළ වන්නේ යයි මම සිතමි. අපි ප්‍රසිද්ධ ලෙස ඒ බව ප්‍රකාශ කළ යුත්තෙමු. එය ප්‍රතික්ෂේප කිරීමට ඉඩක් නැත. එය ප්‍රතික්ෂේප කිරීමට ප්‍රයත්නයක් දරනු ලැබේදැයි බලමු.

අපගේ යෝජනාවල පදනම සකස් කර තිබෙන්නේ මෙම කරුණු සියල්ලම සැලකිල්ලට ගනිමිනි. එම යෝජනා නිසැකවම පමණට වඩා දීර්ඝ වුවත්, ඒවා ප්‍රයෝජනවත් වනු ඇතැයිද, ජාතික සහ යටත් විජිත ප්‍රශ්න හා සම්බන්ධයෙන් අවංක විප්ලවවාදී කටයුතු සංවර්ධනය කිරීමට සහ සංවිධාන කිරීමට දිරිගැන්වීමක් ඒවායින් ලැබෙනු ඇතැයිද යන්න මට ඒකාන්තය. අපේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ එයයි.

1920 අගෝස්තු 7 ද "කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනයේ නිවේදකයා" යන ප්‍රකාශනයෙහි අංක 6 කලාපයෙහි පළ කරන ලදී

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 41, පිටු 241-247

තරුණ සංගම්වලට භාර කර්තව්‍යයන්

(රුසියානු තරුණ කොමියුනිස්ට් සංගමයේ තුන්වැනි සමස්ත රුසියා සම්මේලනයේදී 1920 ඔක්තෝබර් 2 දින කළ කථාව)

(සම්මේලනය ඉමහත් ප්‍රීති ඝෝෂාවකින් ලෙනින් පිළි ගනියි). සහෝදරවරුනි, අද මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ තරුණ කොමියුනිස්ට් සංගමයේ මූලික කර්තව්‍යයන් ගැනය. ඊට අදාළව, සමාජවාදී සමූහාණ්ඩුවක තරුණ සංවිධාන කෙබඳු විය යුතුද යන්න ගැනද සාමාන්‍ය වශයෙන් සඳහන් කරන්නෙමි.

මෙම ප්‍රශ්නය ගැන විමසා බැලීම ඉතාමත් වැදගත්ය. මා එසේ කියන්නේ, එක්තරා අර්ථයකින් බලන කල කොමියුනිස්ට් සමාජයක් නිර්මාණය කිරීමේ නියම කර්තව්‍යයට මුහුණ දෙන්නට සිදු වන්නේ යෞවනයන්ට වන හෙයිනි. ඒ මන්ද? ධනපති සමාජයේ ඇති දැඩි කෙරුණු වැඩකරන ජනතා පරම්පරාවට ඉටු කළ හැකි උසස්ම කර්තව්‍යය වූ කලී, පැරණි ක්‍රමයේ, එනම්, සූරාකෑම මත ගොඩ නගන ලද ධනපති ජීවන ක්‍රමයේ පදනම් විනාශ කිරීම පමණකි. එයට කළ හැකි වන උසස්ම දෙය නම්, නිර්ධන පංතියට හා කම්කරු පංතීනට බලය රැක ගැනීමටත්, ශක්තිමත් පදනමක් දැමීමටත් ආධාරකාරී වන නව සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීම පමණකි. එම පදනම මත ඉදි කිරීම් කටයුතු කරනු හැක්කේ, මිනිසා විසින් මිනිසා සූරාකෑම උඩ ගොඩනැගුනු සම්බන්ධකම් තවදුරටත් නොපවත්නා නව තත්ත්වයක් යටතේ, නව කොන්දේසි යටතේ වැඩ අරඹන පරම්පරාවකට පමණකි.

එබැවින්, තරුණයන්ට මුහුණ පාන්නට සිදුවන කර්තව්‍යයන් ගැන මේ අංශයෙන් සලකා බලන කල, පොදු වශයෙන් තරුණයන්ටද, විශේෂයෙන්ම, තරුණ කොමියුනිස්ට් සංගම්වලට හා අනිකුත් සංවිධානවලටද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පැවරෙන කර්තව්‍යය එක වචනයකින් පිඩු කොට දක්විය හැකිය. එය උගෙනගන්න යන්නය.

නමුත්, මෙය ''එක වචනයක්'' පමණකි. ප්‍රධාන සහ ඉතාමත් වැදගත් ප්‍රශ්නවලට එයින් පිළිතුරු සැපයෙන්නේ නැත. උගෙන ගන්නේ මොනවාද? උගෙන ගන්නේ කොහොමද? මෙහිලා ඉතාමත් වැදගත් කාරණය වන්නේ පැරණි, ධනපති සමාජය පරිවර්තනයට භාජනය කිරීමේ තත්ත්වයන් යටතේ, කොමියුනිස්ට් සමාජය නිර්මාණය කිරීමට සිටින අළුත් පරම්පරාවන් ඇති දැඩි කිරීම, පුහුණු කිරීම සහ ශික්ෂණය පැරණි ක්‍රියාමාර්ග අනුව නොකළ හැකි වීමය. තරුණ පරපුරට උගැන්වීම, ඔවුන් පුහුණු කිරීම හා ශික්ෂණය කිරීම ආරම්භ විය යුත්තේ අපට පැරණි සමාජයෙන් ඉතිරි කර තිබෙන ද්‍රව්‍ය ආධාර කොට ගනිමිනි. අපට කොමියුනිස්ට් ක්‍රමය ගොඩ නැගීමට පුළුවන් වන්නේ පැරණි සමාජයෙන් අපට ඉතිරි කරතිබෙන දැනුම, සංවිධාන සහ ආයතන සමස්තය පදනමක් ලෙසට ගනිමින්ද, එම සමාජයෙන් ඉතිරි කර තිබෙන මිනිස් බලවේග හා මාධ්‍යයන් සංචිතය උපයෝගි කර ගනිමින්ද පමණකි. තරුණ පරම්පරාවේ පරිශ්‍රමයන් ඵල දරමින්, පැරණි සමාජයට වඩා වෙනස් සමාජයක්, එනම්, කොමියුනිස්ට් සමාජයක් නිර්මාණය වීම අපට සහතික කළ හැකි වන්නේ තරුණ අධ්‍යාපනය, සංවිධානය හා පුහුණුව සහමුලින්ම වෙනස් කිරීමෙන් පමණකි. එනිසා අප තරුණ පෙළට උගැන්විය යුත්තේ මොනවාද, කොමියුනිස්ට් තරුණයෝ යන නමට සුදුසු වීමට ඔවුහු ඇත්ත වශයෙන්ම අපේක්ෂා කරති නම්, ඔවුන් උගෙන ගත යුත්තේ කෙසේද, අප පටන්ගත් ව්‍යායාමය සම්පූර්ණ කර පරිපූර්ණත්වයට පත් කළ හැකි වනු පිණිස ඔවුන් පුහුණු කළ යුත්තේ කෙසේද යන ප්‍රශ්නය අපි සවිස්තරව විමසා බැලිය යුත්තෙමු.

මෙහිදී ප්‍රථමයෙන් හා ඉතාමත් ස්වාභාවික ලෙස ඉදිරිපත් වන පිළිතුර ලෙසට පෙනෙන්නේ තරුණ සංගම හා කොමියුනිස්ට් ක්‍රමය කරා ඉදිරියට යාමට අපේක්ෂා කරන තරුණ පිරිස පොදු වශයෙන් කොමියුනිස්ට්වාදය උගත යුතුය යන්නය.

නමුත්, මෙම, ''කොමියුනිස්ට්වාදය උගෙන ගන්න'' යන පිළිතුර පමණට වඩා ලුහුඬුය. කොමියුනිස්ට්වාදය උගෙන ගැනීම සඳහා අපට අවශ්‍ය වන්නේ මොනවාද? කොමියුනිස්ට්වාදය ගැන දැනුමක් ලබනු සඳහා පොදු ඥානයේ එකතු සමස්තයෙන් වෙන් කොට ගත යුත්තේ මොනවාද? මෙහිදී අනතුරු ගණනාවක් ඉස්මතු වේ. ඒවා නම්, කොමියුනිස්ට්වාදය උගෙන ගැනීම පිළිබඳ කර්තව්‍යය වැරදි ලෙස ඉදිරිපත් කළ විට, නැතහොත්, එහි අර්ථය පමණට වඩා එක පැත්තකට බර වන ආකාරයෙන් නිරූපණය කළ විට මතු වන අනතුරුය.

කොමියුනිස්ට්වාදය උගෙන ගැනීම යනුවෙන් අදහස් කරන්නේ

කොමියුනිස්ට් අත් පොත්, පොත් පොඩි හා ග්‍රන්ථවල අන්තර්ගත දැනුම මුළුමනින්ම අවබෝධ කර ගැනීම වනැයි කෙනෙක් ස්වාභාවික වශයෙන්ම එක් වරම සිතන්නට ඉඩ තිබේ. නමුත්, කොමියුනිස්ට්වාදය උගෙන ගැනීම ගැන එ ලෙසින් කරන අර්ථ නිරූපනයක් පමණට වඩා ගොරෝසු සහ අඩුපාඩු සහිත වේ. කොමියුනිස්ට්වාදය උගෙන ගැනීම හුදෙක් කොමියුනිස්ට් ග්‍රන්ථවල හා පොත් පොඩිවල අන්තර්ගත දේ අවබෝධ කර ගැනීමෙන් පමණක් සංයුක්ත වී නම්, අපට ඉතා පහසුවෙන්ම පොත් විජ්ජාකාරයන්, නැතහොත්, පුරාජේරුකාරයන් ලබා ගත හැකි වනු ඇත. මෙයින් අපට බොහෝ විට හානි පැමිණෙනු ඇත. එසේ වන්නේ කොමියුනිස්ට් පොත්වල හා පොත් පොඩිවල ඇති දෑ කට පාඩම් කර ගැනීමෙන් පසු එවැනි පුද්ගලයන් විවිධ අංශවල දැනුම ඒකාබද්ධ කර ගැනීමේ හැකියාවක් නැතිව සහ කොමියුනිස්ට්වාදය සැබැවින්ම අපේක්ෂා කරන ආකාරයෙන් කටයුතු කිරීමට අසමත්ව සිටිනු ඇති හෙයිනි.

පැරණි, ධනපති සමාජයෙන් අපට ඉතිරි කර තිබෙන ලොකුම උවදුරු සහ අභාග්‍යයන් අතුරෙන් එකකි, පොත් සහ ප්‍රායෝගික ජීවිතය අතර සම්පූර්ණ පරස්පරය. සියලු දේම හැකි අනර්ඝතම ආකාරයෙන් විස්තර කරන පොත් අපට තිබිණි. එහෙත් අතිබහුතර ගණනක්ම අවස්ථාවලදී මෙම පොත්වල අන්තර්ගත වූයේ ඉතාමත් විනාශකාරී සහ වංචා සහගත බොරුය. — ධනපති සමාජය ගැන බොරු විස්තරයක්ය.

කොමියුනිස්ට්වාදය පිළිබඳව හුදෙක් පොත්වල දැනුමෙන් පමණක් අවබෝධ කර ගැනීමේ අදහස විශාල වනු ඇත්තේ එහෙයිනි. අප දැන් කරන කථා සහ ලියන ලිපි හුදෙක්ම කලින් කොමියුනිස්ට්වාදය ගැන කියන ලද දේ පුනරුච්චාරනය කිරීමක් නොවේ. ඒසේ කියන්නේ අපගේ කථා හා ලිපි අද දිනපතාම සෑම ක්ෂේත්‍රයකම කරන වැඩ කටයුතු හා සමග සම්බන්ධ වී තිබෙන හෙයිනි. වැඩ කිරීමෙන් තොරව, අරගලයෙන් තොරව, කොමියුනිස්ට් පොත් පොඩිවලින් හා කෘතිවලින් ලබාගත් කොමියුනිස්ට්වාදය පිළිබඳ දැනුමෙහි කිසිම වටිනාකමක් නොමැත. මා එසේ කියන්නේ, න්‍යාය සහ ව්‍යවහාරය වෙන් කර තැබීමේ පැරණි වරදම, පැරණි, ධනපති සමාජයේ ඉතාමත් විනාශකාරී අංගලක්ෂණය වූ ඒ පැරණි පරස්පරයම, එයින් පවත්වා ගනු ලබන හෙයිනි.

කොමියුනිස්ට් සටන් පාඨ පමණක් අවබෝධ කර ගැනීමට ක්‍රියා කිරීම ඊටත් වඩා අනතුරුදායක වනු ඇත. අප කල්තබා මෙම අනතුර ගැන වටහා නොගත්තෙමු නම්, මෙම අනතුර වලකාලීම සඳහා අපි අපගේ පරිශ්‍රමයන් සියල්ලම නොමෙහෙයවුවෙමු නම්, මේ ආකාරයෙන් කොමියුනිස්ට්වාදය උගෙන ගැනීමෙන් පසුව තමන් කොමියුනිස්ට්වාදීන් යයි කියා ගන්නවා ඇති තරුණ පුරුෂයන් හා කාන්තාවන් පන් ලක්ෂයෙන්, නැත-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හොත් දශලක්ෂයෙන් කොමියුනිස්ට්වාදයට සිදුවන්නට තිබුණේ විශාල අයහපතක්ම පමණකි.

මෙහිදී මෙම ප්‍රශ්නය මතු වේ: කොමියුනිස්ට්වාදය අධ්‍යයනය කිරීම සඳහා මේ සියල්ලම සංයෝජනය කර ගන්නේ කෙසේද? පැරණි පාසල්වලින්, පැරණි වර්ගයේ විද්‍යාවෙන් අප ගත යුත්තේ මොනවාද? පැරණි වර්ගයේ පාසැලෙහි ප්‍රකාශිත අරමුණ වූයේ සර්ව පාර්ශවීය අධ්‍යාපනය ලැබූ මිනිසුන් ඉදිරිපත් කිරීම, පොදුවේ විද්‍යාවන් උගැන්වීම ය. නමුත් සමාජය පදනම් වූයේ සහ එය පවත්වා ගන්නා ලද්දේ ජනතාව පංතිවලට බෙදීම, සූරාකන්නන් හා පීඩිතයන් වශයෙන් බෙදීම පදනම් කරගෙනය. එනිසා අධ්‍යාපනයේ එම ප්‍රකාශිත අරමුණ සම්පූර්ණ ව්‍යාජයක් වූ බව අපි දන්නෙමු. පැරණි පාසල් සම්පූර්ණයෙන්ම පංති ජීවගුණයෙන් නැහැවී තිබුණ හෙයින්, ඒවා ස්වාභාවික වශයෙන්ම අධ්‍යාපනය දුන්නේ ධනපති පංතියේ දරුවන්ට පමණකි. ධනපති පංතියේ යහපත පිණිස සෑම වචනයක්ම විකෘති කරන ලදී. මෙම පාසල්වලින් කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ දරුවන්ට දුන්නේ අධ්‍යාපනයට වඩා ධනපති පංතියේ යහපතට අදළ වූ සරඹ පුහුණුවකි. ඔවුන් පුහුණු කරන ලද්දේ ධනපති පංතියේ සාමයට හා විවේකයට බාධා නොකර ලාභ උපදවීමේ හැකියාව ඇත්තා වූ ද, ධනපති පංතියට ප්‍රයෝජනවත් වූ ද සේවකයන් වන ආකාරයට ය. පැරණි වර්ගයේ පාසල් ප්‍රතික්ෂේප කරන අතරම, නියම කොමියුනිස්ට් අධ්‍යාපනයට අවශ්‍ය දේ පමණක් ඒවායින් ගැනීම අපගේ කර්තව්‍යය ලෙසට නියම කරගෙන තිබෙන්නේ එබැවිනි.

බොහෝ විට සම්පූර්ණයෙන්ම වැරදි නිගමනවලට යොමුවන පරිදි පැරණි පාසල්වලට විරුද්ධව නිතර ඉදිරිපත් කරනු ඇසෙන දෝෂාරෝපන හා චෝදනා ගැන මට මෙහිදී සඳහන් කිරීමට සිදුවේ. පැරණි පාසැල් තනිකරම පොතේ දැනුම දෙන, කෙළවරක් නැතිව පාඩම් කරවන හා වෙහෙසකාරී ලෙස උගන්වන පාසැල් වී යයි චෝදනා කරනු ලැබේ. එය ඇත්තකි. නමුත් පැරණි පාසලේ අයහපත් වූ දෙයත්, අපට ප්‍රයෝජනවත් දෙයත් වෙන් කොට හඳුනා ගැනීම අප කළ යුතුය. එයින් කොමියුනිස්ට්වාදයට අවශ්‍ය වන්නේ මොනවාද යනු තෝරා ගැනීමට අප සමත් විය යුතුය.

පැරණි පාසල්වලින් ලැබුණේ තනිකරම පොතේ දැනුම ය. බාල පරම්පරාවෙහි මොලය අසුරා දැමූ සහ ඔවුන් එකම රටාවකට පෙළ ගසන ලද නිලධාරි පිරිසක් බවට හැරවූ වැඩකට නැති, පමණට වැඩි හා නිස්සාර දැනුම සමුදයක් පාඩම් කරන ලෙස ඒවා එහි සිසුවන්ට බල කළේය. ඒ වුවද, මිනිස් වර්ගයා එක්රැස් කළ ඥාන සමුදය අවබෝධ කර නොගෙන කෙනෙකුට කොමියුනිස්ට්වාදියෙකු විය හැකි යයි ඔබ නිගමනය කරතොත්, ඔබ කරන්නේ බරපතල වරදකි. කොමියුනිස්ට්වාදය එම ඥාන සමස්තයේ

ප්‍රතිඵලයයි. එනිසා එම ඥාන සමස්තය සාක්ෂාත් කරගන්නේ නැතිව කොමියුනිස්ට් සටන් පාඨ පමණක් හා කොමියුනිස්ට් විද්‍යාවේ නිගමනයන් පමණක් උගෙන ගැනීම සෑහේ යයි සිතීම වරදකි. මානව ඥාන සමස්තයෙන් කොමියුනිස්ට්වාදය උද්ගත වූයේ කෙසේද යන්න පෙන්වන නිදර්ශනයක් මාක්ස්වාදයෙන් සැපයේ. ප්‍රධාන වශයෙන් මාක්ස් විසින් නිර්මාණය කරන ලද කොමියුනිස්ට් න්‍යාය, කොමියුනිස්ට් විද්‍යාව, මෙම මාක්ස් වාදී ධර්මය දහනවවැනි ශතවර්ෂයේ, මහා ප්‍රාඥයෙක් වූද, එකම සමාජ වාදියෙකුගේ නිර්මාණයක් නොවන බවට පත්ව තිබේ. එම න්‍යාය, දැන් ලෝකය මුළුල්ලේම සිටින දශ ලක්ෂ ගණන් හා කෝටි ගණන් නිර්ධනයන් ධනපති ක්‍රමයට විරුද්ධව කරන ඔවුන්ගේ අරගලයේදී, ඔවුන් විසින් ක්‍රියාත්මක කරනු ලබන දහම වී තිබේ. ඉතාමත් විප්ලවවාදී පංතියේ දශ ලක්ෂ සංඛ්‍යාත හා කෝටි සංඛ්‍යාත ජනතාවන්ගේ සිත් දිනා ගැනීමට තරම් මාක්ස්ගේ උගැන්වීම් පොහොසත් වූයේ මන්දැයි ඔබ ඇසුවහොත් ඔබට ලැබෙනු ඇත්තේ එකම පිළිතුරක් පමණකි. එසේ වූයේ, මාක්ස්, ඔහු කළ කටයුතු ධනපති ක්‍රමය යටතේ අත් කර ගන්නා ලද මානව ඥානසම්භාරය පිළිබඳ ශක්තිමත් පදනම මත පිහිටවූ හෙයිනි. මාක්ස් මිනිස් සමාජයේ සංවර්ධනයට බලපාන නීති ගැන අධ්‍යයනයක් කළේය. ධනපති ක්‍රමය අනිවාරණීය වශයෙන්ම කොමියුනිස්ට් ක්‍රමය දිසාවට සංවර්ධනය වන බව ඔහු වටහා ගත්තේ ඉන් පසුවය. මෙහිදී ඉතාමත් වැදගත් කාරණය වන්නේ, ඉහත පැවති විද්‍යාව විසින් සම්පාදිත සියල්ල සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීම මගින්, ඉඳුරාම මෙම ධනපති සමාජයම ගැන ඉතාමත් නියත, සවිස්තර සහ ගැඹුරු අධ්‍යයනයක් කිරීමෙන් පමණක්, ඔහු මෙම කරුණ ඔප්පු කර තිබීමයි. ඔහු, මිනිස් සමාජය නිර්මාණය කර තිබූ සියලු දෙයක්ම විමර්ශනාත්මක ලෙස නැවත හැඩ ගැන්වූයේය. එසේ කිරීමේදී ඔහු විස්තර කරුණු කිසිවක් අමතක නොකළේය.ඔහු,මිනිස් චින්තනයෙන් නිමවී තිබුණු සියලු දෙයක්ම නැවත සලකා බැලුවේය. විවේචනය කළේය. කම්කරු පංති ව්‍යාපාරය අනුව පරීක්ෂණයට භාජනය කළේය. එසේ කිරීමෙන් ඔහු, ධනපති සීමාවන් තුළ හිරවී සිටින, නැතහොත්, ධනපති දුර්මතවලින් බැඳී සිටින අයට බැසගත නොහැකි වූ නිගමනවලට එළඹියේය.

අපි මෙම කරුණ සිත්හි දරා ගත යුත්තෙමු. නිදසුනක් ලෙසට, අපි නිර්ධන පංති සංස්කෘතිය[25] ගැන කථා කරන විට එය මතක තබා ගත යුතු වෙමු. නිර්ධන පංති සංස්කෘතියක් නිර්මාණය කිරීමේ හැකියාව අපට ලැබෙන්නේ මිනිස් වර්ගයාගේ මුළු මහත් සංවර්ධනයම විසින් නිමවුනු සංස්කෘතිය ගැන හරි දැනීමකින් හා එය පරිවර්තනය කර ගැනීමකින් බව අපි පැහැදිලිවම වටහා නොගන්නෙමු නම්, අපට මෙම ප්‍රශ්නය විසඳිය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හැකි නොවේ. නිර්ධන පංති සංස්කෘතිය හුදු අවකාශයෙන් කඩා ගත හැකි දෙයක් නොවේ. එය තමන් නිර්ධන පංති සංස්කෘතිය පිළිබඳ විශේෂඥයන් යයි කියා ගන්නා අයගේ සොයා ගැනීමක් ද නොවේ. ඒ සියල්ලම අර්ථයෙන් තොරය. නිර්ධන පංති සංස්කෘතිය යනු, ධනපති, ඉඩම්හිමි හා නිලධාරිවාදී සමාජයේ වියගස යටතේ මිනිස් වර්ගයා එක්රැස් කර ගත් දැනුම සම්භාරයෙහි තර්කානුකූල සංවර්ධනය විය යුතුය. මේ මාර්ග සියල්ලම යොමු වී තිබුණේ නිර්ධන පංති සංස්කෘතිය වෙතය. ඒවා තවදුරටත් යොමුවන්නේ ඒ වෙතමය. එය වූ කලී, මාක්ස් විසින් යළි හැඩ ගසන ලද දේශපාලන අර්ථ ශාස්ත්‍රයෙන් මිනිස් සමාජය එළඹෙන්නේ කොතැනටද යනු පෙන්නුම් කෙරෙන වැනි, පංති අරගලයට, නිර්ධන පංති විප්ලවයේ ආරම්භයට මාවත පෙන්නුම් කෙරෙන වැනි කරුණකි.

පැරණි පාසල් පොත්ගුලු ක්‍රමය අනුගමනය කළේ යයි කියමින් තරුණ නියෝජිතයන් මෙන්ම නව අධ්‍යාපන ක්‍රමයේ පක්ෂවාදීන් එම පාසල්වලට පහර දෙනු අපට නිතර ඇසෙන විට, ඒවායින් හොඳ දේ ගත යුතු යයි අපි ඔවුනට කියමු. දහයෙන් නව පංගුවක් නිරර්ථක වූද, ඉතිරි දහයෙන් පංගුව විකෘති කරන ලද්ද වූද විශාල දැනුම සමුදයක් පිරිවීමෙන් තරුණ ජනයාගේ සිත් පීඩාවට පත් කිරීමේ ක්‍රමය පැරණි පාසල්වලින් නොගත යුත්තෙමු. එසේ නමුත්, අපට කොමියුනිස්ට් නිගමනවලට පමණක් සීමා වී සිටිය හැකි යයි ද, කොමියුනිස්ට් සටන් පාඨ පමණක් උගෙන ගැනීම ප්‍රමාණවත් යයි ද යන්න එයින් අදහස් නොවේ. ඒ ආකාරයෙන් ඔබට කොමියුනිස්ට් ක්‍රමය නිර්මාණය කළ හැකි නොවේ. ඔබට කොමියුනිස්ට්වාදියෙක් විය හැක්කේ මිනිස්වර්ගයා නිමවූ සියලුම අගනා දේ පිළිබඳව දැනුමකින් ඔබගේ සිත පොහොසත් කරගතහොත් පමණකි.

පොත් කට පාඩම් කිරීමේ උවමනාවක් අපට නැත. නමුත්, මූලික කරුණු පිළිබඳ දැනුමක් දීමෙන් සෑම ශිෂ්‍යයෙකුගේම සිත පෝෂණය කිරීමේ, සම්පූර්ණ කිරීමේ උවමනාව අපට ඇත. කොමියුනිස්ට්වාදියෙක්, තමා ලබා ගත් දැනුම සාක්ෂාත් කර නොගන්නේ නම්, කොමියුනිස්ට්වාදය හුදෙක් පුහු වචනයක්, හුදු නාම පුවරුවක් හා කොමියුනිස්ට්වාදියා හුදු පුරුජේරුකාරයෙක් වනු ඇත. ඔබ මෙම දැනුම අවබෝධ කර ගත යුත්තේ විචාරයෙන් තොරව නොවේ. වැඩකට නැති කරුණුවලින් ඔබගේ සිත පුරවා ගැනීමෙන් වලකිමින්, වර්තමාන කාලයේ හොඳ උගත්කමක් ඇති මිනිසාට අවශ්‍ය ඒ කරුණු සියල්ලෙන්ම එය පොහොසත් කර ගනිමින් ඔබ එම දැනුම විචාරාත්මක ලෙස සාක්ෂාත් කර ගත යුතුය. සකසා නිමකළ නිගමනයන් තමන්ට දැනගත හැකි වූ පමණින්, යම් කොමියුනිස්ට්වාදියෙක් මහත් උවමනාවෙන් හා වෙහෙස විඳ කළ යුතු වැඩ රාශියක් නොකරම, විචාරාත්මක ලෙස පරීක්ෂා කර බැලිය යුතු කරුණු වටහා

නොගෙනම, ඔහු තමන්ගේ කොමියුනිස්ට්වාදය ගැන පුරසාරම් දොඩන්නට සිතතොත්, ඔහු නම්, ඇත්තෙන්ම භේද ජනක කොමියුනිස්ට්වාදියෙකි. එසේ මතුපිටින් පමණක් කොමියුනිස්ට්වාදියෙකු වීම නිශ්චිත වශයෙන්ම මාරක ය. මා දන්නේ ස්වල්පයක් බව මා දන්නේ නම්, මම තවත් උගෙන ගන්නට උත්සාහ කරන්නෙමි. නමුත් පුද්ගලයෙක් තමා කොමියුනිස්ට්වාදියෙකැයිද, කිසි දෙයක් තරයේ අවබෝධ කර ගැනීම තමාට අවශ්‍ය නැතැයිද කියතොත්, ඔහු කිසි කලෙකත් කොමියුනිස්ට්වාදියෙකුට යම්තමින් හෝ සමාන නොවනු ඇත.

පැරණි පාසල් විසින් ධනපතියන්ට අවශ්‍ය වූ සේවකයන් සූදානම් කර දෙන ලදී. පැරණි පාසල් විසින් විද්‍යාඥයන් සකස් කරන ලද්දේ, ධනපතියන්ගේ සිතැඟි පිණවන දේ ලියන හා කියන පුද්ගලයන් ලෙසටය. එනිසා අපි එම පාසල් අහෝසි කළ යුත්තෙමු. නමුත් ඒවා අහෝසි කළ යුතුය, විනාශ කළ යුතුය කියන විට, මිනිස් වර්ගයා විසින් එක් රැස් කර ගන්නා ලද හා මිනිසාට අත්‍යවශ්‍ය දේ ඒවායින් නොගතයුතුය යන්න ඉන් අදහස් වේ ද? ධනපති ක්‍රමයට අවශ්‍ය වූ දේ සහ කොමියුනිස්ට් ක්‍රමයට අවශ්‍ය දේ වෙන් කොට හඳුනා ගැනීමේ අවශ්‍යතාවයක් අපට නැතැයි යන්න එයින් අදහස් වේ ද?

බහුතරයේ කැමැත්තට පටහැණිව, ධනපති සමාජයේ භාවිතා කරන ලද පැරණි සරඹ-සැරයන් ක්‍රම ඉවත් කර, අපි ඒ වෙනුවට කම්කරුවන්ගේ හා ගොවි ජනතාවගේ පංති විඥානයෙන් යුත් විනය ආදේශ කරන්නෙමු. එය, පැරණි සමාජය කෙරෙහි දක්වන වෛරයත්, මෙම අරගලය සඳහා ඔවුන්ගේ බලවේග එක්සත් කර සංවිධානය කිරීමට ඔවුන්ගේ ඇති හැකියාව හා සූදානමත් ඒකාබද්ධ කරන්නා වූ කම්කරුවන්ගේ හා ගොවි ජනතාවගේ විනය ය. අප එසේ ආදේශ කරන්නේ අසමගිව හා අති විශාල රටක් මුළුල්ලේ විසිරී සිටින දශලක්ෂ ගණන් හා කෝටි ගණන් ජනතාවගේ අධිෂ්ඨානයන් ඒකීය අධිෂ්ඨානයක් වන සේ එකට පාහනු සඳහා ය. එම ඒකීය අධිෂ්ඨානය නොමැති නම් පරාජය වැළැක්විය නොහැක්කේය. කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ මෙම සමගිය නොමැතිව, මෙම විඥූත විනය නොමැතිව අපගේ සත් ව්‍යපාරය කිසිසේත් සාර්ථක විය නොහැකිය. මෙය නොමැතිව මුළු ලෝකයේම ධනපතියන් හා ඉඩම් හිමියන් පරාජය කිරීම අපට නුපුළුවන් වනු ඇත. එවිට අත්තිවාරම සවි කර ගැනීමට පවා අපට නොහැකි වනු ඇත. එසේ නම්, එම අත්තිවාරම මත නව, කොමියුනිස්ට් සමාජයක් ගොඩ නැගීම ගැන කවර කථාද එමෙන්ම, පැරණි පාසල් හෙළා දකින අතරම, පැරණි පාසල් කෙරෙහි සම්පූර්ණයෙන්ම සාධාරණ හා අවශ්‍ය වෛරයක් දරන හා එම පාසල් විනාශ කිරීමට ඇති සූදානම අගය කරන අතරම, පැරණි උගැන්වීම් ක්‍රමය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙනුවට, පැරණි කටපාඩම් කිරීම හා පැරණි සරඹය වෙනුවට මිනිස් ඥානයේ එකතු සමස්තය ලබා ගැනීමේ ක්‍රමයක් ආදේශ කළ යුතු බව අප වටහා ගත යුත්තෙමු. එපමණක් නොව, එසේ ආදේශ කරන ක්‍රමය අනුව කොමියුනිස්ට්වාදය යනු ඔබම මෙනෙහි කර බැලූ දෙයක් විය යුතුය. වර්තමාන අධ්‍යාපනයේ ස්ථාවරය අනුව අනිවාර්‍යය වශයෙන්ම බැස ගත යුතු නිගමනයන් ඇතුළත් කොටගත් දෙයක් විය යුතුය. එය කට පාඩමෙන් උගෙන ගන්නා දෙයක් නොවිය යුතුය.

කොමියුනිස්ට්වාදය උගෙන ගන්න යන අරමුණ ගැන කථා කරන කල ප්‍රධාන කර්තව්‍යයන් ඉදිරිපත් කළ යුත්තේ ඒ ආකාරයෙනි.

ඔබ උගෙන ගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නයට සමීප වන අතර ඔබට මෙය පැහැදිලි කර දීම සඳහා මම ප්‍රායෝගික උදහරණයක් ඉදිරිපත් කරන්නෙමි. යුද්ධමය ප්‍රශ්නවලට, සමූහාණ්ඩුව ආරක්ෂා කිරීමේ ප්‍රශ්නවලට අනතුරුව, අපට දැන් ආර්ථික කර්තව්‍යයන්ට මුහුණ දෙන්නට සිදු වී තිබෙන බව ඔබ සියලු දෙනාම දන්නෙහිය. අප දන්නා පරිදි, අප කර්මාන්තය හා කෘෂිකර්මාන්තය පුනරුත්ථාපනය කළහොත් මිස, කොමියුනිස්ට් සමාජය ගොඩනැගිය හැකි නොවේ. ඒවා පුනරුත්ථාපනය කළ යුත්තේද පැරණි ක්‍රමයට නොවේ. ඒවා ඉහළම විද්‍යානුකූල තත්වයෙන් නවීන පදනමක් මත යළි ස්ථාපිත කළ යුතුය. එම පදනම විදුලි බලය බව ඔබ දන්නෙහිය. වැඩිහිටි පරම්පරාවට ගොඩ නැගිය නොහැකි වන කොමියුනිස්ට් සමාජය ඔබට ගොඩනගා ගත හැකි වන්නේ, මුළු රටම, කර්මාන්තයේ සහ කෘෂිකර්මාන්තයේ සියලුම අංශයන්ම විද්‍යුතනය කිරීමෙන් පසුව, එම අරමුණ ඉටු කිරීමෙන් පසුව පමණක් බවද ඔබ දන්නෙහිය. මුළු රටම ආර්ථික පුනර්ජීවනයට පත් කිරීමේත්, නවීන විද්‍යාව හා කාර්මික ශිල්පය මත, විදුලි බලය මත පදනම් කොට ගනිමින් කෘෂිකර්මාන්තය හා කර්මාන්තය යන දෙකම ප්‍රතිසංවිධානය කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේත් කර්තව්‍යය ඔබ හමුවේ ඇත. තවද, නූගත් ජනයාට විද්‍යුතනය සාර්ථක කළ නොහැකි බවද ඔබ හොඳින්ම දන්නෙහිය. ඒ සඳහා මූලික අධ්‍යාපනය පමණක්ද ප්‍රමාණවත් නොවේ. විදුලි බලය යනු කුමක්දැයි යන්න වටහා ගැනීම ප්‍රමාණවත් නොවේ. විදුලි බලය කර්මාන්තය සහ කෘෂිකර්මාන්තය සඳහාද, කර්මාන්තයේ සහ කෘෂිකර්මාන්තයේ එක් එක් අංශයක් සඳහාද යොදා ගන්නේ කෙසේද යන්න ගැන දැනුමක් අවශ්‍ය වේ. මෙය අයෙක් තමන්ම උගත යුතු දෙයකි. එසේම වැඩකරන ජනතාවගේ නැගී එන මුළුමහත් පරපුරටම මෙය උගැන්විය යුතුය. පංති විඥනය ඇති සෑම කොමියුනිස්ට්වාදියෙක්ම මුහුණ පාන කර්තව්‍යය එයයි. තමන් කොමියුනිස්ට්වාදියෙකු ලෙසට සලකා ගන්නා වුද, තමන්

Российская Социалистическая Федеративная Советская Республика
Пролетарии всех стран, соединяйтесь!

№ 1 Библиотека Главполитпросвета № 1

Н. ЛЕНИН (В. И. Ульянов)

ЗАДАЧИ СОЮЗОВ МОЛОДЕЖИ

(Речь на 3-м Всероссийском Съезде Российского Коммунистического Союза Молодежи)

ГОСУДАРСТВЕННОЕ ИЗДАТЕЛЬСТВО
1920

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොමියුනිස්ට් තරුණ සංගමයට බැඳීමෙන් කොමියුනිස්ට් ක්‍රමය ගොඩනැගීම සඳහා පක්ෂයට ආධාර කිරීමටත්, කොමියුනිස්ට් සමාජයක් නිර්මාණය කිරීම සඳහා මුළු තරුණ පරපුරටම ආධාර කිරීමටත් පොරොන්දු වී සිටින බව පැහැදිලිව වටහා ගන්නා වූ ද සෑම තරුණ පුද්ගලයෙක්ම මුහුණ දෙන කර්තව්‍යය එයයි. කොමියුනිස්ට් සමාජය නිර්මාණය කළ හැක්කේ නවීන අධ්‍යාපනය පදනම් කොට ගෙන පමණක් බවත්, තමා එම අධ්‍යාපනය ලබා නොගන්නේ නම්, කොමියුනිස්ට්වාදය හුදෙක් ධර්මිෂ්ට ප්‍රාර්ථනාවක් පමණක් ලෙසට පවතින බවත් ඔහු වටහා ගත යුත්තේය.

ධනපති පංතිය බලයෙන් පහ කර දැමීම වැඩුමහල් පරම්පරාවේ කර්තව්‍යය විය. එවකට ප්‍රධාන කර්තව්‍යය වූයේ ධනපති පංතිය විවේචනය කිරීමය. පොදු ජනතාව අතර ධනපති පංතිය කෙරෙහි වෛරයක් ඇති කිරීමය. පොදු ජනතාව අතර පංති විඥානය සහ ඔවුන්ගේ බලවේගයන් එක්සත් කිරීමේ හැකියාව දියුණු කිරීමය. නව පරම්පරාවට, ඊට වඩා අතිශයින් සංකීර්ණ කර්තව්‍යයකට මුහුණ දීමට සිදුවේ. ඔබට පැවරෙන කර්තව්‍යය, ධනපතියන්ගේ ආක්‍රමණයකට විරුද්ධව කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ ආණ්ඩුව රකිනු පිණිස ඔබගේ සියලු බලවේගයන් එක්රැස් කිරීම පමණකින් සම්පූර්ණ වන්නේ නැත. ඔබ එය කළ යුතු බවට සැකයක් නැත. එය ඔබට ඉතා පැහැදිලි සහ කොමියුනිස්ට්වාදියාට හොඳින් පෙනෙන කර්තව්‍යයකි. නමුත්, එය ඉටු කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔබ කොමියුනිස්ට් සමාජයක් ගොඩනැගිය යුතුව තිබේ. බොහෝ කරුණු අතින් කටයුත්තෙන් අඩක් හමාර කර තිබේ. කළ යුතු වූ ලෙසටම පැරණි ක්‍රමය විනාශ කර තිබේ. විය යුතු වූ ලෙසටම එය කසල ගොඩක් බවට හරවා තිබේ. බිම පිරිසිදු කර තිබේ. මෙම බිමෙහි කොමියුනිස්ට් සමාජයක් ගොඩ නැගීම තරුණ කොමියුනිස්ට් පරපුර විසින් කළ යුතු වේ. ඔබ මුහුණ පාන්නේ ඉදිකිරීමේ කර්තව්‍යයටය. ඔබට එම කර්තව්‍යය ඉටු කළ හැකි වන්නේ, සියලු නවීන දැනුම ස්වීකර ගැනීමෙන් පමණකි — කොමියුනිස්ට්වාදය, සකස් කොට නිම කළ හා කටපාඩම් කරගත් සූත්‍රවල, අනුශාසනාවල, වට්ටෝරුවල සහ වැඩ පිළිවෙළවල්වල තත්වයේ සිට, ඔබගේ ක්ෂණික වැඩ කටයුතු සඳහා සමගිය ගෙන දෙන ජීවමාන යථාර්ථයක් බවට හරවා ගැනීමට ඔබට හැකි නම්, ඔබගේ සියලුම ප්‍රායෝගික කටයුතුවලදී කොමියුනිස්ට්වාදය මාර්ග දේශකයෙක් කර ගැනීමට ඔබට හැකි නම් පමණකි.

මුළු මහත් බාල පරම්පරාවම ශික්ෂණය කිරීමේදී, පුහුණු කිරීමේදී හා දිරිගැන්වීමේදී ඔබ ඉටු කළ යුතු කර්තව්‍යය එයයි. කොමියුනිස්ට් සමාජය ගොඩ නගන දශ ලක්ෂ ගණන් ජනකායෙහි ඉදිරියෙන්ම සිටිය යුත්තේ ඔබය. සෑම තරුණයෙක්ම හා තරුණියක්ම එම පිරිස අතර සිටිය යුතුය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොමියුනිස්ට් ක්‍රමය ගොඩනැගීමේ වැඩ කටයුතුවලට සියලු තරුණ කම්කරු හා ගොවි පොදු ජනකාය බඳවා ගතහොත් මිස, ඔබට කොමියුනිස්ට් සමාජයක් ගොඩ නැගිය හැකි නොවේ.

මෙහිදී මා ස්වාභාවික වශයෙන්ම යොමු වන්නේ, අප කොමියුනිස්ට්වාදය උගැන්විය යුත්තේ කෙසේද, අපගේ විධික්‍රමවල විශේෂ අංග ලක්ෂණ විය යුත්තේ මොනවාද යන ප්‍රශ්නය වෙත ය.

ප්‍රථමයෙන්ම, මම කොමියුනිස්ට ආචාර ධර්ම ගැන සඳහන් කරන්නෙමි.

ඔබ කොමියුනිස්ට්වාදීන් වීමට පුහුණුව ලබා ගත යුතුය. තරුණ සමිති සාමාජිකයින්ගේම උගෙනීමේ, සංවිධානය වීමේ, එක්සත් වීමේ හා සටන් කිරීමේ කටයුතු මගින් ඔවුන්ට පුහුණුවක් ලැබීමට හා ඔවුන්ගෙන් නායකත්වය අපේක්ෂා කරන අය පුහුණු කිරීමට එම සාමාජිකත්වයට හැකි වන පරිද්දෙන් තරුණ සමිතියේ ප්‍රායෝගික කටයුතු සංවිධානය කර ගැනීම එහි වගකීම වේ. තරුණ සමිතිය කොමියුනිස්ට්වරු පුහුණු කළ යුත්තේය. අද තරුණ ජනයාට පුහුණුව, ශික්ෂණය හා උගෙනුම දීමේ සම්පූර්ණ අරමුණ විය යුත්තේ ඔවුන් කොමියුනිස්ට් ආචාර ධර්ම කෙරෙහි තරයේ බැඳුනු පිරිසක් කිරීමය.

නමුත්, කොමියුනිස්ට් ආචාර ධර්ම කියා දෙයක් තිබේද? කොමියුනිස්ට් සදාචාරය කියා දෙයක් තිබේද? ඇත්තෙන්ම තිබේ. අපට අපේම ආචාර ධර්මයක් නැතැයි බොහෝ විට කියනු ලැබේ. කොමියුනිස්ට්වාදීහු සෑම සදාචාරයක්ම ප්‍රතික්ෂේප කරතියි කියමින් ධනපතියෝ බොහෝ විට අපට චෝදනා කරති. මෙය ප්‍රශ්නය ව්‍යාකූල කිරීමේ, කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ ඇස්වලට වැලි ගැසීමේ ක්‍රමයකි.

අපි කුමණ නම් අර්ථයකින් ආචාර ධර්ම ප්‍රතික්ෂේප කරමුද? සදාචාරය ප්‍රතික්ෂේප කරමුද?

අප එය ප්‍රතික්ෂේප කරන්නේ දේව නියමයන් මත ආචාර ධර්ම පදනම් කළ ධනපති පංතිය එයට දුන් අර්ථයෙනි. අපි දෙවියන් ගැන විශ්වාසනොකරන බව මෙහිලා කියන්නෙමු. පූජකයන්, ඉඩම් හිමියන් හා ධනපතියන් දේව නාමය දිෂ්ටි ගැන්වූයේ සූරාකන්නන් වශයෙන් තමන්ගේම උවමනාවන් ඉටු කර ගැනීම පිණිස බව අපි හොඳින්ම දන්නෙමු. එසේ නැතහොත්, සදාචාරය පිළිබඳ ශික්ෂා පද මත, දෙවියන්ගේ නියමයන් මත ආචාර ධර්ම පදනම් කරනවා වෙනුවට ඔවුන් කළේ, නිතරම දේව නියමයන්ට බොහෝ දුරට සමානවූ විඥානවාදී, නැතහොත්, අර්ධ විඥානවාදී වාක්‍ය ඛණ්ඩ මත එය පදනම් කිරීම ය.

මනුෂ්‍යත්වයෙන් බාහිර, පංතිවලින් බාහිර සංකල්පයන් මත පදනම් වූ, ඉහත සඳහන් වූ වැනි සෑම වර්ගයකම සදාචාරය අපි ප්‍රතික්ෂේප කරන්-

නෙමු. මෙය ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ යහපත පිණිස කම්කරුවන් හා ගොවි ජනතාව රැවටීමකැයි, වංචා කිරීමකැයි, අමාරුවේ දැමීමකැයි අපි කියන්නෙමු.

අපගේ සදාචාරය සම්පූර්ණයෙන්ම, නිර්ධන පංතියේ පංති අරගලයට යටත් කළ එකකැයි අපි කියන්නෙමු. අපගේ සදාචාරය උද්ගත වන්නේ නිර්ධන පංතියේ පංති අරගලයේ අවශ්‍යතාවයන්ගෙනි.

පැරණි සමාජය සියලුම කම්කරුවන් හා ගොවි ජනතාව ඉඩම් හිමියන් හා ධනපතියන් විසින් පීඩනයට පත් කරනු ලැබීම පදනම් කර ගත් එකක් විය. අපට, එය විනාශ කිරීමට සහ පෙරළා දැමීමට සිදු විය. නමුත් එය කිරීම සඳහා අපට සමගිය ඇති කිරීමට සිදු විය. මෙය දෙවියන්ට නිර්මාණය කළ හැකි දෙයක් නොවේ.

සමගිය සම්පාදනය කළ හැක්කේ පැක්ටරිවලට පමණකි. පුහුණුව ලැබූ හා ස්වකීය දීර්ඝ නිද්‍රාවෙන් අවදිවූ නිර්ධන පංතියකට පමණකි. දැන් අපට හිමි තත්ත්වයට, නැතහොත්, දුර්වලතම රටවලින් එකක නිර්ධන පංති විප්ලවයේ ජයග්‍රහණයට මග පෙන්වූ පොදු ජන ව්‍යාපාරයක් ඉස්මතු වූයේ එම පංතිය සකස් වීමෙන් පසුව පමණකි. දැන් තුන් අවුරුද්දක් තිස්සේ එම රට මුළු ලෝකයේම ධනපතියන්ගේ දරුණු ප්‍රහාරය පලවා හරිමින් සිටියේය. ලෝකය මුළුල්ලේම නිර්ධන පංති විප්ලවය වර්ධනය වෙමින් පවතින ආකාරය අපට පෙනේ. අසමගිව සහ විසිරී සිටින ගොවි ජනතාවගේ අනුගාමිකත්වය ලබන සහ සූරාකන්නන් ගසන පහරවලට ඔරොත්තු දෙන ශක්තිමත් බලවේගය නිර්මාණය කිරීමේ හැකියාව තිබුණේ නිර්ධන පංතියට පමණක් බව අත්දැකීම අනුව අපි දැන් කියමු. වැඩ කරන පොදු ජනතාවට එක්සත් වීමට, ඔවුන්ගේ පිරිස් එක්සත් කර ගැනීමට සහ-කොමියුනිස්ට්වාදී සමාජයක් ඒකාන්ත ලෙස ආරක්ෂා කිරීමට, ඒකාන්ත ලෙස තහවුරු කිරීමට හා ඒකාන්ත ලෙස ගොඩනැගීමට ඔවුන්ට ආධාර කිරීමේ හැකියාව ඇත්තේ මෙම පංතියට පමණකි.

මිනිස් සමාජයෙන් පිටත පවතින සදාචාරයක් ලෙසට හැඳින්විය හැකි දෙයක් අපට නැතැයිද, එය වංචාවකැයිද අප කියන්නේ එබැවිනි. අප පිළිගන්නේ නිර්ධන පංතියේ පංති අරගලයේ උවමනාවන්ට යටත් කළ සදාචාරයකි.

එම පංති අරගලය සමන්විත වන්නේ කුමකින්ද? එය සංයුක්ත වන්නේ සාර් බලයෙන් පහකර දැමීමෙන්, ධනපති පංතිය බලයෙන් පහකර දැමීමෙන් හා ධනපති පංතිය අහෝසි කිරීමෙන්ය.

පොදුවේ කියතොත් පංති යනු මොනවාද? පංති යනු සමාජයේ එක් කොටසකට, එහි අනිත් කොටසෙහි ශ්‍රමය අයිති කර ගැනීමට අවසර දෙන ආයතන වෙති. සමාජයේ එක් කොටසක් ඉඩම් සියල්ලම හිමි කර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගතහොත්, අපට එතැන ඉඩම් හිමි පංතියක් හා ගොවි ජන පංතියක් දක්නට ලැබේ. පැක්ටරි, ව්‍යාපාර වස්තු හා ප්‍රාග්ධනය සමාජයේ එක කොටසකට අයිති නම්, ඒ අතර, වෙනත් සමාජ කොටසක් මෙම පැක්ටරිවල වැඩ කරයි නම්, එවිට ධනපති පංතියක් හා නිර්ධන පංතියක් අපට පෙනේ.

සාර් එළවා දැමීම දුෂ්කර දෙයක් නොවිය. ඒ සඳහා අවශ්‍ය වූයේ දින කීපයක් පමණකි. ඉඩම් හිමියන් පන්නා දැමීමත් බොහෝ දුෂ්කර දෙයක් වූයේ නැත. එය මාස කීපයකින් කළ හැකි විය. ධනපතියන් පන්නා දැමීමත් මහත් දුෂ්කරතාවයක් වූයේ නැත. නමුත් පංති අහෝසි කිරීම අනුපමේය තරම් දුෂ්කරය. කම්කරු සහ ගොවිජන යන බෙදීම තවමත් අප අතර තිබේ. ගොවියාට ඔහුගේ ඉඩම් කැබැල්ලෙහි අයිතිය දුනහොත් සහ ඔහු අතිරික්ත ධාන්‍ය හිමි කර ගතහොත්, එනම්, වෙනත් ජනයාට පාන් නැතිව තිබියදී, ඔහු ඔහුටම හා ඔහුගේ ගවයන්ට අවශ්‍ය නැති ධාන්‍ය හිමි කර ගතහොත්, එවිට ගොවියා සූරාකන්නෙක් වන්නේය. ඔහු වැඩි වැඩියෙන් ධාන්‍ය පොදි ගසාගත් තරමට එය ලාභදයක බව ඔහුට පෙනෙන්නේය. අනිත් අය නිරාහාරව සිටිද්දෙන්. "ඔවුන්ගේ සාගින්න වැඩි වූ තරමට මට මගේ ධාන්‍ය වැඩි මිළකට විකිණිය හැකිය." සියල්ලෝම එකම සැලැස්මක් අනුව, පොදු ඉඩම්වල, පොදු පැක්ටරිවල, පොදු ක්‍රමයක් අනුව වැඩ කළ යුත්තෝය. එම තත්ත්වය ඇති කර ගැනීම පහසුද? එය, සාර්, ඉඩම් හිමියන් සහ ධනපතියන් පන්නා දැමීම තරම් පහසු නොවන බව ඔබට පෙනෙනු ඇත. කළ යුතු දෙය මෙසේය: නිර්ධන පංතිය ගොවි ජනතාවගෙන් කොටසකට නැවත උගෙනුම දිය යුතුය. පොහොසත්ව සිටින හා අන් අයගේ දුප්පත්කමෙන් හා නැති බැරිකමෙන් ලාභ ලබන ඒ ගොවීන්ගේ ප්‍රතිරෝධය මැඩ දමනු සඳහා එය වැඩ කරන ගොවිජනතාව තමන් පැත්තට දිනාගත යුතුය. එනිසා සාර් බලයෙන් පහ කර දැමීමෙන් පසුව හා ඉඩම් හිමියන් සහ ධනපතියන් පන්නා දැමීමෙන් පසුව, අප තවමත් නිර්ධන පංති අරගලයේ කර්තව්‍යය සම්පූර්ණ කර නැත. එය සම්පූර්ණ කිරීම අප නිර්ධන පංති ආඥාදායකත්වය යනුවෙන් හඳුන්වන ක්‍රමයේ කර්තව්‍යය වන්නේය.

පංති අරගලය තවදුරටත් කෙරෙන්නේය. වෙනස් වී ඇත්තේ අරගලයේ ආකෘති පමණකි. එය වූකලී, පැරණි සූරාකන්නන් ආපසු ඒම වැලැක්වීම සඳහා, විසිරී සිටින නූගත් ගොවි පොදු ජනතාව එකම සංගමයකට එක්සත් කිරීම සඳහා වූ නිර්ධන පංතියේ පංති අරගලයයි. පංති අරගලය තවදුරටත් කෙරීගෙන යන්නේය. එනිසා සියලුම අයගේ උවමනාවන් එම අරගලයට යටත් කළ යුතුය. අපගේ කොමියුනිස්ට් සදාචාරය එම කර්තව්‍යයට යටත් කර තිබේ. අපි මෙසේ කියමු: සදාචාරය නම්, පැරණි සූරාකන

සමාජය විනාශ කිරීමට සහ වැඩ කරන ජනතාව, නව, කොමියුනිස්ට් සමාජයක් ගොඩනගමින් සිටින නිර්ධන පංතිය වටා එක්සත් කිරීමට ප්‍රයෝජනවත් වන දෙය වන්නේය.

කොමියුනිස්ට් සදාචාරය යනු මෙම අරගලය සඳහා ප්‍රයෝජනවත් වන සහ සියලු සූරාකෑමට විරුද්ධව, සියලු සුළු පෞද්ගලික දේපළට විරුද්ධව වැඩ කරන ජනතාව එක්සත් කරන දෙයයි. එසේ කියන්නේ, මුළු සමාජයේම ශ්‍රමයෙන් නිෂ්පාදනය කරන ලද දෙය සුළු දේපළ විසින් එක පුද්ගලයෙකුගේ අතට පත් කරනු ලබන හෙයිනි. අපේ රටෙහි ඉඩම් පොදු දේපළකි.

නමුත්, මා මෙම පොදු දේපළෙන් කැබැල්ලක් ගෙන මට අවශ්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් ධාන්‍ය එහි වගා කළහොත් කුමක් වේද? කුසගින්නේ සිටින මිනිසුන් සංඛ්‍යාව වැඩි වූ තරමට ඔවුන් ගෙවන ගණනද වැඩි වනු ඇතැයි යනුවෙන් මා තර්ක කළහොත් කුමක් වේද? එසේ වූ කල මා හැසිරෙන්නේ කොමියුනිස්ට්වාදියෙක් ලෙසටද? නැත. එසේ වූ කල මා හැසිරෙන්නේ සූරාකන්නෙක් ලෙසටය. දේපළ හිමියෙක් ලෙසටය. එයට විරුද්ධව සටන් කළ යුතුය. එය එසේ සිදු වන්නට හැරියහොත්, නැවතත් ධනපතියන්ගේ පාලනයත්, ධනපති පංතියේ පාලනයත් ඇතිවන තත්ත්වයට කරුණු යෙදෙනවා ඇත. ඉහත විප්ලවවලදී එක් වරකට වඩා එසේ සිදුවී තිබේ. ධනපතියන්ගේ සහ ධනපති පංතියේ පාලනය යළි ස්ථාපිත වීම වලක්වනු පිණිස, අපි ලාභ ගැරීමට ඉඩ නොදිය යුත්තෙමු. අන්‍යයන්ගේ අයහපතට හේතුවන පරිදි තනි පුද්ගලයන් පොහොසත් වීමට අපි ඉඩ නොදිය යුත්තෙමු. එය සඳහා වැඩ කරන ජනතාව නිර්ධන පංතිය සමග එක්සත් වී කොමියුනිස්ට් සමාජයක් සංයුක්ත කළ යුත්තේය. කොමියුනිස්ට් තරුණ සංගමයේ සහ සංවිධානයේ මූලික කර්තව්‍යයේ ප්‍රධාන අංග ලක්ෂණය මෙයයි.

පැරණි සමාජය පදනම් වූයේ මෙම ප්‍රතිපත්තිය මතය: කොල්ලකාපන්, නැතහොත්, කොල්ලකෑමට යටවෙයන්; වෙනකෙක් සඳහා වැඩකරපන්, නැතහොත් ඔහුගෙන් වැඩ ගනින්; වහල් හිමියෙක් වෙයන්, නැතහොත්, වහලෙක් වෙයන්. එවැනි සමාජයක ඇති දැඩි වූ ජනයා ස්වාභාවික වශයෙන්ම මවගේ උකුළේ කිරි බොන තැන් පටන්ම මෙන්, මෙසේ කියන මනෝභාවය, පුරුද්ද හා සංකල්පය ස්වීකරගන්නේය:නුඹ එක්කෝ වහල් හිමියෙකි, නැතහොත්, වහලෙකි. එසේත් නැතහොත්, සුළු අයිති කාරයෙකි, සුළු සේවා යෝජකයෙකි, සුළු නිලධාරියෙකි — නො එසේනම් බුද්ධිමතෙකි. කොටින් කියතොත් තමන් ගැන පමණක් තකන, අනුන් ගැන තුට්ටුවකටවත් නොතකන මිනිසෙකි.

මම මේ ඉඩම් කැබැල්ල වැඩ කර ගන්නෙම් නම්, මම අන්‍යයන් ගැන තඹ සතයකට වත් නොසලකමි. අන් අය කුසගින්නේ සිටි තරමට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වැඩියෙන් හොඳය. එවිට මගේ ධාන්‍ය සඳහා මට වැඩි මුදලක් ලැබෙන්නේය. මට වෛද්‍යවරයෙක්, ඉන්ජිනේරුවෙක්, ගුරුවරයෙක් හෝ ලිපිකරුවෙක් හැටියට රැකියාවක් තිබේ නම්, වෙනත් කිසි කෙනෙක් ගැන තඹයක් තරම්වත් මම නොසලකමි. මම බලවතුන්ට බැල මෙහෙවර කරමි නම් මට මගේ රැකියාව රැක ගත හැකි වනු ඇත. එපමණක් නොව හොඳින් ජීවත් වීමට හා ධනපතියෙක් වීමට පවා පුළුවන් වනු ඇත. කොමියුනිස්ට්වාදීයෙකු තුළ එවැනි මනෝභාවයක් හා මනෝරංජනයක් තිබිය නොහැකිය. කම්කරුවන්ට හා ගොවි ජනතාවට, ඔවුන්ගේම පරිශ්‍රමයෙන් ඔවුන්ගේ ආරක්ෂාව සලසා ගැනීමට හා නව සමාජයක් නිර්මාණය කිරීමට හැකි බව ඔවුන් විසින් ඔප්පු කරන ලද කල්හි, එය නව, කොමියුනිස්ට් අධ්‍යාපනයේ, සූරාකන්නන්ට විරුද්ධව කරන අරගලයේදී ලබන අධ්‍යාපනයේ, ආත්මාර්ථ සේවීන්ට සහ සුළු දෙපළ අයිතිකාරයන්ට විරුද්ධවත්, ''මම මගේ ලාභය ගනිමි, අන් කවරෙක් ගැන හෝ තඹයක් තරමවත් නොතකමි'' යි කියන මනෝභාවයට හා පුරුද්දට විරුද්ධවත් නිර්ධන පංතිය සමග සන්ධානගතව ලබන අධ්‍යාපනයේ ආරම්භය වූයේය.

තරුණ සහ නැගී එන පරම්පරාව කොමියුනිස්ට්වාදය උගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නයට පිළිතුර එයයි.

එයට කොමියුනිස්ට්වාදය උගත හැක්කේ, සූරාකන්නන්ගේ පැරණි සමාජයට විරුද්ධව නිර්ධන පංතිකයන් හා වැඩ කරන ජනතාව කරන අවිච්ඡේද අරගලය සමග තමන්ගේ අධ්‍යාපනයේ, පුහුණුවේ සහ ශික්ෂණයේ සෑම පියවරක්ම සම්බන්ධ කර ගැනීමෙන් පමණකි. අපට සදාචාරය ගැන කියන විට අපි මෙසේ කියමු: කොමියුනිස්ට් වාදියා සඳහා සදාචාරය අන්තර්ගත වන්නේ විනයානුකූල අන්‍යොන්‍ය එකඟතාවය හා සූරා කන්නන්ට විරුද්ධව විග්‍රහාත්මකව කරන පොදුජන සටන තුළ ය. අපි සදාකාලික සදාචාරයක් ගැන විශ්වාස නොකරමු. එසේම සදාචාරය පිළිබඳ සියලුම ප්‍රබන්ධ කථා හෙළිදරව් කරන්නෙමු. මිනිස් සමාජය උසස් මට්ටමකට සම්ප්‍රාප්ත වීමට සහ ශ්‍රමය සූරාකෑමේ තත්ත්වයෙන් නිදහස් වීමට සදාචාරය උපස්තම්භක වන්නේය.

මෙම කාර්යය ඉටු කර ගැනීම පිණිස, ධනපති පංතියට විරුද්ධව කරන විනය සම්පන්න සහ දරුණු අරගලයේදී දේශපාලන වශයෙන් මුහුකුරා යාම ආරම්භ කළ තරුණ ජන පරම්පරාවක් අපට අවශ්‍ය වන්නේය. මෙම අරගලයේදී එම පරම්පරාව නියම කොමියුනිස්ට්වාදීන් පුහුණු කරන්නේය. එය එහි අධ්‍යාපනයේ, ශික්ෂණයේ සහ පුහුණුවේ සෑම පියවරක්ම මෙම අරගලයට යටත් කළ යුතුය, සම්බන්ධ කළ යුතුය. කොමියුනිස්ට් තරුණ ශික්ෂණය සමන්විත විය යුත්තේ ඔවුන්ට මටසිලුටු කථා පැවැත්වීමෙන් හා සදාචාර ශික්ෂා පද පැනවීමෙන් නොවේ. ශික්ෂණය එයින් සංයුක්ත

වූවක් නොවේ. ස්වකීය පියවරුන් සහ මව්වරුන් ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ වියගසට බැඳී ජීවත්වුනු ආකාරය දක්නට ලැබීමෙන්ද, සූරාකන්නන්ට විරුද්ධව අරගලය ආරම්භ කළ අය වින්ද දුක් ගැහැට අත්දැකීමෙන්ද, දිනාගත් දෙය රැක ගැනීම පිනිස මේ අරගලය තවදුරටත් පැවැත්වීමට කරන පරිත්‍යාගයන් තමන්ම දැකීමෙන්ද, ඉඩම් හිමියන් හා ධනපතියන් මොන තරම් භයානක සතුරන්ද යන්න පෙනී යාමෙන්ද යන මේ කොන්දේසිවලින්, ජනයා ලබන්නේ ඔවුන් කොමියුනිස්ට්වාදීන් කරන උගැන්වීමකි. කොමියුනිස්ට් සදාචාරය පදනම් වී තිබෙන්නේ කොමියුනිස්ට් ක්‍රමය තහවුරු කිරීමට හා සම්පූර්ණ කිරීමට ගෙනයන අරගලය මත ය. කොමියුනිස්ට් පුහුණුවේ, ශික්ෂණයේ හා උගැන්වීමේද පදනම එයයි. කොමියුනිස්ට්වාදය උගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

උගැන්වීම, පුහුණුව සහ ශික්ෂණය පාසල් පංති කාමරයට පමණක් සීමා වී තිබේ නම් හා ජීවන කැලඹිල්ලෙන් වෙන්වී තිබේ නම්, අපට එය ගැන විශ්වාසයක් තැබිය නොහැකිය. කම්කරුවන් හා ගොවි ජනතාව ඉඩම් හිමියන්ගේ හා ධනපතියන්ගේ පීඩනයට හසුව සිටින තාක් කල් හා පාඨශාලා ඉඩම් හිමියන්ගේ හා ධනපතියන්ගේ පාලනයට යටත්ව තිබෙන තාක් කල්, බාල පරම්පරාව අන්ධව හා නූගත්ව සිටිනු ඇත. අපගේ පාසල්, තරුණ පෙළට දැනුම පිළිබඳ මූලධර්ම සහ ස්වාධීනව කොමියුනිස්ට් අදහස් පරිණාම කර ගැනීමේ හැකියාව ලබා දිය යුතුය. තරුණ පෙළ උගත් ජනතාවක් කිරීමට ඒවා කටයුතු කළ යුතුය. ඔවුහු පාසල් යන අතරම, සූරාකන්නන්ගෙන් නිදහස් වීම සඳහා කරන අරගලයේ කොටස්කරුවන් වීමට උගත යුත්තාහ. කොමියුනිස්ට් තරුණ සංගමය, තරුණ කොමියුනිස්ට් පරම්පරාවේ සංගමය වශයෙන් එහි නම දැරීමට තරම් සුදුසු වන්නේ, එය ගගන්නා උගැන්වීමේ, පුහුණු කිරීමේ හා ශික්ෂණයේ සෑම පියවරක්ම, සූරාකන්නන්ට විරුද්ධව වැඩ කරන සියලු ජනතාව ගෙන යන පොදු අරගලයට සහභාගිවීම සමග සම්බන්ධ කරන විට පමණකි. රුසියාව එකම කම්කරු සමූහාණ්ඩුව වී තිබෙන අතර, සෙසු මුළු ලෝකයේම පැරණි ධනපති ක්‍රමය බලපවත්වන තාක් කල්, අප ඔවුන්ට වඩා දුර්වලව සිටින බවත්, අප නිරතුරුවම නව ප්‍රහාරයක තර්ජනයට ලක්ව සිටින බවත් ඔබ හොඳාකාරව දන්නෙහිය. එනිසා, අපට වැඩිදුරටත් අරගලයේදී ජයග්‍රහණය ලැබිය හැකි වන්නේ, ශක්තිය වර්ධනය කර ගැනීමෙන් පසුව සැබැවින්ම අනභිභවනීයත්වයට පත්විය හැකි වන්නේ, අප බලවත් සමගියකින් බැඳී සිටියහොත් පමණකි. ඒ අනුව බලන කල, කොමියුනිස්ට්වාදියෙක් වීම යනුවෙන් අදහස් වන්නේ ඔබ මුළු මහත් තරුණ පරම්පරාවම සංවිධානය කර එක්සත් කළ යුතු බවත්, මෙම අරගලයේදී පුහුණුව හා විනය පිළිබඳව ආදර්ශයක් දිය යුතු බවත්ය. එවිට කොමියුනිස්ට් ක්‍රමය නැමති ප්‍රාසාදය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගොඩ නැගීම ආරම්භ කිරීමට හා අනතුරුව එය සම්පූර්ණ කිරීමට ඔබට පුළුවන් වනු ඇත.

මෙම කරුණ ඔබට පැහැදිලි කිරීම පිණිස මම උදහරණයක් ඉදිරිපත් කරන්නෙමි. අපි අපට කොමියුනිස්ට්වාදීන් යයි කියා ගනිමු. කොමියුනිස්ට්වාදියෙක් යනු කවුද? කොමියුනිස්ට් යනු ලතින් භාෂාවේ වචනයකි. ලතින් භාෂාවෙන් ''කොමූනිස්'' කියන්නේ ''පොදු'' යන අර්ථය දීමටය. කොමියුනිස්ට් සමාජය යනු සියලු දේ, එනම්, ඉඩම්, පැක්ටරි යනාදිය පොදු අයිතියට යටත් හා ජනතාව පොදුවේ වැඩ කරන සමාජයකි. කොමියුනිස්ට් ක්‍රමය කියන්නේ එයට ය.

සැම පුද්ගලයෙක්ම ඔහුගේම ඉඩම් කැබැල්ලෙහි වෙනම වැඩ කරන්නේ නම් පොදුවේ වැඩ කිරීමට හැකි වේද? පොදුවේ වැඩ කිරීමේ තත්ත්වය එක පහරින් ඇති කළ හැක්කේ නොවේ. කිසිසේත් එසේ කළ නොහැකිය. එය අහසින් වැටෙන දෙයක් නොවේ. එය උද්ගත වන්නේ වෙහෙස මහන්සිය හා දුක් වේදනා තුළිනි. එය නිර්මාණය කෙරෙන්නේ අරගලය අතරතුරදීය. මෙහිදී පැරණි පොත්වලින් වැඩක් නොවේ. කිසිවෙක් ඒවා විශ්වාස නොකරනු ඇත. මෙහිදී අයෙක් තමන්ම ලබාගත් ජීවිතයේ අත්දැකීම් ඇතිව සිටීම අවශ්‍ය වේ. කොල්චාක් හා දෙනිකින් සයිබීරියාවේ සහ දකුණේ සිට ඉදිරියට ගමන් කරන විට ගොවි ජනතාව ඔවුන්ගේ පැත්ත ගෙන සිටියහ. බොල්ෂෙවික්වරු නියමිත මිළකට ඔවුන්ගේ ධාන්‍ය ගත් හෙයින් ඔවුහු බොල්ෂෙවික්වරුන් ප්‍රිය නොකළහ. නමුත්, සයිබීරියාවේ හා උක්‍රේනියාවේ, කොල්චාක්ගේ හා දෙනිකින්ගේ පාලනය අත්දුටු ගොවි ජනතාව, තමන්ට ඇත්තේ එකම විකල්පයක් බව වටහා ගත්හ. එක්කෝ ධනපතියන් වෙත යා යුතුය. එවිට ධනපතියෝ අප්‍රමාදවම ගොවිජනයා ඉඩම් හිමියන් යටතේ වහල්කමට යවති. නැතහොත්, කම්කරුවන් අනුගමනය කළ යුතුය. කිරියෙන් පැණියෙන් ඉතිරෙන රටක් දෙන බවට ඔවුන් පොරොන්දු නොවූ බව ඇත්තය. අනික් අතට ඔවුහු දෘඪතර අරගලයේදී අයෝමය විනයක් සහ දැඩි ස්ථිරත්වයක් අපේක්ෂා කරති. නමුත් ඔවුහු, ධනපතියන්ට හා ඉඩම් හිමියන්ට වහල් වී සිටින තත්ත්වයෙන් මිදීම සඳහා ගොවි ජනතාවට නායකත්වය දෙති. නූගත් ගොවි ජනයා පවා ඔවුන්ගේම අත්දැකීමෙන් මෙය දුටු විට හා අවබෝධ කරගත් විට, ඔවුහු දැඩිතර පාසලකින් පාඩම් උගත්, විඥතවම කොමියුනිස්ට්වාදයට ලැදි පිරිසක් බවට පත් වූහ. කොමියුනිස්ට් තරුණ සංගමයේ සියලුම කටයුතුවල පදනම විය යුත්තේ එවැනි අත්දැකීම්ය.

අප උගත යුත්තේ මොනවාද, පැරණි පාසල්වලින් හා පැරණි විද්‍යාවෙන් ගත යුත්තේ මොනවාද යන ප්‍රශ්නවලට මම දැන් පිළිතුරු දී ඇත්තෙමි. මෙය උගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නයටත් පිළිතුරු දීමට දැන් උත්සාහ

කරන්නෙමි. ඊට පිළිතුර මෙයයි: එය උගත හැක්කේ පාසල් කටයුතුවල සැම පියවරක්ම, පුහුණු කිරීමේ, ශික්ෂණයේ සහ උගැන්වීමේ සැම පියවරක්ම, සූරාකන්නන්ට විරුද්ධව වැඩ කරන සකල ජනතාවම ගෙනයන අරගලය සමග නොවෙන් කළ හැකි සේ සම්බන්ධ කිරීමෙන් පමණකි.

කොමියුනිස්ට් ක්‍රමය පුහුණු කිරීම කෙසේ සිදු විය යුතුද යන්න පෙන්නුම් කිරීම සඳහා සමහර තරුණ සංවිධාන කළ වැඩ පිළිබඳව අත්දැකීම්වලින් නිදසුන් කීපයක් ඉදිරිපත් කරන්නෙමි. නූගත්කම නැති කිරීම ගැන කවුරුත් කථා කරති. නූගත් රටක කොමියුනිස්ට් සමාජයක් ගොඩනැගිය නොහැකි බව ඔබ දන්නෙහිය. සෝවියට් ආණ්ඩුවෙන් නියෝගයක් නිකුත් කිරීමවත්, පක්ෂයෙන් විශේෂ සටන් පාඨයක් නිකුත් කිරීමවත්, මෙම කර්තව්‍ය උදෙසා හොඳම කාරකවරුන් පිරිසක් වෙන් කිරීමටත් ප්‍රමාණවත් වන්නේ නැත. මේ සඳහා තරුණ පරම්පරාව තමන්ම මෙම කර්තව්‍යය කරට ගත යුතුය. කොමියුනිස්ට් ක්‍රමය යනුවෙන් අදහස් වන්නේ තරුණ සංගමයට අයත් තරුණ පුරුෂයන් හා කාන්තාවන් මෙසේ කිව යුතු බවය: මෙය අපේ කාර්යය. අපගේ තරුණ ජනතාව අතර නූගත් අය නොමැති වන පරිද්දෙන් නූගත්කම නැති කිරීම සඳහා අපි එක්සත්ව ගම්බද දිස්ත්‍රික්කවලට යා යුත්තෙමු. නැගී එන පරම්පරාව එහි කටයුතු මෙම කාර්යය ඉටු කිරීම සඳහා කැප කරනු දැකීමට අපි උත්සාහ දරමින් සිටිමු. නොදැනුවත්කමින් සහ නූගත්කමින් වැසී ගිය රුසියාව ලියුම් කියුම් දත් ජනතාවකගේ රටක් බවට සීඝ්‍රයෙන් පරිවර්තනය කළ නොහැකි බව ඔබට රහසක් නොවේ.නමුත් තරුණ සංගමය මෙම කාර්යය ඉටු කිරීමට ව්‍යාවෘත වන්නේ නම්, සියලුම තරුණ ජනයා සියල්ලන්ගේම යහපත පිණිස වැඩ කරන්නේ නම්, තරුණ පුරුෂයන් හා කාන්තාවන් 4,00,000 ක සාමාජිකත්වයක් ඇති සංගමය, තරුණ කොමියුනිස්ට් සංගමය යන නමට සුදුසු වන්නේය. සංගමයේ කර්තව්‍යය තමන්ම දැනුම රැස්කරගැනීම පමණක් නොවේ. තමන්ගේම පරිශ්‍රමයෙන් සහ වෙහෙස මහන්සියෙන් නූගත්කම ජය ගැනීමෙහි අසමත් වන තරුණ ජනයාට ආධාර කිරීමද සංගමයේ කර්තව්‍ය වේ. තරුණ සංගමයේ සාමාජිකයෙක් වීම යන්නෙන් අදහස් වන්නේ, කෙනෙක් තමන්ගේ ශ්‍රමය හා පරිශ්‍රමය පොදු ව්‍යාපාරය සඳහා කැප කරන බවය. කොමියුනිස්ට් ශික්ෂණය යන්නෙහි අර්ථය එයයි. තරුණ පුරුෂයන් හා ස්ත්‍රීන් නියම කොමියුනිස්ට්වාදීන් බවට පත් වන්නේ එවැනි වැඩ කිරීමෙන් පමණකි. ඔවුහු මෙම කාර්යය ඉටු කිරීමේදී ප්‍රායෝගික ප්‍රතිඵල ලබත් නම්, ඔවුන් කොමියුනිස්ට්වාදීන් වනු ඇත.

නිදසුනක් ලෙසට නගරාසන්න එළවළු වතු ගෙන බලමු. එය සැබැවින්ම වැදගත් කටයුත්තක් නොවේද? එය තරුණ කොමියුනිස්ට් සංගමයේ කර්තව්‍යයන්ගෙන් එකකි. ජනතාව නිරාහාරව සිටිති. පැක්ටරිවල සාගින්න

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බලපවත්වයි. අප සාගින්නෙන් නිදහස් වීම පිණිස එලවලු වතු දියුණු කළ යුතුය. නමුත් ගොවිතැන කරගෙන යනු ලබන්නේ පැරණි ක්‍රමයටම ය. එනිසා, වඩාත්දියුණු පංති විඥනය ඇති කොටස් මෙම කටයුත්තට සහභාගි විය යුතුය. එවිට එලවලු වතු සංඛ්‍යාව වැඩි වන බවත්, එහි අක්කර ප්‍රමාණය වැඩි වන බවත්, ප්‍රතිඵල වඩාත් සාර්ථක වන බවත් ඔබට දක්ක හැකි වනු ඇත. තරුණ කොමියුනිස්ට් සංගමය ක්‍රියාශීලී ලෙස මෙම කටයුත්තට සහභාගි විය යුතුය. සෑම සංගමයක්ම හා සංගම් ශාඛාවක්ම මෙය එහි යුතුකම ලෙස සැලකිය යුතුය.

තරුණ කොමියුනිස්ට් සංගමය ශූරයන්ගේ හමුදවක් විය යුත්තේය. ක්‍රියාරම්භකතාවය සහ උද්‍යෝගය දක්වමින් ඔවුහු සෑම කාර්යයකදීම ආධාර කළ යුත්තාහ. සංගමයේ අය උගන්වන දේ සමහර විට තමාට නොවැටහුනත්, එසේම සමහර විට ඔවුන්ගේ උගැන්වීම් ගැන තමාට එක්වරම විශ්වාසය තැබිය නොහැකි වුවත්, ඔවුන්ගේ ප්‍රායෝගික වැඩ හා ක්‍රියා අනුව බලන කල, එම සංගමය ඇත්ත වශයෙන්ම සමන්විත වන්නේ තමන්ට හරි මග පෙන්වන පිරිසකගෙන් බව ඕනෑම කම්කරුවෙකුට අවබෝධ වන ලෙසට එම සංගමය කටයුතු කළ යුතුය.

සියලුම ක්ෂේත්‍රයන්හි තමන්ගේ වැඩ මේ ආකාරයෙන් සංවිධානය කර ගැනීමට තරුණ කොමියුනිස්ට් සංගමය අපොහොසත් වුවහොත්, එයින් අදහස් වන්නේ එය පැරණි, ධනපති මාර්ගයට ආපසු යන බවයි. අපි අපගේ අධ්‍යාපනය වැඩ කරන ජනයා සූරාකන්නන්ට විරුද්ධව ගෙනයන අරගලය සමග ඒකාබද්ධ කරගත යුත්තෙමු. එමගින් කොමියුනිස්ට්වාදයේ උගැන්වීම්වලින් නියම කෙරෙන කර්තව්‍යයන් සාර්ථක ලෙස ඉටු කිරීමට එම ජනතාවට ආධාර කළ යුත්තෙමු.

සංගමයේ සාමාජිකයෝ ඔවුන්ගේ නිදහස් කාලයෙන් සෑම පැයක්ම එලවලු වතු වැඩි දියුණු කිරීම නැතහොත් කිසියම් පැක්ටරියක තරුණ ජනයාගේ ශික්ෂණ කටයුතු සංවිධානය කිරීම යනාදිය සඳහා යොදගත යුත්තෝය. රුසියාව දුප්පත් හා කාලකණ්ණි රටක තත්ත්වයේ සිට ආඪ්‍ය සම්පන්න රටකට පරිවර්තනය කිරීමට අපට උවමනා වී තිබේ. තරුණ කොමියුනිස්ට් සංගමය පාසල්වලට, නැතහොත්, කොමියුනිස්ට් ග්‍රන්ථ හා පොත්පොඩි කියවීමට සීමාවී නොසිට එය ශික්ෂණය, උගෙනුම සහ පුහුණුව පිළිබඳ සිය කටයුතු කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ ශ්‍රම කටයුතු සමග ඒකාබද්ධ කළ යුතු වේ. අයෙකුට නියම කොමියුනිස්ට්වාදියෙක් විය හැක්කේ කම්කරුවන් හා ගොවි ජනයා සමග උරෙනුර ගැටී වැඩ කිරීමෙන් පමණකි. තරුණ සංගමයේ සාමාජිකයන් සියලු දෙනාම උගත්කම් ඇති ජනයා බවත්, ඒ අතරම, ඔවුන් ස්වකීය වැඩ කටයුතු ගැන බලවත් උනන්දුවක් දක්වන බවත් පොදුවේ වැටහී යා යුතුය. පැරණි පාසල්වලින්, පැරණි

සරඹ-පිටි ක්‍රමය බැහැර කර ඒ වෙනුවට විඥත විනයක් ආදේශ කිරීමට අප කටයුතු කර තිබෙන බවත්, තරුණ පුරුෂයන් හා ස්ත්‍රීන් සියලු දෙනාම සුබ්බෝත්නික් ශ්‍රමදනවලට සහභාගි වන බවත්, ජනතාවට ආධාර කිරීම පිණිස නගරාසන්නයේ සෑම ගොවිපලක්ම උපයෝගි කර ගන්නා බවත් සෑම කෙනෙකුටම පෙනෙන විට ජනතාව ශ්‍රමය කෙරෙහි දක්වන පැරණි ආකල්පය අත්හැර දමනු ඇත.

සෑම තැනෙකම ආධාර සංවිධානය කිරීම තරුණ කොමියුනිස්ට් සංගමයේ කර්තව්‍ය වේ. ගමෙහිත්, නගර ගෘහ පේළිවලත් එසේ කළ යුතුය. ඒ පිළිබඳ නිදසුනක් ලෙසට මහජන සනීපාරක්ෂාව, නැතහොත්, ආහාර බෙදදීම ගැන සඳහන් කරනු කැමැත්තෙමි. පැරණි ධනපති සමාජයේ මෙම කාර්යයන් කෙසේ කරන ලද්දේද? සෑම දෙනාම තමන් සඳහා පමණක් වැඩ කළහ. මහලු හෝ රෝගී හෝ අය ගැන, ගෘහ කාර්යයන් තනිකර කාන්තාවන්ගේම වැඩක් වීම ගැන හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් පීඩිත හා වහල් තත්ත්වයක පසුවීම ගැන කිසි කෙනෙක් පිදුරු ගසක් තරමවත් නොතැකුවේය. මෙයට විරුද්ධව සටන් කිරීම කාගේ වගකීමද? එය තරුණ සංගම්වල වගකීමය. ඒවා මෙසේ කිව යුතුය: අපි මේ සියල්ල වෙනස් කරන්නෙමු. මහජන සනීපාරක්ෂාව සහතික කිරීමේ, නැතහොත් ආහාර බෙද හැරීමේ කටයුතුවලට ආධාර කරන, ක්‍රමානුකූල ලෙස ගෙයින් ගෙට ගොස් පරීක්ෂණ පවත්වන, තමන්ගේ බලවේගයන් නිසි ලෙස බෙද හරිමින් හා ශ්‍රම කටයුතු සංවිධාන කර ගත යුතු බව පෙන්වමින්, මුළු සමාජයේම යහපත පිණිස සංවිධානාත්මක ලෙස වැඩ කරන තරුණ ජනයාගේ කණ්ඩායම් සංවිධානය කරන්නෙමු.

දූන් අවුරුදු පණහේ වයසට පැමිණ සිටින අයට කොමියුනිස්ට් සමාජයක් දැකීම පිළිබඳ බලාපොරොත්තු ඇති කර ගත නොහැකිය. කොමියුනිස්ට් සමාජයක් ඇති වීමට පෙර එම පරම්පරාව ඉකුත් වනු ඇත. නමුත් දූන් පහළොස් වන වියෙහි පසුවන පරම්පරාව කොමියුනිස්ට් සමාජයක් දකිනු ඇත. එමෙන්ම එම පරම්පරාවම එම සමාජය ගොඩ නගනු ඇත. මෙම පරම්පරාවේ මුළු ජීවිතයේම අරමුණ කොමියුනිස්ට් ක්‍රමය ගොඩ නැගීම බව එය දත යුතුය. පැරණි සමාජයේදී එක් එක් පවුල වෙන වෙනම වැඩ කළේය. පොදු ජනතාව පීඩනයට පත් කළ ඉඩම් හිමියන් හා ධනපතියන් හැර වෙනත් කිසිවෙක් ශ්‍රම කටයුතු සංවිධානය කළේ නැත. අපි ශ්‍රම කටයුතු සියල්ලම සංවිධාන කළ යුත්තෙමු. එය කොතරම් වෙහෙසකාරී සහ අවුල් සහිත වුවත්, කම්කරුවාටත්, ගොවියාටත් මෙසේ කිව හැකි වන ලෙසින් අපි එය කළ යුත්තෙමු: මම නිදහස් ශ්‍රමයේ ශ්‍රේෂ්ඨ හමුදවේ කොටසක් වෙමි. ඉඩම් හිමියන් සහ ධනපතියන් නැතිව මට මගේ ජීවිතය ගොඩ නගා ගත හැකි වන්නේය. මට කොමියුනිස්ට් ක්‍රමයක් පිහිටුවිය

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

හැකි වන්නේය. බාල වයසේදී පටන්ම විඥත ලෙස සහ විනය සම්පන්න ලෙස ශ්‍රම කටයුතුවල යෙදෙන සේ තරුණ කොමියුනිස්ට් සංගමය සියලුම තරුණ ජනයාට උගැන්විය යුතුය. දැන් අපට මුහුණ පාන්නට වී තිබෙන ප්‍රශ්න මේ ආකාරයෙන් විසඳා ගත හැකි වන බව විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කළ හැකිය. අපගේ දුප්පත් රටට නවීනතම කාර්මික ශිල්පයෙන් ප්‍රයෝජන ගත හැකි වන සේ රට විද්‍යුතනය කිරීමට දස වසරකට නොඅඩු කාලයක් අවශ්‍ය වන බව අපි සිතට ගත යුත්තෙමු. එනිසා දැනට පහළොස් වියෙහි පසුවන හා අවුරුදු දහයක් හෝ විස්සක් ගිය තැන කොමියුනිස්ට් සමාජයක වෙසෙනු ඇති ඒ අයගේ පරම්පරාව, එහි ශික්ෂණ කර්තව්‍යයන් සියල්ලම ඉටු කළ යුත්තේ, සෑම දිනක් පාසාම හා ඕනෑම ගමක්, ඕනෑම නගරයක් පාසාම තරුණ ජනයා, සුළුතම හෝ සරලතම හෝ වූව, කිසියම් පොදු ශ්‍රම කටයුත්තකට අදළ ප්‍රශ්නයක් ප්‍රායෝගික ලෙස විසඳීමෙහි යෙදෙන පරිද්දෙනි. සෑම ගමකම මෙසේ කරන විට, කොමියුනිස්ට් තරඟය සංවර්ධනය වන විට සහ තරුණ ජනයා ඔවුන්ගේ ශ්‍රම කටයුතුවලදී එක්සත් වීමෙහි සමත් වන බව ඔප්පු කරන විට කොමියුනිස්ට් ක්‍රමය ගොඩනැගීමේ සාර්ථකත්වය සහතික වන්නේය. තරුණ කොමියුනිස්ට් සංගමයට එහි පන්ලක්ෂයක් පමණ සාමාජිකත්වය එකම ශ්‍රම හමුදවක් ලෙස එක්සත් කරගෙන සකල ලෝකයාගේම ගෞරවය දිනා ගත හැකි වන්නේ, තමන් ගන්නා සෑම පියවරක්ම එම ගොඩනැගීමේ ස්ථාවරයෙන් සලකා බැලීමෙන් පමණක්ද, අප එක්සත් සහ දේශපාලන වශයෙන් විඥත වැඩ කරන ජනතාවක් වීමට අපට හැකි සියල්ලක්ම කර තිබේද යනු තමන්ගෙන්ම අසා ගැනීමෙන් පමණක්ද වේ. (සෝෂාකාරී අත්පොළොසන්.)

‘‘ප්‍රාව්ද’’ අංක 221, 222 හා 223;
1920 ඔක්තෝබර් 5,6 හා 7

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය
වෙළුම 41, පිටු 298-318

නිර්ධන පංති සංස්කෘතිය ගැන[26]

ලූනචාර්ස්කි සහෝදරයා සහ මා ඊයේ එකඟත්වයක් ඇති කර ගත් කරුණුවලට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ දේ ඔහු විසින් ප්‍රොලෙත්කුල්ත්* සම්මේලනයට කරන ලද කථාවෙන් කියන ලද බව ඔක්තෝබර් 8 දින ‘‘ඉස්වෙස්ටියා’’ පත්‍රයෙන් අපට පෙනේ.

ඉතාමත් කඩිනම් ලෙස (ප්‍රොලෙත්කුල්ත් සම්මේලන) යෝජනාවක් කෙටුම්පත් කර එය මෙම ප්‍රොලෙත්කුලත් සැසි වාරයටම ඉදිරිපත් කර ඡන්දය ගැනීමට කල් ඇතිව මධ්‍යම කාරක සභාවෙන් අනුමත කිරීම අවශ්‍යය. සම්මේලනය අද දින අවසන් වන නිසා, අද දින නොඉක්මවා එය අධ්‍යාපනය පිළිබඳ කොමිසාර් අංශයේ මණ්ඩලයේ සහ ප්‍රොලෙත්කුල්ත් සම්මේලනයේ යන දෙකෙහිම අනුමැතිය සඳහා මධ්‍යම කාරක සභාව වෙනුවෙන් ඉදිරිපත් කළ යුතුය.

කෙටුම්පත් යෝජනාව

1. කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ සෝවියට් සමූහාණ්ඩුවේ සියලුම අධ්‍යාපන කටයුතු, පොදු වශයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ සහ විශේෂයෙන්ම කලා ක්ෂේත්‍රයේ කෙරෙන එම කටයුතු නිර්ධන පංති ආඥාදායකත්වයේ අරමුණු සාර්ථක ලෙස ඉටු කරගැනීම සඳහා, එනම්, ධනපති පංතිය බලයෙන් පහ කිරීම, පංති නැති කිරීම සහ මිනිසා විසින් මිනිසා සූරාකෑම බැහැර කිරීම සඳහා නිර්ධන පංතිය කරන පංති අරගලයේ ජීවගුණයෙන් පිරී තිබිය යුතුය.

* ප්‍රොලෙතාර්ස්කය කුල්තුර (නිර්ධන පංතික සංස්කෘතිය) යන වචන වලින් ගත්තකි. — අනුවාදක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

2. එනිසා නිර්ධන පංතිය, එහි පෙරමුණු බල **ඇණිය** — කොමියුනිස්ට් පක්ෂය — සහ පොදු වශයෙන් නිර්ධන පංති **සංවිධාන වර්ග** රැසක් මගින් ඉමහත් ක්‍රියාකාරිත්වයක් දක්වමින් මහජන **අධ්‍යාපන** කටයුතුවලදී නායක කාර්ය කොටසක් ඉටු කළ යුතුය.

3. විප්ලවවාදී නිර්ධන පංතියේ අවශ්‍යතාවයන්, **අදහස සහ සංස්කෘතිය** නියම වශයෙන් ප්‍රකාශිත වන්නේ මාක්ස්වාදී ලෝකාවබෝධයෙන් පමණකැයි යන්න, නූතන ඉතිහාසයේ සහ විශේෂයෙන්ම, 'කොමියුනිස්ට් ප්‍රකාශනය' නිකුත් වීමෙන් පසුව සියලුම රටවල නිර්ධන පංතිය ගෙන ගිය-අඩ ශතවසරකට අධික විප්ලවීය අරගලයේ සියලුම අත්දැකීම් මගින් අවිවාදක ලෙස පෙන්නුම් කෙරිනි.

4. විප්ලවවාදී නිර්ධන පංතියේ දෘෂ්ටිය වශයෙන් මාක්ස්වාදය මුළු ලෝකයම සඳහා ඓතිහාසික වැදගත්කමක් දිනා ගත්තේ, ධනපති යුගයේ අගනා ජයග්‍රහණයන් කිසිසේත් ඉවත ලීමෙන් නොව, ඊට හාත්පසින්ම ප්‍රතිකූල ලෙසින් මිනිස් චින්තනයේ සහ සංස්කෘතියේ අවුරුදු දෙදහසකට අධික සංවර්ධනයේ ඇති වටිනා දේ සියල්ලක්ම ස්වීකර ගැනීමෙන් හා යළි හැඩගසා ගැනීමෙනි. නියම නිර්ධන පංති සංස්කෘතියක් සකස් කර ගැනීම ලෙසට පිළිගත හැක්කේ, සෑම ආකාරයකම සූරාකෑමට විරුද්ධව කරන අරගලයේ අවසාන අවධිය වන නිර්ධන පංති ආඥාදායකත්වයේ ව්‍යවහාරික අත්දැකීමෙන් පණ පෙවී මෙම පදනම මත හා මෙම දිසාවට ලක් කොට තවදුරටත් කරන වැඩ කටයුතු පමණකි.

5. අචල ලෙස මෙම ප්‍රතිපත්ති අනුගමනය කරන සමස්ත රුසියා ප්‍රොලෙත්කුල්ත් සම්මේලනය, අයෙක් තමන්ට විශේෂවූ වර්ගයක සංස්කෘතියක් නිමවා ගැනීමද, සියල්ල ඇතුළත් කොට ගත් සංවිධාන තුළ කොටු වී සිටීමද, මහජන අධ්‍යාපන කොමිසාර් අංශයේ සහ ප්‍රොලෙත්කුල්ත් සංවිධානයේ ක්‍රියාකාරිත්ව ක්ෂේත්‍රයන් අතර විභේදන රේඛා ඇඳීමද, එසේ නැතහොත්, මහජන අධ්‍යාපන කොමිසාර් අංශයේ ආයතන යටතේ ප්‍රොලෙත්කුල්ත් ''ස්වතන්ත්‍රයක්'' ඇති කර ගැනීමද, යනාදිය සඳහා දරන ප්‍රයත්න සියල්ලම න්‍යායික වශයෙන් දුර්වල සහ ප්‍රායෝගික වශයෙන් හානිකර සේ සලකා ඒවා තරයේ ප්‍රතික්ෂේප කරයි. එම ප්‍රයත්නයන්ට ප්‍රතිකූල වශයෙන්, ප්‍රොලෙත්කුල්ත් සංවිධාන සියල්ලම මහජන අධ්‍යාපන කොමිසාර් අංශයේ ආයතන ජාලකය යටතේ කටයුතු කිරීමට ස්වකීය යුතුකම් වශයෙන් සම්පූර්ණයෙන් බැඳී සිටින සහායක ආයතන සේ සලකා, ඒවා පොදු වශයෙන් සෝවියට් අධිකාරීන්ගේ (විශේෂයෙන්ම, මහජන අධ්‍යාපන කොමිසාර් අංශයේ) සහ රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ මෙහෙයවීම යටතේ, නිර්ධන පංති ආඥාදායකත්වයේ කාර්ය කොටසක් ඉටු කරන පරිද්දෙන් ස්වකීය කර්තව්‍යයන් සපුරාලිය යුතු යයි සම්මේලනය සියලුම ප්‍රොලෙත්කුල්ත් සංවිධානවලට නියම කරයි.

* * *

ලුනචාර්ස්කි සහෝදරයාගේ වචනවලට විකෘති අර්ථ දී ඇති බව ඔහු කියයි. එය එසේ නම් මෙම යෝජනාව වඩාත් හදිසි ලෙස අවශ්‍ය වන්නේය.

1920 ඔක්තෝබර් 8 දින ලියන ලදී

1926 දී ''ක්‍රාස්නය නොව්'' සංගරාවේ අංක 3 කලාපයෙහි ප්‍රථමයෙන් පළ කරන ලදී

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 41, පිටු 336-337

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මහජන අධ්‍යාපනය පිළිබඳ ගුබේර්නියා සහ උයෙස්ද් දෙපාර්තමේන්තුවල දේශපාලන අධ්‍යාපන ආයතනවල සමස්ත රුසියා සාකච්ඡා සභාවට කළ කථාව

1920 නොවැම්බර් 3

සහෝදරවරුනි, අදහස් කීපයක් ඔබ හමුවේ තැබීමට මට අවසර දෙන්න. කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ මහජන කොමිසාර් මණ්ඩලය දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන කාරක සභාව පිහිටුවීම සම්බන්ධයෙන් එම අදහස්වලින් සමහරක් ගැන සලකා බලා ඇත. ඉන් අනිත් අදහස් මගේ සිතෙහි පැන නැංගේ මහජන කොමිසාර් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා සකස් කළ කෙටුම්පත සම්බන්ධයෙනි. මෙම කෙටුම්පත පදනමක් වශයෙන් ගෙන අනුමත කිරීම ඊයේ සිදුවිය.ඒ ගැන විස්තර කරුණු තවමත් සාකච්ඡා කළ යුතුව තිබේ.[27]

හුදෙක් මා වෙනුවෙන්ම පමණක් එක් කරුණක් ගැන සඳහන් කිරීමට මෙම අවසරය ගන්නෙමි. එය නම්, ඔබේ ආයතනයේ නම වෙනස් කිරීම ගැන මා මුලින් තද නොකැමැත්තක් දක්වූ වගයි.මා අදහස් කරන හැටියට මහජන අධ්‍යාපන කොමිසාර් අංශයේ කාර්යය වන්නේ, උගෙන ගැනීම සහ අන්‍යයන්ට උගැන්වීම පිණිස ජනතාවට ආධාර කිරීමය, නාම පාඨයන් ලාමක විහිළු සේ සැලකීම සුදුසු බව මගේ සෝවියට් අත්දැකීම අනුව මට ඒත්තු ගොස් තිබේ. ඇත්ත වශයෙන්ම ඕනෑම නමක්, එයටම ආවේණික විහිළුවකි. දැන් වෙනත් නමක් අනුමත කර තිබේ. එය නම්, දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන කාරක සභාව, යනුයි.

දැන් මෙම කාරණය තීරණය කර තිබෙන හෙයින්, ඔබ මා කී දේ ගත යුත්තේ පුද්ගලික අදහසක් ලෙසට පමණකි. එය හුදෙක්ම නම් තහඩුව මාරු කිරීමකට පමණක් සීමා නොවේ නම්, එය පිළිගැනීම කළ යුත්තේමය.

සංස්කෘතික සහ අධ්‍යාපන වැඩ කටයුතුවලට අළුත් ජනයා ඇද ගැනීමෙහි අපි පොහොසත් වෙමු නම්, එය හුදෙක් නම් මාරුවක් නොවනු ඇත. සෑම නව කටයුත්තකටම, සෑම නව ආයතනයකටම ලේබලයක් ඇලවීමේ ''සෝවියට්'' දුර්වලකම ගැන අමනාප නොවී සිටීමට එවිට අපට හැකි වනු

ඇත. අපි මෙය සාර්ථක කර ගන්නෙමු නම්, අප එයින් ලබන්නේ පෙර නොලබන ලද විරූ ජයග්‍රහණයකි.

අප කරන සංස්කෘතික සහ අධ්‍යාපනික කටයුතුවලදී අප සමග සම්බන්ධ වන ලෙසට ජනතාව පොළඹවන ප්‍රධාන උනන්දුකාරකය විය යුත්තේ අධ්‍යාපනය සහ අපගේ ප්‍රතිපත්තිය අතර ඇති සම්බන්ධය ගැන ප්‍රශ්නය ය. කිසියම් දෙයක් ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවය ඇතොත්, නමකින් එය ප්‍රකාශ වීමට පුළුවන. මා එසේ කියන්නේ, අපගේ අධ්‍යාපන කටයුතු පිළිබඳ සම්පූර්ණ ක්‍රියා මාර්ගය මුළුල්ලේම, අධ්‍යාපනය දේශපාලනයෙන් තොර විය යුතුය යන පැරණි ස්ථාවරය බැහැර කිරීමට අපට සිදුවන හෙයිනි. දේශපාලනයෙන් වෙන් කොට අධ්‍යාපන කටයුතු කිරීමට පුළුවන්කමක් අපට නැත.

ඒ අදහස ධනපති සමාජය තුළ බලපැවැත්වූ, කවදත් බලපවත්වන එකකි. ''දේශපාලන නොවන'', නැතහොත්, ''දේශපාලනයෙන් තොර'' අධ්‍යාපනය යන පාඨයම ඉඳුරාම ධනපති රැවටිල්ලකි. එය වූ කලී සියයට 99 ක්ම පිරිස පල්ලිය, පෞද්ගලික දේපළ යනාදියෙහි පාලනය විසින් අවමානයට හා හීන දීන තත්ත්වයට පත් කරන ලද පොදු ජනතාව රැවටීමට යොදා ගත් වංචාවක්ම මිස අන් කිසිවක් නොවේ. සියලුම ධනපති රටවල තවමත් බලයෙහි සිටින ධනපති පංතිය ඇත්ත වශයෙන්ම පොදු ජනතාව රවටන්නේ ඒ ආකාරයෙනි.

එවැනි රටවල දේශපාලන යන්ත්‍රයේ වැදගත්කම අධික වූ තරමට, එම යන්ත්‍රය ප්‍රාග්ධනයෙන් හා එහි ප්‍රතිපත්තියෙන් නිදහස්ව තිබීමේ ඉඩ කඩ අඩු වන්නේය.

සියලුම ධනපති රාජ්‍යයන්හි දේශපාලන යන්ත්‍රයත්, අධ්‍යාපනයත් අතර සම්බන්ධය ඉතාමත් ශක්තිමත්ය. එසේ වුවත්, එය අවංකව පිළිගැනීමේ හැකියාවක් ධනපති සමාජයට නොමැත. එසේ නමුත්, පල්ලිය සහ පෞද්ගලික දේපළ පිළිබඳ ආයතන මගින් එය ජනතාවගේ හිසට එහි අදහස් පුරවයි.

ධනපති ''සත්‍යය''ට පරස්පර වන සේ අපගේ සත්‍යය ඉදිරිපත් කර ඒ සඳහා පිළිගැන්ම දිනාගැනීම අපගේ මූලික කර්තව්‍යයන්ගෙන් එකකි.

ධනපති සමාජයේ සිට නිර්ධන පංති ප්‍රතිපත්තිය වෙත සංක්‍රමණය වීම ඉතා දුෂ්කර දෙයකි. ධනපති පංතිය එහි මුළු මහත් ප්‍රචාරක සහ උද්ඝෝෂක යන්ත්‍රයම මගින් තොර තෝංචියක් නොමැතිව අපට අපවාද නගන නිසා එම දුෂ්කරතාවය තවත් වැඩි වන්නේය. නිර්ධන පංති ආඥාදායකත්වයේ වඩාත්ම වැදගත් මෙහෙයක් සුළු කොට දක්වීම සඳහා ධනපති පංතිය එයට හැකි සෑම ධෛර්යයක්ම යොදන්නේය. එය වූකලී උගැන්වීමේ මෙහෙය යි. නිර්ධන පංතිය ජනගහනයෙන් අල්පතරයක් වන රුසියාවේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එය විශේෂයෙන්ම වැදගත් වන්නේය. කෙසේ හෝ වේවා, සමාජවාදය ගොඩනැගීමට පොදු ජනතාව සූදනම් කිරීමේ කටයුත්ත ඉටු කිරීමට අපට සිදු වී තිබෙන හෙයින් මෙම කාර්යයට පූර්වතාවය දිය යුතුව තිබේ. ධනපති පංතියට විරුද්ධව කරන අරගලයේදී නිර්ධන පංතිය මුවහත් පංති විඥානයක්ද, තදබල විනයක්ද, කැපවීම පිළිබඳ බලවත් හැඟීමක් ද ඇති කර නොගත්තේ නම්, වෙනත් වචනවලින් කියතොත්, නිර්ධන පංතියේ පැරණි සතුරා පරදවා එහි පූර්ණ ජයග්‍රහණය සඳහා අවශ්‍ය ගතිගුණ සියල්ල ඇතිකර නොගත්තේනම්, නිර්ධන පංති ආඥාදායකත්වය ඇතිවීමේ ප්‍රශ්නයක් මතු නොවන්නට තිබිණි.

වැඩ කරන ජනතාව සමාජවාදී සමාජයකට සරිලන සේ සූදනම්ව ඇතැයි යන මනෝරාජික මතය අපි නොදරන්නෙමු. කම්කරු පංති සමාජවාදයේ මුළු ඉතිහාසයෙන්ම අපට සැපයෙන නියත කරුණු අනුව එය එසේ නොවන බව සහ සමාජවාදය සඳහා සූදනම් තත්ත්වය නිර්මාණය වන්නේ මහා පරිමාණ කර්මාන්තයෙන්, වැඩ වර්ජන අරගලයෙන් සහ දේශපාලන සංවිධාන කටයුතුවලින් බව අපි දන්නෙමු. ජයග්‍රහණය ලැබීම සහ සමාජවාදී විප්ලවය සාර්ථක කිරීම සඳහා සංකේන්ද්‍රිත ලෙස ක්‍රියාත්මක වීමේ සහ සූරාකන්නන් බලයෙන් නෙරපා දැමීමේ හැකියාව නිර්ධන පංතියට තිබිය යුතුය. එය මෙම ගතිගුණ සියල්ලම ඇති කර ගෙන තිබෙන බවත්, එය බලය දිනා ගන්නා විට ඒ සියල්ලම ව්‍යවහාරයට නගා ඇති බවත් අපට දැන් පෙනේ.

පැරණි ක්‍රමයෙන් අප උරුම කොට ලබා සිටින පැරණි (ක්‍රම සහ) හුරු පුරුදු අනුබැඳියාව, නැතහොත්, ජනතාව අතර තදින් පැතිර තිබෙන පෞද්ගලික දේපළ හා සම්බන්ධ සිරිත් ඉවත ලනු වස් වැඩ කරන පොදු ජනතාවට කරුණු අවබෝධ කර දීම සහ උපදෙස් දීම තම මූලික කර්තව්‍යය සේ සලකා අධ්‍යාපන කාරකවරුන් හා අරගලයේදී පෙරමුණු බල ඇණිය වන කොමියුනිස්ට් පක්ෂය කටයුතු කළයුතුය. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සහ මහජන කොමිසාර් මණ්ඩලයේ ඉතාමත් දැඩි අවධානය අපේක්ෂා කරන විශේෂ ප්‍රශ්න සලකා බලන අවස්ථාවේදී ද, මුළු සමාජවාදී විප්ලවයේම මෙම මූලික කර්තව්‍ය කිසිසේත් අතපසු නොකළ යුත්තේය.දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන කාරක සභාවට තිබිය යුත්තේ කුමන ආකාරයේ ව්‍යුහයක් ද? එය අන්‍ය ආයතන සමග සම්බන්ධ කළ යුත්තේ කෙසේද? මධ්‍යස්ථානය සමග පමණක් නොව ප්‍රාදේශීය මණ්ඩල සමගද එය සම්බන්ධ කළ යුත්තේ කෙසේද? මෙම කරුණු ගැන වැඩි සුදුසුකම් ඇති සහ දැනටමත් ඒ ගැන සැලකිය යුතු අත්දැකීමක් ලබා සිටින හා ඒ ගැන විශේෂ අධ්‍යයනයක් කර තිබෙන සහෝදරවරු මෙම ප්‍රශ්නවලට පිළිතුරු දෙනවා ඇත. මා කරන්නේ ප්‍රශ්නයේ ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රධාන වූ කරුණු ගැන අවධාරණය කිරීම පමණකි. අපි අවංක ලෙස මෙම කරුණ ඉදිරිපත් කළ යුත්තෙමු. කොතරම් පැරණි බොරු ප්‍රචාර කළත්, දේශපාලනය හා සමග සම්බන්ධ නොවී පැවතීමේ හැකියාවක් අධ්‍යාපනයට නැත.

අප දැන් ජීවත් වන්නේ, අපට වඩා බොහෝ බලවත් ලෝක ධනපති පංතියට විරුද්ධව කරනු ලබන අරගලයක් පවතින ඓතිහාසික අවධියකය. අරගලයේ මෙම අවධියේදී විප්ලවයේ සංවර්ධනය ආරක්ෂා කිරීම අපෙන් ඉටු විය යුතුය. එමෙන්ම, ධනපති පංතියට විරුද්ධව යුද්ධමය අර්ථයෙන් සටන් කිරීම හා ඊටත් වඩා අධ්‍යාපනය මගින් දෘෂ්ටිමය වශයෙන් සටන් කිරීම ද අප කළ යුතුය. එම දෘෂ්ටිමය සටන කළ යුත්තේ, දේශපාලන නිදහස සඳහා කළ දශක ගණන් දීර්ඝ අරගලයේදී කම්කරු පංතිය අත්කර ගත් පුරුදුකම්, භාවිතයන් සහ අවබෝධය, එනම්, මෙම පුරුදුකම්වල, භාවිතයන්ගේ සහ අදහස්වල එකතු සමස්තය සියලුම වැඩ කරන ජනතාවට අධ්‍යාපනය දීමේ උපකරණයක් සේ යොදගත හැකි වන පරිද්දෙනි. වැඩ කරන ජනතාවට අධ්‍යාපනය දිය යුත්තේ කෙසේද යන්න තීරණය කළ යුත්තේ නිර්ධන පංතියය. නිර්ධන පංතියේ අරගලය දැන් තව තවත් ධනපති රටවලට පැතිර යමින් පවතින අතර එම අරගලයෙන් ඉවත්ව සිටීම සහ ජාත්‍යන්තර දේශපාලනයෙන් ඉවත්ව සිටීම කිසිසේත් කළ නොහැක්කක් හා සමාව දිය නොහැකි දෙයක් බව අපි වැඩ කරන ජනතාවට අවබෝධ කොට දිය යුත්තෙමු.අද ජාත්‍යන්තර දේශපාලනයේ නියම පදනම වී තිබෙන්නේ සෝවියට් රුසියාවට විරුද්ධව ලෝකයේ සියලුම බලවත් ධනපති රටවල් අතර ඇති කර ගත් සන්ධානයකි. ධනපති රටවල දස කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනයාගේ ඉරණම රඳා පවතිනු ඇත්තේ මෙය මතය. අද ලෝකයේ අස්සක් මුල්ලක් නැර ධනපති රටවල් ස්වල්පයකින් යුත් කණ්ඩායමක පාලනයට යටත්ව තිබෙන බව අපි දන්නෙමු. එනිසා හැඩ ගැසෙන තත්ත්වය අනුව අයෙකුට කිරීමට සිදු වන්නේ එක්කෝ වර්තමාන අරගලයෙන් ඉවත් වී සිටීම හෝ, එසේ නැතහොත්, නිර්ධන පංති ආඥාදායකත්වය උදෙසා අරගලයට එකතු වීම යන දෙකෙන් එකකි. වර්තමාන අරගලයෙන් ඉවත්ව සිටින තැනැත්තේ, එයින් කරන්නේ, විප්ලවයෙන් හා යුද්ධයෙන් ඉවත්ව සිටි, එසේම, ධනපති පංතිය විසින් දරුණු ලෙස පොදු ජනතාව රවටනු ලබන බව හා ධනපති පංතිය උවමනාවෙන්ම පොදු ජනතාව නූගත්ව තබන ආකාරය නොදක්නා අන්ධයන්ට මෙන්ම තමන්ටද කිසිම දේශපාලන විඥානයක් නොමැති බව ඔප්පු කිරීම පමණකි.

අප මෙම නිර්ධන පංති අරගලය ගැන කථා කරන්නේ ඉතාමත් අවංක ලෙසිනි. අපගේ පැත්ත, නැතහොත්, අනිත් පැත්ත තෝරා ගැනීම ඒ ඒ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පුද්ගලයාට භාර කටයුත්තකි. පැත්තක් ගැනීම මග හැරීමට දරන සෑම ප්‍රයත්නයක්ම කෙළවර වනු ඇත්තේ අමාරුවේ වැටීමෙනි.

යුදෙනිච්ලා, කොල්චාක්ලා, පෙත්ල්යුරාලා, මහ්නෝලා සහ වෙනත් අය විසින් නියෝජනය කරන ලද කෙරෙන්ස්කි කල්ලියේ,[28] සමාජවාදී-විප්ලවවාදීන්ගේ සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නෂ්ටාවශේෂයන් රුසියාව සෑම තන්හිදීම අපට ප්‍රතිවිප්ලවයේ ආකෘති හා ස්වභාවයන් කොතරම් විශාල සංඛ්‍යාවක් ගෙන හැර පෑවේද යන්න ගැන සලකා බලන කල අන් කවුරුන්ටත් වඩා අපි අරගලයෙන් දැඩි වී සිටින්නෙමු යයි සිටීමට සෑම හේතුවක්ම ඇත. බටහිර යුරෝපය දෙස බැලූ කළ අප රටේ සිදු වූ දෙය එහිද සිදු වන බව පෙනේ. එය අපගේම ඉතිහාසය නැවත ක්‍රියාත්මක වන කලෙක මෙනි. කෙරෙන්ස්කි කල්ලියට සමාන කොටස් සෑම තැනෙකම ධනපති පංතිය සමග එක පෙළට සිටිනු දක්නා ලැබේ. රටවල් ගණනාවකම, විශේෂයෙන් ජර්මනියේ, ඔවුහු බලවත්ව සිටිති. සෑම තැනෙකදීම අයෙකුට දක්නට ලැබෙන්නේ එකම දෙයය — අතර මැද තත්ත්වයක් ගෙන සිටීමට නොහැකි බව හා එක්කෝ සුදු හමුද ආඥාදායකත්වයක් (අපට විරුද්ධව ආයුධ සන්නද්ධ වෙමින් බටහිර යුරෝපයේ සියලුම රටවල ධනපතියන් සූදනම් වන්නේ ඒ සඳහා ය) තිබීමේ,නැතහොත්,නිර්ධන පංති ආඥාදායකත්වයක් තිබීමේ අවශ්‍යතාවය ගැන කියන වැටහීමය. අපි කොතරම් උග්‍ර ලෙස හා ගැඹුරු ලෙස මෙය අත්දුටුවෙමුද යත්,මා දිගින් දිගටම රුසියානු කොමියුනිස්ට්වාදීන් ගැන කථා කිරීම අවශ්‍ය නොවේ. එනිසා අපට බැස ගත හැකි වන්නේ එකම නිගමනයකට පමණකි. එම නිගමනය දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන කාරක සභාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන සියලු තර්කවල හා න්‍යායවල මුල්ගල විය යුතුය. සියල්ලටම පෙර එම මණ්ඩලයේ වැඩ කටයුතුවලදී කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රතිපත්තියේ ප්‍රධානත්වය නොසඟවා පිළිගත යුතු බවයි. වෙනත් මඟ පෙන්වීමේ ආකෘතියක් ගැන අපි නොදනිමු. කිසිම රටකදී හෝ වෙනත් ආකෘතියක් පරිණාම කරගෙන ඇත්තේද නොවේ. පක්ෂ, ඒවායේ පංතිවල උවමනාවන් එක් හෝ තවත් මට්ටමකින් නියෝජනය වන සේ සිටිය හැකිය. ඒවා වෙනස් වීමට, නැතහොත්, සංශෝධනය වීමට ඉඩ තිබේ. නමුත් මීට වඩා හොඳ ආකෘතියක් ගැන අපි මෙතෙක් නොදන්නෙමු. ලෝක අධිරාජ්‍යවාදයේ දරුණු ප්‍රහාරයට ඔරොත්තු දී තුන් අවුරුද්දක් සටන් කරමින් සෝවියට් රුසියාව ගෙන ගිය මුළු අරගලයේම සිදුවීම් මාලාවත්, ශික්ෂකයා, සංවිධායකයා හා නායකයා වශයෙන් නිර්ධන පංතියට පැවරී ඇති කාර්යය ඉටු කිරීම පිණිස පක්ෂය එයට විඥත ලෙස ආධාර කිරීමට ඉදිරිපත් වීමත් එකට වෙළී පැටළී ඇත. නිර්ධන පංතියේ එම කාර්යය නොමැතිව ධනපති ක්‍රමයේ බිඳවැටීමක් කිසිසේත් ඇතිවිය නොහැකිය. වැඩ කරන පොදු ජනතාව, එනම්,

ගොවි සහ කම්කරු පොදු ජනතාව පැරණි බුද්ධිවාදී පුරුදුකම් පිටුදැක, කොමියුනිස්ට් ක්‍රමය ගොඩනැගීම සඳහා නැවත ඉගෙනුම ලබා ගත යුතුය. නොඑසේ නම් ගොඩනැගීමේ කටයුතු භාර ගැනීමට නොහැක. මෙය ඉතා බරපතල කරුණක් බව අපගේ මුළු අත්දැකීමෙන්ම පෙනේ. එනිසා පක්ෂයේ ප්‍රධානත්වයට ප්‍රමුඛත්වයක් දිය යුතු අතර, අපගේ කටයුතු සහ සංවිධානාත්මක සංවර්ධනය ගැන සාකච්ඡා කිරීමේදී ඒගැන කිසිකලෙකත් අමතක නොකළ යුත්තෙමු. මෙය කරන්නේ කෙසේද යන්න ගැන තවමත් බොහෝ ලෙස සාකච්ඡා කළ යුතුව තිබේ. පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ මහජන කොමිසාර් මණ්ඩලය තුළ ඒ ගැන සාකච්ඡා කළ යුතුය. ඊයේ අනුමත කළ ආඥාවෙහි, දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන කාරක සභාව හා සම්බන්ධ මූලික ප්‍රතිපත්ති සඳහන් කරන ලදී. නමුත් එය තවමත් මහජන කොමිසාර් මණ්ඩලයේ අවස්ථා සියල්ලම පසු කර නැත. මීළඟ දින කීපය තුළදී එම ආඥාව පළ කෙරෙන අතර අවසාන වශයෙන් එය ඉදිරිපත් කර තිබෙන ආකාරය අනුව, පක්ෂය සමග වූ සම්බන්ධකම ගැන එහි සඳහනක් නොමැති බව ඔබට පෙනෙනු ඇත.

එසේ වී නමුත්, එකම ප්‍රතිපත්තියක් අනුව, එනම්, නිර්ධන පංතිය හා සමග සම්බන්ධ කොමියුනිස්ට් පිරිස්වල ජීවගුණයෙන් නිර්ධන පංතිය ප්‍රබෝධමත් කිරීමට, එම පංතියේ අනුගාමිකත්වය දිනා ගැනීමට හා අප බොහෝ කල් සිට බැහැර කිරීමට වෙර දරමින් සිටි ධනපති පංතියේ රැවටිල්ල සම්බන්ධයෙන් එහි ඇස් පෑදීමට හැකියාව ලැබෙන පරිද්දෙන්, පක්ෂය නිවැරදි කිරීමෙහි, උපදෙස් දීමෙහි හා ගොඩනැගීමෙහි යෙදෙන්නේය යන ශික්ෂාව මත සෝවියට් සමූහාණ්ඩුවේ ව්‍යවස්ථාව නීතිමය හා ව්‍යවහාරික වශයෙන් පදනම් වී තිබෙන බව අප දැන ගත යුතුය, මතක තබා ගත යුතුය. අධ්‍යාපනය පිළිබඳ මහජන කොමිසාර් අංශය දීර්ඝ අරගලයක් කර තිබේ.බොහෝ කලක් ගතවන තෙක් ගුරුවරුන්ගේ සංවිධානය සමාජවාදී විප්ලවයට ප්‍රතිරෝධය පෑවේය. ධනපති දුර්මත ගුරුවරුන් අතර ඉතා ගැඹුරට කාවැදී ඇත. මෙහි කෙළින්ම කඩාකප්පල් කිරීම සහ හැර නොයන ධනපති දුර්මත යන ආකාරයෙන් වූ දීර්ඝ අරගලයක් විය. එනිසා හෙමින්, අඩියෙන් අඩිය, කොමියුනිස්ට් ප්‍රතිෂ්ඨාවන් සඳහා සටන් කිරීමට සහ ඒවා දිනා ගැනීමට අපට සිදු වේ. පාසැලෙන් බාහිර අධ්‍යාපනය, එනම් පොදු ජනතාවට අධ්‍යාපනය දීම සහ කරුණු වටහා දීම භාරව සිටින දේශපාලන අධ්‍යාපනය පිළිබඳ ප්‍රධාන කාරක සභාව දැන් මුහුණ පා සිටින්නේ, පක්ෂ නායකත්වයත්, මෙම පන්ලක්ෂයක් වන ගුරු හමුදාවේ, නැතහොත්, දැන් කම්කරුවන්ගේ සේවාවෙහි යෙදී තිබෙන මෙම ආයතනයේ අනුගාමිකත්වය දිනාගැනීමට, ස්වකීය ජීවගුණයෙන් එය ප්‍රබෝධමත් කිරීමට සහ ක්‍රියාරම්භකතාවයෙන් එය ප්‍රාණවත් කිරීමට ප්‍රයත්න දැරීමත් ඒකාබද්ධ කිරීමේ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පැහැදිලි කර්තව්‍යයටය. අධ්‍යාපන කාරකවරුන් වන ගුරුවරුන් පුහුණු කරන ලද්දේ ධනපති දුර්මතවල සහ පුරුදුවල ජීවගුණය අනුවය, නිර්ධන පංතියට සතුරු වූ ජීවගුණයක් අනුවය. නිර්ධන පංතිය සමග ඔවුන්ගේ කිසිම සම්බන්ධකමක් නොවීය. අපි දැන් අළුත් ගුරු සහ උපදේශක හමුදාවක් පුහුණු කළ යුත්තෙමු. ඔවුන් පක්ෂය සහ එහි අදහස් සමග කිට්ටු සම්බන්ධයකින් යුතුව, එහි ජීවගුණයෙන් ප්‍රබෝධමත්ව සිටිය යුතු අතර, කම්කරු පොදු ජනතාව තුළ කොමියුනිස්ට්වාදයේ ජීවගුණය ඇති කරමින් සහ කොමියුනිස්ට්වරුන් කරන කටයුතු ගැන කම්කරු පොදු ජනයා තුළ උනන්දුවක් අවුළුවා ලමින් එම ජනතාව තමන් වෙත ආකර්ෂණය කර ගත යුතුය.

පැරණි සිරිත්, පුරුදු සහ අදහස් ඉවත ලිය යුතුව තිබෙන හෙයින්, දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන කාරක සභාවත්, එහි පිරිසත් මුහුණ පා තිබෙන්නේ ඔවුන් අවධානය යොමු කළයුතු ඉතාමත් වැදගත් කර්තව්‍යයකට ය. ඇත්ත වශයෙන්ම මෙහිදී අප හමුවේ මතු වන්නේ උභතෝකෝටික ප්‍රශ්නයකි: පැරණි ගුරුකුලයට අයත් ගුරුවරුන් හා පක්ෂ සාමාජිකයන් හා කොමියුනිස්ට්වරුන් අතර සම්බන්ධයක් ඇති කිරීමට අපි කෙසේ කටයුතු කරමුද? එය ඉතාමත් අමාරු ගැටළුවකි. එය ගැන බොහෝ සෙයින් කල්පනා කිරීමට සිදු වනු ඇත.

ඉතාමත් විවිධාකාර වූ මේ මිනිසුන් අතර සංවිධාන සම්බන්ධතාවයන් ඇතිකිරීමේ මාධ්‍යයන් ගැන සිතා බලමු. කොමියුනිස්ට් පක්ෂයේ මූලිකත්වය තිබීමේ අවශ්‍යතාවය ගැන ප්‍රතිපත්තියක් වශයෙන් අපට මොහොතකට හෝ සැකයක් තිබිය නො හැක. ඒ අනුව, දේශපාලන සංස්කෘතියේ, දේශපාලන අධ්‍යාපනයේ අරමුණ වන්නේ මුසාව සහ දුර්මත අකා මකා දැමීමෙහි සමත් වූද, පැරණි ක්‍රමය පරාජය කොට ධනපතියන් නොමැති, සූරාකන්නන් නොමැති හා ඉඩම් හිමියන් නොමැති රාජ්‍යයක් ගොඩනැගීමට වැඩකරන පොදු ජනතාවට ආධාර කිරීමෙහි සමත් වූද, නියම කොමියුනිස්ට්වාදීන් පුහුණු කිරීමය. එය කරන්නේ කෙසේද? එය කළ හැක්කේ ගුරුවරුන් ධනපති පංතියෙන් උරුම කොට ලත් දැනුම එකතු සමස්තය උපයෝගී කර ගැනීමෙන් පමණකි. මෙය නොමැතිව කොමියුනිස්ට් ක්‍රමයේ තාක්ෂණික ජයග්‍රහණයන් ලද හැක්කේ නොවේ. එවිට එම ජයග්‍රහණ ලබා ගැනීම පිළිබඳ අපේක්ෂාවන් හුදෙක් දවල් සිහින පමණක් වනු ඇත. එනිසා මෙම ප්‍රශ්නය පැන නගින්නේය: ස්වකීය වැඩ කටයුතු තුළට දේශපාලනය ගෙන ඒමේ පුරුද්දක් නැති, විශේෂයෙන්ම අපගේ වාසියට හේතු වන දේශපාලනය, එනම්, කොමියුනිස්ට්වාදයට අවශ්‍ය දේශපාලනය ගෙන ඒමේ පුරුද්දක් නැති මේ මිනිසුන් සංවිධාන කරන්නේ කෙසේද? මා කලින් කී පරිදි එය ඉතා අමාරු ප්‍රශ්නයකි. අපි මෙම කරුණ ගැන මධ්‍යම කාරක සභාවේදී සාකච්ඡා කෙළෙමු. එය ගැන සාකච්ඡා කිරීමේදී, අත්දැකීමවලින් ලැබුණු පාඩම් සැලකිල්ලට ගත්තෙමු. මේ හා සම්බන්ධයෙන් වූ කල, මා අද අමතන වැනි සම්මේලනයක්, ඔබගේ වැනි සාකච්ඡා සභාවක් බෙහෙවින් වටිනා බව අපි අදහස් කරමු. හුදෙක් නිශ්චිත කවයකට, නිශ්චිත සංවිධානයකට අයත් පුද්ගලයෙක් ලෙස සලකනු ලැබීමට පුරුදුව සිටි සෑම ප්‍රචාරකයෙක් වෙතම නව කෝණයකින්, නව බැල්මක් හෙළීමට සෑම පක්ෂ කාරක සභාවකටම දැන් සිදුවේ. ඒ සෑම පුද්ගලයෙක්ම මුළු රාජ්‍යයමත්, ධනපති ක්‍රමයට විරුද්ධව සෝවියට් රුසියාව ගෙන යන ලෝක අරගලයත් මෙහෙයවන පාලක පක්ෂයට අයත් වේ. ඔහු සටන් කරන පංතියක සහ අති විශාල රාජ්‍ය යන්ත්‍රයක් පාලනය හා පාලනය කළ යුතු පක්ෂයක නියෝජිතයෙකි. රහසිගත වැඩ කිරීම පිළිබඳ උත්කෘෂ්ට පාසැලෙන් ශික්ෂණය ලැබූ සහ අරගලයේදී උරගා බලන ලද හා දැඩි වූ බොහෝ කොමියුනිස්ට්වරු, උද්ඝෝෂකයා සහ ප්‍රචාරකයා උද්ඝෝෂකයන්ගේ නායකයෙකු බවට, විශාල දේශපාලන සංවිධානයක නායකයෙකු බවට හරවන මෙම පරිවර්තනයෙහි සම්පූර්ණ වැදගත්කම වටහා ගැනීමට එක්කෝ අකැමති වෙති.නැතහොත්, අසමත් වෙති. ඔහුට දෙන නිල නාමය කුමක් වුවත්, පොදු පාසල් පරිපාලක යන්න වැනි අප්‍රසන්න නමක් වුවත් එය වැදගත් නොවේ. වැදගත් දෙය නම්, ගුරුවර සමූහයා මෙහෙයවා ගැනීමේ හැකියාව ඔහුට තිබිය යුතු වීමය.

ලක්ෂ ගණන් ගුරුවරුන්ගෙන් සමන්විත වන්නේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීමට, චින්තනය පණ ගැන්වීමට සහ පොදු ජනතාව අතර තවමත් නොනැසී පවතින දුර්මතයන්ට විරුද්ධව සටන් කිරීමට යොමු විය යුතු පිරිසකි. ගුරුවර සමූහයා ධනපති සංස්කෘතියේ උරුමය හිමි කොට ගෙන සිටිති. ඔවුහු එහි දුර්වලතාවයන්ගෙන් හරිතව සිටිති. එනිසා ඔවුන් කොමියුනිස්ට්වරු වීම වැලකෙන්නේය. නමුත්, මෙම ගුරුවරුන් දේශපාලන අධ්‍යාපන කාරකවරුන්ගේ පිරිසට බඳවා ගැනීමට අපි මේ නිසා පසුබට නොවිය යුත්තෙමු. මන්දයත්, මෙම ගුරුවරුන් දැනුම ඇතිව සිටින අතර එම දැනුම නොමැතිව අපගේ අරමුණ ඉටු කර ගැනීම අපට නොහැකි වනු ඇති හෙයිනි.

කොමියුනිස්ට් අධ්‍යාපනයට සේවය කිරීම සඳහා ප්‍රයෝජනවත් පුද්ගලයන් ලක්ෂ ගණනින් යෙදීමට අපි කටයුතු කළ යුත්තෙමු. එය වූකලී පෙරමුණෙහිදී, අපගේ රතු හමුදාවෙහි ඉටු කරන ලද කර්තව්‍යයකි. පැරණි හමුදාවේ නියෝජිතයන් දස දහස් ගණන් දෙනා එයට බඳවා ගන්නා ලදී. යළි ශික්ෂණය කිරීමේ දීර්ඝ ක්‍රියාදාමයකින් පසුව ඔවුහු රතු හමුදාව සමග එකට පැහුණු තත්ත්වයකට පත් වූහ. අන්තිමේදී ඔවුන් ලත් ජයග්‍රහණ මගින් ඒබව ඔප්පු විය. අපි, අපගේ සංස්කෘතික සහ අධ්‍යාපනික කටයුතුවලදී මෙම ආදර්ශය අනුගමනය කළ යුත්තෙමු. මෙම වැඩ කටයුතු එතරම් දර්ශනීය නොවන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බව ඇත්ත නමුත්, ඒවා ඊටත් වඩා වැදගත්ය. සෑම උද්ඝෝෂකයෙක්ම සහ ප්‍රචාරකයෙක්ම අපට අවශ්‍යය. ඔහු ඒකාන්ත වශයෙන් පක්ෂ ජීවගුණයෙන් වැඩ කරයි නම්, පක්ෂ කටයුතුවලට පමණක් සීමා වී නොසිට, ලක්ෂ ගණන් ගුරුවරුන් මෙහෙයවීම, ඔවුන්ගේ උනන්දුව පණගැන්වීම, ඔවුන්ගේ පරණ ධනපති දූර්මත පරාජය කිරීම, අප කරන වැඩ කටයුතුවලට ඔවුන් සම්බන්ධ කර ගැනීම සහ අප කරන වැඩ කටයුතුවල දැවැන්ත භාවය ඔවුන්ට අවබෝධ වෙන්නට සැලැස්වීම තමන්ගේ කාර්යය බව වටහා ගන්නේ නම්, ඔහු තමන්ගේ මෙහෙය ඉටු කළා වන්නේය. ධනපති ක්‍රමය විසින් යටපත් කරන ලද සහ අප කෙරෙන් ඉවතට ඇද ගන්නා ලද මෙම පොදු ජන සමූහයා හරිමග මෙහෙයවා ගැනීමට අපට හැකි වන්නේ මෙම කාර්යය ඉටු කිරීමෙන් පමණකි.

පාසැලෙන් බාහිර අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි වැඩ කරමින් සිටින සෑම උද්ඝෝෂකයෙක්ම සහ ප්‍රචාරකයෙක්ම අනුගමනය කළ යුතු සහ නිතර සිහියේ තබා ගත යුතු අරමුණු ඒවාය. මෙම ක්‍රියාදමයේදී දුෂ්කරතාවයන් මහා රාශියකට මුහුණ දීමට සිදුවනු ඇත. එනිසා ඔබ, පක්ෂ අධ්‍යයන කවවල පමණක් නොව, දැන් කම්කරු පංතිය අතෙහි පවතින මුළු මහත් රාජ්‍ය යන්ත්‍රයෙහිද නියෝජිතයන් සහ නායකයන් බවට පත්වීමෙන් කොමියුනිස්ට්වාදයේ සත් ව්‍යාපාරයට ආධාර කළ යුතුය.

අපි ධනපතියන්ගේ ප්‍රතිරෝධයේ සෑම ස්වරූපයක්ම පරාජය කළ යුත්තෙමු. යුද්ධමය සහ දේශපාලන ක්ෂේත්‍රයෙහි ප්‍රතිරෝධය පමණක් නොව, ඉතාමත් ගැඹුරට විහිදුන සහ ඉතාමත් ශක්තිමත් දෘෂ්ටිමය ප්‍රතිරෝධය ද පරාජය කළ යුත්තෙමු. පොදු ජනතාව යළි ශික්ෂණය කිරීම අපගේ අධ්‍යාපන කාරකවරුන්ගේ යුතුකම වන්නේය. මෙම ක්ෂේත්‍රයෙහි දී අප ලබන ජයග්‍රහණය සමහර විට පෙරමුණේ තරම් සීඝ්‍ර නොවන්නට හා මහත් දුෂ්කරතාවයන් විඳීමෙන් හා පසු බැසීම්වලින් පවා පසුව ලැබෙන්නට පුළුවන. නමුත් පොදු ජනතාව අතර දක්නට ලැබෙන අධ්‍යාපනය හා කොමියුනිස්ට්වාදය ගැන දැනුම ලැබීම සඳහා වූ උනන්දුව හා පිපාසය මෙම ක්ෂේත්‍රයෙහිදීද අපගේ ජයග්‍රහණය සහතික බව කියන්නකි. කෙසේ හෝ වේවා, අවසානයේදී අපි දිනන්නෙමු.

අවසාන වශයෙන්,මම තවත් එක කරුණක් ගැන විස්තර කිරීමට බලාපොරොත්තු වෙමි. සමහර විට දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන කාරක සභාව යන නම හරිහැටි නොවැටහෙන්නට ඉඩ තිබේ. එයින් දේශපාලන සංකල්පය ගැන සඳහන් වන සේම, මෙහි දී වැදගත් දෙය වන්නේද දේශපාලනය ය.

නමුත්, දේශපාලනය යන්න වටහා ගන්නේ කෙසේද? දේශපාලනය යන්න පැරණි අර්ථයෙන් වටහා ගතහොත් අයෙක් භයානක සහ බරපතල

වරදකට වැටෙන්නේය. දේශපාලනය යනු පංති අතර අරගලයකි. එයින් අදහස් වන්නේ, නිර්ධන පංතිය ස්වකීය විමුක්තිය සඳහා ලෝක ධනපති පංතියට විරුද්ධව කරන අරගලයේදී පවත්වන සම්බන්ධකම්ය. එනමුත්, අපගේ අරගලයෙහිදී මෙම කරුණෙහි අංග දෙකක් ප්‍රමුඛ වෙයි! එක් අතකින් ධනපති ක්‍රමයෙන් ලැබුණු උරුමය විනාශ කිරීමේත්, සෝවියට් රාජ්‍යය පොඩි-පට්ටම් කර දැමීමට මුළු ධනපති පංතියම දරන ප්‍රයත්න ව්‍යර්ථ කිරීමේත් කර්තව්‍යය ඇත. මේ දක්වා අපගේ අවධානයෙන් වැඩි කොටසක් යොමු කෙරුණේ මෙම කර්තව්‍යයට ය. එනිසා අප අපගේ අනිත් කර්තව්‍යය වෙත, එනම්, ගොඩනැගීම වෙත යාම වැලකිත. ධනපති ලෝකාවබෝධය අනුව දේශපාලනය ආර්ථිකයෙන් වෙන්වූ දෙයක් ලෙසට පෙන්වන ලදී. ධනපතියෝ මෙසේ කීහ:ගොවි ජනයිනි, නුඹලාගේ ජීවනෝපායට අවශ්‍ය දෑ ලබා ගැනීමට නුඹලා වැඩ කළ යුතුය. කම්කරුවනි, නුඹලාගේ ජීවනෝපාය සඳහා අවශ්‍ය දෑ වෙළෙඳ පොළෙන් ලබා ගැනීමට නුඹලා වැඩ කළ යුතුය. ආර්ථික ප්‍රතිපත්තිය හා සම්බන්ධයෙන් වූ කල කිව යුත්තේ, එය නුඹලාගේ ස්වාමිවරුන්ගේ කාර්යයක් බවය. නමුත් එය එසේ නොවේ. දේශපාලනය පොදු ජනතාවගේ කාර්යය, නිර්ධන පංතියේ කාර්යය විය යුතුය. අපගේ කාලයෙන් සහ අප කරන කටයුතුවලින් දහයෙන් නව පංගුවක්ම ධනපති පංතියට විරුද්ධව අරගලයට කැප වී තිබෙන බව මෙහිලා අවධාරණයෙන් සඳහන් කළ යුත්තෙමු. වීරාංගල් පරදවා ලබාගත් ජයග්‍රහණ ගැන අපි ඊයේ කියෙව්වෙමු. අද සහ සමහර විට හෙට ඔබට ඒ ගැන කියවන්නට ලැබෙනු ඇත. අරගලයේ එක අවධියක් අවසන් වෙමින් පවතින බවත්, බටහිර රටවල් ගණනාවක් සමග අප සාම තත්ත්වයක් ලබා ගෙන තිබෙන බවත් එම ජයග්‍රහණවලින් පෙනේ. පෙරමුණේදී අපි ලබන සෑම ජයග්‍රහණයක්ම නිසා අභ්‍යන්තර අරගලය සඳහා, රාජ්‍ය සංවිධානයේ දේශපාලනය සඳහා අපගේ අත් නිදහස් වන්නේය. සුදු හමුද පරදවා ලබන ජයග්‍රහණය වෙතට අප සමීප කරන සෑම පියවරක්ම, අරගලයේ එල්ලය ආර්ථික ප්‍රතිපත්තිය වෙතට යොමු කරයි. පැරණි වර්ගයට අයත් ප්‍රචාරයෙන් කෙරෙන්නේ කොමියුනිස්ට්වාදය කුමක් ද යන්න විස්තර කිරීම සහ පැහැදිලි කිරීමය. දැන් එම වර්ගයේ පැරණි ප්‍රචාරයෙන් ප්‍රයෝජනයක් නොවේ. සමාජවාදය ගොඩනගන්නේ කෙසේද යනු ව්‍යවහාරයෙන් පෙන්නුම් කිරීම දැන් අවශ්‍යව තිබේ. අපගේ ප්‍රචාර සියල්ලක්ම ආර්ථික සංවර්ධනයේ දේශපාලන අත්දැකීම් මත පදනම් කළ යුතුය. අපගේ ප්‍රධාන කර්තව්‍යය එයයි. එය ගැන පැරණි අර්ථයෙන් විග්‍රහ කරන යමෙක් වෙතොත්, ඔහු ආපසු ගමන් කරන්නෙක් සේ, ගොවි සහ කම්කරු පොදු ජනතාව අතර ප්‍රචාරක කටයුතු කරගෙන යාමෙහි අපොහොසත් අයෙක් සේ පෙනී යනු ඇත. දැන් අපගේ ප්‍රධාන ප්‍රතිපත්තිය විය යුත්තේ, එකතු කරන ධාන්‍ය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පූඩ් ගණන වැඩි කරන ලෙසින්, බනින ගල් අඟුරු පූඩ් ගණන වැඩි කරන ලෙසින්, එම ධාන්‍ය සහ ගල් අඟුරු පූඩ් ගණන වඩාත් ඵලදායක ලෙස උපයෝජනය කරගන්නේ සහ සාගතය වලක්වන්නේ කෙසේදැයි තීරණය කරන ලෙසින්, රාජ්‍යය ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම ය. අපගේ ප්‍රතිපත්තිය එයයි. අපගේ උද්ඝෝෂණ සහ ප්‍රචාරක කටයුතු සියල්ලම මෙම අරමුණ වෙත ඉලක්ක කළ යුතුය. අලංකාර කථා අඩු කළ යුතුය. වැඩ කරන ජනතාව අලංකාර වචනවලින් සතුටට පත් කළ නොහැකිය. ධනපතියන්ට විරුද්ධව කරන අරගලයෙන්, විරාංගල්ට සහ සුදු හමුදාවලට විරුද්ධව කරන අරගලයෙන් මානය ඉවතට ගැනීමට යුද්ධය අපට අවකාශ දුන් සැනෙකින්, අපි ආර්ථික ප්‍රතිපත්තිය වෙත හැරෙන්නෙමු. එසේ වූ කල උද්ඝෝෂණය සහ ප්‍රචාරය අති විශාල හා තව තවත් වැඩිවන වැදගත්කමක් ඇති කාර්ය කොටසක් ඉටු කරනු ඇත. සෑම උද්ඝෝෂකයෙක්ම රජ්‍ය පාලකයෙක් විය යුතුය, ආර්ථිකය ගොඩනැගීමේ කර්යයේදී සියලුම ගොවිජනතාවගේ හා සියලුම කම්කරුවන්ගේ නායකයෙක් විය යුතුය. කොමියුනිස්ට්වාදියෙක් වීමට නම්, මේ මේ පොතපත කියවිය යුතුයැයි උපදෙස් දීමට ඔහුට හැකියාවක් තිබිය යුතුය.

ආර්ථික ජීවිතය වැඩි දියුණු කිරීමේ සහ එය වඩාත් සුරක්ෂිත, වඩාත් සමාජමය කිරීමේ මාර්ගය එයයි. නිෂ්පාදනය වැඩි කිරීමේ, ආහාර තත්ත්වය වැඩි දියුණු කිරීමේ හා නිෂ්පාදනය කළ භාණ්ඩ වඩා නිවැරදි ලෙස බෙදහැරීමේ ගල් අඟුරු කැණීම් වැඩි දියුණු කිරීමේ සහ ධනපති ක්‍රමය හා ධනපති ජීවගුණය නොමැතිව කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීමේ මාර්ගය එයයි.

කොමියුනිස්ට්වාදය සංයුක්ත වන්නේ කුමකින් ද? කොමියුනිස්ට්වාදය උදෙසා වූ සියලුම ප්‍රචාරක කටයුතු කළ යුත්තේ, රාජ්‍යය සංවර්ධනයට අදාළ වන ප්‍රායෝගික මග පෙන්වීමක් එයින් ලැබෙන ආකාරයෙනි. කොමියුනිස්ට්වාදය තමන්ගේම ව්‍යාපාරය කොට ගැනීමට කම්කරුවන්ට හැකි වන පරිද්දෙන් එය පහසුවෙන් වටහා ගත හැකි තත්ත්වයට පත් කළ යුතුය. දැන් එම කර්තව්‍යය ඉටු කරන ආකාරයෙහි දුර්වලකම් ඇත. එහිදී දහස් ගණන් වැරදි සිදු වේ. අපි ඒ බව නොසඟවා කියන්නෙමු. එය එසේ වුවත්, අපගේ යන්ත්‍රය ගොඩනැගීම හා වැඩි දියුණු කිරීම භාර වන්නේ කම්කරු හා ගොවි ජනයාටමය. අපගේ ආධාරය කොතරම් දුර්වල සහ අඩුපාඩු සහිත වුවත් එයද ලබා ගෙන ඔවුන්ම එම කාර්යය ඉටු කළ යුතුය. අපට නම් දැන් මෙය වැඩ පිළිවෙළක්, න්‍යායක්, නැතහොත්, අනාගත කර්තව්‍යයක් නොවේ. එය යථාර්ථ සහ ප්‍රායෝගික වශයෙන් සංවර්ධනය කිරීම පිළිබඳ ප්‍රශ්නයකි. අපගේ යුද්ධයේදී අපගේ සතුරන්ගෙන් අප කෲරතර පරාජයන් ගණනාවක් ලැබූ නමුත්, අපි එම පරාජයවීම් ඇසුරෙන් පාඩම් උගෙන ගෙන සම්පූර්ණ ජයග්‍රහණය ලබා ගත්තෙමු. දැනුදු අපි සෑම පරාජයකින්ම පාඩමක් උගෙන ගත යුත්තෙමු. එමෙන්ම මෙතෙක් කළ වැඩ නිදර්ශනයක් ලෙසට ගනිමින් කම්කරුවන්ට හා ගොවි ජනතාවට උපදෙස් දිය යුතු බව මතක තබා ගත යුත්තෙමු. නරක දේ අනාගතයේදී මග හැරිය හැකි වන සේ, ඒවා නරක බව පිළිගත යුත්තෙමු.

නිර්මාණශීලී වැඩ ආදර්ශයක් කොට ගැනීමෙන්, ඒවා ගැන නැවත නැවතත් විස්තර කිරීමෙන්, අපි, අකාර්යක්ෂම කොමියුනිස්ට් කළමණාකරුවන් නියම ගොඩනගන්නන් බවට, අන් සියල්ලටම වඩා අපගේ ආර්ථික ජීවිතය ගොඩනගන්නන් බවට සාර්ථක ලෙස පරිවර්තනය කර ගන්නෙමු. අපි අපගේ ඉලක්කයන් සපුරාලන්නෙමු. අපි පැරණි ක්‍රමයෙන් උරුම කොට ගත් සහ එක පහරින් බැහැර කළ නොහැකි බාධක සියල්ලම ජය ගන්නෙමු. අපි ජනතාව නැවත ශික්ෂණය කළ යුත්තෙමු. ඔවුන් යළි ශික්ෂණය කළ හැක්කේ උද්ඝෝෂණය සහ ප්‍රචාරය මගින් පමණකි. මහ ජනතාව, ප්‍රථමයෙන්ම පොදු ආර්ථික ජීවිතය (සම්පූර්ණයෙන්ම) ගොඩ නැගීමේ කාර්යයෙහි යෙදෙන සේ යොමු කළ යුත්තෙමු. සෑම උද්ඝෝෂකයෙකුගේම සහ ප්‍රචාරකයෙකුගේම ප්‍රධාන සහ මූලික අරමුණ විය යුත්තේ එයයි. ඔහු මෙය අවබෝධ කොට ගත් කල ඔහුගේ වැඩ කටයුතු නියත වශයෙන්ම සාර්ථක වනු ඇත. (අත්පොළසන් හඬ).

"සමස්ත රුසියා දේශපාලන අධ්‍යාපන කාරකවරුන්ගේ සාකච්ඡා සභාවේ (1920 නොවැම්බර් 1-8) නිවේදන පත්‍රිකාව", මොස්කව්

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 41, පිටු 398-408

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

"වෘත්තීය සමිතිවල කර්තව්‍යයන් සහ ඒවා ඉටු කරන විධික්‍රම" ගැන කෙටුම්පත් යෝජනාව[29]

රුසියාවේ කොමියුනිස්ට් පක්ෂයේ නවවැනි සම්මේලනයේ තීරණ අනුව, මෙම තීරණ ඉදුරාම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය වෘත්තීය සමිතිවලට නැවත වරක් පෙන්නුම් කරන සාකච්ඡා සභාව, ආර්ථිකය ගොඩනැගීමේ පොදු යෝජනා ක්‍රමයේ සඳහන් අරමුණුවල පූර්වතාවයන් නියම කරන ඒකීය ආර්ථික සැලැස්මක් තිබීමේ අවිවාදී සහ ඒකාන්ත අවශ්‍යතාවය ගැන විශේෂයෙන්ම පෙන්වා දෙන්නේය. ඒ අතරම, 1920 සැප්තැම්බර් පක්ෂ සාකච්ඡා සභාව පිළිගත් ලෙසට මේ මොහොතේදී හදිසි ක්‍රියාමාර්ගවල සිට වඩාත් තුලනාත්මක ලෙස බලවේගයන් බෙදු හැරීම වෙත ක්‍රමික ලෙස, එහෙත්, අනවරථ ලෙස පරිවර්තනය විය යුතුය විශේෂයෙන්ම, සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලය සමස්තයක් වශයෙන් තහවුරු කිරීමේද, එහි සංවිධාන යන්ත්‍රයේ ක්‍රියාත්මක භාවය වැඩි දියුණු කිරීමේද, සියලුම වෘත්තීය සමිතිවල වැඩ කටයුතු වඩාත් ක්‍රමානුකූල කිරීමේද, එමගින් මුළු වෘත්තීය සමිති ව්‍යාපාරයම ශක්තිමත් කිරීමේද අරමුණ ඇතිව එක්එක් සමිතිවල හොඳම සංවිධායකයන් සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍ය මණ්ඩලයට ද්විතීයනය කිරීමේදී එපරිද්දෙන් ක්‍රියා කළ යුතුය.

විශේෂයෙන්ම පොදු ප්‍රවාහණ කම්කරු සමිතියේ මධ්‍යම කාරක සභාව (ට්සෙක්ත්‍රන්)[30] සම්බන්ධයෙන් මෙම පියවර ක්‍රියාත්මක කළ යුතු වේ. අන් සමිති හා සමග සසඳන කල, එහි අසමානුපාතික සංවර්ධනය නවත්වා ලිය යුතුය. එමගින් මුද හරිනු ලබන හොඳම පිරිස්, හොඳම ප්‍රතිඵල ගෙන දුන්, ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීමේද, ක්‍රියාරම්භකතාවය දිරි ගැන්වීමේද, කර්මාන්තයේ කළමනාකාර කටයුතුවලට සහභාගි වීමේද, තරගය දියත් කිරීමේද, යනාදී ඒ විධික්‍රම මුළු වෘත්තීය සමිති ව්‍යාපාරයටම ව්‍යාප්ත කළ යුතුය.

රුසියාවේ කොමියුනිස්ට් පක්ෂයේ නවවැනි සම්මේලනයේ තීරණ අනුව නිෂ්පාදන කළමනාකාරිත්වයේදී වෘත්තීය සමිති සහභාගිත්වය ඇති කිරීමේ, පුළුල් කිරීමේ සහ තහවුරු කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය පිළිගන්නා සාකච්ඡා සභාව, ප්‍රධාන සමිති හා ව්‍යවසායයන් මේ සම්බන්ධයෙන් ලත් අත්දැකීම් සම්පිණ්ඩනය කරන සේ ද, සියලුම වෘත්තීය සමිතිවලට එම ප්‍රායෝගික අත්දැකීම්වලින් ප්‍රයෝජන ගැනීම ආධාර කාරී වන හා වඩාත් ශක්තිමත් ලෙස හා ක්‍රමානුකූල ලෙස එම අත්දැකීම් උපයෝගී කර ගන්නා මෙන් එම සමිතිවලට නියම කරන විස්තරාත්මක උපදෙස් සකස් කරන සේද සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයට භාර දෙයි.

මෙය විශේෂයෙන්ම අදළ වන්නේ විශේෂඥයන් යොදවා ගැනීම සම්බන්ධයෙනි.

1920 නොවැම්බරයේ මුල්භාගයේ ලියන ලදී

ප්‍රථමයෙන් පළකරන ලද්දේ, එකතු කළ කෘති හතරවැනි සංස්කරණයෙහිය

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 42, පිටු 9-10

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අටවැනි සමස්ත රුසියා සෝවියට් සභාවල සම්මේලනය

1920 දෙසැම්බර් 22-29

1

දේශීය සහ විදේශීය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ සහ මහජන කොමිසාර් මණ්ඩලයේ වාර්තාව

දෙසැම්බර් 22

(ශාලාවෙන් ඝෝෂාව නැගෙයි: "ලෙනින් සහෝදරයාට ජය වේවා!" වේගවත් අත්පොළසන් රැල්ලක්. ඔල්වරසන්.) සහෝදරවරුනි, සෝවියට් ආණ්ඩුවේ දේශීය සහ විදේශීය ප්‍රතිපත්තිය ගැන වාර්තාවක් ඉදිරිපත් කිරීම මට භාර වී තිබේ. කම්කරුවන්ගේ සහ ගොවිජනතාවගේ ආණ්ඩුව විසින් අනුමත කරන ලද යටත් පිරිසෙයින් ඉතාමත් ප්‍රමුඛ සහ ඉතාමත් වැදගත් නීති සහ පියවරයන් හෝ ඇතුළත් කොට ලැයිස්තුවක් ඔබ හමුවේ තැබීම මගේ වාර්තාවේ අරමුණ නොවිය යුතුයයි මම සිතමි. මෙම කාලය තුළ ඇති වූ සිදුවීම් පිළිබඳ විස්තරයක් සම්බන්ධයෙන් ඔබ උනන්දු වන්නේ හෝ මා එවැනි විස්තරයක් කිරීම ඉතා වැදගත් වන්නේ හෝ නැතැයි ද මම සිතමි. මා සිතන්නේ අප මෙම අවුරුද්ද තුළ උගෙන ගත් ප්‍රධාන පාඩම්වලින් පොදු නිගමනවලට එළඹ ගැනීම අවශ්‍ය බවයි. විප්ලවයේ ඉහත අවුරුදුවලට වඩා හදිසි දේශපාලන වෙනස් වීම් ඇති වූ මෙම වර්ෂයේදී අපට ලැබුණු පාඩම්වල අඩුවක් නැත. මෙම වර්ෂයේ අත්දැකීම්වලින් ලත් පොදු පාඩම් ඇසුරෙන් අප මුහුණ පා සිටින ඉතාමත් හදිසි දේශපාලන සහ ආර්ථික කර්තව්‍යයන් නිගමනය කර ගත යුතුව තිබේ. සෝවියට් ආණ්ඩුව එම කර්තව්‍යයන් ඉතාමත් වැදගත් කොට සලකන්නේය. ඔබේ පරීක්ෂාව සහ අනුමැතිය සඳහා ඔබ වෙත ඉදිරිපත් කර තිබෙන නීති පණත්වලින් සහ ගන්නා ලද පියවරයන් එකතු සමස්තයෙන් ඒවායේ වැදගත් සලකුනු වේ. එම කර්තව්‍යයන් සපුරාලීමෙන් අපගේ ආර්ථිකයේ සැලකිය යුතු දියුණුවක් සිදුවනු ඇතැයි සෝවියට් ආණ්ඩුව අපේක්ෂා කරයි. එනිසා, මගේ කථාව සමූහාණ්ඩුවේ ජාත්‍යන්තර තත්ත්වය ගැන සහ පසු ගිය අවුරුද්දේ අප අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන ප්‍රතිඵල ගැන කෙටියෙන් කරන විස්තරයකට සීමා කිරීමට අවසර දෙන්න.

බටහිර යුරෝපයේ ධනපති රටවල බල පෑම සහ බල කිරීම යටතේ පෝලන්ත ඉඩම් හිමියන් සහ ධනපතියන් අප මත යුද්ධයක් පැටවූ හැටි ඔබ සියලු දෙනාම දන්නෙහිය. එයට අනුබල දුන්නේ බටහිර යුරෝපයේ ධනපති රටවල් පමණක්ම නොවේ.[31] අප දැන් ඉදිරිපත් කරන කොන්දේසිවලට වඩා පෝලන්තයට වාසිදායක වූ කොන්දේසි අනුව අප පසුගිය අප්‍රේල් මාස්යේදී එරටේ ආණ්ඩුවට සාම යෝජනා ඉදිරිපත් කළ බවද, සමාදානයක් සඳහා පෝලන්තය සමග කළ සාකච්ඡා, සම්පූර්ණයෙන්ම බිඳ වැටීමෙන් පසුව, යුද්ධයක් නොකර බැරිකම නිසාම අපට සටන් කරන්නට සිදු වූ බවද ඔබ දන්නෙහිය. නිශ්චය වශයෙන්ම දැඩි විඩාවට පත්ව සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් වොර්සෝ අසලදී අප හමුද බරපතල පරාජයකට පත් වූ නමුත්,අප අප්‍රේල් මාසයේ දී පෝලන්තයට යෝජනා කළාට වඩා බෙහෙවින් අපට වාසිදායක වන සාමයකින් මෙම යුද්ධය කෙළවර වී තිබේ. පෝලන්තය සමග ප්‍රාථමික ගිවිසුමක් අත්සන්කර ඇත. අවසාන සාම ගිවිසුමක් අත්සන් කිරීම සඳහා දැනට සාකච්ඡා පවත්වා ගෙන යනු ලැබේ.[32] මෙම සාකච්ඡා සාමයකින් කෙළවර වීම වැලැක්වීමේ අරමුණ ඇතිව සමහර වඩාත් මුරණ්ඩු ධනපති රටවල් සහ සමහර රුසියානු සුදු හමුද කොටස් පාන බලයෙන් උද්ගත වන අන්තරාය අපෙන් සඟවා තැබීමට අපි කිසිසේත් අදහස් නොකරමු. නමුත්, යුද්ධමය මැදිහත් වීම සහ ආයුධ සන්නද්ධ මර්දනය මගින් සෝවියට් සමූහාණ්ඩු මෙල්ල කිරීම වෙත ඉලක්ක කළ මිත්‍ර ගිවිසුමේ (Entente) ප්‍රතිපත්තියට බින්දුව වැටෙන තත්ත්වය ලඟා වෙමින් තිබෙන බව සහ සෝවියට් සමූහාණ්ඩු වෙත නිසැක සතුරුතාවයක් දක්වන රාජ්‍යයන් එන්න එන්නම වැඩිවන සංඛ්‍යාවක් අපගේ සාම ප්‍රතිපත්තිය වෙත අප විසින් දිනා ගනු ලබන බව කිව යුතුව තිබේ. සාම ගිවිසුම් අත්සන් කළ රටවල් සංඛ්‍යාව වැඩි වෙමින් පවතී. නුදුරු අනාගතයේදී පෝලන්තය සමග අවසාන සාම ගිවිසුමක් අත්සන් කිරීමේ සෑම ඉඩක්ම ඇත. මේ අනුව බලන කල යුද්ධය මගින් අපෙන් ආණ්ඩු බලය උදුරා ගැනීමට උත්සාහ කරන ධනපති බලවේගයන්ගේ සන්ධානය ට තවත් බලවත් පහරක් වැදෙනු ඇත.

සහෝදරවරුනි, පෝලන්තය සමග යුද්ධයේදී අපට තාවකාලික පසුබැසීම් දරා ගන්නට සිදු වූයේත්, යුද්ධයේ සමහර අවස්ථාවල අපගේ තත්ත්වය දුෂ්කර වූයේත්, එක් අධිරාජ්‍යවාදී බලවතෙක්[33] විසින් පිළිගන්නා ලද සහ අති විශාල ද්‍රව්‍යමය, යුද්ධමය සහ වෙනත් ආධාර ලත් වැරංගල්ට විරුද්ධව සටන් කිරීමට අපට සිදුවූ නිසා බවද ඔබ නිසැකවම දන්නෙහිය. යුද්ධය හැකි තරම් ඉක්මණින් කෙළවර කිරීම පිණිස වැරංගල්ට විරුද්ධව තීරණාත්මක පහරක් ගැසීමට වේගයෙන් සේනා සංකේන්ද්‍රණය කිරීමට අපට සිදු විය. යුද්ධ විශේෂඥයන් හා යුද්ධ හමුද බලධාරීන් පවා සිතූ පරිදි අනභිභව-

https://liberationbase.wordpress.com

නීය වූ බාධක සහ බල කඳවුරු ජය ගැනීමේදී රතු හමුදාව ගෙන හැර පෑවේ කොතරම් අභීත වීරත්වයක්ද යනු ඔබ හොඳින් දන්නෙහිය. විරාංගල් පරදවා රතු හමුදාව ලැබූ පරිපූර්ණ, තීරණාත්මක සහ පුදුමාකාර තරම් වේගවත් ජයග්‍රහණය, රතු හමුදා ඉතිහාසයේ බැබලෙන පිටුවලින් එකකි. සුදු හමුදාවන් සහ අධිරාජ්‍යවාදීන් අප මත බලෙන් පැටවූ යුද්ධය කෙළවර වූයේ එලෙසිනි.

අපගේ සිත් ගත් කර්තව්‍යයක් වන, අත්‍යාවශ්‍ය කර්තව්‍යයක් වන, බොහෝ කාලයක් තිස්සේ අප කෙරෙහි ආකර්ෂණ බලයක් පෑ ඒ ආර්ථික සංවර්ධනය දැන් ඉතාමත් වැඩි විශ්වාසයකින් සහ අධිෂ්ඨානයකින් යුතුව කරගෙන යාමට අපට පුළුවන. කලින් මෙන් අපගේ මෙම කටයුත්තට අකුල් හෙළීම ධනපති මහාධිපතියන්ට පහසු නොවනු ඇතැයි යන විශ්වාසය ඇතිව අපට එය කළ හැකිව තිබේ. නමුත්, සැබැවින්ම අපි අපගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් විය යුත්තෙමු. දැන් අපට යුද්ධයක අන්තරාය නැතැයි යන සහතිකය කිසි කලෙකත් දීමට නොපුළුවන. අපට තවමත් එම සහතිකය නොමැත්තේ විධිමත් සාම ගිවිසුම්වල අඩුවක් නිසා නොවේ. විරාංගල්ගේ හමුදාවේ නෂ්ඨාවශේෂයන් විනාශ වී නොමැති බවත්, ඔවුන් ඉක්මණින් ක්‍රියාත්මක විය හැකි පරිද්දෙන් නිහඬව සිටින බවත්, ඔවුන් උපකාර සහ රැකවරණ ලබමින් සිටින බවත්, බලවත් ධනපති රටවල ආධාරයෙන් ඔවුන් නැවත පෙළ ගස්වනු ලබන බවත් අපි හොඳින් දනිමු. යම් යම් හමුදා කණ්ඩායම් යළි ඇති කිරීමට රුසියානු සුදු හමුදා සංවිධාන ක්‍රියාශීලී ලෙස කටයුතු කරන බව සහ විරාංගල්ගේ පිරිස් සමග එක්ව වාසිදායක අවස්ථාවක රුසියාවට විරුද්ධව ප්‍රහාරයක් දීමට ඒවා සූදානම් කරන බවද අපි දනිමු.

මොනම තත්ත්වයක් යටතේ වුවත් අපගේ යුද්ධමය සූදානම පවත්වා ගත යුත්තේ එබැවිනි. අධිරාජ්‍යවාදයට විරුද්ධව කොතරම් පහර ගසා තිබුණත්, කුමන අමාරුකම් හෝ විඳගෙන අපි අපගේ රතු හමුදාව සටනට සූදානම් තත්ත්වයෙන් තබා ගත යුත්තෙමු. එහි සටන් කාර්යක්ෂමතාවය වැඩි කළ යුත්තෙමු. නමුත් හමුදාවේ එක්තරා කොටසක් නිදහස් කර එම කොටස සීඝ්‍රයෙන් හමුදාවෙන් මුදා හැරීමට මෙය හරස් නොවේ. රතු හමුදාව සහ එහි නායකයන් යුද්ධ සමයේදී ලත් දැවැන්ත අත්දැකීම්, එහි සගුණත්වය වැඩි දියුණු කර ගැනීම දැන් අපට ආධාරකාරී වෙතැයි විශ්වාස කරමු. අපි, සමූහාණ්ඩුවට දැරීමට අපහසු නොවන ප්‍රමාණයට යුද්ධ හමුදාව අඩු කරන්නෙමු. නමුත්, ඒ අතරම, ක්‍රියාශීලීන් සංඛ්‍යාව අඩු කිරීමත් හා සමගම, අවශ්‍ය වූ අවස්ථාවක පෙරටත් වඩා හොඳින්, වඩාත් විශාල යුද්ධ හමුදාවක් සංවිධානය කිරීමේ හා ආයුධ සන්නද්ධ කිරීමේ හැකියාව ලැබෙන පරිද්දෙන් අපි හමුදා කාරකවරුන් මූලවක් පවත්වා ගන්නෙමු.

අපට විරුද්ධව සුදු හමුදා කුමන්ත්‍රණවලට ආධාර කිරීමෙන් බොහෝ

අලාභ හානි වින්ද අසල්වැසි රාජ්‍යයන් සියල්ලම අත්දැකීමෙන් අමිහිරි පාඩමක් උගෙන ගෙන ඇතැයිද, අපගේ දුර්වලකමක් ලෙසට පොදුවේ සලකන ලද අපගේ සහනදායක ආකල්පය ඔවුන් නිසි ලෙස වටහා ගෙන ඇතැයිද යනු අපට ඒකාන්තය. අප නිතරම සාමය සඳහා වෙර දරන අතර යුද්ධයේ දෘෂ්ටි කෝනය අනුවද සූදානම්ව සිටින බව තුන් අවුරුද්දක අත්දැකීමෙන් ඔවුන්ට පෙනී ගොස් ඇතුවාට සැකයක් නොමැත. අපට විරුද්ධව යුද්ධයක් ඇරඹීමට දරන ඕනෑම ප්‍රයත්නයකින් ඉටු වන අර්ථය නම්, යුද්ධයක් නොමැතිව, නැතහොත්, යුද්ධයට පෙර වූ කොන්දේසිවලට වඩා යුද්ධයට පසුව හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට පිළිගැනීමට සිදුවන කොන්දේසි අවාසිදායක වීම ය. රටවල් කීපයක්ම සම්බන්ධයෙන් මෙම කරුණ ඔප්පු විය. මෙය නම් අප කිසි කලෙකත් අහිමි කර නොගන්නා ජයග්‍රහණයකි. අප අවට තිබෙන, නැතහොත්, රුසියාව සමග දේශපාලන සම්බන්ධකම් ඇති කිසිම රාජ්‍යයක් එය අමතක නොකරනු ඇත. මෙයට ස්තුති වන්නට, අවට රටවල් සමග අපගේ සම්බන්ධකම් දිගින් දිගටම වැඩි දියුණුවන්නේය. රුසියාවේ බටහිර දේශසීමාබද රාජ්‍යයන් ගණනාවක් සමග අවසාන සාම ගිවිසුම් අත්සන් කර තිබෙන බව ඔබ දන්නවා ඇත. මෙම රාජ්‍යයන් ඉහත දී රුසියානු අධිරාජ්‍යයේ කොටස් විය. සෝවියට් ආණ්ඩුව කොන්දේසි විරහිතව ඒවායේ ස්වාධීනත්වය සහ ස්වෛරීභාවය පිළිගෙන ඇත[34]. එසේ කර තිබෙන්නේ අපගේ ප්‍රතිපත්තියේ ප්‍රධාන මූලධර්මවලට අනුකූලවය. එවැනි පදනමක් මත ඇතිකර ගන්නා සාමය ධනපතියන්ගේ සහ සමහර බටහිර රාජ්‍යයන්ගේ සතුටට හේතුවනවාට වඩා දීර්ඝ කාලයක් පැවතීමේ සෑම ඉඩක්ම තිබේ.

ලත්වියන් ආණ්ඩුව ගැන සලකන කල, එය සමග වූ අපගේ සම්බන්ධකම් දුර්වල වීමේ අන්තරායක් පැවති කාලයක් තිබුණ බව කිවයුතුය. තත්ත්වය කොතරම් නරක් වූයේද යත්, ලත්වියාව සමග තානාපති සම්බන්ධකම් අත්හැරීමේ අදහස පවා මතු විය. නමුත්, ලත්වියාවේ සිටින අපගේ නියෝජිතයාගෙන් ලැබී තිබෙන අලුත්ම වාර්තාව අනුව පෙනෙන්නේ, දැනටමත් ප්‍රතිපත්ති වෙනසක් සිදු වී තිබෙන බව හා බොහෝ වැරදි වැටහීම් සහ සාධාරණ අප්‍රසාදයට හේතු වූ කරුණ ඉවත් කර තිබෙන බවය. නුදුරු අනාගතයේදී අප හා ලත්වියාව අතර සමීප ආර්ථික සම්බන්ධකම් ඇති වෙතැයි බලාපොරොත්තු වීමට වැදගත් හේතු තිබේ. එස්තෝනියාව සහ රු. ස. ඒ. සෝ. ස. යාබද බොහෝ රාජ්‍යයන් සමග ඇති සම්බන්ධකම්වලට වඩා, ලත්වියාව සමග වන එම සම්බන්ධකම් බටහිර යුරෝපය සමග අප කරන වෙළෙඳාමට ප්‍රයෝජනවත් වනු ඇත.

සහෝදරවරුනි, මෙම අවුරුද්ද තුළදී අප පෙරදිග දේශයන්හි අනුගමනය කළ ප්‍රතිපත්තිය ද සාර්ථක වූ බව මම කිව යුත්තෙමි. බුහාරා, අසර්බයිජාන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ අර්මේනියා සෝවියට් සමූහාණ්ඩු පිහිටුවීම හා තහවුරුවීම ගැන අපි අපේ සතුට පළ කළ යුත්තෙමු. ඒවා තමන්ගේ සම්පූර්ණ නිදහස ලබාගෙන සිටිනවා පමණක් නොව ආණ්ඩු බලය කම්කරුවන් හා ගොවිජනයා අතට පත් කිරීමද සාර්ථක කර තිබේ. කාර්මික වශයෙන් දියුණු රටවල පමණක් නොව, නිර්ධන පංතිය වැනි සමාජ පදනමක් ඇති රටවල පමණක් නොව, ගොවි ජනයා මත පදනම් වී ඇති රටවල පවා සෝවියට් ආණ්ඩුව පිළිබඳ අදහස් සහ ප්‍රතිපත්ති ගැන අවබෝධයක් තිබෙන බවත්, ඒවා වහාම ක්‍රියාත්මක කළ හැකි බවත් මෙම සමූහාණ්ඩුවලින් ඔප්පු වේ.තහවුරු වේ.ගොවිජන සෝවියට් සභා පිළිබඳ අදහස ජය ගෙන ඇත. ගොවියාගේ බලය තහවුරු වී තිබේ. ඔවුහු ඉඩම් හා නිෂ්පාදන මාර්ග දිනා ගත්හ. අපගේ ප්‍රතිපත්තියේ ප්‍රායෝගික ප්‍රතිඵලවලින් ගොවි ජනතා සෝවියට් සමූහාණ්ඩු සහ රුසියානු සමාජවාදී සමූහාණ්ඩුවත් අතර මිත්‍ර සම්බන්ධකම් දැනටමත් තහවුරු වී තිබේ.

පර්සියාව සමග ගිවිසුමක් අත්සන් කිරීමේ සූදනම ගැන ද අපට සතුටු විය හැකිය.[35] අධිරාජ්‍යවාදී වියගසෙන් පීඩා විඳින සියලුම ජනතාවන්ගේ මූලික අවශ්‍යතාවයන් සම්පාත වීම අනුව එරට සමග මිත්‍ර සම්බන්ධකම් ඇතිවීම සහතික වේ.

ඇෆ්ගනිස්ථානය සමග සහ ඊටත් වඩා තුර්කිය සමග ද නොනවත්වාම මිත්‍ර සම්බන්ධකම් ගොඩනගා ගෙන යන බව සහ ශක්තිමත් කෙරෙන බව අපි සටහන් කරගත යුත්තෙමු. මෙහි පසුකී රට හා බටහිර යුරෝපීය රටවල් අතර කිසියම් සාමාන්‍ය තත්ත්වයක සම්බන්ධකම් ඇති කිරීමට කිසිසේත් ඉඩ නොලැබෙන තත්ත්වයක් උද කිරීමට එන්ටෙන්ට් මිත්‍ර ගිවිසුමේ රටවල් ඒවාට හැකි සියල්ලක්ම කර තිබේ. ධනපති පංතියේ ප්‍රතිරෝධය සහ කුමන්ත්‍රණ තිබුණත්, ධනපති රටවල් රුසියාව වට කර ගෙන සිටියත්, මෙම වාතාවරණය සහ, ඒ සමගම සෝවියට් ආණ්ඩුව ද තහවුරු වීමෙන් රුසියාව සහ පෙරදිග පීඩිත ජාතීන් අතර මිත්‍ර සම්බන්ධකම් නොනැවතීම ශක්තිමත් වන්නේය. අද දේශපාලනයේ ප්‍රධාන සාධකය වී තිබෙන්නේ, ජයග්‍රාහකයන් වීමේ වාසනාව නොලද ජනතාවන්ට විරුද්ධව අධිරාජ්‍යවාදීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචණ්ඩයයි. අධිරාජ්‍යවාදය අනුගමනය කරන මෙම ලෝක ප්‍රතිපත්තිය නිසා සියලුම පීඩිත ජනතාවන් අතර වඩාත් සමීප ස්වභාවයේ සම්බන්ධකම්, සන්ධානයක් හා මිත්‍රත්වයක් ඇති වීමට මාර්ගය සකස් වන්නේය. වඩාත් යුරෝපීය ස්වභාවයක් ගත් බටහිර රාජ්‍යයන් සමග වූ සම්බන්ධකම් විෂයෙහිද අපි මේ අතින් සාර්ථකත්වයක්, ලබා ඇත්තෙමු. අපගේ වර්තමාන විදේශ ප්‍රතිපත්තියේ මූලධර්ම නිවැරදි බවත්, අපගේ ජාත්‍යන්තර තත්ත්වය වැඩි දියුණු වීමට උපස්තම්භක වන ශක්තිමත් පදනමක් මත එය පිහිටා තිබෙන බවත් එයින් පෙනේ. අපේ සාමකාමී

ප්‍රතිපත්තිය දිගටම අනුගමනය කිරීමෙන් සහ සහනයන් දීමෙන් (අපි යුද්ධයෙන් වැලකීමට කැමැත්තෙමු නම් එසේ කළ යුත්තෙමු) අප ප්‍රතිපත්තියේ මූලික පොදු ක්‍රියාමාර්ගය සහ එහි මූලික අවශ්‍යතාව පණ ගැන්වී ශක්තිමත් වන බව අපට විශ්වාසය. එම පොදු ක්‍රියාමාර්ගය සහ අවශ්‍යතාවයන් පැන නගින්නේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියේ ස්වභාවයෙන්ම බව මෙහිලා සඳහන් කළ යුතුය. අප හා අන් කිසියම් රාජ්‍යයක් අතර රණ්ඩුවක් ඇවිස්සීමට සැම විටම සමත් තත්ත්වයක සිටින අධිරාජ්‍යවාදීන්ගේ කුමන්ත්‍රණ සහ ශඨප්‍රයෝගයන් මධ්‍යයේම, මෙම තත්ත්වය අනුව, තව තවත් අසල් වැසි රාජ්‍යයන් සමග වඩාත් සමීප සම්බන්ධකම් ඇති කර ගැනීම රු. ස. ඒ. සෝ. ස. ට වඩ වඩාත් අනිවාර්ය වනු ඇත. එක සිතින්ම අපට ආර්ථික සංවර්ධනය සඳහා කැප විය හැකි වන බවටද, දීර්ඝ කාලයක් තිස්සේ සන්සුන් ලෙස, අචල අධිෂ්ඨානයෙන් හා විශ්වාසයෙන් යුතුව වැඩ කිරීමට හැකි වන බවටද තිබිය හැකි සහතිකය නම්, එවැනි සම්බන්ධකම්ය.

මහා බ්‍රිතාන්‍යය සමග වෙළෙඳ ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වෙන බව මා සඳහන් කළ යුතුය. අවාසනාවකට මෙන්, අපගේ සතුටට හේතු වනවාට වඩා දීර්ඝ කාලයක් මෙම සාකච්ඡා ඇදි ඇදී පැවතුනි. නමුත් එහි වරද අප අතෙහි නොවේ. ජූලි මාසය තරම් ඉහත දී, අපගේ සෝවියට් යුද්ධ හමුදා මහා ජයග්‍රහණයන් ලබමින් සිටි කල, ගිවිසුමක කෙටුම්පතක් අප වෙත නිලවශයෙන් ඉදිරිපත් කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුව, වෙළෙඳ සම්බන්ධකම් ඇති කර ගන්නා බව ස්ථිර කොට දැන්වූයේය. අප අපගේ සම්පූර්ණ එකඟත්වය දන්වා පිළිතුරු යැවූ නමුත්, ඉන් අනතුරුව, බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ හා බ්‍රිතාන්‍ය රාජ්‍යයේ විවිධ උපනති අතර ඇතිවූ සටටන නිසා මෙය ප්‍රමාද වී තිබේ.[36] බ්‍රිතාන්‍ය ආණ්ඩුව අස්ථිරව වැනෙන ස්වභාවය අපට පෙනේ. එය අප සමග සම්බන්ධකම් සම්පූර්ණයෙන්ම අත් හැරීමටත්, වහාම පෙට්‍රොග්‍රෑඩයට යුද්ධ නෞකා එවීමටත් තර්ජනය කරයි. අපි මේ සියල්ල දැක ඇත්තෙමු. නමුත්, ඒ අතරම, මෙම තර්ජනයට පිළිතුරු වශයෙන් මහා බ්‍රිතාන්‍ය සැම තන්හිම ''සටන් මණ්ඩල''[37] පැන නැගී තිබෙන බවද අපි දැක ඇත්තෙමු. අවස්ථාවාදී උපනතියෙහි අන්ත අනුගාමිකයන් සහ ඔවුන්ගේ නායකයන්, කම්කරුවන්ගේ බලපෑම හේතු කොට ගෙන මෙම සම්පූර්ණයෙන්ම''ව්‍යවස්ථා විරෝධී'' සහ මඳ අවසරයකට පෙර තමන්ම හෙළා දුටු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සිදු වූ තත්ත්වයට පත්ව සිටින ආකාරය අපි දුටුවෙමු. බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ මෙතෙක් බල පැවති මෙන්ෂෙවික් දුර්මත එසේ තිබියදීම, වැඩ කරන ජනයා සහ ඔවුන්ගේ දේශපාලන විඥනය විසින් පාන ලද බලය අධිරාජ්‍යවාදීන්ගේ කලහකාරී ප්‍රතිපත්තියේ මුවහත මොට්ට කිරීමට තරම් ශක්තිමත් වූ බව පෙනී ගොස් තිබේ. අපි දිගටම සාම ප්‍රතිපත්තියක් අනුගමනය කෙ-

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ලෙමු. ඒ අනුව, ජූලි මාසයේදී බ්‍රිතාන්‍ය ආණ්ඩුව ඉදිරිපත් කළ යෝජනා සම්බන්ධයෙන් අපගේ ප්‍රතිෂ්‍යාවට එළඹියෙමු. අපි අප්‍රමාදවම වෙළෙඳ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම්ව සිටිමු. එය තවමත් අත්සන් කර නොමැති නම්, ඒ ගැන වග කිව යුත්තේ, වෙළෙඳ ගිවිසුම ව්‍යර්ථ කිරීමට සහ කම්කරුවන්ගේ පමණක් නොව බ්‍රිතාන්‍ය ධනපතියන්ගෙන්ද බහුතරයෙහි කැමැත්තට පටහැණි ලෙස නැවතත් සෝවියට් රුසියාවට පහර දීමට ඉඩ ලබා ගැනීමට උනන්දුවන, බ්‍රිතාන්‍ය පාලක කොටස්වල ඇති උපනති සහ ප්‍රවණතාවයන්ය. එය ඔවුන්ගේ වැඩකි.

මහා බ්‍රිතාන්‍යයේ යම් යම් බලගතු පිරිස් විසින්, එහි මූල්‍ය සහ අධිරාජ්‍යවාදී කණ්ඩායම් විසින් මෙම ප්‍රතිපත්තිය තවදුරටත් ගෙනගිය තරමට මුදල් තත්ත්වය තවදුරටත් උග්‍ර ඇත; ධනපති බ්‍රිතාන්‍යය සහ සෝවියට් සමූහාණ්ඩුව අතර දැන් අත්‍යාවශ්‍ය ලෙස ඇති කර ගත යුතුව තිබෙන මෙම අර්ධ ගිවිසුම තවත් ප්‍රමාද වනු ඇත; තවද, අධිරාජ්‍යවාදීන්ට අර්ධ ගිවිසුමක් නොව පූර්ණ ගිවිසුමක් පිළිගැනීමට සිදුවන අවස්ථාව වෙතට ඔවුන් වඩ වඩාත් සමීප වනු ඇත.

සහෝදරවරුනි, මහා බ්‍රිතාන්‍යය සමග ඇති කර ගන්නට යන මෙම වෙළෙඳ ගිවිසුම සමග සම්බන්ධ වන්නේ, අපගේ ආර්ථික ප්‍රතිපත්තියේ ඉතාමත් වැදගත්ම ප්‍රශ්න අතුරෙන් එකක් වන අනුග්‍රහ දීම පිළිබඳ ප්‍රශ්නය බව මා ඔබට කිව යුතුය. සමාලෝචනයට භාජනය කෙරෙන කාලය තුළ සෝවියට් ආණ්ඩුව විසින් සම්මත කරන ලද වැදගත් පණත් අතුරෙන් එකකි, අනුග්‍රහ පිළිබඳව මෙම වර්ෂයේ නොවැම්බර් 23 දින අනුමත වූ නීතිය. මෙම නීතියෙහි සඳහන් දේ ගැන ඔබ සියලු දෙනාම දන්නා බවට සැකයක් නැත. ඊට අතිරේක විස්තරද දැන් පළ කර තිබෙන බව ඔබ දන්නෙහිය. සෝවියට් සභාවල සම්මේලනයේ නියෝජිතවරුන් සියලු දෙනාට එම විස්තරවලින් මෙම ප්‍රශ්නය ගැන සම්පූර්ණ තොරතුරු ලබාගත හැකි ය. අපි, ආඥාව පමණක් නොව, අප යෝජනා කරන අනුග්‍රහ වල ලැයිස්තුවක්ද ඇතුළත් විශේෂ පොත් පිංචක් පළ කොට ඇත්තෙමු. අනුග්‍රහ යෝජනා කර ඇත්තේ කෘෂිකර්මාන්තය, දැව සහ ආකර කර්මාන්තය සම්බන්ධයෙනි. මෙම ආඥාවේ මුද්‍රිත පිටපත් හැකි තරම් ඉක්මණින් බටහිර යුරෝපීය රටවලට යැවීමට අපි පියවර ගෙන ඇත්තෙමු. අපගේ අනුග්‍රහ දීමේ ප්‍රතිපත්තිය ප්‍රායෝගික වශයෙන් ද සාර්ථක වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. විශේෂයෙන්ම දුර්වල සහ නොදියුණු රටක් වන සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුවට මෙම ප්‍රතිපත්තියෙන් මතු විය හැකි අන්තරායන් ගැන අපි මොහොතකට හෝ අමතක නොකරන්නෙමු. අපගේ සෝවියට් සමූහාණ්ඩුව ධනපති ලෝකයේ තනි වූ යාබද දේශය සේ පවතින තාක් කල් අපට සම්පූර්ණ ආර්ථික ස්වාධීනත්වය ලබා ගත හැකි යයිද, සියලුම අන්තරායන් අතුරුදහන් වෙතැයිද අපේක්ෂා කිරීම සම්පූර්ණයෙන්ම හාස්‍යජනක විකාරයක් සහ මනෝරාජ්‍යයක් වනු ඇත. මූලික විසංසන්දනයන් පවතින තාක් කල්, එම අන්තරායන්ද පවතින බව ඇත්තය. එයින් නිදහස් වීමට නොපුළුවන. මෙම අනතුරු අභිභවා ආරක්ෂා වී සිටිනු සඳහා අප කළ යුත්තේ ශක්තිමත් ලෙස දෙපයින් නැගී සිටීම ය. ලොකු අනතුරු සහ සුළු අනතුරු වෙන් කොට හඳුනා ගැනීමටත්, ලොකු අනතුරුවලට හසු නොවී සුළු අනතුරු පිළි ගැනීමටත් අප පොහොසත් විය යුතුය.

නිෂ්නි-නොව්ගොරොද්, ගුබෙර්නියාවේ අර්සමාස් උයෙස්ද් ප්‍රදේශයේ සෝවියට් සභාවල සාකච්ඡා සභාවකදී පක්ෂ සාමාජිකයෙක් නොවන ගොවියෙක් අනුග්‍රහ දීම සම්බන්ධයෙන් මෙසේ කී බව අපට මෑත දී දැන ගන්නට ලැබුණි: ''සහෝදරවරුනි, අපි සමස්ත රුසියා සම්මේලනයේ නියෝජිතයන් වශයෙන් ඔබලා පත් කරන අතර, ගොවි ජනයා වන අප තවත් තුන් අවුරුද්දකට කුසගින්න සහ ශීතල ඉවසමින් අපගේ යුතුකම ඉටු කිරීමට කැමති බවත්, එහෙත් ඔබ, අනුග්‍රහ දීමේ ස්වරූපයෙන් රුසියා මාතාව නොවිකිණිය යුතු බවත් ප්‍රකාශ කරමු.'' පුළුල් ලෙස පැතිරී ඇති එවැනි හැඟීම් ඉතා සිතින් පිළිගන්නෙමි. මෙයින් ඉතාමත් පැහැදිලිව පෙනෙන්නේ පාක්ෂිකයන් නොවන වැඩ කරන පොදු ජනතාව, කාර්මික කම්කරුවන් පමණක් නොව ගොවි ජනතාවද, මෙම තුන් අවුරුද්ද තුළදී දේශපාලන සහ ආර්ථික අත්දැකීම් ලබාගෙන තිබෙන බවත්, ඒ අනුව, ධනපතියන්ගෙන් මිදී ඔවුන් ලත් නිදහස අන් සියල්ලටම වඩා අගය කරන තත්ත්වයට ඔවුන් පත්ව සිටින බවත්, එනිසාම, ධනපති ක්‍රමය යළි ස්ථාපිත වීමේ ඉඩ සැලසෙන සේ පෙනෙන සෑම පියවරක්ම ගැන දෙගුණයක ප්‍රවේසමකින් සහ ඉමහත් සැකයකින් සැලකීමට අනිවාර්යයෙන්ම යොමුවන බවත් යයි සිතමි. නිසැකවම මෙවැනි සියලුම ප්‍රකාශයන් ගැන අපි උසස්තම සැලකිල්ලක් දක්වන්නෙමු. නමුත්, රුසියාව ධනපතියන්ට විකිණීම ගැන ප්‍රශ්නයක් නම් මතු විය නොහැකිය. මතු වී ඇත්තේ අනුග්‍රහ දීම පිළිබඳ ප්‍රශ්නයකි. අනුග්‍රහ දීම පිළිබඳ ඕනෑම ගිවිසුමක් නිශ්චිත කාලයකට හා නිශ්චිත කොන්දේසි අනුව සීමා කර තිබේ. හැකි සෑම දෙයක්ම ගැන සහතික කිරීමෙන් සුරක්ෂිත කර තිබේ. මෙම සහතික කිරීම් ගැන සුපරීක්ෂාකාරී ලෙස සලකා බලා ඇත. එමෙන්ම, ඔබ සමග එක්ව නැවත නැවතත් සහ මෙම සම්මේලනයේදී හා වෙනත් විවිධ සාකච්ඡා සභාවලදීත් ඒවා ගැන සලකා බලනු හා සාකච්ඡා කරනු ලැබේ. මෙම තාවකාලික ගිවිසුම් හා විකිණීම අතර කිසිම සම්බන්ධයක් නැත. රුසියාව විකිණීම පිළිබඳ අල්ප මාත්‍ර හෝ සංඥාවක්වත් ඒවා තුළ අන්තර්ගතව නැත. එහෙත් ඒවායින් නියෝජනය වන්නේ ධනපතියන්ට දෙන යම් යම් ආර්ථික පහසුකම් ය. එම පහසුකම් දෙන්නේ, අපගේ ආර්ථිකය ප්‍රකෘතිමත් කර ගැනීම සඳහා

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

නැතිවම බැරි, යන්ත්‍ර සූත්‍ර හා ඇන්ජින් හැකි තරම් ඉක්මණින් ලබා ගත හැකි වනු පිණිසය. කම්කරුවන්ගේ හා ගොවිජනතාවගේ තත්ත්වයන් වැඩි දියුණු කිරීමට කොතරම් සුළු වශයෙන් හෝ ආධාරකාරී වන ඕනෑම පියවරක් ගැන නොසලකා හැරීමේ අයිතියක් අපට නැත.

වෙළෙඳ සම්බන්ධකම් සීඝ්‍ර ලෙස නැවත ස්ථාපිත කිරීම සඳහා. අපට හැකි සියල්ලක්ම කළ යුතුය. දැනටමත් ඒ සඳහා අර්ධ නීතිමය රාමු කට්ටුවක් තුළ සාකච්ඡා පවත්වා ගෙන යනු ලැබේ. අපි ඇන්ජින් සහ යන්ත්‍ර ඇණවුම් කරන්නෙමු. ඒවා ඇණවුම් කරන සංඛ්‍යාවන් කිසිසේත් ප්‍රමාණවත් නොවුවත්, ඇණවුම් කිරීම ආරම්භ කර තිබේ. අපි නිල වශයෙන් මෙම සාකච්ඡාවන් කරගෙන යන කල ඒවායින් සාර්ථක ප්‍රතිඵල ලැබීමේ ඉඩ කඩ බෙහෙවින් ව්‍යාප්ත වනු ඇත. කර්මාන්තයේ ආධාරය ඇතිව අපි උසස් ප්‍රතිඵල ලබා ගන්නෙමු. එසේම වඩාත් කෙටි කලකදී එම ප්‍රතිඵල ලබන්නෙමු. නමුත් ලබන ප්‍රතිඵල ඉතා විශිෂ්ය වුවත්, ඒ සඳහා අවුරුදු ගණනින් කාලය, අවුරුදු ගණනාවක් අවශ්‍ය වනු ඇත. අප දැන් යුද්ධමය ජයග්‍රහණයක් අත්පත් කරගෙන සහ සාමය දිනාගෙන සිටියත්, යුද්ධ මාලාවක් නොමැතිව කිසිම විශාල ප්‍රශ්නයක් කිසි කලෙකත් විසඳී නැති බව සහ කිසිම විප්ලවයක් සාර්ථක වී නොමැති බව ඉතිහාසයෙන් ලැබෙන පාඩමකැයි යනු අපි සිත්හි තබා ගත යුත්තෙමු. අපි මෙම පාඩම අමතක නොකරන්නෙමු. අපට විරුද්ධව යුද්ධ නොකරන ලෙසට අපි බලවත් රටවල් ගණනාවකටම දැනටමත් පාඩමක් උගන්වා ඇත්තෙමු. නමුත් ඒ කොතෙක් කලකටද යනු අපට සහතික වශයෙන් කිව නොහැකිය. අධිරාජ්‍යවාදී කොල්ලකරුවන්ට යම්තමින් හෝ ඉඩ සැලසෙන සේ තත්ත්වය වෙනස් වුවහොත් ඔවුන් නැවතත් අපට පහර දෙනු ඇත. අපි එයට සූදානම්ව සිටිය යුත්තෙමු. එනිසා අප ප්‍රථමයෙන්ම කළ යුත්තේ ආර්ථිකය ප්‍රකෘතිමත් කර එය දෙපයින් ශක්තිමත් ලෙස නැගී සිටින තත්ත්වයට ගෙන ඒමය. ධනපති රටවලින් ලබා ගන්නා උපකරණ නැතිව, යන්ත්‍ර සූත්‍ර නැතිව අපට මෙය සීඝ්‍රයෙන් කළහැකි නොවේ. එනිසා අපට මෙම ප්‍රකෘතිමත් කිරීම සාර්ථක කර ගත හැකි නම් ධනපතියන්ට ලැබෙන මෙම සුළු අතිරේක ලාභය ගැන අසතුටු නොවිය යුත්තෙමු. කැප කිරීමට සහ දුක් කරදරවලට මුහුණ දීමට තමන් සූදානම් බව ප්‍රකාශ කළ ඒ පාක්ෂික නොවන ගොවීන්ගේ හැඟීමට කම්කරු හා ගොවි ජනතාවගේ දයකත්වය ලැබිය යුතුය. ධනපති ප්‍රහාරයක අන්තරාය ගැන සැලකිල්ලට ගන්නා ඔවුහු, අනුග්‍රහ දීම ගැන කල්පනා කිරීමේදී හැඟීම්වලට යට නොවෙති. ඔවුන් එය ගැන සිතන්නේ යුද්ධය තවදුරටත් ඉදිරියට ගෙන යාමක් වශයෙනි; එම නිර්දය අරගලය වෙනත් භූමියකට මාරු කිරීමක් වශයෙනි. අනුග්‍රහ දීම තුළින් ඔවුන් දකින්නේ, පැරණි ධනපති ක්‍රමය යළි ස්ථාපිත කිරීම පිණිස ධනපතියන් දරන නව ප්‍රයත්නයන්ට ඉඩ

ලැබෙන බවය. එවැනි අදහස් අගනේය. එයින් පෙනෙන්නේ සෝවියට් බල ආයතන පමණක් නොව, කම්කරුවන් හා ගොවි ජනයා සියලු දෙනාමද අපගේ අවශ්‍යතාවයන් ගැන රැකුම් බැලුම් කිරීම ස්වකීය කාර්යය කොට ගෙන තිබෙන බවය. එනිසා, අනුග්‍රහ දෙන ගිවිසුම් ඇති කර ගත්තත්, ධනපතියන්ගේ බලය යළි ස්ථාපිත වීමට කිසිම ඉඩක් නොලැබෙන සේ අපගේ අවශ්‍යතාවයන් ආරක්ෂා වන පදනමක් මත එම ගිවිසුම් ක්‍රියාත්මක කළ හැකි බව අපට දැඩිලෙස විශ්වාසය. අනතුර අවමය දක්වා අඩු කිරීමට සහ එය යුද්ධයේ අනතුරට වඩා අඩු කිරීමට අපට හැකි සියල්ලක්ම කරන්නෙමු. එවිට යුද්ධය නැවත ආරම්භ කිරීම දුෂ්කර වනු ඇත; වඩාත් කෙටි කාලයකදී, අඩු අවුරුදු ගණනකදී (එය අවුරුදු ගණනාවක වැඩක් වනු ඇත) අපගේ ආර්ථිකය ප්‍රකෘතිමත් සහ සංවර්ධනය කර ගැනීම වඩාත් පහසු වනු ඇත.

සහෝදරවරුනි, ආර්ථික කර්තව්‍යයන්, නැතහොත්, ආර්ථික පෙරමුණ ප්‍රධාන හා මූලික සාධකයේ ස්වරූපයෙන් නැවත නැවතත් අප ඉදිරියේ මතු වෙයි. ඔබට වාර්තා කරනු පිණිස විවිධ නීතිවල වැනි අධ්‍යයනය කිරීමේදී මා දුටු පරිදි මහජන කොමිසාර් මණ්ඩලයේ සහ ආරක්ෂක මණ්ඩලයේ[38] පියවරයන් සහ තීරණ අතුරෙන් අති බහුතරය දැන් සමන්විත වන්නේ ආර්ථික ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ නිශ්චිත, විස්තරාත්මක සහ බොහෝවිට ඉතා කුඩා පියවරයන්ගෙනි. මා මෙම පියවරයන් ඇතුළත් ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු යයි ඔබ අපේක්ෂා නොකරන බව දනිමි. එය ඉතාමත් වෙහෙසකාරී හා සම්පූර්ණයෙන්ම නීරස කටයුත්තකි. මා අදහස් කරන්නේ, අප ශ්‍රම පෙරමුණෙහි වැදගත්කම මුල් තැන ලා සලකන ප්‍රථම අවස්ථාව මෙය නොවන බව පෙන්වීමට පමණකි. සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව 1918 අප්‍රේල් 29 දින සම්මත කළ යෝජනාව ගැන මතක් කරමු. එය, අප මත බලෙන් පටවන ලද බ්‍රෙස්ත්-ලිතොව්ස්ක් සාම ගිවිසුම මගින් රුසියව ආර්ථික වශයෙන් කැබලිවලට බිඳින ලද කාලය විය. එය මෙම අන්ත කෲර ගිවිසුම විසින් අප ඉතාමත් දුෂ්කර තත්ත්වයකට පත් කරන ලද කාලය විය. යළිත් සාමකාමී ලෙස ආර්ථික කටයුතු කරගෙන යාමට අවශ්‍ය කොන්දේසි උදා කරන ඉස්පාසු කාලයක් ලැබීමට ඉඩ තිබෙන බවක් එකල පෙනී ගියේය. මෙම ඉස්පාසු කාලය ඉතා කෙටි එකක් වූ බැව් අපි දනිමු. එසේ වී නමුත්, සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව එහි අප්‍රේල් 29 යෝජනාවෙන් එක් වරම ආර්ථික සංවර්ධනය වෙත මුළු අවධානයම යොමු කළේය. මෙම යෝජනාව අවලංගු කර නොමැති අතර අපගේ නීතියක් සේ තවමත් වලංගුව පවතී. අදාළ කර්තව්‍යය වෙත අප ළඟා වූයේ කෙසේද යනුත්, අපගේ වැඩ කටයුතුවල අවශ්‍යතාවයන් සලකා සහ ඒවා සම්පූර්ණයෙන් සාර්ථක කර ගනු සඳහා වැඩි අවධානයක් යොමු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කළ යුත්තේ කුමකටද යනුත්, නියම අභිමතාර්ථයන් සලකුණු කරන මෙම යෝජනාව අනුව අපට නිශ්චය කරගත හැකි වේ.

අපට දැන් විසඳීමට සිදුවී ඇති ප්‍රශ්න රැසක් 1918 අප්‍රේල් මාසය තරම් ඉහත කාලයක දී ඉතා පැහැදිලි ,ස්ථිර සහ ප්‍රමාණවත් තරම් තීරණාත්මක ආකාරයකින් ඉදිරිපත් කරන ලද බව මෙම යෝජනාව පරීක්ෂා කළ විට පෙනේ. මෙය සිහියේ තබා ගනිමින් පුනරුක්තිය උගැන්මේ මාතාව වෙතැයි කියන්නෙමු. ආර්ථික සංවර්ධනයේ මූලික ප්‍රත්‍යක්ෂයන් පුනරුච්චාරණය කිරීමට සිදුවීම ගැන අපි කම්පා නොවෙමු. අපි නැවත නැවතත් ඒවා පුනරුච්චාරණය කරමු. නමුත්, 1918 දී කළ වියුක්ත ප්‍රතිපත්ති ප්‍රකාශනයත්, දැනටමත් අරඹා තිබෙන ප්‍රායෝගික ආර්ථික කටයුතුත් අතර තිබෙන වෙනස බලන්න. අපගේ කටයුතුවලට හරස්වන මහා දුෂ්කරතාවයන් සහ නිරන්තර බාධක ඇතත්, අපි අපගේ ආර්ථික ප්‍රශ්න යථාර්ථ සහ ප්‍රායෝගික ආකාරයෙන් විසඳීම දක්වා තව තවත් සමීප වෙමින් සිටිමු. අපි නැවත නැවතත් කරුණු පුනරුච්චාරණය කරන්නෙමු. නිර්මාණශීලී කටයුතු කිරීමේදී අනේක වාර පුනරුක්තිය, නැතහොත්, ඔබ කළ දේ හරිද බැලීමට වරින් වර ආපසු හැරී බැලීමත්, යම් යම් වැරදි නිවැරදි කිරීමත්, නව ක්‍රම පිළිගැනීමත්, නොදියුණු හා නොපුහුණු අයට අවබෝධය ලබා දීමට සෑම ධෛර්යයක්ම ගැනීමත්, මග හැර යාමේ පුළුවන්කමක් ඔබට නැත.

අප දැන් ගත කරමින් සිටින්නේ ඉතාමත් තීරණාත්මක කාල පරිච්ඡේදයකි. එය යුද්ධයේ සිට ආර්ථික සංවර්ධනය කරා යොමු වූ දඟර පරිවර්තනයකි. වර්තමාන දේශපාලන තත්ත්වයේ වැදගත් අංගලක්ෂණය එයයි. මෙය ඉහතදීද සිදු වූ නමුත්, ඒ මෙතරම් පුළුල් පරිමාණයකින් නොවීය. මේ අනුව, සෝවියට් ආණ්ඩුවේ පොදු දේශපාලන කර්තව්‍යයන් මොනවාද යන්න සහ මෙම පරිවර්තනයේ විශේෂ අංගලක්ෂණ මොනවාද යන්න අපගේ මතකයට නිතර ආ යුතුය. නිර්ධන පංති ආඥාදායකත්වය සාර්ථක වූයේ බලකිරීමත් සමග ඒත්තු ගැන්වීමද ඒකාබද්ධ ලෙස ක්‍රියාත්මක කිරීමට එය සමත් වූ හෙයිනි. ඕනෑම බල කිරීමක් යොදා ගැනීමට, රජයෙන් ක්‍රියාත්මක කෙරෙන ඉතාමත් තදබල, තීරණාත්මක සහ නිර්දය ආකාරයේ බල කිරීම යොදා ගැනීමට නිර්ධන පංති ආඥාදායකත්වය බිය වන්නේ නැත. දියුණු පංතිය, ධනපති ක්‍රමය විසින් වැඩියෙන් පීඩිත පංතිය බල කිරීම ක්‍රියාත්මක කරන්නේ වැඩ කරන සහ සූරාකනු ලබන ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට වන හෙයින් ද, බල කිරීමේ හා ඒත්තු ගැන්වීමේ මාධ්‍යයන් එය සතුව තිබෙන හෙයින්ද, එසේ කිරීමේ අයිතිය එයට ඇත. අපට වඩා ප්‍රචාරය කිරීමේ සහ උද්ඝෝෂණය කිරීමේ පහසුකම් ඉහත පංතිවලට තිබුණු නමුත් ඒවාට කිසි කලෙකත් නො තිබුණු තරම් බල කිරීමේ සහ ඒත්තු ගැන්වීමේ මාර්ග නිර්ධන පංති ආඥාදායකත්වයට ඇත.

මෙම තුන් අවුරුද්දේ දී (යම් යම් මූලික කරුණු සම්බන්ධයෙන් එක් අවුරුද්දක ප්‍රතිඵල සම්පිණ්ඩනය කිරීම අපහසුය) අප ලත් අත්දැකීම්වල ප්‍රතිඵල මොනවාද යනු අපි අපගෙන්ම අසා ගන්නෙමු නම්, සැබැවින්ම අපට වඩා බොහෝ බලවත් සතුරෙක් අභිභවා ජය ගැනීමට අපට හැකි වූයේ කෙසේද යනු අපි අපගෙන්ම අසා ගන්නෙමු නම්, එය පැහැදිලි වන්නේ, සූරාකන්නන්ට විරුද්ධව කම්කරුවන් සහ වැඩ කරන ගොවි ජනතාව අතර වූ සන්ධානය සහිත නිර්ධන පංති නායකත්වයේ සසංගත සහ දැඩිභාවය රතු හමුද සංවිධානය තුළ විශිෂ්ට ලෙස අන්තර්ගත වී තිබීමෙනැයි කිව යුතුය. එසේ වීමට හේතුව කුමක්ද? අති විශාල ගොවි ජනකාය කැමැත්තෙන්ම මෙයට එකඟ වූයේ මන්ද? ඔවුන් අතුරෙන් අති බහුතරය පක්ෂ සාමාජිකයන් නොවූ නමුත්, ඔවුන් එයට එකඟ වූයේ, සෝවියට් ආණ්ඩුවට ආධාර කිරීම හැර වෙනත් ගැළවීමේ මඟක් නොමැති බව ඔවුන්ට අවබෝධ වී තිබුණ හෙයිනි. ඔවුන්ට මෙම අවබෝධය ගෙන දුන්නේ පොත් හෝ ප්‍රචාරය හෝ නොවේ. ඔවුන්ට එම අවබෝධය ලැබුණේ සිවිල් යුද්ධයේ අත්දැකීමෙනි; විශේෂයෙන්ම, කුඩා පරිමාණ ගොවිජන ආර්ථිකයේ සමහර මූලික අංගලක්ෂණවලට සමානත්වයක් ඇති මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් අතර වූ සන්ධානයෙනි.ඉඩම් හිමියන් සහ ධනපතියන් සමග වන, සුළු දේපළ හිමියන්ගේ මෙම පක්ෂවල සන්ධානයෙන් ඔවුන් ලැබූ අත්දැකීමද, කොල්චාක් සහ දෙනිකින් පාලනයෙන් ලත් අත්දැකීමද අනුව, මැද මාවතක් ගත නොහැකි බවත්, එකම නිවැරදි මාවත පැහැදිලි සහ ඍජු සෝවියට් ප්‍රතිපත්තිය බවත්, සූරාකෑමෙන් සහ හිංසනයෙන් මිදීමට ඔවුන්ට ඇති එකම මාර්ගය නිර්ධන පංතියේ අයෝමය නායකත්වය බවත් ගොවි පොදු ජනතාවට අවබෝධ විය. මෙම දැඩි සහ ඒකාන්ත අවබෝධය පදනම් කොටගත් අපගේ බල කිරීමේ ප්‍රතිපත්තිය එතරම් විශිෂ්ට ලෙස සාර්ථක වූයේ, ගොවි ජනතාවට මෙම අවබෝධය දීමට අපට හැකි වූ හෙයිනි.

සුදු හමුදවලට විරුද්ධව සටන් කිරීමේදී අප මුහුණ දුන්නාවූද, වෙනත් කිසිම රාජ්‍යයක, කිසිම යුද්ධයකදී කිසි කලෙකත් නොදක්නා ලද විරු සහ ඇති විය නොහැකි විරු මට්ටමක කම්කරු සහ ගොවි ජනතා උද්යෝගයක් සහ ශක්ති සංකේන්ද්‍රණයක් උද්ගත කළා වූද, එම ප්‍රශ්නවලටම, ඊට වඩා පුළුල් පරිමාණයකින් අප මුහුණ පාමින් සිටින බව, දැන් ශ්‍රම පෙරමුණ කරා යාමේදී අප මතක තබා ගත යුත්තෙමු. සූරාකන්නන් නිර්දය සතුරන් වන අතර ඔවුන් සුන් කිරීමට නිර්දය රාජ්‍ය බලයක් අවශ්‍යය යන නිගමනය වෙත, මා ඉහත උපුටා දක්වූ වචන ප්‍රකාශ කළ අර්සමාස් ගොවියා වැනි පාක්ෂික නොවන ගොවි ජනයා එළඹියේ ඔවුන්ම නිරීක්ෂණය කළ කරුණු සහ ජීවිතය පිළිබඳ ඔවුන්ගේම දැනුම අනුවය. යුද්ධය කෙරෙහි බුද්ධිමත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආකල්පයක් දක්වමින් එයට ක්‍රියාශීලී ලෙස ආධාර කරන සේ පෙර නොවූ විරූ තරම් ජනතාවන් සංඛ්‍යාවක් කුල්මත් කිරීමෙහි අපි පොහොසත් වීමු. සෝවියට් බලය යටතේ අපගේ පක්ෂය සහ පාක්ෂික නොවන කම්කරුවන් හා පාක්ෂික නොවන ගොවි ජනයා (පොදු ගොවි ජනකාය පාක්ෂිකයන් නොවෙති) ඒකමතික ලෙස පන්නුම් කළ සහයෝගයෙන් සහ අනුකූලතාවයෙන් දහයෙන් පංගුවක්වත් වෙනත් කිසිම දේශපාලන රාජ්‍යයක් යටතේ පෙර කිසි කලෙකත් යුද්ධයකට ලැබුණේ නොවේ. අවසානයේදී අපට බලවත් සතුරෙක් පරාජය කිරීමට හැකි වූ ප්‍රධාන හේතුව එයයි. මෙය මාක්ස්වාදයේ ඉතාමත් ගැඹුරු සහ ඉතාමත් සරල සහ සුබෝධ මූලධර්මයක් සනාථ කරන්නක් විය. ඓතිහාසික සිද්ධීන්ගේ පරිමාණය හා විස්තීර්ණභාවය වැඩි වූ තරමට, ඒවාට සහභාගි වන ජනතාවන්ගේ සංඛ්‍යාව විශාල වෙයි. අනිත් අතට, අප ඇති කිරීමට බලාපෙරොත්තු වන වෙනස මහත් වූ තරමට, දශලක්ෂ ගණන් හා කෝටි ගණන් ජනතාව තුළ ඒ කෙරෙහි බුද්ධිමත් ආකල්පයක් හා උනන්දුවක් වැඩි වැඩියෙන් ජනිත කිරීම අප විසින් කළ යුතු වන්නේය. අන් සියලුම විප්ලවයන් අභිභවා යාමට අපගේ විප්ලවයට හැකි වූයේ, ඉහත දී රාජ්‍ය සංවර්ධනය ගැන උනන්දුවක් නොදැක්වූ කෝටි ගණන් ජනතාව රාජ්‍ය ගොඩ නැගීමේ කටයුතුවලට ක්‍රියාශීලී ලෙස සහභාගි වන සේ සෝවියට් ආණ්ඩු ආකෘතිය මගින් ඔවුන් කුල්මත් කිරීමෙහි එය සමත් වූ හෙයින් බව අවසාන විග්‍රහයේදී පෙනේ. අපට මුහුණ පාන්නට සිදුවී තිබෙන සහ මෙම කාලය තුළ දී සෝවියට් ආණ්ඩුව අනුමත කළ දුසිම් ගණන් සහ සිය ගණන් තීරණවලින් ප්‍රකාශ වන නව කර්තව්‍යයන් ගැන දැන් මේ අංශයෙන් සලකා බලමු. ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලය කළ වැඩවලින් (ඒ ගැන පසුව සඳහන් කරමු) දහයෙන් නවයක්ම සහ සමහර විට මහජන කොමිසාර් මණ්ඩලයේ වැඩවලින් අඩකට වැඩියෙන් අදාළ වූයේ මෙම කර්තව්‍යයන්ටය—එනම් ආර්ථික කර්තව්‍යයන්, තනි ආර්ථික සැලැස්මක් සකස් කිරීම, රුසියාවේ ආර්ථිකය එහි අත්තිවාරමෙන්ම ප්‍රතිසංවිධානය කිරීම, කුඩා පරිමාණ ගොවි ජන ආර්ථිකයේ අත්තිවාරමම වෙනස් කිරීම යන කර්තව්‍යයන්ටය. මෙම කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වෘත්තීය සමිතිවල සාමාජිකයින් සියලු දෙනාම, කිසිම විශේෂයක් නොමැතිව, එකතු කර ගැනීම අවශ්‍ය වන්නේය. ධනපති ක්‍රමය යටතේ මෙම කාර්යය ඔවුන්ගේ පිටස්තර දෙයක් විය. යුද්ධ කාලයේදී සීඝ්‍රයෙන් හා අනුමානයෙන් තොරව ජයග්‍රහණයන් ලැබීමට හේතු වූ කොන්දේසිය, එනම්, පොදු ජනතාව වැඩට අනුකර්ෂණය වීමේ කොන්දේසිය වර්තමානයේදී අපට දක්නට තිබේද යන ප්‍රශ්නය ඔබෙන්ම අසන්න. අපගේ අළුත් විධික්‍රම සහ අපගේ ආර්ථික සංවර්ධනයේ මහා කර්තව්‍යයන් අවශ්‍ය බව වෘත්තීය සමිති සාමාජිකයින්ට සහ පාක්ෂික නොවන ජනයා බහුතරයට

අවබෝධ වී තිබේ ද? යුද්ධය සඳහා සියල්ල කැප කිරීමේත්, යුද්ධ පෙරමුණේ ජයග්‍රහණය වෙනුවෙන් සියල්ලක්ම පරිත්‍යාග කිරීමේත් අවශ්‍යතාවය ගැන ඔවුන් අවබෝධ කරගෙන සිටි සේම, මෙයත් ඔවුන්ට අවබෝධ වී තිබේද? ප්‍රශ්නය ඒ ආකාරයෙන් ඇසුවහොත්, ඇත්තෙන්ම නැත යනුවෙන් පිළිතුරු දීමට ඔබට සිදුවනු ඇත. ඔවුන්ට මේ පිළිබඳව තිබිය යුතු අවබෝධයේ අසලකට වත් ඔවුන් පැමිණ නැත.

යුද්ධය වූකලී ජනතාව අවුරුදු දහස් ගණන් තිස්සේ දැන සිටි සහ පුරුදුව සිටි දෙයකි. ඉඩම් හිමියන් ඉහතදී කළ මෘග හිංසන ක්‍රියාවන් කොතරම් පැහැදිලිව පෙනෙන්නට තිබුණේද යත්, ජනතාවට කරුණු අවබෝධ කිරීම පහසු විය. අප යුද්ධය කළේ වැඩ කරන ජනතාවගේ යහපත පිණිස බව, කර්මාන්තයට අඩුවෙන්ම සම්බන්ධ වඩාත් සාරවත් ධාන්‍ය නිෂ්පාදන ප්‍රදේශවල ගොවි ජනතාවට වුව අවබෝධ කිරීම අපහසු නොවීය. එනිසා සියලු දෙනාගේම පාහේ උද්යෝගය කුළුගැන්වීමට හැකි විය. දැන් ගොවි ජන සමූහයාට සහ වෘත්තීය සමිති සාමාජිකයින්ට මෙම කර්තව්‍යයන් වටහා දීම, අපට පැරණි විධියට දිගටම ජීවත් විය නොහැකි බවත්, ධනපති යූරාකෑම අවුරුදු දශක ගණන් තිස්සේ කොතරම් තදින් සවි වී තිබුණත් එය පිටුදැකිය යුතු බවත් වටහා දීම වඩාත් අසීරු වනු ඇත. රුසියාව අපට අයත් බවත්, පැරණි පැවැත්මේ ආර්ථික කොන්දේසි යළි හැඩ ගස්වමින් මහා ආර්ථික සැලැස්මක් ක්‍රියාත්මක කළ හැකි වන්නේ කම්කරු හා ගොවි පොදු ජනතාව වන අපට අපගේ කටයුතු සහ දැඩි ශ්‍රම විනය මගින් පමණක් බවත් සියලු දෙනාටම වටහා දීම අපගේ යුතුකමය. මෙයින් බාහිර ගැළවීමක් නැත. අපි ධනපති බලවතුන්ට පසු බා සිටිමු. තවදුරටත් ඔවුන්ට පසු බා සිටීමට අපට සිදු වනු ඇත. අපගේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමෙහි අපි සමත් නොවන්නෙමු නම්, අපට පරාජය අත් වනු ඇත. මා ඔබට දැන් මතක් කළ පැරණි සත්‍යයන් පුනරුච්චාරණය කළ යුත්තේ එහෙයිනි. සංවිධාන ප්‍රශ්නවල හා ශ්‍රම විනයෙහි වැදගත්කම ගැන, වෘත්තීය සමිතිවල දැවැන්ත කාර්ය කොටස ගැන නැවත සඳහන් කළ යුත්තේ එහෙයිනි. පුළුල් ජනතාව එක්සත් කරන වෙනත් සංවිධානයක් නොමැති නිසා වෘත්තීය සමිතිවලට මෙම ක්ෂේත්‍රයේදී පැවරෙන කාර්ය කොටස අති දැවැන්තය. එනිසා අපි පැරණි සත්‍යයන් නැවත සඳහන් කිරීමෙන් නොනැවතී යුද්ධමය කර්තව්‍යවල සිට ආර්ථික කර්තව්‍යවලට පරිවර්තනය වීම ඇරඹී තිබෙන බව අපගේ ජීව ශක්තියේ සෑම අංශුවකින්ම වටහා ගත යුත්තෙමු.

යුද්ධමය ක්ෂේත්‍රයේදී අපි සම්පූර්ණයෙන්ම ජය ගත්තෙමු. දැන්, ඊට වඩා දුෂ්කර සහ කම්කරු හා ගොවි ජනතා අති බහුතරයෙන් උද්යෝගය සහ ආත්ම පරිත්‍යාගය අපේක්ෂා කරන කර්තව්‍යයන්හිදී එවැනිම ජයග්‍රහණයන් ලැබීම සඳහා කටයුතු සූදානම් කළ යුත්තෙමු. පරම්පරාවෙන් පරම-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පරාවට වහල් සහ පීඩිත තත්ත්වයක සිටිමින් දිවි පෙවෙත ගෙව්වා වූ ද, තමන්ගේ සෑම ක්‍රියාරම්භකතාවයක්ම මැඩලනු ලැබූවා වූද දශ කෝටි සංඛ්‍යාත ජනතාවන්ට නව කර්තව්‍යයන්ගේ ආවශ්‍යකත්වය පිළිබඳ දැඩි අවබෝධයක් ගෙන දිය යුතුය. වෘත්තීය සමිතිවලට අයත්, එහෙත්, දේශපාලන විඥනය නොමැති හා තමන් ස්වාමිවරුන් සේ සැලකීමට පුරුදු වී නැති දශ ලක්ෂ ගණන් කම්කරුවන්ට අපි අවබෝධය ලබා දිය යුත්තෙමු. ඔවුන් සංවිධාන කළ යුතුය. ආණ්ඩුවට ප්‍රතිරෝධය දැක්වීමට නොව, ඔවුන්ගේ ආණ්ඩුවට ආධාර කිරීමට සහ එහි පියවරයන් සංවර්ධනය කර සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස ඔවුන් සංවිධානය කළ යුතුය. මෙම පරිවර්තනය ඉදිරියට යනු ඇත්තේ දුෂ්කරතාවයන් මධ්‍යයේය. හුදෙක් අදහසක් ඉදිරිපත් කිරීමක් ලෙසින් සලකන කල, එය නව කර්තව්‍යයක් නොවේ. එහෙත්, ප්‍රථම වතාවට ප්‍රශ්නය මෙතරම් මහා පරිමාණ මට්ටමකට එසවීම අනුව බලන කල එය නව කර්තව්‍යයකි. ආර්ථික පෙරමුණේ යුද්ධය වඩාත් දුෂ්කර සහ දීර්ඝ වනු ඇති බව අපි වටහා ගත යුත්තෙමු. මතක තබා ගත යුත්තෙමු. මෙම පෙරමුණෙහිදී ජයග්‍රහණය ලැබීම පිණිස කම්කරුවන් සහ ගොවි ජනයා සිටිනවාට වඩා විශාල සංඛ්‍යාවක් ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තබන සේද, ක්‍රියාශීලී වන සේද, කැපවීමෙන් කටයුතු කරන සේද ඔවුන්ට අධ්‍යාපනය දිය යුතු වේ. ආර්ථික සංවර්ධනයේදී අප ලබා තිබෙන අත්දැකීම්වලින් ඔප්පු වී තිබෙන පරිදි මෙය කළ හැකිය. එයට හේතුව, අභාග්‍යයෙන්, ශීතලෙන්, සාගින්නෙන් සහ නැති බැරි කමින් පීඩා විඳින්නට සිදුවන්නේ අපට සෑහෙන තරම් නිශ්පාදනීය බලවේගයන් නොමැති නිසා බව පොදු ජනතාවට සම්පූර්ණයෙන්ම වැටහී තිබීමය. දැන් අපගේ උද්ඝෝෂණ සහ ප්‍රචාරක කටයුතු සියල්ලම දේශපාලන හා යුද්ධමය උවමනාවන් කෙරෙන් ආර්ථික සංවර්ධනයට මාරු කිරීමට අපි අවධානය යොමු කළ යුත්තෙමු. අපි බොහෝ වරක් මෙය ප්‍රකාශ කර ඇත්තෙමු. නමුත් එය ප්‍රමාණවත් නොවේ. මා කල්පනා කරන ලෙසට පසු ගිය අවුරුද්ද තුළ සෝවියට් ආණ්ඩුව ගත් ඉතාමත් වැදගත් පියවරයන් වන්නේ, සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයේ නිෂ්පාදන ප්‍රචාරය සඳහා මධ්‍යම බියුරෝව පිහිටුවීම එහි වැඩ දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන කාරක සභාවේ වැඩ සමග ඒකාබද්ධ කිරීම සහ නිෂ්පාදන ප්‍රචාරය පමණක් නොව දේශ ව්‍යාප්ත පරිමාණයෙන් නිෂ්පාදනය සංවිධානය කිරීමද වෙත අවධානය යොමු කරනු පිණිස, ඒ ඒ වෘත්තීය සමිති සඳහා අතිරේක පුවත්පත් පළ කිරීමය.

දේශ ව්‍යාප්ත ලෙස නිෂ්පාදන ප්‍රචාරය සංවිධානය කිරීමේ අවශ්‍යතාවය පැන නගින්නේ දේශපාලන තත්ත්වයේ සියලු විශේෂ අංගලක්ෂණවලිනි. එය කම්කරු පංතියටත්, වෘත්තීය සමිතිවලටත්, ගොවි ජනතාවටත්

එකසේම අවශ්‍ය වන්නකි. අපගේ රාජ්‍ය යන්ත්‍රයට එය ඒකාන්ත වශයෙන්ම අත්‍යාවශ්‍ය ය. නමුත් අප මෙම කටයුත්ත සඳහා එම යන්ත්‍රය උපයෝගී කර ගෙන තිබෙන තරම කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. කර්මාන්තවල කටයුතු අන්දම ගැන සහ පොදු ජනතාවගේ උනන්දුව ඇති කරන ආකාරය ගැන අප ව්‍යවහාරයෙන් ක්‍රියාත්මක කරනවාට වඩා දහස් වරක් දැනුම, පොතේ දැනුම, අපට ඇත. සෑම වෘත්තීය සමිති සාමාජිකයෙක්ම නිෂ්පාදනය ගැන උනන්දුමත් වනු දැකීමට සහ සෝවියට් රුසියාව ජය ලබන තත්ත්වයට පත් වන්නේ නිෂ්පාදනය වැඩි කළහොත් හා නිෂ්පාදකත්වය වැඩි කළහොත් පමණකැයි මතක තබා ගනු දැකීමට අපි වග බලා ගත යුත්තෙමු. සෝවියට් රුසියාව දැන් අත්දකින සාගින්න, ශීතල සහ දුක් කරදර සහිත භයානක තත්ත්වයන්ගෙන් පිරි කාලය දස අවුරුද්දකින් පමණ කෙටි කිරීමට ඇයට හැකි වන්නේ මේ ආකාරයෙන් පමණකි. අපි මෙම කර්තව්‍යය වටහා නොගන්නෙමු නම්, අප සියලු දෙනාම විනාශ වීමට ඉඩ තිබේ. මා එසේ කියන්නේ, අපට දිගටම යුද්ධ කිරීමේ හැකියාව නොමැතිව තිබිය දී, කෙටි විරාමයකින් පසුව ධනපතියන් ඕනෑම මොහොතක යුද්ධය අළුත් කිරීමට ඉඩ තිබෙන හෙයින් හා අපගේ යන්ත්‍රයෙහි දුර්වලතාවයන් නිසා එවිට අපට පසු බැසීමට සිදුවන හෙයිනි, එසේ වුවහොත් අපගේ දශ ලක්ෂ ගණන් ජනතාවන්ගේ බලය යුද්ධයේදී පෙන්වීමට නොහැකි වීමෙන් මෙම අවසාන යුද්ධයේදී අප සුන් වී යනු ඇත. පවතින තත්ත්වයේ ස්වභාවය එයයි.මේ දක්වාම සියලුම විප්ලවවල, මහා විප්ලවවල ඉරණම තීරණය වූයේ දීර්ඝ යුද්ධ මාලාවක් මගිනි. අපගේ විප්ලවයද එවැනි මහා විප්ලවය කි. අපි එක යුද්ධ කාලසීමාවක් පසු කෙළෙමු. දැන් අපි තවත් යුද්ධ කාලයකට සූදනම් විය යුත්තෙමු.එම යුද්ධය කවද සිදු වන්නේදැයි අපි නොදනිමු.නමුත් එය සිදු වන විටෙක සියලුම තත්ත්වයන්ට මුහුණ දීමට අප සූදනම්ව සිටින බවට අපි වග බලා ගත යුත්තෙමු. අප බලකිරීමේ පියවරයන් අත් නොහැරිය යුත්තේ එනිසාය. අප ඒවා අත් නොහැරිය යුත්තේ, ගොවි ජනතාව සහ පාක්ෂික නොවන කම්කරුවන් දැනටමත් තේරුම් ගෙන තිබෙන නිර්ධන පංති ආඥදායකත්වය රැක ගත යුතු නිසාම නොවේ. ඔවුහු සියලු දෙනාම අපගේ ආඥදායකත්වය ගැන දනිති. ඔවුන්ට එයින් අන්තරායක් නොවන බව ඔවුහු දනිති. ඔවුන් එයට බිය වන්නේ නැත. ඔවුහු එය බල පවුරක් සහ බලකොටුවක් සේ සලකති. ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට විරුද්ධව ප්‍රතිරෝධය දැක්වීමේ දී ඔවුන්ට එහි ආධාරය ලබා ගත හැකි බවත්, එය නොමැතිව ජයග්‍රහණය ලැබිය නොහැකි බවත් ඔවුහු දනිති.

යුද්ධමය සහ දේශපාලන කර්තව්‍යයන් හා සම්බන්ධයෙන් ගොවි පොදු ජනතාව අතර දැනටමත් ගැඹුරට මුල් බැස ගෙන තිබෙන මෙම වැටහීම, මෙම අවබෝධය, දැන් ආර්ථික ප්‍රශ්න දක්වා ව්‍යාප්ත කළ යුතු වේ. සමහර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විට එක වරම මෙම පරිවර්තනය ඇති කිරීමට නුපුළුවන් වන්නට ඉඩ තිබේ. යම් යම් වැනෙනසුලු ස්වභාවයන්ගෙන් සහ පැරණි ඔතැනි ගති හා සුළු ධනපති දෘෂ්ටිය වෙත ආපසු යාමේ අවස්ථාවලින් තොරව අපට එය කළ නොහැකි වන්නට ඉඩ තිබේ. අපි තව තවත් වැඩි ධෛර්යයකින් යුතුව සහ තව තවත් ආසන්න ලෙසින් මෙම කර්තව්‍යය ඉටු කිරීමට ව්‍යාවෘත විය යුත්තෙමු. එසේ කිරීමේදී, පාක්ෂික නොවන ගොවි ජනයාට සහ ප්‍රමාණවත් තරම් පංති විඥනයක් නොමැති වෘත්තීය සමිති සාමාජිකයින්ට කරුණු අවබෝධ කිරීමේ හැකියාව අප සතු බව මතක තබා ගත යුත්තෙමු. අපට එම හැකියාව ලැබෙන්නේ, සත්‍යය අප පැත්තේ වන හෙයිනි. රටේ ආර්ථිකය ප්‍රකෘතිමත් නොකළහොත්, යුද්ධයේ දෙවැනි කාල පරිච්ඡේදයේදී අපට අපගේ සතුරා පරාජය කළ නොහැකි බව ප්‍රතික්ෂේප කළ නොහැකි කරුණක් වන හෙයිනි. දශ ලක්ෂ ගණන් ජනයා ආර්ථික පෙරමුණේ යුද්ධය කෙරෙහි වඩාත් ඥනවන්ත ආකල්පයක් දක්වන තත්ත්වයක් ඇතිවන බවට අපි වග බලා ගත යුත්තෙමු. නිෂ්පාදන ප්‍රචාරය සඳහා වූ මධ්‍යම බියුරෝවේ කර්තව්‍යය එයයි. සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයේ කර්තව්‍යය එයයි.සියලුම පක්ෂ කාරකවරුන්ගේද, සෝවියට් ආණ්ඩුවේ සියලුම දෙපාර්තුමේන්තුවලද කර්තව්‍යය එයයි.වෙනත් ප්‍රචාරයන් කම්කරුවන්ට හා ගොවි ජනතාවට බොරු කී අතර, ලෝකය මුළුල්ලේම ඔවුන්ට ඇත්ත කීමෙන් අපට ලෝක ව්‍යාප්ත වැදගත්කමක් දිනා ගැනීමට ආධාර කළ අපගේ ප්‍රචාරයේ සියලු කටයුතු මගින් ඉටු කළ යුතු කර්තව්‍යය එයයි. මෙම කටයුත්තට අදළ කොන්දේසි කොතරම් අමාරු වුවත්, ආණ්ඩු කෙරෙහි විශ්වාසය නොතබන සේ කම්කරුවන්ට හා ගොවි ජනතාවට උගැන්නූ පැරණි ධනපති ක්‍රමයේ මතකයන් කොතරම් ශක්තිමත්ව තිබුණත්, අපගේ ප්‍රචාරය ඉතාමත් අසීරු හා පැක්ටරි කම්හලේ කම්කරුවාගේ සැමදු ජීවිතයට සම්බන්ධ යම් දෙයක් වෙතට දූන් හැරවිය යුතුව තිබේ. අළුත් ආකාරයකින් බලවේග සම්බන්ධ වීමකින් තොරව රාජ්‍ය ඒකාබද්ධතාවයේ නව ආකෘති නොමැතිව හා බල කිරීමට අදළ නව ආකෘති නොමැතිව අපට අපගේ දුෂ්කරතාවයන් ජයගත නොහැකි බව ද, දූන් අප අභිමුඛයේ තිබෙන ආර්ථික බිඳ වැටීමේ පාතාලයෙන් ගැළවීමක් නොවන බවද, අනිත් අතට අප දූනටමත් මෙම තත්ත්වය මෙල්ල කර ගැනීම අරඹා තිබෙන බවද අපි කම්කරුවන්ට සහ ගොවි ජනතාව යන දෙකොටසටම අවබෝධ කොට දිය යුත්තෙමු.

සහෝදරවරුනි, දූන් මම අපගේ ආර්ථික ප්‍රතිපත්තිය හා ආර්ථික ප්‍රශ්න සම්බන්ධයෙන් කරුණු සමහරක් සඳහන් කරන්නෙමි. මා සඳහන් කරන ආර්ථික ප්‍රශ්න, අපගේ වර්තමාන දේශපාලන තත්ත්වයට හා අපට මුහුණ පාන්නට සිදු වී තිබෙන පරිවර්තනයට ආවේණික වූ ඒවා බව මම අදහස් කරමි. මා ප්‍රථමයෙන්ම සඳහන් කළ යුත්තේ අපගේ ගොවි පනත ගැනය. එය මහජන කොමිසාර් මණ්ඩලය විසින් සම්මත කරන ලද්දේ කෘෂිකාර්මික නිෂ්පාදනය තහවුරු හා සංවර්ධනය කිරීමත්, ගොවිජන ගොවිපළවලට ආධාර කිරීමත් සඳහාය. මෙම පනත දෙසැම්බර් 14 දින පළ කරන ලදී. එදිනට පෙර එම පනතේ අදසහ සහ ප්‍රතිපත්ති ගුවන් විදුලිය මගින් සියලුම ප්‍රාදේශීය නිලධාරීන් වෙත දන්වා තිබිණ.[39]

සම්මේලනය විසින් ද, ප්‍රාදේශීය විධායක කාරක සභා සහ එම කාරක සභාවල දෙපාර්තුමේන්තුවල නියෝජිතයින් විසින්ද මෙම පනත තරයේ සාකච්ඡා කරනු ලැබීම සඳහා — ප්‍රදේශීය අත්දූකීම් පදනම් කර ගෙන (පනත ඇත්ත වශයෙන් පදනම් කර තිබෙන්නේ ඒ මතය — ප්‍රදේශවල දූනටමත් ඒ ගැන හැඟී ගොස් ඇත) — වහාම පිළියෙළ යෙදිය යුතුය. කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි දියුණු කිරීම උදෙසා, උනන්දු කිරීමේ ස්වභාවයෙන් පමණක් නොව බල කිරීමේ ස්වභාවයෙන් ද, ආධාර කිරීමේ නිශ්චිත හා ඉතා ශක්තිමත් පියවරයන් ගැනීමේ අවශ්‍යතාවය ගැන දූන් කිසිම සහෝදරයෙක් අනුමාන කරතැයි මම නොසිතමි.

LIBERATIONBASE

අපගේ රට සුළු ගොවීන්ගේ රටක් විය. දූනුදු එය එසේමය. එනිසා, වනත් මොනම හෝ තත්ත්වයක් යටතේ සිට කොමියුනිස්ට් ක්‍රමයට පරිවර්තනය වීමට වඩා, අපට එම පරිවර්තනය දුෂ්කර වනු ඇත.මෙම පරිවර්තනය සාර්ථක කර ගැනීම සඳහා යුද්ධයේදී මෙන් දස ගුණයක් වැඩියෙන් ඊට ගොවි ජනයාගේ සහභාගිත්වය ලැබිය යුතුය. වැඩිහිටි පිරිමි ජනගහනයෙන් කොටසක කැප වීම බලකර සහ නොවැලැක්විය හැකි ලෙස ලබා ගැනීමේ සමත්කම යුද්ධයට තිබුණේය. එසේ වී නමුත්, තවමත් වෙහෙසට පත් තත්ත්වයේ සිටින ගොවි ජන දේශයක් වන අපේ රටට සිදු වී තිබෙන්නේ, කිසිම විශේෂයකින් තොරව කම්කරු සහ ගොවිජන පුරුෂ සහ ස්ත්‍රී යන දෙපාර්ශවයේම මුළු මහත් ජනගහනයම මෙහෙයවා ගැනීමටය. අනිවාර්ය ශ්‍රම සේවය සඳහා බඳවා ගැනීමේ අවශ්‍යතාවය ගැන කොමියුනිස්ට්වරුන් වන අපට, ඉඩම් දෙපාර්තමේන්තුවල කාරකවරුන් කරුණු වටහා දීම දුෂ්කර නොවේ. ඔබගේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කර තිබෙන දෙසැම්බර් 14 දින පනත ගැන සාකච්ඡා කිරීමේදී, මෙම කරුණ ගැන ප්‍රතිපත්ති වෙනසක ඡායා මාත්‍රයක්වත් මතු නොවෙතැයි යනු මම අපේක්ෂා කරමි. නමුත් වෙනත් දුෂ්කරතාවයක් තිබෙන බව අපි වටහා ගතයුත්තෙමු.එය නම්,පාක්ෂික නොවන ගොවි ජනතාවට කරුණු අවබෝධ කිරීම ය. ගොවි ජනයා සමාජවාදීහු නොවෙති. ඔවුන් සාමාජවාදීන් වෙතිය යන උපකල්පනය මත අපගේ සමාජවාදී සැලසුම් ඉදි කිරීම වැලි මත ගොඩනැගිලි තැනීම හා සමාන වනු ඇත. එසේ කිරීමෙන් අදහස් වනු ඇත්තේ, අපට අපගේ කර්තව්‍යයන් නොවැටහෙන බවත්, අප වටා තිබෙන

https://liberationbase.wordpress.com

දුප්පත්කම සහ බොහෝ විට තිබෙන කැලි කසළ ගැන සැලකිල්ලට ගනිමින් අපගේ වැඩ පිළිවෙළවල් සකසා ගැනීමට සහ අපගේ නව කාර්යයන් ඉටු කිරීමට අප මේ තුන් අවුරුද්ද තුළදී උගෙන ගෙන නැති බවත්ය. අප හමුවේ තිබෙන ප්‍රශ්න ගැන පැහැදිලි පින්තූරයක් අප සතුව තිබිය යුතුය. මෙහිදී ප්‍රථම කර්තව්‍යය වන්නේ, ඉඩම් දෙපාර්තමේන්තුවල වැඩ කරන කොමියුනිස්ට්වරුන් එක්සත් කිරීම, ඔවුන්ගේ අත්දැකීම්වලින් පොදු නිගමනයන් වෙත එළඹ ගැනීම, ප්‍රදේශවල කර තිබෙන දේ වටහා ගැනීම සහ මධ්‍යස්ථානයද, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුද, සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයද පනවන නීති පනත්වල ඒවා අන්තර්ගත කිරීමය. අපට එය කළ හැකි වේයයි අපි බලාපොරොත්තු වෙමු. එසේ වුවත්, එය ප්‍රථම පියවර පමණකි. දෙවැනි පියවර වූකලී, පාක්ෂික නොවන ගොවි ජනයාට අවබෝධය ලබා දීමය. ඔව්. පාක්ෂික නොවන ගොවි ජනයාට අවබෝධය ලබා දීමය. මා එසේ කියන්නේ ඔවුන් බහුතරය වන නිසාය. අපට කළ හැකි දේ කිරීමේ අප පොහොසත් වන්නේ, මෙම ස්වකීයම වූ ක්‍රියාශීලිත්වයකින් සහ පිරීගිය ක්‍රියාරම්භකතාවයකින් යුත් මහා ජනකායට, මෙම කර්තව්‍යය ඉටු කිරීමේ අවශ්‍යතාවය ගැන වඩාත් උසස් මට්ටමකින් අවබෝධ කිරීමෙන් පමණකි. ගොවිජන තව දුරටත් පැරණි ආකාරයෙන් පවත්වාගෙන යා නොහැක. පළමු යුද්ධ කාල පරිච්ඡේදයෙන් නිදහස් වීමට අපට පුළුවන් වූ නමුත්, එහි දෙවැනි කාල පරිච්ඡේදයෙන් අපට එතරම් පහසුවෙන් නිදහස් විය නොහැකි වනු ඇත. එනිසා අපි මෙම අංශය ගැන විශේෂ සැලකිල්ලක් දක්විය යුත්තෙමු.

පාක්ෂික නොවන සෑම ගොවියෙකුටම මෙම ඒකාන්ත සත්‍යය වැටහෙන්නට සැලැස්විය යුතුය. ඒ සෑම ගොවියෙක්ම එය වටහා ඇතැයි අපි ස්ථිරවම විශ්වාස කරමු. එම ගොවියා මෙම වේදනා සහිත හා දුෂ්කර පසුගිය සය අවුරුද්ද ගෙව්වේ නිශ්ඵල ලෙස නොවේ. ඔහු දරුණු ලෙස දුක් වේදනා විඳ තිබේ; බොහෝ කල්පනා කර තිබේ; බොහෝ දේශපාලන සහ ආර්ථික අමාරුකම් විඳ දරාගෙන තිබේ. එනිසා ඔහු ඔවුන්ගේ පැරණි පුරුදුකම් බොහොමයක් අත්හැර දැමීමට පෙළඹී ඇත. තමන්ට පැරණි ආකාරයෙන් ජීවත් විය නොහැකි බවත්, තමන් වෙනත් ආකාරයකින් ජීවත් විය යුතු බවත් ඔහු දැනටමත් වටහා ගෙන ඇතැයි මට හැඟේ. අපගේ ප්‍රචාරක මාධ්‍යයන් සියල්ලමද, අපගේ රාජ්‍යයේ සම්පත් සියල්ලමද, අපගේ අධ්‍යාපන පහසුකම් සියල්ලමද, අප පක්ෂයේ සම්පත් හා උපසේවාවන් සියල්ලමද, පාක්ෂික නොවන ගොවියාට අවබෝධය ලබා දීම සඳහා මුළු බලයෙන් ක්‍රියාත්මක කළ යුතුය. අපගේ ගොවි පනත — අවශ්‍ය සංශෝධන සහ එකතු කිරීම්වලට යටත්ව ඔබ ඒකමතික ලෙස එය සම්මත කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි — ශක්තිමත් පදනමක් මත පිහිටෙව්වා වන්නේ එවිට පමණකි. මෙම පියවර අපගේ ප්‍රතිපත්තිය තරම්ම බලවත් වනු ඇත්තේ ගොවි ජනතාවගෙන් බහුතරයට කරුණු වටහා දී ඔවුන් මෙම කටයුත්තට අනුකර්ෂණය කොටගත් කල පමණකි. වාටාර් සමූහාණ්ඩුවේ අත්දැකීම් පදනම් කරගෙන කුරායෙව් සහෝදරයා ලියූ ඔහුගේ ලිපියක සඳහන් කළ ලෙසට, එසේ වන්නේ වැඩ කරන මධ්‍යම ගොවියා සහ දුප්පත් ගොවියා සෝවියට් ආණ්ඩුවේ මිතුරන් වන අතර අලසයන් එහි සතුරන් වන හෙයිනි. නියම සත්‍යය එයයි. එම සත්‍යයෙහි කිසිම සමාජවාදයක් නැතත්, එය ඉතාමත් අවිවාදීය; ඉතාමත් පැහැදිලිය. එනිසා, ඕනෑම ගැමි සභාවකට සහ පාක් ක නොවන ගොවි ජනයාගේ ඕනෑම රැස්වීමකට එය වැටහෙනු ඇත. එය වැඩ කරන ගොවි ජනතා බහුතරයෙහි අවබෝධය බවට පත්වනු ඇත.

සහෝදරවරුනි, දැන් අප යුද්ධයේ අදියරෙහි සිට ආර්ථික සංවර්ධනයේ අදියරට හැරී තිබෙන නිසා, ඔබට විශේෂයෙන්ම කීමට මා අදහස් කළ දේ මෙයයි. සුළු ගොවි රටක සිටින අපගේ මූලික කර්තව්‍යය වන්නේ, ඒකාන්ත වශයෙන්ම අත්‍යාවශ්‍ය වන, හදිසි සහ ගොවි ජනයාට සම්පූර්ණයෙන්ම තේරෙන සහ වටහා ගත පියවරයන්ගෙන් පටන් ගනිමින් ගොවිජන ගොවිතැනෙහි මට්ටම උසස් කර ගැනීම සඳහා රාජ්‍ය මගින් බල කිරීම යොදගත හැකි තත්ත්වයක් ඇති කර ගැනීමය. අපට එම තත්ත්වය ඇති කර ගත හැකි වන්නේ තවමත් එය සඳහා සූදනමක් නැති දශ ලක්ෂ ගණන් තවත් ජනතාවට කරුණු වටහා දීමට අප සමත් වූ කල්හි පමණකි. බල කිරීමේ යන්ත්‍රය ක්‍රියාත්මක කර සහ ශක්තිමත් කර, පෙළඹවීමේ නව ව්‍යාපාරයක් සඳහා එය හැඩ ගසා සහ සංවර්ධනය කර ගනු දකිනු පිණිස, අපි අපගේ බලවේගයන් සියල්ලම ඒ වෙනුවෙන් මිඩංගු කළ යුත්තෙමු. එවිට යුද්ධයේ තවත් වටයක් ජයග්‍රහණයෙන් කෙළවර වනු ඇත. දැන් අප යුද්ධ ප්‍රකාශ කරන්නේ ගොවි පොදු ජනකාය අතර බලපවත්වන උදාසීනත්වයේ, නොදැනුවත් තරම් සහ අවිශ්වාසයේ පුරාවස්තුවලට විරුද්ධවය. පැරණි විධි ක්‍රම මගින් අපට දිනා ගත හැකි කිසිවක් නැත. නමුත්, අප උගෙන ගෙන තිබෙන නව ප්‍රචාරක, උද්ඝෝෂක සහ සංවිධික බලපෑමේ ක්‍රම මගින් අපට ජයග්‍රහණය ලබා ගත හැක. ආඥාවන් අනුමත කිරීමට, ආයතන ඇති කිරීමට සහ ලේඛන සකස් කිරීමට අමතරව — රට සෑම තැනම නියෝග පතුරුවා හැරීම ප්‍රමාණවත් නොවේ — කලට වඩා හොඳින් සියලුම කෙත් වපුරන බවටත්, සුළු ගොවිජන ගොවිතැනෙහි නිශ්චිත වැඩි දියුණුවක් ඇති වන බවටත් අපි වග බලා ගත යුත්තෙමු. එය ඉතාමත් ප්‍රාථමික ස්වභාවයේ දියුණුවක් වන්නට පිළිවන. සුපරීක්ෂාකාරීවන තරමට හොඳය. නමුත් මොන වෙහෙසක් දරා හෝ, පොදු ජන පරිමාණයකින් එය ඇති කර ගත යුතුය. අපි මුහුණ පාන කර්තව්‍යය මනා ලෙස වටහා ගන්නෙමු නම්, අපි

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

අපගේ මුළු අවධානයම පාක්ෂික නොවන ගොවියා වෙත යොමු කරන්නෙමු නම්, එසේම, අපි මෙම තුන් වසර තුළදී ලැබූ කුසලතාවයන් හා අත්දැකීම් මේ සඳහා සංකේන්ද්‍රණය කර ගන්නෙමු නම්, අපට සාර්ථකත්වය ලැබිය හැකි වේ. අප මෙහිදී සාර්ථකත්වය ලැබුවහොත් මිස, අප සුළු පරිමාණ ගොවිජන ගොවිතැනෙහි ප්‍රායෝගික සහ යෝධ වැඩි දියුණුවක් ඇති කර ගතහොත් මිස, අපට ගැළවීමක් නොවනු ඇත. මෙම පදනම ඇති නොකළහොත්, කිසිම ආර්ථික සංවර්ධනයක් කළ නොහැකි වනු ඇත. එවිට ඉතාමත් අපේක්ෂා සහගත සැලසුම් පවා අගයෙන් තොර වන්නේය. සහෝදරවරු මෙය මතක තබා ගෙන, එය ගොවිජනතාවට වටහා දිය යුතුය. අපට කෙළවරක් නොමැතිව හැමදාමත් සාගින්නෙන් දුවෙමින් හා ශීතලෙන් මිදෙමින් සිටිය නොහැකි බවත්, අප එසේ සිටියහොත් මීළඟ යුද්ධ කාලයේදී අප නෙරපී යනු ඇති බවත් අපි අර්සමාස්හි පාක්ෂික නොවන ගොවි ජනතාවට කිව යුත්තෙමු — ඔවුන් කෝටියක්, නැතහොත්, කෝටි එක හමාරක් පමණ ඇත. මෙය රාජ්‍ය කටයුත්තකි. මෙය අපගේ රාජ්‍යයේ අවශ්‍යතාවයන්ට අදාළ කටයුත්තකි. මෙම කාරණයෙහිදී ස්වල්ප හෝ දුර්වලකමක්, ස්වල්ප හෝ නොසැලකිලිමත් කමක් දක්වන තැනැත්තේ කවුරුන් හෝ වේවා, ඔහු කම්කරු හා ගොවි ජනතා ආණ්ඩුවට අන්ත අපරාධයක් කරන්නෙක් වන්නේය. ඔහු ඉඩම් හිමියාට සහ ධනපතියාට ආධාර කරන්නෙක් වන්නේය. තවද, ධනපතියා සහ ඉඩම් හිමියා ඔවුන්ගේ හමුදා ආසන්න මානයේ සීරුවෙන් රඳවා ගෙන සිටිති. ඔවුහු අපට විරුද්ධව ප්‍රහාරයක යෙදීමේ අටියෙන් අප දුර්වල වන මොහොත තෙක් බලා සිටිති. කෘෂිකර්මාන්තය සහ නාගරික කර්මාන්තය යන අපගේ ප්‍රධාන බල පවුර ගොඩ නගන්නේ නැතිව අප ශක්තිමත් වීමේ වෙනත් මාර්ගයක් නොමැත. අපගේ සියලුම බලවේගයන් කාර්යාවනත කර ගනිමින් සහ ව්‍යවහාරයේදී ඇත්ත වශයෙන්ම පාක්ෂික නොවන ගොවියාට ආධාර කරමින්, කෘෂිකර්මාන්තය සහ කර්මාන්තය දියුණු කිරීමේ අවශ්‍යතාවය ගැන ඔහුට අවබෝධ කර දීම හැර ඒවා වැඩි දියුණු කිරීමේ වෙනත් මගක් නැත.

අපි ගොවියාට ණය වී සිටින බව පිළිගන්නෙමු. අපි කඩදාසි මුදල් සඳහා ඔහුගෙන් ධාන්‍ය ලබාගත් අතර, එම මුදල් ඔහුගෙන් ණයට ගත්තෙමු. අපි එම ණය ගෙවිය යුත්තෙමු. අපගේ කර්මාන්තය ප්‍රකෘතිමත් කර ගත් පසු අපි එම ණය ගෙවන්නෙමු. කර්මාන්තය ප්‍රකෘතිමත් කර ගැනීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදිතයන්ගේ අතිරික්තයක් අවශ්‍ය වන්නේය. ගොවි පනත වැදගත් වන්නේ එහෙයිනි එය වැදගත් වන්නේ අපට ප්‍රායෝගික ප්‍රතිඵල ලබා ගැනීමේ අවශ්‍යතාවය ඇති නිසා පමණක් නොව, එය යොමු ලක්ෂයක් වූ කලෙක මෙන්, සෝවියට් ආණ්ඩුවේ තීරණ සහ ව්‍යවස්ථාදායක පියවරයන් සිය ගණන් එය වටා ගෙතී ඇති හෙයින්ද වේ.

දැන් අපට රුසියාවේ ආර්ථික බලවේගයන් ප්‍රකෘතිමත් කර ගැනීමට හැකි වන සේ අපගේ කාර්මික සංවර්ධනයේ පදනම නිර්මාණය කරනු ලබන්නේ කෙසේද යන ප්‍රශ්නය වෙතට මම යොමු වන්නෙමි. මේ හා සම්බන්ධයෙන්, අපගේ ආහාර කොමිසාර් අංශයේ වාර්තාවෙන් කොටසක් කෙරෙහි ඔබගේ අවධානය ප්‍රථමයෙන් යොමු කළ යුත්තෙමි. එම වාර්තාව සියලු කොමිසාර් අංශවලදී ඔබට ලැබී ඇති, නැතහොත්, මීළඟ දින කීපය තුළ ඔබට ලැබෙනු ඇති වාර්තා සමූහය අතර ඇත. මීළඟ දින කීපය තුළ සෑම කොමිසාර් අංශයක්ම ඔබ වෙත සංඛ්‍යා විස්තර සහ වාර්තා රැසක් ඉදිරිපත් කරනු ඇත. ඒවා සියල්ල එක් කොටගත් කල තෝරා බේරා ගැනීමට අමාරු වන තරමට බහුලය. කොතරම් අල්ප වූ හෝ සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය වන සහ ආර්ථික සැලැස්ම සාර්ථක කර ගැනීමටත්, අපගේ ආර්ථිකය සහ අපගේ කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීමටත් මූලික වන කරුණු එයින් උපුටා ගැනීම අපි කළ යුත්තෙමු. එසේ අත්‍යාවශ්‍ය එක් දෙයක් නම්, අපගේ ආහාර ද්‍රව්‍ය එකතු කිරීමේ කටයුතුය. ඔබට බෙදා දී තිබෙන කුඩා පොතෙහි — ආහාර කොමිසාර් අංශයේ තුන් අවුරුදු වාර්තාවෙහි — සටහනක් ඇතුලත් කර තිබෙන බව ඔබට පෙනෙනු ඇත. එයින් මුළු ගණන් පමණක් මම කියවන්නෙමි. නමුත් සංඛ්‍යා කිය වීම සහ සංඛ්‍යා විස්තර අසා සිටීමට අපහසු දෙයක් නිසා එයද මා කියවන්නේ සම්පූර්ණ ගණන් වශයෙනි. මෙම සංඛ්‍යාවලින් පිළිබිඹු කෙරෙන්නේ එක් එක් අවුරුද්දෙහිදී එකතු කළ ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයන්ය. 1916 අගෝස්තු 1 දින සිට 1917 අගෝස්තු 1 දින දක්වා පූඩ් 32,00,00,000 ක් එකතු කරන ලදී. ඊළඟ අවුරුද්දේ එකතු කළ ප්‍රමාණය පූඩ් 5,00,00,000 කි. ඊළඟට පූඩ් 10,00,00-000 ක්ද, ඉන් පසුව පූඩ් 20,00,000 ක්ද විය. 32,5,10,20 යන මෙම සංඛ්‍යාවලින් සෝවියට් ආණ්ඩුවේ ආර්ථික ඉතිහාසයේ පදනම ගැන, ආර්ථික ක්ෂේත්‍රයේ සෝවියට් ආණ්ඩුව කරන වැඩ ගැන, අපට නියම වශයෙන්ම සංවර්ධන කටයුතු ඇරඹීමේ හැකියාව ලැබෙනු පිණිස දමා තිබිය යුතු පදනම දැමීමට කරන සූදානම ගැන අදහසක් ඔබට ලැබෙනු ඇත. විප්ලවයට පෙර එකතු වූ පූඩ් 32,00,00,000 නැතිවම බැරි අවමය වන්නේය. එය නොමැතිව සංවර්ධනයක් කළ නොහැකිය. විප්ලවයේ මුල් වර්ෂයේදී එකතු වූ ප්‍රමාණය පූඩ් 5,00,00,000 ක් පමණක් වූ අතර එම වර්ෂයේ සාගතයක්, ශීතලෙන් පීඩා විඳීමක් හා දුප්පත්කමක් අති විශාල ප්‍රමාණයෙන් ඇති විය. දෙවැනි අවුරුද්දේ අපට පූඩ් 10,00-00, 000 ක් තිබුණි. තුන්වැනි අවුරුද්දේ ප්‍රමාණය පූඩ් 20,00,00,000 ක් විය. අවුරුද්දෙන් අවුරුද්දට මුළු ගණන දෙගුණ වී තිබේ. ඊයේ ස්විදෙර්ස්කිගෙන් මට ලැබුණු තොරතුරු අනුව, දෙසැම්බර් 15 දින අප වෙත පූඩ් 15,50,00,000 ක් තිබිණි. ප්‍රථම වතාවට අපට අපගේ දෙපයින් සිට ගත හැකි කාලය ආරම්භ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙමින් තිබේ. නමුත් ඒ අති මහත් පරිශ්‍රමයෙනි. අසම සම දුෂ්කරතාවයන් මධ්‍යයේය. බොහෝ විට, සයිබීරියාවෙන්, කොකේසියාවෙන් සහ දකුණෙන් කිසිම සැපයුමක් නොලබාම කර්තව්‍ය ඉටු කිරීමට සිදුවන තත්ත්වයන් යටතේය. දැන් පූඩ් 15,00,00,000 ඉක්මවන එකතුවක් ලබන කල, අති දැවැන්ත දුෂ්කරතාවයන් මධ්‍යයේ වුවද, මෙම කර්තව්‍යය ඉටු කර තිබෙන බව අපට අතිශයෝක්තියෙන් තොරව කිව හැකිය. අපට පූඩ් 30,00,00,000 ක පමණ හෝ සමහර විට ඊට වැඩි එකතුවක් තිබෙනු ඇත. කෙසේ හෝ වේවා, එවැනි සම්පාදනයක් නොමැතිව, රටේ කර්මාන්ත කිසිසේත් ප්‍රකෘතිමත් කළ නොහැකි වනු ඇත. එය නොමැතිව ප්‍රවාහන ක්‍රමය යළි ප්‍රාණවත් කිරීමේ අපේක්ෂාව පුස්සක් වනු ඇත. රුසියාව විද්‍යුතන ක්‍රීමේ මහා කර්තව්‍යයට සමීප වීමට වුව නොහැකි වනු ඇත. කර්මාන්තයේ යෙදී සිටින කම්කරුවන්ගේ යැපීම සහතික කරනු සහ සෝවියට් ආණ්ඩුව අවශ්‍යය යයි සලකන තැන්වලට ලක්ෂ ගණන් කම්කරුවන් යැව්මේ හැකියාව එයට ලබා දෙනු පිණිස ප්‍රමාණවත් වන තරම් ආහාර තොගයක් කම්කරුවන්ගේ සහ ගොවි පනතාවගේ ඒකාබද්ධ පරිශ්‍රමයෙන් රැස්කර ගත හැක් නොවේ නම්, කම්කරුවනාගේ සහ ගොවි ජනයාගේ ආණ්ඩුවක් සහිත රාජ්‍යයක් වශයෙන් සැලක්ය හැකි සමාජවාදී රටක් තිබිය නොහැකිය. මෙය නොමැති කල පුහු කථා හැර වෙනත් කිසිවක් තිබිය නොහැකිය. ආර්ථික ක්‍රමයේ නියම පදනම ආහාර තොග වන්නේය. මෙහිදී අපි වැදගත් ජයග්‍රහණයක් ලබා සිටිමු. මෙම සාර්ථකත්වය ලබාගත් සහ එතරම් සංචිතයක් ඇතිව සිටින අපට අපගේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමෙහි යෙදෙන්නට පුළුවන. මෙම ජයග්‍රහණයන් ලබා ගෙන තිබෙන්නේ ගොවි ජනතාව අතර පැවති අති මහත් අග හිඟකම්, සාගින්න සහ සත්වාහාර හිඟය විඳ ගනිමින්ම බව අපි දන්නෙමු. එම දුෂ්කරතාවයන් තවත් උග්‍ර වන්නට පුළුවන. නියං වර්ෂය නිසා ගොවි ජනතාවගේ දුෂ්කරතාවයන් සහ අග හිඟකම් උපමා විරහිත තරමින් අධික වූ බවද අපි දන්නෙමු. එනිසා අපි, මා සඳහන් කළ පනතෙහි අඩංගු ආධාර දීමේ පියවරයන්ට ප්‍රථම ස්ථානය දෙමු. කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීමේ අරමුදල වන්නේත්, ගොවි ජනතාවට ආධාර දීමේ අරමුදල වන්නේත්, එම ආහාර තොග බව අපගේ පිළිගැනීමයි. එවැනි අරමුදලක් නොමැති කල්හි රාජ්‍ය බලය යනු අර්ථ ශූන්‍ය දෙයකි. එවැනි අරමුදලක් නොමැති කල්හි සමාජවාදී ප්‍රතිපත්තිය යනු දූහැමි ප්‍රාර්ථනාවක් පමණකි.

අප දැඩි ලෙස ගත් තීරණය අනුව අප ආරම්භ කිරීමට යන නිෂ්පාදන ප්‍රචාරයට අතිරේකව වෙනත් වර්ගයක පෙළඹවීමක්ද, එනම්, භාණ්ඩවලින් ප්‍රසාද දීමනා ප්‍රදානයද ක්‍රියාත්මක කරන බව අපි මතක තබා ගත යුත්තෙමු. භාණ්ඩවලින් ප්‍රසාද දීමනා ප්‍රදානය පිළිබඳ නීතිය වූකලී, මහජන කොමිසාර්

මණ්ඩලයේ සහ ආරක්ෂක මණ්ඩලයේ ආඥා සහ තීරණ අතුරෙන් ඉතාමත් වැදගත් එකක් විය. මෙම නීතිය එක්වරම සම්මත කිරීමේ හැකියාවක් නොතිබිණි. අප්‍රියෙල් මාසයේ පටන්ම දීර්ඝ මාලාවක් තීරණ සහ යෝජනා සම්මත කර තිබෙන බවත්, මෙම නීතිය සම්මත කළේ, අපගේ ප්‍රවාහණ ක්‍රමයේ දෘඪකර ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් පූඩ් 5,00,000 ක ආහාර තොගයක් රැස්කර ගැනීමට අපට හැකි වූ පසු පමණක් බවත්, ඔබ කරුණු පරීක්ෂා කර බැලුවහොත් ඔබට පෙනෙනු ඇත. පූඩ් පන් ලක්ෂයක් යනු ඉතා අල්ප සංඛ්‍යාවකි. ඊයේ ''ඉස්වේස්තිය'' පත්‍රයෙහි පළවූ පරිදි, මෙම පූඩ් 5,00,000 න් පූඩ් 1,70,000 ක් දැනටමත් වැය වී තිබේ. ඔබ එම වාර්තාව කියවන්නට ඇතිවාට සැකයක් නැත. ඔබට පෙනෙනු ඇති ලෙසට මෙම සංචිතය පුරසාරම් දෙඩීමට තරම් දෙයක් නොවේ. එය කිසිසේත් ප්‍රමාණවත් නොවේ. ඒ එසේ වුවත්, අප මාවතකට එළඹ සිටින අතර, අපි එය ඔස්සේ ඉදිරියට ගමන් කරන්නෙමු. වැඩ කිරීමේ නව ආකෘතිවලට පරිවර්තනය වීමේදී අප විශ්වාසය තබන්නේ කරුණු පැහැදිලි කරදීම මත පමණක් නොවන බව මෙයින් ඔප්පු වේ. ඉතාමත් දැඩි ශ්‍රම විනයක් පවත්වා ගන්නා ලෙස ගොවීන්ට හා කම්කරුවන්ට කීම පමණක් ප්‍රමාණවත් නොවේ අප ඔවුන්ට ආධාර කිරීමද අවශ්‍යය. මහා අමාරුකම් විඳීමෙන් පසුව, තවදුරටත් ශ්‍රම පෙරමුණේ වීරත්වය පාන අයට අපි ත්‍යාග ප්‍රදානය කළ යුත්තෙමු. අපි දැනටමත් සංචිතයක් ගොඩ නගා ගෙන සිටින්නෙමු. නමුත් එය උපයෝගී කර ගන්නා ආකාරය කිසිසේත් සතුටුදායක යයි කිව නොහැකිය. භාණ්ඩවලින් ප්‍රසාද දීමනා ප්‍රදානය බොහෝ අවස්ථාවල හුදෙක්ම සරල ලෙස වේතන වැඩි කිරීමක් වන බවට නිමක් නැති සලකුනු මහජන කොමිසාර් මණ්ඩලයේ සිටින අපට දක්නට ලැබේ. මේ සම්බන්ධයෙන් තවත්කළ යුතු බොහෝ දේ ඇත. මධ්‍යස්ථානයේ කෙරෙන සාකච්ඡා පැවැත්වීම හා අමතර යෝජනා ක්‍රම කෙටුම්පත් කිරීම සමගම ඉතා වැදගත් වැඩ කටයුතු, එනම්, ඒ ඒ තැන්වලදී පොදු ජනතාව අතර වැඩ කළ යුතුය. රජය කරුණු ඒත්තු ගැන්වීමෙන් නොනැවතී, හොඳ කම්කරුවන්ට වඩාත් හොඳ ජීවන තත්ත්වයන් ඇති කර දීමෙන් ඔවුන්ට තෑගි ප්‍රදානයද කරන විට එහි අර්ථයක් තිබේ. එය වටහා ගැනීම අපහසු නොවේ. එය වටහා ගැනීමට අයෙක් සමාජවාදියෙකු වීම අවශ්‍යනොවේ. එමෙන්ම මෙහිදී අපට පාක්ෂික නොවන කම්කරු සහ ගොවි ජනතාවගේ සහයෝගය ලැබෙන බව කල් තබාම ස්ථිර වී තිබේ. අප කළ යුතුව තිබෙන්නේ මෙම අදහස වඩාත් පුළුල් ලෙස ප්‍රචලිත කිරීම සහ මෙම කටයුතු වඩාත් ප්‍රායෝගික ආකරයකින් ප්‍රදේශවල සංවිධානය කිරීම පමණකි.

දැන් ඉන්ධන ගැන සලකා බලමු. මෙහිදී ඇති කර තිබෙන වැඩි දියුණුව පෙන්වන සංඛ්‍යා ඔබට රිකොව් සහෝදරයාගේ ප්‍රවාදවලින් දැක ගත හැක.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

දර පමණක් නොව තෙල් සම්පාදනයෙහිද වැඩි දියුණුවක් දක්නට ලැබේ. අසර්බයිජාන් සමූහාණ්ඩුවේ කම්කරුවන්ගේ අති මහත් උද්යෝගයද, අප ඔවුන් සමග ඇති කර ගෙන තිබෙන මිත්‍ර සම්බන්ධයද, ජාතික ආර්ථිකය පිළිබඳ ශ්‍රෙෂ්ඨ මණ්ඩලය විසින් එහි යවන ලද දක්ෂ කළමනාකරුවන්ද නිසා, දැන් ඛනිජ තෙල් තත්ත්වය වාසිදායක වී තිබේ. ඒ අනුව ඉන්ධන පිළිබඳ ප්‍රශ්නයේදීද අපි අපගේ දෙපයින් සිටගන්නට පටන් ගනිමින් සිටිමු. ට්‍රොට්ස්කි සහෝදරයාගේ නායකත්වය යටතේ යවන ලද බල සහිත කොමිසමේ වැඩ කටයුතුවලට ස්තුති වන්නට දනියෙට්ස් මිටියාවතෙන් මසකට ලැබෙන ගල් අඟුරු සැපයුම පූඩ් 2,50,00,000 සිට 5,00,00,000 දක්වා වැඩි කරනු ලැබේ. වගකීම ඇති සහ පළපුරුද්ද සහිත පුරුෂයන් දනියෙට්ස් මිටියාවතට යැවීමට එම කොමිසම තීරණය කර තිබේ. එමෙන්ම, එහි කටයුතු භාරව සිටීමට පියතකොව් සහෝදරයා එහි යවා ඇත.

ඒ අනුව, සාර්ථකත්වය ලැබීම සඳහා අපි ඉන්ධන සම්බන්ධයෙන් යම් යම් පියවරයන් ගත්තෙමු. ඉතාමත් විශාල සම්පත් නිධි සහිත ප්‍රදේශයක් වන දනියෙට්ස් මිටියාවත දැනටමත් අපේ පාලනය යටතේ පවතී. මහජන කොමිසාර් මණ්ඩලයේ සහ ආරක්ෂක මණ්ඩලයේ වාර්තාවල දනියෙට්ස් මිටියාවතට සම්බන්ධයෙන් ගන්නා ලද තීරණවල සටහන් දක්නට ලැබේ. සැලකිය යුතු තරම් බලතල සහිත සහ මධ්‍යම ආණ්ඩුවේ නියෝජිතයන්ගෙන් හා ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් සමන්විත කොමිසම් සභා පිටත් කර හැරීම ගැන එම වාර්තාවල සඳහන්ව ඇත. අපි ප්‍රදේශවල වැඩ කටයුතු දිරිගැන්විය යුත්තෙමු. මෙම කොමිසම් සභාවලට එසේ කළ හැකි යයි මට හැඟේ. අනාගතයේදීද අප තවදුරටත් කොමිසම් සභා පිහිටුවන අතර, ඒවායේ වැඩ කටයුතුවල ප්‍රතිඵල ඔබට බලාගත හැකි වනු ඇත. අපගේ කර්මාන්තයේ ප්‍රධාන අංශය වන ඉන්ධන නිෂ්පාදනයට නිශ්චිත උත්තේජනයක් දීමට අපි ක්‍රියා කළ යුත්තෙමු.

ඉන්ධන හා සම්බන්ධයෙන් කථා කරන කල, හයිඩ්රොලික් ක්‍රමයට පර්ණක නිෂ්කර්ෂණය කිරීම විශාල ජයග්‍රහණයක් බව කියනු කැමැත්තෙමි. පර්ණක වූකලී ඉතා විශාල වශයෙන් අප සතුව තිබෙන ඉන්ධන වර්ගයකි. නමුත් ඉතාමත් අයහපත් තත්ත්වයන් යටතේ වැඩ කිරීමට සිදුව තිබුණු හෙයින්, අපට මේ දක්වා එයින් ප්‍රයෝජන ගත නොහැකි විය. මෙම නව ක්‍රමය, ඉන්ධන හිඟය ජය ගැනීම සඳහා අපට ආධාරකාරී වනු ඇත. ඉන්ධන හිඟය ආර්ථික පෙරමුණේ අපට තර්ජනයක් වී තිබෙන ලොකුම අන්තරායකි. අපි පැරණි ක්‍රම කෙරෙහි එල්බ ගෙන සිටිමින්, අපගේ කර්මාන්තය සහ ප්‍රවාහණය ප්‍රකෘතිමත් කර නොගතහොත්, අපට අවුරුදු බොහෝ ගණනක් ගත වන තෙක් මෙම අමාරුවෙන් මිදෙන්නට නොහැකි වනු ඇත. අපගේ පර්ණක කාරක සභාවේ සාමාජිකයන්, මෙම නව සොයා ගැනීම සම්පූර්ණ

කරනු සඳහා රුසියානු ඉන්ජිනේරුවරුන් දෙදෙනෙකුට ආධාර කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම නව ක්‍රමය සම්පූර්ණ වීමට ඉතාමත් ආසන්නය. එනිසා අපි මහා විප්ලවයකට ආසන්නව සිටිමු. එය අපට ආර්ථික වශයෙන් වැදගත් ආධාරයක් වනු ඇත. අති විශාල පර්ණක නිධි අප සතුව තිබෙන නමුත්, එවැනි කොන්ද කැඩෙන වැඩ කිරීමට මිනිසුන් යැවීමේ පුළුවන්කමක් අපට නොමැති හෙයින් අපට ඒවායින් ප්‍රයෝජන ගත නොහැකි වී තිබෙන බව අමතක නොකළ යුතුය. එවැනි ඉතා කටුක තත්ත්වයන් යටතේ වැඩ කිරීමට මිනිසුන් යැවීම ධනපති ක්‍රමයට නම් කළ හැකිය. ධනපති ක්‍රමය යටතේ ජනයා එහි වැඩ කිරීමට දක්කනු ලැබුවේ සාගින්න විසිනි. නමුත් එවැනි ඉවසුම බැරි වැඩට මිනිසුන් යැවීම සමාජවාදී රාජ්‍යයට කළ නොහැක්කකි. අනිත් අතට, කිසිවෙක් ස්ව කැමැත්තෙන්ම එහි යන්නේද නැත. ධනපති ක්‍රමය සියල්ලක්ම කර දුන්නේ ඉහළ තට්ටුවේ අයටය. පහළ පංති ගැන එය සැලකිල්ලක් දැක්වූයේ නැත.

අපි සෑම තැනෙකම යන්ත්‍ර සූත්‍ර යෙදිය යුත්තෙමු. එසේම හැකි තරම් විස්තීර්ණ වශයෙන් යාන්ත්‍රිය කාර්මික ශිල්පය උපයෝගී කර ගත යුත්තෙමු. හයිඩ්රොලික් ක්‍රමයට පර්ණක නිෂ්කර්ෂණය කිරීම නුපුහුණු කම්කරුවන්ට පවා කළ හැකි වන හෙයින්, ජාතික ආර්ථිකය පිළිබඳ මහා මණ්ඩලය එතරම් සාර්ථක ලෙස පිළියෙළ කරවා තිබෙන මෙම නව ක්‍රමය නිසා ඉන්ධන අති විශාල පමණින් නිෂ්කර්ෂණය කර ගත හැකි වේ. එපමණක් නොව ඒ සඳහා පුහුණු කම්කරුවන් අවශ්‍යතාවයද මඟ හැරෙන්නේය. අපි මෙම යන්ත්‍ර නිෂ්පාදනය කර ඇත්තෙමු. පර්ණක නිෂ්කර්ෂණය ගැන මොස්කව් නගරයේ තිරගත කරන ලද චිත්‍ර පටිය නරඹන ලෙස නියෝජිතවරුන්ට නිර්දේශ කරන්නෙමි. සම්මේලනයේ නියෝජිතයන් සඳහා එය ප්‍රදර්ශනය කිරීමට පුළුවන. ඉන්ධන හිඟයට මුහුණ දීමේ එක නිශ්චිත මාර්ගයක් ගැන අදහසක් ඔබට එයින් ලැබෙනු ඇත. නව ක්‍රමය සඳහා අපට අවශ්‍ය යන්ත්‍ර සාද ගෙන ඇත්තෙමු. නමුත්, ඒවා හොඳ තත්ත්වයෙන් නිමවා ගෙන නැත. අපි අපගේ ජනයා විදේශයට යවන්නෙමු නම් හා විදේශ රටවල් සමග අප ඇති කර ගෙන තිබෙන සම්බන්ධකම්වලින්, පවත්නා අර්ධ — නීතිමය සම්බන්ධකම්වලින් පවා ප්‍රයෝජන ගන්නෙමු නම්, අපගේ නිර්මාණකයන් නිර්මාණය කළ යන්ත්‍ර එහිදී නිසි ලෙස සාදවා ගත හැක. මෙම යන්ත්‍ර සංඛ්‍යාවත්, මෙම ක්ෂේත්‍රයෙහිදී ප්‍රධාන පර්ණක කාරක සභාව සහ ජාතික ආර්ථිකය පිළිබඳ ශ්‍රෙෂ්ඨ මණ්ඩලය ලබන සාර්ථකත්වයනුත්, අප ලබන ආර්ථික ජයග්‍රහණයන් සියල්ලම තක්සේරු කරන මානකයක් ලෙස ගත හැකි වනු ඇත. ඉන්ධන හිඟය මැඩ පවත්වා ගතහොත් මිස, ආර්ථික පරමුණෙහිදී ජය අත්කර ගැනීමේ ඉඩක් අපට කිසි-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉස්ත් නොලැබෙනු ඇත. ප්‍රවාහන ක්‍රමය ප්‍රකෘතිමත් කිරීම පිළිබඳ අත්‍යාවශ්‍ය ජයග්‍රහණයද ඉන්ධන හිඟය මකා ගැනීම මත රඳා පවතිනු ඇත.

මෙම ක්ෂේත්‍රයෙහිදී අවුරුදු ගණනාවකට අදාල වන සේ නියම සැලැස්මක් අපට ඇතැයි යන්න යෙම්ෂානොව් සහ ට්‍රොට්ස්කි යන සහෝදරවරුන්ගේ අවුරුදු පහක කාලයක් සඳහා සැලසුම් කරන ලද්දකි. අවුරුදු පහක් තුළදී[40] අපට අපගේ ප්‍රවාහණය අකෘතිමත් කර, අබලන් ඇන්ජින් යන්ත්‍ර සංඛ්‍යාව අඩු කළ හැකි වනු ඇත. නව වැනි ප්‍රවාදයෙහි සඳහන් ප්‍රශ්නය සමහර විට විසඳීමට ඉතාමත් අමාරු ප්‍රශ්නය ලෙස අවධාරණය කිරීමට මම කැමැත්තෙමි. මෙම කාලය දැනටමත් අඩුකර තිබෙන බව එහි සඳහන් කර තිබේ.

අවුරුදු ගණනාවක් සඳහා සකස් කෙරුණු විස්තීර්ණ සැලසුම් ඉදිරිපත් වන කල, පහත දැක්වෙන පරිදි කියන සංශයවාදීන් නිතර හමුවේ. ඉදිරි අවුරුදු ගණනාවක් සඳහා අපි කෙසේ නම් සැලසුම් සකස් කරන්නෙමුද? අපට කළ හැකි හොඳම දෙය නම් මෙම අවස්ථාවට"අවශ්‍ය දෙය කිරීමය. සහෝදරවරුනි, කරුණු දෙකක් සම්බන්ධ කර ගැනීමේ සමත් කම අපට තිබිය යුතුය: වැදගත් ජයග්‍රහණයන් අරමුණු කරන දීර්ඝ කාලීන සැලැස්මක් නොමැතිව අපට වැඩ කළ හැකි නොවේ. ප්‍රවාහන ක්‍රමයේ වැඩ කට යුතු විෂයෙහි දක්නට ලැබෙන ඒකාන්ත දියුණුවෙන් මෙහි සත්‍යය ඔප්පු වී තිබේ. ප්‍රවාහනය ප්‍රකෘතිමත් කිරීම සඳහා කාලය අවුරුදු පහක් සේ නියම කර ගත් නමුත්, අප නියමිත වැඩ සටහන ඉක්මවා ගොස් සිටින නිසා, මෙම කාලය දැනටමත් අඩු කර තිබෙන බව කියන නව වැනි ප්‍රවාදයේ අදළ ඡේදය වෙත ඔබගේ අවධානය යොමු කරමි. එම කාලය අවුරුදු තුන හමාරක් ලෙසට දැන් නියම කර තිබේ. ආර්ථික ක්‍රියාකාරීත්වයේ අන් අංශවලද වැඩ කළ යුත්තේ මේ ආකාරයෙනි. ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලයේ නියම සහ ප්‍රායෝගික කර්තව්‍යය මෙය බවට පත්වන සේ එය නොකඩවාම සරල කරනු ලැබේ. විද්‍යාවේ සහ ව්‍යවහාරයේ ප්‍රගතියෙන් ප්‍රයෝජන ගනිමින්, අපි ප්‍රදේශවල සැලසුම් නියමිත කලට මත්තෙන් සපුරා ගැනීමට නොපසුබට ලෙස උත්සාහ දැරිය යුත්තෙමු.කර්මාන්තය සම්පූර්ණයෙන්ම ප්‍රකෘතිමත් කිරීම අපෙන් වෙන් කරන දීර්ඝ කාලය ව්‍යවහාරයේදී අඩු කළ හැකි බව එවිට පොදු ජනතාවට වැටහෙන්නේය. එය අප මත රැඳී පවතින දෙයකි. සෑම කම්හලකම, සෑම දුම්රිය ඩිපෝවකම, සෑම ක්ෂේත්‍රයකම අපගේ වැඩ ක්‍රම වැඩි දියුණු කරමු. එවිට අපට මෙම කාලය කෙටි කළ හැකි වනු ඇත. අපි එය කෙටි කරමු දීර්ඝ කාලීන සැලසුම් ගැන බිය නොවන්න. ඒවා නොමැතිව ඔබට ආර්ථික පුනර්ජීවනයක් උදා කර ගත හැකි නොවේ. සියලුම ප්‍රදේශවල අපගේ සියලුම ශක්තිය ඒවා සපුරාලීම සඳහා කැප කරමු.

ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම කළ යුත්තේ නිශ්චිත වැඩ පිළිවෙළක් අනුවය. එමෙන්ම, එම සැලසුම් වැඩි වැඩියෙන් ඉටු වීම සටහන් කර ගෙන, ඒ ගැන උනන්දුවක් ඇති කළ යුතුය. සාගින්නෙන්, ශීතලෙන් සහ දුප්පත්කමෙන් පීඩා විඳීමේ කාලය කෙටි කිරීම රඳා පවතින්නේ පොදු ජනතාව කොතරම් කඩිනමින් අපගේ සැලසුම් සම්පූර්ණ කරන්නේද යන්න මත බව ඔවුන්ට අවබෝධ වීමට පමණක් නොව හැඟීමටද සැලස්විය යුතුය. තවද අපට බෙහෙවින්ම අවශ්‍ය වන ඒකීය ආර්ථික සැලැස්ම සැදෙන ආකාරයෙන් නිෂ්පාදනයේ විවිධ අංශවල සැලසුම්ද බුද්ධිමත් ලෙස ඒකාබද්ධ කර එකට සම්බන්ධ කළ යුතුය.

මේ හා සම්බන්ධයෙන් වූ කල, විවිධ ආර්ථික අංශවලට අදළ මහජන කොමිසාර් අංශ එකම ආර්ථික මධ්‍යස්ථානයක් යටතේ එක්සත් කිරීමේ කර්තව්‍යයට මුහුණ දීමට අපට සිදු වේ. අපි මෙම කර්තව්‍යයට අත ගසා ඇත්තෙමු. ඒ අනුව, ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධයෙන් එම මණ්ඩලයේ සහ මහජන කොමිසාර් මණ්ඩලයේ තීරණයක් ඔබගේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන්නෙමු.

ඔබ මෙම යෝජනා ක්‍රමය පරීක්ෂා කර බලනු ඇතැයිද, අවශ්‍ය සංශෝධන සමග එය ඒකමතික ලෙස සම්මත කරනු ඇතැයිද මම විශ්වාස කරමි. එහි සන්ධාරය අල්පේච්ඡය. නමුත් එහි වැදගත්කම විශාලය. මා එසේ කියන්නේ, සියලු ආර්ථික වැඩ එක්සත් කරන සහ ස්වකීය තත්ත්වය ගැන නිශ්චිත වශයෙන් දන්නා මණ්ඩලයක් අපට තිබිය යුතු හෙයිනි. දැන් ප්‍රධාන වශයෙන් දන්නා මණ්ඩලයක් අපට තිබිය යුතු හෙයිනි.දැන් ප්‍රධාන වශයෙන් අවධාරණය යොදනු ලබන්නේ ආර්ථික කටයුතු කෙරෙහිය.

සම්මේලනයට පෙර හා එය සම්බන්ධයෙන් නිකුත් කෙරුණු සාහිත්‍ය මගින්, ගුසයෙව් සහෝදරයා ලියූ කුඩා පොතක් මගින් මේ ගැන විස්තර කර තිබේ.එම පොත ගුසයෙව් සහෝදරයා කලින් ලියූ පොත තරම් හොඳින් ලියවී නැති බව මෙහිලා සඳහන් කරමි. [41]ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලයේ සංවිධානය සම්බන්ධයෙන් අති විශාල වෙනස්කම් යෝජනා කරන සැලැස්මක් එම පොතෙහි අඩංගුය.ප්‍රමුඛ කාරකවරුන් බොහෝ දෙනෙක් එයට මාරු කිරීමට යෝජනා කර තිබෙන අතර එසේ මාරු කිරීමට අදහස් කරන අය අතර ට්‍රොට්ස්කිගේ සහ රිකොව්ගේ නම්ද වේ.අප මීට වඩා තරමක් අඩුවෙන් මනෝරංජනයෙහි යෙදීම සුදුසු බව මම කියමි. ගොඩ නැගීමට තුන් අවුරුද්දක් කල් ගතවූ සංවිධාන ව්‍යුහයක් බිඳ ගෙන පිටතට පැනීම අපට කළ හැකි නොවේ. එහි ඇති විශාල දුර්වලකම් ගැන අවබෝධයක් අපට ඇත. මෙම සම්මේලනයේදී අපි ඒ ගැන විස්තර සහිතව කථා කරමු. මෙම ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇතුලත් කර තිබේ. එය ඉතාමත් වැදගත් ප්‍රශ්නවලින් එකකි. මා සඳහන් කරන්නේ සෝවියට් සංවිධාන ව්‍යුහය වැඩි දියුණු කිරීම ගැනය. නමුත් වර්තමානයේදී අප කටයුතු කළ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යුත්තේ ඉතාමත් කල්පනාකාරී ලෙසටය අපි අත්‍යාවශ්‍ය දෙයට පමණක් සීමා විය යුත්තෙමු. ඒ අනුව ප්‍රායෝගික අත්දැකීම පදනම් කරගෙන අපගේ සංවිධාන ව්‍යුහය වෙනස් කරගත යුත්තෙමු. අප ඉදිරිපත් කර තිබෙන යෝජනා ක්‍රමය සමච්චලයට ලක් කරන ගුසයෙව් සහෝදරයා, අප ඉදිරිපත් කර ඇත්තේ කෘෂිකර්මාන්ත කොමිසාර් අංශයත්, ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලයත් එකට එකතු කිරීමේ යෝජනාවක් බව කියයි. සම්පූර්ණයෙන්ම සත්‍යයකි. අපි එවැනි යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කරන්නෙමු. ඒ අනුව අප ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලයට වෙන් කරන්නේ ඉතා අල්පේච්ඡ ස්ථානයකි. එය මහජන කොමිසාර් මණ්ඩලය යටතේ ශ්‍රම සහ ආරක්ෂක කටයුතු භාර කොමිසම බවට පත් කරනු ලැබේ. මේ දක්වා අප ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලයේ කටයුතු කර තිබෙන්නේ කිසිම ව්‍යවස්ථාවකින් තොරවය. මහජන කොමිසාර් මණ්ඩලයේ බලයත්, ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලයේ බලයත් විස්තර කර තිබුණු ආකාරය සතුටුදායක නොවේ. අපි සමහර විට මෙම බලය ඉක්මවා යමින් ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ලෙසට ක්‍රියා කර ඇත්තෙමු. නමුත් මෙය හේතු කොට ගෙන කිසි කලෙකත් ගැටුමක් ඇති නොවීය. එවැනි ප්‍රශ්න මහජන කොමිසාර් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් වහාම විසඳා ගන්නා ලදී. ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලය ආර්ථික ප්‍රතිපත්තිය වඩාත් එකලස් ලෙස සම්බන්ධ කිරීමේ මණ්ඩලයකට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය පෙනී ගිය පසු, මෙම සම්බන්ධතාවයන්ට නීතිමය නිර්වචනයක් දෙන්නේ කෙසේද යන ප්‍රශ්නය මතු විය. අප ඉදිරියේ සැලසුම් දෙකක් ඇත. මහජන කොමිසාර් මණ්ඩලයේ හා ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලයේ බලතල පැහැදිලි කරන ලෙස ඉන් එකකින් කියනු ලැබේ. මෙය කිරීම පිණිස බොහෝ සංග්‍රන්ථකරුවන් සහ රීම් ගණන් කඩදාසි උපයෝගී කර ගැනීම අවශ්‍ය වනු ඇත. නමුත් අඩු පාඩුවක් සිදු නොවේය යන්න එයින් සහතික වන්නේද නැත.

වෙනත් ආකාරයකින් එය විසඳන්නට බලමු. ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලය බොහෝ දුරට මහජන කොමිසාර් මණ්ඩලයට සමාන ආයතනයක් ලෙසට සැලකීමේ පුරුද්දක් තිබිණ. අපි මෙම අදහස අත්හැරිය යුත්තෙමු. එය මහජන කොමිසාර් මණ්ඩලයේ කොමිසමක් බවට පත්වෙන්නට හරිමු. එවිට, ගැටෙන තැන් බොහෝ සෙයින් අඩු කර ගැනීමටත්, වඩාත් සීඝ්‍ර ලෙස ප්‍රායෝගික අභිමතාර්ථයන් ඉටු කර ගැනීමටත් අපට හැකි වේ. මහජන කොමිසාර් මණ්ඩලයේ කිසියම් සාමාජිකයෙක් අසතුටට පත් වී සිටී නම්, තම පැමිණිල්ල මහජන කොමිසාර් මණ්ඩලය හමුවේ තැබීමට ඔහුට පුළුවන. ඔබ දන්නා පරිදි එම මණ්ඩලය පැය කීපයක් ඇතුළත රැස් කළ හැකිය. මේ ආකාරයෙන් අපි දෙපාර්තමේන්තු

අතර ඝර්ෂණ වලක්වා, ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලය සීඝ්‍රයෙන් ක්‍රියාත්මක වන මණ්ඩලයක් බවට පත් කරන්නෙමු. එය පහසු කටයුත්තක් නොවේ. එය ඒකීය ආර්ථික සැලැස්මක් සැබැවින්ම නිර්මාණය කිරීම හා සමග එකට බැඳී පවතින්නකි. අපට විසඳීමට තිබෙන්නේ ආර්ථිකයේ විවිධ අංශයන්ට අදාළ කොමිසාර් අංශ සාර්ථක ලෙස එක්සත් කිරීමේ ප්‍රශ්නයය. අපි ඒ සම්බන්ධයෙන් යම් යම් කටයුතු කර ඇත්තෙමු; අවුරුදු දෙකක්ම සූදානම් වෙමින් සිටියෙමු. ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලය හා සම්බන්ධ පනතට ඔබගේ අවධානය යොමු කරන්නේත්, අවශ්‍ය සංශෝධන සහිතව ඔබ එය අනුමත කරනු ඇතැයි බලා පොරොත්තු වන්නේත් එහෙයිනි. එවිට ආර්ථික කොමිසාර් අංශ එක්සත් කිරීම වඩාත් නිරවුල් ලෙස, සීඝ්‍ර ලෙස, දැඩි ලෙස හා තීරණාත්මක ලෙස සිදු කෙරෙනු ඇත.

දැන් මම අවසාන කරුණ ගැන සඳහන් කරන්නෙමි. එය නම්, විශේෂ ප්‍රශ්නයක් වශයෙන් න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙන විද්‍යුතනය පිළිබඳ ප්‍රශ්නයයි. මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඔබ වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. අප ඉදිරියේ ඉතා වැදගත් වෙනස් වීමක් සිදුවෙමින් පවතින බව මම අදහස් කරමි. එය වූකලී සෝවියට් බලයේ වැදගත් ජයග්‍රහණවල ආරම්භය සලකුණු කරන වෙනස් වීමකි. මින් ඉදිරියට සමස්ත රුසියා සම්මේලනයේ වේදිකාවට දේශපාලනඥයන් හා පරිපාලකයන් පමණක් නොව, ඉන්ජිනේරුවරුන් සහ ශස්‍ය විද්‍යාඥයන්ද නැගෙනු ඇත. මෙයින් සලකුණු වන්නේ දේශපාලනය පසුතලයට යන, දේශපාලනය ගැන සාකච්ඡා කෙරෙන අවස්ථා ගණන අඩු වන හා වඩාත් කෙටියෙන් සාකච්ඡා කෙරෙන, කථා කිරීම වැඩියෙන්ම ඉන්ජිනේරුවන්ට හා ශස්‍ය විද්‍යාඥයන්ට භාර වන ඒ ඉතා වාසනාවන්ත කාලයේ ආරම්භයයි. ආර්ථික සංවර්ධනයේ කටයුතු නියම වශයෙන් කර ගෙන යනු පිණිස, සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයේදීද, සියලුම සෝවියට් සභාවල හා සංවිධානවලද, ප්‍රවෘත්ති පත්‍රවලද, ප්‍රචාරක සහ උද්ඝෝෂණ ආයතනවලද, සියලුම අවස්ථාවලදීද, ඉහළ සිට පහළ දක්වාම මෙම සිරිත ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ යුතුය.

අප දේශපාලනය උගෙන ගෙන තිබෙන බව නිසැකය. ඒ අතින් අපි පර්වතයක් මෙන් ස්ථිර වෙමු. නමුත් ආර්ථික කරුණු හා සම්බන්ධයෙන් වූ කළ තත්ත්වය සතුටුදායක නොවේ. මින් ඉදිරියට හොඳම දේශපාලනය වනු ඇත්තේ දේශපලනය අඩු කිරීමය. වැඩි වැඩියෙන් ඉන්ජිනේරුවරු සහ ශස්‍ය විද්‍යාඥයන් ඉදිරියට ගෙන එන්න. ඔවුන්ගෙන් උගෙන ගන්න. ඔවුන්ගේ වැඩ ගැන සෝදිසියෙන් නිරීක්ෂණය කරන්න. එමෙන්ම, අපගේ සම්මේලන සහ සාකච්ඡා සභා ප්‍රචාරක රැස්වීම්වලට නොව, අපගේ ආර්ථික

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජයග්‍රහණයන් පුනරීක්ෂණය කරන මණ්ඩල බවට, ආර්ථික සංවර්ධනයේ කාර්යය නියම වශයෙන් උගෙන ගැනීමේ මණ්ඩල බවට හරවන්න.

සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ 1920 පෙබරවාරි 7 දින රැස්වීමේ තීරණය අනුව පිහිටුවන ලද රාජ්‍ය විද්‍යුතන කරණ කොමිසමේ වාර්තාව ඔබට ඉදිරිපත් කරනු ඇත. මෙම කොමිසමේ සංයුතිය නිශ්චය කරන අවසාන ආඥාව ජාතික ආර්ථිකය පිළිබඳ මහා මණ්ඩලයේ සභාපති මඩුල්ල විසින් පෙබරවාරි 21 දින අත්සන් කරන ලදී. ප්‍රධාන පෙළේ හොඳම විශේෂඥයන් හා කාරකවරුන් ගණනාවක් ඔවුන්ගේ මුළු ශක්තිය යොදා මෙම වැඩෙහි යෙදෙති. එම විශේෂඥයන් සහ කාරකවරුන් ප්‍රධාන වශයෙන්, එනම්, සියයකට වැඩි සංඛ්‍යාවක් ජාතික ආර්ථිකය පිළිබඳ මහා මණ්ඩලයෙන්ද, තවත් අය දුම්රිය කටයුතු භාර කොමිසාර් අංශයෙන් හා කෘෂිකර්මාන්ත කටයුතු භාර කොමිසාර් අංශයෙන්ද ලබා ගත් අයය. රුසියාවේ විද්‍යුතනකරණ රාජ්‍ය කොමිසමේ කටයුතුවල ප්‍රතිඵල අප හමුවේ තබා ඇත. මෙම කුඩා වෙළුමෙහි ස්වරූපයෙන් ඉදිරිපත් කර තිබෙන එය අද, නැතහොත්, හෙට ඔබට බෙද දෙනවා ඇත.[42] මෙම කුඩා වෙළුම දැක ඔබ බියක් ඇති කර නොගනිතියි මම විශ්වාස කරමි. මෙම පොතේ විශේෂ වැදගත්කම ගැන ඔබට වටහා දීම මට අපහසු නොවේ යයි මම සිතමි. මගේ අදහසේ හැටියට එය අප පක්ෂයේ දෙවැනි වැඩ පිළිවෙළ ලෙසට සැලකිය යුතුය. ප්‍රියබ්‍රෂෙන්ස්කි සහ බුහාරින් යන සහෝදරවරුන් විසින් ඉතා අගනා ලෙස පැහැදිලි කරන ලද ඒ පක්ෂ වැඩ පිළිවෙළ අපට ඇත. එය මෙතරම් විශාල නැති, එහෙත් ඉතාමත් ප්‍රයෝජනවත් පොතක් ලෙසට ඉදිරිපත් කර තිබේ. එය නම් දේශපාලන වැඩ පිළිවෙළය. එය අපගේ අරමුණු සහ පංති හා පොදු ජනතාව අතර සම්බන්ධකම් විස්තර කරන ලියවිල්ලකි. නමුත්, සත්‍ය වශයෙන්ම මෙම මාර්ගයේ ගමන් කිරීමටත්, ඉන් ලබාගත් ප්‍රායෝගික ප්‍රතිඵල මැන බැලීමටත් දැන් කාලය පැමිණ තිබෙන බව අමතක නොකළ යුතුය. අප පක්ෂ වැඩ පිළිවෙළ තනිකරම පක්ෂයේ වැඩ පිළිවෙළක් ලෙසට නොතිබිය යුතුය. එය අපගේ ආර්ථික සංවර්ධනයේ වැඩ පිළිවෙළක් විය යුතුය. නොඑසේ නම්, එය පක්ෂයේ වැඩ පිළිවෙළක් ලෙසට වුවද වටිනාකමෙන් තොර වනු ඇත. ඊට අතිරේකයක් ලෙසට දෙවැනි පක්ෂ වැඩ පිළිවෙළක් තිබිය යුතුය. එය, මුළු මහත් ආර්ථිකයම ප්‍රකෘතිමත් කිරීමේ සහ එය නවීන තාක්ෂණික සංවර්ධනයේ මට්ටමට නගා සිටුවීමේ සැලැස්මක් විය යුතුය. විද්‍යුතනකරණය සඳහා සැලැස්මක් නොමැතිව අපට කිසිම නියම නිර්මාණාත්මක වැඩක් කළ නොහැකිය. අප සාකච්ඡා කරන්නේ කෘෂිකර්මාන්තය, කර්මාන්තය සහ ප්‍රවාහනය ප්‍රකෘතිමත් කිරීම සහ ඒවායේ සංගත සම්බන්ධීකරණය ගැන වන කල්හි, අපට පුළුල් ආර්ථික සැලැස්මක් සාකච්ඡා

කිරීමට සිදුවන්නේමය. අපි නිශ්චිත සැලැස්මක් අනුමත කළ යුත්තෙමු. නමුත් එය ප්‍රථම සන්නිකර්ෂණය ලෙසට පිළිගන්නා සැලැස්මක් වනු ඇත. පක්ෂ සම්මේලනයෙන් පමණක් වෙනස් කළ හැකි අපගේ නියම පක්ෂ වැඩ පිළිවෙළ මෙන් නොව, මෙම පක්ෂ වැඩ පිළිවෙළ නොවෙනස් කළ හැක්කක් නොවේ. නැත. දිනෙන් දිනම, සෑම පැක්ටරියකම සහ සෑම වොලොස්ට් වසමකම, මෙම වැඩ පිළිවෙළ වැඩි දියුණු කරනු ලැබේ; විස්තරාත්මක කරනු ලැබේ, අංග සම්පූර්ණ කරනු ලැබේ; වෙනස් කර සකසා යනු ලැබේ.අපට එය අවශ්‍ය වන්නේ මුල් කෙටුම්පතක් ලෙස ටය. කොමියුනිස්ට් ක්‍රමය සඳහා අවශ්‍ය වන නියම ආර්ථික පදනම මත රුසියාව පිහිටුවන්නේ කෙසේද යන්න සනිටුහන් කරමින්, දස වසරකට නොඅඩු කාලයක් සඳහා සකස් කළ මහා ආර්ථික සැලැස්මක් ලෙසට එය මුළු රුසියාවටම ඉදිරිපත් කරනු ලැබේ. යුද්ධ පෙරමුණෙහි ජය ගැනීමේදී අපගේ ධෛර්යය සහ ශක්තීන් වැඩි වර්ධනය කළ ඉතාමත් බලවත් උනන්දු කාරකයන්ගෙන් එකක් වූයේ කුමක්ද? එය නම් අන්තරාය ගැන වටහා ගැනීම විය. ඉඩම් හිමියන් සහ ධනපතියන් රුසියාවට ආපසු ඒමට ඉඩ ඇත්දැයි යන ප්‍රශ්නය කවුරුත් ඇසූහ. එයට දුන් පිළිතුර වූයේ එම ඉඩ ඇති බවය. එනිසා අපි අපගේ පරිශ්‍රමයන් සිය ගුණයෙන් වැඩි කර ගෙන ජයග්‍රහණය ලබා ගත්තෙමු.

ආර්ථික පෙරමුණ ගෙන බලන්න. ආර්ථික වශයෙන් රුසියාවේ ධනපති ක්‍රමය යළි ස්ථාපිත කළ හැකිද යන ප්‍රශ්නය අසන්න. අපි "සුහරොව්කා"[43] කළු කඩයට විරුද්ධව සටන් කෙළෙමු. මේ පසුගිය ද, සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය ආරම්භ කිරීමට මඳකට පෙර, මොස්කව්හි කම්කරු සහ රතු හමුදා නියෝජිත සෝවියට් සභාව, වැඩි සතුටක් නොඋපදවන එම ආයතනය වසා දැම්මේය. (අත්පොළසන්). "සුහරොව්කා" කළු කඩය වසා තිබේ. නමුත්, දුෂ්ට ස්වභාවය ඇත්තේ එම වෙළෙඳ පොළ තුළ නොවේ. සුහරොව්ස්කයා චතුරශ්‍රයෙහි තිබුණු පැරණි "සුහරොව්කා" වෙළඳ පොළ වසා දමන ලදී. එසේ කිරීම දුෂ්කර දෙයක් නොවීය. නමුත් දුෂ්ටත්වය ඇත්තේ සෑම සුළු දේපළ හිමියෙකුගේම සිතෙහි සහ හැසිරීමෙහි රැඳී තිබෙන "සුහරොව්කාව" තුළය. වසා දැමිය යුත්තේ එම "සුහරොව්කාව" ය. ධනපති ක්‍රමයේ පදනම වන්නේ එම "සුහරොව්කාව" ය. එය පවතින කල්හි, ධනපතියන් ආපසු රුසියාවට පැමිණ අපට වඩා ශක්තිමත් වීමට ඉඩ තිබේ. එය පැහැදිලි ලෙස වටහා ගත යුතු වේ. එම වැටහීම අප කරන වැඩ කටයුතුවල මුල් උල්පත සහ අපගේ නියම ජයග්‍රහණ සලසන කොන්දේසිය හා ඒවායේ මිම්ම වන්නේය. අප ජීවත් වන්නේ සුළු ගොවීන්ගේ රටකය. කොමියුනිස්ට් ක්‍රමයට වඩා ධනපති ක්‍රමයට සුදුසු ආර්ථික පදනමක් රුසියාවේ ඇත. එය සිතෙහි දරා ගත යුතුය. අප ධනපති

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ක්‍රමයේ මුල් උදුරා දමා නැති බවත්, අභ්‍යන්තර සතුරාගේ අත්තිවාරම, නැතහොත්, පදනම දුර්වල කර නැති බවත්, ගම්බද ජීවිතය ගැන සුපරීක්ෂාකාරී ලෙස නිරීක්ෂණය කරමින් එය නාගරික ජීවිතය සමග සංසන්දනය කරන ඕනෑම කෙනෙන් දන්නේය. අභ්‍යන්තර සතුරා ඔහුගේ බලාපොරොත්තුව රඳවන්නේ කුඩා පරිමාණ නිෂ්පාදනය කෙරෙහිය. එය දුර්වල කිරීමට ඇත්තේ එකම ක්‍රමයක් පමණකි. එය නම්, කෘෂිකර්මාන්තය ඇතුළත්ව, රටේ ආර්ථිකය නව තාක්ෂණික පදනමක් මත, නවීන මහා පරිමාණ නිෂ්පාදනය මත පිහිටුවාලීමය. එම පදනම සම්පාදනය කෙරෙන්නේ විදුලි බලයෙන් පමණකි.

කොමියුනිස්ට් ක්‍රමය යනු සෝවියට් බලය සහ මුළු රටම විද්‍යුතනය කිරීම යන දෙකෙහි එකතුවයි. එසේ නැතහොත් රට සුළු ගොවියන්ගේ රටක් ලෙසින් පවතිනු ඇත. අපි එය පැහැදිලිවම වටහා ගත යුත්තෙමු අපි ධනපති ක්‍රමයට වඩා දුර්වල තත්ත්වයේ සිටිමු. ලෝක පරිමාණයෙන් පමණක් නොව, රට තුළද එසේමය. එය කවුරුත් දන්නා දෙයකි. අපි එය අවබෝධ කොට ගෙන සිටින්නෙමු. එනිසා ආර්ථික පදනම සුළු ගොවි පදනමක සිට මහා පරිමාණ කාර්මික පදනමකට පරිවර්තනය වන බවට අපි වග බලා ගන්නෙමු. අප සම්පූර්ණයෙන් ජයග්‍රාහී වන්නේ රට විද්‍යුතනය කළ විට සහ කර්මාන්තයක්, කෘෂිකර්මාන්තයක්, ප්‍රවාහණයත් නවීන මහා පරිමාණ කර්මාන්තයේ තාක්ෂණික පදනම මත පිහිටුවා ලූ විට පමණකි. එවිට පමණකි.

රට විද්‍යුතනය කිරීම සඳහා අපි දනටමත් ප්‍රාථමික සැලැස්මක් සකස් කර ඇත්තෙමු. අපගේ හොඳම විද්‍යාඥයන් හා කාර්මික ශිල්පීන් දෙසියයක් දෙනා එම කාර්යයෙහි යෙදුනහ. දීර්ඝ කාලයක් සඳහා, දස අවුරුද්දකට නො අඩු කාලයක් සඳහා ද්‍රව්‍ය සහ මුදල් ඇස්තමේන්තු පෙන්නුම් කරන සැලැස්මක් අපට ඇත. විද්‍යුතනය කිරීමේ කටයුත්ත සඳහා අපට ගඩොල් කී ලක්ෂයක් අවශ්‍ය වේද යනුත්, සිමෙන්ති පීප්ප කී ලක්ෂයක් අවශ්‍ය වේද යනුත් මෙම සැලැස්මෙන් පෙන්නුම් කෙරේ. මුදල් පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් බලන කල විද්‍යුතනය කිරීම සඳහා ඇස්තමේන්තුව රන් රූබල් කෝටි 100 සහ 120 අතර වේ. අපගේ රත්රන් සංචිතයෙන් මෙම මුදල කොහෙත්ම ගෙවිය නොහැකි බව ඔබ දන්නෙහිය. අපගේ ගබඩාගත ආහාර ද්‍රව්‍ය තොගද එතරම් විශාල නොවේ. එනිසා අපට මෙම ඇස්තමේන්තුවල සඳහන් වියදම් දැරීමට සිදු වන්නේ මා සඳහන් කළ සැලැස්ම අනුව සහන මාර්ගයෙනි. මෙම පදනම මත අපගේ කර්මාන්තය සහ අපගේ ප්‍රවාහනය ප්‍රකෘතිමත් කිරීම සැලසුම් කර තිබෙන ආකාරය හා ඒ සම්බන්ධ ගණනය ඔබට දැක ගත හැකිය.

මොස්කව් ගුබෙර්නියාවේ ඈතින් පිහිටි වලකලම්ස්ක් උයෙස්ද් ප්‍රදේශයේ මෑතදී පැවැත්වුනු ගොවිජන උත්සවයකට සහභාගි වීමට මට අවස්ථාව ලැබින. එහි ගොවි ජනයාට විදුලි එළිය ඇත. වීදියෙහි රැස්වීමක් පැවැත්වීමට සූදනම් කර තිබිණි. එහිදී එක් ගොවියෙක් ඉදිරියට අවුත්, ගොවි ජනයාගේ ජීවිතයේ මෙම නව සිද්ධිය ගැන අගය කරමින් කථා කළේය. ගොවීන් වන අපි ආලෝකය නැතිව සිටියෙමුයි ඔහු කීවේය. නමුත් දැන් අප අතරට ආලෝකය පැමිණ තිබේ. එය "අස්වාභාවික ආලෝකයකි. එය අපගේ වර්තමාන අන්ධකාරය දුරලනු ඇත." මට නම් මෙම වචන පුදුමයක් නොවිය. පාක්ෂික නොවන ගොවි පොදු ජනතාවට විදුලි එළිය "අස්වාභාවික" එළියක් බව සැබෑය. නමුත් අප "අස්වාභාවික" ලෙසට සලකන්නේ, ගොවි ජනතාව හා කම්කරුවන් ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ වියගසට බැඳී අවුරුදු සිය ගණන් සහ දහස් ගණන් එතරම් නොදියුණුව, දුප්පත්ව හා පීඩිතව සිටීමය. මෙම අන්ධකාරය පසු කොට ඉතාමත් සීඝ්‍ර ලෙස මතු වී ඒමට පුළුවන්කමක් ඔබට නොමැත. දැන් අප උත්සාහ දැරිය යුත්තේ, අප ගොඩ නගන සෑම විදුලි බලස්ථානයක්ම, පොදු ජනතාවට විදුලි බලය පිළිබඳ විඥනයක් යයි කිව හැකි ආකාරයේ හැඟීමක් දීම සඳහා ඥනයේ බලකොටුවක් බවට හැර වීමටය. දුසිම් ගණනක් වන මෙම කුඩා විදුලි බලස්ථාන කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීම හා සමග සම්බන්ධ වී තිබීමට හේතුව සියලු දෙනාටම පැහැදිලි කර දිය යුතුය. විද්‍යුතනකරණය සඳහා පිළිගත් සැලැස්මක් අපට ඇත. නමුත් මෙම සැලැස්ම සම්පූර්ණ කිරීම සඳහා අවුරුදු ගණනාවක් ගත වන සේ එය සැලසුම් කර තිබේ. මොන අමාරුවක් හෝ විඳ අපි මෙම සැලැස්ම සපුරාලිය යුත්තෙමු. එමෙන්ම එය සඳහා ගත කරන කාලයද අඩු කළ යුත්තෙමු. අපගේ මුල්ම ආර්ථික සැලැස්මවලින් එකක් වූ ප්‍රවාහනය ප්‍රකෘතිමත් කිරීම සඳහා සැලැස්ම — නියෝග අංක 1042 අවුරුදු පහකින් සපුරාලීමට අරමුණු කර තිබුණ නමුත්, අප වැඩ සටහනට වඩා ඉදිරියට ගොස් සිටින නිසා එම කාලය අවුරුදු තුන හමාරක් දක්වා අඩු කර තිබේ. මෙහිදීද, එම සාර්ථකත්වයම ලැබිය යුත්තෙමු. විද්‍යුතනය කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා, ධනපති ක්‍රමය වෙත නැවත කිසිසේත් ආපසු යාමට නොහැකි වන සේ වෙනස්කම් ඇති කරනු සඳහා අපට අවුරුදු දහය සිට විස්ස දක්වා කාලයක් අවශ්‍ය වනු ඇත. මෙය ලෝකයේ පෙර කිසිම තැනෙක නොදක්නා ලද විරූ සීඝ්‍ර සමාජ සංවර්ධනයක ආදර්ශයක් වනු ඇත. කොතරම් අමාරුකම් තිබුණත් මෙම සැලැස්ම සම්පූර්ණ කළ යුතුය. එසේම එය නිම කිරීමට නියමිත දිනය තවත් මෑත් කළ යුතුය.

නිදසුනක් ලෙසට ප්‍රවාහන ක්‍රමයේ මෙන් තනි කාර්මික කොට්ඨාශයන් තුළ උද්ගත වූ සහ කර්මාන්තයේ අනෙකුත් අංශවලට ගෙන යන ලද, ඒ ඒ කොට්ඨාශයට වෙන් වූ සැලසුම්වලට අමතරව අවුරුදු ගණනාවක් සඳහා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගණනය කොට සකස් කළ සමස්තමය සැලැස්මක්ද දැන් අපට ඇත. මේ ආකාරයෙන් ආර්ථික වැඩ කිරීමට අප යොමු වූ ප්‍රථම අවස්ථාව මෙයයි. මේවා කොමියුනිස්ට් ක්‍රමයේ ජයග්‍රහණය උදා කිරීම සඳහා කළ යුතුව තිබෙන අමාරු කාර්යයන් වන්නේය.

නමුත්, අපට සිටින නූගතුන් සමගින් විද්‍යුතනය කිරීම ක්‍රියාත්මක කළ නොහැකි බව අවබෝධ කර ගත යුතුය; මතක තබා ගත යුතුය. නූගත්කම අතා මකා දැමීමට අපගේ කොමිසම ප්‍රයත්න දරනු ඇත. නමුත් එය ප්‍රමාණවත් නොවේ. අතීතය සමග සසඳන කල එය විශාල වැඩ කොටසක් ඉටු කර තිබෙන නමුත්, කළ යුතුව තිබෙන දේ සමග සසඳන කල ඉටු කර තිබෙන කොටස අල්පය. අකුරු දැනුම පමණක් නොව, සංස්කෘතිමත් බව, ඥානවත් බව හා ශික්ෂිත බවද ලැබූ වැඩ කරන ජනයා අපට අවශ්‍යය. ගොවි ජනයාගෙන් බහුතරයකට අප ඉදිරියේ ඇති කර්තව්‍යයන් ගැන අවබෝධයක් ලබා දිය යුතුය. පක්ෂයේ මෙම වැඩ පිළිවෙළ, සෑම පාසලකම ප්‍රයෝජනයට ගන්නා මූලික පොතක් විය යුතුය. විද්‍යුතනකරණය සඳහා වූ පොදු සැලැස්මට අමතරව, රුසියාවේ සෑම දිස්ත්‍රික්කයක්ම සඳහා වෙන වෙනම සැලසුම් එහි ඇතුළත් කොට තිබෙන බව ඔබට පෙනෙනු ඇත. මේ අනුව බලන කල, පළාත්වලට යන සෑම සහෝදරයෙක්ම සමග, ඔහුගේ දිස්ත්‍රික්කය විද්‍යුතනය කිරීමේ නිශ්චිත සැලැස්මක් තිබුනු ඇත. එය අන්ධකාරයෙන් සහ නොදැනුවත්කමෙන් සාමාන්‍ය ජීවිතයකට පරිවර්තනය වීම සඳහා වූ යෝජනා ක්‍රමයකි. තවද සහෝදරවරුනි, ඔබට ඉදිරිපත් කර තිබෙන ප්‍රවාද සංසන්දන කර බැලීම, ඒවාට විස්තර එකතු කිරීම හා අදාළ තැනෙහිදීම ඒවායේ හරි වැරදි බැලීම ඔබට කළ හැක. ඔබ එසේ කළ යුතුය. ඕනෑම පාසලකදී, ඕනෑම අධ්‍යයන කවයකදී කොමියුනිස්ට්වාදය යනු කුමක්ද යන ප්‍රශ්නය අසනු ලැබූ කල ඊට දෙන පිළිතුරෙහි අඩංගු විය යුත්තේ පක්ෂ වැඩ පිළිවෙළෙහි ලියා ඇති දෙය පමණක් නොවේ. නූගත් තත්ත්වයෙන් අපට ගොඩ ආ හැක්කේ කෙසේද යන්නත් එම පිළිතුරෙන් කිව යුතු වේ.

රුසියාව විද්‍යුතනය කිරීම සහ ඇගේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා සැලැස්මක් සකස් කරන සේ අපගේ හොඳම මිනිසුන්ට, අපගේ ආර්ථික විශේෂඥයන්ට අප පැවරූ කාර්තව්‍යය ඔවුන් ඉටු කර තිබේ. මෙම කර්තව්‍යය කොතරම් ශ්‍රේෂ්ඨද, කොතරම් දුෂ්කරද යන්න සහ එයට සමීප විය යුත්තේ සහ එය ඉටු කළ යුත්තේ කෙසේද යන්න ගැන කම්කරුවන්ට සහ ගොවි ජනතාවට අවබෝධයක් ලැබෙන බවට අපි වග බලා ගත යුත්තෙමු.

සෑම ෆැක්ටරියක්ම, සෑම විදුලි බල ස්ථානයක්ම දැනුම පතුරුවන මධ්‍යස්ථානයක් වන බවට අපි වග බලා ගත යුත්තෙමු. රුසියාව සෑම තැනම ඝනව වසා සිටින ජාලකයක් සේ විදුලි බලස්ථාන සහ තාක්ෂණික යන්ත්‍ර ස්ථාන පැතිරී තිබේ නම්, අපගේ කොමියුනිස්ට් ආර්ථික සංවර්ධනය අනාගත සමාජවාදී යුරෝපයට සහ ආසියාවට ආදර්ශයක් වනු ඇත. (වේගවත් සහ දීර්ඝ අත්පොළසන්.)

1921 වර්ෂයේදී, ''අටවැනි සමස්ත රුසියා කම්කරු, ගොවිජන, රතු හමුදා සහ කොසාක් නියෝජිතයින්ගේ සෝවියට් සභා සම්මේලනය. සම්පූර්ණ වාර්තාව'' යන ප්‍රකාශනයෙහි පළ කරන ලදී

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 42, පිටු 128-161

2

විද්‍යුතනකරණය පිළිබඳ වාර්තාව ගැන (අටවැනි සෝවියට් සභා සම්මේලනයේ) යෝජනා කෙටුම්පත

රුසියාව විද්‍යුතනය කිරීමේ රාජ්‍ය කොමිසම් සභාවේ සභාපතිවරයාගේ වාර්තාව ඇසූ අටවැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය, රුසියාව විද්‍යුතනය කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීමෙන් ප්‍රථමයෙන්ම ජාතික ආර්ථිකය පිළිබඳ මහා මණ්ඩලයේ සභාපති මඩුල්ලත්, එමෙන්ම කෘෂිකර්මාන්ත කටයුතු භාර මහජන කොමිසාර් අංශය සහ දුම්රිය කටයුතු භාර මහජන කොමිසාර් අංශයත්, විශේෂයෙන්ම, රුසියාව විද්‍යුතනය කිරීමේ කොමිසමත් කළ වැඩ සම්බන්ධයෙන් ඒවාට සිය ස්තුතිය පළ කරයි.

හැකි තරම් ඉක්මණින් මෙම සැලැස්ම අංග පූර්ණසේ නිම කර නොවරදවාම එය අනුමත කරන ලෙස, මෙම සම්මේලනය, සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවටද, මහජන කොමිසාර් මණ්ඩලයටද, ශ්‍රම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ මණ්ඩලයටද, ජාතික ආර්ථිකය පිළිබඳ මහාමණ්ඩලයටද, එමෙන්ම වෙනත් මහජන කොමිසාර් අංශවලටද උපදෙස් දෙයි.

තවද, මෙම සැලැස්ම වෙනුවෙන් ඉතාමත් පුළුල් ප්‍රචාරයක් ගෙන යාමට සහ නගරවල හා ගම්බද පෙදෙස්වල සිටින පුළුල්තම ජනතා කොටස්වලට ඒ ගැන කරුණු වටහා දීමට සෑම පියවරක්ම ගන්නා ලෙස, සම්මේලනය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආණ්ඩුවට උපදෙස් දෙන අතර, එසේ කරන ලෙස සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයෙන් සහ සමස්ත රුසියා වෘත්තීය සමිති සම්මේලනයෙන් ඉල්ලයි. මෙම සැලැස්ම ගැන අධ්‍යයනය කිරීම, කිසිම විශේෂයක් නොමැතිව, සමූහාණ්ඩුවේ තිබෙන සියලුම අධ්‍යාපන ආයතනවලට හඳුන්වා දිය යුතුය. සෑම විදුලි බල ස්ථානයක්ම, තරමක් හෝ හොඳින් සංවිධානය වී ඇති සෑම පැක්ටරියක්ම සහ රජයේ ගොවිපළක්ම විදුලි බලය සහ නවීන කර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති උගැන්වීමේ මධ්‍යස්ථානයක්ද, විද්‍යුතනකරණය සඳහා සැලැස්ම ගැන ප්‍රචාරය කිරීමේ හා එය ක්‍රමානුකූල ලෙස අධ්‍යයනය කිරීමේ මධ්‍යස්ථානයක්ද බවට පත් විය යුතුය. ප්‍රමාණවත් තරම් විද්‍යාත්මක, නැතහොත්, ප්‍රායෝගික දැනුම ඇති පුද්ගලයන් සියලු දෙනාම විද්‍යුතනකරණ සැලැස්ම ගැන ප්‍රචාරක කටයුතු කිරීම සහ එය වටහා ගැනීමට අවශ්‍ය දැනුම අන් අයට දීම සඳහා සංවිධානය කර ගත යුතුය.

සෝවියට් ආයතන සියල්ලත්, සෝවියට් සභා සියල්ලත්, එමෙන්ම කම්කරුවන් සහ වැඩ කරන ගොවි ජනතාව සියලු දෙනාමත්, සියලු අමාරුකම් විදිමින්ම සහ සියලු බාධකයන් මධ්‍යයේම රුසියාව විද්‍යුතනය කිරීමේ මෙම සැලැස්ම ක්‍රියාත්මක කරනු පිණිස සෑම පරිශ්‍රමයක්ම දරනු ඇතැයිද, අවශ්‍ය සෑම පරිත්‍යාගයක්ම නොකර නොහරිනු ඇතැයිද යන දැඩි විශ්වාසය මෙම සම්මේලනය විසින් පළ කරනු ලැබේ.

1920 දෙසැම්බර් 21 හා 29 දින අතර ලියන ලදී. ප්‍රථමයෙන් 1930 දී වී. අයි. ලෙනින්ගේ කෘති එකතුවේ 2 වැනි හා 3 වැනි මුද්‍රණයේ 26 වැනි වෙළුමෙහි පළ කරන ලදී.

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 42, පිටු 196-197

LIBERATIONBASE

වෘත්තීය සමිති, වර්තමාන තත්ත්වය සහ ට්‍රොට්ස්කි හා බුහාරින් සහෝදරවරුන්ගේ වැරදි ගැන නැවත වරක්[44]

පක්ෂ තුළ සාකච්ඡා සහ අරගල තදින් ඇවිලී යයි. සම්මේලනයකට පෙර දක්නට ලැබෙන ආකාරයේ වන එම අරගල ළඟ එන රු. කො. ප. දහවැනි සම්මේලනයට තෝරා පත් කිරීම්වලට පූර්වයෙන්, ඒ සම්බන්ධව සිදුවන ඒවාය. ප්‍රථම කාණ්ඩවාදී ප්‍රකාශනය වූයේ ට්‍රොට්ස්කි සහෝදරයා "වගකිව යුතු කාරකවරුන් කීප දෙනෙක්" වෙනුවෙන් ඔහුගේ "වැඩ පිළිවෙළ පොත් පිංච" ("වෘත්තීය සමිතිවල කාර්ය කොටස හා කර්තව්‍යයන්" — 1920 දෙසැම්බර් 5 දින ඇති පෙරවදනක්ද සමග) මගින් පළ කළ දැය. ඊට තදනන්තරව, රු. කො. ප. පෙට්‍රොග්‍රෑඩ් සංවිධානය විසින් තියුණු ප්‍රකාශනයක් (එහි තියුණුකම සාධාරණ බව පහත එන කරුණුවලින් පාඨකයාට පෙනෙනු ඇත) නිකුත් කරන ලදී. ("පක්ෂයට ආයාචනයක්" — එය "පෙත්‍රොග්‍රාඩ්ස්කයා ප්‍රාව්ද" විසින් 1921 ජනවාරි 6 දින ද, පක්ෂයේ ප්‍රධාන නිල පුවත්පත වන මොස්කව් "ප්‍රාව්ද" විසින් 1921 ජනවාරි 13 දිනද පළ කරන ලදී). ඊළඟට මොස්කව් කාරක සභාව පෙට්‍රොග්‍රෑඩ් සංවිධානයට විරුද්ධව ("ප්‍රාව්ද" පත්‍රයේ එම කලාපයෙන්ම) ඉදිරිපත් විය. ඊළඟට ඉතා විශාල සහ වැදගත් පක්ෂ රැස්වීමක, එනම් අටවැනි සෝවියට් සභා සම්මේලනයේ රු. කො. ප. කණ්ඩායමේ 1920 දෙසැම්බර් 30 දින රැස්වීමේ සම්පූර්ණ වාර්තාව පළ විය. එය පළ කරන ලද්දේ සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයේ රු. කො. ප. කණ්ඩායම විසිනි. එය පළ කර ඇත්තේ "නිෂ්පාදනයේදී වෘත්තීය සමිතිවලට භාර වන කාර්ය කොටස" යන සිරස්තලය යටතේය (1921 ජනවාරි 6 දින සහිත පෙරවදනක්ද ඇතුළත් කර තිබේ). සාකච්ඡාවලට අදාළ වන ලියවිලි කිසිසේත් මෙයට සීමා නොවේ. මෙම ප්‍රශ්න සාකච්ඡා කිරීමට සෑම තැනෙකම පාහේ පක්ෂ රැස්වීම් පවත්වනු ලැබේ. 1920 දෙසැම්බර් 30 දින මම රැස්වීමකදී කථා කෙළෙමි. මා එහිදී කථා කළේ, මා එම අවස්ථාවේදී විස්තර කළ පරිදි "කාර්ය

https://liberationbase.wordpress.com

පටිපාටිය පිළිබඳ නියාමයන් බිඳිමිනි.'' නැතහොත්, මට සාකච්ඡාවට සහභාගි වීමට හෝ අනතුරුව කථා කළ කථිකයන් කී දේ ඇසීමට හෝ නොහැකි වූ කොන්දේසි යටතේය. එම වරද නිවැරදි කරමින් වඩාත් ''ක්‍රමානුකූල ලෙස'' මගේ අදහස් ප්‍රකාශ කිරීමට මම දැන් උත්සාහ කරමි.

පක්ෂයට කණ්ඩවාදී ප්‍රකාශයන් කිරීමේ අනතුර

ට්‍රොට්ස්කි සහෝදරයාගේ ''වෘත්තීය සමිතිවල කාර්ය කොටස ප්‍රකාශනයක්ද? එහි සන්ධාරය කුමක් වුවත්, මෙම වර්ගයේ ප්‍රකාශයන් කිරීමෙන් පක්ෂයට අනතුරක් වේද? මෙම ප්‍රශ්නය යටපත් කර දැමීමට ප්‍රයත්න දැරීම පෙට්‍රොග්‍රෑඩ් සහෝදරවරුන්ගේ කාණ්ඩවාදීත්වයක් දකින මොස්කව් කාරක සභාවේ සමාජිකයින්ගේ (නමුත් ට්‍රොට්ස්කි සහෝදරයා හැර) සහ බුහාරින් සහෝදරයාගේ හිතකාමී ව්‍යායාමය වී තිබේ. බුහාරින් සහෝදරයා මොන හේතුවක් නිසා හෝ ''බfපර් කණ්ඩායම''[45] වෙනුවෙන් 1920 දෙසැම්බර් 30 පහත සඳහන් පරිදි ප්‍රකාශ කළ යුතු තත්ත්වයට පත් වීය:

''... දුම්රියක් පෙරළෙන ආකාරයෙන් ගමන් කරන සේ පෙනෙන විට බfපරයක් තිබීම කිසිසේත් නරක දෙයක් නොවේ'' (1920 දෙසැම්බර් 30 දින සාකච්ඡාවේ වාර්තාව, පිටු 45).

එසේ නම් පෙරළීමක කිසියම් අන්තරායක් තිබේ. අන්තරාය මතු වූයේ කෙසේද, කොතැනද සහ කවදද යන ප්‍රශ්නය ගැන පක්ෂයේ බුද්ධිමත් සාමාජිකයන් නොසැලකිලිමත් වෙතියි අපට සිතන්නට පුළුවන්ද?

ට්‍රොට්ස්කි ඔහුගේ පොත පටන් ගන්නේ, එය ''සාමූහික කෘත්‍යයකැ'' යිද, එය සකස් කිරීමට ''වග කිව යුතු කාරකවරුන්, විශේෂයෙන්ම, වෘත්තීය සමිතිවාදීන් ගණනාවක් (සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයේ, ලෝහ කම්කරු සමිතියේ මධ්‍යම කාරක සභාවේ, ට්සෙක්ත්‍රාන් සහ වෙනත් සංවිධානවල සාමාජිකයන්) සහභාගි වූ බවද, එය ''වැඩ පිළිවෙළ පොත් පිංචකැ'' යිද කියමිනි. ''ඉදිරියේ එන පක්ෂ සම්මේලනයට වෘත්තීය සමිති ව්‍යාපාරයේ පවතින උපනති දෙකක් අතුරෙන් එකක් තෝරා ගැනීමට (අවධානය ට්‍රොට්ස්කිගේය) සිදු වනු ඇත'' යනුවෙන් එහි 4 වැනි ප්‍රවාදය අවසානයේදී අපට කියවන්නට ලැබේ.

මෙය මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙක් විසින් කාණ්ඩ සෑදීමක් නොවේ නම්, ''පෙරළෙන ආකාරයෙන් ගමන් කිරීමක්'' මෙයින් අදහස් නොවේ නම්, බුහාරින් සහෝදරයා හෝ ඔහු මෙන් සිතන ඔහුගේ ඕනෑම

සගයෙක් හෝ ''කාණ්ඩවාදය'' සහ ''පෙරළෙන ආකාරයෙන් ගමන් කරන සේ පෙනෙන'' යන වචනවලට දිය හැකි වෙනත් අර්ථයක් පක්ෂයට විස්තර කළ යුතුය. ''බfපරයක'' කොටස ඉටු කිරීමට කැමති සහ එවැනි ''පෙරළීමක අන්තරායක්'' ගැන ඇස් වසා ගන්නා අයට වඩා පෙනීම අඩු තවත් පුද්ගලයන් විය හැක්කේ කවුරුන්ද?

මදක් සිතන්න: මධ්‍යම කාරක සභාව පූර්ණ රැස්වීම් දෙකක් (නොවැම්බර් 9 සහ දෙසැම්බර් 7) පවත්වා, ට්‍රොට්ස්කි සහෝදරයාගේ මුල් කෙටුම්පත් තීසිස සහ පක්ෂය පිළිගත යුතු යයි ඔහු කියන මුළු වෘත්තීය සමිති ප්‍රතිපත්තියම ගැන පෙර නොවූ තරම් විස්තරාත්මක, දීර්ඝ සහ උණුසුම් ලෙස සාකච්ඡා කරන ලද පසුව, මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් දහනව දෙනාගෙන් එක් අයෙක් මධ්‍යම කාරක සභාවෙන් පිටස්තරව කණ්ඩායමක් සාදා ගෙන, එහි ''සාමූහික කෘතිය'' ''වැඩ පිළිවෙළක්'' ලෙසට ඉදිරිපත් කර ''උපනති දෙකකින් එකක් තෝරා ගන්නා'' ලෙස පක්ෂ සම්මේලනයට ආරාධනා කරයි! ට්‍රොට්ස්කි සහෝදරයා උපනති දෙකක් ගැන, දෙකක් පමණක් ගැන, 1920 දෙසැම්බර් 25 දින ප්‍රකාශයට පත් කළ අතර නොවැම්බර් 9 දින බුහාරින් ''බfපරයක්'' ලෙසින් ඉදිරිපත් වී ඇතත්, ඒවා එසේ වුවත්, බුහාරින් කණ්ඩායම ඉටු කරන කාර්ය කොටස ඉතාමත් නරක සහ ඉතාමත් හානිදායක ආකාරයේ කාණ්ඩවාදයකට අනුබල දීමකියි යන්න, මෙයින් ඉතා පැහැදිලි ලෙස හෙළදරව් වූ බව සැලකිල්ලට නොගෙන අමතර වශයෙන් සඳහන් කරමු. මම ඕනෑම පක්ෂ සාමාජිකයෙකුගෙන් මෙසේ අසන්නෙමි: මෙම ප්‍රහාරයත්, වෘත්තීය සමිති ව්‍යාපාරයේ උපනති දෙකෙන් එකක් ''තෝරා ගන්නා'' ලෙසට මෙසේ බල කිරීමත්, තරමක් හදිසියෙන් සිදු වූ දෙයක් නොවේද? නිර්ධන පංති ආඥාදායකත්වයේ තුන් අවුරුද්දකින් පසුව, වෘත්තීය සමිති ව්‍යාපාර ක්ෂේත්‍රයෙහි මේ ආකාරයෙන් ''පහර දෙන'' එක් සාමාජිකයෙක් හෝ සිටිනු දකින අපට පුදුමයට පත්වීම හැර වෙන දෙයක් කළ හැකිද?

නමුත්, එපමණක්ද නොවේ. මෙම පොත පුරාම ඇති කාණ්ඩවාදී ප්‍රහාරයන් දෙස බලන්න. ''දීර්ඝ කලකට පෙර පක්ෂය විසින් ප්‍රතික්ෂේප කරන ලද පිරිසිදු සහ සරල වෘත්තීය සමිතිවාදය වෙත ආපසු'' තල්ලු වී සිටින ''වෘත්තීය සමිති ව්‍යාපාරයේ යම් යම් කාරකවරුන්ට'' එල්ල කළ තර්ජනාත්මක ''සංඥාවක්'' එහි ප්‍රථම ප්‍රවාදයෙහිම අන්තර්ගත බව අපට පෙනේ (මෙහිදී පෙනෙන්නට ඇති ලෙසට පක්ෂය නියෝජනය වන්නේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් දහනව දෙනාගෙන් එක් අයෙකුගෙන් පමණකි). ''මුදුනෙහි සිටින වෘත්තීය සමිති කාරකවරුන් අතර බලපවත්වන ශිල්පීය ගතානුගතිකත්වය'' 8 වැනි ප්‍රවාදයෙන් වර්ණනාලංකාරයෙන් යුතුව හෙළා දකිනු ලැබේ. (නියම නිලධාරිවාදිත්වය අනුව ''මුදුන''

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෙරෙහි දක්වන අවධානය ගැන සටහන් කර ගන්න!) 11 වැනි ප්‍රවාදය ආරම්භ වන්නේ පුදුමාකාර තරම් උපක්‍රමශීලී, තීරණාත්මක සහ කාර්යානුබද්ධ...ඒ සඳහා යෙදිය හැකි වඩාත්ම ආචාරශීලී වචනය කුමක්ද... ''ඉහයකිනි.'' ''වෘත්තීය සමිතිවාදීන් අතුරෙන් බහුතරය'' පක්ෂයේ නව වැනි සම්මේලනයේ තීරණ කෙරෙහි දක්වන්නේ ''නාමික, එනම්, වාචක පිළිගැනීමක් පමණකැ'' යි එහි සඳහන් කර තිබේ.

වෘත්තීය සමිතිවාදීන් බහුතරය (!!) පක්ෂ තීරණ කෙරෙහි දක්වන්නේ වාචක පිළිගැනීමක් පමණකැයි කියන අප හමුවේ ඇති මහත් බලධාරී විනිශ්චය කරුවන් වර්ගය මෙයයි!

12 වැනි ප්‍රවාදයෙහි මෙසේ කියා ඇත:

''... සංහතියක් ඇති වීමට විරුද්ධව වෘත්තීය සමිතිවාදීහු බොහෝ දෙනෙක් වඩ වඩාත් ආක්‍රමණශීලී සහ නොසමහන්කාරී ස්ථාවරයක් ගෙන සිටිති... ඔවුන් අතර තොම්ස්කි සහ ලසොව්ස්කි යන සහෝදරවරුද සිටින බව අපට පෙනේ එපමණක්ද නොවේ. නව කර්තව්‍යයන්ට හා විධික්‍රමවලට හරස් වන වෘත්තීය සමිතිවාදීන් බොහෝ දෙනා ඔවුනතර සමායතන ස්වභාවයේ විශේෂත්වයේ සහ අදාළ ආර්ථික අංශයට අනුකර්ෂණය වන නව පුද්ගලයන් කෙරෙහි වූ සතුරුතාවයේ ජීවගුණයක් වැපිරීමට නැඹුරුවෙති. එයින් ඔවුන් ඇත්ත වශයෙන්ම කරන්නේ සංවිධාන වූ කම්කරුවන් අතර ශිල්පී-සංගම්වල නෂ්ඨාවශේෂයන් පෝෂණය කිරීමය.''

පාඨකයා මෙම තර්ක සුපරීක්ෂාකාරී ලෙස කියවා බලා, ඒවා ගැන සිතා බැලීම සුදුසුය. එම තර්ක ''මානිකායයන්''ගෙන් පිරී ඇත. පළමුව, මෙම ප්‍රකාශනය කාණ්ඩවාදයේ ස්ථාවරයෙන් අගය කළ යුතු වේ! ට්‍රොට්ස්කි සහ ''බොහෝ'' යුද්ධ හමුද කාරකවරුන් නිලධාරිවාදයේ ජීවගුණය වපුරතියිද, මිලේච්ඡත්වයේ නෂ්ඨාවශේෂයන් පෝෂණය කරතියිද, යනාදිය කියමින් ඔවුන්ට චෝදනා කරමින් තොම්ස්කි සහෝදරයා වැඩ පිළිවෙළක් ප්‍රකාශයට පත් කළේ නම්, ට්‍රොට්ස්කි මොනවා කියනු ඇද්ද යනුත්, එය කුමණ ආකාරයෙන් කියනු ඇද්ද යනුත් සිතා බලන්න. මෙහි ආක්‍රමණශීලීභාවයත්, කාණ්ඩවාදයත් නොදකින — ස්ථිර වශයෙන්ම සටහන් කර ගැනීමට අසමත් වන, එය සටහන් කර ගැනීමට අන්ත අපොහොසත්කමක් පාන — එමෙන්ම, පෙට්‍රොග්‍රෑඩ් සහෝදරවරුන්ගේ ප්‍රකාශයට වඩා එම තර්ක ඉතාමත් කාණ්ඩවාදී බව දැකීමට ප්‍රතික්ෂේප කරන බුහාරින්, ප්‍රියබ්‍රෂෙන්ස්කි, සිරිබ්‍රියකොව් සහ වෙනත් අය ඉටු කරන කාර්ය කොටස කුමක්ද?

දෙවැනිව,මාතෘකාවට සමීප වන ආකාරය ගැන වඩාත් සුපරීක්ෂාකාරීව විමසා බලන්න: වෘත්තීය සමිතිවාදීන් බොහෝ දෙනා ඔවුනතර — ''ජීවගුණයක් වගා කරති''... මෙය අන්ත නිලධාරිවාදී ප්‍රවේශයකි. මෙය මුළුමනින්ම, දශ ලක්ෂ ගණන් පොදු ජනතාවගේ සංවර්ධනය සහ ජීවන කොන්දේසි පිළිබඳ මට්ටම නොව, තොම්ස්කි සහ ලසොව්ස්කි ''ඔවුන් අතර'' වපුරන ''ජීවගුණය'' පිළිබඳ ප්‍රශ්නයකි.

තුන්වැනිව, ට්‍රොට්ස්කි සහෝදරාත්, බුහාරින් සහ සමාගමේ ''බෆරයන්'', එතරම් ප්‍රවේසම් සහිත ලෙස මහ හරිමින් හා වසං කරමින් සිටි මුළු විවාදයටම හරය වූ කරුණ ට්‍රොට්ස්කි සහෝදරයා විසින් නොදැනුවත්වම හෙළිදරව් කරන ලදී.

විවාදයට මුල් වූ කරුණ හා අරගලයේ උල්පත කුමක්ද? එයට මුල් වූයේ වෘත්තීය සමිතිවාදීන් බොහෝ දෙනෙක් නව කර්තව්‍යයන්ට සහ විධික්‍රමවලට හරස් වීමත්, නව නිලධාරීන් කෙරෙහි සතුරුතාවයේ ජීවගුණයක් වැපිරීමට නැඹුරු වීමත් යන කරුණද?

එසේ නැතහොත්, නිලධාරිවාදයේ වැඩකට නැති සහ හානිකර සීමාන්තයන් නිවැරදි කර ගැනීම ප්‍රතික්ෂේප කරන නව නිලධාරීන්ට විරුද්ධව සංවිධානය වූ කම්කරු පොදු ජනතාව පාන නිසි විරෝධය හා ඔවුන් ඉවත දැමීමට දක්වන සූදානමද?

එයට හේතුව කිසියම් අයෙක් ''නව කර්තව්‍යයන් හා විධික්‍රම'' වටහා ගැනීම ප්‍රතික්ෂේප කිරීමද?

එසේ නැතහොත්, නිලධාරිවාදයේ යම්කිසි වැඩකට නැති සහ හානිකර සීමාන්තයන් ආරක්ෂා කිරීම පිණිස කිසියම් අයෙක් නව කර්තව්‍යයන් සහ විධික්‍රම ගැන නානා කථා කියමින් ගෙනයන ස්වකීය ක්‍රියාමාර්ගය වසං කිරීමට දරන පිළිවෙළක් නැති ප්‍රයත්නයක්ද?

පාඨකයා මතක තබා ගත යුත්තේ විවාදයේ මෙම හරය ය.

විධිමාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදය සහ විප්ලවවාදී අවශ්‍යතාවය

''කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය වූකලී රූප වන්දනාවක් නොවේ'' යයි ට්‍රොට්ස්කි සහෝදරයා, ''සාමූහික කෘතියක ඵලයක්'' වන ඔහුගේ ප්‍රවාදවල සඳහන් කරයි. ''එහි එකම අර්ථය නම් විප්ලවවාදී අවශ්‍යතාවයය'' (23 වැනි ප්‍රවාදය).

ට්‍රොට්ස්කි සහෝදරයාගේ මෙම ප්‍රවාද නිසා ඔහු අවුලකට පත්ව තිබේ. එම ප්‍රවාදවල අන්තර්ගත නිවැරදි කොටස අළුත් නොවේ. එපමණක් නොව එම කොටස ඔහුට විරුද්ධව කරුණු කියන තත්ත්වයක් ගන්නේය. එහි ඇති අළුත් දේ සියල්ලම වැරදිය.

මම ට්‍රොට්ස්කි සහෝදරයාගේ නිවැරදි ප්‍රස්තුතයන් සටහන් කර ගත්තෙමි. ඒවා එම ප්‍රශ්නය (ග්ලාව්පොලිත්පුත්[46] ගැන) සම්බන්ධයෙන් පමණක් නොව අන් කරුණු සම්බන්ධයෙන්ද ඔහුට පටහැණි වන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විධිමාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදයේ නීති අනුව නම් මුළු මධ්‍යම කාරක සභාවටම විරුද්ධව වුව, කාණ්ඩවාදී වැඩ පිළිවෙළක් සමග ඉදිරිපත් වීමේ අයිතියක් ට්‍රොට්ස්කිට තිබිණි. ඒ ගැන විවාද කිරීමට ඉඩක් නැත. සාකච්ඡා කිරීමේ නිදහස සම්බන්ධයෙන් මධ්‍යම කාරක සභාව 1920 දෙසැම්බර් 24 දින ගත් එහි තීරණය අනුව, එය මෙම විධිමාත්‍ර අයිතිය අනුමත කළ බවද එසේම අවිවාදී කරුණකි. බුහාරින් බෆරය ට්‍රොට්ස්කිට මෙම විධිමාත්‍ර අයිතිය තිබෙන බව පිළිගනියි. නමුත් පෙට්‍රොග්‍රෑඩ් සංවිධානයට මෙම අයිතිය තිබෙන බව ඔහු නොපිළිගනියි. සමහර විට මෙයට හේතුව, 1920 දෙසැම්බර් 30 දින ඔහු කළ කථා අනුව ඔහු "කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ශුද්ධ සටන් පාඨය" පිළිගත් තත්ත්වයට වැටුනු නිසා විය යුතුය (සම්පූර්ණ වාර්තාව, පිටු 45)...

හොඳයි, නමුත් විප්ලවවාදී අවශ්‍යතාවය ගැන කියන්නේ කුමක්ද?

ට්‍රොට්ස්කි වැනි ප්‍රමුඛ නායකයෙක්, වෘත්තීය සමිති ව්‍යාපාරයේ ප්‍රශ්න ගැන කරන එවැනි ප්‍රකාශනයක් නිසා විප්ලවවාදී අවශ්‍යතාවයට යහපතක් සිදු වේ යයි සිහි බුද්ධිය ඇති ඕනෑම කෙනෙකුට, "ට්සෙක්ත්‍රාන්," නැතහොත්, "බෆර්" කාණ්ඩයේ කාණ්ඩවාදී ආත්ම වර්ණනාවෙන් අන්ධ නොවුනු හා බරපතල ලෙස සිතන ඕනෑම කෙනෙකුට කිව හැකිද?

ට්‍රොට්ස්කිගේ "නව කර්තව්‍යයන් සහ නව විධික්‍රම" ඇත්ත වශයෙන් අසාර්ථක නමුත් (ඒ ගැන පසුවට තබමු), ඒවා එතරම්ම සාර්ථක සේ සැලකුවත්, ඔහු ප්‍රශ්නයට සමීප වන ආකාරයම ඔහුටත්, පක්ෂයටත්, වෘත්තීය සමිති ව්‍යාපාරයටත්, දශ ලක්ෂ සංඛ්‍යාත වෘත්තීය සමිති සාමාජිකයින්ගේ පුහුණුවටත්, සමූහාණ්ඩුවටත් හානිකර බව ප්‍රතික්ෂේප කළ හැකිද??

කාරුණික බුහාරින් සහ ඔහුගේ කණ්ඩායම තමන් "බෆරය" යනුවෙන් හඳුන්වා ගත්තේ, එම නාමයෙන් ඔවුන් වෙත පැවරෙන වගකීම ගැන කල්පනා නොකිරීමට ඔවුන් තරයේ තීරණය කර ගෙන සිටින නිසා බව පෙනේ.

වෘත්තීය සමිති ව්‍යාපාරයේ භේද වීම් නිසා ඇතිවන දේශපාලනමය අනතුර

ලොකු මත භේද සමහර විට ඇති වන්නේ ඉතා කුඩා වෙනස්කම් වර්ධනය වී යාමෙන් බව කවුරුත් දනිති. එම වෙනස්කම් ප්‍රථමයෙන් කොහෙත්ම නොවැදගත් සේ පෙනෙන්නට පිළිවන. සැම කෙනෙක්ම ස්වකීය ජීවිතයේදී දුසිම් ගණනින් ලබන ස්වභාවයේ සුළු කැපුම්, නැතහොත්, සීරීම්

අතුරෙන් එකක් පැසවුවහොත් සහ ලේ විෂවීමට පටන් ගතහොත් එය ඉතා අනතුරුදායක සහ මරණීය පවා වන්නට පුළුවන. ඕනෑම වර්ගයක ගැටුමකින්, හුදෙක්ම පෞද්ගලික ගැටුමකින් පවා මෙය සිදු වන්නට පිළිවන. දේශපාලනයේදී ද මෙය සිදු වන්නේය.

ඕනෑම මත වෙනස්කමක්, නොවැදගත් මත වෙනස්කමක් පවා, භේදයක් දක්වා වර්ධනය වුවහොත් එය අනතුරුදායක වන්නට ඉඩ තිබේ. මා අදහස් කරන්නේ මුළු දේශපාලන ප්‍රාසාදයම චලනය කර විනාශ කරන ආකාරයේ භේදයන්ය. නැතහොත්, බුහාරින් සහෝදරයාගේ උපමාව යොදතොත්, දුම්රිය පෙරළීමකට තුඩු දෙන භේදයන්ය.

නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ පවතින රටක නිර්ධන පංති සහ නිර්ධන පංති පොදු ජනතාව අතර ඇති වන භේදයක් නිකම්ම අන්තරාදායක නොවන බව පැහැදිලිය. එය අත්‍යන්තයෙන්ම අන්තරාදායකය. විශේෂයෙන්ම, මේ රටේ නිර්ධන පංතිය ජනගහනයෙන් කුඩා අල්පතරයක් වන විට එවැනි භේදයක අන්තරාදායක බවෙහි සීමාවක් නැත. තවද, වෘත්තීය සමිති ව්‍යාපාරයේ (එම ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම පාහේ සංවිධානය වුනු නිර්ධන පංතියේ ව්‍යාපාරයක් බව මගේ 1920 දෙසැම්බර් 30 දින කථාවෙන් අවධාරණය කිරීමට මම බොහෝ වෙහෙස දැරුවෙමි) භේද යන්නෙන් අදහස් වන්නේ නිර්ධන පංති පොදු ජනතාව අතර භේදයන්ය.

1920 නොවැම්බර් 2-6 පැවැත්වුනු පස්වැනි සමස්ත රුසියා වෘත්තීය සමිති සාකච්ඡා සභාවේදී මුළු ආරාවුලම ඇති වූ විට (එය ආරම්භ වූයේ හරියටම එතැනිනි) සහ සාකච්ඡා සභාව අවසන් වූ වහාම... නැත, මා වැරදිය, — සාකච්ඡා සභාව අතරතුරදී දේශපාලන කාරක සභාව ඉදිරියේ මහත් උදහස් ලීලාවෙන් පෙනී සිටි තොම්ස්කි සහෝදරයා ඉතාමත් සන්සුන් ස්වභාවයෙන් යුත් රුද්සුතාක් සහෝදරයා ඔහුට එක හෙළාම ආධාර කළ අතර වෘත්තීය සමිති "සොලවා දැමීම" ගැන ට්‍රොට්ස්කි සහෝදරයා සාකච්ඡා සභාවේදී කථා කළ බවත්, ඔහු, එනම්, තොම්ස්කි එයට විරුද්ධ වූ බවත් කී විට, විවාදයට මුල් වී තිබෙන්නේ ප්‍රතිපත්තිය (පක්ෂයේ වෘත්තීය සමිති ප්‍රතිපත්තිය) බවත්, ට්‍රොට්ස්කි සහ ඔහු තොම්ස්කි සහෝදරයාට විරුද්ධව එල්ල කළ "සොලවා දැමීමේ" ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම වැරදි බවත් මම තීරණය කර ගත්තෙමි. මන්දයත්, "නව කර්තව්‍යයන් සහ විධික්‍රම" අනුව "සොලවා දැමීමේ" ප්‍රතිපත්තිය අර්ධ වශයෙන් යුක්ති යුක්ත වුවත් (ට්‍රොට්ස්කිගේ ප්‍රවාද අංක 12), වර්තමාන අවස්ථාවේදී එය කිරීමට යාමෙන් භේදයක තර්ජනයක් මතු වෙන නිසා එයට ඉඩ දිය නොහැකි හෙයිනි.

"ඉහළින් සොලවා දැමීමේ" ප්‍රතිපත්තිය තමන් පිට දැමීම "අන්ත අවනඩුවක්" බව දැන් ට්‍රොට්ස්කි සහෝදරයාට පෙනෙන්නේය. (එල්. ට්‍රොට්ස්කි "පෙට්‍රොග්‍රෑඩ් සහෝදරවරුන්ට පිළිතුරක්", "ප්‍රාව්දා" අංක 9, 1921

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජනවාරි 15.) නමුත් ''සොලවා දැමීම'' යනු නියම ''උගුල් වදනකි.'' එය එසේ වන්නේ, පස්වැනි සමස්ත රුසියා වෘත්තීය සමිති සාකච්ඡා සභාවේදී ට්‍රොට්ස්කි විසින් පළ කරන ලද පසු එය, ඔබ කියනු ඇති ලෙසට, පක්ෂය සහ වෘත්තීය සමිති මුළුල්ලේම ''ඇලී සිටි'' නිසා පමණක් නොවේ. අවාසනාවකට මෙන් ඊට වඩා බොහෝ ගැඹුරු අර්ථයකින්ද, එනම්, ''වෘත්තීය සමිතිවල කාර්ය කොටස සහ කර්තව්‍යයන්'' යන වැඩ පිළිවෙළ පොත් පිංචෙහි එන මුළු ජීවගුණයම,මුළු උපනතියම මූර්තිමත් කිරීමේ අර්ථයෙන්ද, අද වුවත්, එය උගුල් වදනක් වන්නේය. ට්‍රොට්ස්කි සහෝදරයාගේ මේ වැඩ පිළිවෙළ පොත් පිංච ''ඉහළින් සොලවා දැමීමේ'' ප්‍රතිපත්තියෙන් විනිවිද ගොස් තිබේ. තොම්ස්කි සහෝදරයාට විරුද්ධව නැතහොත්, ''වෘත්තීය සමිතිවාදීන් බොහෝ දෙනා'' ''ඔවුනතර නව පුද්ගලයන් කෙරෙහි වූ සතුරුතාවයේ ජීවගුණයක් වැපිරීමට නැඹුරු වෙති'' යි කියමින් ඔවුන්ට විරුද්ධව කරන ලද චෝදනාව පමණක් සිහියට නගන්න.

නමුත්, පස්වැනි සමස්ත රුසියා වෘත්තීය සමිති සාකච්ඡා සභාවේදී (1920 නොවැම්බර් 2-6) දක්නට ලැබුණේ භේදවලට තුඩු දෙන වාතාවරණයක් සකස් වීම පමණක් වන අතර 1920 දෙසැම්බරයේ මුල් භාගයේදී ට්සෙක්ත්‍රාන් තුළ භේදය යථාර්ථයක් බවට පත් විය.

අපගේ වාද විවාදවල දේශපාලන සාරාර්ථය වටහා ගැනීම සඳහා මෙම සිද්ධිය මූලික හා ඉතා වැදගත් වන්නේය. එනිසා කරුණු යටපත් කිරීමෙන් කටයුතුවලට පහසුවක් වේයයි ට්‍රොට්ස්කි සහ බුහාරින් යන සහෝදරවරු සිතති නම්, ඒ ඔවුන්ට වැරදීමකි. මෙම කරුණෙහිදී යටපත් කිරීම් නිසා බ්‍රප‍ර් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැත. එයින් සිදු වන්නේ ආවේගයන් ඇවිස්සීම පමණකි. එසේ කියන්නේ මෙම ප්‍රශ්නය සිදුවීම් විසින් න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙන නිසා පමණක් නොව, ට්‍රොට්ස්කි සහෝදරයා ඔහුගේ වැඩ පිළිවෙළ පත්‍රිකාවෙන්ද අවධාරණය කර තිබෙන හෙයිනි. කාරණයෙහි සාරාර්ථය වන්නේ ''වෘත්තීය සමිතිවාදීන් බොහෝ දෙනා ඔවුනතර නව පුද්ගලයන් කෙරෙහි සතුරුතාවයේ ජීවගුණයක් වැපිරීමට නැඹුරු'' වීමද එසේ නැතහොත්, නිලධාරිවාදයේ, නිදසුන් ලෙසට, ට්සෙක්ත්‍රාන්හි පවතින නිලධාරිවාදයේ යම් යම්, වැඩකට නැති හා හානිකර සීමාන්තයන්. නිසා පොදු ජනතාව දක්වන යුක්ති යුක්ත ''සතුරුතාවය'' ද, යන ප්‍රශ්නය මතු කර දක්වා ඇත්තේ, මා නැවත නැවතත් උපුටා දැක්වූ, ඡේද සහිත මෙම පොත් පිංචෙනි — විශේෂයෙන්ම එහි 12 වැනි ප්‍රවාදයෙනි.

සිනොවියෙව් සහෝදරයා 1920 දෙසැම්බර් 30 දින ඔහු කළ ප්‍රථම කථාවෙන්ම එක එල්ලේම හා නිවැරදි ලෙසට මෙම ප්‍රශ්නය මතු කළේය. භේදයක් ඇති කළේ ''ට්‍රොට්ස්කි. සහෝදරයාගේ අසංයත අනුගාමිකයන්'' යයි ඔහු එහිදී කීවේය. බුහාරින් සහෝදරයා සිනොවියෙව් සහෝදරයාගේ

කථාව ගැන ගර්හාමුඛයෙන් සඳහන් කරමින් එය ''සැර හුළං පිඹීමක්'' ලෙසට විස්තර කළේ එනිසා විය හැකිද? නමුත්, එය සැබෑවක් නොවන බව 1920 දෙසැම්බර් 30 දින සම්පූර්ණ වාර්තාව කියවන සෑම පක්ෂ සාමාජිකයෙකුටම පෙනෙනු ඇත. සත්‍ය කරුණු ඉදිරිපත් කරන්නේ සහ උපයෝගි කර ගන්නේ සිනොවියෙව් සහෝදරයා බවත්, සත්‍ය කරුණු රහිත බුද්ධිවාදී වචන බාහුල්‍යතාවයක් දක්වන්නේ ට්‍රොට්ස්කි සහ බුහාරින් බවත්, ඔහුට පෙනෙනු ඇත.

''ට්සෙක්ත්‍රාන් මැටියෙන් කළ පාදවලින් සිට ගෙන සිටින අතර දැනටමත් කොටස් තුනකට බිඳී ඇතැ'' යි යනුවෙන් සිනොවියෙව් සහෝදරයා කී විට සස්නොව්ස්කි සහෝදරයා ඔහුට බාධා කරමින් මෙසේ කීවේය:

''ඔබ එය දිරි ගැන්නුවා'' (සම්පූර්ණ වාර්තාව, පිටු 15).

මෙය නම් බරපතල චෝදනාවකි. එය ඔප්පු කළහොත්, වෘත්තීය සමිති අතුරෙන් එකක් තුළ පවා භේදයක් දිරි ගැන්වීමේ වරදට හසු වූ අයට මධ්‍යම කාරක සභාව තුළවත්, රු. කො. ප. තුළවත්, අපගේ සමූහාණ්ඩුවේ වෘත්තීය සමිති තුළවත් තැනක් නොමැති වනු ඇත. වාසනාවකට මෙන් මෙම බරපතල චෝදනාව ඉදිරිපත් කරන ලද්දේ අවකල්පනාවෙනි. එය ඉදිරිපත් කරන ලද්දේ මා කණගාටුවෙන් සඳහන් කළ යුතු පරිදි මෙයට පෙර වරින් වර කල්පනාවෙන් තොරව විවාදයෙන් ''ඇදී ගිය'' සහෝදරයෙකු විසිනි. වෙනත් අංශවලින් විශිෂ්ට, නිදසුනක් ලෙසට, නිෂ්පාදන ප්‍රචාරය ගැන වූ ඔහුගේ ලිපිවලට පවා ''කිරි මුට්ටියට ගොම බිඳක්'' දැමීමට සස්නොව්ස්කි සහෝදරයා සමත් විය. මේ නිසා ඔහුගේ නිෂ්පාදන ප්‍රචාරය පිළිබඳ හොඳ සියල්ල නොහොඳ අතට හැරවීමේ නැඹුරුවක් පෙනෙන්නට තිබේ. සමහර (බුහාරින් සහෝදරයා වැනි) අය කොතරම් වාසානා ගුණයෙන් සංයුක්ත වී සිටිත් ද යත්, සටන ඉතාමත් දරුණු ලෙස සිදුවන අවස්ථාවෙහිදී පවා තමන්ගේ ප්‍රහාරයට විෂ කැවීමෙහි ඔවුහු අපොහොසත් වෙති. ඊට වඩා අඩු වාසනා ගුණයකින් සංයුක්ත අය එසේ කරන්නට ඉඩ ඇත. නිතර නිතර එසේ කරති. මේ සම්බන්ධයෙන් වූ කල සස්නොව්ස්කි සහෝදරයා ප්‍රවේසමෙන් පිය නැගීම මැනවි. සමහර විට එහිදී ඔහු ඔහුගේ මිතුරන්ගේ ආධාරය පැතීම පවා සුදුසුය.

නමුත්, අවකල්පනාවෙන්, අවාසනාවන්ත ලෙස හා පැහැදිලිව පෙනෙන සේ ''කාණ්ඩවාදී'' ලෙස වුවද, චෝදනාව ඉදිරිපත් කර ඇතැයි සමහරු කියනු ඇත. බරපතල ප්‍රශ්නයකදී කරුණු වසං කරනවාට වඩා, නරක හෝ වදන්ගත කරන ලද සත්‍යය හොඳය.

මෙය බරපතල කරුණක් බවට කිසිම සැකයක් නැත. සාමාන්‍ය වශයෙන් අනුමාන කරනවාට වඩා මෙම ප්‍රශ්නයේ අරටු කොටස මෙම ක්ෂේත්‍රයෙහි රැඳී තිබෙන බව මම නැවතත් කියන්නෙමි. වාසනාවකට

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

මෙන්, සස්නොව්ස්කි සහෝදරයා ඉදිරිපත් කළ කරුණට හරවත් පිළිතුරක් දීමට තරම් සෑහෙන වාස්තවික සහ තීරණාත්මක කරුණු අප සතුව තිබේ.

ප්‍රථමයෙන්ම, සස්නොව්ස්කි සහෝදරයාගේ චෝදනාව ප්‍රතික්ෂේප කරමින් හා තීරණාත්මක සත්‍ය කාරණා ගැන ඒකාන්ත ලෙස සඳහන් කරමින් සිනොවියෙව් සහෝදරයා කළ ප්‍රකාශය සම්පූර්ණ වාර්තාවේ එම පිටුවෙහිම ඇත. ට්‍රොට්ස්කි සහෝදරයාගේ චෝදනාව (කාණ්ඩවාදී උත්සුක්තභාවය පිටාර යාමකදී කරන ලද්දක් බව මම එකතු කරන්නෙමි) සස්නොව්ස්කි සහෝදරයාගේ චෝදනාවට වඩා වෙනස් බැව් සිනොවියෙව් සහෝදරයා පෙන්නුම් කළේය. ට්‍රොට්ස්කි සහෝදරයාගේ චෝදනාව වූයේ, රු. කො ප. සැප්තැම්බර් සමස්ත රුසියා සාකච්ඡා සභාවෙහිදී සිනොවියෙව් සහෝදරයා කළ කථාව භේදයක් ඇති වීමට අනුබලයක් විය, නැතහොත්, භේදයක් ඇති කළේය යනුයි. (සිනොවියෙව් සහෝදරයගේ සැප්තැම්බර් කථාව හරය වශයෙන් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් කරන ලද නිසා සහ මේ දක්වාම ඊට විරුද්ධව විධිමත් විරෝධයක් ඉදිරිපත් වී නොමැති නිසාම පමණක් වුවද, මෙම චෝදනාව කොහෙත්ම පිළිගත නොහැකි බව මම අමතර වශයෙන් කියමි.)

''මගේ (සිනොවියෙව්ගේ) කුමණ කථාවකටත් බොහෝ කලකට පෙර සහ සමස්ත රුසියා සාකච්ඡා සභාවටද බොහෝ කලකට පෙර, මේ ප්‍රශ්නය ට්සෙක්ත්‍රාන්හි නිලධාරිවාදයේ යම් යම් නොමනා සහ හානිදයක සීමාන්තයන් ගැන වූ ප්‍රශ්නය ගැන සයිබීරියාවෙහිදී, වොල්ගා පෙදෙසෙහිදී, උතුරෙහිදී සහ දකුණෙහිදී පරීක්ෂා කරන ලද'' බව ඔප්පු කිරීමට රුද්සුතාක් සහෝදරයා මධ්‍යම කාරක සභාවේදී වාර්තාවලින් කරුණු දක්වා ඇති බව කියමින් සිනොවියෙව් සහෝදරයා පිළිතුරු දුන්නේය.

මෙය ඉතාමත් ඒකාන්ත සහ පැහැදිලි සත්‍යයක් කියන ප්‍රකාශයකි. සිනොවියෙව් සහෝදරයා එම ප්‍රකාශය කළේ, ඉතාමත් වගකිව යුතු පක්ෂ සාමාජිකයන් දහස් ගණනක් ඉදිරියේ කරන ලද ඔහුගේ ප්‍රථම කථාවෙනි. තවද, ඊට පසු දෙවරක් කථා කළ ට්‍රොට්ස්කි සහෝදරයා හෝ එසේම පසුව කථා කළ බුහාරින් සහෝදරයා හෝ සිනොවියෙව් සහෝදරයා ඉදිරිපත් කළ කරුණු නිෂ්ප්‍රභා කළේ නැත.

දෙවැනිව, එම සම්පූර්ණ වාර්තාවෙහිම දක්වා ඇති, ජල ප්‍රවාහනයෙහි වැඩ කරන කොමියුනිස්ට්වරුන් සහ ට්සෙක්ත්‍රාන් සාකච්ඡා සභාවේ කොමියුනිස්ට් කණ්ඩායම අතර ආරාවුල සම්බන්ධයෙන් වූ රු. කො. ප. මධ්‍යම කාරක සභාවේ පූර්ණ සභා රැස්වීමේ 1920 දෙසැම්බර් 7 දින යෝජනාව, සස්නොව්ස්කි සහෝදරයාගේ චෝදනාව ඊටත් වඩා නිශ්චිත වශයෙන් හා නිල වශයෙන් ප්‍රතික්ෂේප කරන්නක් විය. යෝජනාවෙහි ට්සෙක්ත්‍රාන් ගැන සඳහන් වන කොටස මෙසේය:

''ට්සෙක්ත්‍රාන් සහ ජල ප්‍රවාහන කම්කරුවන් අතර ආරාවුල හා සම්බන්ධයෙන් මධ්‍යම කාරක සභාව මෙසේ තීරණය කරයි: 1 ඒකාබද්ධ ට්සෙක්ත්‍රාන් තුළ ජල ප්‍රවාහන අංශයක් පිහිටුවීමට. 2 පෙබරවාරි මාසයේදී දුම්රිය සේවකයන්ගේ සහ ජල ප්‍රවාහන කම්කරුවන්ගේ සම්මේලනයක් කැඳවීමට සහ නව ට්සෙක්ත්‍රාන් සභාවක් සඳහා සාමාන්‍ය තෝරා පත් කිරීම් කිරීමට. 3 එතෙක් පරණ ට්සෙක්ත්‍රාන් සභාවට කටයුතු කිරීමට ඉඩ දීමට. 4 වහාම ග්ලාව්පොලිත්වොද් සහ ග්ලාව්පොලිත්පුත් අහෝසි කිරීමට සහ ඒවායේ අරමුදල් හා සම්පත් සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගය අනුව වෘත්තීය සමිතියට මාරු කිරීමට.''

මෙයින් පෙනෙන්නේ ජල ප්‍රවාහන කම්කරුවන් දෝෂ දර්ශනයට ලක් කිරීමක් සිදුවී නොමැති අතර සෑම වැදගත් කරුණක්ම අනුව ඔවුන් නිවැරදි සේ සලකන ලද බවයි. එහෙත්, 1921 ජනවාරි 14 පොදු වැඩ පිළිවෙළට අත්සන් තැබූ මධ්‍යම කාරක සභා සාමාජිකයන් අතුරෙන් කිසිවෙක් (කාමෙනෙව් හැර) යෝජනාවට ඡන්දය දුන්නේ නැත. (මෙහි සඳහන් කෙරෙන වැඩ පිළිවෙළ නම්, මධ්‍යම කාරක සභාවේ සහ වෘත්තීය සමිති කාරක සභාවේ සාමාජිකයන් කණ්ඩායමක් විසින් මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කරන ලද ''වෘත්තීය සමිතිවල කාර්ය කොටස සහ කර්තව්‍යයන්'' නමැති රු. කො. ප. දහවැනි සම්මේලනයේ කෙටුම්පත් තීරණ යන්නය. එය අත්සන් කළ අය අතර මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙක් නොවන හා වෘත්තීය සමිති කොමිසමේ සාමාජිකයෙක් වන ලසොව්ස්කි සහෝදරයාද විය. එයට අත්සන් කළ අන්‍යයන් වූයේ තොම්ස්කි, කලිනින්, රුද්සුතාක්, සිනොවියෙව්, ස්ටාලින්, ලෙනින්, කාමෙනෙව්, පෙත්රොව්ස්කි සහ ආර්තියොම් සර්ගෙයෙව් ය.)[47]

මෙම යෝජනාව ඉහත සඳහන් ම. කා. සාමාජිකයන්ට විරුද්ධව එනම්, අපගේ කණ්ඩායමට විරුද්ධව සම්මත විය. එසේ කියන්නේ පරණ ට්සෙක්ත්‍රාන් සභාව තවදුරටත් පවත්වා ගෙන යාමට විරුද්ධව අපගේ ඡන්දය දෙන්නට තිබුණ හෙයිනි. අප කණ්ඩායමේ ජයගැනීම ස්ථිර තත්ත්වයක තිබුණ නිසා, ට්‍රොට්ස්කිට බුහාරින්ගේ යෝජනාවට ඡන්දය නොදී සිටීමට බැරි විය. නොඑසේ වී නම් අපගේ තීරණය සම්මත කරනු ලබන්නට තිබිණි. නොවැම්බරයේදී ට්‍රොට්ස්කිට පක්ෂව සිටි රීකොව් සහෝදරයා, ට්සෙක්ත්‍රාන් සහ ජල ප්‍රවාහන කම්කරුවන් අතර ආරාවුල ගැන වෘත්තීය සමිති කොමිසම කළ පරීක්ෂාවට දෙසැම්බරයේදී සහභාගි වූ හෙයින්, ජල ප්‍රවාහන කම්කරුවන් නිවැරදි බව ඔහු දුටුවේය.

මෙසේ සම්පිණ්ඩනය කරමු. දෙසැම්බර් 7 දින මධ්‍යම කාරක සභා බහුතරය සමන්විත වූයේ, ට්සෙක්ත්‍රාන් සභාවට විරුද්ධව සිටියේ යයි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිසිසේත් සිතිය නොහැකි ට්‍රොට්ස්කි, බුහාරින්, ප්‍රියබ්‍රෂෙන්ස්කි, සිරිබ්‍රියාකොව් සහ වෙනත් ම. කා. සාමාජික සහෝදරවරුන්ගෙනි. එහෙත් මේ බහුතරයේ යෝජනාවෙන් දෝෂ දර්ශනයට ලක් කෙරුණේ ජල ප්‍රවාහන කම්කරුවන් නොව ට්සෙක්ත්‍රාන් සභාවය. එම යෝජනාව ට්සෙක්ත්‍රාන් සභාව හිටි වනම හා එක්වරම විසුරුවා නොහැර නැවතුනා පමණකි. සස්නොව්ස්කිගේ චෝදනාව සම්පූර්ණයෙන්ම පදනම් විරහිත බව මෙයින් ඔප්පු වේ.

ද්වයාර්ථතාවයට ඉඩ නොතැබීමට නම්, සලකා බැලිය යුතු තවත් කරුණක් ඇත. මා යළි යළිත් සඳහන් කර තිබෙන "නිලධාරිවාදයේ යම් යම් නොමනා සහ හානිකර සීමාන්තයන්" වූයේ මොනවාද? මෙම චෝදනාව හේතු විරහිත, නැතහොත්, අතිශයෝක්තිමත් එකක් නොවේද?

නැවතත්, අයෙකුට අපේක්ෂා කළ හැකි තරම් නියත වශයෙන් පිළිතුර සැපයුවේ සිනොවියෙව් සහෝදරයාය. 1920 දෙසැම්බර් 30 දින ඔහුගේ ප්‍රථම කථාවෙන්ම එම පිළිතුර සපයා ඇත. 1920 මැයි 3 දින සෝෆ් සහෝදරයා විසින් පළ කළ ජල ප්‍රවාහන චක්‍ර ලේඛනයේ[48] මෙසේ සඳහන්ව ඇති බව ඔහු ගෙන හැර දක්වූයේය: "ඒකාකාර කාරක සභා වැඩ අවලංගු කරනු ලැබේ." සිනොවියෙව් සහෝදරයා එම මූලික වැරැද්ද හරි ලෙස හැඳින් වීය. නිලධාරිවාදයේ නොමනා සහ හානිකර සීමාන්තයන් සහ "පත්කිරීම් ක්‍රමය" එයින් මූර්තිමත් විය. නමුත් පත් කරන ලද සමහර අය සෝෆ් සහෝදරයා මෙන් "අඩක්වත් පළපුරුද්ද හා ඔරොත්තු දීම ඇති අය නොවේ" යයි සිනොවියෙව් සහෝදරයා එහිදීම, එවරම කීවේය. සො ප් සහෝදරයා ඉතාමත් අගනා කාරකවරයෙක් බව සඳහන් වනු මම මධ්‍යම කාරක සභාවේදී අසා ඇත්තෙමි. ආරක්ෂක මණ්ඩලයේදී මා නිරීක්ෂණය කළ කරුණුවලින්ද ඒ බව සම්පූර්ණයෙන්ම සනාථ වේ. එවැනි සහෝදරවරු (කිසිම හේතුවක් නැතිව ට්‍රොට්ස්කි ඔහුගේ වාර්තාවෙහි 25 වැනි පිටුවෙහි සඳහන් කරන ලෙසට) "මුව හමක්" කර ගැනීම හෝ ඔවුන්ගේ අධිකාරය දුර්වල කිරීම හෝ ගැන කිසිවෙක් සිතුවේ වත් නැත. ඔවුන්ගේ අධිකාරය දුර්වල කිරීමට උත්සාහ කරන්නේ "පත්වීම් ලැබූවන්ගේ" වැරදි හැදීමට උත්සාහ කරන අය නොව, ඔවුන් වැරදි කරන විට පවා ඔවුන් ආරක්ෂා කරන අයයි.

එනිසා වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ භේද ඇති වීමේ අන්තරාය සිතින් මවා ගත් එකක් නොව යථාර්ථයක් බව මෙයින් පෙනේ. තවද, නියම අසමඨයන්ට හේතුව වූයේ නිලධාරිවාදයේත්, පත් කිරීම් ක්‍රමයේත් යම් යම් නොමනා සහ හානිකර සීමාන්තයන් සාධාරණ කර දක්වීම, නැතහොත් ආරක්ෂා කිරීම නොකර ඒවා නිවැරදි කළ යුතුය යන ඉල්ලීම බව අපට පෙනේ. ඊට වඩා දෙයක් එහි නැත.

මූලික අසමඨතාවයන් පවතින කල, එනිසා තියුණුතම සහ ඉතාමත් කාණ්ඩවාදී ප්‍රකාශන කිරීම යුක්ති යුක්ත නොවන්නේද යන ප්‍රශ්නය අපෙන් අසන්නට ඉඩ තිබේ. සම්පූර්ණයෙන්ම නව සහ නොතේරෙන අදහසක් වටහා දීමේ අවශ්‍යතාවය තිබේ නම්, භේදයන් වැනි දෙයක් යුක්ත යයි කිව හැක්කේද?

අසමඨයන් ඇත්ත වශයෙන්ම ඉතාමත් ගැඹුරුනම් සහ පක්ෂයේ නැතහොත්, කම්කරු පංතියේ වැරදි උපනතියක් නිවැරදි කිරීමට වෙනත් මාර්ගයක් නොමැති නම්, එය යුක්ති යුක්ත සේ දක්විය හැකි යයි මම අදහස් කරමි.

නමුත් එවැනි අසමඨයන් කිසිවක් නැත. අසමඨයන් පෙන්වා දීමට ට්‍රොට්ස්කි සහෝදරයා උත්සාහ කළ නමුත්, ඔහුට එය කළ නොහැකි විය. ඔහුගේ (දෙසැම්බර් 25) පොත පළ කිරීමට පෙර උත්සාහ කර බැලීමේ, නැතහොත්, සමහන්කාරී ආකාරයේ මඟක් ගැනීමට ඉඩ තිබිණ. එවැනි මඟක් ගැනීම අවශ්‍ය විය. ("අසමඨයන් සහ නොපැහැදිලි නව කර්තව්‍යයන් පවා එවැනි මඟක් ගැනීම බැහැර කෙරේ". නමුත් එය පළ කිරීමෙන් පසුව අපට මෙසේ කීමට සිදු විය: ට්‍රොට්ස්කි සහෝදරයා ඔහු ඉදිරිපත් කරන අළුත් කරුණු සියල්ලම සම්බන්ධයෙන් වැරදිය.

ඔහුගේ ප්‍රවාද සහ පස්වැනි සමස්ත රුසියා වෘත්තීය සමිති සාකච්ඡා සභාව නොවැම්බර් 2-6 විසින් පිළිගන්නා කල මෙය ඉතා හොඳින් පෙනේ. මා දෙසැම්බර් 30 දින කළ කථාවෙහිදී සහ "ප්‍රාව්දා" පත්‍රයේ ජනවාරි 21 කලාපයෙහි ඉහත පසු කී ප්‍රවාදයන්ගෙන් කරුණු උපුටා දක්වීමි. ඒවා ට්‍රොට්ස්කිගේ ප්‍රවාදයන්ට වඩා අංග පූර්ණය. වඩාත් නිවැරදිය. ට්‍රොට්ස්කි රුද්සුතාක්ට වඩා වෙනස් දෙයක් කියන සෑම තැනකදීම ඔහු වැරදිය.

බුහාරින් සහෝදරයා ඉතාමත් නොඉවසිලිමත්ව දෙසැම්බර් 7 මධ්‍යම කාරක සභා යෝජනාවට ඇතුළත් කළ මෙම සුප්‍රසිද්ධ "කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය" ගෙන බලන්න. මෙම විකාර සංකල්පය ("තෛරාටික අලංකාර වදන්") හුදෙක් ලිපියක, නැතහොත්, කථාවක සඳහන් විනි නම්, ඒ ගැන වාද කර ගැනීමේ තේරුමක් නොවන්නට තිබුණු බව ඇත්තය. නමුත් මෙම යෙදුමම ඉතාමත් උචමනාවෙන් තමන්ගේ ප්‍රවාදවල ඇතුලත් කිරීමෙන් ට්‍රොට්ස්කි හා බුහාරින් තමන්ම විකාර තත්ත්වයකට පත් වූහ. ඔවුන්ගේ "වැඩ පිළිවෙළවල්" වෘත්තීය සමිති විසින් පිළිගන්නා ලද රුද්සුතාක්ගේ ප්‍රවාදවලින් වෙනස් වන කරුණු අතුරෙන් එකක් මෙයය!

මෙම යෙදුම න්‍යායික වශයෙන් වැරදිය. අවසාන වශයෙන් විග්‍රහ කර බලන කල සෑම වර්ගයක ප්‍රජාතන්ත්‍රවාදයක්ම, පොදු වශයෙන් දේශපාලන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උඩුව්‍යුහයක් ලෙසින් (පංති නැති කර පංති රහිත සමාජයක් ස්ථාපිත කරන තෙක් එය තිබිය යුතුය) නිෂ්පාදනයට උපයෝජනය වන අතර, එය අන්තිමේදී නිර්ණය වන්නේ ඒ ඒ සමාජයේ නිෂ්පාදන සම්බන්ධතාවන් අනුවය. එනිසා, ඕනෑම වෙනත් වර්ගයේ ප්‍රජාතන්ත්‍රවාදයක් තුළින් ''කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය'' වෙන්කොට ගැනීම අර්ථ විරහිතය. එයින් ව්‍යාකූලත්වයක් ඇතිවන අතර එහි ප්‍රතිඵලය වන්නේ නැති දෙයක් ඇති සැටියට ගැනීමය. ප්‍රථම කරුණ එයයි.

දෙවැන්න. බුහාරින් විසින් කෙටුම්පත් කරන ලද හා දෙසැම්බර් 7 දින පූර්ණ මධ්‍යම කාරක සභා රැස්වීමෙන් අනුමත කෙරුණු යෝජනාවෙන් බුහාරින්ම සපයා ඇති පැහැදිලි කිරීම දෙස ඔබ සූපරීක්ෂාකාරී ලෙස බලන්නේ නම්, ඔහු මෙසේ කියන බව ඔබට පෙනෙනු ඇත: ''ඒ අනුව, කම්කරු ප්‍රජාතන්ත්‍රවාදයේ විධික්‍රම විය යුත්තේ කාර්මික ප්‍රජාතන්ත්‍රවාදයේ විධික්‍රමය. එයින් අදහස් වන්නේ...'' — මෙහි එන ''එයින් අදහස් වන්නේ'' යන්න සටහන් කර ගන්න! බුහාරින් පොදු ජනතාව වෙත ඉදිරිපත් කරන ඔහුගේ ආයාචනය ආරම්භ කිරීමට ඔහු ගන්නා යෙදුම කොතරම් පර භාෂිතයක්ද, එයට සැරසිල්ලක් එකතු කිරීමට ඔහුට සිදුවේ. ප්‍රජාතන්ත්‍රවාදී ස්ථාවරය අනුව බලන කල මෙය ප්‍රජාතන්ත්‍ර විරෝධී යයි මම අදහස් කරමි. ඔබ පොදු ජනතාව අමතා ලියන විට සැරසිලි අවශ්‍ය නොවන යෙදුම් උපයෝගී කර ගතයුතු වේ. ''නිෂ්පාදනයේ'' ස්ථාවරයෙන් බලන කල, එය අයහපත්ය. මා එසේ කියන්නේ අනවශ්‍ය යෙදුම් විස්තර කිරීමෙන් කාලය නාස්ති වන හෙයිනි. — ''එයින් අදහස් වන්නේ, අපේක්ෂකයින් නම් කිරීම, නාම යෝජනා ස්ථිර කිරීම හා තෝරා පත් කිරීම ආදිය, ඔවුන්ගේ දේශපාලන දැඩි බව පමණක් නොව, ව්‍යාපාරික කාර්යක්ෂමතාවයත්, පරිපාලන පළ පුරුද්දත්, සංවිධායක ජීව ගුණයත් වැඩ කරන ජනයාගේ ද්‍රව්‍යමය සහ අධ්‍යාත්මික උවමනාවන් ගැන දක්වන ඔප්පු වූ උනන්දුවත් සැලකිල්ලට ගනිමින් සිදු කළ යුතු බවය''යි ඔහු කියයි.

මෙහි දක්නා තර්කණය කෘත්‍රිම සහ සාවද්‍ය බව පැහැදිලිව පෙනේ. එක දෙයක් කිව යුතුය. ප්‍රජාතන්ත්‍රවාදය යනු ''අපේක්ෂකයින් නම් කිරීම, නාම යෝජනා ස්ථිර කිරීම, තෝරා පත් කිරීම ආදිය''ට සීමා වූ දෙයක් නොවේ. තවද සෑම තෝරා පත් කිරීමක්ම දේශපාලන දැඩි බව සහ ව්‍යාපාරික කාර්යක්ෂමතාවය සැලකිල්ලට ගනිමින් කළ යුත්තේද නොවේ. ට්‍රොට්ස්කි මොනවා කීවත්, දශ ලක්ෂ ගණනාවක සංවිධානයකට කැන්වසර්ලා සහ නිලධාරීන්ද කිසියම් ප්‍රතිශතයක් සිටිය යුතුය. (තවත් අවුරුදු ගණනාවක් යන තෙක් හොඳ නිලධාරීන්ගේ ආධාරය නැතිව අපට කටයුතු කළ නොහැකි වනු ඇත). නමුත්, අප කථා කරන්නේ ''කැන්වසිං'', නැතහොත්, ''නිලධාරිවාදී'' ප්‍රජාතන්ත්‍රයක් ගැන නොවේ.

තුන්වැනි කරුණ. තෝරා පත් කළ සංවිධායකයින්, පරිපාලකයන් ආදීන් පමණක් සැලකිල්ලට ගැනීම වරදක් වේ. ඔවුන්ගෙන් සංයුක්ත වන්නේ මිනිසුන්ගෙන් අල්පතරයක් පමණකි. අප සැලකිල්ලට ගත යුත්තේ පොදු ජනකායය; සාමාන්‍ය පිරිසය. රුද්සුතාක් වඩාත් සරල, වඩාත් සුබෝධ සහ න්‍යායික වශයෙන් වඩාත් නිවැරදි යෙදුමකින් එය ඉදිරිපත් කරයි (6 වැනි ප්‍රවාදය):

''... නිෂ්පාදනයට සහභාගි වන සෑම අයෙකුගේම නිෂ්පාදන කර්තව්‍යයන් නිසි සහ වැදගත් බව ඔහුට අවබෝධ කර දිය යුතුය; සෑම කෙනෙක්ම තමන්ට පැවරුනු කාර්යය ඉටු කිරීමට ක්‍රියා කිරීම පමණක් නොව, නිෂ්පාදන ක්ෂේත්‍රයේ තාක්ෂණික සහ සංවිධානමය දුර්වලතාවයන් මකා ගැනීම සඳහා බුද්ධිමත් කාර්ය කොටසක් ඉටු කිරීමද අවශ්‍ය බව අවබෝධ කර දිය යුතුය.''

හතරවැනි කරුණ. ''කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය'' යන යෙදුම වැරදි අර්ථ නිරූපනයට පහසුවෙන්ම ඉඩ දෙන්නකි. ආඥාදායකත්වය හා තනි පුද්ගල අධිකාරය ප්‍රතික්ෂේප කිරීමක් ලෙසට එය වටහා ගැනීමට ඉඩ තිබේ. එය සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදය නතර කිරීමක් සහ එය මඟ හැරීමට කඩතුරාවක් ලෙසට වටහා ගැනීමට ඉඩ තිබේ. එය දෙආකාරයෙන්ම වටහා ගැනීම හානිකරය. දීර්ඝ විශේෂ විවරණයන් නොමැතිව එය එලෙසින් වටහා ගැනීමද වැලැක්විය නොහැකිය.

රුද්සුතාක් එම අදහසම ඉදිරිපත් කරන සරල ආකාරය වඩාත් නිවැරදිය. වඩාත් අතනුහුරුය. ජනවාරි 11 දින ''ප්‍රාව්ද'' පත්‍රයෙහි ''කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය'' ගැන ලිපියක් ලියූ ට්‍රොට්ස්කි, ඔහුගේ පාඨවල එම වැරැදි හා අතනුහුරුතාවයන් ඇති බව ප්‍රතික්ෂේප නොකරනවා පමණක් නොව (ඔහු එම මූළ ප්‍රශ්නයම මඟ හරින අතර තම ප්‍රවාද රුද්සුතාක්ගේ ප්‍රවාද සමඟ සංසංදන නොකරයි), ඊට ප්‍රතිවිරුද්ධව විශේෂයෙන්ම එයට සමාන්තර ලෙස ''යුද්ධ ප්‍රජාතන්ත්‍රවාද'' යෙදවීමේ තම පාඨයේ වැරැදිභාවය හා අතනුහුරු භාවය වක්‍ර ලෙස සහතික කරයි. වාසනාවකට මෙන් එවැනි පාඨයක් මුල් කරගෙන අප අතර කිසි කලෙකත් කාණ්ඩවාදී විවාදයක් ඇති නොවූ බව මට මතක ඇති පමණින් කිව හැකිය.

ට්‍රොට්ස්කිගේ ''නිෂ්පාදන වාතාවරණය'' යන යෙදුම ඊටත් වඩා නොගැලපෙනසුලුය. සිනොවියෙව් එයට සිනා වූයේ හේතු සහිතවය. ඔහුගේ සිනාසීම නිසා ට්‍රොට්ස්කි කෝපයට පත්ව මෙම තර්කය ඉදිරිපත් කළේය: ''වරක් අපට යුද්ධ වාතාවරණයක් තිබුණේය... දැන් අපට නිෂ්පාදන වාතාවරණයක් ඇති විය යුතුය. එය මතු පිට පමණක් නොව කම්කරු පොදු ජනතාව අතර ගැඹුරෙහිම පැවතිය යුතුය මෙය, මුලින් අප යුද්ධ පෙරමුණෙහිදී දැක්වූ උනන්දුවට සමාන උත්සන්න සහ ප්‍රායෝගික උනන්දුවක්ද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිෂ්පාදනය කෙරෙහි සැලකිල්ලක්ද විය යුතුය..." උරහිස නැටවීමක් හා සීනාවක් ඇති කරවන "නිෂ්පාදන වාතාවරනය" වැනි වචන පාවිච්චි නොකර රුද්සුතාක්ගේ ප්‍රවාදවල කියා ඇති පරිදි "කම්කරු පංතියට, එහි බහුතරයට"ආමන්ත්‍රණය කළ යුතුය.කාරණය එයයි. ට්‍රොට්ස්කි සහෝදරයාගේ "නිෂ්පාදන වාතාවරණයෙහි" ද ඇත්තේ නිෂ්පාදන ප්‍රචාරය යන්නටම සමාන අර්ථයකි. නමුත්, නිෂ්පාදන ප්‍රචාරය සාමාන්‍ය කම්කරුවන් අමතා කරන එකක් වන කල එවැනි යෙදුම් ගැනීමෙන් වැලකී සිටිය යුතුය. මෙම යෙදුම වූ කලී, පොදු ජනතාව අතර ප්‍රචාරක කටයුතු නොකළ යුත්තේ කෙසේද යන්න පෙන්වන නිදර්ශනයකි.

දේශපාලනය සහ ආර්ථිකය.
දයලෙක්තික ක්‍රමය සහ සාරසංග්‍රහවාදය

මෙවැනි ප්‍රාථමික ප්‍රශ්න කරා අපට ආපසු ඒමට සිදුවීම මචිතය දනවන්නකි. නමුත් එසේ කරන ලෙස ට්‍රොට්ස්කි සහ බුහාරින් අපට බල කරති. "ප්‍රශ්නය මාරු කිරීම," නැතහොත්, "දේශපාලන" ප්‍රවේශ මාර්ගයක් ගැනීම ගැන ඔවුන් දෙදෙනාම මට චෝදනා කර ඇත. ඔවුන් ගන්නේ "ආර්ථික" ප්‍රවේශ මාර්ගයක් බව ඔවුහු කියති. එය තමන්ගේ ප්‍රවාදවලට පවා ඇතුළත් කළ බුහාරින්, තමා දෙපැත්ත සම්බන්ධ කරන බවක් කියන කලෙක මෙන් දෙපැත්තටම වඩා "ඉහළට නැගීමට" උත්සාහ කළේය.

මෙය එක් වරම පෙනෙන න්‍යායික වරදකි. මා ගන්නා "දේශපාලන" පිවිසුම් මගට දෙස් නැගීම මාක්ස්වාදියෙකුට නොගැලපෙන හා නොපිළිගත හැකි අයුරින් කරනු මා ඊට පෙර අසා තිබුණු හෙයින්, දේශපාලනය යනු ආර්ථිකයේ සමුච්ඡගත ප්‍රකාශනයකියි මම නැවත වරක් මගේ කථාවේදී කීවෙමි. දේශපාලනය ආර්ථිකයට වඩා මුල් තැනක් ගත යුතුය. ඊට වෙනස් ලෙසකින් තර්ක කිරීම මාක්ස්වාදයේ අ යන්න ආ යන්න අමතක කිරීමක් වනු ඇත.

මා දේශපාලනය ගැන අගය කරන සැටි වැරදිද? ඔබ එසේ සිතන්නෙහි නම් ඒ බව කියන්න. ඔප්පු කරන්න. නමුත් දේශපාලන ප්‍රවේශය "ආර්ථික" ප්‍රවේශයට සමාන යයි ඔබ කියන විට (නැතහොත්, වක්‍ර ලෙස පිළිගන්නට පවා) සහ "එකක්, නැතහොත්, අනික" ගත හැකි යයි කියන විට, ඔබ මාක්ස්වාදයේ අ යන්න ආ යන්න අමතක කරන්නෙහිය.

වෙනත් වචනවලින් කියතොත්, දේශපාලන ප්‍රවේශ මාර්ගයෙන් අදහස් කෙරෙන පරිදි වෘත්තීය සමිති කෙරෙහි දක්වන වැරදි ආකල්පය නිසා සෝවියට් බලය විනාශ වනු ඇත. එමෙන්ම නිර්ධන පංති ආඥාදායකත්වය පෙරළී යනු ඇත. (රුසියාව වැනි ගොවිජන රටක වෘත්තීය සමිති සහ වැරදි මග ගත් පක්ෂය අතර භේදයක් ඇති වුවහොත් සෝවියට් බලය නිසැක ලෙසම ඇද වැටෙනු ඇත.) මෙම ප්‍රස්තුතය මූලික වශයෙන් හරිදැයි බැලිය හැකිය (බැලිය යුතුය). ඒ සඳහා ප්‍රවේශ මාර්ගයේ වැරදි නිවැරදිකම් බලා තීරණයක් ගැනීම අවශ්‍ය වේ. මා ඔබගේ දේශපාලන ප්‍රවේශය "අගය කරන" "නමුත්", එය දේශපාලන ප්‍රවේශයක් පමණක් වන නිසා "අපට ආර්ථික ප්‍රවේශයක් ද අවශ්‍යය"යි කීමමෙසේ කීමට සමාන වේ:ඒ විශේෂ පිය වර ගැනීමෙන් ඔබේ බෙල්ල කැඩී යන්න පුළුවනැයි කියන ඔබේ අදහස මා "අගය කරන" නමුත් නිරුවත්ව සහ කුසගින්නේ සිටිනවාට වඩා ඇඳ පැළඳ ගෙන සහ හොඳින් කා බී සිටීම යෙහෙකැයි යනුත් ඔබගේ සැලකිල්ලට ගත යුත්තෙහිය.

බුහාරින් දේශපාලන හා ආර්ථික ප්‍රවේශය ඒකාබද්ධ කිරීමෙහි එල්බ සිටින හෙයින් ඔහු න්‍යායික සාරසංග්‍රහවාදයට වැටී සිටියි.

ට්‍රොට්ස්කි සහ බුහාරින් පෙන්නුම් කරන්නට උත්සාහ කරන්නේ ඔවුන් නිෂ්පාදනයේ වර්ධනය ගැන කැක්කුමකින් සිටින අතර අපගේ සිතෙහි විධිමාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදය හැර වෙනත් දෙයක් නොමැති බවකි. මෙම පින්තූරය වැරදිය. ප්‍රශ්නය වදන්ගත කළ හැක්කේ (මාක්ස්වාදී ස්ථාවරයට අනුකූලව) මෙසේ පමණකි: කාරණයට සමීප වීමේ නිවැරදි ප්‍රවේශයක් නොමැති කල, අදාළ පංතියට මුදුනෙහි සිටිය නොහැකි වීමෙන්, එහි ප්‍රතිඵලයක් වශයෙන්, එය තමන්ගේ නිෂ්පාදන ප්‍රශ්නය විසඳා ගැනීමටද අපොහොසත් වනු ඇත.

නිශ්චිත නිදසුනක් ගෙන බලමු. සිනොවියෙව් මෙසේ පවසයි: "කරුණු වෘත්තීය සමිති තුළ භේදයක් ඇති වීම දක්වා දුරට ගෙන යාමෙන් ඔබ කරන්නේ දේශපාලන වරදකි. මහජන ස්නානාගාර තැනීම නිදසුන් කොට දක්වමින් මම 1920 ජනවාරි තරම් ඉහතදී නිෂ්පාදනයේ වර්ධනය ගැන කථා කෙළෙමි. ලිවීමි" ට්‍රොට්ස්කි මෙසේ පිළිතුරු දෙයි: "පුරසාරම් දෙඩීමටත් තරම් දෙයක්ද? මහජන ස්නානාගාර නිදසුන් කොට දක්වන පොතක් (පිටුව 29). වෘත්තීය සමිතිවල කර්තව්‍යයන් ගැන එහි "එක වචනයක්වත් නැත" (පිටුව 22).

මෙය වැරදිය. මහජන ස්නානාගාර නිදර්ශනය — උභයාර්ථය ගැන සමාවන්න — "කාර්මික ප්‍රජාතන්ත්‍ර" අතලොස්සක් ද සමග ගත් "නිෂ්පාදන වාතාවරණ" දුසිමකට වඩා අගනේය. වෘත්තීය සමිති කළ යුත්තේ කුමක්ද යන්න පොදු ජනතාවට පොදු ජන සමූහපයටම එයින් කියනු ලැබේ. තවද එය කියා ඇත්තේද සරල සහ සුබෝධ වදනිනි. නමුත් මෙම "නිෂ්පාදන වාතාවරණ "සහ" ප්‍රජාතන්ත්‍රවාද" සියල්ලම කම්කරු පොදු ජනතාවගේ පෙනුම දුර්වල කරන සහ ඔවුන්ගේ වැටහීම හීන කරන අඳුරු පටලයක් පමණකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''වෘත්තීය සමිති යන්ත්‍රය යනුවෙන් හැඳින්වෙන ලීවරයන් විසින් ඉටු කෙරෙනු යුතු — හා ඉටු කෙරෙන කාර්ය කොටස''ගැන ''ලෙනින් වචනයක්වත් නොකීම'' ගැන ද ට්‍රොට්ස්කි සහෝදරයා මට දෙස් පැවරුවේය.

ට්‍රොට්ස්කි සහෝදරය, මම ඔබගේ අදහසට විරුද්ධ වන්නෙමි. රුද්සුතාක් සහෝදරයාගේ ප්‍රවාද සම්පූර්ණයෙන්ම කියවා පැමෙන් සහ ඒවාට මගේ එකඟත්වය පළ කිරීමෙන්, මම මෙම ප්‍රශ්නය ගැන, ඔබගේ ප්‍රවාද සියල්ලටමත්, ඔබගේ වාර්තාව, නැතහොත්, සම-වාර්තාවටත්, විවාදයේදී කළ පිළිතුරු කථාවටත් වඩා සම්පූර්ණ, සරල, පැහැදිලි සහ වඩාත් නිවැරදි ප්‍රකාශයක් කෙළෙමි. ''කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය'', ''සංගතවීම'' ආදිය ගැන වූ සම්පූර්ණයෙන්ම වියුක්ත (එනිසා හිස්) කථාවලට වඩා භාණ්ඩවලින් දෙන ප්‍රසාද දීමනා සහ සහෝදර විනය පිළිබඳ උසාවි ආර්ථික සංවර්ධනයට, කාර්මික කලමනාකරණයට සහ නිෂ්පාදන කටයුතුවලදී වඩාත් පුළුල් වෘත්තීය සමිති සහභාගිත්වයකට හේතු වන බව මම තරයේ කියන්නෙමි.

''නිෂ්පාදන ස්ථාවරය'' ඉදිරිපත් කිරීමට (ට්‍රොට්ස්කි), නැතහොත්, ඒක පාර්ශවීය දේශපාලන ප්‍රවේශය මැඩ පැවැත්වීමට සහ එය ආර්ථික ප්‍රවේශය සමග ඒකාබද්ධ කිරීමට (බුහාරින්) දරන ප්‍රයත්නය පිටුපස අපට දක්නට ලැබෙන දේ මෙසේය:

1) දේශපාලනය සහ ආර්ථිකය අතර සම්බන්ධය ගැන ඉදිරිපත් කරන න්‍යායික වශයෙන් වැරදි, සාරසංග්‍රහවාදී නිර්වචනයෙන් ප්‍රකාශිත වන පරිදි මාක්ස්වාදය ගැන නොසලකා හැරීම:

2) ට්‍රොට්ස්කිගේ වැඩ පිළිවෙත පොත මුළුල්ලේම දිවෙන සහ වරද පිළි ගෙන නිවරද නොකළහොත් නිර්ධන පංති ආඥාදායකත්වය ඇද වැටීමට තුඩු දෙන සොලවා දැමීමේ ප්‍රතිපත්තියෙන් ප්‍රකාශිත වන දේශපාලන වරද ආරක්ෂා කිරීම, නැතහොත්, වසං කිරීම;

3) පිරිසිදුම ආර්ථික සහ නිෂ්පාදන කටයුතුවලදී සහ නිෂ්පාදනය වැඩි කරන්නේ කෙසේද යන ප්‍රශ්නයේදී පියවරක් පස්සට තැබීම; එය ඇත්ත වශයෙන්ම නියත, ඉතා වැදගත් හා හදිසි කර්තව්‍යයන් (නිෂ්පාදන ප්‍රචාරය දියුණු කිරීම, භාණ්ඩවලින් දෙන ප්‍රසාද දීමනා නිසි ලෙස බෙදා හැරීමට උගෙන ගැනීමට සහ සහෝදර විනය පිළිබඳ උසාවි මගින් බලකිරීම නිවැරදි ලෙස උපයෝගී කර ගැනීම) පෙන්නුම් කරන රුද්සුතාක්ගේ ප්‍රායෝගික ප්‍රවාදවල සිට, ප්‍රායෝගික සහ කාර්යානුබද්ධ සියල්ල නොසලකා හරින ව්‍යක්ත, වියුක්ත, ''හිස්'' සහ න්‍යායික වශයෙන් සාවද්‍ය පොදු ප්‍රවාද දක්වා පස්සට තැබූ පියවරකි.

දේශපාලනය සහ ආර්ථිකය හා සම්බන්ධ ප්‍රශ්නයේදී එක් අතකින් සිනොවියෙව් හා මාද, අනිත් අතින් ට්‍රොට්ස්කි හා බුහාරින්ද ඇත්ත වශයෙන් ගෙන සිටින ස්ථාවරයන් එසේය.

එනිසා, ට්‍රොට්ස්කි සහෝදරයා දෙසැම්බර් 30 දින කළ කථාවෙන් ඔහු පෑ විරුද්ධත්වය ගැන කියවන කල මට සිනා නොවී සිටිය නොහැකි විය. ඔහු මෙසේ කියා ඇත: ''අටවැනි සෝවියට් සභා සම්මේලනයේදී අපගේ තත්ත්වය සම්බන්ධයෙන් කෙරුණු විවාදයේ කරුණු සම්පිණ්ඩනය කරමින් ලෙනින් සහෝදරයා අපට දේශපාලනයට වඩා ආර්ථිකය අවශ්‍ය බව කී නමුත් ඔහු වෘත්තීය සමිති ප්‍රශ්නයට පැමිණි විට කාරණයෙහි දේශපාලන අංශය ගැන අවධාරණය කළේය'' (පිටුව 65). මෙම වචන ''හරියටම ප්‍රශ්නයට අදාළ'' යයි ට්‍රොට්ස්කි සහෝදරයා සිතුවේය. නමුත්, ඇත්ත වශයෙන් එයින් හෙළිදරව් වන්නේ අදහස් පිළිබඳ විශාල අවුලකි. නියම වශයෙන්ම අන්ත ''දෘෂ්ටිමය අවුලකි.'' අපට වැඩියෙන් ආර්ථිකය සහ දේශපාලනය අවශ්‍ය බව මම නිතරම කියා ඇත්තෙමි. තවදුරටත් එසේ කියන්නෙමි. නමුත් අපට එම තත්ත්වය ලබා ගැනීමට නම් අපි පැහැදිලිවම දේශපාලන අනතුරුවලින් සහ දේශපාලන වැරදිවලින් නිදහස් විය යුත්තෙමු . බුහාරින් සහෝදරයා විසින් තවදුරටත් උග්‍ර කරන ලද ට්‍රොට්ස්කි සහෝදරයාගේ දේශපාලන වැරදි හේතු කොට ගෙන අපගේ පක්ෂයේ අවධානය ආර්ථික කර්තව්‍යයන්ගෙන් සහ ''නිෂ්පාදන'' කටයුතුවලින් ඉවතට යොමුවේ. එනිසා, එම වැරදි නිවැරදි කිරීමත්, (නිර්ධන පංති ආඥාදායකත්වය ඇද වැටීමට තුඩු දෙන) සම්මේලවාදී අපගමනයට විරුද්ධව වාද විවාද කිරීමත්, වෘත්තීය සමිති ව්‍යාපාරයට සමීපවීමේ (සෝවියට් පාලනය ඇද වැටීමට තුඩු දෙන) වැරදි ප්‍රවේශ මාර්ගයට විරුද්ධත්වය දැක්වීමත්, නොවැම්බර් 2-6 දිනවල පැවැත්වුනු පස්වැනි සමස්ත රුසියා වෘත්තීය සමිති සාකච්ඡා සභාව විසින් පිළිගන්නා ලද රුද්සුතාක්ගේ ප්‍රවාදවල සඳහන් පරිදි සංහත වීම,භාණ්ඩවලින් ප්‍රදානය කරන ප්‍රසාද දීමනා බෙදා හැරීම සහ සහෝදරයින්ගේ උසාවි සංවිධානය කිරීම අතින් හොඳම ප්‍රතිඵල ලබා තිබෙන්නේ සරාතොව් මෝල් කම්කරුවන්ද, දොන්බාස් ආකර කම්කරුවන්ද, පෙට්‍රොග්‍රෑඩ් ලෝහ කම්කරුවන්ද, නැතහොත්, වෙනත් කණ්ඩායමක්ද යන්න ගැන ප්‍රායෝගික සහ කාර්යානුබද්ධ ''ආර්ථික'' සාකච්ඡා කරනු වෙනුවට පොදු ''ප්‍රවාද'' ගැන සාකච්ඡා කිරීමත් පිණිස අපට අවාසනාවකට මෙන් කාලය මිඩංගු කිරීමට සිදු විය.

''පුළුල් සාකච්ඡාවකින් '' සිදුවන යහපත කුමක්දැයි අපි දැන් සලකා බලමු දේශපාලන වැරදි නිසා ආර්ථික කර්තව්‍යයන් කෙරෙන් අවධානය වෙනතකට යොමු වන බව අපට නැවතත් දක්නට ලැබේ. මම මෙම ''පුළුල්'' සාකච්ඡාවට විරුද්ධ වුනෙමි. කාර්යානුබද්ධ සාකච්ඡාවක් කළ යුතුව තිබුණු වෘත්තීය සමිති කොමිසමේ කටයුතු කඩාකප්පල් කිරීමෙන් ට්‍රොට්ස්කි සහෝදරයා වරදක් කළ බව, දේශපාලන වරදක් කළ බව මම විශ්වාස කෙළෙමි. දැනුදු විශ්වාස කරමි. බුහාරින් සහෝදරයාගේ බ්‍ෆර්

https://liberationbase.wordpress.com

කණ්ඩායම බ්‍ෆපරයේ කර්තව්‍යය වරදවා වටහා ගැනීමේ (මෙහිදී ඔවුහු නැවත වරක් දයලෙක්තික ක්‍රමය වෙනුවට සාරසංග්‍රහවාදය ආදේශ කර ගත්හ) දේශපාලන වරද කළ බව මම විශ්වාස කරමි. මා එසේ සිතන්නේ, ''බ්‍ෆපරයේ'' ස්ථාවරය අනුව ඔවුන් කළ යුතුව තිබුණේ පුළුල් සාකච්ඡාවට දැඩි ලෙස විරුද්ධ වෙමින් අදාළ කරුණ වෘත්තීය සමිති කොමිසමෙහි සාකච්ඡා කරන ලෙස බලකර ඉල්ලීම වූ හෙයිනි. මෙයින් ඇති වූ ප්‍රතිඵලය මෙසේය.

''අපි කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය ගැනවූ නව සහ ශුද්ධ උද්යෝග පාඨය ප්‍රකාශයට පත්කර ඇත්තෙමු යයිද, එයින් අදහස් වන්නේ මින් පසු ප්‍රශ්න සම්බන්ධයෙන් සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල කාමරය තුළ, නැතහොත්, කුඩා රැස්වීම්වල සාකච්ඡා නොකර, ඒවා විශාල රැස්වීම් ඉදිරියේ තබන බව යයිද ''කියන තරම් දුරට යාමට බුහාරින් සහෝදරයා ඔහුගේ දෙසැම්බර් 30 දින කථාවෙන් යොමු විය. ''වෘත්තීය සමිති ප්‍රශ්නය මෙවැනි විශාල රැස්වීමක් හමුවේ තැබීමෙන් අප කරන්නේ පියවරක් පස්සට නොව පෙරට තැබීම බව මම තරයේ ප්‍රකාශ කරන්නෙමි'' (පිටුව 45). නමුත්, මේ මිනිසා ''සැර හුළං'' පිඹීම සහ ප්‍රජාතන්ත්‍රවාදය පමණට වැඩියෙන් හුවා දැක්වීම ගැන සිනොවියෙව්ට චෝදනා කළේය! ඔහුම අප වෙත බොහෝ සෙයින් සැර හුළං පිඹ තිබෙන බවත්, උපමා විරහිත තරම් අවුල් ඇති කර තිබෙන බවත් මම කියන්නෙමි. විධිමාත්‍ර ප්‍රජාතන්ත්‍රවාදය විප්ලවවාදී අවශ්‍යතාවයට යටත් කළ යුතු බව වටහා ගැනීමට ඔහු සම්පූර්ණයෙන්ම අපොහොසත් වන්නේය!

ට්‍රොට්ස්කිත් නැගී සිටින්නේ එම ඔරුවටමය. ''කාරණය මූලික වශයෙන් සාකච්ඡා කිරීම කෙසේ හෝ කඩාකප්පල් කිරීමට, නැතහොත්, යටපත් කිරීමට ලෙනින්ට උවමනා වී තිබේ'' යන්න ඔහුගේ චෝදනාව ය (පිටුව 65). ඔහු මෙසේ ප්‍රකාශ කරයි: ''මා කොමිසමෙහි සේවය කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතුව මධ්‍යම කාරක සභාවෙහිදී මා විසින් පැහැදිලි ලෙස සඳහන් කරන ලදී. අන් සහෝදරවරු සමග සම තත්ත්වයෙන් මෙම ප්‍රශ්න පිළිබඳ මගේ අදහස් සම්පූර්ණ ලෙස පක්ෂ පත්‍ර මගින් පළ කිරීමට මට ඉඩ දෙන තෙක්, මෙම කරුණු ගැන කුඩු ගැසී කරන පරීක්ෂාවෙන් කිසිම යහපතක් නොවෙතැයි සහ එනිසා කොමිසමේ වැඩ කිරීමෙන්ද කිසිම යහපතක් නොවෙතැයි මම සිතමි'' (පිටුව 69).

මෙහි ප්‍රතිඵලය කුමක්ද? ට්‍රොට්ස්කි දෙසැම්බර් 25 දින ''පුළුල් සාකච්ඡාව'' ආරම්භ කර ගත වී ඇත්තේ මසකට අඩු කාලයකි. නමුත් මෙම සාකච්ඡා එපා වී සහ එහි නිරර්ථකභාවය අවබෝධ වී (ඊට වඩා බරපතල දෙයක් නොකියමු) නැති අය, වගකිව යුතු පක්ෂ කාරකවරුන් සියයකින් එක් කෙනෙක්වත් සොයා ගැනීම ඔබට අපහසු වනු ඇත. එසේ වී තිබෙන්නේ වචන ගැන සහ දුර්වල ප්‍රවාද ගැන සාකච්ඡා කිරීමට පක්ෂයට සිදු කිරීමෙන් ට්‍රොට්ස්කි එහි කාලය නාස්ති කර තිබෙන නිසාය. එමෙන්ම, ප්‍රාණවත් ක්‍රියාකාරිත්වයේ සිට නේකාකාර ''නිෂ්පාදන වාතාවරණ'' සම්බන්ධයෙන් කරන විශාරද ව්‍යායාමයන් වෙත ආපසු ගමන් කරනු වෙනුවට, ප්‍රායෝගික අත්දැකීම් අධ්‍යයනය කර හා පරීක්ෂා කර, නියම ''නිෂ්පාදන'' කටයුතුවල ප්‍රගතිය සඳහා එයින් ලැබෙන පාඩම් ප්‍රක්ෂේපණය කිරීම විය යුතුව තිබුණු කොමිසමේ කාර්යානුබද්ධ ආර්ථික සාකච්ඡාව ''කුඩු ගැසීමක්'' ලෙසට සමච්චලයට ලක් කරන ලද නිසාය.

මෙම සුප්‍රසිද්ධ ''සංහත වීම'' ගෙන බලන්න. මේ සම්බන්ධයෙන් දෙසැම්බර් 30 දින මා දුන් උපදේශය වූයේ මෙම කරුණ ගැන අප නිහඬව සිටිය යුතු බවය. මා එසේ කීවේ, අප අපගේම ප්‍රායෝගික අත්දැකීම් අධ්‍යයනය කර නොතිබුණු හෙයින්, සාකච්ඡා ''සැර හුළං'' පිඹීමක් දක්වා පිරිහී යාමෙන් පක්ෂයේ බලවේගයන් ආර්ථික කටයුතු කෙරෙන් ඉවතට විකර්ෂණය වීමට එය හේතු වන බැවිනි. ආර්ථික මණ්ඩලවල තුනෙන් කොටසේ සිට දෙකෙන් කොටස දක්වාද, දෙකෙන් කොටසේ සිට තුනෙන් දෙකොටස දක්වාද, වෘත්තීය සමිතිවාදීන්ගෙන් සමන්විත විය යුතුයයි ස්වකීය ප්‍රවාද මගින් යෝජනා කිරීමෙන් ට්‍රොට්ස්කි කළේ නිලධාරිවාදී යෝජනා ක්‍රම හරඹයක යෙදීමක් බව මම කීවෙමි.

මේ නිසා බුහාරින් මට දෙස් නැගුවේය. ''කිසියම් දෙයක් සාකච්ඡා කිරීමට රැස්වූ පුද්ගලයන් බිහිරි ගොළුවන් මෙන් ක්‍රියා නොකළ යුතු'' පහත පඳහන් පිටුවෙහි මෙම වචනවලින්ම සඳහන් කර ඇති බව මට ඔප්පු කර පෙන්වීමට ඔහු උනන්දුවක් ගත් බව වාර්තාවේ 49 වැනි පිටුවෙන් මට පෙනේ. ට්‍රොට්ස්කි ද කෝපව මවිතය පාමින් මෙසේ කීය:

''මෙම විශේෂ දිනයේදී, මෙය නිලධාරිවාදී නපුරක් ලෙස ලෙනින් සහෝදරයා විසින් විස්තර කරන ලද බව සටහන් කර ගන්නා මෙන් ඔබ සැම කෙනෙකුටම කියන්නෙමි. සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලය සහ ආර්ථික කටයුතු පිළිබඳ මහා මණ්ඩලයද, ලෝහ කම්කරු සංගමයේ මධ්‍යම කාරක සභාව, ලෝහ දෙපාර්තමේන්තු ආදියද, ඒවායේ සාමාජිකත්වයෙන් තුනෙන් කොටසක සිට දෙකෙන් කොටසක් දක්වා සංඛ්‍යාවක් පොදුවේ තබා ගත යුතුය යන්න අපට මහ පෙන්වීමක් සහ අප සලකා බැලිය යුතු කරුණක් ලෙසට මාස කීපයක් ඇතුළත අප විසින් පිළිගනු ලැබෙනු ඇති බව අනාවැකියක් ලෙසට ප්‍රකාශ කිරීමට මම කැමැත්තෙමි'' (පිටුව 68).

මා මෙය කියවූ පසු සංහත වීම ගැන තිබෙන මුද්‍රිත වාර්තා මට ලැබෙන්නට සලස්වන ලෙස මම මිල්යුටින් (ආර්ථික කටයුතු පිළිබඳ මහා මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති) සහෝදරයාට කීවෙමි. මම මටම මෙසේ කියා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගත්තෙමි: අපගේ ප්‍රායෝගික අත්දැකීම් ගැන අධ්‍යයනය කිරීමට සුළුවෙන් ආරම්භයක් නොකළ යුත්තේ මන්ද? කරුණු නොමැතිව සහ අසමථයන්, නිර්වචනයන් හා ''කාර්මික ප්‍රජාතන්ත්‍රයන්'' නිර්මාණය කරමින් වැඩකට නැති ''සාමාන්‍ය පක්ෂ කථාවල'' (බුහාරින්ගේ වදනකි, පිටුව 47. මෙය ''සොලවා දැමීම'' වැනි උගුල් වදනක් වීමට හොඳටම ඉඩ තිබේ) යෙදීම ඉතාමත් නීරස ය.

මිල්යුටින් සහෝදරයා මා වෙත පොත් කීපයක් එවීය. ''ආර්ථික කටයුතු පිළිබඳ මහා මණ්ඩලය අටවැනි සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයට ඉදිරිපත් කළ වාර්තාව'' ද (මොස්කව්, 1920 දෙසැම්බර් 19 දිනැති පෙරවදන සහිතය) ඒ අතර විය. පරිපාලන මණ්ඩලවලට කම්කරුවන්ගේ සහභාගිත්වය ගැන තොරතුරු පෙන්නුම් කරන සටහනක් එහි 14 වැනි පිටුවේ ඇත. එම සටහන පහත දැක්වේ. (එහි ඇතුළත් වන්නේ ගුබෙර්නියා ආර්ථික මණ්ඩලවලින් සහ පැක්ටරිවලින් කොටසක් පමණක් සම්බන්ධ තොරතුරුය):

පරිපාලක කාර්ය මණ්ඩලවලින් සියයට 61.6 ක්, එනම්, දෙකෙන් කොටසකට වඩා තුනෙන් දෙකොටසට ආසන්න සංඛ්‍යාවක් දැන් කම්කරුවන්ගෙන් සමන්විත වන බව මෙයින් පෙනෙනු ඇත! එනිසා, මෙම කරුණ සම්බන්ධයෙන් ට්‍රොට්ස්කි සහෝදරයා ඔහුගේ ප්‍රවාදවල ලියා තිබෙන දෙය නිලධාරිවාදී යෝජනා ක්‍රම හරඹයක් බව මෙයින් දැනටමත් ඔප්පු වී ඇත. ''තුනෙන් කොටසේ සිට දෙකෙන් කොටස දක්වා'' සහ ''දෙකෙන් කොටසේ සිට තුනෙන් දෙකොටස දක්වා'' යන්න ගැන කථා කිරීම, තර්ක කිරීම සහ වැඩ පිළිවෙළවල් ලිවීම වූකලී කාලය, අවධානය සහ සම්පත් නිෂ්පාදන කටයුතු කෙරෙන් වෙනතකට යොමු කරන, කිසිම වැඩකට නැති ආකාරයේ ''සාමාන්‍ය පක්ෂ කථා'' වන්නේය. එය ශූන්‍ය දේශපාලනයයි.

මේ මුළු කාලය තුළ කොමිසමේ වැඩ කිරීමෙන් මහත් යහපතක් ඉටුකර ගත හැකිව තිබුණි. එම කොමිසමේ සිටින්නේ පළපුරුදුකම් ඇති පුද්ගලයන් වන අතර, ඔවුන් සත්‍ය කරුණු ගැන අධ්‍යයනය නොකර, නිදසුනක් ලෙසට, ''සාමාන්‍ය නිලධාරීන්'' (දහසකින්) දුසිමක පමණ මතය විමසීමෙන් සහ ඔවුන්ගේ අදහස් හා නිගමන සමග වාස්තවික සංඛ්‍යා ලේඛන දත්තයන් සංසන්දනය කිරීමෙන්ද, අනාගතය සඳහා ප්‍රායෝගික මග පෙන්වීමක් ලබා ගැනීමට ප්‍රයත්න දැරීමෙන්ද, තොරව ප්‍රවාද ලිවීම ප්‍රතික්ෂේප කරන්නට තිබිණි. අපගේ පළපුරුද්ද එසේ වන කල අපි කෙළින්ම ඉදිරියටම යන්නෙමුද? නැතහොත් අපගේ මාර්ගය, විධික්‍රම හා ප්‍රවේශය සම්බන්ධ කිසියම් වෙනසක් කරන්නෙමුද? එය කෙසේ කරන්නෙමුද? නැතහොත් ව්‍යාපාරයේ යහපත උදෙසා නැවතී සිට, නැවත නැවතත්

පරිපාලන මණ්ඩලය	මුළු සාමාජික සංඛ්‍යාව	කම්කරුවෝ		විශේෂඥයින්		කාර්යාල සේවකයන් සහ වෙනත් අය	
		සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
ආර්ථික කටයුතු පිළිබඳ මහා මණ්ඩලයේ සහ ගුබෙර්නියා ආර්ථික මණ්ඩලවල සභාපති මඩුල්ල.	187	107	57.2	22	11.8	58	31.0
ප්‍රධාන පරිපාලන ආයතනවල, දෙපාර්තමේන්තුවල, මධ්‍යම මණ්ඩලවල සහ ප්‍රධාන කාර්යාලවල අධිකාරි මණ්ඩලවල	140	72	51.4	31	22.2	37	26.4
පැක්ටරිවල සමායත්ත සහ තනි පුද්ගල කළමනාකරණ	1143	726	63.5	398	34.8	19	1.7
එකතුව	1470	90	61.6	451	30.7	114	7.7

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කරුණු පරීක්ෂා කර බලා තැනින් තැන වෙනස්කම් කීපයක් කිරීමට, එවැනි වෙනත් කටයුතු කිරීමට යොමු වන්නෙමුද?

සහෝදරවරුනි, (දන්මට "නිෂ්පාදන ප්‍රචාරක කටයුතුවල" නියැළීමට අවසර දෙන්න!) ඉතාමත් දියුණු රටවල පවා ධනපතියන් හා ඔවුන්ගේ විධායක නිලධාරීන්, තමන්ගේ (සහ අන් අයගේ) අත්දැකීම් අධ්‍යයනය කිරීමට හා පරීක්ෂා කිරීමටත්, කලමනාකරණ ක්‍රමයක් සංස්කරණය කර ගැනීම පිණිස අනේක වාරයක් ඇරඹීම සහ නිවැරදි කිරීම සඳහාත්, ඔවුන්ගේ විශේෂ ව්‍යාපාරයට සුදුසු ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ විධායක නිලධාරීන් තෝරා ගැනීම ආදිය කිරීම සඳහාත්, අවුරුදු ගණන්, සමහර විට අවුරුදු දහයක් හා ඊටත් වඩා කාලය ගත කරන බව නියම "විධායකයෙක්" දන්නේය. ධනපති ක්‍රමය යටතේ නියාමය එයයි. ධනපති ක්‍රමය ශිෂ්ටාචාර ලෝකය මුළුල්ලේම එහි ව්‍යාපාරික ව්‍යවහාරයට පදනම කොට ගත්තේ ශත වර්ෂ ගණන් තිස්සේ ලැබූ අත්දැකීම් සහ ඇති කරගත් පුරුදුකම්ය. නව භූමියක් විවෘත කරන අපි පුද්ගලයන් රඳවා ගැනීමටත්, ධනපති ක්‍රමයෙන් අපට ලැබුණු පැරණි පුරුදුකම් වෙනස් කිරීමටත්, දීර්ඝ, අනවරථ සහ ඉවසිලිමත් ප්‍රයත්නයක් දැරිය යුත්තෙමු. නමුත් මෙය කළ හැක්කේ මඳින් මඳ පමණකි. ට්‍රොට්ස්කි ප්‍රශ්නයට සමීප වන ආකාරය සම්පූර්ණයෙන්ම වැරදිය. ඔහුගේ දෙසැම්බර් 30 දින කථාවෙන් ඔහු වේගයෙන් මෙසේ කීවේය: "අපගේ කම්කරුවන්ට, පක්ෂ සහ වෘත්තීය සමිති නිලධාරීන්ට කිසියම් නිෂ්පාදන පුහුණුවක් තිබේද? නැද්ද? ඔව්ද? නැද්ද? මම නැත යයි කියමි" (පිටුව 29). මෙය විකට ආකාරයෙන් ප්‍රශ්නය වෙත සමීප වීමකි. එසේ ඇසීම හමුදවකට සෑහෙන තරම් පෙල්ට් බූට් සපත්තු තිබේද? ඔව්ද? නැද්ද? යනුවෙන් ඇසීම වැන්නේය. මෙතැන් සිට අවුරුදු දහයකින් පසුව වුව, අපගේ පක්ෂ සහ වෘත්තීය සමිති නිලධාරීන්ට ප්‍රමාණවත් තරම් නිෂ්පාදන පුහුණුවක් නොමැති බව පිළිගැනීමට සිදු වනු ඇති බව බියෙන් තොරව කිව හැකිය. එය යම් සේද යත්, යුද්ධ දෙපාර්තමේන්තුවේ කාරකවරුන්ට, වෘත්තීය සමිති සහ පක්ෂ නිලධාරීන්ට අවශ්‍ය තරම් යුද්ධ පුහුණුවක් ලැබී නොමැති පරිදිම වේ. නමුත්, දහසක් පමණ කම්කරුවන්, වෘත්තීය සමිති සාමාජිකයන් හා නියෝජිතයන් කලමනාකරණ කටයුතුවලටත්, පැක්ටරි, ප්‍රධාන කාර්යාල හා වඩාත් උසස් පරිමාණයේ වෙනත් මණ්ඩල ක්‍රියාත්මක කරවීමේ කටයුතුවලටත් සහභාගි කරවීමෙන් අපි නිෂ්පාදන පුහුණුවෙහි ආරම්භයක් කර ඇත්තෙමු. ඉහතදී රහසිගතව වැඩ කළවුන් හා වෘත්තීය පුවත් පත් කලා වේදීන් වන අපටම පුහුණුවක් ලබා ගැනීම වන "නිෂ්පාදන පුහුණුව" පත්ලෙහි ඇති මූලික ප්‍රතිපත්තිය වන්නේ, අපේම අත්දැකීම් ගැන, පනින්නට පෙර සිතා බැලිය යුතුය යන නියාමය අනුව ආයාසමත් ලෙස හා විස්තරාත්මක ලෙස කරන අධ්‍යයනයක් ඇරඹීම හා එසේ කිරීමට අන් අයට උගැන්වීම ය. මෙම එක් දහසක් දෙනා කර තිබෙන දේ ගැන ක්‍රමානුකූල ලෙස, විස්තර සහිතව, ප්‍රායෝගික වශයෙන් හා කාර්යානුබද්ධ ආකාරයෙන් හරි වැරදි බැලීමද, ඊටත් වඩා කාර්යක්ෂම ලෙස හා සුපරීක්ෂාකාරී ලෙස ඔවුන්ගේ වැඩ නිවැරදි කිරීමද, ඉදිරි පියවර තැබීම ඊට අදාළ විධික්‍රම, කලමණාකරණ ක්‍රම, අනුපාතයන් හා පිරිස් තෝරා ගැනීම, ආදියෙහි ප්‍රයෝජනවත් බව ඒත්තු ගැනීමට සෑහෙන තරම් සාක්ෂි තිබෙන විට පමණක් කිරීමද, "නිෂ්පාදන පුහුණුව" පිටුපස ඇති මූලික සහ නිරපේක්ෂ නියාමය වන්නේය. ට්‍රොට්ස්කි සහෝදරයා ඔහුගේ ප්‍රවාද සියල්ලම සහ ප්‍රවේශය මගින් මෙම නියාමය උල්ලංඝනය කර ඇත්තේය. ඔහුගේ ප්‍රවාද සියල්ලමත්, ඔහුගේ මුළු වැඩ පිළිවෙළ පොත් පිංචත් කොතරම් වැරදිද යත්, ඒවා නිසා පක්ෂයේ අවධානය සහ සම්පත් ප්‍රායෝගික "නිෂ්පාදන" කටයුතු කෙරෙන් පුහු කථා රාශියක් වෙත යොමු වී තිබේ.

දයලෙක්තික ක්‍රමය සහ සාරසංග්‍රහවාදය. "පාසැල" සහ "යන්ත්‍රය"

LIBERATIONBASE

සෑම ප්‍රශ්නයකම න්‍යායික මූලය වෙත සමීප වීමේ හැකියාව සහ ඒ සඳහා දක්වන තියුණු උනන්දුව බුහාරින් සහෝදරයා තුළ ඇති බොහෝ අගනා ගතිගුණවලින් එකකි. එය ඉතා වැදගත් ගතිගුණයකි. මන්ද යත්, දේශපාලන වරදක් ගැන තබා, වෙනත් ඕනෑම වරදක් ගැන වුව නිසි ලෙස වටහා ගැනීම, එය කරන තැනැත්තාගේ ප්‍රධාන තර්කාංගයන් අතර ඇති න්‍යායික මුල් සොයා ගැනීමෙන් තොරව කළ නොහැකි හෙයිනි.

මෙම උත්ප්‍රාසයට ප්‍රතිචාරය දක්වමින් බුහාරින් සහෝදරයා කල් තබාම නොවේ නම් දෙසැම්බර් 30 දින පටන් හෝ විවාදය න්‍යායික ක්ෂේත්‍රයට මාරු කිරීමට නැඹුරු වෙයි. එදින ඔහුගේ කථාවෙන් ඔහු මෙසේ කීවේය:

"දේශපාලන සාධකයවත්, ආර්ථික සාධකයවත් නොසලකා හැරිය නොහැකිය යන්න ප්‍රතික්ෂේප කළ නොහැකිය. මෙහිදී "බfපර් කණ්ඩායම" පිරිසෙහි න්‍යායික සාරාර්ථය, නැතහොත්, ඒහී දෘෂ්ටිය වන්නේ එයයි..." (පිටුව 47).

මෙම අවස්ථාවේදී බුහාරින් සහෝදරයා කර තිබෙන න්‍යායික වරද නම්, (අපට මාක්ස්වාදයේ දක්නට ලැබෙන) දේශපාලනය සහ ආර්ථිකය අතර වන දයලෙක්තික අන්තර් ක්‍රියාකාරිත්වය වෙනුවට සාරසංග්‍රහවාදය ආදේශ කිරීමය. ඔහු දක්වන න්‍යායික ආකල්පය මෙයයි: "එක් අතකින් සහ අනිත් අතින්", "එකක් සහ අනික" යනුයි. එය වූකලී සාරසංග්‍රහවාදයයි. දයලෙ-

https://liberationbase.wordpress.com

ක්තික ක්‍රමයෙන් අපේක්ෂා කරන පරිදි, සම්බන්ධතාවයන් ගැන ඒවායේ යථාභූත සංවර්ධනයේ තත්ත්වයන් අනුව සර්ව පාර්ශවීය ලෙස සලකා බැලිය යුතුය. කැබලි සහ කොටස් පූට්ටු කරන අණ්ඩ දැමීමක් ලෙස එය නොකළ යුතුය. දේශපාලනය සහ ආර්ථිකය පිළිබඳ නිදර්ශන දැක්වීමෙන් මම මෙය පෙන්වා දී ඇත්තෙමි.

බෆරය පිළිබඳ අදහස මෙම කරුණ තහවුරු කිරීමට ඉවහල් වේ. පක්ෂ දුම්රිය පෙරළෙන ආකාරයෙන් ගමන් කරන විට ඔබට බෆරයක් අවශ්‍ය වන්නේය. එය ප්‍රයෝජනවත් වන්නේය. ඒ ගැන ප්‍රශ්නයක් නොමැත. බුහාරින් ඔහුගේ බෆර් ප්‍රශ්නය ගොඩනගා ගෙන ඇත්තේ සාරසංග්‍රහවාදී ලෙස සිනොවියෙව්ගෙන් සහ ට්‍රොට්ස්කිගෙන් නොයෙක් ආකාර කොටස් එකතු කර ගැනීමෙනි. ''බෆරයක්'' ලෙසට බුහාරින් කළ යුතුව තිබුණේ එක් එක් කණ්ඩායම හෝ පුද්ගලයා හෝ ඔවුන්ගේ වරද කළේ කොතැනදීද, කවදද සහ කෙසේද යන්නත්,එය න්‍යායික වරදක්ද, දේශපාලන උපක්‍රම, කාණ්ඩවාදී. ප්‍රකාශන, නැතහොත්, අතිශයෝක්තිය, ආදිය පිළිබඳ වරදක්ද යන්නත්, තමන්ම තීරණය කර ගැනීමයි. එසේ කොට, ඔහු එවැනි සෑම වරදකටම විරුද්ධව දැඩිව සටන් කළ යුතුව තිබිණි. නමුත් තමන්ගේ ''බෆර්'' කාර්ය ය වටහා ගැනීමෙහි ඔහු අපොහොසත් විය. එය එසේ බව ඔප්පු කරන සාධක මෙන්න:

''ප්‍රධාන ප්‍රශ්නය වන,නිෂ්පාදනයෙහිදී වෘත්තීය සමිතියට පැවරෙන කාර්ය කොටස හා සම්බන්ධයෙන් ට්‍රොට්ස්කි සහ බුහාරින් යන සහෝදරවරු දෙදෙනාම දරන අදහස් එකම ස්ථාවරයේ ප්‍රභේදයන් වන්නේය'' යන මතය, ට්‍රොට්ස්කිට හිතවත්කම් දක්වන සංවිධානයක් වන ටිසෙක්ත්‍රාන්හි (දුම්රිය සේවක සහ ජල ප්‍රවාහන කම්කරු සංගමයේ මධ්‍යම කාරක සභාව) පෙට්‍රොග්‍රෑඩ් බියුරෝ සභාවේ කොමියුනිස්ට් කණ්ඩායම ප්‍රකාශ කර තිබේ. එය බුහාරින් සහෝදරයාගේ 1921 ජනවාරි 3 දින කළ වාර්තාව, කුඩා පොතක් ලෙසට පෙට්‍රොග්‍රෑඩයේදී නිකුත් කර තිබේ (එන්. බුහාරින්, ''වෘත්තීය සමිතිවල කර්තව්‍යයන්'', පෙට්‍රොග්‍රෑඩ්, 1921). එහි මෙසේ කියා ඇත:

''ට්‍රොට්ස්කි සහෝදරයාගේ මුල් යෝජනාව වූයේ වෘත්තීය සමිති නායකත්වය ඉවත් කර ඔවුන්ගේ තැන ගැනීමට සුදුසු සහෝදරවරු සොයා ගත යුතුය, යනාදියයි. ඔහු ''සොලවා දැමීම' පිළිබඳ අදහස කලින් ඉදිරිපත් කර තිබුණ නමුත්, දැන් එය අත්හැර දමා ඇත. එනිසා එය ට්‍රොට්ස්කි සහෝදරයාට විරුද්ධව තර්කයක් ලෙසට උපයෝගි කර ගැනීම සම්පූර්ණයෙන්ම අර්ථ විරහිතය'' (පිටුව 5).

මෙම ප්‍රකාශයේ ඇති බොහෝ වැරදි තැන් අත්හැර දමන්නෙමි. (නොවැම්බර් 2-6 දිනවල පැවති පස්වැනි සමස්ත රුසියා වෘත්තීය සමිති සාකච්ඡා

සභාවේදී ට්‍රොට්ස්කි ''සොලවා දැමීම'' යන පාඨය යොදා ගත්තේය. නොවැම්බර් 8 දින ඔහු මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ ඔහුගේ ප්‍රවාදවල 5 වැනි ඡේදයේ ''නායකත්වය තෝරා ගැනීම'' ගැන සඳහන් කර ඇත. ඔහුගේ ආධාර කරුවන් සමහර දෙනෙක් එය මුද්‍රණය කර පළ කර තිබෙන බව අමතර වශයෙන් සඳහන් කරමි. ට්‍රොට්ස්කිගේ ''වෘත්තීය සමිතිවල කාර්ය කොටස සහ කර්තව්‍යයන්'' යන දෙසැම්බර් 25 පොත් පිංචෙන්ද ඉදිරිපත් කෙරෙන්නේ මා කලින් පෙන්වා දුන් ඒ මනෝභාවයමය; එම ජීවගුණයමය. ඔහු මෙම ආකල්පය ''අත් හැර දැමීමේ කවදද හා කෙසේද යන්න අභිරහසක්ව පවතී.) මා දැන් සඳහන් කරන්නේ වෙනත් කරුණක් ගැනය. ''බෆරය'' සාරසංග්‍රහවාදී වන කල, ඔහු සමහර වැරදි අත් හැර යන අතර වෙනත් වැරදි මතු පිටට ගෙන එන්නේය. 1920 දෙසැම්බර් 30 දින රුසියාවට සෑම දෙසින්ම පැමිණි රු.කො.ප. කාරකවරුන් දහස් ගණන් දෙනා මොස්කව්හිදී ඇමතීමේදී ඔහු ඒවා ගැන කිසිවක් නොකී නමුත්, 1921 ජනවාරි 3 දින පෙට්‍රොග්‍රෑඩයේදී ඒවා මතු කළේය. ''බෆරය'' දයලෙක්තිකවාදියෙක් වන කල, දෙපැත්තෙහිම, නැතහොත්, සියලු පැත්තෙහිම ඔහු දක්නා සෑම වරදකටම විරුද්ධව ඔහුගේ ප්‍රහාරයේ සම්පූර්ණ ශක්තිය යොදවයි. නමුත් මෙය බුහාරින් විසින් නොකෙරෙන දෙයකි. ''සොලවා දැමීමේ'' ප්‍රතිපත්තිය ගැන සැලකිල්ලට ගනිමින් ට්‍රොට්ස්කිගේ පොත් පිංච පරීක්ෂාවට ලක් කිරීමේ ප්‍රයත්නයක් වත් ඔහු දරන්නේ නැත. ඔහු ඒ ගැන කිසිවක් කියන්නේ නැත. බෆර් මගින් මෙසේ ක්‍රියාකිරීම හැම දෙනාගේම සිනහවට ලක්වීම පුදුමයට කරුණක් නොවේ.

තවත් දුර යමු. එම පෙට්‍රොග්‍රෑඩ් කථාවෙහිම (පිටුව 7) ඔහු මෙසේ කියයි:

''ට්‍රොට්ස්කි සහෝදරයාගේ වරද වන්නේ, කොමියුනිස්ට්වාදයේ පාසැල පිළිබඳ අදහසට දක්වන ප්‍රමාණවත් නොවන සහයෝගයයි''.

දෙසැම්බර් 30 දින සාකච්ඡාවේදී, බුහාරින් මෙසේ තර්ක කළේය:

''වෘත්තීය සමිති නම් කොමියුනිස්ට්වාදයේ පාසැල් වෙතියි සිනොවියෙව් සහෝදරයා කියා ඇත. ඒවා කාර්මික කලමනාකරණය සඳහා වූ තාක්ෂණික සහ පරිපාලනමය යන්ත්‍රයකියි ට්‍රොට්ස්කි කියා ඇත. මෙම ප්‍රස්තුතයන් දෙකෙන් එකක්වත් වැරදි බව ඔප්පු කිරීමට සෑහෙන තර්කානුකූල හේතුවක් මට නොපෙනේ. ඒ දෙකම සහ ඒ දෙකෙහි සංයෝජනයද නිවැරදිය'' (පිටුව 48).

බුහාරින් සහ ඔහුගේ ''කණ්ඩායම'', නැතහොත්, ''කාණ්ඩය'' ඔවුන්ගේ 6 වැනි ප්‍රවාදයෙන් එම කරුණම ඉදිරිපත් කරති: ''... එක් අතකින් ඒවා (වෘත්තීය සමිති) කොමියුනිස්ට්වාදයේ පාසලක් වෙති... එමෙන්ම අනිත් අතට, ඒවා — වැඩි වැඩියෙන් — ආර්ථික යන්ත්‍රයේ හා පොදු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වශයෙන් රාජ්‍ය පරිපාලනයේ සංයුක්ත කොටසක් වෙති..." ("ප්‍රාව්ද", ජනවාරි 16).

බුහාරින් සහෝදරයාගේ මූලික න්‍යායික දෝෂය අපට දකින්නට ලැබෙන්නේ එතැනදීය. එය වූකලී මාක්ස්වාදී දයලෙක්තිකය වෙනුවට (නේකාකාර "මෝස්තරකාර " සහ ප්‍රතිගාමී දර්ශනික ක්‍රම නිපයන කතුවරුන් අතර ජනප්‍රිය) සාරසංග්‍රහවාදය ආදේශ කිරීමය.

බුහාරින් සහෝදරයා "තාර්කික" හේතු ගැන කථා කරන විට ඔහු — සමහරවිට අවිඥත ලෙස — ගන්නේ දයලෙක්තික, නැතහොත්, මාක්ස්වාදී තර්කණ මාවත නොව, විධිමාත්‍ර නැතහොත්, පණ්ඩිතමානී තර්කණ මාවත බව ඔහුගේ මුළු තර්කයෙන්ම පෙනේ. බුහාරින් සහෝදරයාම ඉදිරිපත් කරන සරල නිදසුනක් දක්වමින් මම මෙය පැහැදිලි කරන්නෙමි. දෙසැම්බර් 30 දින සාකච්ඡාවෙහිදී ඔහු මෙසේ කීවේය:

"සහෝදරවරුනි, වර්තන විවාදය මෙන්න මෙවැනි කරුණක් ඉදිරිපත් කරන බව ඔබට පෙනෙනු ඇත: පුද්ගලයන් දෙදෙනෙක් පැමිණ, මේසය මත තිබෙන තඹලේරුව ගැන නිර්වචනයක් දෙන ලෙස එකිනෙකාට කියති.''එය වීදුරු සිලින්ඩරයකි.ඊට වෙනස් දෙයක් කියන කෙනෙකුට ශාප වේවා'' යි එකෙක් කියයි. ''තඹලේරුව යනු බොන දෑ සඳහා බඳුනකි. ඊට වෙනස් දෙයක් කියන අයෙකුට ශාපවේවා'' යි අනිකා කියයි.'' (පිටුව 46).

බුහාරින් මෙම නිදසුන ඉදිරිපත් කර තිබෙන්නේ එක ආකාරයකට සිතීමේ අන්තරාය ගැන මට පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයේ පැහැදිලි කිරීමක් දීමේ අටියෙන් බව පාඨකයාට පෙනෙනු ඇත. මම එය කෘතඥතා පූර්වකව පිළිගනිමි. එපමණක් නොව උපකාරයක් කළ අයට ප්‍රත්‍යුපකාරයක් කිරීමේ හැඟීම ඇතිව මමද දයලෙක්තික ක්‍රමය සහ සාරසංග්‍රහවාදය අතර වෙනස වටහා ගැනීමට පහසු ආකාරයෙන් පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන්නෙමි.

තඹලේරුවක් යනු, වීදුරු සිලින්ඩරයක් සහ බොන දෑ සඳහා බඳුනක් යන දෙකම බව නිසැකය.නමුත්,එහි මේ දෙකට වඩා ගුණයන්, ස්වභාවයන් සහ හැඩහුරුකම් ඇත්තේය. ඒවා අනන්ත ප්‍රමාණයක්ද, "අන්තර් තත්ත්වයන්" හා සෙසු ලෝකයා සමග අන්තර් සම්බන්ධතාවයන් අනන්ත ප්‍රමාණයක්ද එහි ඇත්තේය. තඹලේරුව බර ඇති වස්තුවකි. එය දමා ගසන දෙයක් සේ ගත හැකිය. එය කඩදසි බරුවක් ලෙසටද, අල්ලා ගත් සමනලයෙක් බහාලන බඳුනක් ලෙසටද, නැතහොත්, කලාත්මක කැටයමක් සහිත වටිනා භාණ්ඩයක් ලෙසටද ගත හැකිය. එය බොන භාජනයක් සේ ගත හැකිද, වීදුරුවලින් සෑදු තිබේද, එය සිලින්ඩරාකාරද, නැතහොත්, ඊට තරමක් වෙනස්ද යනාදියට ඉහත සඳහන් ස්වභාව ලක්ෂණ කිසිසේත් සම්බන්ධ නොවේ.

එපමණක්ද නොව, යමක් බීම සඳහා මට මේ දැන් තඹලේරුවක් අවශ්‍ය වන්නේ නම්, එය කොතරම් සිලින්ඩරාකාරද සහ එය ඇත්ත වශයෙන්ම වීදුරුවෙන් තනා තිබේද යන්න කිසිසේත් වැදගත් නොවේ. එහිදී වැදගත් වන්නේ, තඹලේරුව පත්ලෙහි සිදුරු තිබේද, නැතහොත් බීම බොන විට මගේ තොල් කැපෙන යමක් එහි තිබේද යනාදියයි. නමුත් මට බීම සඳහා තඹලේරුවක් අවශ්‍ය නොවේ නම්, එය අවශ්‍යව ඇත්තේ වෙනත් වීදුරු-සිලින්ඩරයකින් ඉටු කරගත හැකි කටයුත්තක් සඳහා නම්, පතුල බිඳුනු තඹලේරුවකින්, නැතහොත්, පතුල නොමැතිවම වුවද එය ඉටු කර ගත හැකිය. මේ ආදී වශයෙනි.

පාසැල් සඳහා වූ (සහ පහළ ශ්‍රේනි සඳහා සුදුසු සේ සරල කොට ගත්) විධිමාත්‍ර තර්ක විද්‍යාවෙහි සඳහන් වන්නේ විධිමාත්‍ර නිර්වචනය. එහි සඳහන් වන්නේ ඉතාමත් පොදු, නැතහොත්, ඉතාමත් පැහැදිලි දේ ගැනය. එය ඉන් ඔබ්බට නොයා නවතියි. නිර්වචන දෙකක් හෝ ඊට වැඩි ගණනක් ගෙන ඒවා සසම්භාවී ලෙස (වීදුරු සිලින්ඩරයක් සහ බොන භාජනයක්) සංයෝජනය කළවිට, එහි ප්‍රතිඵලය වන්නේ වස්තුවෙහි විවිධ හැඩහුරුකම් විස්තර කරන සාරසංග්‍රහවාදී නිර්වචනයක් මිස, ඊට වැඩි යමක් නොවේ.

අප ඊට එහා යා යුතු යයි දයලෙක්තික තර්ක ක්‍රමය අපේක්ෂා කරයි. ප්‍රථමව, යම් වස්තුවක් ගැන සැබෑ අවබෝධයක් ලබා ගැනීම අපට අවශ්‍ය නම්, අපි එය දෙස බලා, එහි හැඩහුරුකම් සියල්ලම, එහි සම්බන්ධකම් සහ "අන්තර්-තත්ත්වයන්" සියල්ලම ගැන පරීක්ෂා කළ යුත්තෙමු. මෙය අපට කිසි කලෙකත් සම්පූර්ණයෙන්ම සාර්ථක කර ගත හැකි දෙයක් නොවේ. නමුත් සවිස්තර ආකාරය පිළිබඳ නීතිය වැරදී සිදුවීමට හා අනම්‍ය ස්වභාවයට විරුද්ධව ආරක්ෂාව දෙන්නකි. දෙවැනිව, දයලෙක්තික තර්ක ක්‍රමය අනුව, විෂය වස්තුවක් එහි සංවර්ධන ආකාරයෙන්, වෙනස් වන ආකාරයෙන්, (හෙගල් කියන ලෙසට) "ස්වයං චලිත" ස්වභාවයෙන් ගත යුතු වේ. තඹලේරුවක් වැනි වස්තුවක් සම්බන්ධයෙන්, මෙය එක් වරම පැහැදිලි නොවේ. නමුත්, එයද වෙනස් නොවන තත්ත්වයක නොපවතින්නේය. තවද, එහි අරමුණ, උපයෝගිතාවය සහ අවට ලෝකයා සමග සම්බන්ධය ගැනවූ කල මෙය විශේෂයෙන්ම අදාළ වන්නේය. තුන්වැනිව, වස්තුවක් ගැන කරන පූර්ණ "නිර්වචනයකට" සත්‍යයේ මිම්මක් ලෙසටත්, මිනිස් අවශ්‍යතාවයන්ට එහි ඇති සම්බන්ධය පෙන්නුම් කරන ලෙසටත් යන දෙආකාරයෙන්ම, මුළු මිනිස් අත්දැකීම ඊට ඇතුළත් විය යුතුය. හතර වැනිව, හෙගල් අනුව යමින් ප්ලෙහානොව් කීමට පුරුදුව සිටි සේ, "සත්‍යය නිතරම මූර්ත බවත්, එය කිසි කලෙකත් වියුක්ත නොවන බවත්" දයලෙක්තික තර්ක ක්‍රමයෙන් පිළිගෙන තිබේ. (ප්ලෙහානොව්ගේ දර්ශනික කෘති සියල්ලම අධ්‍යයනය නොකර—මා අදහස් කරන්නේ අධ්‍යයනය කිරීමය —

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඔබට නියම බුද්ධිමත් කොමියුනිස්ට්වාදියෙක් වීමට නොහැකි බව තරුණ පක්ෂ සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා අමතර වශයෙන් කියමි. මා එසේ කියන්නේ මාක්ස්වාදය ගැන ඊට වඩා හොඳ කිසිවක් ලෝකයේ ලියවී නොමැති හෙයිනි*.)

ඇත්ත වශයෙන්ම මම දයලෙක්තික තර්ක විද්‍යාව පිළිබඳ මූළ මතය ගැන විස්තරයක් නොකෙළෙමි. නමුත්, දැනට මා කියා ඇති දේ ප්‍රමාණවත්ය. දැන් තඹලේරුව අත් හැර දමා වෘත්තීය සමිති හා ට්‍රොට්ස්කිගේ වැඩ පිළිවෙළ වෙත ආපසු පැමිණිය හැකි යයි මම අදහස් කරමි.

''එක් අතකින් පාසැලක් වන අතර අනිත් අතින් යන්ත්‍රයකි'' යි බුහාරින් කියයි. ඔහුගේ ප්‍රවාදවලද එසේම ලියා ඇත. ට්‍රොට්ස්කිගේ වරද වන්නේ'', පාසල පිළිබඳ අදහසට දක්වන ප්‍රමාණවත් නොවන සහයෝගයයි...'' සිනොවියෙව් කරන වරද යන්ත්‍රය පිළිබඳ ''සාධකය'' ගැන වැඩි උනන්මුවක් නොදක්වීමය.

බුහාරින්ගේ තර්කණය හුදෙක් ඔතැනි සහ හිස් සාරසංග්‍රහවාදයට වැඩි යමක් නොවන්නේ මන්ද? එසේ වන්නේ ඔහු (මාක්ස්වාදය අනුව, එනම්, දයලෙක්තික තර්ක ක්‍රමය අනුව කොන්දේසි විරහිතව අවශ්‍ය වන පරිදි) ප්‍රවර්තන විවාදයේ මූළ ගමනම ගැන හෝ වර්තමාන අවස්ථාවේ සහ මෙම නිශ්චිත තත්ත්වයන් යටතේ පවතින ප්‍රශ්නය වෙත සමීප වීමේ සම්පූර්ණ මාර්ගයම ගැන,එය ඉදිරිපත් කිරීමේ මූළ වැඩ පිළිවෙළම ගැන—ඔබ කිව හැකි ලෙසට එය ඉදිරිපත් කිරීමේ මූළ උපනතිය ගැන — හෝ තමන්ගේම ස්ථාවරය අනුව ස්වාධීන විශ්ලේෂණයක් කිරීමට ඔහු උත්සාහ නොදරන නිසාය.බුහාරින් එය කරන බවක් ඔබට කොහෙත්ම දක්නට නොලැබේ! ඔහුගේ ප්‍රවේශ මාවත හුදෙක්ම යථාර්ථය අත්හැර දැමීමකි.නියම අධ්‍යයනයක් කිරීමට කිසිම පරිශ්‍රමයක් නොදරන ඔහු සිනොවියෙව්ගෙන් සහ ට්‍රොට්ස්කිගෙන් කැට කැබලි අවුලා ගනියි. ඒ සාරසංග්‍රහවාදයයි.

පින්තූරය පැහැදිලි වනු පිණිස තවත් නිදසුනක් මෙන්න. දකුණු චීනයේ කැරළි කරුවන් හා විප්ලවවාදීන් ගැන (සුන්යත්-සෙන්ගේ ලිපි දෙක තුනකින් හා පොත් හා පුවත් පත් ලිපි කීපයකින් මා අවුරුදු බොහෝ ගණනකට පෙර කියවූ දැ හැරෙන්නට) මා කිසි දෙයක් නොදන්නා තරම්ය. එහි මෙම නැගී සිටීම් පවතින නිසා, කැරළි ගසා නැගී සිටීම ඉතාමත් තියුණු ජාති ව්‍යාප්ත පංති අරගලයේ ප්‍රතිඵලයක් බව කියන අංක 1 දරන චීන ජාතිකයෙක් හා කැරළි ගසා නැගී සිටීම යනු කලාවකැයි කියන අංක 2 දරන චීන ජාතිකයෙක්ද අතර ඇති වන විවාදයක් ගැන උපකල්පනයක් ලෙසින් සිතීම එතරම් දුෂ්කර දෙයක් නොවේ. බුහාරින්ගේ වැනි ප්‍රවාද ලිවීමට මා දැන ගත යුත්තේ එපමණකි: ''එක් අතකින්... අනිත් අතකින්.'' එක් අයෙක් ''කලාව සාධකය'' සැලකිල්ලට ගෙන නැති අතර අනික් අය ''තියුණුකම සාධකය'' සැලකිල්ලට ගෙන නැත. ඒ ආදී වශයෙනි. මෙම විශේෂ විවාදය, ප්‍රශ්නය, ප්‍රවේශය ආදිය ගැන නියම අධ්‍යයනයක් කර නොමැති නිසා, ලැබෙන ප්‍රතිඵලය අප්‍රාණික හා හිස් සාරසංග්‍රහවාදයය.

වෘත්තීය සමිති එක් අතකින් පාසලක්ද, අනිත් අතින් යන්ත්‍රයක්ද වේ. එහෙත් ඒවා, වැඩ කරන ජනතාවගේ සංවිධානයක්ද, කාර්මික වැඩ කරන ජනතාවට විශේෂවූ සංවිධානයක්ද,කර්මාන්තය අනුව ගොඩනැගුනු සංවිධානයක්ද* යනාදියද වේ. බුහාරින් තමාම වෙනුවෙන් කිසිම විශ්ලේෂණයක් නොකරයි. එපමණක් නොව, ප්‍රශ්නයේ, නැතහොත්, විෂය වස්තුවෙහි තුන්වැනි, හතරවැනි, පස්වැනි යනාදී වූ ''හැඩහුරුකම්'' වෙනුවට එහි පළමුවැනි හා දෙවැනි ''හැඩහුරුකම්'' දෙක පමණක් සලකා බැලිය යුත්තේ මන්ද යන්න ඔප්පු කිරීමට අල්ප මාත්‍ර සාක්ෂියක් පවා ඔහුගෙන් ඉදිරිපත් නොවේ. ඔහුගේ කණ්ඩායමේ ප්‍රවාද සාරසංග්‍රහවාදී සබන් පෙන බුබුලක් වී තිබෙන්නේ එහෙයිනි. බුහාරින් කරන පරිදි ''පාසල'' සහ ''යන්ත්‍රය'' අතර සම්බන්ධතාවය පිළිබඳ මූළ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ මූලික වශයෙන් සාරසංග්‍රහවාදී සහ සාවද්‍ය ලෙසය.

මෙම ප්‍රශ්නය දෙස නිවැරදි පහන් එළියෙන් බැලීමට නම්,ශූන්‍ය වියුක්තතාවයන් හැර දමා යථාර්ථය වෙත, එනම් වර්තමානයේ පවතින ප්‍රශ්නය වෙතට පහත බැසිය යුත්තෙමු. එය පස්වැනි සමස්ත රුසියා වෘත්තීය සමිති සාකච්ඡා සභාවේදී මතුවූ ස්වරූපයෙන් ගත්තත්, නැතහොත්, ට්‍රොට්ස්කිම ඔහුගේ දෙසැම්බර් 25 වැඩ පිළිවෙළ පොතෙන් එය ඉදිරිපත් කළ හා හැඩ

* ප්‍රථමයෙන්ම, ප්ලෙහානොව්ගේ කෘතිවලින් දැන් පළ කෙරෙන සංස්කරණයට ඔහුගේ දර්ශනික ලිපි සියල්ලම අන්තර්ගත සහ විස්තර සහිත සූචි ආදිය සහිත විශේෂ වෙළුමක්, නැතහොත්, විශේෂ වෙළුම් ඇතුළත් කළහොත් හොඳ බව, අමතර වශයෙන් සඳහන් කරමි. මන්දයත් ඒවා කොමියුනිස්ට්වාදය පිළිබඳ සම්මත පාඩම් පොත් මාලාවකට ඇතුළත් කළ යුතු හෙයිනි. දෙවැනිව, මාක්ස්වාදී දර්ශනය ගැන ප්ලෙහානොව්ගේ විවරණයන් ගැන දර්ශනවාදයේ මහාචාර්යවරුන්ට දැනුමක් තිබිය යුතු බවටත්, ඒ ගැන ශිෂ්‍යයන්ට උගැන්වීමේ හැකියාවක් ඔවුන්ට තිබිය යුතු බවටත් කම්කරු රාජ්‍යය බල කළ යුතුය. නමුත්, මේ සියල්ල, ''ප්‍රචාරයේ'' සිට ''පරිපාලනය'' දක්වා බැහැරට යාමකි.

* නැවතත් මෙහිදීද ට්‍රොට්ස්කි වරදක් කරන බව අමතර වශයෙන් කියමු. කාර්මික සංගමයක් යනු කර්මාන්තය පාලනය කිරීමට අරමුණු කළ එකකැයි ඔහු සිතයි.එය වැරදිය. සංගමයක්,කාර්මික සංගමයක් ලෙසට විස්තර කරන විට එයින් ඔබ අදහස් කරන්නේ, එහි සමපිකත්වයට එක කර්මාන්තයක කම්කරුවන් ඇතුළත් කර ගන්නා බවය. වර්තමානයේ (රුසියාවේ සහ ලෝකයේ සෑම තන්හිම) පවතින තාක්ෂණික සහ සංස්කෘතික මට්ටම අනුව එය අනිවාරණීය වශයෙන් කළ යුතු වන්නකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගැන්වූ ආකාරයෙන් ගත්තත්, ට්‍රොට්ස්කි එම ප්‍රශ්නය වෙත ලඟා වූ සම්පූර්ණ ආකාරයම ඉතාමත් වැරදි බවත් ඔහු ප්‍රශ්නයට පිටින් ගොස් ඇති බවත් ඔබට පෙනෙනු ඇත. ''සෝවියට් වෘත්තීය සමිති'' පිළිබඳ ප්‍රශ්නය මතු කරන විටත්, පොදු වශයෙන් නිෂ්පාදන ප්‍රචාරය ගැන කථා කරන විටත්, ''සංහත වීම'' හා කාර්මික කළමනාකරනයේදී වෘත්තීය සමිතිවල සහභාගිත්වය ගැන ට්‍රොට්ස්කිගේ අදහස් අනුව සලකන විටත්,යන අවස්ථා තුනෙහිදීම වෘත්තීය සමිති පාසැලක් වශයෙන් ගත හැකි හා ගත යුතු බව වටහා ගැනීමට ඔහු අසමත් වෙයි. මෙම අවසාන කරුණ ට්‍රොට්ස්කිගේ වැඩ පිළිවෙළ පත්‍රිකාවෙන් ප්‍රකාශ කර තිබෙන ආකාරය දෙස බලන කල, එම කරුණ සම්බන්ධයෙන් ඔහුගේ වරද වන්නේ, වෘත්තීය සමිති යනු නිෂ්පාදනයේ තාක්ෂණික සහ පරිපාලනමය කළමනාකරණයේ පාසලක්ය යන්න වටහා ගැනීමට අපොහොසත් වීමය. විවාදය හා සම්බන්ධයෙන් වූ කල ඔබට මෙසේ කිව හැකි නොවේ: ''එක් අතකින් පාසැලක් වන අතර අනිත් අතින් වෙනත් දෙයකි''. මේ විවාදයෙහි, ට්‍රොට්ස්කිගේ ප්‍රවේශය අනුව, ඔබ කුමණ ආකාරයෙන් වෘත්තීය සමිති දෙස බැලුවත්, ඒවා පාසැලක් වන්නේය. ඒවා එක්සත්භාවයේ, සමගියේ, කළමනාකරණයේ සහ පරිපාලනයේ පාසලක් වන අතර,ඔබ ඔබගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කර ගැනීමට එයින් උගෙන ගන්නෙහිය. ට්‍රොට්ස්කි සහෝදරයාගේ මෙම මූලික වරද වටහා ගෙන එය නිවරද කිරීමට පරිශ්‍රමයක් දරනු වෙනුවට බුහාරින් සහෝදරයා කුඩා විකාර සංශෝධනයක් ඉදිරිපත් කර ඇත: ''එක් අතකින්, සහ අනිත් අතින්''.

මෙම ප්‍රශ්නය ගැන තවත් ගැඹුරට විමසා බලමු. කාර්මික කළමනාකරණයේ ''යන්ත්‍රයක්'' ලෙසට වර්තමාන වෘත්තීය සමිතිවල තත්ත්වය කෙබඳුදැයි පිරික්සමු. වෘත්තීය සමිති සාමාජිකයන් සහ නියෝජිතයන් 900 ක් පමණ දෙනා කර්මාන්ත කළමනාකරණයෙහි යෙදී සිටින බව අසම්පූර්ණ වාර්තා අනුව අපි දැක ඇත්තෙමු. මෙම සංඛ්‍යාව 10 න් වැඩි කළත් — ඔබගේ වරද නිවරද කර ගැනීමට ආධාරයක් වේ නම්, නුදුරුතම අනාගතයේදී විශ්වාස ගත නොහැකි තරම් වේගයකින් ''ඉදිරිගමන'' සිදු වේයයි උපකල්පනයක් ලෙසින් පිළිගනිමින් — එය 100 න් වැඩි කළත්, කෙළින්ම කළමනාකරණ කටයුතුවල යෙදී සිටින සංඛ්‍යාව හැට ලක්ෂයක් වෘත්තීය සමිති සාමාජිකයන් සමග සසඳන කල ඔබට ලැබෙන්නේ ඉතාමත් ස්වල්ප අනුපාතයකි. සියයට 98.5 ක් (60 ලක්ෂයකින් 90,000 ක් ඍණ කළ විට ලැබෙන 59,10,000, නැතහොත්, මුළු සංඛ්‍යාවෙන් සියයට 98.5) උගෙන ගනිමින් හා තවත් දීර්ඝ කාලයක් යන තෙක් එසේ කළ යුතුව සිටින බව අමතක කර, ට්‍රොට්ස්කි මෙන් ''නායක ස්ථරය'' කෙරෙහි විශ්වාස තැබීම සහ කාර්මික කළමනාකරණය ගැනද, නිෂ්පාදනයෙහිදී වෘත්තීය

සමිතිවල කාර්ය කොටස ගැනද කථා කිරීම ඉතාමත් වැරදි බව මෙයින් තවදුරටත් පැහැදිලි වේ. පාසැල සහ කළමනාකරණය නොකියා කළමනාකරණයේ පාසැල කියන්න.

''පත්කිරීම් ක්‍රමය'' එනම් පත්වීම් දීමට මධ්‍යම කාරක සභාවට ඇති අයිතිය සහ යුතුකම ප්‍රතික්ෂේප කිරීම ගැන සම්පූර්ණයෙන්ම හේතු විරහිත ලෙස හා සාවද්‍ය ලෙස සිනොවියෙව් සහෝදරයාට චෝදනා කළ ට්‍රොට්ස්කි සහෝදරයා, ඔහුට විරුද්ධව තර්ක කිරීමේදී අනවධානයෙන්දෝ පහත සඳහන් හෙළිදරව්කාරී සැසඳුම ඉදිරිපත් කළේය:

''... උද්ගතව ඇත්තේ උද්ඝෝෂණය සඳහා කරුණු සපයාගැනීමේ මාර්ගයක් පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නොව, පරිපාලනමය විසඳීම අවශ්‍ය කෙරෙන ප්‍රශ්නයක්ද බව අමතක කරමින් සිනොවියෙව්, සෑම ප්‍රායෝගික කරුණකදීම ප්‍රචාරක පැත්ත පමණට වැඩියෙන් හුවා දැක්වීමේ නැඹුරුවක් ගනියි'' (පිටුව 27).

මෙම ප්‍රශ්නය වෙත පරිපාලනමය ලෙස සමීප වීමේ භව්‍ය මාර්ගය ගැන විස්තර සහිත ලෙස පැහැදිලි කිරීමට පෙර, ට්‍රොට්ස්කි සහෝදරයාගේ මූලික වරද කුමක්දැයි කියනු කැමැත්තෙමි. ඔහුම ඔහුගේ වැඩ පිළිවෙළ පොතෙන් ඉදිරිපත් කළ ප්‍රශ්න ගැන ප්‍රචාරක පැත්තෙන් පමණක් සලකා බැලිය හැකිව හා සලකා බැලිය යුතුව තිබිය දී ඒවා පරිපාලනමය ප්‍රශ්න ලෙස ගෙන සැලකීම (ඊට වඩා නො සැලකීම) ඔහුගේ මූලික වරද වේ.

සැබැවින්ම, ට්‍රොට්ස්කි ගැන කිව හැකි හොඳ මොනවාද? නිසැක වශයෙන්ම එක හොඳ සහ ප්‍රයෝජනවත් කටයුත්තක් නම් ඔහුගේ නිෂ්පාදන ප්‍රචාරයයි. නමුත් ඔහුගේ ප්‍රවාදවල එය අන්තර්ගත නොවේ. එය අන්තර්ගතව ඇත්තේ ඔහුගේ කථාවලය. විශේෂයෙන්ම, වෘත්තීය සමිතිවාදීන්ගේ ''ගතානුගතික අංශය'' යයි කියනු ලබන අයට විරුද්ධව කරන ඔහුගේ අවාසනාවන්ත විවාදය අමතක කර කරන කථාවලය.වෘත්තීය සමිති කොමිසමෙහි ප්‍රායෝගික ''ආර්ථික'' කටයුතුවලදී, කථිකයෙක් හා ලේඛකයෙක් ලෙසට සහ සමස්ත රුසියා නිෂ්පාදන ප්‍රචාරක බ්‍යුරෝ සභාවේ සාමාජිකයෙක් ලෙසට ඔහු නිසැක ලෙස මහත් යහපතක් ඉටු කර ඇත. (තවදුරටත් කරනු ඇතැයිද මම සිතමි.) ඔහුගේ වැඩ පිළිවෙළ ප්‍රවාද සාවද්‍යය. එසේ වන්නේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ ''අර්බුදය'' සහ ''උපනති දෙක'' ද, රු. කො. ප. වැඩ පිළිවෙළ ගැන අර්ථ නිරූපනය කිරීමද, ''සෝවියට් වෘත්තීය සමිති ව්‍යාපාරය'' ද, ''නිෂ්පාදන පුහුණුව'' හා ''සංහත වීම'' ද, වෙතට සමීපවීමේ පරිපාලනමය ආකල්පය තදරතු නූලක් මෙන් එම ප්‍රවාද ඔස්සේ විනිවිද ගොස් ඇති හෙයිනි. ට්‍රොට්ස්කිගේ ''වැඩ පිළිවෙළෙහි'' ප්‍රධාන මාතෘකා සියල්ලම මම ලැයිස්තු ගත කෙළෙමි. ට්‍රොට්ස්කි වෙත ඇති තොරතුරු ගැන සලකා බලන කල, වර්තමාන අවස්ථාවේදී ඒවා වෙත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිවැරදි ලෙස සමීප විය හැක්කේ ප්‍රචාරක පැත්තෙන් පමණක් බව පෙනේ.

රාජ්‍යය යනු බල කිරීමේ ක්ෂේත්‍රයකි. බලහත්කාරය අත්හැර දැමීම, විශේෂයෙන්ම, නිර්ධන පංති ආඥාදායකත්වයේ යුගයේදී එසේ කිරීම, උන්මත් ක්‍රියාවක් වනු ඇත. එනිසා පරිපාලනමය ප්‍රවේශය සහ "නියමු-කම" අත්‍යාවශ්‍ය වන්නේය. එක එල්ලේම පාලනය කරන නායකයා වන්නේ, නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණිය වන්නේ පක්ෂයයි. එය තුළ බල පෑවේ නිශ්චිත මාර්ගය සහ පෙරමුණු බල ඇණිය පිරිසිදු කිරීමේ හා දැඩි කිරීමේ මාර්ගය බල කිරීම නොව පක්ෂයෙන් නෙරපීමයි. වෘත්තීය සමිති රාජ්‍ය බල නිධානයක්, කොමියුනිස්ටවාදයේ පාසැලක් සහ කළමනාකරණයේ පාසැලක් වේ. මෙම ක්ෂේත්‍රයෙහි විශේෂිත සහ මූලික දෙය වන්නේ පරිපාලනය නොව, "මධ්‍යම රාජ්‍ය පරිපාලනයත්" (ඒමෙන්ම ප්‍රාදේශීය පරිපාලනයත්), "ජාතික ආර්ථිකයත්, වැඩ කරන පුළුල් පොදු ජනතාවත් අතර" "සම්බන්ධකම්ය" (වෘත්තීය සමිති සම්බන්ධයෙන්, පක්ෂ වැඩ පිළිවෙළෙහි ආර්ථික කොටස, § 5 බලන්න).

ට්‍රොට්ස්කිගේ මුළු වැඩ පිළිවෙළ පොතෙන්ම පෙළිදරව් වන්නේ මෙම ප්‍රශ්නය වෙත වැරදි ආකාරයෙන් සමීප වීමක් සහ මෙම සම්බන්ධතාවය ගැන වරදවා වටහා ගැනීමකි.

ට්‍රොට්ස්කි මෙම සංහත වීම "පිළිබඳ සුප්‍රසිද්ධ ප්‍රශ්නය විෂයෙහි ගෙන තිබෙන්නේ ඔහුගේ වැඩ පිළිවෙළෙහි එන අන් මාතෘකා හා සම්බන්ධ අමුතු ප්‍රවේශ මාර්ගයකැයිද, ඔහුගේ පොත් පිංච සම්පූර්ණයෙන්ම මිඩංගු කර තිබෙන්නේ "සංහත වීමේ" අවස්ථා 900 ක් අතුරෙන් වෘත්තීය සමිති නිලධාරීන් හා සාමාජිකයින් තෝරා පත්කළ වෘත්තීය සමිති තනතුරු සමගම සමගාමී ලෙසට මහා ආර්ථික මණ්ඩලයේ තනතුරුත් දරන අවස්ථා 90 ක් ගැන සවිස්තර විමර්ශනයක් කිරීම සඳහා යයි ද සිතමු. මෙම අවස්ථා 90, වරණාත්මක සංඛ්‍යා ලේඛණ සමීක්ෂණයක වාර්තාද, රාබ්ක්රින්[49] පරීක්ෂකවරුන්ගේ සහ උපදේශකයන්ගේ වාර්තාද, අදාළ මහජන කොමිසාර් අංශයේ වාර්තාද සමග ගෙන විශ්ලේෂණය කරන ලදැයි සිතමු. පරිපාලන මණ්ඩලවලින් සැපයුන දත්තයන්, කරන ලද වැඩවල ප්‍රතිඵල, නිෂ්පාදනයෙහිදී ලබා ඇති දියුණුව ආදිය සැලකිල්ලට ගනිමින් ඒවා විශ්ලේෂණය කර ඇතැයි සිතමු. එසේ කරන ලද්දේ නම්, එය, ඉවත් කිරීම්, මාරු කිරීම්, පත්කිරීම් සහ "නායක ස්ථරය" වෙතින් අපේක්ෂා කළ යුතු ක්ෂණික කාර්යයන් කෙරෙහි අවධානය සංකේන්ද්‍රණය කිරීම අදහස් වන "සොලවා දැමීමේ" ක්‍රියාමාර්ගය සම්පූර්ණයෙන්ම සනාථ කරන නිවැරදි පරිපාලනමය ප්‍රවේශ මාර්ගයක් වන්නට තිබිණි. ට්‍රොට්ස්කි පළමුව "සොලවා දැමීමේ" ක්‍රියාමාර්ගයක් අපේක්ෂා කළ නමුත්, දැන් ඔහු එය අත්හැර දමා ඇති බව බුහාරින් ජනවාරි 3 දින කළ හා පෙට්‍රොග්‍රෑඩයේ ට්සෙක්ට්‍රාන් පිරිස විසින්

පළ කරන ලද කථාවෙන් කීකල, ඔහු ඔහුගේ සාරසංග්‍රහවාදී වැරදි අතුරෙන් තවත් එකකට වැටුණේය. එම වරද ප්‍රායෝගික ස්ථාවරය අනුව විකාරයක් වන අතර මාක්ස්වාදියෙකුට න්‍යායික වශයෙන් පිළිගත හැක්කක් නොවේ. සත්‍ය විස්තර කරුණු වෙත එළඹීමට නොහැකිව (නැතහොත් නොකැමතිව) ඔහු ප්‍රශ්නය වියුක්ත ලෙසින් ගනියි. ඒ අනුව අප මධ්‍යම කාරක සභාවෙහි සිටින තාක් සහ මුළු පක්ෂයම තවදුරටත් කටයුතු මෙහෙයවන, එනම්, ආණ්ඩු කරන තාක්, අපි කිසි කලෙකත් "සොලවා දැමීම", එනම්, ඉවත් කිරීම්, මාරු කිරීම්, පත් කිරීම්, තනතුරුවලින් පහ කිරීම්, ආදිය අත් නොහරින්නෙමු — අපට ඒවා අත් හැරිය හැකි නොවේ. නමුත් ට්‍රොට්ස්කිගේ වැඩ පිළිවෙළ පොතෙහි සඳහන් වන්නේ වෙනත් දෙයක් ගැනය. "ප්‍රායෝගික කටයුතු ගැන ප්‍රශ්නය" එයින් මතු කෙරෙන්නේම නැත. සිනොවියෙව් සහ ට්‍රොට්ස්කිත්, බුහාරින් සහ මාත්, ඇත්ත වශයෙන්ම මුළු පක්ෂයත් විවාද කරමින් සිටියේ මෙය ගැන නොව, "වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ පවතින උපනති" (ට්‍රොට්ස්කිගේ 4 වැනි ප්‍රවාදයේ අන්තිම කොටස) ගැනය.

මෙය ප්‍රධාන වශයෙන්ම දේශපාලන ප්‍රශ්නයකි. මෙම විෂය කරුණෙහි — මෙම නියත විශේෂ "විෂයෙහි" — සන්ධාරය කෙබඳුද යත්, බුහාරින් නිසැක වශයෙන්ම මානුෂික හැඟීම්වලින් හා අපේක්ෂාවන්ගෙන් බරව උත්සාහ කරන පරිද්දෙන්, සාරසංග්‍රහවාදී කුඩා සංශෝධන සහ එකතු කිරීම් මගින් ට්‍රොට්ස්කිගේ වරද කිසිසේත් නිවැරදි කළ හැකි නොවේ.

ඇත්තේ එක පිළිතුරක් පමණකි.

ප්‍රථමව, "වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ පවතින උපනති" ගැන, පංති අතරත්, දේශපාලනය හා ආර්ථිකය අතරත් ඇති සම්බන්ධතාවය ගැන, රාජ්‍යයේ, පක්ෂයේ සහ වෘත්තීය සමිතිවල විශේෂ කාර්ය කොටස ගැන, "පාසැල" සහ යන්ත්‍රය මෙන් වූ කාර්ය කොටස ආදිය ගැන වූ දේශපාලන ප්‍රශ්නයට නිවැරදි විසඳුමක් තිබිය යුතුය.

දෙවැනිව, නිවැරදි දේශපාලන තීරණය පිළිගන්නා ලද පසු, නිරන්තර ලෙස සහ ඉවසීමෙන් යුතුව, රාජ්‍ය ආයතනයක අනුග්‍රහය හා මග පෙන්වීම යටතේ දීර්ඝ කාලයක් තිස්සේ විවිධාංගමය හා ජාති-ව්‍යාප්ත නිෂ්පාදන ප්‍රචාරක ව්‍යාපාරයක් ගෙන යා යුතුය. නැතහොත්, ක්‍රමානුකූල ලෙස පෙරට ගෙන යා යුතුය. එකම කරුණු නැවත නැවතත් ඉදිරිපත් කරන ආකාරයෙන් එම ව්‍යාපාරය ගෙන යා යුතු වේ.

තුන්වැනිව, "ප්‍රායෝගික කටයුතු පිළිබඳ ප්‍රශ්න" උපනති ප්‍රශ්න සමග පටලවා නොගත යුතුය. උපනති ප්‍රශ්න නිසි ලෙසින් අයත් වන්නේ "පොදු පක්ෂ කථා" සහ පුළුල් සාකච්ඡා පිළිබඳ ක්ෂේත්‍රයටය. ප්‍රායෝගික කටයුතු ඒ ආකාරයෙන් ගෙන සාක්ෂි ඇසීම සහ ලිපි, වාර්තා හා සංඛ්‍යා ලේඛන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අධ්‍යයනය කිරීම ආධාර කොට ගනිමින්, කාරක කොමිසම් සභා තුළ කළ යුතු වන්නේය. අවශ්‍ය ඕනෑම ''සොලවා දැමීමක්'' ක්‍රියාත්මක කළ යුත්තේ එම පදනම සහ එම තත්ත්වයන් යටතේ පමණක්ද, ඊට නිසි බලය ඇති සෝවියට්, නැතහොත්, පක්ෂ, එසේ නැතහොත් ඒ දෙආකාරයේම කාර්යාංශවල තීරණයක් අනුවද වේ.

ට්‍රොට්ස්කි සහ බුහාරින් ඉදිරිපත් කර ඇත්තේ ප්‍රශ්නය වෙත සමීප වීම පිළිබඳ දේශපාලන වැරදිද, සම්ප්‍රේෂණ පටි අතර මැද බිඳීම්ද, ''පරිපාලන නියමුකමට'' විරුද්ධ නුසුදුසු සහ ඵල රහිත ප්‍රහාරයන්ද මිශ්‍ර කොට ගත් හත්මාලුවකි. බුහාරින් ඔහුගේ තඹලේරුව පිළිබඳ උදාහරණය ඉදිරිපත් කිරීමෙන් න්‍යායික අංශය ඉස්මතු කර තිබෙන නිසා වරදෙහි ''න්‍යායික'' මූලාශ්‍රය තිබෙන්නේ කොහේදැයි යන්න පැහැදිලිය. ඔහුගේ න්‍යායික — මේ අවස්ථාවෙහි දී ගුඪවාදී — වරද වන්නේ දයලෙක්තික ක්‍රමය වෙනුවට සාරසංග්‍රහවාදය ආදේශ කිරීමය. ඔහු ගත් සාරසංග්‍රහවාදී ප්‍රවේශ මාර්ගය නිසා ඔහු අවුලට පත්ව සම්මේලවාදයට ඇද වැටී තිබේ. ට්‍රොට්ස්කිගේ වරද වන්නේ එක පැත්තකට බරව සිතීම, බලකාරී ස්වභාවය, අතිශයෝක්තිය හා මුරණ්ඩුකමය. තඹලේරුව බොන දෑ සඳහා භාජනයක් බව ඔහුගේ වැඩ පිළිවෙළෙන් කියා ඇතත්, මෙම විශේෂ තඹලේරුව පතුලක් නොමැති එකකි.

අවසානය

වැරදි අවබෝධයක් ඇති වීම වලක්වනු සඳහා තවත් කරුණු ස්වල්පයක් ගැන සඳහන් කිරීමේ කාර්ය ඉටු කිරීමට ඉතිරිව තිබේ.

ට්‍රොට්ස්කි සහෝදරයා ඔහුගේ ''වැඩ පිළිවෙළෙහි'' 6 වැනි ප්‍රවාදයෙහි, රු. කො. ප. වැඩ පිළිවෙළෙහි 5 වැනි ඡේදයේ ආර්ථික කොටස උපුටා දක්වයි; එම කොටසෙහි වෘත්තීය සමිති ගැන සඳහන් වේ. ඉන් පිටු දෙකකින් ඉක්බිතිව ඔහුගේ 8 වැනි ප්‍රවාදයෙහි ට්‍රොට්ස්කි සහෝදරයා මෙසේ කියා ඇත:

''... ස්වකීය පැවැත්මේ පැරණි පදනමට, එනම්, පංති ආර්ථික අරගලයට අහිමිවූ වෘත්තීය සමිති...'' — (එය වැරදිය. එමෙන්ම ඉක්මන්කාරී අතිශයෝක්තියකි: වෘත්තීය සමිතිවලට දැන් මුහුණ දීමට ඇත්තේ පංති ආර්ථික අරගලයකට නොව පංති නොවන ''ආර්ථික අරගලයකටය''. ඒ අනුව කළ යුතු වන්නේ සෝවියට් යන්ත්‍රයේ අත නොපොවන මානයේ වන මාර්ග හා මාධ්‍ය උපයෝගී කර ගනිමින් වැඩ කරන ජනතාවගේ ද්‍රව්‍යමය සහ අධ්‍යාත්මික උවමනාවන් ආදිය ආරක්ෂා කිරීම පිණිස සෝවියට් යන්ත්‍රයේ ඇති නිලධාරිවාදී විකෘති කිරීම්වලට විරුද්ධව සටන් කිරීමය.

අවසානාවකට මෙන් තව අවුරුදු ගණනාවක් යන තෙක් වෘත්තීය සමිතිවලට මෙම කර්තව්‍යයට මුහුණ දෙන්නට සිදුවනු ඇත)... — ''නිර්ධන පංති විප්ලවය විසින් වෘත්තීය සමිති හමුවේ තබන ලද හා අපගේ වැඩ පිළිවෙළ මගින් ඉදිරිපත් කර තිබෙන නව කර්තව්‍යය වන නිෂ්පාදනය සංවිධාන කිරීම (ට්‍රොට්ස්කිගේ අවධාරණය, පිටු 9, ප්‍රවාදය 8) පිළිබඳ ප්‍රශ්නය විසඳා ලීමට හැකි වනු පිණිස අවශ්‍ය බලවේගයන් ඒකරාශී කර ගැනීම හා අවශ්‍ය විධික්‍රම සකස් කර ගැනීම ඒවාට තවමත් ඉටු කළ හැකි වී නැත. ඊට හේතු වූ කරුණු විවිධ ය.''

මෙය බරපතල වැරද්දක කලල සහිත තවත් ඉක්මන්කාරී අතිශයෝක්තියකි. වැඩ පිළිවෙළ එවැනි කිසිවක් ඉදිරිපත් නොකරයි. නිෂ්පාදනය ''සංවිධානය කිරීමේ'' කර්තව්‍යය වෘත්තීය සමිති හමුවේ තැබීමක්ද එයින් සිදු වන්නේ නැත. අපගේ පක්ෂ වැඩ පිළිවෙළෙහි සඳහන් කර ඇති පරිදි අදාළ ප්‍රස්තුතයන් ගෙන බලමු:

(1) ''සමාජ සන්තක කරන ලද කර්මාන්තයේ සංවිධාන යන්ත්‍රය'' (වෙනත් අංශ නොවේ) ''ප්‍රධාන වශයෙන්'' (තනිකරම නොවේ) ''විශ්වාසය තැබිය යුත්තේ වෘත්තීය සමිති කෙරෙහිය''. 2) ''ඒවා වඩ වඩාත් අංග සම්පූර්ණ ලෙස පටු ශිල්පීය-සංගම් ජීවගුණය තමන් කෙරෙන් බැහැර කර'' (කෙසේද? පක්ෂ නායකත්වය යටතේ සහ වැඩ කරන ජනතාවගේ නිර්ධන පංති නොවන බහුජනකාය කෙරෙහි නිර්ධන පංතිය පාන අධ්‍යාපනික සහ වෙනත් බලපෑම මගිනි) ''කිසියම් කර්මාන්තයක බහුතරය සහ කල් යාමේදී සියලුම කම්කරුවන් වැළඳගත් විශාල කාර්මික සංගම් බවට පත් විය යුතුය...''

පක්ෂ වැඩ පිළිවෙළෙහි වෘත්තීය සමිති ගැන පරිච්ඡේදයේ පළමුවැනි කොටස මෙයයි. එය ආරම්භ වන්නේ අනතුරුව එන දෙය සඳහා දීර්ඝ සහ අනවරත ප්‍රයත්නයක් අපේක්ෂා කරන ''දැඩි කොන්දේසි'' නියම කරමින් බව ඔබ සටහන් කර ගන්නට ඇත. අනතුරුව එන දෙය මෙසේය:

''... කාර්මික කළමනාකරණයේ සියලුම ප්‍රාදේශීය සහ මධ්‍යම ආයතනවලට සහභාගි වන්නන්...'' (ප්‍රවේසම් සහිත යෙදුම සටහන් කර ගන්න: සහභාගි වන්නන් පමණකි) ''... වන වෘත්තීය සමිති, සෝවියට් සමූහාණ්ඩුවේ නීති සහ පිළිගත් ව්‍යවහාරය පිහිට කොට ගනිමින්, මුළු ජාතික ආර්ථිකයම ඒකීය භූතාර්ථයක් සේ ගනිමින්, එහි මුළු පරිපාලනයම කල් යාමේදී තමන් අතට සංකේන්ද්‍රණය කර ගන්නා තත්ත්වයට එළඹිය යුත්තේය...'' (මෙය සටහන් කර ගන්න: කර්මාන්තයේ අංශවල නොව, සමස්තයක් වශයෙන් කර්මාන්තයේම නොව, ජාතික ආර්ථිකය ඒකීය භූතාර්ථයක් ලෙසට ගෙන, එහි කළමනාකරණය යථාර්ථ වශයෙන් සංකේන්ද්‍රණය කර ගන්නා තත්ත්වයට එළඹිය යුත්තේය. ආර්ථික අර්ථ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යෙන් ගත් කල, මෙම කොන්දේසිය සම්පූර්ණ වූ සේ ගත හැකි වන්නේ කර්මාන්තය සහ කෘෂිකර්මාන්තය යන දෙකෙහිම සුළු නිෂ්පාදකයන්-ගෙන් පිළිබිඹු වන කොටස ජනගහනයෙන් සහ ජාතික ආර්ථිකයෙන් දෙකෙන් පංගුවකට අඩු වන කලය)…'' මධ්‍යම රාජ්‍ය පරිපාලනය, ජාතික ආර්ථිකය හා වැඩ කරන පුළුල් ජනතාව අතර නොනැසෙන සම්බන්ධකම් පැවතීම මේ ආකාරයෙන්''… (ඉහත සඳහන් කරන ලද කොන්දේසි සියල්-ලම ඉටු වීමට ආධාරකාරී වන ආකාරයෙන්)… ''සහතික කරන වෘත්තීය සමිති, හැකි තරම් පුළුල් පරිමාණයෙන්, එම පසුකී ජනතාව''… (එනම්, පොදු ජනතාව, ජනගහනයෙන් බහුතරය)… ''ආර්ථික කළමනාකරණයට අනුකර්ෂණය කර ගත යුත්තේය. ඒ අතරම, සෝවියට් බලයේ ආර්ථික යන්ත්‍රය නිලධාරිවාදී වීමට විරුද්ධව සටන් කිරීමේ සහ නිෂ්පාදනයේ ප්‍රතිඵල මතුයෙහි නියම පොදුජන පාලනය ස්ථාපිත කිරීම පහසු කිරීමේ ප්‍රධාන මාර්ගය වන්නේ, ආර්ථික කළමනාකරණයට වෘත්තීය සමිති සහභාගී වීම සහ ඒවා විසින් මෙම කටයුත්තට පොදු ජනතාව අනු-කර්ෂණය කර ගැනීමය.''

මෙහි ද අවසාන වාක්‍යයෙහි ඉතාමත් ප්‍රවේසමෙන් යොදන ලද වාක්‍ය කොටසක් වෙයි: ''ආර්ථික කළමනාකරණයට සහභාගි වීම.'' තවද, නිලධාරිවාදී ව්‍යවහාරයන්ට විරුද්ධව සටන් කිරීමේ ප්‍රධාන (එහෙත් එකම නොවේ) මාර්ගය ලෙසට පුළුල් ජනතාව සම්බන්ධ කර ගැනීම ගැන නැව-තත් හඳහනක් කර ඇත. අවසාන වශයෙන් ඉතාමත් ප්‍රවේසම් සහිත ලෙස කළ යෙදුමකි: ''පොදුජන'' — එනම්, හුදෙක් පිරිසිදුම නිර්ධන පංතික නොව, කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ — ''පාලනය ස්ථාපිත කිරීම පහසු කිරීම.''

පක්ෂ වැඩ පිළිවෙළෙන් ''ඉදිරිපත් කර'' ඇති පරිදි වෘත්තීය සමිතිවල කර්තව්‍යය ''නිෂ්පාදනය සංවිධාන කිරීම'' වන්නේය යනුවෙන් මෙහි අර්ථ දැක්වීම වැරදි බව ඉතා පැහැදිලිය. ඔබ මෙම වරද කිරීමෙහි එල්බ ගනිමින්, එය ඔබගේ වැඩ පිළිවෙළ ප්‍රවාදවලට ඇතුළත් කොට ලියන්-නෙහි නම්, ඔබට ලැබෙන්නේ අන් කිසිවක් නොව, කොමියුනිස්ට් විරෝධී සම්මේලවාදී පිලිපැනීමකි.

''පසුගිය කාලයේදී අප හතරවැනි වැඩ පිළිවෙළෙහි අරමුණු ඉටු කර ගැනීම අතින් කිසිම ප්‍රගතියක් ලබා නොමැති අතර ඇත්ත වශයෙන් ඉන් පසු බැස ඇතැ''යි ට්‍රොට්ස්කි සහෝදරයා ඔහුගේ ප්‍රවාදවල (පිටු 7, ප්‍රවාදය 6) සඳහන් කර තිබෙන බව මෙහිලා සඳහන් කළ යුතුය. එම ප්‍රකාශය ඔප්පු කිරීමට කරුණු සඳහන් කර නැත. එය වැරදි යයි මම අදහස් කරමි. වෘත්තීය සමිති ''තමන්ම'' මෙය පිළිගනිති යයි ට්‍රොට්ස්කි සාකච්ඡාවෙහිදී කී පරිද්දෙන් ප්‍රකාශයක් කිරීම ඔප්පු කිරීමක් නොවේ. පක්ෂය පිළිගන්නා

LIBERATIONBASE

ලෙසට අන්තිම සාක්ෂිය එය නොවේ. ඔප්පු වීම යනු සත්‍ය කරුණු මහා රාශියක් බරපතල සහ වාස්තවික ලෙස අධ්‍යයනය කිරීමෙන් සිදු විය යුත්-තකි. එපමණක් නොවේ. එවැනි සාක්ෂි දක්නට තිබුණත් මෙම ප්‍රශ්නය ඉතිරි වන්නේය: අපි පසු බැස සිටින්නේ කුමක් නිසා ද? එයට හේතුව, ට්‍රොට්ස්කි විශ්වාස කරන ලෙසට ''වෘත්තීය සමිතිවාදීන් බොහෝ දෙනා'' ''නව කර්තව්‍යයන්ට හා විධි ක්‍රමවලට හරස් වීම'' ද, නැතහොත්, නිලධාරි-වාදයේ ඇතැම් නුසුදුසු සහ හානිකර සීමාන්තයන් අඩු කිරීම සහ නිවැරදි කිරීම සඳහා අවශ්‍ය බලවේගයන් ඒකරාශි කර ගැනීමට සහ අවශ්‍ය ක්‍රම සකස් කර ගැනීමට අප තවමත් අපොහොසත්ව සිටින'' නිසාද?

මෙයින් මා යොමු වන්නේ, ''නව වැනි පක්ෂ සම්මේලනයෙන් තීර-ණය කරන ලද ක්‍රියා මාර්ගය අත් හැර දමන ලද'' බවට බුහාරින් දෙසැම්බර් 30 දින අප වෙත එල්ල කළ (දෙවැනි ආකර කම්කරු සම්මේලනයේ කොමි-යුනිස්ට් කණ්ඩායමේ ඊයේ, ජනවාරි 24 දින සාකච්ඡාවේදී[50] ට්‍රොට්ස්කි නැවත ප්‍රකාශ කළ) දෝෂ දර්ශනය වෙතය (දෙසැම්බර් 30 සාකච්ඡාවේ වාර්තාවේ පිටු 46). ලෙනින් ශ්‍රමකරුවන් යුද්ධ හමුද ආකාරයෙන් සංවිධා-නය කිරීමට පක්ෂව කථා කළේ යයි ද, ප්‍රජාතන්ත්‍රවාදය ගැන සඳහන් කරන විට එයට සමච්චල් කළේ යයි ද, එහෙත්, දැන් ඒ සියල්ලම ''ප්‍රති-ක්ෂේපකළේ''යයිද,කියමින් ඔහු සම්මේලනයේදී චෝදනා කළේය.ට්‍රොට්-ස්කි සහෝදරයා දෙසැම්බර් 30 දින විවාදයේ ඔහුගේ පිළිතුරු කථාව කරමින් මෙම අල්පෙනෙත්ති පහර එකතු කළේය: ''විරුද්ධ පාර්ශවීය අදහස් ඇති සහෝදරවරුන් කණ්ඩායමක් වෘත්තීය සමිති තුළ සිටින බව… ලෙනින් සැලකිල්ලට ගනියි'' (පිටුව 65); ලෙනින් එය දෙස ''උපායශීලී දෘෂ්ටි කෝණයෙන්'' බලන බවත් (පිටුව 69); ''පක්ෂ කණ්ඩායම් තුළ සූක්ෂම අරගලයක්'' පවතින බවත් (පිටුව 70), ආදියද ඔහු කීවේය. අදාළ කරුණට එවැනි වර්ණයක් දීම ට්‍රොට්ස්කි සහෝදරයාට මහත්, ආඩම්බරයක් වන අතර එය මට අගුණකීමටත් වඩා අයහපත් දෙයකි. නමුත් සත්‍ය කරුණු ගෙන බලමු.

''අපගේ කම්කරු සංවිධානයේ අභ්‍යන්තර ජීවිතය සම්බන්ධයෙන් අපි අළුත් මඟක් ගත යුත්තෙමු යයි (1920) ජූලි මාසය, තරම් ඈත කාලයක ප්‍රියබ්‍රෂෙන්ස්කි සහෝදරයා මධ්‍යම කාරක සභාව ඉදිරියේ යෝජනා කර තිබුණු'' බැව් දෙසැම්බර් 30 දින එම සාකච්ඡාවේදීම ට්‍රොට්ස්කි සහ ක්‍රෙස්-තින්ස්කි තහවුරු කළහ (පිටු 25). අනුබැඳියාව මැඩ පැවැත්වීම සහ ප්‍රජාත-න්ත්‍රවාදය පුළුල් කිරීම ගැන සිනොවියෙව් සහෝදරයා විසින් ලිපියක් කෙටුම්පත් කරනු ලැබීමත්, මධ්‍යම කාරක සභාව විසින් මා. කා ලිපියක් අනුමත කරනු ලැබීමත් අගෝස්තුවේදී සිදු විය. සැප්තැම්බරයේදී ප්‍රශ්නය පක්ෂ සාකච්ඡා සභාවකට ඉදිරිපත් කරන ලදින් එහි තීරණ මධ්‍යම කාරක

https://liberationbase.wordpress.com

සභාව විසින් අනුමත කෙරිනි. දෙසැම්බරයේදී අනුබැඳියාව මැඩ පැවැත්වීම ගැන ප්‍රශ්නය අටවැනි සෝවියට් සභා සම්මේලනය හමුවේ තබන ලදී. මේ අනුව මුළු මධ්‍යම කාරක සභාවත්, මුළු පක්ෂයත්, මුළු කම්කරු සහ ගොවි ජනතා සමූහාණ්ඩුවත් නිලධාරිවාදය හා එහි දුර්විපාක මැඩ පැවැත්වීමේ මාර්ග පිළිබඳ ප්‍රශ්නය ඉතා වැදගත් එකක් සේ සලකූහ. රු. කො. ප. නව-වැනි සම්මේලනයේ තීරණ ‘‘ප්‍රතික්ෂේප කිරීමක්’’ මෙයින් සිදු වේද? ඇත්තෙන්ම නැත. ශ්‍රමකරුවන් යුද්ධ හමුද ආකාරයෙන් සංවිධානය කිරීම ආදිය ගැන තිබෙන තීරණවලට අභියෝග කළ නොහැකිය. මෙම තීරණ-වලට අභියෝග කළ අය ප්‍රජාතන්ත්‍රවාදය ගැන කී කථා උපහාසයට ලක් කරමින් මා කී වදන් කිසිවක් ඉල්ලා අස් කර ගැනීමේ කිසිම උවමනාවක් මට නොමැත. මෙයින් පෙනෙන්නේ, කම්කරු සංවිධාන වල ප්‍රජාතන්ත්‍ර-වාදය රැවටිල්ලකට නොහරවා එය පුළුල් කිරීමට අප කටයුතු කරන බවය; නිලධාරිවාදී ව්‍යවහාරයන්ට විරුද්ධව අප දරන පරිශ්‍රමයන් දෙගුණ කරන බවය; නිලධාරිවාදයේ නුසුදුසු හා හානිකර සීමාන්තයන් පෙන්නුම් කර දෙන අය කවුරුන්ද යන්න නොතකා, ඒවා නිවරද කිරීමට අප විශේෂ සුපරීක්ෂාකාරිත්වයක් දක්වන බවය.

අවසාන වශයෙන් පූර්වතාවය සහ සමකරණය පිළිබඳ සුළු ප්‍රශ්නය ගැන එක අදහසක් ප්‍රකාශ කරනු කැමැත්තෙමි. නිෂ්පාදනයෙහි දී පූර්වතා-වය සහ පරිභෝජනයෙහිදී සමකරණයත් ට්‍රොට්ස්කි සහෝදරයාගේ 41 වැනි ප්‍රවාදයෙන් අදහස් කෙරෙන හෙයින් ඔහු මෙම කරුණ සම්බන්ධයෙන් එයින් කියා ඇති දෙය න්‍යායික වශයෙන් වැරදි බව මම දෙසැම්බර් 30 දින සාකච්ඡාවේදී කීවෙමි. පූර්වතාවයෙන් අදහස් වන්නේ වැඩි සැලකිල්ලක් දක්වීම වන අතර පරිභෝජනයෙහි එය ක්‍රියාත්මක නොකෙරේ නම්, එය අර්ථ විරහිත වන්නේයයි කියමින් මම පිළිතුරු දුන්නෙමි. ‘‘පුදුමාකාර අමතකය’’ සහ ‘‘බිය වැද්දීම’’ ගැන ට්‍රොට්ස්කි සහෝදරයා මට චෝදනා කළේය (පිටු 67 හා 68). සූක්ෂම ලෙස පොරවැදීම, උපායශීලී පියවර ගැනීම, ආදිය ගැන ඔහු මට චෝදනා නොකිරීම ගැන මම පුදුම වෙමි. ඔහු, එනම්, ට්‍රොට්ස්කි මගේ සමානාත්මතා ක්‍රියා මාර්ගයට ‘‘අනුග්‍රහයක්’’ දක්වූ නමුත්, මම ඔහුට පහර දී ඇත්තෙමි.

නමුත්, පක්ෂ කටයුතු ගැන උනන්දුවක් දක්වන ඕනෑම කෙනෙකුට අවිවාදී පක්ෂ ලියවිලි පිහිට කොට ගත හැක්කේය: ම. කා. පූර්ණ රැස්වීමේ නොවැම්බර් යෝජනාවෙහි අංක 4 සහ ට්‍රොට්ස්කිගේ වැඩ පිළිවෙළ පො-තෙහි 41 වැනි ප්‍රවාදය. මට කොතරම් ‘‘අමතක’’ වුවත්, ට්‍රොට්ස්කි සහෝදර-යාගේ මතකය කොතරම් හොඳ වුවත්, 41 වැනි ප්‍රවාදයෙහි න්‍යායික වරද තිබෙන බවත්, නොවැම්බර් 9 දින ම. කා. යෝජනාවේ එවැනි වරදක් නැති බවත් සැබෑය. එම යෝජනාවෙහි මෙසේ සඳහන් වේ: ‘‘මධ්‍යම කාරක

සභාව, පසුගිය (සැප්තැම්බර්) සමස්ත රුසියා සාකච්ඡා සභාවේ තීරණවලට සම්පූර්ණයෙන්ම එකඟ වෙමින්, ආර්ථික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී පූර්වතා ප්‍රතිපත්තියට අනුකූලතාවය රැකීමේ අවශ්‍යතාවය පිළිගන්නා, අතරම, විවිධ කම්කරු කණ්ඩායම් හා ඒවාට අදාළ වෘත්තීය සමිති සමානා-ත්මතා මට්ටමකට පරිවර්තය වන තත්ත්වයක් ක්‍රමික ලෙස, එහෙත් ස්ථිර ලෙස ඇති කිරීමත්, සංවිධානය නිතරම සමස්ත සමිති පරිමාණයෙන් ගොඩ-නැගීමත් අවශ්‍ය යයි අදහස් කරන්නේය.’’ එය පැහැදිලි ලෙසම එල්ල කර තිබෙන්නේ ටිසෙක්‍රාන් සභාවට විරුද්ධවය. යෝජනාවේ ඒකාන්ත අර්-ථයට වෙනත් ස්වරූපයක් දීමේ කිසිම හැකියාවක් නැත. පූර්වතාවය රැඳී පවතිනු ඇත. පූර්වතා ලැයිස්තුවෙහි ඇති ව්‍යවසායයන්ට, වෘත්තීය සමිති-වලට, සංගතවලට සහ දෙපාර්තමේන්තුවලට (ආර්ථික සැලැස්ම සම්පූර්ණ කිරීම හා සම්බන්ධයෙන්) තවදුරටත් වැඩි සැලකිල්ලක් දක්විය යුතුය. නමුත් ඒ අතරම, සමානාත්මතා ක්‍රියා මාර්ගය අනුව — එයට සහයෝගය දක්වූයේ ‘‘ලෙනින් සහෝදරයා පමණක්’’ නොවන අතර එය පක්ෂ සාක-ච්ඡා සභාව සහ මධ්‍යම කාරක සභාව විසින්, එනම්, මුළු පක්ෂයම විසින් අනුමත කරන ලදී — මෙම පැහැදිලි ඉල්ලීම ඉදිරිපත් වේ: ක්‍රමික ලෙස, එහෙත්, ස්ථිර ලෙස සමානාත්මතාවය කරා පරිවර්තනය වීම ක්‍රියාත්මක කරනු. ටිසෙක්‍රාන් මෙම නොවැම්බර් යෝජනාව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ බැව් මධ්‍යම කාරක සභාවේ දෙසැම්බර් (ට්‍රොට්ස්කි සහ බුහාරින් ගැන වූ) යෝජනාවෙන් පෙනේ. ‘‘සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිපත්ති’’ ගැන නැවත මතක් කිරීමක් එහි අන්තර්ගතය. 41 වැනි ප්‍රවාද-යෙහි න්‍යායික වරද ඇත්තේ එහි මෙසේ සඳහන්ව තිබීම තුළය: පාරිභෝ-ජනයෙහි දී සමකරණය හා නිෂ්පාදනයෙහිදී පූර්වතාවය. එයින් නිෂ්පාදනය හා පාරිභෝජනය අතර පරතරයක් තිබීම අදහස් කෙරෙන හෙයින් එය ආර්ථික වශයෙන් අර්ථ විරහිත යෙදුමකි. මම එවැනි කිසි දෙයක් කියා නැත්තෙමි. එවැන්නක් කීමේ හැකියාවක් මට නැත. ඔබට පැක්ටරියක් නුවුවමනා නම්, එය වසා දමන්න. අත්‍යවශ්‍ය නොවන සියලුම පැක්ටරි වසා දමන්න. අත්‍යවශ්‍ය වන පැක්ටරිවලට පූර්වතාවය දෙන්න. නිදසුනක් ලෙසට ප්‍රවාහණයට වැඩි සැලකිල්ලක් දක්වන්න. ඒකාන්ත වශයෙන්ම එසේ කරන්න. නමුත් වැඩි සැලකිලි දක්වීමෙහිදී පමණ නොඉක්මවිය යුතුය. ටිසෙක්‍රාන් හා සම්බන්ධයෙන් පමණ ඉක්මවා එසේ කරන ලද නිසා පක්ෂය (හුදෙක් ලෙනින් නොව) මෙම නියෝගය නිකුත් කළේය: ක්‍රමික ලෙස, එහෙත්, ස්ථිර ලෙස සමානාත්මතාවය කරා පරිවර්තනය වීම ක්‍රියාත්මක කරනු. පැහැදිලි හා න්‍යායික වශයෙන් නිවැරදි විසඳීමක් දුන් නොවැම්බර් පූර්ණ රැස්වීමෙන් පසුව ‘‘උපනති දෙකක්’’ ගැන කාණ්ඩවාදී පොත් පිංචක් ලියමින්, එහි 41 වැනි ප්‍රවාදය මගින් ආර්ථික අර්ථයෙන් වැරදි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අදහසක් යෝජනා කිරීම ගැන ට්‍රොට්ස්කි දෙස් පවරා ගත යුත්තේ තමන්ටමය.

ට්‍රොට්ස්කි සහෝදරයා ඔහුගේ කාණ්ඩවාදී ප්‍රකාශය කර අදට, ජනවාරි 25 දිනට හරියටම මාසයකි. නුසුදුසු ආකෘතියකින් සහ වැරදි අර්ථයකින් යුත් මෙම ප්‍රකාශනය නිසා පක්ෂය එහි ප්‍රායෝගික ආර්ථික සහ නිෂ්පාදන ප්‍රයත්නයන් කෙරෙන් දේශපාලන සහ න්‍යායික වැරදි නිවැරදි කිරීම දක්වා ඉවතට යොමු කෙරුණු බව දැන් ඉතාමත් පැහැදිලිය. නමුත්, එය නම්, පැරණි කියමනෙහි එන ලෙසට අශුභ සුළහකි.

මධ්‍යම කාරක සභාවේ අභ්‍යන්තර අසමඑයන් ගැන ඇතැම් බියජනක කථා කියා ඇතැයි යන ආරංචි පැතිර තිබේ. මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීන් විරුද්ධ පාර්ශවය පිටුපස සැඟවී සිටින (හා සැඟවී සිටි) බවට සැකයක් නැත. කට කථා, පුදුමාකාර තරම් ද්වේෂ සහගත කියමන් සහ පක්ෂය ද්වේෂයට ලක් කරන නේකාකාර ප්‍රබන්ධ පතුරුවන්නේත්, පක්ෂයේ තීරණවලට ජඩ අර්ථ නිරූපනයන් දෙන්නේ, ගැටුම් උග්‍ර කරන්නේ සහ පක්ෂයේ වැඩට හානි කරන්නේත් ඔවුන්ය.මෙය වූකලී, ඉතා පැහැදිලි හේතු නිසා බොල්ෂෙවික්වරුන්ගේ ධෛර්යය ගැන වෛර කරන සහ වෛර නොකර සිටිය නොහැකි සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්, මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් ඇතුළු ධනපතියන් විසින් උපයෝගි කර ගනු ලබන දේශපාලන කපටිකමකි. පක්ෂයේ සිටින සෑම බුද්ධිමත් සාමාජිකයෙක්ම ධනපතියන්ගේ මෙම දේශපාලන කපටිකම ගැන සහ එහි වටිනාකම ගැන දන්නේය.

මධ්‍යම කාරක සභාවේ අසමඑතාවයන් නිසා පක්ෂය වෙත ආයාචනාකිරීමට සිදු විය. ඒ අනුව ඇති වූ සාකච්ඡාවලින් මෙම අසමඑයන්ගේ සාරාර්ථය හා පරිමාණය හෙළිදරව් විය. එනිසා කටකථා සහ අපවාදයන් අතුගෑවී ගියේය. පක්ෂය එහි පාඩම් උගෙන ගනියි. එමෙන්ම, කාණ්ඩවාදය නැමති නව රෝගයට (ඔක්තෝබර් විප්ලවයෙන් පසු අප ඒ ගැන සියල්ල අමතක කර තිබීමේ අර්ථයෙන් එය අළුත්ය) විරුද්ධව කරන අරගලයේදී එය පන්නරය ලබන්නේය. ඇත්තෙන්ම එය පැරණි රෝගයකි. මීළඟ අවුරුදු කීපය තිස්සේ එය නැවත නැවතත් මතු වන්නට ඉඩ තිබෙන නමුත් දැන් එය සුව කරන පහසු ප්‍රතිකාරයක් පෙනෙන මානයේ ඇත.

තමන්ගේ අසමඑයන් පුම්බා නොතැබීමට පක්ෂය උගෙන ගන්නේය. තොම්ස්කි සහෝදරයා ගැන ට්‍රොට්ස්කි සහෝදරයා පළ කළ නිවැරදි අදහසෙන් මෙම කරුණ උපුටා දක්වනු කැමැත්තෙමි: ''වෘත්තීය සමිතිවල අපගේ නායකයන් විය යුත්තේ තොම්ස්කි සහෝදරයාට තිබෙන පළපුරුද්ද හා අධිකාරය ඇති පුරුෂයන් පමණක්ය යන්න මට ඉතා පැහැදිලි බැවි

මම නිතරම, තොම්ස්කි සහෝදරයාට විරුද්ධව විවාදය ඉතාමත් උග්‍රව පැවති අවස්ථාවේ පවා කියා ඇත්තෙමි. පස්වැනි වෘත්තීය සමිති සාකච්ඡා සභාවේ පක්ෂ කණ්ඩායමට මම මෙය කීවෙමි. එමෙන්ම, දින කීපයකට පෙර සිමීන් රඟහලෙහි එය නැවත වරක් කීවෙමි. පක්ෂය තුළ වන දෘෂ්ටිමය අරගලයෙන් අදහස් කෙරෙන්නේ අන්‍යොන්‍ය වර්ජනය නොව අන්‍යොන්‍ය බලපෑමය'' (දෙසැම්බර් 30 දින සාකච්ඡාවේ වාර්තාවෙහි 34 පිටුව). ස්වාභාවික වශයෙන්ම පක්ෂය ට්‍රොට්ස්කි සහෝදරයා විෂයෙහිමත් මෙම නිවැරදි ප්‍රවේශය ක්‍රියාත්මක කරනු ඇත.

සාකච්ඡාවේදී ඉතාමත් කැපී පෙනෙන සේ සම්මේලවාදී උපනතිය ප්‍රදර්ශනය කළේ ශ්ලයාප්නිකොව් සහෝදරයා සහ ඔහුගේ ඊනියා ''කම්කරු විරුද්ධ පාර්ශවය''[51] ය. මෙය කොමියුනිස්ට්වාදයෙන් සහ පක්ෂයෙන් පිළිපැනීමක් බව පැහැදිලි නිසා අපට එය ගැන සැලකිල්ලක් දැක්වීමට සහ මෙම අදහස්වල වරද විස්තර කිරීමටත්, එවැනි වැරදි කිරීමේ අන්තරාය පැහැදිලි කිරීමටත් විශේෂ ප්‍රචාරක ප්‍රයත්නයක් දැරීමට අපට සිදු වේ. ''භාර කාරත්ව නාම යෝජනා'' (වෘත්තීය සමිති විසින් කළමනාකරණ මණ්ඩලවලට කරන නාම යෝජනා) යන සම්මේලවාදී වදන නිර්මාණය කළ බුහාරින් සහෝදරයා තමා නිවැරදි බව පෙන්වීමට අද ''ප්‍රාව්ද'' පත්‍රයෙන් උත්සාහයක් දරයි. නමුත්, ඔහුගේ ආරක්ෂක ක්‍රියා මාර්ගය ඉතාමත් නිශ්ඵල සහ ඉතාමත් වැරදි යයි මම සිතමි. ඔහු ඉදිරිපත් කරන අනිත් කරුණුවලින් ඔහු පක්ෂයේ කාර්ය කොටස ගැන සඳහන් කරන බව අප දැන ගත යුතු යයි ඔහු අපේක්ෂා කරයි. වෙන කොහොමද? එය එසේ නොවී නම්, එය නිවැරදි කිරීම අවශ්‍ය වන සහ කිසියම් ස්වල්ප නිවැරදි කිරීමකට ඉඩ දෙන වරදක් පමණක් නොවනු ඇත. එවිට එය පක්ෂයෙන් ඉවත් වීමක් වනු ඇත. ඔබ ''භාරකාරත්ව නාම යෝජනා'' යන්න කියන විටම, ඒ සමගම, පක්ෂයේ භාරයක් නොමැති යන්න එකතු කිරීම ගැන නො සලකා හරින විට ඔබ සම්මේලවාදියෙක් වන්නේය. එය කොමියුනිස්ට්වාදය සහ පක්ෂ වැඩ පිළිවෙළ සමග නොගැලපෙයි. ''භාරකාරත්ව එහෙත් පක්ෂයේ භාරයක් නොමැති'' යනුවෙන් එකතු කළහොත්, එවිට ඔබ පාක්ෂික නොවන කම්කරුවන්ගේ අයිතිවාසිකම් වැඩි වී තිබීමක් ගැන ව්‍යාජ හැඟීමක් ඔවුනට දෙන්නෙහි ය. නමුත් එම හැඟීම දෙන්නේ කිසිම වෙනසක් සිදු වී නැතිව තිබිය දීය. කොමියුනිස්ට්වාදය කෙරෙන් මෙසේ පිළි පැනීමෙහි, න්‍යායික වශයෙන් වැරදි සහ දේශපාලන වශයෙන් නොමග යවන සුළු මෙම පිළිපැනීමෙහි බුහාරින් සහෝදරයා එල්බ සිටින කාලය දීර්ඝ වූ තරමට ඔහුගේ මුරණ්ඩුකමෙහි ප්‍රතිඵල වඩාත් අප්‍රසාදජනක වනු ඇත. නොගැලපෙනසුලු තත්ත්වයක් පවත්වා ගැනීමට ඔබට නොපුළුවන. පාක්ෂික

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

නොවන කම්කරුවන්ගේ අයිතිවාසිකම් පොදුවේ වැඩි කිරීම ගැන පක්ෂය විරුද්ධ වන්නේ නැත. නමුත් මේ හා සම්බන්ධයෙන් කළ හැක්කේ කුමක්ද, කළ නොහැක්කේ කුමක්ද යන්න, මදක් සිතා බැලූ පමණින් පෙනෙනු ඇත.

දෙවැනි සමස්ත රුසියා ආකර කම්කරු සම්මේලනයේ කොමියුනිස්ට් කණ්ඩායමේ සාකච්ඡාවේදී ශ්ලයාප්නිකොව් ඉදිරිපත් කළ වැඩ පිළිවෙළට, එම සංගමයේ විශේෂ ප්‍රසාදයක් දිනා ගෙන සිටි කිසෙල්යොව් සහෝදරයාගේ ආධාරය ලැබුණ නමුත්, එහිදී එම වැඩ පිළිවෙළ පරාජය විය. අපගේ වැඩ පිළිවෙළට ඡන්ද 137 ක්ද, ශ්ලයාප්නිකොව් සහෝදරයාගේ වැඩ පිළිවෙළට ඡන්ද 62 ක්ද, ට්‍රොට්ස්කි සහෝදරයාගේ වැඩ පිළිවෙළට ඡන්ද 8 ක්ද ලැබිණි. සම්මේලවාදී රෝගය සුව කළ යුත්තේය. එසේම එය සුව කෙරෙනු ඇත.

සාකච්ඡාවට ප්‍රතිචාර දක්වමින් පක්ෂය ට්‍රොට්ස්කි සහෝදරයාගේ වැරදි ක්‍රියා මාර්ගය අති විශාල වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ප්‍රතික්ෂේප කළ බව පෙට්‍රොග්‍රෑඩ්, මොස්කව් සහ ප්‍රාදේශීය නගර ගණනාවක් පසුගිය මාසය තුළ පෙන්නුම් කර ඇත. ''මුදුනෙහි'' සහ ''පළාත්වල'' ද, කාරක සභාවල සහ කාර්යාලවලද තරමක වැනෙනසුලු භාවයක් නිසැකවම තිබුණ නමුත්, සාමාන්‍ය සාමාජිකත්වය, පක්ෂ කාරකවරු සමූහයා මෙම වැරදි ක්‍රියාමාර්ගයට විරුද්ධව දැඩි ලෙස ඉදිරිපත් විය.

ට්‍රොට්ස්කි සහෝදරයා ඔහුගේ වැඩ පිළිවෙළ ඉවත් කර ගෙන බුහාරින් කණ්ඩායම සමග නව වැඩ පිළිවෙළකට එකතු වන බවට ජනවාරි 23 දින මොස්කව්හි සමොස්ක්වරේච්යේ දිස්ත්‍රික්කයේ සාකච්ඡාවේදී ට්‍රොට්ස්කි සහෝදරයා කළ ප්‍රකාශය ගැන කාමෙනෙව් සහෝදරයා මට දන්විය. ජනවාරි 23 දින හෝ ආකර කම්කරු සම්මේලනයේ කොමියුනිස්ට් කණ්ඩායමේ දී එම 24 දින ඔහු මට විරුද්ධව කථා කළ අවස්ථාවේදී හෝ ට්‍රොට්ස්කි සහෝදරයාගෙන් මට මේ ගැන කිසිවක් අසන්නට නොලැබිණි. එය අවාසනාවක් බඳුය. මෙයට හේතුව ට්‍රොට්ස්කි සහෝදරයාගේ වැඩ පිළිවෙළ සහ අපේක්ෂාවන් නැවත වෙනස් වීමක්ද, නැතහොත්, වෙනත් කරුණක්ද යන්න මම නොදනිමි. කෙසේ හෝ වේවා, පක්ෂය එහි බලවේග සියල්ලම ඒකරාශී නොකරම, පෙට්‍රොග්‍රෑඩ්, මොස්කව් සහ ප්‍රාදේශීය නගර අල්පතරයක් තම තත්ත්වය වාර්තාගත කළ පමණින්, ට්‍රොට්ස්කි සහෝදරයාගේ වරද අප්‍රමාදව සහ අදිටන් සහිතව නිවරද කිරීමට එය හේතු වූ බව ජනවාරි 23 දින ඔහුගේ ප්‍රකාශයෙන් පෙනේ.

පක්ෂයේ සතුරෝ කල් මත්තෙන් ප්‍රීති වූහ. පක්ෂය තුළ නොවැලැක්විය හැකි ලෙසින් ඇති වන ඇතැම් අසමඨයන් පක්ෂයටත්, රුසියාවේ නිර්ධන පංති ආඥාදායකත්වයටත් හානි කිරීම පිණිස උපයෝගි කර ගැනීමෙහි ඔවුන් සමත් නොවීය — කිසි කලෙකත් සමත් නොවනු ඇත.

1921 ජනවාරි 25.

මොස්කව් කම්කරු ගොවිජන සහ රතු හමුදා නියෝජිත සෝවියට් සභාවේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව විසින් කුඩා පොතක් ලෙසට 1921 ජනවාරි 25 හා 26 දිනවල පළ කරන ලදී

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 42, පිටු 264-304

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඒකාබද්ධ ආර්ථික සැලැස්ම

මෙම විෂය ගැන කියන හා ලියන දෙයින් ඇති වන්නේ වේදනාත්මක හැඟීමකි. "එකොනොමිචෙස්කය ෂීස්න්"[52] හි පළ කෙරුණු (I — 1920 දෙසැම්බර් 14; II — දෙසැම්බර් 23; III — පෙබරවාරි 9; IV — පෙබරවාරි 16 සහ V — පෙබරවාරි 20) එල්. ක්‍රිට්ස්මාන්ගේ ලිපි ගෙන බලමු. හිස් කථා සහ වචන නැටවීමත්, මෙම ක්ෂේත්‍රයෙහි කර තිබෙන කටයුතු ගැන සලකා බැලීම හා විමසා බැලීම ප්‍රතික්ෂේප කිරීමත් හැර එහි ඇති වෙනත් දෙයක් නොමැත. කරුණු සහ දත්තයන් ගැන සැබෑ පරීක්ෂාවක් නොකරන, ඒවා අධ්‍යයනය කිරීම වෙත සමීප වන්නේ කෙසේද යන සංකල්පනා විස්තර කරන දීර්ඝ ලිපි පහකි!

මිල්යූතින්ගේ ("එකොනොමිචෙස්කය ෂීස්න්", පෙබරවාරි 19), නැතහොත්, ලාරින්ගේ (එම, පෙබරවාරි 20) ප්‍රවාද ගෙන බලන්න. "වග කිව යුතු" සහෝදරවරුන්ගේ කථාවලට කන් දෙන්න. ක්‍රිට්ස්මාන්ගේ ලිපිවල ඇති එම මූලික දුර්වලකම් ඒ සියල්ලෙහිම ඇත. ඇදීමේ නියාමය ආදිය පිළිබඳ නන් දෙඩවිලි රැසක් සහිත ඉතාමත් මොට්ට ස්වභාවයේ පණ්ඩිතමානය එයින් හෙළිදරව් වේ. එය චූකලී සියලු ප්‍රායෝගික පරිශ්‍රමයන් බැහැර කරන සහ සාහිත්‍යයේ සිට නිලධාරිවාදය දක්වා විහිදෙන පණ්ඩිතමානයකි.

නමුත් කරන ලද හා තවදුරටත් කර ගෙන යාම අවශ්‍යව තිබෙන ඉතා වැදගත් වැඩ කටයුතු ගැන දක්වන විභූෂිත නිලධාරිවාදී පිළිකුල් සහගත සැලකිල්ල ඊටත් වඩා භයානකය. අපගේම ප්‍රායෝගික අත්දැකීම් ගැන වෙහෙස දරා සහ කල්පනාකාරීව කරන අධ්‍යයනය වෙනුවට ඉතාමත් හිස් "ප්‍රවාද නිෂ්පාදනය කිරීම" සහ සැලසුම් හා උද්යෝග පාඨ ගෙතීම දක්නට ලැබේ.

මෙම විෂය සම්බන්ධයෙන් කර තිබෙන එකම බරපතල සේවය "රු. ස. ඒ. සෝ. ස. විද්‍යුතනය කිරීම සඳහා සැලැස්මය." එනම්, "ගොඑල්රෝ" කොමිසම (රුසියාව විද්‍යුතනය කිරීම සඳහා රාජ්‍ය කොමිසම) අටවැනි සෝවියට් සභා සම්මේලනයට ඉදිරිපත් කළ වාර්තාවය. එය 1920 දෙසැම්බර් මස පළ කෙරුණු අතර, අට වැනි සම්මේලනයට බෙදා දෙන ලදී. සමූහාණ්ඩුවේ ඉහළම මණ්ඩලවල උපදෙස් අනුව, සමූහාණ්ඩුවේ හොඳම බුද්ධිමතුන් විසින් සකස් කරන ලද ඒකාබද්ධ ආර්ථික සැලැස්මක කටු සටහනක් එයින් ඉදිරිපත් කෙරේ. එය සකස් කර තිබෙන්නේ සන්නිකර්ෂණ වශයෙන් පමණක් බව සැබෑය. මෙම බමුණන්ගේ නොදැනුවත්කමින් උපන් ශුභවාදයට සහ කොමියුනිස්ට් සාහිත්‍යකරුවන්ගේ බුද්ධිවාදී උද්ධච්ච කමට විරුද්ධව අපි ඉතා සුළු වශයෙන් සටන් කිරීම ආරම්භ කළ යුත්තෙමු. මෙම පොතෙහි ඉතිහාසය ගැන කීමෙන් සහ එහි සන්ධාරය සහ වැදගත්කම ගැන විස්තර කිරීමෙන් එම කටයුත්ත ආරම්භ කළ යුත්තෙමු.

මීට අවුරුද්දකට වඩා ඉහතදී, 1920 පෙබරවාරි 2-7 දිනවල රැස්වූ සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව විද්‍යුතන කිරීම ගැන යෝජනාවක් අනුමත කළේය. එහි මෙසේ සඳහන්ය:

"ප්‍රවාහනය සංවිධානය කිරීමේ, ඉන්ධන හා ආහාර අර්බුද සමහන් කිරීමේ, වසංගතයට විරුද්ධ සටනේ සහ විනය සම්පන්න ශ්‍රම හමුද පිහිටුවීමේ ඉතාමත් හදිසි, අවශ්‍ය සහ වැදගත් කර්තව්‍යයන් ඉටු කරන අතරම, වඩාත් තුලනාත්මක ආර්ථික සංවර්ධනයක් ආරම්භ කිරීමේ සහ දේශව්‍යාප්ත රාජ්‍ය ආර්ථික සැලැස්මක් විද්‍යාත්මක ලෙසින් සකස් කර ගෙන එය සසංගත ලෙස ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවක් දැන් ප්‍රථම වතාවට සෝවියට් රුසියාවට ලැබී තිබේ. විද්‍යුතන කරණය මූලික වශයෙන් වැදගත් බව සැලකිල්ලට ගැනීම... කර්මාන්තය, කෘෂිකර්මාන්තය සහ ප්‍රවාහනය සඳහා විද්‍යුතනයෙහි ඇති වැදගත්කම කල්පනාවට ගැනීම... යනාදිය අනුව... කාරක සභාව මෙසේ තීරණය කරයි: කෘෂිකර්මාන්ත කටයුතු භාර මහජන කොමිසාර් අංශය සමග එක්ව කටයුතු කරමින්, විදුලි බල ස්ථාන ක්‍රමයක් ගොඩනැගීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කරන ලෙස ආර්ථික මහා මණ්ඩලයට බලය පැවරීමට"

මෙය ප්‍රමාණවත් තරම් පැහැදිලි බව පෙනේ. නොඑසේද? "දේශව්‍යාප්ත රාජ්‍ය ආර්ථික සැලැස්මක් විද්‍යාත්මක ලෙසින් සකස් කර" — අපගේ උසස්තම අධිකාරියෙන් අනුමත කරන ලද තීරණයෙහි එන මෙම වචන වැරදි අර්ථයකින් වටහා ගත හැකි ද? විශේෂඥයන් හමුවේ තමන්ගේ කොමියුනිස්ට්වාදය ගැන පුරසාරම් දෙඩන සාහිත්‍යකාරයන් හා බමුණන් මෙම තීරණය ගැන නොදන්නේ නම්, අපගේ නීති ගැන ඔවුන්ට ඇති නොදැනුම තර්කයක් නොවන බැව් ඔවුන්ට මතක් කර දීම අපගේ යුතුකමය.

සමස්ත රුසියා ම. වි. කා. තීරණය අනුව කටයුතු කළ ආර්ථික මහා මණ්ඩලයේ සභාපති මඬුල්ල විදුලි බල දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලද විද්‍යුතන කොමිසම 1920 පෙබරවාරි 21 දින ස්ථිර කළේය. ඉන් අනතුරුව ආරක්ෂක මණ්ඩලය "ගොඑල්රෝ" පනත අනුමත කළ අතර කෘෂිකර්මාන්ත කටයුතු භාර කොමිසාර් අංශය සමග එක්ව එහි සංයුතිය නිර්ණය කරගන්නා ලෙස ආර්ථික මහා මණ්ඩලයට උපදෙස් දුන්නේය. "ගොඑල්රෝ" කොමිසම 1920 අප්‍රේල් 24 දින එහි අංක 1 "නිවේදන පත්‍රිකාව" නිකුත් කළේය. විස්තර සහිත වැඩ ලේඛනයක්ද, වග කිව යුතු පුද්ගලයන්, එනම්, විවිධ ක්ෂේත්‍රයන්හි කටයුතු මෙහෙයවන අනු කොමිසම්වල ක්‍රියා කරන විද්‍යාඥයන්, ඉන්ජිනේරුවරු, කෘෂිවිද්‍යාඥයන් හා සංඛ්‍යා විද්‍යාඥයන් සහ ඒ එක් එක් අය භාර ගෙන තිබුණු නිශ්චිත වගකීම් දක්වෙන ලැයිස්තුවක්ද, එම "නිවේදන පත්‍රිකාවෙහි" ඇතුළත් විය. එම පුද්ගලයන්ගේ නම් සහ ඔවුන්ට පැවරුනු වගකීම් දක්වෙන ලැයිස්තුව අංක 1 දරන "නිවේදන පත්‍රිකාවේ" මුද්‍රිත පිටු දහයක් විය. ආර්ථික මහා මණ්ඩලයේත්, කෘෂිකාර්මික කටයුතු භාර මහජන කොමිසාර් අංශයේත්, ප්‍රවාහනය භාර මහජන කොමිසාර් අංශයේත් සිටි ඉතාමත් දක්ෂ පුද්ගලයන් එම කොමිසමට බඳවා ගෙන තිබුණි.

"ගොඑල්රෝ" ප්‍රයත්නයෙන් මෙම ඉතා විශාල හා පළමු පංතියේ විද්‍යාත්මක ප්‍රකාශනය නිමවී තිබේ. එය සකස් කිරීම සඳහා විශේෂඥයන් 180 දෙනෙකුට වැඩි පිරිසක් වැඩ කළහ. ඔවුන් "ගොඑල්රෝ" කොමිසමට ඉදිරිපත් කළ වැඩ ලැයිස්තුවෙහි වැඩ අංක 200 කට වැඩි ගණනක් විය. ප්‍රථමයෙන්ම මෙම වැඩ පිළිබඳ සම්පිණ්ඩනයක් අපට දක්නට ලැබේ (පිටු 200 කට අධික වෙළුමේ පළමු කොටස) :(අ) විද්‍යුතනකරණය සහ රාජ්‍ය ආර්ථික සැලැස්මක්; ඊළඟට, (ආ) ඉන්ධන සම්පාදනය (මීළඟ දස අවුරුද්දට අදාළව රු. ස. ඒ. සෝ. ස. සඳහා විස්තර සහිත "ඉන්ධන අය වැය ලේඛනයක්", අවශ්‍ය මිනිස් බල ඇස්තමේන්තුවක් ද සමග); (ඇ) ජල බලය; (ඈ) කෘෂිකර්මාන්තය; (ඉ) ප්‍රවාහනය සහ (ඊ) කර්මාන්තය.

අවුරුදු දහයක් පමණ වූ කාලයක් සඳහා වන මෙම සැලැස්මෙහි, අදාළ කම්කරුවන් සංඛ්‍යාව හා බලශක්ති ධාරිතාවය (අශ්ව බල 1000 ගණන්) දක්වා ඇත. නමුත් එය දළ කෙටුම්පතක් බවත්, එහි වැරදි තිබිය හැකි බවත්, එය "දළ සන්නිකර්ෂණයක්" පමණක් වන බවත් ඇත්තය. එසේ වුවත්, එය නියම විද්‍යාත්මක සැලැස්මකි. සෑම ප්‍රධාන වැඩ අංකයක්ම සහ සෑම කර්මාන්තයක්ම සඳහා විශේෂඥයන් විසින් සකස් කරන ලද යථාතථ්‍ය ගණන් හිලව් අපට සපයා තිබේ. සුළු නිදසුනක් ලෙසට, සම් නිෂ්පාදනය සඳහා, එක් පුද්ගලයෙකුට පාවහන් කුට්ටම් දෙක බැගින් (කුට්ටම් 30 කෝටියක්) දීම ආදිය සඳහා ඔවුන් සකස් කළ ගණන් හිලව් අපට සපයා ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙසට, විද්‍යුතනය කිරීමට අදාළව ද්‍රව්‍ය හා මුදල් (රන් රූබල්) විස්තර (වැඩ කරන දින කෝටි 37 ක් පමණ වන අතර

අවශ්‍ය සිමෙන්ති බැරල් ගණන, ගඩොල් සංඛ්‍යාව, යකඩ, තඹ හා අනෙකුත් ද්‍රව්‍ය පූඩ් ගණන, ටර්බයින් ජෙනරේටර ශක්තිය, ආදිය) දක්වෙන අය වැය පත්‍රයක් අපට ඇත. මීළඟ දස අවුරුද්ද තුළ ("ඉතා දළ තක්සේරුවක්) නිෂ්පාදන කර්මාන්තවල සියයට 80 ක වර්ධනයක් ද, නිෂ්කර්ශන කර්මාන්තවල සියයට 80-100 ක වර්ධනයක්ද එම සැලැස්මෙන් අපේක්ෂා කෙරේ. රත්‍රන් ශේෂයේ පරතරය (+ කෝටි 1100 — කෝටි 1700 අනුව කෝටි 600) "අනුග්‍රහ දීමෙන් සහ ණය ගනුදෙනු මගින් පියවා ගත හැකිය."

ප්‍රථම දිස්ත්‍රික්ක වාෂ්ප විදුලි බල ස්ථාන 20 සහ ජල විදුලිබල ස්ථාන 10 පිහිටුවීමට සුදුසු ස්ථාන සහ ඒ එක එකෙහි ආර්ථික වැදගත්කම ගැන විස්තර සැලැස්මෙහි දක්වා ඇත.

පොදු සම්පිණ්ඩනයට අනතුරුව එක් එක් ප්‍රදේශයට අදාළ වැඩ ලැයිස්තු (වෙනම පිටු අංක සහිතව) දක්වා ඇත: උතුරු ප්‍රදේශය, මධ්‍යම කාර්මික ප්‍රදේශය (මෙම ප්‍රදේශ දෙකම සම්බන්ධයෙන් විද්‍යාත්මක දත්තයන් රැසක් පදනම් කොටගත් යථාතථ්‍ය විස්තර සහිතව නොරතුරු ඉතා හොඳින් ඉදිරිපත් කර ඇත), දකුණු ප්‍රදේශය, වොල්ගා ප්‍රදේශය, උරල් ප්‍රදේශය, කොකේසියාව (කොකේසියාවේ විවිධ සමූහාණ්ඩු අතර එකඟත්වයක් ඇති වේය යන අපේක්ෂාවෙන් එය සමස්තයක් වශයෙන් ගෙන ඇත), බටහිර සයිබීරියාව සහ තුර්කිස්ථානය. සෑම ප්‍රදේශයක්ම සම්බන්ධයෙන් විදුලි බල ධාරිතාවයන් ප්‍රථම ඒකකයන්ගෙන් ඔබ්බට ප්‍රක්ෂේපණය කොට තිබේ. ඊට අනතුරුව ඇත්තේ "ගොඑල්රෝ වැඩ පිළිවෙළ — අ" ය. එයින් ඉදිරිපත් කෙරෙන්නේ පවතින විදුලි බල ස්ථාන ඉතාමත් බුද්ධිමත් ලෙස හා පිරිමැසුම්දායක ලෙස උපයෝගී කර ගැනීමේ සැලැස්මකි. තවත් සුළු නිදර්ශනයක් මෙන්න: පෙට්‍රොග්‍රෑඩ් (උතුරු ප්‍රදේශය) බල ස්ථාන ජාලකයකින් පහත සඳහන් පිරිමැස්ම සිදු වෙතැයි ඇස්තමේන්තු කර තිබේ (පිටු 69): බල ශක්තියෙන් අඩක් පමණ උතුරේ මුර්මාන්ස්ක්, අර්හාංගල්ස්ක්, ආදී වූ කපන ප්‍රදේශවලට හරවා යැවිය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් දව සැපයුම හා අපනයනය වැඩි කිරීමෙන් "නුදුරුතම අනාගත කාලයේදී අවුරුද්දකට රූබල් 50 කෝටියක් දක්වා වටිනා විදේශ විනිමය" ලබා ගත හැකි වනු ඇත.

අපි සැලැස්ම ගැන කථා කිරීම නවත්වා දැන් විද්‍යාඥයන් සකස් කර තිබෙන සැලැස්ම අධ්‍යයනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම අරඹන්නෙමු නම්, "උතුරු ප්‍රදේශයේ අපගේ දැවවලින් ලබන වාර්ෂික ආදායම මීළඟ අවුරුදු කීපය තුළදී අපගේ රන් සංචිතයට සමාන වීමට හොඳටම ඉඩ තිබේ" (එම, පිටු 70).

වෙනත් කාර්යයන් ගණනාවක් සම්බන්ධයෙන් (එහෙත් සියල්ලම සම්බන්ධයෙන් නොවේ) අපට ඉතා කුඩා ප්‍රමාණ වාර්ෂික වැඩ පිළිවෙළක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇත. මෙය පොදු සැලැස්මට වඩා අමතර දෙයකි: එය 1921 සිට 1930 දක්වා වර්ෂයෙන් වර්ෂයට ක්‍රියාත්මක කළ හැකි බල ස්ථාන ගණන සහ පවත්නා බල ස්ථාන විශාල කළ හැකි අනුපාතයන් දක්වන ඇස්තමේන්තුවකි. (එය ඉටු කළ හැක්කේ මා දූන් සඳහන් කළ දෙය ආරම්භ කළහොත් පමණකි. අපගේ බුද්ධිවාදී සාහිත්‍යකාරයන්ගේ සහ නිලධාරිවාදී බමුණන්ගේ හුරුපුරුදුකම් ගැන සිතන කළ මෙය පහසු වන්නේ නොවේ.)

ජර්මනිය දෙස බලන කල "ගොඑල්රෝ" පරිශ්‍රමයේ පරිමාණය හා අගය පෙනෙනු ඇත. එහි බල්ලොද් නැමති විද්‍යාඥයා එබඳු කෘතියක් නිර්මාණය කළේය. ඔහු ජර්මනියේ මුළු ජාතික ආර්ථිකයම සමාජවාදී ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා විද්‍යාත්මක සැලැස්මක් සකස් කළේය.[53] නමුත් ඔහුගේ රට ධනපති රටක් වූ හෙයින් එම සැලැස්ම කිසි කලෙකත් ක්‍රියාත්මක කෙරුනේ නැත. එය එකසර ප්‍රයත්නයක් හා සාහිත්‍යික ලෙඛනයේ ව්‍යායාමයක් ලෙසට ඉතිරිව ඇත. මෙහි සිටින අපට එය විශේෂඥයන් සිය ගණන් මෙහෙයවා ගනිමින් (අප කලින් අරමුණු කළ ලෙසට මාස දෙකකින් නම් නොව) මාස 10 කින් ඒකාබද්ධ ආර්ථික සැලැස්මක් විද්‍යානුකූල ලෙස සකස් කිරීම පිළිබඳ රාජ්‍ය කාර්ය භාරයක් විය. මෙම කෘතිය ගැන ආඩම්බර වීමේ සෑම අයිතියක්ම අපට ඇත. අප දූන් කළ යුතුව තිබෙන්නේ එය උපයෝගි කර ගන්නේ කෙසේද යන්න වටහා ගැනීමය. දූන් අපට පොර බැදීමට සිදුව ඇත්තේ මෙම කරුණ වටහා ගැනීමට ඇති අපොහොසත්කමට විරුද්ධවය.

අටවැනි සෝවියට් සභා සම්මේලනයේ යෝජනාවෙහි මෙසේ කියා ඇත: "... සම්මේලනය... ආර්ථික මහා මණ්ඩලය ආදියෙහි කටයුතු-විශේෂයෙන්ම රුසියාව විද්‍යුතනකරණය සඳහා සැලැස්මක් සකස් කිරීමෙන් "ගොඑල්රෝ" කොමිසම කළ කටයුතු අනුමත කරයි... මෙම සැලැස්ම මහා ආර්ථික ප්‍රයත්නයේ ප්‍රථම පියවර වශයෙන් සලකයි. සැලැස්ම අවසාන වශයෙන් පිළියෙළ කොට හැකි තරම් ඉක්මණින් එය අනුමත කරන ලෙස සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවට බලය පවරයි... මෙම සැලැස්ම ඉතාමත් පුළුල් ලෙස පොදු ජනතාවට හඳුන්වා දීම සඳහා අවශ්‍ය සියලුම පියවර ගැනීමට එය බලය දෙයි... මෙම සැලැස්ම, විශේෂයකින් තොරව, සමූහාණ්ඩුවේ සියලුම අධ්‍යාපන ආයතන වල පාඨමාලාවල විෂයයක් ලෙසට ඇතුළත් කළ යුතුය."[54] යනා දී වශයෙනි.

මොස්කව්හි සිටින සමහර පුද්ගලයන් මෙම යෝජනාව කෙරෙහි දක්වන ආකල්පයෙන්ද, එය සම්පූර්ණයෙන්ම නොතකා හරින තරම් දුරට විකෘති කිරීමට ඔවුන් දරන ප්‍රයත්නයන්ගෙන් ද, අපගේ යන්ත්‍රයේ, විශේෂයෙන්ම, එහි මුදුන් රාක්කයේ ඇති නිලධාරිවාදී සහ බුද්ධිවාදී දුර්වලකම් එක් වරම හෙළිදරව් වන්නේය. සැලැස්ම ගැන ප්‍රචාරය කරනු වෙනුවට

සැලැස්මක් සකස් කරන්නේ කෙසේද යන්න ගැන සාහිත්‍ය කරුවෝ ප්‍රවාද සහ හිස් විචාර ලිපි ලියති. බමුණෝ ඉඳුරාම නිලධාරීවාදී තාලයකින් සැලැස්ම "අනුමත කිරීමේ" අවශ්‍යතාවය ගැන අවධාරණය කරති. ඔවුන් එයින් අදහස් කරන්නේ යථාභූත කාර්යයන් (විවිධ යන්ත්‍රස්ථාන තැනීම, විදේශයෙන් විවිධ භාණ්ඩ මිළට ගැනීම, ආදිය සඳහා දින) අනුමත කිරීම නොව නව සැලැස්මක් සකස් කිරීම වැනි අවුල්මතයකි! මෙයින් ඇති වන වැරදි අවබෝධයන් භයානකය. ඒ අනුව, අළුත් දෙය ආරම්භ කිරීමට පෙර පරණ දෙය අර්ධ වශයෙන් ප්‍රකෘතිමත් කිරීම ගැන ද කථා කරනු ලැබේ. විද්‍යුතනකරණය වූකලී කිසියම්"විද්‍යුත් විජ්ජා කරණයකැ"යිද කියනු ලැබේ. ගෑස්කරණය නොකරන්නේ මන්දැයි ඔවුහු අපෙන් අසති. "ගොඑල්රෝ" කොමිසම ධනපති විශේෂඥයින්ගෙන් පිරී ඇතැයිද, එහි ඇත්තේ කොමියුනිස්ට්වාදීන් කීප දෙනෙක් පමණකැයිද කියති. ගොඑල්රෝව පොදු සැලැසුම්කරණ කොමිසමේ කාර්ය මණ්ඩලය ලෙසට කටයුතු නොකර විශේෂඥ කාර්ය මණ්ඩලය සැපයිය යුතු බවද යනාදිය එසේම කියති.

අනතුර ඇත්තේ දුස්සංගමයෙහිය. වැඩ කිරීමට අපොහොසත්කම සහ සෑම සැබෑ පරිශ්‍රමයක්ම බැහැර කරන තරමට බුද්ධිවාදී සහ නිලධාරිවාදී ශුභවාදය පවතින බව එයින් පෙනේ. "පුදුමාකාර" සැලැස්ම වෙත එල්ල කරන සරදම්වලින් සහ ගෑස්කරණය ආදිය ගැන අසන ප්‍රශ්නවලින් උද්ධච්ච මෝඩයා හඳුනා ගත හැකිය. නිර්මාණය කිරීමට පළමු පෙළේ විශේෂඥයන් හමුදවක් අවශ්‍ය වූ යම් දෙයක අඩුපාඩු පෙන්වීමට අවිචාරවත් ලෙස ප්‍රයත්න දැරීමට තරම් ඔවුන් ඔළමොට්ටලය! වැරහැලි වුනු සුළු විහිළු තහළුවලින් එය පසෙක තැබීම සහ "අනුමැතිය නොදීමට" අයෙකුට ඇති අයිතිය ගැන උදම් ඇනීම ලජ්ජාවට කරුණක් නොවේ ද?

විද්‍යාව ගැන අගය කරමින් මතගාන්නාගේ සහ නිලධාරිවාදියාගේ "කොමියුනිස්ට්" මාන්නය ඉවත ලීමට අප උගෙන ගත යුතු කාලය පැමිණ තිබේ. අප, අපගේම අත්දැකීම්වලින් සහ ව්‍යවහාරයෙන් ප්‍රයෝජන ගනිමින් ක්‍රමානුකූල ලෙස වැඩ කිරීමට උගෙන ගත යුතු කාලය පැමිණ තිබේ.

"සැලසුම්" කෙළවරක් නැති තර්ක සහ සාකච්ඡා ඇතිවීමට තුඩුදෙන බව ඇත්තය. නමුත්, අප හමුවේ තිබෙන එකම විද්‍යාත්මක සැලැස්ම අධ්‍යයනය කිරීමෙහි යෙදීම අපගේ කර්තව්‍යය වී තිබෙන කල, පොදු ප්‍රකාශයන් කිරීම සහ පතුලේ තිබෙන "ප්‍රතිපත්ති" ගැන විවාද කිරීම වෙත අප යොමු වන තැනට අපි ඉඩ නොතැබිය යුත්තෙමු. අපි, ප්‍රායෝගික අත්දැකීම් සහ වඩාත් විස්තර සහිත අධ්‍යයනය ශක්තියක් කොට ගනිමින් එය නිවැරදි කර ගැනීමේ කටයුත්තෙහි නිරත විය යුත්තෙමු. නමුත් "අනුමැතිය දීමේ, නැතහොත්, නොදීමේ" අයිතිය නිතරම තමන් වෙත රඳවා ගැනීම බමුණන්ගේ සිරිත බව ඇත්තය. මෙම අයිතිය දෙස ඥානාන්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විත ලෙස බලන කලද, අටවැනි සම්මේලනය අනුමත කළ හා පුළුල්තම ප්‍රචාරය සඳහා වන සැලැස්ම සම්මත කිරීමට අදාළ එහි යෝජනාව තර්කානුකූල ලෙස වටහා ගත් විටද, පෙනෙන්නේ අනුමැතිය යන්නෙන් ඇණවුම් මාලාවක් කිරීමත්, උපදෙස් මාලාවක් නිකුත් කිරීම, යම් යම් භාණ්ඩ මිළට ගැනීම, ගොඩනැගිලි තැනීම ආරම්භ කිරීම, ද්‍රව්‍ය එකතු කිරීම සහ ඒවා අවශ්‍ය තැන්වලට යැවීම, ආදියත් අදහස් වන බවය. අනිත් අතට, නිලධාරිවාදී ස්ථාවරය අනුව ''අනුමැතිය'' යන්නෙන් අදහස් වන්නේ, බමුණන් කරන හිතුවක්කාර ක්‍රියාවන්, අනුබැදියා පටලැවිල්ල, පරීක්ෂණ කොමිසම් ක්‍රීඩාව සහ ක්‍රියාත්මක වන සියල්ල සම්පූර්ණයෙන්ම නිලධාරිවාදී ලෙස අවුල් කර දැමීමය.

එම කරුණ වෙත වෙනත් පැත්තකින් බලමු. විද්‍යුතනකරණය සඳහා වූ විද්‍යාත්මක සැලැස්ම, පවත්නා කෙටිකාලීන සැලසුම් සමග හා ඒවා සැබැවින්ම ක්‍රියාත්මක කිරීම සමග එකට සම්බන්ධ කර ගැනීමේ විශේෂ අවශ්‍යතාවයක් ඇත. මෙය කළ යුතුය යන්න ගැන ස්වභාවික වශයෙන්ම කිසිම සැකයක් නොමැති. නමුත් එය කළ යුත්තේ කෙසේ ද? එය සොයා ගැනීම පිණිස, ආර්ථික විද්‍යාඥයන්, සාහිත්‍ය කාරයන් සහ සංඛ්‍යා විද්‍යාඥයන් සැලැස්ම ගැන පොදුවේ කරන දෙඩවිල්ල නතර කොට,අපගේ සැලසුම් ක්‍රියාත්මක කරන ආකාරයත්, මෙම ප්‍රායෝගික කටයුත්තෙහිදී අප අතින් සිදුවන වැරදිත්, ඒවා නිවැරදි කරන මාර්ගත් ගැන විස්තරාත්මක අධ්‍යයනයක් කළ යුතුය. එසේ නොකළහොත් දීර්ඝ කාලයක් තිස්සේ අඳුරේ අතගාමින් අපගේ මඟ සොයා ගැනීමට අපට සිදුවේ. අපගේ ප්‍රායෝගික අත්දැකීම් ගැන කරන එබඳු අධ්‍යයනයකට අමතරව, පරිපාලන ශිල්ප ක්‍රමය පිළිබඳ සුළු කරුණක් ඇත. අපට උවමනාවටත් වඩා සැලසුම්කරණ කොමිසම් සභා ඇත. ඉවාන් ඉවනොවිච් යටතේ පවතින දෙපාර්තමේන්තුවෙන් පුද්ගලයන් දෙදෙනෙක් ගෙන, ඔවුන් පාවෙල් පාව්ලොවිච් යටතේ පවතින දෙපාර්තමේන්තුවේ සිටින පුද්ගලයෙක් සමග සම්බන්ධ කරන්න. නැතහොත් එහි අනිත් පැත්ත ක්‍රියාත්මක කරන්න. ඔවුන් පොදු සැලසුම්කරණ කොමිසමේ අනුකොමිසමක් සමග සම්බන්ධ කරන්න. මේ සියල්ලම පරිපාලන ශිල්ප ක්‍රමයට අදාළ වන්නේය. විවිධාකාර ඒකාබද්ධ කිරීම් අත්හද බලා ඉන් හොඳම ඒවා තෝරා ගත යුතුය. එය ඉතා සරලය.

එම හේතුව නම්, ප්‍රවේශයේ කලාව තවමත අප නොදන්නා බව හා උද්‍යෝගී පරිශ්‍රමය වෙනුවට බුද්ධිවාදී හා නිලධාරිවාදී යෝජනා ක්‍රම ආදේශ කරන බවය. ආහාර හා ඉන්ධන සම්බන්ධයෙන් අපට කෙටිකාලීන සැලසුම් තිබුණේය. එසේම දැනටත් ඇත. ඒ දෙකෙහිම ඉතා පැහැදිලිව පෙනෙන වැරදි ඇත. එය අවිවාදී සත්‍යයකි. නමුත් කාර්යක්ෂම ආර්ථික විද්‍යාඥයා. හිස් ප්‍රවාද නොලිය සත්‍ය කරුණු සහ සංඛ්‍යා අධ්‍යයනය කර-

මින්, අපගේම ප්‍රායෝගික අත්දැකීම් විශ්ලේෂණය කිරීමෙහි යෙදෙන්නේය. අපගේ වැරදි නියත ලෙසින් පෙන්වා දෙන ඔහු ඊට පිළියමක්ද යෝජනා කරනු ඇත. යෝජනා කළ යුතු, නැතහොත්, ක්‍රියාත්මක කළ යුතු මාරුකිරීම්, වාර්තා වෙනස් කිරීම්, යන්ත්‍ර යළි සකස් කිරීම්, ආදිය පිළිබඳ අදහසක් එවැනි වර්ගයේ අධ්‍යයනයක් විසින් කාර්යක්ෂම පරිපාලකයාට ගෙන දෙනු ඇත. ඒකාබද්ධ ආර්ථික සැලැස්ම සම්බන්ධයෙන් කිසිම දෙයක් අප විසින් නොකෙරෙනබව ඔබට පෙනෙනු ඇත.

ප්‍රධාන දුර්වලකම ඇත්තේ කොමියුනිස්ට්වරුන් සහ විශේෂඥයන් අතරද, පරිපාලකයන් සහ විද්‍යාඥයන් හා ලේඛකයන් අතරද වන සම්බන්ධකම් වෙතට සමීප වීමේ මාර්ගයෙහිය. වෙනත් ඕනෑම කටයුත්තකදී මෙන්ම, ඒකාබද්ධ ආර්ථික සැලැස්මෙහිද, ඇතැම් අංශ හා සම්බන්ධයෙන් පරිපාලනමය ස්වභාවයේ ප්‍රවේශ මාර්ගයක්, නැතහොත්, තනිකරම කොමියුනිස්ට්වරුන්ගේ තීරණ ගැනීමක් අවශ්‍ය වන බවට සැකයක් නැත. එවැනි අංශ නිතරම ඉදිරියට ඒමට ඉඩ තිබෙන බවද එකතු කරනු කැමැත්තෙමි. එසේ වුවත්, එය මෙම කරුණ දෙස වියුක්ත ආකාරයකින් බැලීමක් වන්නේය. ඉඳුරාම මෙම අවස්ථාවෙහි අපගේ කොමියුනිස්ට් ලේඛකයෝ සහ පරිපාලකයෝ සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රවේශ මාර්ගයක් ගනිති. එසේ කියන්නේ, මෙම අවස්ථාවෙහිදී ධනපති විශේෂඥයන්ගෙන් සහ විද්‍යාඥයන්ගෙන් අපට උගත හැකි සියල්ලක්ම උගෙන ගැනීමෙහි සහ පරිපාලන ක්‍රීඩාව කෙටි කිරීමෙහි යෙදීම අපගේ යුතුකම වන හෙයිනි. දැන් අපට ලබා ගැනීමට අපේක්ෂා කළ හැකි එකම විද්‍යාත්මක සැලැස්ම ''ගොඑල්රෝ'' සැලැස්මය. එය විස්තීර්ණ කොට, අංග සම්පූර්ණ කොට, නිවැරදි කොට, මැනැවින් පරීක්ෂාවට භාජනය කරන ලද ප්‍රායෝගික අත්දැකීම් සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක කළ යුතුය. ඊට ප්‍රතිවිරුද්ධ අදහස සරල කොටගත් විට එය හුදෙක්ම ''බොරු උන්නතිකාමී මාන්නය වේ. එය වූකලී, නොදැනුවත්කම මිස අන් කිසිවක් නොවන'' බව අපගේ වැඩ පිළිවෙළෙන් කියා ඇත.[55] ගොඑල්රෝවට අමතරව රු. ස. ඒ. සෝ. ස. සඳහා අපට පොදු සැලසුම් කරණ කොමිසමක් ඇති කරගත හැකිය යන අදහසෙන්ද පිළිබිඹු වන්නේ ඒ සමානම නොදැනුවත්කමක් සහ උඩඟු කමකි. නමුත් ''ගොඑල්රෝ'' කොමිසමෙහි සාමාජිකත්වය කාර්ය පරවශ ලෙස හා අර්ධ වශයෙන් වෙනස් කිරීමෙන් යම් යම් යහසාධනයන් ඇති කර ගැනීමට හැකි බව නම් ප්‍රතික්ෂේප නොකරමු. පොදු ආර්ථික සැලැස්මෙහි සැලකිය යුතු වැඩි දියුණුවක් කිරීමට අපට හැකි වන්නේ මෙම පදනම මත පමණකි පටන් ගත් දෙය කර ගෙන යාමෙනි. වෙනත් කුමණ හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් අප පරිපාලන ක්‍රීඩාවට, නැතහොත්, නොවළහා කියතොත්, බලපුළුවන්කාරකම් පෙන්වා ක්‍රියා කිරීමට පැටලෙනු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇත. ''ගොඑල්රෝ'' කොමිසමෙහි වැඩ කරන කොමියුනිට්වරුන්ගේ කර්තව්‍යය වන්නේ නියෝග නිකුත් කිරීම අඩු කිරීමය. නැතහොත්, නියෝග දීමෙහි නොයෙදීමය. විද්‍යාඥයන් සහ කාර්මික ශිල්පීන් සමග කටයුතු කිරීමේදී ඔවුන් ඉතාමත් උපක්‍රමශීලී විය යුතුය. (රු. කො. ප. වැඩ පිළිවෙළෙහි මෙසේ සඳහන්ව ඇත: ''අනිවාරණීය වශයෙන්ම ඔවුන් බහුතරය බලවත් ලෙස ධනපති සිරිත් කෙරෙහි එල්බ ගෙන සිටින අතර කාරණා ගැන ධනපති අදහස් දරති''.) ඉටු කළ යුතු කර්තව්‍යය නම්, ඔවුන්ගෙන් උගෙන ගැනීම සහ ඔවුන්ගේ විශේෂ ක්ෂේත්‍රයෙහිදී ලබන ජයග්‍රහණ මගින් ඔවුන්ගේ ලෝකාවබෝධය පුළුල් කර ගැනීමට ඔවුන්ට ආධාර දීමය. එසේ කළ යුත්තේ ඉන්ජිනෝරුවරයාගේ කොමියුනිස්ට්වාදය පිළිගැනීමේ මාර්ගය, රහසිගත ලෙස කටයුතු කරන ප්‍රචාරකයාගේ සහ ලේඛකයාගේ කොමියුනිස්ට්වාදය පිළිගැනීමේ මාර්ගයට වඩා වෙනස් බව නිතර සිතේ තබා ගනිමිනි. ඔහු ඉදිරියට යන්නේ ඔහුගේම විද්‍යාවෙන් සැපයෙන සාක්ෂිවල මග පෙන්වීම අනුවය. එනිසා කෘෂි විද්‍යාඥයා, වන විශේෂඥයා, ආදී එක් එක් අය කොමියුනිස්ට්වාදය දෙසට ගමන් කිරීමේදී පසු කරන තමන්ටම විශේෂ වූ මාර්ගයක් ඇත. විශේෂඥයන් ඒක්තැන් කර ගැනීමෙහි සහ නිහතමානී ජීවගුණයෙන් කරුණු ගැන ගැඹුරට සොයා බලමින් හා ඒවා විස්තර සහිතව අධ්‍යයනය කරමින් විශේෂඥයන්ගේ කටයුතු මෙහෙය වීමෙහි අපොහොසත් කොමියුනිස්ට්වාදියාට අනතුරක් වීමට ඉඩ තිබේ. එවැනි කොමියුනිස්ට්වාදීන් බොහෝ දෙනෙක් අප අතර ඇත. සුදුසුකම් ඇති එක අවංක ධනපති විශේෂඥයෙක් වෙනුවට ඔවුන් දුසිම් ගණනක් මාරු කිරීමට කැමැත්තෙමි.

ඒකාබද්ධ ආර්ථික සැලැස්ම තහවුරු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ''ගොඑල්රෝ'' කොමිසමෙන් පිටත සිටින කොමියුනිස්ට්වරුන්ගේ ආධාරය දිය හැකි මාර්ග දෙකක් ඔවුන්ට ඇත. ඔවුනතර වන ආර්ථික විද්‍යාඥයන්, සංඛ්‍යා විද්‍යාඥයන්, නැතහොත්, ලේඛකයන් අපගේම අත්දැකීම් අධ්‍යයනය කිරීමෙන් එය ඇරඹිය යුතුය. සත්‍ය කරුණු ගැන එවැනි විස්තරාත්මක අධ්‍යයනයක් කිරීමෙන් පසුව පමණක් සැලැස්මට නිවැරදි කිරීම් සහ වැඩි දියුණු කිරීම් යෝජනා කළ යුතුය. පර්යේෂණය විද්‍යාඥයා සතු කාර්යය වේ. අප දැන්, පොදු ප්‍රතිපත්ති නොව ප්‍රායෝගික අත්දැකීම් හා සම්බන්ධ කටයුතුවල යෙදී සිටින හෙයින්, මොහොතකින් ''ප්‍රවාද'' ලිවීමට, ''උද්යෝග පාඨ'' නිකුත් කිරීමට හා අර්ථ විරහිත වියුක්තතාවයන් නිර්මාණය කිරීමට යොමු වන උඩඟු කොමියුනිස්ට්වාදියාට වඩා, ''විද්‍යා සහ කාර්මික ශිල්පීය විශේෂඥයෙක්'' ඔහු ධනපති වුවත්, අපට ඔහුගෙන් ඉතා වැඩි යහපතක් ඉටු කර ගත හැකිය. අපට යථාතථ්‍ය කරුණු ගැන වැඩි දැනුමක් සහ නාම මාත්‍ර කොමියුනිස්ට් ප්‍රතිපත්ති ගැන විවාද අඩු කිරීමක් අවශ්‍ය වී තිබේ.

අනිත් අතට, තමා නියෝග නිකුත් කිරීමේ ලෝලයෙක් නොවන බවට කොමියුනිස්ට් පරිපාලකයා වග බලා ගත යුත්තේය. ඔහු කුමණ හෝ වැරදි හැදීමකට අත ගැසීමට පෙර, විද්‍යාවේ ජයග්‍රහණයන් දෙස බලා, කරුණු නිවැරදිද යනු නොවරදවාම පරීක්ෂා කර සහ වැරදි ඇති තැන් සොයා ගෙන ඒවා ගැන (වාර්තා, පුවත්පත් ලිපි, රැස්වීම් ආදිය මගින්) අධ්‍යයනය කිරීමෙන් ඒ සඳහා ආරම්භයක් කළ යුත්තේය. අපට තිත් තිතිවිලාගේ[56] වැනි (''මට එසේ හැගේ නම් මගේ අනුමැතිය දෙන්නෙමි'') උපක්‍රම නොව, වැඩි වැඩියෙන් අවශ්‍යව ඇත්තේ අපගේ වැරදි නිවැරදි කරන ප්‍රායෝගික අධ්‍යයනයන්ය.

මිනිසුන්ගේ දුෂ්චරිත ඔවුන්ගේ සුචරිත සමග බොහෝ දුරට එකට වෙළී තිබෙන බව ඉහත කාලයේ සිටම දන්නා ලද දෙයකි. මෙය ඇත්ත වශයෙන්ම කොමියුනිස්ට් නායකයින් බොහෝ දෙනෙකුට අදාළ වේ. අපි අවුරුදු දශක ගණනක් තිස්සේ, ධනපති පංතිය බලයෙන් පහ කිරීම ගැන දේශනා කරමින්, ධනපති විශේෂඥයන් කෙරෙහි විශ්වාසය නොතබන ලෙසටත්, ඔවුන් ගැන හෙළිදරව් කිරීමටත්, ඔවුන්ට බලය අහිමි කිරීමට හා ඔවුන්ගේ ප්‍රතිරෝධය මර්දනය කිරීමටත් මිනිසුන්ට උගන්වමින්, ශ්‍රෙෂ්ඨ සත් ව්‍යාපාරය සඳහා වැඩ කර ඇත්තෙමු . එය ලෝක ව්‍යාප්ත වශයෙන් වැදගත් ඓතිහාසික සත් ව්‍යාපාරයකි. නමුත්, අති උද්දරත්වයේ සිට තකතිරුකම දක්වා යාමට ඇත්තේ එක පියවරක දුර යැයි කියවෙන පැරණි කථාව සනාථ කිරීමට මෙහිදී අවශ්‍ය වන්නේ සුළු අතිශයෝක්තියක් පමණකි. දැන් අප රුසියාවට කරුණු ඒත්තු ගන්වා ඇති හෙයින්, දැන් අප රුසියාව සූරාකන්නන්ගෙන් උදුරා ගෙන එය වැඩ කරන ජනතාවට දී ඇති හෙයින්, දැන් අප සූරාකන්නන් මැඩලා සිටින හෙයින්, අපි රට පාලනය කිරීමට උගත යුත්තෙමු. මෙය කිරීම සඳහා නිහතමානයත්, කාර්යක්ෂම ''විද්‍යා සහ කාර්මික ශිල්පීය විශේෂඥයන්ගේ'' සත් ව්‍යාපාරයට ගරු කිරීමත්, අපගේ බොහෝ ප්‍රායෝගික වැරදි ගැන සුපරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීම සහ ඒවා ක්‍රමික ලෙස, එහෙත්, නොනවත්වාම නිවැරදි කිරීමත් අවශ්‍ය වේ. අපි මෙම බුද්ධිවාදී සහ නිලධාරිවාදී ශුභවාදය අඩු කළ යුත්තෙමු; මධ්‍යස්ථානයේදී සහ ප්‍රදේශවලදී අත්කර ගනු ලබන ප්‍රායෝගික අත්දැකීම් සහ ලබා ඇති විද්‍යා ජයග්‍රහණයන් ගැන වඩාත් ගැඹුරු ලෙස පරීක්ෂා කළ යුත්තෙමු.

1921 පෙබරවාරි 21.

''ප්‍රාව්දා'' අංක 39, 1921 පෙබරවාරි 22

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 42, පිටු 339-347

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

රු. කො. (බො.) පක්ෂයේ දසවැනි සම්මේලනය[57]

1921 මාර්තු 8-16

1

සම්මේලනය ආරම්භ කිරීමේ කථාව
මාර්තු 8

(දීර්ඝ වශයෙන් නැගෙන අත්පොළසන්.) සහෝදරවරුනි, රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ දහවැනි සම්මේලනය විවෘත කිරීමට මට අවසර දෙන්න. අපි සිදුවීම්වලින් පිරුණු වර්ෂයක් ගත කර ඇත්තෙමු. ජාත්‍යන්තර මෙන්ම, අපගේ අභ්‍යන්තර ඉතිහාසයේද සිදුවීම් රැසක් ඇති විය. ජාත්‍යන්තර තත්ත්වය ගැන පළමුව සඳහන් කරන අතර, කොමියුනිස්ට් ජාත්‍යන්තරය හුදෙක් සටන් පාඨයක්ව තිබීමේ තත්ත්වය කෙළවර වී, එය විශාල හා දියුණු ධනපති රටවල පදනම් සහිත — නියම පදනම් සහිත — දැවැන්ත සංවිධානයක් බවට පරිවර්තනය වූ තත්ත්වයන් යටතේ අප රැස් වූ ප්‍රථම අවස්ථාව මෙය බව සඳහන් කරනු කැමැත්තෙමි. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනයේදී හුදෙක් යෝජනා ගොන්නක්ව තිබුණු දෙය පසු ගිය වර්ෂයේදී සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදින්,එම සාර්ථකත්වය ජර්මනිය, ප්‍රංශය හා ඉතාලිය වැනි රටවලින් ප්‍රකාශිතව, සනාථව සහ තහවුරුව තිබේ. පසුගිය ගිම්හානයේදී මොස්කව්හි පැවැත්වුනු කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සම්මේලනයෙන් පසුව, එම ජාත්‍යන්තරය යුරෝපයේ ප්‍රධාන දියුණු රටවල කම්කරු පංති ව්‍යාපාරය සමග ඒකාබද්ධ වූ කොටසක් වී තිබෙන බව, ඊටත් වඩා ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන සාධකය වී තිබෙන බව පෙන්වීමට මෙම රටවල නම් සඳහන් කිරීම පමණක් සෑහේ. සහෝදරවරුනි, අප ඉදිරියේ තිබෙන මහා අරගල කොතරම් දුෂ්කර හා දරුණු වුවත් — අපි ඒවා ගැන අමතක නොකළ යුත්තෙමු — කිසිවෙකු විසින් අපට අහිමි නොහැකි වන ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය එබඳුය!

එපමණක් නොවේ, සහෝදරවරුනි. මුළු ලෝකයේ ධනපතියන්ගේ සහ අධිරාජ්‍යවාදීන්ගේ ආධාරය ලබන සතුරු යුද්ධ හමුද සෝවියට් සමූහාණ්ඩුවේ භූමියෙහි නොමැතිව සිටින අවස්ථාවක රැස්වෙන ප්‍රථම සම්මේලනයද මෙයයි. පසුගිය අවුරුද්දේදී රතු හමුදව ලැබූ ජයග්‍රහණයන් නිසා ප්‍රථම වතාවට එවැනි තත්ත්වයන් යටතේ පක්ෂ සම්මේලනය විවෘත කිරීමට

අපට හැකි වී තිබේ. අපි අවුරුදු තුන හමාරක් තිස්සේ අසමසම අරගලයක් කෙළෙමු. දැන් අන්තිම සතුරු හමුදවක් අපගේ දේශයෙන් පලවා හැර තිබේ. අපේ ජයග්‍රහණය යි! නමුත් එයින් සියල්ලක්ම ඉටුවී නැත. කෙසේත්ම නැත. අප දිනා ගත යුතු සියල්ල — අධිරාජ්‍යවාදී ආක්‍රමණයෙන් සහ ඇඟිලි ගැසීම්වලින් නියම නිදහස — අපට ලැබුණේ නැත. ඊට ප්‍රතිකූල වශයෙන්, අපට විරුද්ධව කරන යුද්ධය අඩුවෙන් යුද්ධමය වන, එහෙත්, සමහර අංශවලින් වඩාත් දරුණු හා අනතුරුදායක ස්වභාවයක් ගෙන ඇත. යුද්ධයේ සිට සාමයට පරිවර්තනය වීම ගැන අපි පසුගිය පක්ෂ සම්මේලනයේදී මහ ඉහළින් අගය කෙළෙමු. එය අනුව අපේ වැඩ කටයුතු සංවිධානය කර ගැනීමට උත්සාහ කෙළෙමු. නමුත් එම පරිවර්තනය තවමත් කෙසේත්ම සම්පූර්ණ වී නොමැත. අපගේ පක්ෂයට නොඇදහිය හැකි තරම් දුෂ්කර කර්තව්‍යයන්ට මුහුණ දීමට තවමත් සිදුව ඇත. අප අතින් බොහෝ වැරදි සිදුවූ ආර්ථික සැලැස්ම සම්බන්ධයෙන් පමණක් නොව, අපගේ සමාජයේ, මෙම සෝවියට් සමූහාණ්ඩුවේ ඉතිරි වී සිටින පංති අතර සම්බන්ධකම් පිළිබඳ පදනම සම්බන්ධයෙන්ද එම දුෂ්කරතා මතු වේ. පංති අතර මෙම සම්බන්ධකම් විෂයෙහි වෙනසක් සිදුවී ඇත. මෙහිදී ඔබ පරීක්ෂා කළ යුතු හා තීරණය කළ යුතු ප්‍රධාන ප්‍රශ්නවලින් එකක් එයයි. ඔබ සියලු දෙනාම එය පිළිගනු ඇතැයි මම සිතමි.

සහෝදරවරුනි, අපි අති විශේෂ අවුරුද්දක් ගත කර ඇත්තෙමු. මෙම අවුරුද්දේදී, පක්ෂය තුළ සාකච්ඡා සහ වාද විවාද පැවැත්වීමේ සුව පහසුව ලැබුයෙමු. පෙර නෑසූ විරූ තරම් වගකීම්වලට කර දී සිටින සහ මුළු ධනපති ලෝකයම එක්සත් කරගත් දැවැන්ත හා බලවත් සතුරන්ගෙන් වටවී සිටින පක්ෂයකට මෙය පුදුමාකාර සුව පහසුවක් විය!

මෙම කරුණ ගැන දැන් ඔබ කෙසේ අගය කරනු ඇද්දැයි මම නොදනිමි. අපගේ ද්‍රව්‍යමය අධ්‍යාත්මික යන දෙ ආකාරයේම සම්පත් අනුව බලන කල අනුව එම සුව පහසුව සම්පූර්ණයෙන්ම ඒවාට ගැලපෙන්නේද? එය ගැන කල්පනා කර බැලීම ඔබට භාර කරමි. නමුත්, කෙසේ හෝ වේවා, අප මෙම සම්මේලනයේදී අප සඳහා නියම කර ගත යුතු සහ කුමණ අමාරුවක් හෝ විඳ සාර්ථක කළ යුතු සටන් පාඨය, කර්තව්‍යය සහ අරමුණ නම්, අප අන් කවරදටත් වඩා ශක්තිමත් වී සාකච්ඡාවලින් සහ විවාදවලින් මතු විය යුතු බවයි. (අත්පොළසන්). සහෝදරවරුනි, සාකච්ඡාවලින් අදහස් වන්නේ වාද විවාද බවද, වාද විවාදවලින් අදහස් වන්නේ අසමගිය බවද, අසමගියෙන් අදහස් වන්නේ කොමියුනිස්ට්වරු දුර්වල බවද, එනිසා තදින් බලපා අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන ඔවුන්ගේ දුර්වලකම වාසියට හරවා ගත යුතු බවද (!) කියන අපගේ ධනපතියන් සුළු ධනපති සතුරන් මෙහි, සෝවියට් සමූහාණ්ඩුව තුළ පතුරුවන එම අභූත කට කථාවට, අපගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සතුරෝ සියලු දෙනාම — ඔවුන්ගේ සංඛ්‍යාව අති විශාලය — විදේශයෙහි වන ඔවුන්ගේ නිමක් නැති පුවත්පත් මගින් යළි යළිත් කියති; විස්තර කොට කියති; වැඩි දියුණු කොට කියති. ඒ ගැන ඔබ නොදන සිටිනවා විය නොහැක. එය සතුරු ලෝකයාගේ සටන් පාඨය වී තිබේ. අපි මොහොතකට හෝ මෙය අමතක නොකළ යුත්තෙමු. අතීතයේදී හරි හෝ වැරදි හෝ ලෙසින් අප කොතරම් දුරට මෙම සුවපහසුව කෙරෙහි ඇදී ගියත්, ඉදිරිපත් කළ හා සාකච්ඡා කළ අසාමාන්‍ය තරම් විශාල සංඛ්‍යාවක් වැඩ පිළිවෙළවල්, අදහස්මාත්‍ර, අල්පමාත්‍ර අදහස් හා ඉතාමත් අල්පමාත්‍ර අදහස් නිසිලෙස පරීක්ෂා කිරීමෙන් පසුව, අප එයින් මතුවී ආ යුත්තේ, අපගේ සම්මේලනයෙහිදී අපටම මෙසේ කියා ගත හැකි වන ලෙසිනි: මොනවා වුවත්, දැනට පෙර සාකච්ඡාව කුමණ ආකාරයක් ගෙන තිබුණත්, අප අප අතර කොතරම් තර්ක කර ගත්තත් — එමෙන්ම, අපි එතරම් සංඛ්‍යාවක් සතුරන්ට මුහුණ දී සිටිමු — ගොවි ජන රටක නිර්ධන පංති ආඥදායකත්වය ඉතාමත් විශාල හා සංකීර්ණ නිසා විධිමාත්‍ර සංසක්තිය කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. (ඔබ මෙම සම්මේලනයට පැමිණ සිටීමෙන් පෙනෙන්නේ ඔබට එතරම් හැඟීමක් තිබෙන බවයි.) පෙර කිසි දිනක නොදක්නා ලද තරම් අපගේ පරිශ්‍රමයන් එක්සත් හා සංගත විය යුතුය. අතීතයේදී කාණ්ඩවාදය කෙසේ ප්‍රකට වුවත්, දැන් කාණ්ඩවාදයේ ඡායාමාත්‍රයක් හෝ නොතිබිය යුතුය. කුමණ හේතුවක් නිසා හෝ එය ඇති වීමට ඉඩ නොදිය යුතුය. අප හමුවේ තිබෙන දැවැන්ත කර්තව්‍යයන් ඉටු කිරීමට අපට හැකි වන්නේ මෙම කොන්දේසිය ඉටු වුවහොත් පමණකි. මා මෙසේ කියන විට, මා ඔබ සියලු දෙනාගේම අපේක්ෂාව සහ දැඩි අධිෂ්ඨානය ප්‍රකාශ කරන බව අදහස් කරමි: මොනවා වුනත්, සම්මේලනය අවසාන වන විට අපගේ පක්ෂය අන් කවර දකටත් වඩා ශක්තිමත්ව, වඩාත් සංගතව සහ වඩාත් අවංක ලෙස සමගිව තිබිය යුතුය. (අත්පොළසන්.)

"ප්‍රාව්ද" අංක 52, 1921 මාර්තු 9 ද

අතිරික්ත ධාන්‍ය අත්පත් කර ගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්ද ආදේශ කිරීම ගැන වාර්තාව මාර්තු 15

සහෝදරවරුනි, අතිරික්ත ධාන්‍ය අත්පත් කර ගැනීම වෙනුවට අය බද්දක් ආදේශ කිරීම යනු අවශ්‍යයෙන්ම හා ප්‍රධාන වශයෙන්ම ගොවි ජනයා කෙරෙහි කම්කරු පංතිය විසින් දක්වනු ලබන ආකල්පය පිළිබඳ

ප්‍රශ්නයක් වන හෙයින් එය දේශපාලන ප්‍රශ්නයකි. මෙම ප්‍රධාන පංති දෙක අතර අරගලය, නැතහොත්, එකඟත්වය අනුව, සමස්තයක් වශයෙන් අපගේ විප්ලවයේ ඉරණම තීරණය වනු ඇත. අප මෙම ප්‍රශ්නය මතු කරන්නේ, එම පංති දෙක අතර සම්බන්ධකම් අළුත්, නැතහොත්, මා සමහර විට සිතන ලෙසට, වඩාත් සූපරීක්ෂාකාරී සහ නිවැරදි අතිරේක විමර්ශනයකට හා එක්තරා සංශෝධනයට භාජනය කිරීම අවශ්‍ය වී තිබෙන හෙයිනි. ඊට හේතු වන කරුණු ගැන දීර්ඝ විස්තරයක් කිරීමට අවශ්‍ය නැත. අතිශයින්ම අවදානම් සහ භයානක වූත්, නිර්ධන පංතිය පැත්තේ සිට ධනපති පංතිය පැත්තට නොවැලැක්විය හැකි ලෙස නැඹුරු වීම වැඩි කරන්නා වූත් තත්ත්වයක් ගොවි ජනතාව අතර පහළ වීමට හේතු සාධක වූ කරුණු සමස්තය ගැන, විශේෂයෙන්ම, යුද්ධය, විනාශය, යුද්ධ හමුද විසුරුවා හැරීම හා දරුණු අස්වනු පාළුව යන කරුණු සමස්තය නිසා ඇති වූ අන්ත අභේනිය ගැන ඔබ සියලු දෙනාම හොඳින් දන්නෙහිය.

මෙම ප්‍රශ්නයේ න්‍යායික වැදගත්කම, නැතහොත්, එයට න්‍යායික වශයෙන් සමීප විය යුතු ආකාරය ගැන වචනයක් දෙකක් සඳහන් කරන්නෙමි. ජනගහනයේ අති බහුතරය සුළු කෘෂිකාර්මික නිෂ්පාදකයන්ගෙන් සැදුනු රටක සමාජවාදී විප්ලවය ඉටු කළ හැක්කේ විශේෂ පරිවර්තනීය පියවරයන් මාලාවක්ම ගැනීමෙන් බවට සැකයක් නොමැත. කර්මාන්තයෙහි සහ කෘෂිකර්මාන්තයෙහි නියුක්ත වේතන කම්කරුවන්ගෙන් ජනගහණයේ අති බහුතරය සමන්විත වන ඉතාමත් දියුණු රටවල මෙම පියවරයන් ගැනීම අනවශ්‍යය. ඉතාමත් දියුණු ධනපති ක්‍රමය සහිත රටවල අවුරුදු දශක ගණනාවක් තිස්සේ හැඩ ගැන්වුනු කෘෂිකාර්මික වේතන කම්කරුවන් පංතියක් ඇත. කෙළින්ම සමාජවාදයට පරිවර්තනය වීම සඳහා සමාජමය, ආර්ථිකමය හා දේශපාලනමය වශයෙන් සහයෝගය දැක්වීමේ හැකියාව ඇත්තේ එවැනි පංතියකට පමණකි. විශේෂ දේශ ව්‍යාප්ත පරිවර්තනීය පියවරයන් නොගෙන ධනපති ක්‍රමයේ සිට කෙළින්ම සමාජවාදයට සංක්‍රමණය විය හැක්කේ මෙම පංතිය ප්‍රමාණවත් තරම් දුරට සංවර්ධනය වී ඇති රටවලට පමණකි. රුසියාවේ පවතින්නේ මෙම තත්ත්වය නොවන බව අපගේ කෘතීන් රැසකමත්, අපගේ කථා සියල්ලෙහිමත්, අප පුවත්පත්වලට කළ ප්‍රකාශයන් සියල්ලෙහිමත්, අවධාරණය කර දක්වා ඇත. මෙහි කර්මික කම්කරුවන් අල්පතරයක් වන අතර සුළු ගොවීහු ඉතා විශාල බහුතරය වෙති. එවැනි රටක සමාජවාදය ජයග්‍රහණයට පත්විය හැක්කේ කොන්දේසි දෙකකට යටත්වය. ප්‍රථමයෙන්ම, දියුණු රටවල් එකක හෝ වැඩි ගණනක සමාජවාදී විප්ලවය ඇති වීමෙන් කලට වේලාවට එයට ආධාර ලැබුණහොත්ය. අතීතය හා සමඟ සසඳා බලන කල මෙම කොන්-

https://liberationbase.wordpress.com

දේසිය ඉටු වනු දැකීම සඳහා අප බොහෝ වෙහෙස ගත් නමුත්, එය යථාර්ථයක් වීමට අප කළ දේ ප්‍රමාණවත් නොවූ බව ඔබ දන්නෙහිය.

දෙවැනි කොන්දේසිය, නිර්ධන පංති ආඥාදායකත්වය ක්‍රියාත්මක කරන, එනම්, රාජ්‍ය බලය අත්පත් කරගෙන සිටින නිර්ධන පංතියත්, ගොවි ජනතා බහුතරයත් අතර එකඟත්වයයි. එකඟත්වය යනු පියවරයන් සහ පරිවර්තනයන් මාලාවක්ම ඇතුළත් කොට ගත් ඉතා පුළුල් සංකල්පයකි. අප ගෙන යන ප්‍රචාරය හා උද්ඝෝෂණය විවෘත හා අවංක විය යුතු බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. දේශපාලනය යනු රැවටිල්ලක් බඳු වූ පහත් කපටිකම් මාලාවක් යයි අදහස් කරන අය තරයේ හෙළා දැකීම අපි කළ යුත්තෙමු. ඔවුන්ගේ වැරදි නිවැරදි කළ යුතුය. පංතියන් රැවටීමට නොපුළුවන. පොදු ජනතාවගේ දේශපාලන විඥනය උසස් කිරීමට පසු ගිය තුන් වසර තිස්සේ අප කළ දෑ බොහෝය. ඔවුන් වැඩියෙන්ම උගෙන ගෙන තිබෙන්නේ තියුණු අරගලවලිනි. අපගේ ලෝකාවබෝධයටත්, අවුරුදු දශක ගණන් තිස්සේ අප රැස්කරගත් අත්දැකීම්වලටත්, අපගේ විප්ලවයෙන් ලද පාඩම්වලටත් අනුකූලව අපි මෙම ප්‍රශ්න ගැන ඉතා පැහැදිලි ප්‍රකාශයක් කළ යුත්තෙමු: මෙම පංති දෙකේ උවමනාවන් වෙනස්ය. සුළු ගොවියාට අවශ්‍ය වන්නේ කම්කරුවාට අවශ්‍ය දෙය නොවේ.

වෙනත් රටවල විප්ලවය සිදුවී නොමැති කල, රුසියාවේ සමාජවාදය ආරක්ෂා කළ හැක්කේ ගොවි ජනතාව සමග ඇති කර ගන්නා එකඟත්වයෙන් පමණකි. එය ප්‍රකාශ කළ යුත්තේ ඒ ආකාරයෙනි. අවංක ලෙසම සියලු රැස්වීම්වලදීත්, සියලු පත්‍ර මගිනුත් එය ප්‍රකාශ කළ යුත්තේ එසේය. කම්කරු පංතිය සහ ගොවි ජනතාව අතර මෙම එකඟත්වය ශක්තිමත් වී නොමැති බව අපි දනිමු. "ලිහිලෙන්" යන වචනය වාර්තාවට ඇතුළත් නොකළත්, මෙසේ කීම තත්ත්වය ලිහිලෙන් ප්‍රකාශ කිරීමකි. පැහැදිලි ලෙසම කියතොත් තත්ත්වය ඊට වඩා බොහෝ අයහපත්ය. අප කිසි ලෙසකින් හෝ කිසිවක් හෝ සැඟවීමට උත්සාහ නොකරන්නෙමු. අප සමග පවතින සම්බන්ධකම් ආකෘතිය ගැන ගොවි ජනයා අප්‍රසාදව සිටින බවත්, මේ ආකාරයේ සම්බන්ධකම් ඇති කර ගැනීම ඔවුන්ගේ අපේක්ෂාව නොවන බවත්,මෙතෙක් ජීවත් වූ ආකාරයට ඔවුන් දිගටම ජීවත් නොවන බවත් අපි පැහැදිලි ලෙසම කිව යුත්තෙමු. මෙය ප්‍රශ්න නොකරම පිළිගැනීමට සිදු වේ. මේ සම්බන්ධයෙන් ගොවි ජනයාගේ අදහස ප්‍රමාණවත් තරම් නිශ්චිත ලෙස ප්‍රකාශ වී තිබේ. එය වැඩ කරන ජනතාවගෙන් අති බහුතර සමූහයකගේ අදහසය. අපි මෙය සැලකිල්ලට ගත යුතු වෙමු. අපි මෙසේ කීමට තරම් හොඳ කල්පනාව ඇති දේශපාලනඥයන් වෙමු: ගොවි ජනතාව සම්බන්ධයෙන් වූ අපගේ ප්‍රතිපත්තිය යළිත් විමර්ශනය කර බලමු. මෙතෙක් බලපැවැත්වූ තත්ත්වය තවදුරටත් ගෙන යා නොහැක.

ගොවි ජනයාට අපි මෙසේ කිව යුත්තෙමු: "ඔබට ආපසු යන්නට උවමනා නම්, පෞද්ගලික දේපළ හා සීමාවෙන් තොර වෙළඳාම යළි ස්ථාපිත කිරීමට ඔබට උවමනා නම්, එය ඒකාන්ත වශයෙන්ම හා අනිවාරණීය වශයෙන්ම, යළිත් වරක් ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ පාලනයට යටත් වීමක් වනු ඇත. ඉතිහාසයේ අත්දැකීම් ගණනාවකින්ද, විප්ලවවල අත්දැකීම්වලින්ද මෙය ඔප්පු වී තිබේ. මෙය අනිවාරණීය දෙයක් බව කොමියුනිස්ට්වාදයේ හා දේශපාලන අර්ථශාස්ත්‍රයේ අ යන්න ආ යන්න ගැන කරන මඳ පරීක්ෂණයකින් වුවද ඔප්පු වනු නිසැකය. එනිසා අපි මේ ගැන පරීක්ෂා කර බලමු. ධනපතියන්ගේ සහ ඉඩම් හිමියන්ගේ පාලනය දක්වා ආපසු තල්ලු වීම පමණක් පතා, රට එම පාලනය වෙත ආපසු තල්ලු වීම පමණක් පතා, නිර්ධන පංතිය අත් හැර වෙනත් මහක යාමෙන් ගොවි ජනතාවට යහපතක් වේද? අයහපතක් වේද? මෙය සලකා බලන්න. මේ ගැන අපි එක්ව සලකා බලමු."

පිළිගෙන තිබෙන පරිදිම, නිර්ධන පංතියේ සහ කුඩා ගොවියාගේ ආර්ථික උවමනාවන් අතර ගැඹුරු පරතරයක් තිබුණත්, මෙම කාරණය හරි ආකාර ලෙස සලකා බැලුවහොත්, ඉන් බැස ගන්නා නිගමනය අපට වාසිදායක වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

සම්පත් සම්බන්ධයෙන් අප අසීරු තත්ත්වයක සිටින නමුත්, මධ්‍යම ගොවියාගේ අවශ්‍යතාවයන් ඉටු කළ යුතුව තිබේ. දැන් සිටින මධ්‍යම ගොවි සංඛ්‍යාව පෙරට වඩා බොහෝ අධිකය. ඔවුනතර අතිවිරෝධයන් තුනීවී ගොස් තිබේ. ඉඩම් උපයෝගිතාවය සඳහා ඒවා බෙහෙවින්ම සමානාත්මතා ආකාරයකට බෙද දී ඇති අතර කුලාකයාගේ තත්ත්වයද දුර්වල කර තිබේ. ඔහුගේ දේපළ බොහෝ දුරට ඔහුට අහිමි කර ඇත. උක්‍රේනියාවට වඩා එය රුසියාවේද, අඩු ප්‍රමාණයකින් සයිබීරියාවේද ක්‍රියාත්මක කර ඇත. කෙසේ හෝ වේවා සමස්තයක් වශයෙන් ගත්කල, ඉතාමත් නිශ්චිත ලෙසට ගමෙහි එක මට්ටමක් ඇති කිරීමක්, සමානත්වය ඇති කිරීමක් සිදුවූ බවද, එහි කුලාකයන් හා අස්වනු අහිමි ගොවියන් ලෙසට පැරණි තිබූ බෙදීම අතුරුදහන් වී ගොස් තිබෙන බවද සංඛ්‍යා ලේඛනවලින් හෙළිදරව් වේ. සියල්ලම වඩාත් සමානාත්මතා පදනමකට පත්ව ඇති අතර, ගොවි ජනයා පොදු වශයෙන් මධ්‍යම ගොවියාගේ තත්ත්වයට පත්ව සිටී.

මධ්‍යම ගොවි ජනතාවට ආවේණික වූ ඔවුන්ගේ ආර්ථික විශේෂතාවයන් හා ආර්ථික මූලාශ්‍රමයන් එසේ තිබියදීම, ඔවුන් සතුටට පත් කිරීම අපට හැකි වේද? සුළු ගොවිතැනෙහි ආර්ථික පදනම හා ආර්ථික මූලාශ්‍රයන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තුන් අවුරුද්දකින් නැවත හැඩ ගැස්විය හැකි යයි සිතූ අයෙක් කොමියුනිස්ට්වරුන් අතර වී නම් ඔහු සිහින මවන්නෙක් විය. එවැනි සිහින මවන්නන් බොහෝ දෙනෙක් අප අතර වූ බව සැඟවීමට අවශ්‍ය නැත. එහි ඇති විශේෂ දුර්ගුණයක්ද නොමැත. අපගේ වැනි රටක සිහින මවන්නන් නොමැතිව සමාජවාදී විප්ලවයක් පටන් ගත හැකිද? සමූහ ගොවිතැන පිළිබඳ ක්ෂේත්‍රයේදී විවිධාකාර අත්දැකීම් සහ ව්‍යාපාර විසින් අති විශාල කාර්ය කොටසක් ඉටු කරනු ලබන බව ව්‍යවහාරයෙන් පෙනී ගොස් තිබේ. එසේ වුවද, සාමූහික ව්‍යවසායයන්හි යෙදීමේ පළ පුරුද්දක් නොමැති හෙයින් ආර්ථික වශයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූ අය, ඉතාමත් හොඳ අපේක්ෂාවන් හා බලාපොරොත්තු ඇතිව, කොමියුන් පිහිටුවීම සඳහා ගම්බද පෙදෙස්වලට ගිය අවස්ථාවන්හි ලත් අත්දැකීම්වලින් සමහර විට අයහපත් ප්‍රතිඵල ඇති වූ අවස්ථාද විය. එවැනි සමූහ ගොවිපළවල අත්දැකීම්වලින් පෙන්නුම් කෙරුණේ ගොවිපළවල් නොපැවැත්විය යුත්තේ කෙසේද යන්න පිළිබඳ නිදර්ශන පමණකි. ඒවා අවට සිටි ගොවිහු, ඒවා දැක එක්කෝ සිනාසුනහ. නැතහොත්, ඒවාට සරදම් කළහ.

මෙවැනි අවස්ථා කෙතෙක් තිබුණේද යන්න ඔබ හොඳාකාරවම දන්නෙහිය. මෙය පුදුමයට කරුණක් නොවන බව නැවතත් කියමි. මන්දයත්, සුළු ගොවියා යළි හැඩ ගැස්වීමටත්, ඔහුගේ මනෝභාවය හා ගති සිරිත් ප්‍රතිසංස්කරණය කිරීමටත් පරම්පරා ගණනක් ගත වනු ඇති හෙයිනි. සුළු ගොවියා හා සම්බන්ධ මෙම ප්‍රශ්නය විසඳීමට, ඔහුගේ මනෝභාවය වැඩි දියුණු කිරීම යනුවෙන් අදහස් කෙරෙන දෙය කිරීමට තිබෙන එකම මාර්ගය ද්‍රව්‍යමය පදනම ඔස්සේ, කාර්මික උපකරණ, ට්‍රැක්ටර් හා වෙනත් ගොවිපළ් යන්ත්‍ර පුළුල් ලෙස උපයෝගි කර ගැනීම සහ මහා පරිමාණ විද්‍යුතනකරණය ඔස්සේ වැටී ඇති එකකි. මේ අනුව සුළු ගොවියා යළි හැඩ ගැසෙනවා පමණක් නොව, එය සීඝ්‍රාකාර ලෙසද සිදු වන්නේය. මේ සඳහා පරම්පරා ගණනක් ගතවන බව කීමෙන් මා අදහස් කළේ ශත වර්ෂ ගණනක් ගතවන බව නොවේ. නමුත් මෙම දුවැන්ත රටට අවශ්‍ය ට්‍රැක්ටර් සහ වෙනත් යන්ත්‍ර ලබා ගැනීමද, එය විද්‍යුතනය කිරීමද අවුරුදු දශක ගණනාවක් යන කටයුත්තක් බව ඔබ මැනවින් දන්නෙහිය. පවත්නා වාස්තවික තත්ත්වය එයයි.

අප්‍රසාදව හා අමනාපව සිටින, එසේ නොවී සිටිය නොහැකි, සාධාරණ හේතු නිසාම එම තත්ත්වයට පත්ව සිටින ගොවි ජනයාගේ ඉල්ලීම් ඉටු කිරීමට අපි උත්සාහ ගත යුත්තෙමු. අපි ඔවුනට මෙසේ කිව යුත්තෙමු: ''ඔව්, තවදුරටත් මෙම තත්ත්වය පැවතීමට ඉඩ දිය නොහැකිය.'' ගොවියා සතුටට පත් කළ හැක්කේ කෙසේද? ඔවුන් සතුටට පත්කිරීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? මෙයට පිළිතුරක් කොහිද? ස්වාභාවික

වශයෙන්ම එම පිළිතුර ඇත්තේ ගොවි ජනතාවගේ ඉල්ලීම් අතරය. අපි එම ඉල්ලීම් දන්නෙමු. එහෙත්, එම ඉල්ලීම්ද, ගොවි ජනයාගේ ආර්ථික ඉල්ලීම් ගැන අප දන්නා සියල්ලක්ද, ආර්ථික විද්‍යාවේ ස්ථාවරය අනුව සංසන්දනය කර හා පරීක්ෂා කර බැලිය යුතුය. අප මේ ගැන පරීක්ෂා කර බලන්නේ නම්, සුළු ගොවියා සතුටු කිරීමට අවශ්‍යයෙන්ම කරුණු දෙකක් ඉටු විය යුතු බව අපට පෙනෙනු ඇත. ප්‍රථමයෙන්ම, හුවමාරුව සඳහා එක්තරා ප්‍රමාණයක නිදහස, එනම්, කුඩා, පෞද්ගලික දේපළ හිමියා සඳහා නිදහසක්ද, දෙවැනිව, වෙළෙඳ භාණ්ඩ සහ නිෂ්පාදිතයන් ලබා ගැනීමේ පහසුකම්ද ඔහුට අවශ්‍ය වී තිබේ. හුවමාරු කිරීමට යමක් නොමැත්තේ නම්, විකිණීමට යමක් නොමැත්තේ නම්, නිදහස් හුවමාරුව සහ වෙළඳාම් කිරීමේ නිදහස යන්නෙහි අර්ථයක් තිබේද? එවිට එය කඩදාසියට සීමාවූ නිදහසක් වන්නේය. කඩදාසි කැබලිවලින් පංතියක් සැනසීමට නොපුළුවන. ඔවුනට භාණ්ඩ උවමනා වී තිබේ. මෙම කොන්දේසි දෙක පැහැදිලි ලෙස වටහා ගත යුතුය. දෙවැන්න — වෙළෙඳ භාණ්ඩ ලබා ගන්නේ කොහෙන්ද? ඒවා අපට ලබා ගත හැකි වේද? ඒ ගැන පසුව සාකච්ඡා කරමු. දැන් අප සලකා බැලිය යුත්තේ ප්‍රථම කොන්දේසිය ගැනය, එනම් නිදහස් හුවමාරුව ගැනය.

LIBERATIONBASE

නිදහස් හුවමාරුව යනු කුමක්ද? එය සීමා කිරීමෙන් තොර වෙළෙඳාමයි. එසේ නම්, එය ආපසු හැරී ධනපති ක්‍රමයට යාමකි. නිදහස් හුවමාරුව සහ වෙළඳාම් කිරීමේ නිදහස යනුවෙන් අදහස් කෙරෙන්නේ කුඩා දේපළ හිමියන් අතර සිදු වන වෙළෙඳ භාණ්ඩ සංස්කරණයයි. මෙම හුවමාරුව සහ වෙළඳාම් කිරීමේ නිදහස යනු වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයන් බෙදී යාමට ප්‍රාග්ධන හිමියන් හා ශ්‍රම ශක්තිය හිමියන් වශයෙන්, නැතහොත්, ධනපතියන් සහ වේතන කම්කරුවන් වශයෙන් බෙදී යාමට, එනම්, ධනේශ්වර වේතන වහල් ක්‍රමය යළිත් අනිවාර්යය වශයෙන්ම ප්‍රතිෂ්ඨාපනය වීමට මග හෙළි කරන්නක් බව මාක්ස්වාදයේ ප්‍රාථමික උගැන්වීම් ගැන පමණක් වුවද දන්නා අප සියලු දෙනාටම පැහැදිලි දෙයකි. වේතන වහල් ක්‍රමය අහසෙන් වැටෙන දෙයක් නොවේ. ලෝකය මුළුල්ලේම, එය පැන නගින්නේ හරියටම කෘෂිකාර්මික වෙළෙඳ භාණ්ඩ ආර්ථිකයෙනි. න්‍යායික වශයෙන් අපි මෙය හොඳින් දනිමු. සුළු ගොවියාගේ ජීවිතයත්, ඔහු ගොවිතැන් කරන්නේ කුමණ තත්ත්වයන් යටතේද යන්නත් නිරීක්ෂණය කළ රුසියාවේ ඕනෑම කෙනෙක් මෙය සිදු වනු දැක ඇත.

එසේ නම්, වෙළඳාම් කිරීමේ නිදහස පිළිගෙන එයට ඉඩ දීම කොමියුනිස්ට් පක්ෂයට කළ හැක්කක්ද? එම අදහසෙහි ගැලපිය නොහැකි ප්‍රතිවිරෝධයක් දීතිබෙනවා නොවේද? මෙම ප්‍රශ්නය ප්‍රායෝගික වශයෙන් විසඳීමේ, ස්වභාවිකවම අති මහත් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවේ.

https://liberationbase.wordpress.com

ප්‍රශ්නයට පිළිතුර එයයි. අතිරික්ත ධාන්‍ය අත්පත් කර ගැනීම වෙනුවට බද්දක් ආදේශ කිරීම ගැන ඔබ අතට පත් කර තිබෙන ප්‍රාථමික කෙටුම්පත, සාධාරණ සහ අනිවාරණීය ලෙස, වැඩි වශයෙන්ම ප්‍රාදේශීය ආර්ථික පිරිවැටුම පිළිබඳ රාමුව යටතේ භාණ්ඩ හුවමාරුවට ඉඩ දීම සම්බන්ධයෙන් පැන නගින ප්‍රශ්නවලට තුඩු දෙන බව මට කල් තබා සිතා ගත හැකිය. සමහර සහෝදරවරු මා සමග කළ සාකච්ඡා අනුව ඒ බව දන්නෙමි. මෙය 8 වැනි කරුණ අවසාන වන තැන ඇතුළත් කර තිබේ. එහි අදහස කුමක්ද? හුවමාරුවට තිබෙන සීමාවන් මොනවාද? මේ සියල්ලම ක්‍රියාත්මක කරන්නේ කෙසේද? මෙම සම්මේලනයේදී මෙයට පිළිතුරු බලාපොරොත්තු වන කෙනෙක් වෙතොත් ඔහුගේ බලාපොරොත්තු ඉටු නොවනු ඇත. එයට අපගේ නීතිවලින් පිළිතුරු ලැබෙනු ඇත. අපගේ කර්තව්‍යය වන්නේ, අනුගමනය කළ යුතු ප්‍රතිපත්තියත්, සටන් පාඨයත්, ඉදිරිපත් කිරීමය. අපගේ පක්ෂය ආණ්ඩු කරන පක්ෂයයි. එනිසා පක්ෂ සම්මේලනයේ තීරණයට මුළු මහත් සමූහාණ්ඩුවම බැඳී සිටී. දැන් අපට භාරව තිබෙන්නේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරණය කිරීමය. වැපිරීමට කාලය ඉතා ආසන්න නිසා අප මේ පිළිබඳව ගන්නා තීරණය ගොවි ජනතාවට දන්විය යුතුය. එමෙන්ම එම තීරණය ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද යන්න සොයා බැලීමට අපගේ මුළු පරිපාලන යන්ත්‍රයත්, අපගේ න්‍යායික බලවේග සියල්ලත්, අපගේ මුළු ප්‍රායෝගික අත්දැකීමත් උපයෝගී කර ගත යුතුය. න්‍යායික වශයෙන් කියන කළ එය කුමණ ආකාරයකින් හෝ කළ හැකි දෙයක්ද? නිර්ධන පංතියේ දේශපාලන බලය දුර්වල කරන්නේ නැතිව වෙළඳාම සඳහා නිදහස, සුළු ගොවියාට ධනපති ව්‍යවසායික නිදහස තරමක් දුරට ආපසු දිය හැකිද? මෙය කළ හැකි දෙයක්ද? ඔව්, එය කළ හැකි දෙයකි. සියල්ලම ප්‍රමාණය මත රඳා පවතින නිසා, එය කළ හැක. ස්වල්ප ප්‍රමාණයක් හෝ භාණ්ඩ ලබා ගෙන එය රජය අතට, එය දේශපාලන බලය ක්‍රියාත්මක කරන නිර්ධන පංතිය අතට පත් කර ගැනීමට අපට හැකි නම්, එමෙන්ම එම භාණ්ඩ සංසරණය සඳහා මුදා හැරීමට හැකි නම්, එවිට, රජය වශයෙන් අපට ඇති දේශපාලන ශක්තියට ආර්ථික ශක්තියද එකතු වන්නේය. දරුණු යුද්ධ තත්ත්වයන් සහ ආර්ථික වියවුල් නිසා, දියුණු විය නොහැකිව විනාශ මුඛයට ලක්ව තිබෙන සුළු ගොවිතැනට, මෙම භාණ්ඩ සංසරණය සඳහා මුදා හැරීම දිරි ගැන්වීමක් වනු ඇත. සුළු ගොවියා සුළුව සිටින තාක් කල්, ඔහුගේ ආර්ථික පදනම, එනම්, තනි පුද්ගල කුඩා ගොවිපළට සුදුසු වන ආකාරයේ දිරිගැන්වීමක් ඔහුට අවශ්‍ය වන්නේය. මෙහිදී ප්‍රාදේශීය නිදහස් හුවමාරුව වැලැක්වීම ඔබට කළ හැක්කක් නොවේ. මෙහිදී, මෙම පිරිවැටුම නිසා, කාර්මික භාණ්ඩ වෙනුවට, නගරවල හා කර්මාන්තවල අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමට තරම් වන අවම

ධාන්‍ය ප්‍රමාණයක් රජයට ලැබේ නම්, එයින් ආර්ථික සංසරණය යළිත් ජීවය ලබන අතරම, රාජ්‍ය බලය නිර්ධන පංතිය අතෙහිම පවතිමින් එය ශක්තියෙන්ද වැඩි වේ, මෝල් හා පැක්ටරි, නැතහොත්, කර්මාන්ත පාලනය කරන කම්කරුවා, ගොවි ජනයා සමග හුවමාරුව සංවිධානය කිරීමෙහි සමත් වන ව්‍යවහාරයෙන් දැකීමට ගොවියෝ අපේක්ෂා කරති. අනිත් අතට, අපගේ කෘෂිකාර්මික රටෙහි විශාලත්වය නිසාත්, ප්‍රවාහන ක්‍රමයේ දුර්වලකම් නිසාත්, අති විශාල භූමි භාගයන්, විවිධ දේශ ගුණික තත්ත්වයන්, නානාවිධ ගොවිතැන් ක්‍රම ආදිය පවතින නිසාත්, ප්‍රාදේශීය කෘෂිකර්මාන්තය සහ ප්‍රාදේශීය කර්මාන්ත අතර ප්‍රාදේශීය පරිමාණයෙන් එක්තරා හුවමාරු නිදහසක් අනිවාරණීය වශයෙන්ම පැවතිය යුතු වේ. මේ හා සම්බන්ධයෙන් වූ කල අප පමණට වඩා ඉදිරියට යාමෙන් වරදක් කර ඇත. කර්මාන්ත හා වෙළඳාම ජනසතු කිරීමේදී පමණ ඉක්මවා ගිය අපි ප්‍රාදේශීය වෙළෙඳ භාණ්ඩ හුවමාරුව නවත්වා දැමුවෙමු. එය වරදක් වීද? ඇත්තෙන්ම එය වරදක් විය.

මේ අතින් ප්‍රත්‍යක්ෂ වශයෙන්ම බොහෝ වැරදි කර ඇත්තෙමු. එය වටහා නොගැනීමත්, අපට සීමාවන් නොඉක්මවා සිටීමට නොහැකි වූ බව හා කොතැනින් නැවැත්විය යුතුද යන්න අප නොදැන සිටි බව අවබෝධ කර නොගැනීමත් බරපතල අපරාධයක් වන්නේය. නමුත් අවශ්‍යතාවයේ සාධකද බල පැවැත්වූ බව මෙහිදී කිව යුතුය. මේ දක්වා අප ජීවත් වූයේ කෲර යුද්ධයක තත්ත්වය යටතේය. එනිසා අපගේ කරපිට අනුපමේය අමාරුකම් වැටුණු හෙයින් ආර්ථික ක්ෂේත්‍රයෙහිදීද අපට යුද්ධ කාලීන පියවරයන් ගැනීම හැර, වෙනත් කළ හැකි දෙයක් නොවීය. විනාශයට පත් රටට මෙම යුද්ධයට මුහුණ දීමට ශක්තිය තිබීම ප්‍රාතිහාර්යයකි. නමුත් එය දෙවි ලොවින් බට ප්‍රාතිහාර්යයක් නොවේ. එය කම්කරු පංතියේ සහ ගොවි ජනතාවගේ ආර්ථික අවශ්‍යතාවයෙන් ජනිත වූ ප්‍රතිහාර්යයකි. ඉඩම් හිමියන් හා ධනපතියන් පරාජය කිරීමේ ඒ ප්‍රාතිහාර්යය නිර්මාණය වූයේ කම්කරු පංතියේ සහ ගොවි ජනතාවගේ උද්යෝගයෙනි. එසේ වුවද, ඒ අතරම, න්‍යායික වශයෙන් හා දේශපාලන වශයෙන් අප අවශ්‍ය දුර ඉක්මවා ඉන් ඔබ්බට ගිය බව තර්ක විරහිතව පිළිගත යුතු කරුණක් වී තිබේ. අපගේ උද්ඝෝෂණ සහ ප්‍රචාරක කටයුතුවලදී අපි එය නොසැඟවිය යුතු වෙමු. නිර්ධන පංතියේ දේශපාලන බලය විනාශ නොකර, එය ඇත්ත වශයෙන්ම ශක්තිමත් කරමින්, සැලකිය යුතු තරම් දුරකට ප්‍රාදේශීය නිදහස් හුවමාරුවට ඉඩ දීමට පුළුවන. මෙය කළ යුත්තේ කෙසේද යන්න ව්‍යවහාරයෙන් බලා ගත හැක. මා අදහස් කරන්නේ මෙය නිවැරදි න්‍යායික සංකල්පනයක් වශයෙන් පිළිගත හැකි බව ඔප්පු කිරීමට පමණකි. රාජ්‍ය බලය හසුරුවන නිර්ධන පංතිය අතේ, කිසියම් හෝ සංචිතයන් ප්‍රමාණයක් ඇතොත්, ඒවා සංසරණයට යොමු කිරීමෙන්, ප්‍රාදේශීය ආර්ථික හුවමාරුව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පදනම් කර ගෙන මධ්‍යම ගොවි ජනයා එක්තරා දුරකට සතුටු කළ හැකි වේ.

දැන් ප්‍රාදේශීය ආර්ථික හුවමාරුව ගැන වචන කීපයක් සඳහන් කරනු කැමැත්තෙමි. පළමුවෙන්ම සමුපකාරය ගැන සලකා බලමු. ඒවා දැනට අන්ත පරිහානි තත්ත්වයට පත්ව ඇතත්, ප්‍රාදේශීය ආර්ථික හුවමාරු මාර්ගයක් වශයෙන්, ස්වාභාවිකවම ඒවා අපට අවශ්‍යව ඇත. ධනපති ක්‍රමයෙන් ශේෂ වී තිබෙන සමුපකාර හොඳම බෙදා හැරීමේ ක්‍රමය වන බවත්, එය ආරක්ෂා කර ගත යුතු බවත් අපගේ වැඩ පිළිවෙළෙහි සඳහන්ව තිබේ. අපගේ වැඩ පිළිවෙළෙහි කියා තිබෙන්නේ එයයි. අප ඒ අනුව කටයුතු කර තිබේද? එසේ කර තිබේ නම්, ඒ ඉතා අල්ප වශයෙන් පමණකි. එසේ වූයේ, නැවතත්, අර්ධ වශයෙන් අපගේ වැරදි නිසාය. අර්ධ වශයෙන් යුද්ධ කාලීන අවශ්‍යතාවය නිසාය. සමුපකාර විසින් ඉදිරියට දමන ලද්දේ වඩාත් ව්‍යාපාරානුබද්ධ සහ ආර්ථික වශයෙන් වඩාත් දියුණු කොටස්ය. එනිසා එමගින් ඉදිරියට වන්නේ දේශපාලන ක්ෂේත්‍රයේ මෙන්ෂෙවික්වාදීන් සහ සමාජවාදී-විප්ලවවාදීන් වන අයයි. මෙය රසායන විද්‍යාවේ නීතියකි. ඒ ගැන අපට කළ හැකි දෙයක් නැත! (සිනා.) මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් වූ කලී දැන හෝ නොදැන ධනපති ක්‍රමය යළිත් ප්‍රතිෂ්ඨාපනය කිරීමට වැඩ කරන, යුදෙනිච්ලාට ආධාර කරන පිරිසකි. එයත් නීතියකි. අපි ඔවුනට විරුද්ධව සටන් කළ යුත්තෙමු. එමෙන්ම, සටන් කරනවා නම්, එය යුද්ධයක් මෙන් කළ යුත්තකි. අපට ආරක්ෂාව සලසා ගැනීමට සිදු විය. අපි එය කෙළෙමු. නමුත් වර්තමාන තත්ත්වය හැමදාමත් පවත්වා ගත යුතුද? නැත. එය අවශ්‍ය නැත. එය අවශ්‍ය යයි කීම අපගේ අත් බැඳ දැමීමකි. එය වරදක් වන්නේය. එනිසා සමුපකාර ගැන යෝජනාවක් ඔබ හමුවේ තැබීමට මම අදහස් කරමි. එය ඉතා කෙටි යෝජනාවකි. මම එය කියවන්නෙමි:

"රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ නව වැනි සම්මේලනය සමුපකාර සම්බන්ධයෙන් සම්මත කළ යෝජනාව ධාන්‍ය අතිරික්තයන් අත්පත් කර ගැනීමේ පදනමක් මත පිහිටා සකස් කරන ලද හෙයින්ද, දැන් ද්‍රව්‍ය බද්ද නිසා ධාන්‍ය අතිරික්තයන් අත්පත් කර ගැනීම අවලංගු වන හෙයින්ද, රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ දහවැනි සම්මේලනය මෙසේ තීරණය කරයි:

"ඉහත සඳහන් යෝජනාව අවලංගු කරනු ලැබේ."

"රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළට අනුකූලවත්, අතිරික්ත ධාන්‍ය අත්පත් කර ගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්දක් ආදේශ කිරීමේ අරමුණ අනුවත්, සමුපකාරවල ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කර සංවර්ධනය කිරීම සඳහා වූ තීරණ සකස් කර පක්ෂ හා සෝවියට් සභා

මාර්ගයෙන් ඒවා ක්‍රියාත්මක කරන ලෙස මෙම සම්මේලනය මධ්‍යම කාරක සභාවට නියම කරයි."

මෙය එතරම් පැහැදිලි නැතැයි ඔබ කියනු ඇත. එය ඇත්තය. එක්තරා ප්‍රමාණයකට එය අවශ්‍යයෙන්ම එසේ විය යුතුය. අවශ්‍යයෙන්ම එසේ විය යුත්තේ මන්ද? සම්පූර්ණයෙන්ම නිශ්චිත වශයෙන් මෙය කීමට නම්, මීළඟ අවුරුද්ද තුළ අප කරන්නට යන දේ හරියටම දැන ගෙන සිටිය යුතු හෙයිනි. එය දන්නේ කවුද? කිසිවෙක් එය දන්නේ නැත. එමෙන්ම, දැන ගතද නොහැකිය.

ආහාර කොමිසාර් අංශයට යටත් කිරීම ගැන වූ නව වැනි සම්මේලන යෝජනාව නිසා සුදුසු ලෙස කටයුතු කිරීමේ ඉඩ කඩ අපට නැතිව යන්නේය. මෙම කොමිසාර් අංශය අගනා ආයතනයකි. එහෙත් සුළු ගොවීන් කෙරෙහි අප දක්වන ආකල්පය ගැන පුනරීක්ෂණයක් කරන අවස්ථාවක, එයට පමණක්, අන් සියල්ලටම හැර එයටම පමණක් සමුපකාර යටත් කිරීම මගින් අපගේ අත් බැඳ තැබීම දේශපාලන වරදකි. නිශ්චිත පියවරයන් හා වෙනස් කිරීම් ගැන විස්තර විභාග දක්වන ලෙස හා ඒවා ක්‍රියාත්මක කරන ලෙසත්, ඉස්සරහට හෝ පස්සට අප ගන්නා සෑම පියවරක්ම ගැන අප ක්‍රියාත්මක විය යුත්තේ කොතෙක් දුරටද, අපගේ දේශපාලන අවශ්‍යතාවයන් ආරක්ෂා කරන්නේ කෙසේද, කටයුතු පහසු කිරීම පිණිස කොතරම් ලිහිලක් දැක්විය යුතුද, අපගේ අත්දැකීම් ගැන පරීක්ෂා කළ යුත්තේ කෙසේද යන කරුණු ගැන සොයා බැලීමට කටයුතු කරන ලෙසත් පත් වූ නව මධ්‍යම කාරක සභාවට අපි නියම කළ යුත්තෙමු. න්‍යායික වශයෙන් බලන කල, මේ හා සම්බන්ධයෙන් වූ පරිවර්තනීය අවධි, නැතහොත්, පරිවර්තනීය පියවරයන් ගණනාවකට අපි මුහුණ පා සිටින්නෙමු. එක කරුණක් නම් පැහැදිලිය. නව වැනි සම්මේලනයේ යෝජනාව සකස් වී තිබෙන්නේ අපගේ ඉදිරි ගමන සරල රේඛා ස්වරූපයක් ගනු ඇතැයි යන අදහස අනුවය. එහෙත් විප්ලවවල ඉතිහාසයේදී නැවත නැවතත් සිදු වුනු පරිදිම අපගේ ව්‍යාපාරයද දහරාකාර මාර්ගයක් ගත් බව පෙනේ. එවැනි යෝජනාවකින් තමන්ගේ අත් බැඳ ගැනීම දේශපාලන වරදකි. එය අවලංගු කරන අතර, සමුපකාර ව්‍යාපාරයේ වැදගත්කම අවධාරණය කර තිබෙන අපගේ වැඩ පිළිවෙළ අනුව අපි කටයුතු කළ යුතු වෙමු.

එම යෝජනාව අවලංගු කරමින් අපි මෙසේ කියන්නෙමු: අතිරික්ත ධාන්‍ය අත්පත් කර ගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්දක් ආදේශ කිරීමේ අරමුණ ඇතිව වැඩ කරනු. එහෙත් අප මෙය කරන්නේ කවදාද? අස්වනු එකතු කිරීමට පෙර එය කළ හැකි නොවේ. අස්වනු එකතුව මාස කීපයකින් සිදු වනු ඇත. ද්‍රව්‍ය බද්ද ආදේශ කිරීම සෑම තන්හිම එකාකාරවම කරනු ලැබේද? එය කිසිසේත් කළ නොහැක්කකි. මධ්‍යම රුසියාවටත්, උක්‍රේනියාවටත්,

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සයිබීරියාවටත් එකම රටාවක් ක්‍රියාත්මක කරන්නට යාම අන්ත මෝඩකමක් වනු ඇත. සීමා නොකළ ප්‍රාදේශීක හුවමාරුව පිළිබඳ මූලික අදහස සම්මේලනයේ තීරණයක් ලෙස ගත යුතු යයි මම යෝජනා කරමි.[58] මෙම තීරණය ගත් පසු ඊළඟ දවස් කීපය ඇතුළත මධ්‍යම කාරක සභාව චක්‍ර ලේඛයක් යවනු ඇතැයිද, මූලික වෙනස්කම් නොකරන බවත්, නුවමනා ඉක්මන්කාරිකම්, නැතහොත්, ක්ෂණික තීරණ ගැනීම් නොවිය යුතු බවත්, කටයුතු කළ යුත්තේ මධ්‍යම ගොවීනට උපරිම සැලකිල්ලක් ලැබෙන සේ සහ නිර්ධන පංතියේ උවමනාවන්ට හානියක් නොවන පරිද්දෙන් බවත් මට මෙහිදී කළ හැකිවාට වඩා හොඳින් (ශෛලිය ඔප දැමීම සඳහා අපි හොඳම ලේඛකයන් සොයා ගනිමු) පැහැදිලි කරනු ඇතැයිද, මම විශ්වාස කරමි. එක් එක් දේ අත්හද බලන්න. ව්‍යවහාරයේදී හා අත්දැකීම් තුළින් කරුණු අධ්‍යයනය කරන්න. ඊළඟට ඔබගේ අත් දැකීම් අපටත් දෙන්න — ඔබට කළ හැකි වූ දේ අපට දන්වන්න. ඔබ එකතු කරගත් අත්දැකීම් අධ්‍යයනය කිරීමට අපි විශේෂ කොමිසමක් පත් කරන්නෙමු. අවශ්‍ය නම් කොමිසම් කීපයක් වුවද පත් කරන්නෙමු. "නිර්ධන පංති ආඥාදායකත්වය සමයේ කඩදාසි මුදල්" නමැති ලියවිල්ලේ කතෘවරයා වන ප්‍රියබ්‍රෙෂෙන්ස්කි සහෝදරයාට විශේෂ ආරාධනයක් යැවිය යුතු යයි මම අදහස් කරමි. මෙය ඉතා වැදගත් ප්‍රශ්නයකි. රටේ භාණ්ඩ සංසරණය ගැන අගේ ඇති දර්ශකයකි, මුදල් සංසරණය. එය අසතුටුදායක වන විට මුදල් අච්චු ගසා තිබෙන කඩදාසි තරමටවත් මුදල වටින්නේ නැත. මෙම අත්දැකීම් පදනම් කර ගෙන ඉදිරියට යාම සඳහා, අප පිළිගෙන තිබෙන පියවරයන් නැවත නැවතත් පිරික්සුමට භාජනය කළ යුත්තෙමු.

සීමා නොකළ වෙළඳාම සඳහා භාණ්ඩ අවශ්‍ය වන හෙයින්, භාණ්ඩ ලැබෙන්නේ කොහෙන්ද යන ප්‍රශ්නය අපෙන් අසනු ලැබෙනු ඇත. ගොවීනට කූට බුද්ධියක් ඇති බවත්, ඔවුන් අවඥ කිරීමෙහි දක්ෂ බවත් අපි සැලකිල්ලට ගත යුත්තෙමු. අපට දැන් භාණ්ඩ කිසිවක් ලබා ගත හැකිද? අපගේ ජාත්‍යන්තර තත්ත්වය බෙහෙවින් වැඩි දියුණු වී තිබෙන නිසා දැන් එය කළ හැක. අපි ජාත්‍යන්තර ධනපතියන්ට විරුද්ධව සටන් කරමින් සිටින්නෙමු. ප්‍රථම වරට ඔවුනට මෙම සමූහාණ්ඩුවට මුහුණ දීමට සිදුවූ අවස්ථාවේ, ඔවුහු අප හැඳින් වූයේ පල්හොරුන් සහ කිඹුල්ලුන් වශයෙනි. (ඉතාමත් බලවත් දේශපාලනඥයෙක් මෙම වචනම පාවිච්චි කළ බව තමාට ඇසුනේ යයි ඉංග්‍රීසි කලාකරු කාන්තාවක් මට කීවාය.)[59] කිඹුල්ලු පිළිකුල් සහගතය. ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ නිගමනය එය විය. එය පංති සතුරාගේ නිගමනය විය. ඔහුගේ දෘෂ්ටිය අනුව එය අතාමත් නිවැරදිය. එසේ වුවද, එවැනි තීරණයක් නිවැරදිද බැලිය යුත්තේ ව්‍යවහාරය අනුවය. ඔබ සමස්ත ලෝක මහා බලවේගය වන්නේ නම්, ලෝක ප්‍රාග්ධනය නම්,

එමෙන්ම කිඹුල්ලු වැනි වචන පාවිච්චි කරන්නෙහි නම්, අවශ්‍ය සියලු තාක්ෂණික පහසුකම් ඔබට තිබේ නම්, උත්සාහයක් ගෙන ඔවුනට වෙඩි නොතබන්නේ මන්ද? ඇත්තෙන්ම ඔබ වෙඩි තැබුවෙහිය. එයින් සල්ලම් වුනේ ඔබමය. "අපි වෙළඳාම් කළ යුත්තෙමු" යි ධනපතියන් විසින් කියන ලද්දේ එවිටය; දේශපාලන හා ආර්ථික යථාර්ථයන් සැලකිල්ලට ගන්නා ලෙස බල කෙරුණු පසුවය මෙය. අපගේ ශ්‍රෙෂ්ඨ තම ජයග්‍රහණයකි. අපට රත්රන් රූබල් දස කෝටියක් පමණ වන ණය මුදල් දෙකක් දීමට කැමැත්ත පල කෙරෙන ප්‍රතිඥ ලැබී තිබෙන බව ඔබට දැන්වීමට කැමැත්තෙමි. අපට රත්රන් තිබේ. එහෙත් රත්රන් කෑමට ගත නොහැකි නිසා, ඒවා වෙළඳාම් කළ නොහැකිය. යුද්ධයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සියලු රටවල්ම දරිද්‍රතාවයට පත්ව ඇත — ධනපති රටවල් අතර ව්‍යවහාර මුදල් සම්බන්ධකම් විශ්වාස කළ නොහැකි තරම් දුරට අවුල් වී තිබේ. එපමණක් නොව, යුරෝපය හා සමග සම්බන්ධකම් පැවැත්වීමට වෙළෙඳ නැව් කණ්ඩායමක් අවශ්‍ය නමුත්, අපට එවැන්නක් නැත. ඒවා තිබෙන්නේ සතුරන් අතේය. අපි ප්‍රංශයත් සමග ගිවිසුමක් අත්සන් කර නැත්තෙමු. අප ඇගේ ණයකරුවන් ලෙසට ඇය සලකන්නීය "එසේ නම් ඕනෑම නැවක් අපට අයිතිය." ඔවුහු කියති. ඔවුනට නාවුක හමුදවක් ඇත. අපට එවැන්නක් නැත. මෙම තත්ත්වයන් යටතේ අපට රත්රන් පාවිච්චි කිරීමට හැකි වී තිබෙන්නේ ඉතාමත් සීමා සහිත, අල්පමාත්‍ර පරිමාණයකින් පමණකි. දැන් අපට දස කෝටියක ණය ගනුදෙනුවක් සම්බන්ධයෙන් ප්‍රතිඥ දෙකක් ධනපති බැංකුකරුවන්ගෙන් ලැබී තිබේ. ඇත්තෙන්ම, අපෙන් ඉතා අධික පොළී ප්‍රමාණයක් අය කරනු ඇත. එසේ වුවත්, මෙය ඔවුන් අපට දුන් මේ වර්ගයේ ප්‍රථම ප්‍රතිඥවය. මේ දක්වාම ඔවුන් අපට කීවේ මෙසේය: "මම තොපට වෙඩි තබා සියලු දේම නොමිලේම ගන්නෙමි." දැන් වෙඩි තැබීමට නොහැකි නිසා ඔවුන් අප සමග වෙළඳාම් කිරීමට සූදානම්ය. ඇමෙරිකාව සහ බ්‍රිතාන්‍ය සමග වෙළෙඳ ගිවිසුම් අපගේ මල්ලෙහි තිබෙන කලෙක මෙනි. අනුග්‍රහයන් ගැන තත්ත්වයද එසේමය. මෙහි සිටින වැන්ඩර්ලිප් මහතාගෙන් මට ඊයේ ලිපියක් ලැබුණේය. එයින් නොයෙක් කාරණා ගැන පැමිණිළි කරන අතරම ඔහු අනුග්‍රහ පිළිබඳ සැලසුම් මාලාවක්ද, ණයක් දීමේ ප්‍රතිඥවක්ද ඉදිරිපත් කරයි. ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ බටහිර ප්‍රාන්ත රාජ්‍යයන් හා සම්බන්ධ, එමෙන්ම, ජපානයට වැඩි විරුද්ධකමක් දක්වන, කූටතම වර්ගයේ ධනපතියන් නියෝජනය කරන්නෙකි. එනිසා භාණ්ඩ ලබා ගැනීමේ ආර්ථික හැකියාව අපට ඇත. අප භාණ්ඩ ලබා ගන්නේ කෙසේද යන්න වෙනත් ප්‍රශ්නයකි. නමුත් එක්තරා ප්‍රමාණයක අවකාශයක් තිබේ.

විදේශ ධනවාදය සමග පෙරමුණක් ඇති කර ගැනීමක් සේ මතු පිටින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උපනෙන, මේ වර්ගයේ ආර්ථික සම්බන්ධකම් මගින් පහළ සිටින ගොවි ජනතාව සමග නිදහස් හුවමාරුවක් ඇති කර ගැනීමේ හැකියාව නිර්ධන පංති රාජ්‍යයට ලැබෙන බව මම යළිත් කියන්නෙමි. මෙයට විළිස්සන සමහර දෙනෙක් සිටින බව මම දන්නෙමි. ඒ බව මා කලින්ද කියා ඇත. "මහජන මතය" හැඩ ගසන්නට උත්සාහ කරන නිලධාරිවාදී බුද්ධිමතුන්ගේ ස්ථරයක්ම මොස්කව්හි ඇත. "කොමියුනිස්ට්වාදයට සිදු වී තිබෙන දේ බලන්නැ" යි මොවුහු විලිස්සමින් දෙඩති. "එය කිහිලි කරුවලින් යන, මුහුණ සම්පූර්ණයෙන්ම වෙළුම් පටිවලින් ඔතනු ලැබූ පින්තූර ප්‍රහේලිකාවක් මිස අන් දෙයක් නොවේ". මම මෙවැනි උපහාස ඕනෑ තරම් අසා ඇත්තෙමි. එසේ කියන්නෝ එක්කෝ නිලධාරිවාදීහු වෙති. නැතහොත්, වග කීමෙන් තොරව කථා කරන්නෝ වෙති. යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් රුසියාව උඩට මතුවී ආවේ මරණාසන්නව පණ අදින තරමට පහර දෙනු ලැබූ මිනිසෙකුගේ තත්ත්වයේ සිටය. මෙම පහර දීම හත් අවුරුද්දක් තිස්සේම කෙරුනි. එයට කිහිලි කරුවලින් නොන්ඩි ගසමින් ඇවිදින්නට ලැබීමත් වාසනාවකි! අප සිටින්නේ එවැනි තත්ත්වයකය! කිහිලි කරු නොමැතිව මෙම තත්ත්වයෙන් ගොඩ ඒමට හැකි යයි කල්පනා කිරීම යනු කිසිවක් තේරුම් නොගැනීමකි! අතිකූත් රටවල විප්ලවය ඇති නොවන තාක් කල්, අපට මෙම තත්ත්වයෙන් ගොඩ ඒමට අවුරුදු දශක ගණන් කාලය ගත වනු ඇත. තවද,මෙම තත්ත්වයන් යටතේ මහා ධනපතියන්ගෙන් ආධාර ලබා ගැනීම පිණිස අපගේ සාරවත් අමුද්‍රව්‍ය සම්පත්වලින් දස කෝටි ගණන්, නැතහොත්, සිය කෝටි ගණන් පවා ගෙවීම් කිරීමට සිදුවීම වැලැක්විය නොහැකිය. පසුව එම ගෙවීම්වලටත් වැඩියෙන් අපි ආපසු ලබා ගන්නෙමු. ප්‍රාග්ධනය සඳහා අපෙන් ඉතා අධික පොළියක් අය කරනු ලබන බව නිසැකය. එහෙත්, වෙන කිසිම රටකට නොකරන ලද පරිදි විනාශයක් කරන ලද, ජනගහනයෙන් අති බහුතරය එසේම විනාශයට පත් ගොවි ජනයාගෙන් සමන්විත වූ අපගේ වැනි රටක ප්‍රාග්ධනය ආධාර කර නොගෙන නිර්ධන පංති පාලනය පවත්වා ගත නොහැකිය. අපි මේ බව වටහා ගත යුත්තෙමු. එනිසා තෝරා ගැනීමට තිබෙන්නේ මේ වර්ගයේ ආර්ථික සම්බන්ධකම් හෝ කිසිවක් නොමැති තත්ත්වයක් හෝ යන දෙකෙන් එකකි. වෙනත් ආකාරයකින් ප්‍රශ්නය ඉදිරිපත් කරන තැනැත්තේ ප්‍රායෝගික ආර්ථික කටයුතු ගැන කිසිවක් නොදන, උපහාස පැමෙහි යෙදෙමින් ප්‍රශ්නයෙන් මග හරින්නෙකි. පොදු ජනතාව ඉතාමත් වෙහෙසට පත්ව දුර්වලව සිටින බව අපි පිළිගත යුත්තෙමු. මෙරටට වඩා දියුණු රටවල් හතර අවුරුද්දක යුද්ධයේ ප්‍රතිවිපාකවලින් තවමත් පීඩා විඳින කල, මේ රටේ හත් අවුරුද්දක යුද්ධයෙන් පසු ඔබට බලාපොරොත්තු විය හැක්කේ කෙබඳු තත්ත්වයක්ද!

හත් අවුරුද්දක් තිස්සේ යුද්ධයෙන් පීඩිත වූ මෙම රටෙහි අනුපමේය පරිත්‍යාගයන් කළ කම්කරු පංතියත්, ගොවි ජන සමූහයාත් දැන් ඉතා දුර්වල වූ තත්ත්වයක පසු වෙති. මෙය වැඩ කිරීමේ හැකියාව සම්පූර්ණයෙන්ම අහෝසි වී යාමට ආසන්න තත්ත්වයකි. දැන් අවශ්‍යව තිබෙන්නේ ආර්ථික වශයෙන් හුස්ම ගැනීමේ අවකාශයකි. කිසියම් හෝ නිෂ්පාදන මාධ්‍යයන් ලබා ගැනීම සඳහා අපගේ රත්රන් සංචිතයන් ලබා ගැනීමට අපි බලාපොරොත්තු වුනෙමු. කළ හැකි හොඳම දෙය නම්, අපට අවශ්‍ය යන්ත්‍ර අපම තනා ගැනීමය. නමුත්, අප ඒවා මුදල්වලට ගත්තත්, එමගින් අපේ කර්මාන්ත ගොඩ නගා ගත හැකි වන්නේය. කෙසේ වුවත්, ඒ සියල්ලම කිරීමට නම්, වැඩ කිරීමට හැකි කම්කරුවන් සහ ගොවීන් සිටිය යුතුය. එහෙත්, පවත්නා තත්ත්වය අනුව, ඉන් බොහෝ දෙනෙක් සිටින්නේ එම කාර්යය ඉටු කළ හැකි තත්ත්වයක නොවේ. ඔවුහු වෙහෙසට පත් වී, දුර්වලව සිටිති. එනිසා ඔවුනට ආධාර දිය යුතුව තිබේ. අපගේ පැරණි වැඩ පිළිවෙළට ප්‍රතිකූලව යමින්, පාරිභෝගික භාණ්ඩ ලබා ගැනීම සඳහා රත්රන් සංචිතයන් වැය කළ යුතුය. ඒ වැඩ පිළිවෙළ න්‍යායික වශයෙන් නිවැරදි වූ නමුත් ප්‍රායෝගික වශයෙන් ශක්තිමත් එකක් නොවීය. ලෙෂාවා සහෝදරයාගෙන් මට ලැබී තිබෙන තොරතුරු ටිකක් ඔබ හමුවේ තබන්නෙමි. විවිධ ආහාර වර්ග පූඩ් ලක්ෂ ගණනක් ලිතුවේනියාවෙන්, පින්ලන්තයෙන් හා ලත්වියාවෙන් මිළට ගෙන තිබෙන බවත්, ඒවා හැකි තරම් ඉක්මණින් ගෙන්වන බවත් එම තොරතුරු අනුව අනාවරණය වේ. ගල් අඟුරු පූඩ් 1,85,00,000 ක් මිළට ගැනීමේ ගනු දෙනුවක් ලන්ඩනයේදී කෙරුණු බව අද අපට දැන ගන්නට ලැබිණ. අප මෙම ගල් අඟුරු මිළයට ගත්තේ පෙට්‍රොග්‍රෑඩ් කර්මාන්ත සහ රෙදි කර්මාන්තය යළි පණ ගැන්වීමටය. ගොවියාට භාණ්ඩ ගෙන දුනහොත් අප එයින් කරන්නේ වැඩ පිළිවෙළට පටහැනි, ක්‍රම විරෝධී දෙයක් බව සැබැවි. එහෙත් ජනතාව දුර්වල වී වැඩ කළ නොහැකි තත්ත්වයට පත්ව සිටින හෙයින්, අපට ලිහිලක් අවශ්‍ය වී තිබේ.

තනි පුද්ගල භාණ්ඩ හුවමාරුව ගැන මා වචනයක් දෙකක් කිව යුතුය. නිදහස් හුවමාරුව ගැන කථා කරන විට අප අදහස් කරන්නේ, තනි පුද්ගල භාණ්ඩ හුවමාරුව ගැනයි. එය ඇති වීමෙන් කුලාකයන් ධෛර්යමත් කෙරෙන්නේය. අප කුමක් කළ යුත්තෙමු ද? අතිරික්තයන් අත්පත් කර ගැනීම වෙනුවට බද්දක් අය කිරීම ආරම්භ කිරීම නිසා, නව ක්‍රමය යටතේ කුලාකයන් වැඩි වන බව අපි අමතක නොකළ යුත්තෙමු. කලින් ඔවුනට මතු විය නොහැකි වූ තැන්වලින් දැන් ඔවුන් මතු වනු ඇත. මෙයට විරුද්ධව සටන් කළ යුත්තේ තහනම් නීති පැනවීමෙන් නොවේ. රජයේ අනුග්‍රහයෙන් ඇති කරන සමාගමය සහ ඉහළින් ගන්නා ආණ්ඩුවේ පියවරයන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මාර්ගයෙනි. ඔබ ගොවියාට යන්ත්‍ර දෙන්නෙහි නම්, එය ඔහුගේ වර්ධනයට රුකුලකි. එමෙන්ම, ඔබ යන්ත්‍ර හා විදුලි බලය සපයන විට, ඒ හේතු කොට ගෙන කුඩා කුලාකයන් දස දහස් ගණන්, නැතහොත්, ලක්ෂ ගණන් අතු ගෑවී යන්නේය. නමුත් සියල්ල සපයන්නට හැකි වන තෙක්, ඔබ භාණ්ඩ එක්තරා ප්‍රමාණයක් සැපයිය යුතුය. භාණ්ඩ ඔබ අතේ ඇතොත්, බලයද ඔබ අතෙහිය. එවැනි හැකියාවක් නොමැතිවීම, ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හැර දැමීම යනු සෑම හුවමාරුවක්ම අබලම් කිරීමකි. එසේ වූ කල මධ්‍යම ගොවියා සතුටු නොවන අතර, ඔහු සමග එක්ව පැවතීමද අපහසු වනු ඇත. රුසියාවේ ගොවීන් අතුරෙන් වැඩි අනුපාතයක් නියෝජනය කරන පිරිසක් මධ්‍යම ගොවීන් බවට පත්වී සිටිති. එනිසා තනි පුද්ගල පදනමක් මත හුවමාරුව ගැන බිය වීමට කිසිම හේතුවක් නොමැත. හුවමාරු වශයෙන් රජයට යමක් දීමට කවුරුත් සමත්ය. අයෙක් ඔහුගේ ධාන්‍ය අතිරික්තය දෙයි. තවත් අයෙක් ගෙවතු නිෂ්පාදන දෙයි. තුන්වැන්නෙක් තමන්ගේ ශ්‍රමය දෙයි. මූලික වශයෙන් පවත්නා තත්ත්වය මෙසේය. මධ්‍යම ගොවි ජනයා ආර්ථික වශයෙන් සතුටු කරමින් අපි නිදහස් හුවමාරුව වෙත යා යුත්තෙමු. එසේ නොකළහොත් ජාත්‍යන්තර විප්ලවයට තිරිංග දැමීම නිසා රුසියාවේ නිර්ධන පංති පාලනය ආර්ථික වශයෙන් රැක ගත නොහැකි වනු ඇත. අපි මෙය පැහැදිලිවම අවබෝධ කර ගත යුත්තෙමු. අතිරික්ත ධාන්‍ය අත්පත් කර ගැනීම වෙනුවට, බද්දක් ආදේශ කිරීම පිළිබඳ කෙටුම්පත් තීරණයෙහි (යෝජනාව ඔබ අතට පත් කර ඇත) නොගැලපෙන තැන් කීපයක්, ප්‍රතිවිරෝධයන් පවා තිබෙන බව ඔබට පෙනෙනු ඇත. එය අවසානයට අප මෙම වචන එකතු කර තිබෙන්නේ එනිසාය: ''අතිරික්ත ධාන්‍ය අත්පත් කර ගැනීම වෙනුවට, බද්දක් අය කිරීම ආදේශ කිරීම ගැන මධ්‍යම කාරක සභාව ඉදිරිපත් කළ යෝජනාව සාරානුකූල වශයෙන් (මෙය බොහෝ කරුණු අදහස් කරන තරමක් අනියත යෙදුමකි) අනුමත කරන මෙම සම්මේලනය, ඉතාමත් කඩිනම්ව මෙම ප්‍රස්තුතයන් ඒකාබද්ධ කරන ලෙස මධ්‍යම කාරක සභාවට නියම කරයි''. අපට කාල වේලා මඳ වූ නිසා ඒවා ඒකාබද්ධ කිරීමට නොහැකි වූ බව දන්නෙමු. අපි විස්තර විභාගයෙහි නොයෙදුනෙමු. බද්ද අය කිරීම ව්‍යවහාරයට නැගීම පිළිබඳ විධි විධාන විස්තර සහිතව සකස් කරනු ලැබේ. ඉන් පසුව, සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව සහ මහජන කොමිසාර් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන නීතියක් මගින් බද්ද පැනවීම සිදු කෙරේ. අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ක්‍රියා මාර්ගය මෙයයි: ඔබ මේ කෙටුම්පත අද අනුමත කරන්නේ නම්, ප්‍රථම සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේදීම එය තීරණයක් ලෙසට වලංගු කරනු ලැබේ. එහෙත්, එයද නීතියක් නිකුත් නොකරනු ඇත.

නමුත් එය සංශෝධිත රෙගුලාසි නිකුත් කරනු ඇත. පසුව, මහජන කොමිසාර් මණ්ඩලයත්, කම්කරු හා ආරක්ෂක මණ්ඩලයත් විසින් ඒවා නීති බවට පරිවර්තනය කිරීමත්, ඊට වඩා වැදගත් වන ප්‍රායෝගික උපදෙස් නිකුත් කිරීමත් කරනු ලැබේ. ප්‍රදේශවල ජනතාවට මෙහි අර්ථය වැටහීම සහ ඒ සඳහා අපට ඔවුන්ගේ ආධාරය ලැබීම වැදගත් වේ.

අතිරික්තයන් අත්පත් කර ගැනීම වෙනුවට බද්දක් ආදේශ කළ යුත්තේ මන්ද? අතිරික්තයන් අත්පත් කර ගැනීම යන්නෙන් අදහස් වූයේ සියලුම අතිරික්තයන් රාජ්‍ය සන්තක කිරීම සහ අනිවාර්යයෙන්ම රාජ්‍ය ඒකාධිකාරයක් ඇති කිරීමයි. අපගේ අවශ්‍යතාවය ඉතාමත් තදබල වූ හෙයින්, අපට කළ හැකි වෙනත් දෙයක් නොවීය. සමාජවාදයේ අවශ්‍යතාවයන් අනුව කල්පනා කර බලන කල රාජ්‍ය ඒකාධිකාරය හොඳම ක්‍රමය යයි පිළිගැනීම අනිවාර්ය නොවේ. කර්මාන්තයක් තිබෙන ගොවි ජනතා රටක — එම කර්මාන්තය ක්‍රියාකාරීව පවතින්නේ නම් — කිසියම් ප්‍රමාණයක් භාණ්ඩද තිබේ නම්, පරිවර්තනීය පියවරක් වශයෙන් අය බදු අය කිරීමත්, නිදහස් හුවමාරුවත් සහිත ක්‍රමයක් උපයෝගි කර ගත හැකි වේ.

හුවමාරුව ගොවියාට උනන්දු කාරකයකි; දිරිගැන්වීමකි. තම අතිරික්තයන් සියල්ලම තමන්ගෙන් නොගන්නා බවත්, තමන්ගෙන් අය කරන්නේ බද්දක් පමණක් බවත් — හැකි සෑම විටෙකදීම මෙම බද්ද කල් තබා නියම කළ යුතුය — දේපළ හිමියා දන්නා කල තමන්ගේම යහපත පතා උත්සාහයක් දැරීමට ඔහුට හැකි වනු ඇත. නිශ්චය වශයෙන්ම ඔහු එවැනි උත්සාහයක් දරනු ඇත. මූලික දෙය වී තිබෙන්නේ බිම ගොවිතැන් කිරීමට සුළු ගොවියාට උනන්දු කාරකයක් සහ ධෛර්යක් දීමයි. අපගේ රජයේ ආර්ථිකය මධ්‍යම ගොවියාගේ ආර්ථිකයට ගැලපෙන සේ සකස් කර ගත යුතුය. පසුගිය තුන් වසර තුළ අපට මධ්‍යම ගොවියාගේ ආර්ථිකය ප්‍රතිසංස්කරණය කර ගත නොහැකි විය. එය තවත් දස අවුරුද්දකින්වත් කළ නොහැකි වනු ඇත.

ආහාර පිළිබඳ ක්ෂේත්‍රයේදී රජයට නිශ්චිත වගකීම් දැරීමට සිදු විය. එනිසා අත්පත් කර ගැනීමේ සලාකයන් පසු ගිය අවුරුද්දේදී වැඩි කිරීමට සිදු විය. බද්ද ඉතා වඩා අඩු විය යුතුය. අය කළ යුතු නියමිත බදු ප්‍රමාණයන් විස්තර කර නොමැත. ඒවා විස්තර කිරීමටද නොහැකිය. අපගේ මධ්‍යම සංඛ්‍යා-ලේඛන මණ්ඩලය නිකුත් කළ දත්තයන් පොපොව් විසින් සම්පාදිත ''සෝවියට් සහ ඒකාබද්ධ සමූහාණ්ඩුවල ධාන්‍ය නිෂ්පාදනය'' යන පොතෙහි නිවැරදි ලෙස දක්වා තිබෙන අතර, කෘෂිකාර්මික නිෂ්පාදනය පහත වැටීමට හේතු වූ කරුණු එයින් පැහැදිලි වේ.[60]

අස්වැන්න පාළු වුවහොත් අතිරික්තයක් නොවන නිසා එවිට අතිරික්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තයන් එකතු කළ නොහැකි වනු ඇත. එවිට අතිරික්තයන් ගන්නට සිදු වන්නේ ගොවියාගේ කටෙන්ය. අස්වැන්නක් තිබේ නම් සියලු දෙනාම සාමාන්‍ය ප්‍රමාණයට කුසගින්නේ සිටිනු අතර, රාජ්‍යයද ආරක්ෂා වේ. එසේ නැතිව, පවත්නා තත්ත්වය අනුව, ප්‍රමාණවත් තරම් ආහාර නොලබන ජනයාගෙන් අප යමක් නොගෙන සිටියොත්, රාජ්‍යයත් විනාශ වනු ඇත. ගොවි ජනයා අතර ගෙන යන අපගේ ප්‍රචාරයෙන් පැහැදිලි කළ යුත්තේ මෙයයි. සාමාන්‍ය ප්‍රමාණයේ අස්වැන්නක් ලැබුණහොත් ධාන්‍ය පූඩ් පණස් කෝටියක අතිරික්තයක් ලැබේ. එවිට පාරිභෝජනයට අවශ්‍ය ධාන්‍ය ගත් විට කිසියම් සංචිතයක්ද ඇති වේ. වැදගත් දෙය වී තිබෙන්නේ ගොවි ජනයාට උනන්දු කාරකයක් දීමය, ආර්ථික වශයෙන් උනන්දු කිරීමය. සුළු දේපළ හිමියාට අපි මෙසේ කිව යුත්තෙමු: ''නිෂ්පාදනය කිරීම අයිතිකරු වන ඔබගේ කාර්යයකි; එවිට රජය අවම බද්දක් අය කරයි.''

මගේ කථාව අවසාන කිරීමට කාලය පැමිණ තිබේ. අපට මේ දූත් නීතියක් නිකුත් කළ නොහැකි බව මම නැවතත් කියන්නෙමි. ප්‍රශ්නයකට තිබෙන්නේ අපගේ යෝජනාව ප්‍රමාණවත් තරම් නීතිමය ස්වභාවයක නොතිබීමයි. නීති ලිවීම පක්ෂ සම්මේලනයකදී කළ හැකි දෙයක් නොවේ. එනිසා මධ්‍යම කාරක සභාව ඉදිරිපත් කළ යෝජනාව පදනමක් වශයෙන් අනුමත කර, එහි අන්තර්ගත විවිධ ප්‍රස්තුතයන් ඒකාබද්ධ කරන ලෙස මධ්‍යම කාරක සභාවට නියම කරමු. අපි යෝජනාව මුද්‍රණය කරන්නෙමු. එවිට එහි ප්‍රස්තුතයන් ඒකාබද්ධ කිරීමටත් එය නිවරද කිරීමටත් විවිධ ප්‍රදේශවල පක්ෂ නිලධාරීන් උත්සාහ කරනු ඇත. එය මුල සිට අග දක්වා ඒකාබද්ධ කළ නොහැකිය. ජීවිතය ඉතාමත් විවිධාකාර වන නිසා, එය කළ හැකි දෙයක් නොවේ. පරිවර්තනීය පියවරයන් සොයා ගැනීම දුෂ්කර කර්තව්‍යයකි. අපට මෙය එක එල්ලේම සහ කඩිනම්ව කළ නොහැකි නම්,අපි ඒ නිසා දුර්මුඛ නොවිය යුත්තෙමු. අවසානයේදී අපි ජය ගන්නෙමු. ආණ්ඩුව වශයෙන් අප නියෝජනය කරන්නේ කම්කරු පංතියත්, වැඩ කරන ගොවි ජනයාට (ජනගහනයෙන් දහයෙන් නවයක් සමන්විත වන්නේ ඔවුන්ගෙනි) එකඟ විය හැකි ආකාරයේ වන වැඩ කරන ජනතාවත් බවද, ආපසු හැරුනහොත් අප නැවතත් යන්නේ පරණ සාර්වාදී ආණ්ඩුවට වෙත බවද අල්පමාත්‍ර හෝ දේශපාලන විඥනයක් ඇති සෑම ගොවියෙකුටම වැටහෙනු ඇත. ක්‍රන්ෂ්ටාඩ්ට්ගෙන් ලැබුනු අත්දැකීමෙන්[61] මෙය ඔප්පු වේ. සුදු හමුදුවන්ගේ ආණ්ඩුවද, නැතහොත්, අපේ ආණ්ඩුවද යන දෙකෙන් එකක් තෝරන තත්ත්වයට ඔවුහු එකඟ නොවෙති. වෙනත් විකල්පයක්ද නැත. එනිසා ඔවුන් පක්ව සිටින්නේ වෙන කිසිවෙකුටත් වඩා අපට පක්ෂවත්, සෑම අළුත් ආණ්ඩුවකටම විරුද්ධවත් ඔවුන් පොළඹවන තත්ත්වයකටය.

අපි දූත් ගොවි ජනයා හා සමග එකඟත්වයක් ඇති කර ගැනීමට හැකි තත්ත්වයක සිටිමු. එය ව්‍යවහාරික වශයෙන්, දක්ෂ ලෙස, කාර්යක්ෂම ලෙස සහ නම්‍යශීලී ලෙස ඇති කර ගත යුත්තෙමු ආහාර පිළිබඳ කොමිසාර් අංශයේ සංවිධාන ව්‍යුහය ගැන අපි දන්නෙමු. එය අපට තිබෙන හොඳම සංවිධානවලින් එකකි. එහි සංවිධාන ව්‍යුහය අනිකුත් කොමිසාර් අංශවලට වඩා හොඳය. එනිසා එය ආරක්ෂා කර ගත යුතුය. එසේ වුවද, පරිපාලන යන්ත්‍රය දේශපාලනයට යටත් කළ යුතුය. අපට ගොවි ජනයා සමග හරි ආකාර සම්බන්ධකම් ඇති කර ගත නොහැකි නම්, ආහාර පිළිබඳ කොමිසාර් අංශයේ අගනා සංවිධානයෙන් වැඩක් සිදු නොවනු ඇත. එවිට එයින් සේවයක් වනු ඇත්තේ ඩෙනිකින්ට හා කොල්චාක්ට මිස අපගේ පංතියට නොවේ. බලවත් වෙනස්කම්ද, නම්‍යශීලී භාවයද, දක්ෂ ලෙස පරිවර්තනීය පියවරයන් ගැනීමද දේශපාලන වශයෙන් අවශ්‍ය වී ඇති හෙයින්, නායකයන් ඒ ගැන වටහා ගත යුතුය. ශක්තිමත් සංවිධාන ව්‍යුහයක් ඕනෑම උපමාර්ගයකට සුදුසු විය යුතු නමුත්, එහි ශක්තිය හසුරුවා ගත නොහැකි වුවහොත්, එය වෙනස් කිරීම්වලට බාධක වුවහොත්, ඊට විරුද්ධව අරගල ඇති වීමද වැළැක්විය නොහැකිය. එනිසා සියලු ප්‍රයත්නයන්ම අපගේ අරමුණ ඉටු කර ගැනීම වෙත ඉලක්ක කළ යුතුය. සංවිධාන ව්‍යුහය දේශපාලනයට යටත් කළ යුතුය යනු ඒ අරමුණය. දේශපාලනය යනු පංති සම්බන්ධකම් වේ. සමූහාණ්ඩුවේ ඉරණම තීරණය වන්නේ එමගිනි. සංවිධාන ව්‍යුහයක් ශක්තිමත් වූ තරමට, එය, උපමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සහායක අවයවයක් වශයෙන් වඩාත් සුදුසු වේ. එය ඉටු කිරීමට අපොහොසත් සංවිධාන ව්‍යුහය කිසිම දෙයකට සුදුසු නැත.

මූලික කාරණය සිතෙහි තබා ගන්නා ලෙස ඔබෙන් ඉල්ලමි. විස්තර කරුණු සකස් කිරීමට හා අර්ථ නිරූපනයන් දීමට මාස ගණනක් ගත වනු ඇත. මෙම අවස්ථාවේ ප්‍රධානතම දෙය වන්නේ, අප ගන්නා තීරණය, අද රාත්‍රියේම, ගුවන් විදුලියෙන් මුළු ලෝකයාටම දූන ගන්නට සැලැස්වීමය. ආණ්ඩු පක්ෂයේ සම්මේලනය, අතිරික්තයන් අත්පත් කර ගැනීමේ ක්‍රමය වෙනුවට, මූලික වශයෙන්, බද්දක් අය කිරීම ආදේශ කරන බවත්, එය, සුළු ගොවියාගේ ගොවිපළ පුළුල් කර ගැනීමට සහ වෑඩියෙන් වගා කිරීමට ඔහුට උනන්දු කාරකයන් මාලාවක් දෙන බවත් අප ප්‍රකාශයට පත් කළ යුතුය. එමෙන්ම, මෙම ක්‍රියාමාර්ගයට පිවිසෙන සම්මේලනය, නිර්ධන පංතිය හා ගොවි ජනතාව අතර සම්බන්ධකම් ක්‍රමය නිවරද කරන බව හා ඒ ආකාරයෙන් එම සම්බන්ධකම් වඩාත් චිරස්ථායී වන්නේය යන ස්ථිර විශ්වාසයද ප්‍රකාශයට පත් කළ යුතුය. (දීර්ඝ අත්පොළොසන්)

''ප්‍රාව්ද'' අංක 57, 1921 මාර්තු 16 ද

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

3

පක්ෂ සමගිය ගැන රු. කො. ප. දහවැනි සම්මේලනයේ ප්‍රාථමික කෙටුම්පත් යෝජනාව

1. හේතුන් ගණනාවක් නිසා, රටේ සුළු ධනපති ජනගහනය අතර වැනෙන සුලු භාවය වැඩි වෙමින් පවතින මෙම අවස්ථාවේදී පක්ෂ සාමාජිකත්වයේ සමගිය හා සංශුක්තිය තිබීමත්, පක්ෂ සාමාජිකයන් ඉතර සම්පූර්ණ අන්‍යොන්‍ය විශ්වාසය තිබීම සහ නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණියෙහි අධිෂ්ඨානයේ ඒකමතිකත්වය සැබැවින්ම ඇතුලත් කොට ගත් නියම කණ්ඩායම් වැඩ කිරීමත් විශේෂයෙන්ම අවශ්‍ය බව මෙම සම්මේලනය සියලුම පක්ෂ සාමාජිකයන්ගේ අවධානයට ලක් කරයි.

2. එය එසේ වුවත්, වෘත්තීය සමිති ගැන පොදු පක්ෂ සාකච්ඡාවට පෙර පවා, පක්ෂය තුළ ඇතැම් කාණ්ඩවාදී සලකුණු, එනම්, වෙනම වැඩ පිළිවෙළවල් සහිත කණ්ඩායම් ඇති කිරීමට, එක්තරා දුරකට වෙන්වී සිටීමට සහ තමන්ගේම කණ්ඩායම් විනයක් නිර්මාණය කිරීමට දරන ඔවුන්ගේ ප්‍රයත්න දක්නා ලදී. නිදසුනක් ලෙසට, ඊනියා ''කම්කරු විරුද්ධ පාර්ශ්වය'' සහ ඊනියා ''ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදී'' කණ්ඩායම[62] විසින්, මොස්කව්හි පක්ෂ සාකච්ඡා සභාවේදී (1920 නොවැම්බර්) සහ හාර්කොව්හි පක්ෂ සාකච්ඡා සභාවේදී[63] එවැනි ලකුණු පෙන්නුම් කරන ලදී.

තනි පක්ෂ කණ්ඩායම්වල සාමාජිකයන් පක්ෂ සමගිය ආරක්ෂා කිරීමට කොතරම් ආශා කළත්, කාණ්ඩවාදය අනිවාරණීය වශයෙන්ම කණ්ඩායම් වැඩ දුර්වල වීමට තුඩු දෙන හෙයින්ද, ආණ්ඩු පක්ෂය තුළට රිංගා ගෙන සිටින එහි සතුරන් පිපුරුම පුළුල් කිරීම හා ප්‍රතිවිප්ලවවාදී අරමුණු ඉටු කර ගැනීම පිණිස එය උපයෝගි කර ගැනීමට උත්සන්න ලෙස සහ නිතර නිතර දරන ප්‍රයත්නයන්ට හේතු වන හෙයින්ද, ඕනෑම වර්ගයක කණ්ඩායම්වාදයක් හානිකර සහ නොඉවසිය හැකි බව පංති විඥානය ඇති කම්කරුවන් සියලු දෙනාම අවබෝධ කර ගත යුතුය.

තරයේ කොමියුනිස්ට්වාදී වන ක්‍රියාමාර්ගයකින් බැහැරව යොමු වන සෑම අපගමනයකින්ම නිර්ධන පංතියේ සතුරන් වාසි ලබා ගන්නා ආකාරය ක්‍රන්ෂ්ටාඩ්ට් හමුදු කැරැල්ලෙන් සමහර විට ඉතාමත් සිත් කාවදින ලෙස පෙනිනා. සෝවියට් ක්‍රමය සඳහා වූ සටන් පාඨය රුසියාවේ නිර්ධන පංති ආඥදායකත්වය පෙරළා දැමීමට ආධාරකයක් වේ නම්, තමන් එක් වරම එම සටන් පාඨය පිළිගැනීමට සූදානම් බව ලෝකයේ සියලුම රටවල ධනපති ප්‍රතිවිප්ලවවාදීහු සහ සුදු හමුදු පිරිස් එම අවස්ථාවේදී ප්‍රකාශ කළහ. එමෙන්ම, ක්‍රන්ෂ්ටාඩ්ට්හි නැගිටීමේ සටන් පාඨ පොදුවේ උපයෝගි කර ගත්

සමාජවාදී-විප්ලවවාදීහු සහ ධනපති ප්‍රතිවිප්ලවවාදීහුද, එකලම සෝවියට් බලයේ අවශ්‍යතාවයන් සඳහා කටයුතු කරන බවත් පෙන්වමින් රුසියාවේ සෝවියට් ආණ්ඩුවට විරුද්ධව කැරළි ගසා නැගී සිටින ලෙස ආයාචනා කළහ. රුසියාවේ නිර්ධන පංති විප්ලවයේ බල පවුර දුර්වල කිරීමේ හා විනාශ කිරීමේ එකම අරමුණ ඇතිව, සුදු හමුදු පිරිස් කොමියුනිස්ට්වාදීන් ලෙස හා ඉතාමත් වාමාංශික කොමියුනිස්ට්වාදීන් ලෙස පවා වෙස් වලාගැනීමට උත්සාහ දරන හා එසේ කිරීමට සමත් වන බව මෙම කරුණු වලින් පෙනේ.හමුදු කැරැලිවලට විරුද්ධ හා සුළු වෙනසක් පමණක් ඇතිව සෝවියට් බලයට ආධාර කරන බව කියන අතරම,ඇත්ත වශයෙන් ක්‍රන්ෂ්ටාඩ් හමුදු කැරළිකරුවන්ට, සමාජවාදී-විප්ලවවාදීන්ට සහ සුදු හමුදුවලට ආධාර දීමට හා ඒවා දිරිගැන්වීමට රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ අසමථයන්ගෙන් සහ කණ්ඩායම්වාදයේ ඇතැම් මූලිකාංගයන්ගෙන් මෙන්ෂෙවික්වරුන් ප්‍රයෝජන ගත් සැටි, ක්‍රන්ෂ්ටාඩ්ට් හමුදු කැරැල්ල පූර්වාසන්නයේදී ඔවුන් පෙට්‍රොග්‍රෑඩයේ බෙදු හළ පත්‍රිකාවලින් පෙනේ.

3. මෙම කාරණයේදී කරන ප්‍රචාරය, එක් අතකින් පක්ෂ සමගියේ සහ නිර්ධන පංති ආඥදායකත්වයේ සාර්ථකත්වයට මූලික කොන්දේසියක් වන නිර්ධන පංතියේ පෙරමුණු බල ඇණියෙහි අධිෂ්ඨානයේ ඒකමතිකත්වයක් ඇති කර ගැනීමේ ස්ථාවරයෙන් සවිස්තර ලෙස ඉදිරිපත් කරන පැහැදිලි කිරීමකින්ද, අනින් අතින්, සෝවියට් බලයේ සතුරන් යොදා ගන්නා අළුත්ම උපක්‍රමීය සූත්‍රවල විශේෂ අංග ලක්ෂණ පැහැදිලි කිරීමකින්ද සමන්විත විය යුත්තේය. සුදු හමුදු කොඩිය යටතේ විවෘත ලෙස ගෙන යන ප්‍රතිවිප්ලවයෙන් කිසිම වාසියක් නොවන බව අවබෝධ කර ගත් මෙම සතුරෝ, සෝවියට් බලය පිළිගැනීමට ඉතාමත් සමීපව සිටින සේ පෙනෙන දේශපාලන කණ්ඩායමකට බලය පැවරීමෙන් එක් හෝ තවත් ආකාරයකින් ප්‍රතිවිප්ලවය ඉදිරියට ගෙන යාම සඳහා රුසියානු කොමියුනිස්ට් පත්ෂය තුළ වන අසමථයන් උපයෝගි කර ගැනීමට හැකි උපරිම ප්‍රයත්නයන් දරති.

පසුගිය විප්ලවවලින් ලැබුණු පාඩම් ගැන උගැන්වීමද ප්‍රචාරය මගින් කළ යුතු වේ. එම විප්ලවවලදී, විප්ලවවාදී ආඥදායකත්වය දුර්වල කර බලයෙන් පහ කර දමනු සහ ඉන් අනතුරුව ප්‍රතිවිප්ලවයේ, ධනපතියන්ගේ හා ඉඩම් හිමියන්ගේ සම්පූර්ණ ජයග්‍රහණයට මාර්ගය සකස් කරනු පිණිස, සීමාන්තික විප්ලවවාදී පක්ෂයට ඉතාමත් ආසන්න තත්ත්වයේ සිටින එහි විරුද්ධ පාර්ශවයට ආධාර දීම ප්‍රතිවිප්ලවයේ විශේෂ ක්‍රියාමාර්ගයක් විය.

4. කාණ්ඩවාදයට විරුද්ධව කරන ප්‍රායෝගික අරගලයේදී, සියලුම කාණ්ඩවාදී ක්‍රියා වැලැක්වීම සඳහා පක්ෂයේ සෑම සංවිධානයක්ම දැඩි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සේ පියවර ගත යුතුය. පක්ෂයේ දුර්වලකම් විවේචනය කිරීම ඉතාමත් අවශ්‍ය වන අතර, සෑම ප්‍රායෝගික යෝජනාවක්ම නායක ප්‍රාදේශීය හා මධ්‍යම මණ්ඩල තුළ සලකා බැලීම සඳහා වහාම හා කිසිම ප්‍රමාදයක් නැතිව, හැකි තරම් දුරට ඉතාමත් නිශ්චිත ආකාරයෙන් ඒවා වෙත ඉදිරිපත් වන සේ එය ක්‍රියාත්මක කළ යුතුය. එපමණක් නොව, සෑම විවේචකයෙක්ම පක්ෂයේ තත්ත්වය, එනම්, එය සතුරන් වළල්ලකින් වටවී තිබීම ගැන සැලකිල්ලට ගන්නා බවටත්, සෝවියට් සහ පක්ෂ කටයුතුවලට කෙළින්ම සහභාගි වීමෙන් පක්ෂයේ, නැතහොත්, එක් එක් පාක්ෂිකයන්ගේ වැරදි නිවැරදි කෙරෙන බව තමන්ට ව්‍යවහාරික වශයෙන් පරීක්ෂා කර බැලිය හැකි වන සේ තමන්ගේ විවේචනයේ සන්ධාරය සකස් වී තිබෙන බවටත් වග බලා ගත යුතුය. පක්ෂයේ පොදු ක්‍රියාමාර්ගය ගැන විශ්ලේෂණයන්, එහි ප්‍රායෝගික අත්දැකීම් ගැන තක්සේරු කිරීම් එහි තීරණ ඉටු කිරීම ගැන වූ පරීක්ෂාවන්, වැරදි නිවරද කිරීම ගැන අධ්‍යයනයන්, යනාදිය, සෑම අවස්ථාවකදීම පක්ෂයේ සියලුම සාමාජිකයන් විසින් සාකච්ඡා කරනු ලැබීම සඳහා ඒවා එක එල්ලේම ඔවුන් වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ ගැන ප්‍රාථමික සාකච්ඡාවන් කිරීම සඳහා, ''වැඩ පිළිවෙළවල්'' ආදිය පදනම් කොට ගෙන සෑදුනු කණ්ඩායම් වෙත ඒවා කිසි කලෙකත් ඉදිරිපත් නොකළ යුතුය. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා ' දිස්කුසියෝනි ලිස්තොක්''[64] වඩාත් නිති පතා පළ කරන ලෙසද, විවේචනය නිර්ධන පංතියේ සතුරන්ට ආධාරකාරී වන ස්වරූපයන් ගැනීම වැළැක්වීම සහ එය අවශ්‍ය කරුණු වටා සංකේන්ද්‍රණය වීම සහතික කිරීම පිණිස නොකඩවාම ප්‍රයත්න දැරීමට අදාළ වන පරිදි විශේෂ ලිපි සංග්‍රහ පළ කරන ලෙසද සම්මේලනය නියම කරයි.

5. විශේෂ යෝජනාවකින්[65] පරීක්ෂාවට භාජනය කෙරෙන සම්මේලවාදය හා අරාජිකවාදය වෙතට නැඹුරු වූ අපගමනය ප්‍රතිපත්තියක් වශයෙන් ප්‍රතික්ෂේප කරන සහ සෑම කාණ්ඩවාදයක්ම සම්පූර්ණයෙන්ම නැති කර දමන ලෙස මධ්‍යම කාරක සභාවට උපදෙස් දෙන සම්මේලනය, ඊනියා 'කම්කරු විරුද්ධ පාර්ශවය'' විසින් විශේෂයෙන් අවධානයට ලක් කරන ලද, නිදසුනක් ලෙසට, නිර්ධන පංතික නොවන හා විශ්වාසය තැබිය නොහැකි කොටස් පක්ෂයෙන් ඉවත් කිරීම, නිලධාරිවාදී ව්‍යවහාරයන් මැඩ පැවැත්වීම, ප්‍රජාතන්ත්‍රවාදය සහ කම්කරු ක්‍රියාරම්භකත්වය සංවර්ධනය කිරීම, ආදී වූ ප්‍රශ්න ගැන ඇති සෑම ප්‍රායෝගික යෝජනාවක්ම ගැන ඉතාමත් සුපරීක්ෂාකාරී ලෙස සොයා බලා, ව්‍යවහාරයේදී අත්හදා බැලිය යුතු බව ඒ අතරම ප්‍රකාශ කරයි. මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් අප ගත යුතු පියවරයන් සියල්ලම ගෙන නැත්තේ විවිධ බාධකයන් නිසා බව පක්ෂය දැන ගත යුතුය.එහෙත් ප්‍රායෝගික නොවන සහ ව්‍යාජ ස්වභාවබය් වන විවේචනයන් ඉවත ලන අතරම, පක්ෂය, එය සතු සියලුම මාධ්‍යයන් යොදා ගනිමින් හා නව විධි ක්‍රම අත්හදා බලමින් නිලධාරිවාදයේ දුර්ගුණයන්ට විරුද්ධවත්, ප්‍රජාතන්ත්‍රවාදය සහ ක්‍රියාරම්භකත්වය පුළුල් කිරීමටත්, පක්ෂය තුළට වාසි තකා රිංගා ගෙන සිටින කොටස් සොයා ගැනීමට, හෙළිදරව් කිරීමට සහ පක්ෂයෙන් නෙරපා හැරීමටත් යනාදී වශයෙන් නොකඩවාම සටන් කරනු ඇත.

6. එනිසා, (''කම්කරු විරුද්ධ පාර්ශව'' කණ්ඩායම ''මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදී'' කණ්ඩායම, ආදිය වැනි) එක් හෝ තවත් පිළිවෙළක් අනුව පිහිටුවන ලද සියලුම කණ්ඩායම් කිසිම විශේෂයක් නොමැතිව විසුරුවා හරින ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරන සම්මේලනය, ඒවා වහාම විසුරුවා හරින ලෙස නියෝග කරයි. සම්මේලනයේ මෙම තීරණය අනුව කටයුතු නොකිරීමේ ප්‍රතිඵලය කොන්දේසි විරහිතව සහ අප්‍රමාදවම පක්ෂයෙන් නෙරපා හරිනු ලැබීම වනු ඇත.

7. පක්ෂයේ සහ සෝවියට් සභා සියලුම කටයුතුවලදී දැඩි ලෙස විනය ආරක්ෂා කරනු දැකීම සහ කාණ්ඩවාදය අහෝසි කිරීම සම්බන්ධයෙන් උපරිම ඒකමතිකත්වයක් ඇති කර ගැනීම පිණිස, පක්ෂ විනය උල්ලංඝනය කිරීම, නැතහොත්, කාණ්ඩවාදය යළි පණ ගැන්වීම හෝ එය ඉවසීම හෝ පිළිබඳ අවස්ථාවලදී, පක්ෂයෙන් නෙරපීම ඇතුළුව සියලුම පක්ෂ දඬුවම් ක්‍රියාත්මක කිරීමටත්, මධ්‍යම කාරක සභිකයන් සම්බන්ධයෙන් වූ කල ඔවුන් විකල්ප සාමාජික තත්ත්වයට පහත දැමීමට සහ සීමාන්ත පියවරක් වශයෙන් පක්ෂයෙන් නෙරපීමටත් සම්මේලනය බලය දෙයි. මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන්, විකල්ප සාමාජිකයන් සහ විනය කාරක සභාවේ සාමාජිකයන් විෂයෙහි එවැනි සීමාන්ත පියවරක් ක්‍රියාත්මක කිරීමේදී ඉටු කළ යුතු අවශ්‍ය කොන්දේසියක් ලෙසට මධ්‍යම කාරක සභාවේ විකල්ප සාමාජිකයන් සියලු දෙනාටම සහ විනය කාරක සභාවේ සාමාජිකයන් සියලු දෙනාටම ආරාධනා කර මධ්‍යම කාරක සභාවේ පූර්ණ රැස්වීමක් පැවැත්විය යුතුය. මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙක් විකල්ප සාමාජික තත්ත්වයට පහත දැමීම, නැතහොත්, පක්ෂයෙන් නෙරපීම අවශ්‍යයයි පක්ෂයේ වගකිව යුතු නායකයන්ගේ එවැනි මහ සභා රැස්වීමක් තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් අදහස් කරන්නේ නම්, අප්‍රමාදවම මෙම පියවර ක්‍රියාත්මක කළ යුතුය.

1923 දී ''ප්‍රොෂෙක්තොර්'' සඟරාවේ අංක 22 කලාපයෙහි ප්‍රථමයෙන් පළ කරන ලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

4

අපගේ පක්ෂය තුළ දක්නට ලැබෙන සම්මේලවාදී සහ අරාජිකවාදී අපගමනය ගැන රු. කො. ප. දහවැනි සම්මේලනයේ ප්‍රාථමික කෙටුම්පත් යෝජනාව

1. අපගේ පක්ෂය තුළ සම්මේලවාදී සහ අරාජිකවාදී අපගමනයක් ඇති බව පසුගිය මාස කීපය තුළ නිශ්චිත වශයෙන්ම හෙළිදරව් වී තිබේ. එනිසා දෘෂ්ටිමය අරගලයක් කිරීමේ සහ පක්ෂය පිරිසිදු කිරීමේ හා එහි සෞඛ්‍යය ප්‍රකෘතිමත් කිරීමේ ඉතාමත් දැඩි පියවරයන් ගැනීම අවශ්‍යව තිබේ.

2. එම අපගමනයට හේතු වී තිබෙන්නේ ඉහතදී මෙන්ෂෙවික්වරුන් වූ අය සහ කොමියුනිස්ට්වාදී ලෝකාවබෝධය තවමත් සම්පූර්ණයෙන් ග්‍රහණය නොකළ කම්කරුවන් හා ගොවීන් පක්ෂය තුළට ඇදී ඒමය. එසේ වුවත්, මෙම අපගමනයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ අප රටේ ඉතාමත් බලවත්ව පවතින, සහ අරාජිකවාදය දෙසට අනිවාරණීය වශයෙන්ම නැඹුරු වන්නා වූද, අස්වනු පාළුවෙහි හා යුද්ධයේ විනාශකාරී විපාකවල ප්‍රතිඵලයක් ලෙසට ජනතාවගේ ජීවන තත්ත්වයන් බොහෝ සෙයින් පිරිහී පවතින විට සහ වහාම නිත්‍ය ජීවනෝපායයක් සොයා ගැනීමට නොහැකි තත්ත්වයට පත්වන සේ ගොවි ජනයා හා කම්කරුවන් ලක්ෂ ගණන් මුද හරිමින් දශ ලක්ෂ සංඛ්‍යාත භටයන් සහිත යුද්ධ හමුද විසුරුවා හරින විට විශේෂයෙන්ම අරාජිකවාදය වෙත එසේ නැඹුරු වන්නා වූද, සුළු ධනපති කොටස් නිර්ධන පංතිය හා රුසියානු කොමියුනිස්ට් පක්ෂය කෙරෙහි පාන බලයය.

3. මෙම අපගමනය න්‍යායික වශයෙන් ඉතාමත් අංග සම්පූර්ණ ලෙස හා පැහැදිලි ලෙස විස්තර කරන ප්‍රකාශනය (නැතහොත්, මෙම අපගමනයේ ඉතාමත් අංග සම්පූර්ණ ආදී වූ ප්‍රකාශනවලින් එකක්) ඊනියා ''කම්කරු විරුද්ධ පාර්ශවයේ''ප්‍රවාද සහ වෙනත් සාහිත්‍යික නිර්මාණයන් වන්නේය. මෙම කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් ප්‍රවාදය මේ බව පෙන්වීමට ප්‍රමාණවත් නිදර්ශනයකි: ''ජාතික ආර්ථිකයේ පාලනය සංවිධානය කිරීම යනු, කාර්මික වෘත්තීය සංගම්වලට සංවිධාන වුනු සහ සමූහාණ්ඩුවේ මුළු ආර්ථිකයම පාලනය කිරීමට මධ්‍යම මණ්ඩලයක් තෝරා පත් කළ යුතු සමස්ත රුසියා නිෂ්පාදකයන්ගේ සම්මේලනයක වන්නේය.''

මෙම සහ නිමක් නැති එවැනි ප්‍රකාශයන් පත්ලෙහි ඇති අදහස් න්‍යායික වශයෙන් වැරදිය. එමෙන්ම, ඒවායින් නියෝජනය වන්නේ මාක්ස්වාදය

සහ කොමියුනිස්ට්වාදය කෙරෙන්ද, සියලුම අර්ධ නිර්ධන පංති විප්ලවවල හා වර්තමාන නිර්ධන පංති විප්ලවයේ ප්‍රායෝගික අත්දැකීම් කෙරෙන්ද බිඳී වෙන් වීමකි.

ප්‍රථමයෙන්ම, ''නිෂ්පාදකයා'' යන සංකල්පය ඉදිරිපත් කිරීමෙන් නිර්ධන පංතිකයන් සමග අර්ධ නිර්ධන පංතිකයන් හා සුළු වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයන්ද එකට සම්බන්ධ කරන අතර, එමගින් පංති අරගලය පිළිබඳ මූලික සංකල්පයෙන් සහ පංති අතර වෙනස පැහැදිලි ලෙස වටහා ගත යුතුය යන මූලික ඉල්ලීමෙන්ද සම්පූර්ණයෙන්ම ඈත් වීමක් සිදු වේ.

දෙවැනිව, පාක්ෂික නොවන පොදු ජනතාව දිනා ගැනීමට, නැතහොත්, පිණවීමට දරනු ලබන, ඉහත උපුටා දක්වූ ප්‍රවාදයෙන් ප්‍රකාශිත ප්‍රයත්නයද එසේම මාක්ස්වාදයෙන් මූලික වශයෙන් ඈත් වීමක් වන්නේය.

වැඩ කරන ජනතා සමූහයාගේ අනිවාරණීය සුළු ධනපති චපලකම්වලටත්, නිර්ධන පංතිය අතර වන නොවැලැක්විය හැකි සම්ප්‍රදයයන්ට හා ශිල්පීය සංගම්, නැතහොත්, ශිල්පීය පටු අදහස්වලටත් විරුද්ධව නැගී සිටීමෙහිද, මුළු නිර්ධන පංතියෙහි සහ එමගින් මුළු වැඩ කරන ජනතා සමූහයෙහිත් එක්සත් කටයුතු සියල්ලම මෙහෙයවීමෙහි, එනම්, ඒවාට දේශපාලන නායකත්වය දීමෙහිද, සමත් එකම පිරිස වන නිර්ධන පංතියේ සහ මුළු වැඩ කරන පොදු ජනතා සමූහයේම පෙරමුණු බල ඇණිය එක්සත් කිරීමේ, එය පුහුණු කිරීමේ සහ සංවිධානය කිරීමේ හැකියාව ඇත්තේ කම්කරු පංතියේ දේශපාලන පක්ෂයට, එනම්, කොමියුනිස්ට් පක්ෂයට පමණක් බව මාක්ස්වාදය උගන්වයි. නිර්ධන පංතියේ දේශපාලන පක්ෂයේ කාර්ය භාරය ගැන වූ කොමින්ටර්නයේ දෙවැනි (1920) සම්මේලනයේ තීරණ මගින් මුළු කොමියුනිස්ට් ජාත්‍යන්තරයම මෙම ප්‍රතිපත්තිය අනුමත කර තිබේ. එපමණක් නොව, අපගේ විප්ලවයේ ව්‍යවහාරයෙන්ද එය සනාථ වී තිබේ. මෙම පිළිවෙත නොරකින තැන නිර්ධන පංති ආඥාදායකත්වයක් කිසිසේත් තිබිය හැකි නොවේ.

පාක්ෂික නොවන නිර්ධන පංතිය සම්බන්ධයෙන් කොමියුනිස්ට් පක්ෂය ඉටු කළ යුතු කාර්ය කොටසත්, මුළු මහත් වැඩ කරන ජනතා සමූහයා සමග මෙම පළමුවැනි හා දෙවැනි සාධක්යන්ගේ සම්බන්ධය විෂයෙහි එයින් ඉටු විය යුතු කාර්ය කොටසක් වරදවා වටහා ගැනීම කොමියුනිස්ට්වාදයෙන් න්‍යායික වශයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වීමක් සහ සම්මේලවාදය හා අරාජිකවාදය දෙසට අපගමනයෙහි යෙදීමක්ද වන්නේය. ''කම්කරු විරුද්ධ පාර්ශවයේ'' අදහස් සියල්ලක්ම තුළ මෙම අපගමනය පැතිර තිබේ.

4. ඉහත සඳහන් කණ්ඩායම සහ අනෙකුත් පුද්ගලයන්, වෘත්තීය සමිතිවල කාර්ය භාරය ගැන කරුණු සඳහන් කෙරෙන රුසියානු කොමියු-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළෙහි ආර්ථිකය පිළිබඳ කොටසෙහි 5 වැනි ඡේදය ගැන සඳහන් කරමින් තමන්ගේ වැරදි අදහස් රැකීමට දරන ප්‍රයත්න සියල්ලද සම්පූර්ණයෙන්ම වැරදිය යනු තමන් අදහස් කරන බව රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ දහවැනි සම්මේලනය ප්‍රකාශ කරයි. "මුළු ජාතික ආර්ථිකයම සම්පූර්ණ වශයෙන්ම පාලනය කිරීම, තනි ඒකකයක් ලෙසට ගනිමින්, එය තමන් අතෙහි යථාර්ථ වශයෙන් සංකේන්ද්‍රණය කර ගැනීමේ තත්ත්වයට වෘත්තීය සමිති කල්යාමේදී එළඹිය යුතු" බවද, ඒවා මේ ආකාරයෙන් කටයුතු කිරීමෙන්, පොදු ජනතාවන් "ආර්ථික කළමනාකාරිත්වයට කෙළින්ම අනුකර්ෂණය කර ගැනීමෙන් මධ්‍යම රාජ්‍ය පාලනයත්, ජාතික ආර්ථිකයත්, වැඩ කරන පුළුල් ජනතාවත්, අතර නොමැකෙන සම්බන්ධකම් ඇති වීම සහතික කරනු" ඇති බවද මෙම ඡේදයෙන් ප්‍රකාශිත වේ.

වෘත්තීය සමිති "කල් යාමේදී එළඹිය යුතු" තත්ත්වයෙහි පූර්වාවශ්‍යතාවයක් වන්නේ, ඒවා "පටු ශිල්පීය සංගම් ජීවගුණයෙන් වැඩි වශයෙන් නිදහස් වී" වැඩ කරන ජනතා බහුතරය, "කල් යාමේදී එම ජනතාව සියලු දෙනාම" ආලිංගනය කර ගැනීමට යොමු වන ක්‍රියාමාර්ගය බව, රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළෙහි මෙම ඡේදයෙන් කියවේ.

අවසාන වශයෙන්, "රු. ස. ඒ. සෝ. ස. නීති සහ පිළිගත් ව්‍යවහාරය අනුව, වෘත්තීය සමිති සියලුම ප්‍රාදේශීය සහ මධ්‍යම කාර්මික කළමනාකාර ආයතනවලට සහභාගි වෙති" යි රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළෙහි එන මෙම ඡේදයෙහි අවධාරණය කෙරේ.

පරිපාලනයට සහභාගි වීමේ ප්‍රායෝගික අත්දැකීම් ගැන අධ්‍යයනය කරනු වෙනුවට සහ එහිදී ලැබූ ජයග්‍රහණ හා නිවැරදි කර ගත් වැරදි තරයේ සැලකිල්ලට ගනිමින් මෙම අත්දැකීම් සංවර්ධනය කර ගනු වෙනුවට, සම්මේලවාදීහු සහ අරාජිකවාදීහු ආර්ථික කළමනාකාර ආයතන "තෝරා පත් කිරීමට" "නිෂ්පාදකයින්ගේ සම්මේලන, නැතහොත්,සම්මේලනයක්" සඳහා වූ ක්ෂණික සටන් පාඨයක් ඉදිරිපත් කරති. මේ අනුව බලන කල, නිර්ධන පංතියේ වෘත්තීය සමිති විෂයෙහි පක්ෂයෙන් ඉටු විය යුතු නායක, අධ්‍යාපනික සහ සංවිධානාත්මක කාර්ය භාරය සහ එම වෘත්තීය සමිතිවලින් අර්ධ සුළු ධනපති සහ සම්පූර්ණයෙන්ම සුළු ධනපති පවා වන පොදු ජන කොටස් විෂයෙහි ඉටු විය යුතු එම කාර්ය කොටස සම්පූර්ණයෙන්ම මඟ හැර සහ බැහැරකර තිබේ. එමෙන්ම සෝවියට් රජය දැනටමත් ආරම්භ කර ඇති නව ආර්ථික ආකෘති ගොඩ නැගීමේ ප්‍රායෝගික වැඩ කටයුතු දිගටම ගෙන යමින් ඒවා නිවැරදි කිරීම වෙනුවට අප වෙත ඉදිරිපත් කෙරෙන්නේ එම කටයුතු කඩාකප්පල් කිරීමය. එහි ප්‍රතිඵලය විය හැක්කේ ධනපති ප්‍රතිවිප්ලවයේ ජයග්‍රහණය පමණකි.

5. න්‍යායික මිථ්‍යාවන්ට සහ සෝවියට් ආණ්ඩුව දැනටමත් අරඹා තිබෙන ආර්ථික සංවිධානයේ ප්‍රායෝගික අත්දැකීම් කෙරෙහි දක්වන සම්පූර්ණයෙන්ම වැරදි ආකල්පයට අමතරව, මෙම සහ එවැනි කණ්ඩායම්වල හා පුද්ගලයන්ගේ අදහස්වල බරපතල දේශපාලන වරදක් ඇති බව හා ඒවා නිර්ධන පංති ඇඳෑදයකත්වයේ හුදු පැවැත්මම වෙත එල්ල වුනු අනතුරක් වන බව රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ සම්මේලනය දකියි.

රුසියාව වැනි රටක ඇති සුළු ධනපති ජන කොටසෙහි මහා විශාලත්වය සහ යුද්ධයේ අනිවාරණීය ප්‍රතිඵලයක් වන දරුණු විනාශය, දරිද්‍රතාවය, වසංගත, අස්වනු පාළුව, අන්ත අගහිඟකම සහ දුක් කම් කටුලු නිසා සුළු ධනපති සහ අර්ධ නිර්ධන පංති පොදු ජනතාව අතර ඉතාමත් තියුණු වැනෙන සුලු භාවයක් ඇති වීමට හේතු වේ. පළමුව පොදු ජනතාව සහ නිර්ධන පංතිය අතර සන්ධානය ශක්තිමත් කිරීම දිසාවටද,නැවත ධනපති පුනරුත්ථාපනයක් දිසාවටද ඔවුහු නැඹුරු වෙති. නිර්ධන පංතියේ විප්ලවවාදී පෙරමුණු බල ඇණියෙහි සමගිය, ශක්තිය හා බලපෑම යම්තම්න් හෝ දුර්වල වන්නේනම්, මෙම චපලකම්වල එකම ප්‍රතිඵලය විය හැක්කේ ධනපතියන්ගේ බලය හා දේපළ යළිත් ඔවුන්ට ලැබීම බව දහ අටවැනි, දහනවවැනි සහ විසිවැනි ශත වර්ෂවල සියලු විප්ලවවල අත්දැකීම්වලින් ඉතාමත් පැහැදිලි ලෙස හා කිසිසෙත් ප්‍රතික්ෂේප කළ නොහැකි ලෙස පෙන්නුම් කෙරේ.

එනිසා "කම්කරු විරුද්ධ පාර්ශවයේ" සහ එවැනි සිතුවිලි ඇති කොටස්වල අදහස්වල වරද, ඒවා න්‍යායික වශයෙන් සදොස් වීම පමණක් නොවේ. ඒවායින් ව්‍යවහාරික වශයෙන් සුළු ධනපති සහ අරාජිකවාදී වැනෙන සුලු භාවයද ප්‍රකාශිත වේ. ඒ අනුව, කොමියුනිස්ට් පක්ෂයේ නායික ක්‍රියා මාර්ගයේ සසංගත බව දුර්වල කරන එම අදහස්, නිර්ධන පංති විප්ලවයේ පංති සතුරන්ට දෙන ආධාරයකි.

6. මේ සියල්ල ගැන සැලකිල්ලට ගත් රු. කො. ප. සම්මේලනය, එම අදහස්වලින් ප්‍රකාශ වන්නේ සම්මේලවාදී සහ අරාජිකවාදී අපගමනයක් බව පිළිගෙන —

පළමුව, මෙම අදහස්වලට විරුද්ධව දැඩි සහ ක්‍රමානුකූල අරගලයක් කිරීමත්;

දෙවැනිව, මෙම අදහස් ප්‍රචාරය කිරීම රු. කො. ප. සාමාජිකත්වය සමග නොගැලපෙන බව පිළිගැනීමත් අවශ්‍ය යයි අදහස් කරයි.

සම්මේලනය, මෙම තීරණ තරයේ ක්‍රියාත්මක කරන ලෙස පක්ෂයේ මධ්‍යම කාරක සභාවට (හා පක්ෂයට) නියම කරන අතර, මෙහි සඳහන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෙරුණු ප්‍රශ්න සියල්ලම හා සම්බන්ධයෙන් පක්ෂ සාමාජිකයින් අතර ඉතාමත් විස්තරාත්මක ලෙස අදහස් හුවමාරු කර ගැනීම සඳහා විශේෂ ප්‍රකාශන, ලිපි සංග්‍රහ ආදිය මගින් ඉඩකඩ සලසා ගත හැකි හා ගත යුතු බවද පෙන්නුම් කරයි.

1963 දී ''රු. කො. (බො.) ප. දහවැනි සම්මේලනය, 1921 මාර්තු 8-16. සම්පූර්ණ වාර්තාව'' නමැති පොතෙහි ප්‍රථමයෙන් සම්පූර්ණ ලෙස පළ කරන ලදී.

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, පස්වැනි මුද්‍රණය, වෙළුම 43, පිටු 3-6, 57-73 89-92, 93 97

ද්‍රව්‍ය බද්ද

(නව ප්‍රතිපත්තියෙහි වැදගත්කම සහ එයට අදාළ කොන්දේසි)

හැඳින්වීමක් වෙනුවට

ද්‍රව්‍ය බද්ද පිළිබඳ ප්‍රශ්නය දැන් ඉමහත් අවධානයට ලක්වන සහ බොහෝ සාකච්ඡාවලට සහ තර්කවලට හේතුවන ප්‍රශ්නයකි. මෙය ස්වභාවිකය. මන්දයත්, වර්තමාන තත්ත්වයන් යටතේ එය ඇත්ත වශයෙන් ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න අතුරෙන් එකක් වන හෙයිනි.

සාකච්ඡාව එක්තරා දුරකට අපිළිවෙළය. පැහැදිලි හේතු නිසා, එයට අපි සියලු දෙනාම වැරදිකරුවෝ වෙමු. එනිසා මෙම ප්‍රශ්නයේ ''කාලෝචිතභාවය'' පිළිබඳ අංශයෙන් නොව, පොදු ප්‍රතිපත්තියේ අංශයෙන් එය වෙත සමීප වීම හැම අතින්ම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. වෙනත් වචනවලින් කියතොත්, දැන් අප වර්තමාන ප්‍රතිපත්තියේ නිශ්චිත ප්‍රායෝගික පියවරයන් දක්වන රටාව සටහන් කර ඇඳිමින් සිටින පින්තූරයේ පොදු හා මූලික පිටු තලය පරීක්ෂා කර බැලීම ප්‍රයෝජනවත් වනු ඇත.

මෙය කිරීමේ ප්‍රයත්නයක් දරනු පිණිස, මගේ ''අපගේ කාලයේ ප්‍රධාන කර්තව්‍යයන්. — 'වාමාංශික' ළමා ගතිය සහ සුළු ධනපති චිත්ත ස්වභාවය'' යන පොතෙන් දීර්ඝ කොටසක් උපුටා දැක්වීමේ අවස්ථාව ගන්නෙමි. 1918 දී පෙත්‍රොග්‍රෑඩයේ කම්කරු සහ සොල්දාදු නියෝජිත සෝවියට් සභාව විසින් පළ කරන ලද එහි, පළමුව බ්‍රෙස්ට් සාමය ගැන වූ 1918 මාර්තු 11 දින සහිත පුවත්පත් ලිපියක්ද, දෙවැනිව, එවකට පැවති වාම කොමියුනිස්ට්වාදී කණ්ඩායමට[66] විරුද්ධව මා ලියූ 1918 මැයි 5 දින සහිත විවාදාත්මක ලිපියද අන්තර්ගත විය. විවාදාත්මක ලිපිය මෙහිදී අවශ්‍ය නොවන හෙයින් එය අත් හරිමි. එයින් ''රාජ්‍ය ධනපති ක්‍රමය'' ගැන සහ ධනපති ක්‍රමයේ සිට සමාජවාදී ක්‍රමයට පරිවර්තනය වීමේ ආකෘතියක් වන අපගේ වර්තමාන ආර්ථිකයේ ප්‍රධාන මූලිකාංගයන් ගැන සාකච්ඡාවට අදාළ කොටස් පමණක් මෙහි ඇතුළත් කරමි.

මම එම අවස්ථාවේදී මෙසේ ලිව්වෙමි:

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

රුසියාවේ වර්තමාන ආර්ථිකය

(1918 පොතෙන් උධෘතය*)

"... අපගේ සෝවියට් සමූහාණ්ඩුවේ දැන් පවතින තත්ත්වය අනුව රාජ්‍ය ධනපති ක්‍රමය ඉදිරි පියවරක් වනු ඇත. සය මසක පමණ කාලයකින් අපගේ සමූහාණ්ඩුව තුළ රාජ්‍ය ධනපති ක්‍රමය ස්ථාපිත වේනම් එය විශාල ජයග්‍රහණයක් වනු ඇත. එවිට අවුරුද්දක් ඇතුළත සමාජවාදය තදින් මුල් අල්ලන බවට හා එය අප රටේ අනභිභවනීයත්වයට පත්වන බවට එම රාජ්‍ය ධනපති සහතිකයක් වනු ඇත.

සමහර අය මෙම වචනවලින් ඉවතට හැරෙනු ඇත්තේ මොන තරම් උත්තම උදහසකින්ද යනු මට සිතා ගත හැකිය... හැබැටම! සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව තුළ රාජ්‍ය ධනපති ක්‍රමය දිසාව බලා කෙරෙන පරිවර්තනය ඉදිරි පියවරක් වනු ඇත?.. මෙය සමාජවාදයට ද්‍රෝහි වීමක් නොවේද?

අපි මෙම කරුණු ගැන වඩාත් විස්තර සහිතව සලකා බැලිය යුත්තෙමු.

ප්‍රථමයෙන්ම, අපගේ රට සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවක් යනුවෙන් හැඳින්වීමට අපට අයිතිය සහ හේතු සාධක සපයන්නා වූ ධනපති ක්‍රමයෙන් සමාජවාදී ක්‍රමය කරා සිදුවන පරිවර්තනයේ ස්වභාවය ගැන අපි පරීක්ෂා කළ යුත්තෙමු.

දෙවැනිව, අප රටේ සමාජවාදයේ ප්‍රධාන සතුරා ලෙසට සුළු ධනපති ආර්ථික තත්ත්වයන් සහ සුළු ධනපති ගති ලක්ෂණය හැඳින නොගන්නා අයගේ වරද හෙළිදරව් කිරීමට අපි ක්‍රියා කළ යුත්තෙමු.

තුන්වැනිව, අපි සෝවියට් රාජ්‍යයත්, ධනපති රාජ්‍යයත් අතර ඇති වෙනසෙහි ආර්ථික අර්ථය සම්පූර්ණයෙන්ම වටහා ගත යුත්තෙමු.

අපි මෙම කරුණු තුන පරීක්ෂා කළ බලමු.

රුසියාවේ ආර්ථික ක්‍රමය ගැන අධ්‍යයනය කිරීමේදී එහි පරිවර්තනීය ස්වභාවය නොපිළිගෙන ප්‍රතික්ෂේප කළ කෙනෙක් නැතැයි මම අදහස් කරමි. එසේම, "සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව" යන පාඨයෙන් අදහස් වන්නේ සමාජවාදය කරා පරිවර්තනය වීමට සෝවියට් බලයේ ඇති අධිෂ්ඨානය මිස පවතින නව ආර්ථික ක්‍රමය සමාජවාදය ලෙස පිළිගැනීමක් නොවන බව කිසිම කොමියුනිස්ට්වාදියෙක් ප්‍රතික්ෂේප කර නැතැයිද සිතමි.

නමුත්, "පරිවර්තනය" යන වචනයේ අර්ථය කුමක්ද? ආර්ථිකයට ගලපන ලද කල මෙයින් අදහස් කෙරෙන්නේ ධනපති ක්‍රමය සහ සමාජවාදය යන දෙකෙහිම ගති ලක්ෂණ, අංශු හෝ කැබලි වර්තමාන ක්‍රමයෙහි තිබෙන බවක්ද? ඒ එසේය යන්න ගැන කවුරුත් එකඟ වනු ඇත. එහෙත්, වර්තමාන අවස්ථාවේ රුසියාවේ පවතින විවිධ සමාජ-ආර්ථික ව්‍යුහයන් සමන්විත වන්නේ කුමණ මූලිකාංගයන්ගෙන්ද යන්න ගැන සලකා බැලීමට තරම් කරදර වන්නේ, ඉහත කරුණ පිළිගන්නා සෑම කෙනෙක්ම නොවේ. ප්‍රශ්නයේ අරටු කොටස එයයි.

අපි මෙම මූලිකාංගයන් නම් කරමු:

1) පීතෘ මූලික, එනම්, බොහෝ දුරට ස්වාභාවික ගොවිජන ගොවිතැන;

2) කුඩා පරිමාණ වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය (තමන්ගේ ධාන්‍ය විකුණන ගොවි ජනයා බහුතරය මෙයට ඇතුළත්ය);

3) පෞද්ගලික ධනපති ක්‍රමය;

4) රාජ්‍ය ධනපති ක්‍රමය;

5) සමාජවාදය.

රුසියාව කොතරම් විශාලද හා විවිධද යත්, මෙම නොයෙක් වර්ගයේ සමාජ-ආර්ථික ව්‍යුහයන් සියල්ලම එකට පැටලී පවතී. වර්තමාන තත්ත්වයේ විශේෂ අංග ලක්ෂණය සැදෙන්නේ එයිනි.

මෙම ප්‍රශ්නය පැන නගින්නේය: ප්‍රබල වන්නේ කුමණ මූලිකාංගයන්ද? කුඩා ගොවි ජන රටක ඉඩම් ගොවිතැන් කරන අති බහුතරයක් ජනකාය සුළු වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයන් වන නිසා සුළු ධනපති මූලිකාංගය ප්‍රබල වන බව හා එවැන්නක් නොවිය නොහැකි බව පැහැදිලිය. රාජ්‍ය ධනපති ක්‍රමයේ කටුව (ධාන්‍ය ඒකාධිකාරය, රජයේ පාලනයට යටත් ව්‍යවසායිකයන් හා වෙළෙඳුන්, ධනපති සමූපකාරකයන්) වරෙක එක තැනෙකින් සහ වරෙක තවත් තැනෙකින් ලාභ ගරන්නන් විසින් සිදුරු කරනු ලැබේ. ලාභ ගැරීමේ ප්‍රධාන භාණ්ඩය වී තිබෙන්නේ ධාන්‍යය.

ප්‍රධාන අරගලය කරනු ලබන්නේ මෙම ක්ෂේත්‍රයෙහිය. "රාජ්‍ය ධනපති ක්‍රමය" වැනි ආර්ථික ප්‍රවර්ගයන් ගැන කථා කරන්නෙමු නම්, මෙම අරගලය සිදු වන්නේ කුමණ මූලිකාංගයන් අත්රද? එම අරගලය සිදු වන්නේ මා ඒවා නම් කර ඇති පිළිවෙළ අනුව හතරවැනි සහ පස්වැනි මූලිකාංගයන් අතරද? ඇත්තෙන්ම නැත. සමාජවාදයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කර තිබෙන්නේ රාජ්‍ය ධනපති ක්‍රමය නොවේ. එසේ කර තිබෙන්නේ රාජ්‍ය ධනපති ක්‍රමයටත් සමාජවාදයටත් යන දෙකටම විරුද්ධව එක්ව සටන් කරන සුළු ධනපති සහ පුද්ගලික ධනපති ක්‍රමයය. රාජ්‍ය ධනපති ක්‍රමයේ වේවා, රාජ්‍ය සමාජවාදී ක්‍රමයේ වේවා සෑම වර්ගයකම රාජ්‍ය ඇඟිලි ගැසීමකට, ගිණුම් තැබීමකට හා පාලනයකට සුළු ධනපතියෝ

---

* ලෙනින් 1918 පොතෙන් මෙම ලිපියෙහි ඇතුළත් කිරීම සඳහා කොටස උපුටා ගැනීමේදී එහි සංස්කරන වෙනස් කිරීම් රැසක් කළේය. — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විරුද්ධ වෙති. මෙය කිසිසේත් නැතැයි කිව නොහැකි යථාර්ථ කරුණකි. ආර්ථික වැරදි රැසකට මුල එය වරදවා වටහා ගැනීමය. අපගේ ''අභ්‍යන්තර'' සතුරන් වන්නේ, සෝවියට් බලයේ ආර්ථික පියවරයන්ට සතුරු වන්නේ ලාභ ගරන්නා, වානිජ වංචාකාරයා සහ ඒකාධිකාරය කඩාකප්පල් කරන්නා යන මොවුන්ය. ''තෝරාගත්'' කීප දෙනෙකු මරා දැමීමෙන් සහ ගිගුරුම් හඬ දෙමින් කළ චතුර කථා මගින් ලාභ ගරන්නා මර්දනය කිරීමට එකසිය විසිපස් වසරකට පෙර ප්‍රයත්න දරූ ඉතාමත් භක්තිමත් සහ අවංක විප්ලවවාදීන් වූ ප්‍රංශ සුළු ධනපතියන්ට සමාව දිය හැකි වන්නට තිබුණි. එසේ වුවත් අද මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් සමහර වාම සමාජවාදී-විප්ලවවාදීන්[67] දක්වන පිරිසිදුම ප්‍රංශ ආකල්පය නිසා දේශපාලන විඥානය ඇති සෑම විප්ලවවාදියෙක්ම තුළ පැන නගිනු ඇත්තේ අප්‍රසාදය හා පිළිකුළ මිස අන් කිසිවක් නොවේ. ලාභ ගැරීමට පදනම වන්නේ රුසියාවේ සෑම තන්හිම බහුල වශයෙන් පැතිරී සිටින සුළු දේපළ හිමියන් සහ සෑම සුළු ධනපතියෙක්ම ඒජන්තවරයෙක් කොට ගත් පුද්ගලික ධනපති ක්‍රමය යන දෙකොටසම බව අපි ඉතා හොඳින් දනිමු. මෙම සුළු ධනපති බූවල්ලා උගේ දශ ලක්ෂ සංඛ්‍යාත අඬුවලින් වරින් වර කම්කරු කොටස් වටලා ගනු ලබන බවත්, රාජ්‍ය ඒකාධිකාරය වෙනුවට ලාභ ගැරීම අපගේ සමාජ හා ආර්ථික ජීවේන්ද්‍රියෙහි සෑම රෝම කූපයක් තුළටම කාවදින බවත් අපි දන්නෙමු.

මෙය නොදක්නාවුන් සුළු ධනපති පූර්ව මතියේ වහළුන් වී සිටින බව ඔවුන්ගේ අන්ධකමෙන් පෙනේ...

යුද්ධ කාලයේදී ''අවංක'', විශේෂයෙන්ම වංක මාර්ගයෙන් සුළු ධනපතියෝ දෙතුන් දහසින් මුදල් ඉතිරි කර ගෙන සිටිති. ඔවුහු ලාභ ගරන සහ පෞද්ගලික ධනපති ක්‍රමයේ පදනම වශයෙන් ප්‍රයෝජනවත් වන ආර්ථික ප්‍රවර්ගයේ ලක්ෂණ ඇති පිරිස් වෙති. මුදල යනු එය හිමියාට සමාජ වස්තුව ලබා ගැනීමට දෙන සහතිකයකි. කෝටි සංඛ්‍යාත සුළු දේපළ හිමියෝ මෙම සහතිකය කෙරෙහි එල්බ ගෙන එය ''රාජ්‍යයෙන්'' වසං කරති. සමාජවාදය හෝ කොමියුනිස්ට් ක්‍රමය හෝ ගැන විශ්වාසයක් නොතබන ඔවුහු, නිර්ධන පංති කුණාටුව හමා යන තෙක් කල් බලති. එක්කෝ අපි සුළු ධනපතියන් අපගේ ගිණුම් තැබීමට හා පාලනයට යටත් කළ යුත්තෙමු. (දේශපාලන විඥානය ඇති නිර්ධන පංති පෙරමුණ වටා දුප්පතුන්, එනම් අර්ධ නිර්ධන පංතිකයන්, නැතහොත්, ජනගහනයෙන් බහුතරය සංවිධානය කරන්නෙමු නම්, අපට මෙය කළ හැකිය). එසේ නැතහොත්, මෙම සුළු දේපළ හිමිකම නැමති භූමියෙන්ම පැන නැගුනු නැපෝලියන්ලා සහ කවෙනාාක්ලා විසින් විප්ලවය පෙරළා දමන ලද මෙන්ම, ස්ථිරවම සහ අනිවාරණීය වශයෙන්ම, සුළු ධනේශ්වරයන් අපගේ කම්කරු බලය පෙරළා දමනු ඇත. ප්‍රශ්නය හා සම්බන්ධයෙන් අපට ඇති කර ගත හැකි එකම අදහස එයය...

තම දහස් ගණනක මුදල රැස්කර තබා ගන්නා සුළු ධනපතියා රාජ්‍ය ධනපති ක්‍රමයේ සතුරෙකි. ඔහුට අවශ්‍ය වී තිබෙන්නේ තමන්ම සඳහා, දුප්පතුන්ට විරුද්ධව, මොනම වර්ගයක හෝ රාජ්‍ය පාලනයට විරුද්ධව තමන්ගේ දහස් ගණනක මුදල යෙදීමටය. මෙම දහස් ගණන්වල මුළු එකතුවෙන් සැදෙන කෝටි සිය ගණනක මුදල අපගේ සමාජවාදය ගොඩනැගීමේ කටයුතු දුර්වල කරන ලාභ ගැරීමේ පදනම වන්නේය. කිසියම් කම්කරුවන් සංඛ්‍යාවක් දින කීපයක් තුළදී 1000 ක වටිනා කම් නිපදවතියි සිතමු. සුළු ලාභ ගැරීමේ සහ විවිධ වංචා නිසාද, සුළු දේපළ හිමියන් සෝවියට් ආඥා සහ රෙගුලාසි මග හැරීම නිසාද මෙම 1000 න් 200 ක් අතුරුදහන් වෙතැයිද සිතමු. 1000 න් 300 ක් වැය කර වඩාත් හොඳ සංවිධානයක් ඇති කර ගත හැකි නම්, 200 වෙනුවට තමන් කැමැත්තෙන්ම 300 ක් දෙන බව දේශපාලන විඥානය ඇති සෑම කම්කරුවෙක්ම කියනු ඇත. මක්නිසාදයත්, පසුව, ක්‍රමානුකූලතාවය සහ සංවිධානය තහවුරු කළ පසු, සුළු ධනපතියන් විසින් රාජ්‍ය ඒකාධිකාරය කඩා කප්පල් කරනු ලැබීම පරාජය කළ පසු, මෙම කප්පම 100 ක් හෝ 50 ක් හෝ දක්වා අඩු කිරීම අපහසු නොවන හෙයිනි.

සම්පූර්ණ පැහැදිලිතාවය තකා මා උවමනාවෙන්ම අන්තය දක්වා සරල කළ මෙම සංඛ්‍යාමය නිදර්ශනයෙන් රාජ්‍ය ධනපති ක්‍රමය සහ සමාජවාදය අතර වර්තමාන සහ සම්බන්ධය පැහැදිලි වේ. කම්කරුවන්ට රාජ්‍ය බලය හිමිව තිබෙන නිසා, සමාජවාදී අරමුණු සඳහා හැර වෙනත් කිසිවක් සඳහා කොපෙක් එකක් හෝ නොදී මුළු දහසම ''ගැනීමේ'' සෑම නීතිමය අවස්ථාවක්ම ඔවුනට ඇත. ඇත්ත වශයෙන්ම බලය කම්කරුවන් අතට පත්වීම මත රැඳී පවතින මෙම අවකාශය සමාජවාදයේ මූලිකාංගයකි. නමුත්, සුළු දේපළ හිමි සහ පෞද්ගලික ධනපති ගති ලක්ෂණය, නොයෙක් ආකාරයෙන් මෙම නීතිමය අවකාශය හීන කරයි. එය ලාභ ගැරීම වැද්ද ගනියි. සෝවියට් ආඥාවන් ක්‍රියාත්මක කිරීමට බාධා කරයි. එනිසා අප දුන් ගෙවනවාට වඩා ගෙව්වත්, රාජ්‍ය ධනපති ක්‍රමය යෝධ ඉදිරි පියවරක් වනු ඇත. (මා උවමානවෙන්ම සංඛ්‍යාමය නිදසුනක් ගත්තේ කරුණ හොඳින් පැහැදිලි කරනු පිණිසය). එසේ කියන්නේ ''අධ්‍යාපනය'' ලැබීම කම්කරුවන්ට ප්‍රයෝජනවත් නිසා, ඒ සඳහා ගාස්තුගෙවීම පාඩුවක් නොවන හෙයිනි; අපිළිවෙළ, ආර්ථික විනාශය සහ නොසැලකිල්ල පරදවා ලබන ජයග්‍රහණය ඉතාමත් වැදගත් දෙයක් වන හෙයිනි; රාජ්‍ය ධනපති ක්‍රමයට වඩාත් බරපතල කප්පමක් ගෙව්වත් එයින් අප විනාශයට පත් නොවන අතර, එයින් ඉතාමත් විශ්වාසදයක මාර්ගයක් ඔස්සේ සමාජවාදය කරා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යාමට අපට නිසැකවම හැකි වන නමුත්, සුළු දේපළ හිමි ක්‍රමයේ අරාජිකත්වය තවදුරටත් පැවතීම ඉතාමත් විශාල අන්තරායක් හා (එය පරාජය නොකළහොත්) අපගේ ඒකාන්ත විනාශයද වන හෙයිනි. සුළු දේපළ හිමිකමේ අරාජිකත්වයට එරෙහිව රාජ්‍ය යන්ත්‍රය ආරක්ෂා කරන හැටි කම්කරු පංතිය උගෙන ගත් පසු, ජාතික පරිමාණයෙන් හා රාජ්‍ය ධනපති ක්‍රියාමාර්ගය අනුව මහා පරිමාණ නිෂ්පාදනය සංවිධානය කිරීමට එය උගෙන ගත් පසු, එයට — මෙම වචනය යෙදීම මනා නම් — තුරුම්පු සියල්ලම අත් වීමත්, සමාජවාදය තහවුරු වීමත් සහතික වනු ඇත.

ප්‍රථම කොටම, රාජ්‍ය ධනපති ක්‍රමය ආර්ථික වශයෙන් දැන් පවතින අපගේ ආර්ථික ක්‍රමයට වඩා අපරිමිත තරමින් උසස්ය.

දෙවැනිව, සෝවියට් රාජ්‍යය යනු කම්කරුවන්ගේ සහ දුප්පතුන්ගේ බලය සහතික වූ රාජ්‍යයක් වන හෙයින්, සෝවියට් බලයට එයින් සිදු වන භයානක අන්තරායක්ද නැත...

* * *

තවදුරටත් කරුණු පැහැදිලි කිරීම සඳහා, රාජ්‍ය ධනපති ක්‍රමය පිළිබඳ ඉතාමත් යථාර්ථ නිදර්ශනය ගෙන බලමු. එම නිදර්ශනය කුමක්දැයි කවුරුත් දනිති. එය නම් ජර්මනියය. යුනකර්-ධනපති අධිරාජ්‍යවාදය යටතේ වන නවීන මහා පරිමාණ ඉන්ජිනේරු කර්මාන්තය සහ සැලැස්මානුකූල සංවිධානය පිළිබඳ "පරිසමාප්ත අවස්ථාව" මෙහිදී අපට දක්නට ලැබේ. මෙහි අවධාරණය කළ වචන ඉවත් කර, යුද්ධවාදී යුන්කර්, ධනපති, අධිරාජ්‍යවාදී රාජ්‍යය වෙනුවට වෙනත් රාජ්‍යයක්, එහෙත්, වෙනත් අමුතු සමාජ වර්ගයක, වෙනත් පංති සන්ධාරයක් ඇති රාජ්‍යයක්, එනම්, සෝවියට් රාජ්‍යයක්, නිර්ධන පංති රාජ්‍යයක් යන්න යොදන්න. එවිට සමාජවාදය සඳහා අවශ්‍ය කොන්දේසිවල එකතු සමස්තය එහි අන්තර්ගතය.

නවීන විද්‍යාවේ අළුත්ම සොයා ගැනීම් පදනම් කරගත් මහා පරිමාණ ධනපති ඉන්ජිනේරු කර්මාන්ත නොමැතිව සමාජවාදය ගැන සිතන්නට නොහැකිය. නිෂ්පාදනයේ සහ බෙදා හැරීමේ අනුමත සම්මතයන් තරයේ අනුගමනය කරන තත්ත්වයෙන් කෝටි ගණන් ජනයා යොමු කර ගන්නා සැලසුම් කළ රාජ්‍ය සංවිධානයක් නොමැතිව එය ඇති වීම ගැන සිතන්නට පවා නොපුළුවන. මාක්ස්වාදීන් වන අප නිතරම මේ ගැන කථා කෙළෙමු. නමුත් මෙය පවා නොවැටහෙන (අරාජිකවාදීන් සහ වාම සමාජවාදී-විප්ලවවාදීන්ගෙන් අඩක්ම පමණ) අය සමග කථා කිරීමට තත්පර දෙකක් වුව මිඩංගු කිරීමේ ප්‍රයෝජනයක් නොමැත.

ඒ අතරම, නිර්ධන පංතිය රාජ්‍යයේ පාලකයා නොවන්නේ නම්, එම තත්ත්වය යටතේද සමාජවාදය ගැන සිතන්නට නොපුළුවන. මෙය අ

යන්න මෙන් පැහැදිලි කරුණකි. තවද, ඉතිහාසය කොතරම් අමුතු මාවතක් ගෙන ඇත්තේද යත්, (ඉතිහාසය සන්සුන් ලෙස, මෘදු ලෙස, පහසුවෙන් හා සරල ලෙස "සම්පූර්ණ" සමාජවාදය ගෙන එනු ඇතැයි යනු, පළමු පෙළේ මෙන්ෂෙවික් මොට්ටයන් හැර, අන් කිසිවෙක් කිසි කලෙකත් අපේක්ෂා නොකළේය) එය, ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයේ කටුව තුළ වන අනාගත කුකුළු පැටවුන් දෙදෙනෙකු හා සමාන වන ලෙසට එකිනෙකට අසම්බන්ධව හා එක පෙළට පවතින සේ, සමාජවාදයේ වෙනස් භාග දෙකක් 1918 දී බිහි කළේය. එක් අතකින් සමාජවාදය සඳහා අවශ්‍ය ආර්ථික, නිෂ්පාදනීය සහ සමාජ-ආර්ථික කොන්දේසිද, අනිත් අතින්, ඒ සඳහා අවශ්‍ය දේශපාලන කොන්දේසිද, ද්‍රව්‍යමය වශයෙන් ඉටුවීම පිළිබඳව 1918 දී පවතින ඉතාමත් සිත් ගන්නා ප්‍රතිමූර්තිය වී තිබෙන්නේ ජර්මනිය හා රුසියාවය.

ජර්මනියේ සාර්ථක නිර්ධන පංති විප්ලවයක් ඇති වුවහොත් වහාම හා ඉතා පහසුවෙන්ම අධිරාජ්‍යවාදයේ කටුව පොඩි කෙරෙනු ඇත (අවාසනාවකට මෙන් එය ඉස්තරම්ම වානේවලින් නිමවා ඇති හෙයින් ඕනෑම කුකුළු පැටවෙකුගේ ප්‍රයත්න මගින් බිඳිය හැක්කේ නොවේ). එවිට, නියත වශයෙන්ම, කිසිම අමාරුවක් නොමැතිව, නැතහොත්, ඉතා සුළු අමාරුවකින් ලෝක සමාජවාදයේ ජයග්‍රහණය සිදු වනු ඇත. නමුත් මෙහිදී අප "අමාරුව" යනුවෙන් අදහස් කරන්නේ පටු අමන අර්ථයෙන් නොව, ලෝක ඓතිහාසික පරිමාණයේ "දුෂ්කරතාවයන්" වේ.

ජර්මනියේ විප්ලවය "ජනිත වීම" තවමත් ප්‍රමාද වන අතර, අපගේ කර්තව්‍යය වන්නේ ජර්මන්වරුන්ගේ රාජ්‍ය ධනපති ක්‍රමය අධ්‍යයනය කිරීම, එය පිටපත් කර ගැනීමට හැකි සෑම වෙහෙසක්ම දැරීම සහ අසංස්කෘතියට විරුද්ධව සටන් කිරීම සඳහා අසංස්කෘතික විධික්‍රම යොදා ගැනීමට නොපසුබට වෙමින් අසංස්කෘතික රුසියාව විසින් බටහිර සංස්කෘතිය පිටපත් කර ගනු ලැබීම කඩිනම් කරනු සඳහා ආඥාදායක ක්‍රම යොදා ගැනීමට මැලි නොවීමය. කරේලින් ස්වභාවයේ සංකල්පනාවලින් සතුටු වන සහ ජර්මන් අධිරාජ්‍යවාදයෙන් "පාඩම් උගෙන ගැනීම" විප්ලවවාදීන් වන අපට තරම් නොවන බව කියන (මෙම මොහොතේ මට මතක් වන්නේ මධ්‍යම විධායක කාරක සභා රැස්වීමේදී කරේලින් සහ ගේ කළ කථාවන්ය) අරාජිකවාදීන් සහ වාම සමාජවාදී-විප්ලවවාදීන් සිටිත් නම්, ඔවුනට පිළිතුරු වශයෙන් අපට කිව හැක්කේ මෙය පමණකි: මේ මිනිසුන් ගැන බරපතල ලෙස ගණන් ගන්නා විප්ලවයක් නොවැලැක්විය හැකි සේ (සහ යුක්ති සහගත ලෙස) වැනසී යනු ඇත.

දැනට සුළු ධනපති ක්‍රමය රුසියාවේ ප්‍රබලව පවතින්නේය. එහි සිට රාජ්‍ය ධනපති ක්‍රමය සහ සමාජවාදය යන දෙකටම යා යුත්තේ එකම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මාර්ගයෙනි. එම මාවත වැටී ඇත්තේ "නිෂ්පාදනය සහ බෙද හැරීම පිළිබඳ ජාතික ගිණුම් තැබීම සහ පාලනය" යනුවෙන් හැඳින්වෙන අතර මහ ඇති එකම නැවතුම් පල හරහාය. මෙය වටහා නොගන්නා අය ආර්ථික ක්ෂේත්‍රයේදී කරන්නේ සමාව දිය නොහැකි වරදකි. එක්කෝ ඔවුහු ජීවිත-යේ සත්‍ය කරුණු නොදනිති; යථාර්ථ වශයෙන් පවතින දේ නොදනිති; එනිසා, එක එල්ලේම සත්‍ය දෙස බැලීමට අසමත් වෙති. නැතහොත්, ඔවුහු "ධනපති ක්‍රමය" සහ "සමාජවාදය" වියුක්ත ලෙස සංසන්දනය කිරීමෙහි යෙදෙති; එහිදී, අප රටේ සිදු වෙමින් පවතින පරිවර්තනයේ නියත ආකෘති සහ අවධි ගැන අධ්‍යයනය කිරීමට අසමත් වෙති.

"නොවය ෂිස්න්" සහ "වපිරියොද්"[68] කඳවුරේ හොඳම අය පවා නොමග යාමට හේතු වූයේ ඉඳුරාම මෙම න්‍යායික වරද නිසාම බව අමතර වශයෙන් කිව යුතුය. එම කඳවුරේ නරකම සහ සාමාන්‍ය අය ධනපති පංතිය කෙරෙහි භය පක්ෂ ගතියක් දක්වමින් එය පසු පස ඇදෙති. එයට හේතුව ඔවුන්ගේ මෝඩ ගතිය සහ කොන්ද පණ නැතිකම වන්නේය. සමාජවාදයේ ගුරුවරු ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ මුළු කාල පරිච්ඡේදයක් ගැන කියමින් නව සමාජයේ" දීර්ඝ කාලයක් පවතින පසුව වේදනා"[69] ගැන අවධාරණය කළේ හේතු රහිතව නොවන බව ඔවුනතර සිටි හොඳම අය පවා වටහා නොගත්හ. තවද, මෙම නව සමාජයද වියුක්ත සංකල්පයක් විය. එය ජනිත වූයේ එක් හෝ තවත් සමාජ වාදී රාජ්‍යයක් නිර්මාණය කිරීමට දරන ලද විවිධාකාර අඩු පාඩු සහිත සහ නියත ප්‍රයත්න මාලාවක් මගින් යාමෙන් පමණකි.

"රාජ්‍ය ධනපති ක්‍රමය දෙසට පරිනාම වීම ගැන කීමෙන් අනුන් සහ තමන්ම බිය ගැන්වීමට දරන ප්‍රයත්නය අන්ත න්‍යායික විකාරයක් වනුයේ, ධනපති ක්‍රමයට සහ සමාජවාදයට පොදු වන භූමිය (එනම්, ජාතික ගිණුම් තැබීම සහ පාලනය) පසු නොකර, දැනට මෙහි පවතින ආර්ථික තත්ත්වයේ සිට ඉදිරියට යාමට නොහැකි හෙයිනි. මෙයින් පෙනෙන්නේ යමෙක් තමන්ගේ සංකල්පනා නියම "පරිනාමයේ" මාවතෙන් බැහැර යාමට ඉඩ හරින සහ මෙම මාවත කුමක්ද යන්න වටහා ගැනීමට අසමත් වන බවය. එය ව්‍යවහාරික වශයෙන් ගත් කල, අපව සුළු දේපළ හිමි ධනපති ක්‍රමය වෙත ආපසු ඇද ගෙන යාමක් හා සමාන වන්නේය.

රාජ්‍ය ධනපති ක්‍රමය මවිසින් මෙසේ "උසස් ලෙස" අගය කරන ලද ප්‍රථම අවස්ථාව මෙය නොවන බවත්, බොල්ෂෙවික්වරු බලය අල්ලා ගැනීමට පෙර මා එසේ කළ බවත් පාඨකයාට ඒත්තු ගැන්වීම පිණිස "ළඟ එන මහා විපත හා එයට විරුද්ධව සටන් කරන හැටි" යනුවෙන් 1917 සැප්තැම්බරයේදී මා ලියූ කුඩා පොතෙන් පහත සඳහන් කොටස උපුටා දක්වමි:

"... යුන්කර්-ධනපති රාජ්‍යය වෙනුවට, ඉඩම් හිමි-ධනපති ක්‍රමය වෙනුවට, විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක්, එනම්, සියලුම වරප්‍රසාද විප්ලවවාදී ආකාරයෙන් අහෝසි කරන සහ විප්ලවවාදී ආකාරයෙන් සම්පූර්ණ තම ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට බිය නොවන රාජ්‍යයක් ආදේශ කිරීමට උත්සාහ ගන්න. නිමය වශයෙන්ම විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍ර-වාදී වන රාජ්‍යයක් ඇතොත්, රාජ්‍ය ඒකාධිකාරී ධනපති ක්‍රමයෙන් අනිවා-ර්‍යය ලෙසට හා නොවැලැක්විය හැකි ලෙසට අදහස් වන්නේ සමාජවාදය දෙසට යොමු වූ පියවරක් බව ඔබට පෙනෙනු ඇත.

"... එසේ කියන්නෙ සමාජවාදය යනු, හුදෙක්ම රාජ්‍ය ධනපති ඒකා-ධිකාරයේ සිට ඊළඟ පියවර වන හෙයිනි.

"... රාජ්‍ය-ඒකාධිකාරී ධනපති ක්‍රමය යනු සමාජවාදය සඳහා අවශ්‍ය සම්පූර්ණ ද්‍රව්‍යමය සූදනම් කිරීම වන්නේය; එය සමාජවාදයට එළඹෙන එළිපත්ත, නැතහොත්, එයත්, සමාජවාදය නැමති හිණත්, අතර අන්තර් හිණි නොමැති හිණි පෙත්ත වන්නේය" (පිටු 27 හා 28).

මෙය ලියන ලද්දේ කෙරෙන්ස්කි බලයේ සිටියදී බව සහ එහි අප සාකච්ඡා කරන්නේ නිර්ධන පංති ආඥාදායකත්වය ගැන නොව, සමාජවාදී රාජ්‍ය ගැන නොව, "විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී" රාජ්‍යය ගැන බව සටහන් කර ගන්න. අප මෙම දේශපාලන හිණි මගෙහි ඉහළට නැග සිටි තරමට, සමාජවාදී රාජ්‍යය සහ නිර්ධන පංති ආඥාදායකත්වය සෝවියට් සභා තුළ සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කළ තරමට "රාජ්‍ය ධනපති ක්‍රමය" ගැන අප අඩුවෙන් බිය විය යුතු බව පැහැදිලි නොවේද? ද්‍රව්‍යමය, ආර්ථික සහ නිෂ්පාදනීය දෘෂ්ටි කෝණය අනුව බලන කල, අප තවමත් සමාජවාදයේ "එළිපත්ත" වෙත පැමිණ නැති බව පැහැදිලි නොවේද? අප තවමත් සම්ප්‍රාප්ත වී නොමැති "එළිපත්ත" පසු නොකර සමාජවාදයේ දොරෙන් ඇතුළු විය නොහැකි බව නොපැහැදිලිද?..

* * *

මෙහි පහත දැක්වෙන කරුණද අතිශයින්ම උපදේශාත්මකය.

අප මධ්‍යම විධායක කාරක සභාවේදී බුහාරින් සහෝදරයා සමග තර්ක කළ විට ඔහු වෙනත් කරුණුද සඳහන් කරමින් ප්‍රකාශ කළේ, විශේෂඥ-යන්ට ඉහළ වැටුප් ගෙවීම හා සම්බන්ධ ප්‍රශ්නය ගැන වූ කල, යම් යම් තත්ත්වයන් යටතේ "ඔවුන් බුරුත්තම මිළට ගැනීම"[70] (නැතහොත්, ධනපතියන් සියලු දෙනාම, එනම් ඉඩම්, පැක්ටරි, වැඩ පලවල් හා වෙනත් නිෂ්පාදන මාර්ග සියල්ලම ධනපතියන්ගෙන් මිළට ගැනීම) කම්කරු පංතියට වඩාත් අවස්ථාවෝචිත වන්නේ යයි කී මාක්ස්ගේ වචන මතක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තබා ගත් ''ඔවුන්'' මෙම ක්‍රියාමාර්ගය ප්‍රතිපත්තියෙන් බැහැර වීමක් ලෙස නොසැලකූ හෙයින්, ''ඔවුන් ලෙනින්ට වඩා දක්ෂිනාංශික වූ'' බවය.

මෙය ඉතාමත් සිත් ගන්නා ප්‍රකාශයකි...

.. මාක්ස්ගේ අදහස ගැන සූපරීක්ෂාකාරී ලෙස විමසා බලන්න.

මාක්ස් සඳහන් කරන්නේ පසුගිය ශත වර්ෂයේ හැත්තෑ ගණන්වල බ්‍රිතාන්‍ය ගැනය එනම් පූර්ව ඒකාධිකාර ධනපති සංවර්ධනයේ උච්ඡ අවස්ථාව ගැනය. එකල බ්‍රිතාන්‍ය අන් සෑම රටකටම වඩා අඩුවෙන් යුද්ධවාදය සහ නිලධාරිවාදය දක්නා ලද රට විය. එවිට එය, කම්කරුවන් විසින් ධනපතියන්ගේ දේපළ ''මිළට ගනු ලැබීමේ'' අර්ථයෙන් සමාජවාදය ''සාමකාමීලෙස'' ජයග්‍රහණයට පත් වීමේ වැඩිම හැකියාව ඇති රටක් විය. එනිසා,ඇතැම් කොන්දේසි යටතේ ධනපතියන් මිළයට ගැනීමට කම්කරුවන් අත්තෙන්ම අකැමති නොවනු ඇතැයි මාක්ස් කීවේය. තමන් හෝ සමාජවාදී විප්ලවයේ අනාගත නායකයන් හෝ විප්ලවය ඇති කිරීමට අනුගමනය කළ යුතු ආකාර, මාර්ග හා මාධ්‍ය ගැන නියමයක් මාක්ස් විසින් නොකරන ලදී. අළුත් ගැටළු අති විශාල සංඛ්‍යාවක් මතු වන වගත්, විප්ලවය අතරවාරයේදී මුළු තත්ත්වයම වෙනස් විය හැකි වගත්, තත්ත්වය සහමුලින්ම සහ බොහෝ විට විප්ලවය සිදු වන විටම වෙනස් විය හැකි වගත් ඔහු මැනවින් දුන සිටියේය.

හොඳයි, සෝවියට් රුසියාව ගැන කිව හැක්කේ කුමක්ද? අඩ ශතවර්ෂයකට පෙර බ්‍රිතාන්‍යයේ සාමකාමී පරිවර්තනයකින් සමාජවාදයට සංක්‍රමණය වීම සිදු වූයේ නම් එහි ඇති විය හැකි වූ තත්ත්වයන්ට සමාන නියත කොන්දේසි මෙහි නිර්ධන පංතිය බලය අල්වා ගත් පසු හා සූරාකන්නන්ගේ ආයුධ සන්නද්ධ ප්‍රතිරෝධය හා කඩා කප්පල් කිරීම් පරාජය කළ පසු වුවද පවතින්නේද යන්න පැහැදිලි නැත. එවකට බ්‍රිතාන්‍යයේ බල පැවති පහත සඳහන් තත්ත්වයන් නිසා එහි ධනපතියන් ස්ථිරවම කම්කරුවන්ට යටත් වන්නට ඉඩ තිබුණි: 1. ගොවි ජනතාවක් නොමැති වීම නිසා (හැත්තෑ ගණන්වල බ්‍රිතාන්‍යයේ කෘෂිකාර්මික ශ්‍රමකරුවන් අතර සමාජවාදය ඉතාමත් සීඝ්‍ර ලෙස පැතිරී ඇතැයි යන බලාපොරොත්තුවක් විය) ජනගහනයෙන් අති විශාල කොටස කම්කරුවන් හා නිර්ධන පංතිකයන් විය; 2. නිර්ධන පංතිය විශිෂ්ඨ ලෙස වෘත්තීය සමිති තුළ සංවිධානය වී සිටියහ (මේ සම්බන්ධයෙන් ඒවකට ලෝකයේ ප්‍රධාන තැන ගත් රට බ්‍රිතාන්‍යය විය); 3. දේශපාලන නිදහසේ සංවර්ධනය පිළිබඳ ශතවර්ෂාධික කාලයක පුහුණුවක් ලත් නිර්ධන පංතිය තුළ සංසන්දනීය වශයෙන් උසස් සංස්කෘතික මට්ටමක් පැවැත්තේය; 4. හොඳින් සංවිධානය වී සිටි බ්‍රිතාන්‍ය ධනපතියන් අතර බල පැවැති, සම්මුති මගින් දේශපාලන සහ ආර්ථික ප්‍රශ්න බේරුම් කර ගැනීමේ පැරණි පුරුද්දක් විය. එවකට බ්‍රිතාන්‍යයේ ධනපතියෝ ලෝකයේ අන් සෑම රටකම ධනපතියන්ට වඩා හොඳින් සංවිධානය වී සිටියහ (දැන් මෙම උසස් කම ජර්මනියට මාරු වී තිබේ). බ්‍රිතාන්‍ය ධනපතියන් කම්කරුවන් විසින් සාමකාමී ලෙස යටත් කරනු ලැබිය හැකිය යන අදහස එවකට උද්ගත වීමට හේතු වූයේ මෙම කරුණුය.

අප රට තුළ වර්තමාන අවස්ථාවේදී බල පවත්වන මූලික වැදගත්කමකින් යුත් කරුණු සමහරක් නිසා (ඔක්තෝබරයේ ජයග්‍රහණය සහ ඔක්තෝබරයේ සිට පෙබරවාරි දක්වා ධනපතියන්ගේ ආයුධ සන්නද්ධ ප්‍රතිරෝධය සහ කඩා කප්පල් ක්‍රියා මර්දනය කිරීම නිසා) මෙම යටත් වීම ඒකාන්ත දෙයක් වී ඇත. නමුත් රුසියාවේ ජයග්‍රහණයට වැදගත් සාධකය වූයේ කම්කරුවන්, නිර්ධන පංතිකයන් ජනගහනයේ බහුතරය වීම නොව, ඔවුන් අතර පැවති උසස් සංවිධාන මට්ටම නොව, දුප්පත් සහ ක්ෂණික විනාශයට පත් ගොවීන්ගෙන් නිර්ධන පංතියට ලැබුණු ආධාරයය. අවසාන වශයෙන් අපට උසස් මට්ටමක සංස්කෘතියක් හෝ සම්මුති ඇති කර ගැනීමේ පුරුද්දක් හෝ නොමැත. මෙම යථාභූත කොන්දේසි ගැන සූපරීක්ෂාකාරී ලෙස සැලකිලිමත් වන්නේ නම්, අපට එක්වරම ක්‍රම දෙකක් අනුගමනය කිරීමට හැකි බව හා සිදු වන බව පැහැදිලි වනු ඇත. ''රාජ්‍ය ධනපති ක්‍රමය'' හා කිසිම සම්බන්ධයක් පැවැත්වීම හෝ කුමණ ආකාරයක වුව සම්මුති ගැන සැලකීම හෝ ප්‍රතික්ෂේප කරන සහ ලාභ ගැරීම, ගොවීන්ට අල්ලස් දීම ආදියෙහි යෙදෙමින් සෝවියට් සභා ගන්නා පියවරයන් දිගටම කඩා කප්පල් කරන අසංස්කෘතික ධනපතියන් නිර්දය ලෙස මර්දනය කිරීමට අප එක් අතකින් කටයුතු කළ යුතුය. අනික් අතින් අපි සම්මුති ක්‍රමය උපයෝගි කග ගත යුත්තෙමු නැතහොත් ''රාජ්‍ය ධනපති ක්‍රමයට'' එකඟ වන, එය ක්‍රියාත්මක කිරීමට සමත් වන සහ කෝටි ගණන් ජනතාවන්ට ඇත්ත වශයෙන්ම භාණ්ඩ සම්පාදනය කරන විශාල තම වර්ගවල ව්‍යවසායයන් සංවිධානය කිරීමේ බුද්ධිය හා පළ පුරුද්ද ඇතියවුන් ලෙස නිර්ධන පංතියට ප්‍රයෝජනවත් වන සදචාරවත් ධනපතියන් මුදලට ගැනීමට කටයුතු කළ යුත්තෙමු.

බුහාරින් බොහෝ පොතපත කිය වූ මාක්ස්වාදී අර්ථ ශාස්ත්‍රඥයෙකි. එනිසා ඉඳුරාම සමාජවාදය කරා පරිවර්තනය වීම පහසු වනු සඳහාම, මහා පරිමාණ නිෂ්පාදන සංවිධාන රැක ගැනීමේ වැදගත්කම ගැන මාක්ස් කම්කරුවන්ට උගැන්වූ කරුණු ඉතාමත් නිවැරදි බව ඔහුට මතක් විය. ධනපතියන්ට ගෙවීම් කළහොත් සාමකාමීව යටත් වන ලෙසටත්, සදචාරවත් හා සංවිධානාත්මක ලෙස සමාජවාදය පැත්තට ඒමටත්, ඔවුන්ට බල කරන තත්ත්වයක් පවතින්නේ (විශේෂයක් වශයෙන් — එම බ්‍රිතාන්‍යය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විය) නම්, ඔවුන්ට හරිහැටි ගෙවීම් කර ඔවුන් මිළට ගැනීම ගැන සිතිය හැකි බව මාක්ස් උගැන්වීය.

නමුත් බුහාරින් රුසියාවේ පවතින වර්තමාන විශේෂ අංග ලක්ෂණ ගැන ගැඹුරට සිතා නොබැලූ නිසා ඔහු නොමග ගියේය. මෙම විශේෂ අංග ලක්ෂණ පවතින විට, එනම්, අපගේ දේශපාලන ක්‍රමය අතින්ද, කම්කරුවන්ගේ දේශපාලන බලය අතින්ද අප, නැතහොත්, රුසියානු නිර්ධන පංතිය ඕනෑම බ්‍රිතාන්‍යයකට හෝ ඕනෑම ජර්මනියකට හෝ වඩා ඉදිරියෙන් සිටින විට, එහෙත්, රාජ්‍ය ධනපති ක්‍රමය හොඳින් සංවිධාන කිරීම අතින්ද, සංස්කෘතික මට්ටම අතින්ද, ද්‍රව්‍යමය හා නිෂ්පාදනමය මාර්ග මගින් සමාජවාදය "ආරම්භ කිරීමට" ඇති සූදනම අතින්ද අප ඉතාමත් නොදියුණු බටහිර යුරෝපීය රටකටත් වඩා පසුබා සිටින විට, එයින් විශේෂ තත්ත්වයක් පැන නගින්නේය. වර්තමාන තත්ත්වයේ එම විශේෂ ස්වභාවය නිසාම, සෝවියට් බලයට සේවය කිරීමට බැඳීමට සහ හැකි විශාලම පරිමාණයෙන් "රාජ්‍ය" නිෂ්පාදනය සංවිධානය කිරීමට ආධාර දෙනු කැමති ධනපතියන් අතර සිටින ඉතාමත් සදචාරවත්, ඉතාමත් කුසලතා පූර්ණ, ඉතාමත් දක්ෂ අය "මිළට ගැනීමේ" විශේෂ ක්‍රමයක සහ කම්කරුවන් ඒ අනුව යෝජනා ඉදිරිපත් කිරීමක අවශ්‍යතාවය පැන නගින බව පැහැදිලි නොවේද? මෙම විශේෂ තත්ත්වය යටතේ අප වැරදි දෙකක් මඟ හැරීමට සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතු බවත්, එම වැරදි දෙකම සුළු ධනපති ස්වභාවයේ ඒවා බවත් පැහැදිලි නොවේද? එක් අතකින් අපගේ ආර්ථික "බලවේග" සහ අපගේ දේශපාලන ශක්තිය අතර නොගැලපීමක් තිබෙන "නිසා", අප බලය අල්ලා නොගත යුතු යයි කීම මරණීය වරදක් වනු ඇත. එවැනි තර්කයක් ඉදිරිපත් කිරීමෙහි සමත් වන්නේ ඒ ආකාර "නොගැලපීමක්" සෑම විටම පවතින බවත්, ස්වභාව ධර්මයේ සංවර්ධනයේදී මෙන්ම සමාජ සංවර්ධනයේදීද එය දක්නට ලැබෙන බවත්, සියලුම, රටවල නිර්ධන පංතිකයන්ගේ විප්ලවීය සහයෝගය ඇතිව පූර්ණ සමාජවාදය නිර්මාණය කෙරෙනු ඇත්තේ තනි තනිව ගත් කල එක පැත්තකට බර වූ සහ යම් යම් දුර්වලකම් සහිත ප්‍රයත්න මාලාවක් මගින් බවත් අමතක කරන "මජ්ලර්කාරයෙක්"[71] පමණකි.

අනිත් අතට, "ඇස් නිලංකාර කරන" විප්ලවවාදී ජීවගුණයෙන් මෝහනය වන, එහෙත්, පරිවර්තනයේ ඉතාමත් දුෂ්කර අවධි ගැන සැලකිල්ලට ගනිමින් නොකඩවාම, කල්පනාකාරී ලෙස සහ උවමනාවෙන් කළ යුතු විප්ලවකාරී වැඩ කිරීමේ හැකියාව නැති සෝෂාකාරයන්ට සහ වදන් හරඹකරුවන් කැමති පරිද්දෙන් කටයුතු කිරීමට ඉඩ හැරීමද බලවත් වරදක් බව පැහැදිලිය.

වාසනාවකට මෙන්, විප්ලවවාදී පක්ෂවල සංවර්ධනයේ සහ ඒවාට

විරුද්ධව බොල්ෂෙවික්වාදය කළ අරගලයේ ඉතිහාසය විසින් පැහැදිලි ලෙස වෙන් කොට දක්වෙන වර්ග පිළිබඳ උරුමයක් අපට ලැබී තිබේ. එම වර්ග අතුරෙන් වාම සමාජවාදී-විප්ලවවාදීහු සහ අරාජිකවාදීහු නරක විප්ලවවාදීන් පිළිබඳ සිත් කාවදින ආදර්ශ වෙති. දැන් ඔවුහු "දක්ෂිණ-බොල්ෂෙවික්වරුන්ගේ" "සම්මුතියට" විරුද්ධව සන්නියක් වැළඳුනු කලෙක මෙන් කෑ ගසති; හුස්ම හිරවෙන තරමට හා උගුර බැරැඬි වන තෙක් කෑ ගසති. එහෙත් "සම්මුතියෙහි" ඇති නරක දෙය කුමක්ද යනුත්, ඉතිහාසය සහ විප්ලවයේ ගමන් මඟ විසින් "සම්මුතිය" යුක්ති යුක්ත ලෙස හෙළා දකින ලද්දේ මන්ද යනුත් සිතා ගැනීමට පුළුවන්කමක් ඔවුනට නැත.

කෙරෙන්ස්කිගේ කාලයේදී සම්මුති ගත වීම යනු බලය අධිරාජ්‍යවාදී ධනපති පංතියට හිමිකර දීමක් හා සමාන විය. බලය පිළිබඳ ප්‍රශ්නය සෑම විප්ලවයකම මූලික ප්‍රශ්නය වන බව මෙහිදී මතක තබා ගත යුතුය. 1917 ඔක්තෝබර්-නොවැම්බර් සමයේදී බොල්ෂෙවික්වරු කොටසක් සම්මුති ගත වීමෙන් අදහස් කෙරුණේ නිර්ධන පංතිය බලය අල්වා ගැනීම ගැන ඔවුන් බිය වූ බව හෝ, එසේ නැතහොත්, වාම සමාජවාදී-විප්ලවවාදීන් වැනි "අවිශ්වාසදායක සහචරයන්" සමග පමණක් නොව, සතුරන් සමගද, චෙර්නොව්වාදීන් සහ මෙන්ෂෙවික්වරුන් සමගද සමසේ බලය බෙද ගැනීමට ඔවුන් කැමැත්තක් දැක්වූ බවය. නමුත්, ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසුරුවා හැරිය,[72] බගයෙව්ස්කිලා නිර්දය ලෙස මර්දනය කිරීම, සෝවියට් ආයතනවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම හා රාජ්‍ය සන්තක කිරීමේ කටයුතු සියල්ලම වැනි මූලික කටයුතුවලදී, මෙහි සඳහන් සතුරන් අපට අනිවාරණීය වශයෙන්ම බාධා කරන්නට ඉඩ තිබුණි.

දැන්, "අවිශ්වාසදායක සහචරයන්" නොමැතිව පවා බලය අල්වා ගෙන, එය එක පක්ෂයක, එනම්, නිර්ධන පංතියේ පක්ෂය අතෙහි තහවුරු කර තිබේ. බලය බෙද ගැනීමේ, නැතහොත්, ධනපති පංතිය යට කරන නිර්ධන පංති ආඥාදායකත්වය අත්හැර දැමීමේ ප්‍රශ්නයක් වත් පැන නැග නැති හා කිසිසේත් පැන නැගිය නොහැකි වර්තමාන අවස්ථාවේ, සම්මුතිය ගැන කථා කිරීම යනු, කටපාඩමෙන් උගත්, එහෙත් වටහා නොගත් වචන ගිරා තාලයෙන් පුනරුච්ඡාරනය කිරීම පමණකි. රට පාලනය කිරීමට හැකි හා පාලනය කළ යුතු තත්ත්වයට පැමිණි අප, කුඩා දේපළ හිමියන්ට විරුද්ධව, ධනපති ක්‍රමය විසින් පුහුණු කරන ලද ඉතාමත් දක්ෂ පිරිස් අපේ පැත්තට දිනා ගැනීමට වියදම් ගැන අදිමදි නොකර ප්‍රයත්න දරන විට, එය "සම්මුති" ගත වීමක් ලෙස විස්තර කිරීමෙන් හෙළිදරව් වන්නේ, සමාජවාදය ගොඩ නැගීමේ ආර්ථික කර්තව්‍යයන් ගැන සිතීමට හැකියාවක් කොහෙත්ම නොමැති බවය...

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ද්‍රව්‍ය බද්ද, වෙළඳාම් කිරීමේ නිදහස සහ අනුග්‍රහයන්

ඉහත උපුටා දක්වන ලද 1918 තර්කවලට අදාළ කාල පරිච්ඡේදයන් සම්බන්ධයෙන් එහි වැරදි ගණනාවක් ඇත. මෙම කාල සීමාවන් එවකට අපේක්ෂා කළාට වැඩියෙන් දීර්ඝ විය. එය පුදුමයට කරුණක් නොවේ. එහෙත් අපගේ ආර්ථිකයේ පදනම සදන මූලිකාංගයන් එසේම පැවතින. ගොවිජන "දුප්පතුන්" ඉතාමත්ම විශාල සංඛ්‍යාවක් (නිර්ධන පංතිකයන් සහ අර්ධ නිර්ධනයන්) මධ්‍යම ගොවීන් බවට පත්වී ඇත. සුළු දේපළ හිමි සුළු ධනපති කොටස වැඩි වීමක් මේ නිසා සිදු විය. 1918-1920 සිවිල් යුද්ධය නිසා රටේ විනාශය තවත් දරුණු විය. එහි නිෂ්පාදනීය බලවේගයන් ප්‍රකෘතිමත් කිරීම ප්‍රමාද විය. අන් කිසිම පංතියකට වඩා නිර්ධන පංතියේ ලේ ගැලුවේය. මෙයට අමතරව, 1920 අස්වනු පාළුව, සත්වාහාර හිඟය හා ගවයන් විනාශ වීම නිසා, අපගේ ප්‍රධාන ඉන්ධන වර්ගය වන දව කරත්තවලින් ගෙන ඒමට ගොවීන්ගේ අශ්වයින් යෙදීමටත්, වෙනත් අවශ්‍ය කටයුතුවලටත් බාධා පැමිණි හෙයින් ප්‍රවාහනය හා කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීම තව තවත් ප්‍රමාද විය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1921 වසන්තයේදී දේශපාලන තත්ත්වය කොතරම් උග්‍ර වී තිබුණේද යත්, ගොවි ජනතාවගේ තත්ත්වය වැඩි දියුණු කිරීමට සහ ඔවුන්ගේ නිෂ්පාදනීය බලවේගයන් වැඩි කිරීමට වහාම, ඉතා දැඩි හා හදිසි පියවරයන් ගැනීම අවශ්‍ය විය.

ගොවි ජනතාවගේ මිස කම්කරුවන්ගේ නොවූයේ මන්ද?

එසේ වූයේ කම්කරුවන්ගේ තත්ත්වය උසස් කිරීම සඳහා ධාන්‍ය සහ ඉන්ධන අවශ්‍ය වූ හෙයිනි. රාජ්‍ය ආර්ථිකය සමස්තයක් වශයෙන් ගත් කල, වර්තමාන අවස්ථාවේදී ලොකුම "අවහිරය" මෙයයි. එසේ වන්නේ ගොවි ජනතාවගේ තත්ත්වය හා ඔවුන්ගේ නිෂ්පාදනීය බලවේගයන් දියුණු කිරීමෙන් තොරව ධාන්‍ය නිෂ්පාදනය හා එකතු කිරීමත්, ඉන්ධන සම්පාදනයත්, ප්‍රවාහනයත් කිසිසේත් වැඩි කළ නොහැකි හෙයිනි. අපි ගොවි ජනතාවගේ සිට පටන් ගත යුත්තෙමු. මෙය නොවටහා ගන්නා අය සහ ගොවි ජනතාව ඉදිරි පෙළෙහි තැබීම යනු නිර්ධන පංති ආඥාදායකත්වය "අත් හැරීම", නැතහොත්, එවැනි දෙයක් යයි සිතන අය විෂය ගැන කල්පනා නොකරම තමන් වචන බලයට අවනත වීමට ඉඩ දෙන්නෝ වෙති. නිර්ධන පංති ආඥාදායකත්වය යනු, නිර්ධන පංතිය විසින් ප්‍රතිපත්තිය මෙහෙය වනු ලැබීමය.ඉතාමත් හදිසි හා වැඩියෙන්ම "විවාද වන" ප්‍රශ්නය පළමුවෙන් විසඳන ආකාරයෙන් ප්‍රතිපත්තිය මෙහෙය වීමේ හැකියාව නායක සහ පාලක පංතිය වන නිර්ධන පංතියට තිබිය යුතුය. වර්තමාන

අවස්ථාවේදී ඉතාමත් හදිසි ප්‍රශ්නය වන්නේ ගොවි ජන ගොවිතැනෙහි නිෂ්පාදනීය බලවේගයන් වහාම වැඩි කිරීමට ආධාරකාරී පියවරයන් ගැනීමය. කම්කරුවන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීමට, කම්කරුවන් හා ගොවි ජනතාව අතර සන්ධානය ශක්තිමත් කිරීමට හැකි වන්නේ මේ ආකාරයෙන් පමණකි. කම්කරුවන්ගේ තත්ත්වය මේ ආකාරයෙන් වැඩි දියුණු කිරීමට ප්‍රතික්ෂේප කළ නිර්ධන පංතිකයා, නැතහොත්, නිර්ධන පංති නියෝජිතයා, ඇත්ත වශයෙන්ම තමා සුදු හමුදු පිරිස්වල සහ ධනපතියන්ගේ ආධාරකයෙක් බව ඔප්පු කරන්නේය. මේ ආකාරයෙන් එය කිරීමට ප්‍රතික්ෂේප කිරීමෙන් අදහස් වන්නේ කම්කරුවන් පංති උවමනාවන්ට ඉහළින් ඔවුන්ගේ ශිල්පීය අවශ්‍යතාවයන් තබන බවකි; කම්කරුවන්ට ලැබෙන හදිසි, තාවකාලික හා අර්ධමය වාසියක් සලකා මුළු කම්කරු පංතියේම අවශ්‍යතාවය, එහි ආඥාදායකත්වය, ඉඩම් හිමියන්ට හා ධනපතියන්ට විරුද්ධව ගොවි ජනාතාව සමග වන එහි සන්ධානය හා ප්‍රාග්ධනයේ වියගසෙන් ශ්‍රමය නිදහස් කිරීම සඳහා කරන අරගලයේදී එයට භාර නායක කාර්ය කොටස පාවාදීමකි.

මේ අනුව බලන කල, අපට අවශ්‍ය ප්‍රථම දෙය නම්, ගොවි ජනතාවගේ නිෂ්පාදනීය බලවේගයන් නඟා සිටුවීමට හේතුවන හදිසි සහ බරපතල පියවරයන්ය.

අපගේ ආහාර ප්‍රතිපත්තියෙහි වැදගත් වෙනස්කම් නොකර, මෙය කළ හැකි නොවේ. ධාන්‍ය අතිරික්තය අත්පත් කර ගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්ද ආදේශ කිරීම එවැනි එක වෙනස්කමක් විය. බද්ද ගෙවීමෙන් පසුව, යටත් පිරිසෙයින් ප්‍රාදේශීය හුවමාරුවෙහිදී නිදහස් වෙළඳ පොළක් පැවතීම අදහස් කෙරේ.

ධාන්‍ය අතිරික්තය අත්පත් කර ගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්ද ආදේශ කිරීමෙහි සාරාර්ථය කුමක්ද?

මෙම කරුණ සම්බන්ධයෙන් බොහෝ වැරදි අදහස් පැතිරී ඇත. එම අදහස් පැතිරීමට ප්‍රධාන හේතුව වන්නේ, සිදු කෙරෙන වෙනස පොදු වශයෙන් කොමියුනිස්ට් ක්‍රමයේ සිට පොදු වශයෙන් ධනපති ක්‍රමය දක්වා යොමු වුවකැයි යන උපකල්පනය පිළිගෙන, පරිවර්තනයේ අර්ථය අධ්‍යයනය කිරීමට, ප්‍රයත්න නොදැරීමය, එම පරිවර්තනයේ ආරම්භය හා අවසානය ගැන තමන්ගෙන්ම නොඇසීමය. වරදට පිළියම් යෙදීම සඳහා කළ යුත්තේ 1918 මැයි මාසයේ කියන ලද දෙය ගැන සඳහන් කිරීමය.

අන්ත අගහිඟකම, විනාශය හා යුද්ධය නිසා අප මත බලෙන්ම පැටවුනු ඒ විශේෂ "යුද්ධ කාලීන කොමියුනිස්ට් ක්‍රමයේ" සිට ක්‍රමවත් සමාජවාදී භාණ්ඩ හුවමාරුව වෙත පරිවර්තනය වීමේ එක් ක්‍රමයකි, ද්‍රව්‍ය බද්ද. අනිත් අතට සමාජවාදී භාණ්ඩ හුවමාරුව යනු, ජනගහනයෙන් අති බහුතරය

https://liberationbase.wordpress.com

සුළු ගොවි ජනතාව වීමෙන් පැන නැඟුනු විශේෂ අංග ලක්ෂණ සහිත සමාජවාදයේ පටන් කොමියුනිස්ට් ක්‍රමය දක්වා පරිවර්තනය වීමේ එක් ආකෘතියකි.

මෙම විශේෂ ''යුද්ධ කාලීන කොමියුනිස්ට් ක්‍රමය'' යටතේ, අපි යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් සපුරාලීම සහ කම්කරුවන් ජීවත් කිරීම සඳහා ගොවියාගෙන් ඔහුගේ අතිරික්තයන් සියල්ලම ගත්තෙමු. සමහර විට ඔහුට අවශ්‍ය භාණ්ඩවලින් කොටසක් පවා ගත්තෙමු. අපි ඉන් වැඩි කොටසක් ණයට, කඩදාසි මුදල් සඳහා ගත්තෙමු. එසේ නොකරන ලද නම්, විනාශ වූ සුළු ගොවි රටක සිටින අපට ඉඩම් හිමියන් හා ධනපතියන් කිසි කලෙකත් පරාජය කරන්නට නොලැබෙන්නට තිබුණි. ඔවුන් පරාජය කිරීමට (ලෝකයේ ඉතාමත් බලවත් රටවලින් අපගේ සූරාකන්නන්ට ආධාර ලැබුණත්) අපට හැකි වීමෙන් දක්නට ලැබුණේ කම්කරුවන් හා ගොවි ජනතාව ඔවුන්ගේ විමුක්තිය සඳහා කරන අරගලයේදී පාන වීරත්වයේ ප්‍රාතිහාර්යයන් පමණක් නොවේ. මෙම ''යුද්ධ කාලීන කොමියුනිස්ට් ක්‍රමය'' සම්බන්ධයෙන්, මෙන්ෂෙවික්වරු, සමාජවාදී -විප්ලවවාදීන් හා කෞට්ස්කි සහ සමාගම අපට දෝෂාරෝපනය කළ විට ඔවුන් ධනපතියන්ගේ අතවැසි කාර්යය ඉටු කළ බවද එයින් පෙනිනි. ඒ සම්බන්ධයෙන් අපට ලැබිය යුත්තේ ගරුත්වයකි.

ලැබිය යුතු ගරුත්වය කොතරම්ද යන්නද එසේම වැදගත් කරුණකි. යුද්ධ හා විනාශය නිසා ''යුද්ධ කොමියුනිස්ට්වාදය'' පිහිටුවීමට සිදුවිය. එය නිර්ධන පංතියේ ආර්ථික කර්තව්‍යයන්ට ගැලපෙන ප්‍රතිපත්තියක් නොවූයේ සහ විය හැක්කේ නොවේ. එය තාවකාලිකව ක්‍රියාත්මක කරන ලද්දක් විය. සුළු ගොවිජන රටක ස්වකීය ආඥාදායකත්වය ක්‍රියාත්මක කරන නිර්ධන පංතිය අනුගමනය කළ යුතු නිවැරදි ප්‍රතිපත්තිය නම්, ගොවියාට අවශ්‍ය නිෂ්පාදිත භාණ්ඩ වෙනුවට හුවමාරු වශයෙන් ධාන්‍ය ලබා ගැනීමයි. නිර්ධන පංතියේ කර්තව්‍යයන්ට ගැලපෙන සහ සමාජවාදයේ පදනම් ශක්තිමත් කර එහි සම්පූර්ණ ජයග්‍රහණයට මඟ සලසන එකම ආහාර ප්‍රතිපත්තිය එම වර්ගයට අයත් එකකි.

ද්‍රව්‍ය බද්දක් අය කිරීම මෙම ප්‍රතිපත්තියට පරිවර්තනය වීමක් වන්නේය. යුද්ධයේ මහත් බරෙන් (එය ඊයේ දක්වාම පැවතුනු අතර, ධනපතියන්ගේ අති කෑදරකම හා ද්වේෂය නිසා, එය නැවතත් හෙට ඇති විය හැකිය) අප තවමත් ඉමහත් සේ විනාශව හා මිරිකී සිටින හෙයින්, අපට අවශ්‍ය ධාන්‍ය සියල්ලම සඳහා හුවමාරු වශයෙන් ගොවියාට නිෂ්පාදිත භාණ්ඩ දීමේ හැකියාව අපට නැත. මෙය දන්නා අපි ද්‍රව්‍ය බද්ද ආරම්භ කරන්නෙමු. ඒ අනුව අපට (යුද්ධ හමුදාව සහ කම්කරුවන් සඳහා) අවශ්‍ය අවම ධාන්‍ය

ප්‍රමාණය බද්ද වශයෙන් ලබා ගෙන, ඊට අමතර ධාන්‍ය නිෂ්පාදිත භාණ්ඩ සඳහා හුවමාරු වශයෙන් ලබා ගන්නෙමු.

අප අමතක නොකළ යුතු තවත් දෙයක් ඇත. මහා පරිමාණ සමාජවාදී රාජ්‍ය කර්මාන්ත එක් වරම ආරම්භ කළ නොහැකි වන තරමට අපගේ දුප්පත්කම සහ විනාශ වූ ස්වභාවය බලවත්ය. මෙය කළ හැක්කේ ලොකු කාර්මික මධ්‍යස්ථානවල ධාන්‍ය සහ ඉන්ධන විශාල තොග ඇති විට, ගෙවී ගිය යන්ත්‍ර වෙනුවට අළුත් යන්ත්‍ර ආදේශ කළ විට, යනාදී තත්ත්වයන් යටතේ පමණකි. මෙය එක පහරින් කළ නොහැකි බව අපි අත්දැකීමෙන් දන්නෙමු. විනාශකාරී අධිරාජ්‍යවාදී යුද්ධයෙන් පසුව ධනවත්ම හා ඉතාමත් දියුණු රටවලට පවා මෙම ප්‍රශ්නය විසඳා ගත හැකි වන්නේ අවුරුදු ගණනාවක් යන සෑහෙන තරම් දීර්ඝ කාලයකින් බව අපි දන්නෙමු.එනිසා කුඩා කර්මාන්ත ප්‍රකෘතිමත් තත්ත්වයට ගෙන ඒම එක්තරා දුරකට අවශ්‍ය වන්නේය. ඒ සඳහා රාජ්‍ය යන්ත්‍රද, අමුද්‍රව්‍ය, ඉන්ධන හා ආහාර විශාල තොගද තිබීම අවශ්‍ය කොන්දේසියක් නොවේ. තවද ගොවි ජන ගොවිතැනට අප්‍රමාදවම කිසියම් ආධාරයක් දීමටත්, වහාම එහි නිෂ්පාදනීය බලවේගයන් වැඩි කිරීමටත් හැකියාවද සුළු කර්මාන්තයට ඇත.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වනු ඇත්තේ කුමක්ද?

එහි ප්‍රතිඵලය වනු ඇත්තේ යම් තරමක් දුරට (ප්‍රාදේශීය පමණක් වුව) වෙළඳාම් කිරීමේ නිදහස පදනම් කර ගෙන සුළු ධනපතියන් සහ ධනපති ක්‍රමය යළි ප්‍රාණවත් වීමය. ඒ ගැන සැකයක් නැත. ඒ ගැන අයෙකුගේ ඇස් වසා ගැනීම මෝඩකමක් වනු ඇත.

එය අවශ්‍යද? එය යුක්ති සහගත යයි කිව හැකිද? එය අනතුරුදායක නොවේද?

එවැනි බොහෝ ප්‍රශ්න ඇසිය හැකිය. ඉන් බොහොමයක්ද (අඩු මට්ටමින් කියතොත්) හුදෙක් ප්‍රශ්න නගන තැනත්තාගේ අඩු කල්පනාව පෙන්නුම් කරන ප්‍රශ්න වන්නේය.

අපගේ ආර්ථිකයේ විවිධ සමාජ-ආර්ථික ව්‍යුහයන්හි මූලිකාංගයන් (සංයුක්ත කොටස්) ගැන වූ මගේ 1918 මැයි පැහැදිලි කිරීම ගෙන බලන්න. පිතෘමූලික, එනම්, අර්ධ ම්ලේච්ඡ ක්‍රමයේ සිට සමාජවාදී ක්‍රමය දක්වා වූ මෙම අවධි (නැතහොත් සංයුක්ත කොටස්වල) පහේම, ආර්ථික ආකෘති පහේම පැවැත්ම පිළිගැනීමට කිසිවෙක් ප්‍රතික්ෂේප කරන්නේ නැත. සුළු ගොවි ජන රටක, සුළු ගොවි ජන ''ව්‍යුහය'', එනම්, අර්ධ වශයෙන් පීතෘමූලික,අර්ධ වශයෙන් සුළු ධනපති ක්‍රමය පවතින බව නිරායාසයෙන්ම පෙනී යන්නේය. හුවමාරුව පවතින විට සුළු ආර්ථිකය අනිවාරණීය වශයෙන්ම සුළු ධනපති, එනම්, ධනපති ආකාරයෙන් සංවර්ධනය වන බව බොරු නොකළ හැකි සත්‍යයකි. එය දේශපාලන අර්ථශාස්ත්‍රයේ සරල සිද්ධාන්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තයකි. සාමාන්‍ය මිනිසාගේ දෛනික අත්දැකීමෙන් පවා එය සනාථ වන්නේය.

මෙම ආර්ථික යථාර්ථයට මුහුණ දෙන විට සමාජවාදී නිර්ධන පංතියට අනුගමනය කළ හැකි ප්‍රතිපත්තිය කුමක්ද? එය, කුඩා ගොවියාගේ ධාන්‍ය සහ අමුද්‍රව්‍ය වෙනුවෙන් හුවමාරුවට මහා පරිමාණ සමාජවාදී කර්මාන්ත විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවලින් එම ගොවියාට අවශ්‍ය *සියල්ලම* දීමද? එය ඉතාමත් හොඳ සහ "නිවැරදි" ප්‍රතිපත්තිය වනු ඇත. එනිසා අපි එය ආරම්භ කර ඇත්තෙමු. නමුත් *සියලු* භාණ්ඩ සැපයීමේ හැකියාවක් අපට නැත. ඒ අසලකටවත් ඒමට අපට නොපුළුවන. අපට එය ඉතා ඉක්මණින් කළ හැකි වන්නේද නොවේ. අපගේ මුළු රටම විද්‍යුතනය කිරීමේ ප්‍රථම අදියර සම්පූර්ණ කරන තෙක් අපට එම කර්තව්‍යය කෙලෙසින්වත් ඉටු කළ නොහැකි වනු ඇත. එසේ නම් කළ යුත්තේ කුමක්ද? එක් මාර්ගයක් නම්, දශ ලක්ෂ ගණන් සුළු නිෂ්පාදකයන් සිටින විට නොවැලැක්විය හැකි පුද්ගලික, එනම්, රාජ්‍යමය නොවන හුවමාරුව, එනම්, වෙළඳාම, එනම්, ධනපති ක්‍රමය සම්පූර්ණයෙන්ම තහනම් කිරීමට, එහි සංවර්ධනය මුළුමනින්ම වලක්වන සේ එයට අගුළු ලෑමට ප්‍රයත්න දැරීමය. නමුත් එවැනි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ කිරීම මෝඩකමක් හා එය එම ප්‍රයත්නය දරන පක්ෂයේ සිය දිවි නසා ගැනීමක් වනු ඇත. එය කිසිසේත් ආර්ථික වශයෙන් සාර්ථක කළ හැක්කක් නොවන හෙයින් එය මෝඩකමක් වන්නේය. එය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන පක්ෂය අනිවාරණීය වශයෙන්ම විනාශයට පත් වන හෙයින් එය සිය දිවි නසා ගැනීමක් වන්නේය. හරියටම *එවැනිම* ප්‍රතිපත්තියක් පිළිගැනීමෙන් සමහර කොමියුනිස්ට්වරු "සිතෙන්, වචනයෙන් සහ ක්‍රියාවෙන්" වරදෙහි බැඳුනහ. අපි එය සඟවන්නට උත්සාහ නොදරමු. අපි මෙම වැරදි නිවැරදි කරන්නට උත්සාහ ගන්නෙමු. නොවරදවාම මෙය කළ යුතු වේ. නැතහොත්, ඉතාමත් කණගාටුදායක අන්දමින් කරුණු යෙදෙනු ඇත.

විකල්පය නම්, (අවසාන වශයෙන් *විය හැකි* හා එකම බුද්ධිමත් ප්‍රතිපත්තිය) ධනපති ක්‍රමයේ සංවර්ධනයට තහනම් පැනවීමට, නැතහොත් අගුළු ලෑමට ප්‍රයත්න දැරීම නොව, එය *රාජ්‍ය ධනපති ක්‍රමය* බවට හැරවීමය. මෙය ආර්ථික වශයෙන් කළ හැකි දෙයකි. එසේ කියන්නේ සීමා නොකළ වෙළඳාමේ සහ ධනපති ක්‍රමයේ මූලිකාංගයන් පවතින තැන, විවිධ ආකාරයෙන් හා මට්ටමින් රාජ්‍ය ධනපති ක්‍රමය පවතින හෙයිනි.

සෝවියට් රාජ්‍යය සහ නිර්ධන පංති ආඥාදායකත්වය සමග රාජ්‍ය ධනපති ක්‍රමය සම්බන්ධ කළ හැකිද? ඒවා ගැලපෙන්නේද?

ඇත්ත වශයෙන්ම එසේය. 1918 මැයි මාසයේදීද මා තර්ක කළේ හරියටම මේ ආකාරයෙනි. එම අවස්ථාවේදී මා එය ඔප්පු කර ඇතැයි

මම සිතුවෙමි. සුළු දේපළ හිමි ස්වභාවය (සුළු පීතෘමූලික සහ සුළු ධනපති යන දෙ ආකාරයේම) සමග සසඳන කල රාජ්‍ය ධනපති ක්‍රමය ඉදිරි පියවරක් බවද මම ඔප්පු කර ඇත්තෙමි. රාජ්‍ය ධනපති ක්‍රමය සමාජවාදය සමග පමණක් සංසන්දනය කරන වැරදි රැසක් කරති. මක්නිසාදයත්, වර්තමාන දේශපාලන සහ ආර්ථික වාතාවරණය යටතේ ධනපති ක්‍රමය සුළු ධනපති නිෂ්පාදනය සමගද සංසන්දනය කළ යුතු හෙයිනි.

න්‍යායික සහ ප්‍රායෝගික අර්ථයෙන් බලන කල, තිබෙන මුළු ප්‍රශ්නයම ධනපති සංවර්ධනය (එය තරමක් දුරට සහ යම් කාලයක් සඳහා අනිවාරණීයය) රාජ්‍ය ධනපති ක්‍රමයේ මාර්ගවලට යොමු කිරීමේ නිවැරදි විධික්‍රම සොයා ගැනීම සහ නුදුරු අනාගතයේදී එය සමාජවාදී ක්‍රමයට පරිවර්තනය වීම සහතික කරනු පිණිස, එය කොන්දේසිවලට යටත් කරන්නේ කෙසේද යන්න සොයා ගැනීම පිළිබඳ වූවකි.

මෙම ප්‍රශ්නය විසඳීම කරා සමීප වීම පිණිස සෝවියට් ක්‍රමය තුළ සහ සෝවියට් රාජ්‍යයේ රාමු කට්ටුව තුළ පවතිනු ඇති සහ තිබිය හැකි රාජ්‍ය ධනපති ක්‍රමය කුමක්ද යන්න දක්වන මනෝ පින්තූරය හැකි තරම් පැහැදිලි ලෙස අපි අපගේම සිත් තුළ ඇඳ ගත යුත්තෙමු.

සෝවියට් ආණ්ඩුව ධනපති ක්‍රමය රාජ්‍ය ධනපති ක්‍රමයේ මාර්ගවලට යොමු කරන්නේ සහ රාජ්‍ය ධනපති ක්‍රමය "රෝපණය" කරන්නේ කෙසේදැයි පෙන්වන සරලතම නිදසුන, අනුග්‍රහයන් සැලසීමය. අනුග්‍රහයන් දීම අවශ්‍ය බවට දැන් අපි සියලු දෙනාම එකඟ වන්නෙමු. නමුත් එයින් මතු වන තත්ත්වයන් ගැන අප සියලු දෙනාම සිතා බලා තිබේද? ඉහත සඳහන් සමාජ-ආර්ථික ආකෘති සහ ඒවායේ අන්තර්-සම්බන්ධකම් අනුව බලන කල සෝවියට් ක්‍රමය යටතේ අනුග්‍රහයන් යනු මොනවාද? ඒවායින් පිළිබිඹු වන්නේ, සුළු දේපළ හිමි (පීතෘමූලික සහ සුළු ධනපති) ගති ලක්ෂණයට විරුද්ධව සෝවියට්, එනම්, නිර්ධන පංතික රාජ්‍ය බලය සහ රාජ්‍ය ධනපති ක්‍රමය අතර වන සන්ධානයකි. අනුග්‍රහ ලබන්නා ධනපතියෙකි. ඔහු ඔහුගේ ව්‍යාපාරය ගෙන යන්නේ ධනපති ක්‍රියා මාර්ගය අනුව, ලාභය සඳහාය. අධිලාභ, නැතහොත්, ඔහුට වෙනත් මගකින් ලබා ගත නොහැකි හෝ මහත් දුෂ්කරතා විඳ පමණක් ලබා ගත හැකි ඔහු අමුද්‍රව්‍ය ලබා ගනු පිණිස නිර්ධන පංති ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වීමට ඔහු කැමතිය. නිෂ්පාදනීය බලවේගයන් සංවර්ධනය වීමෙන්ද, වහාම, නැතහොත්, ඉතා කෙටි කාලයක් තුළ වැඩි භාණ්ඩ ප්‍රමාණයක් ලැබීමෙන්ද සෝවියට් ආණ්ඩුවට වාසියක් සැලසේ. නිදසුනක් ලෙසට අපට තෙල් බිම්, ආකර සහ වන පෙත් සියයක් ඇතැයි සිතමු. අපට ප්‍රමාණවත් තරම් යන්ත්‍ර, ආහාර හා ප්‍රවාහන පහසුකම් නොමැති හෙයින්, ඒවා සියල්ලම සංවර්ධනය කර ගැනීමේ හැකියාවක් අපට නැත. වෙනත් භූමි භාගයන් සංවර්ධනය කිරීම

https://liberationbase.wordpress.com

සඳහා කිසිවක් නොකරම පාහේ සිටීමට අපට සිදු වී තිබෙන්නේද මෙම හේතුව නිසාමය. මහා පරිමාණ ව්‍යවසායයන්ගේ ඌන සංවර්ධනය නිසා සුළු දේපළ ස්වභාවය එහි සියලු ආකෘතිවලින්ම මතු වී පවතී. එසේම අවට (හා පසුව සමස්ත වශයෙන්) ගොවි ජන ගොවිතැන පිරිහී යාමෙන්ද, එහි නිෂ්පාදනීය බලවේගයන් කඩා කප්පල් වන ආකාරයෙන්ද, සෝවියට් බලය කෙරෙහි එය තබන විශ්වාසය අඩුවීමෙන්ද, සොරකමෙන් සහ පැතිරී ගිය සුළු (සහ ඉතාමත් භයානක) ලාභ ගැරීමෙන්ද, යනාදියෙන් ඒ බව පිළිබිඹු වේ. අනුග්‍රහ දක්වීමේ ආකාරයෙන් රාජ්‍ය ධනපති ක්‍රමය "රෝපණය" කරන සෝවියට් ආණ්ඩුව, සුළු නිෂ්පාදනයට විරුද්ධව මහා පරිමාණ නිෂ්පාදනයද, නොදියුණු නිෂ්පාදනයද, අත්කම් නිෂ්පාදනයට විරුද්ධව යාන්ත්‍රික නිෂ්පාදනයද ශක්තිමත් කරයි. මහා පරිමාණ කර්මාන්තයේ නිෂ්පාදිතවලින් (ස්වකීය නිෂ්පාදිත කොටස ලෙසට) පෙරට වැඩි ප්‍රමාණයක් ලබා ගන්නා එය සුළු ධනපති-අරාජික සම්බන්ධතාවයන්ට අමුතුව ක්‍රියාත්මක වන රාජ්‍ය මෙහෙයුම ලබන ආර්ථික සම්බන්ධකම් ශක්තිමත් කරන්නේය. අනුග්‍රහ දීමේ ප්‍රතිපත්තිය වැදගත් ලෙස සහ සුපරීක්ෂාකාරී ලෙස ක්‍රියාත්මක කිරීමෙන්, එය කර්මාන්තයේ තත්ත්වය සහ කම්කරුවන්ගේ හා ගොවි ජනයාගේ තත්ත්වය ඉක්මණින් වැඩි දියුණු කිරීමට නිසැක ආධාරයක් වනු ඇත. ඇතැම් පරිත්‍යාගයන් කිරීමෙන් සහ ඉතා වටිනා නිෂ්පාදිතයන් සූඩ කෝටි ගණනක් ධනපතියන්ට දීමෙන් අපට මේ සියල්ලම ලබා ගත හැකිය. අනුග්‍රහ දීමේ පරිමාණය සහ ඒවා අපට අන්තරායක් නොවී අපගේ වාසියට හේතුවක් වන්නේ කුමණ කොන්දේසි යටතේද යන්න රඳා පවතින්නේ බලවේගයන් අතර පවතින සම්බන්ධතා අනුවය. ඒවා තීරණය වන්නේ අරගලයේදීය. මන්දයත්, අනුග්‍රහ වීමද අරගලයේ එක් ආකෘතියක් වන හෙයිනි. එය වෙනත් ආකාරයකින් පංති අරගලය දිගටම කර ගෙන යාමක් වන හෙයිනි. කුමණ තත්ත්වයක් යටතේ හෝ එය පංති යුද්ධය වෙනුවට පංති සාමය ආදේශ කිරීමක් නොවන හෙයිනි. ව්‍යවහාරය අරගලයේ ක්‍රම පෙන්නුම් කරනු ඇත.

සෝවියට් ක්‍රමය තුළ පවතින රාජ්‍ය ධනපති ක්‍රමයේ අන් ආකෘති සමග සසඳන කල, සමහර විට වඩාත්ම සරල සහ නිරවුල් රාජ්‍ය ධනපති ක්‍රමය අනුග්‍රහ දීම විය හැකිය. එය ඉතාමත් ශිෂ්ට, දියුණු බටහිර යුරෝපීය ධනපති ක්‍රමය සමග ඇති කර ගත් ලිඛිත ගිවිසුමක් ඇතිව සිදු කෙරෙන්නකි. අපට ලැබෙන ලාභ සහ පාඩුද, අපගේ අයිතිවාසිකම් හා යුතුකම්ද මොනවාද යන්න අපි දන්නෙමු. අනුග්‍රහය දෙන්නේ කුමණ කාලයකටදැයි යන්න අපි හරියටම දන්නෙමු. ගිවිසුම් කාලය ගෙවීමට පෙර එයින් නිදහස් වීමට ගිවිසුම අනුව ඉඩ ඇතොත් ඒ කුමණ කොන්දේසි අනුවද යන්න අපි දන්-

නෙමු. අපි ලෝක ධනපති ක්‍රමයට කිසියම් "කප්පමක්" ගෙවන්නෙමු. ඇතැම් බේරුම් කර ගැනීම් අනුව අපි "මිදුම් දඩයක්" ගෙවන්නෙමු. ඒ අනුව අප්‍රමාදව සෝවියට් බලය ස්ථාපිත කර ගන්නා අතරම, අපගේ ආර්ථික තත්ත්වයන් ශක්තිමත් කර ගන්නෙමු. අනුග්‍රහ දීමේදී ඇති වන ලොකුම අපහසුව නම්, අනුග්‍රහ ගිවිසුමක් ඇති කර ගැනීමේදී සියලුම තත්ත්වයන් ගැන නිසි ලෙස සැලකිල්ලට ගැනීම සහ අගය කිරීමත්, අනතුරුව ඒ සියල්ලම සපුරාලන බවට වග බලා ගැනීමත්ය. මෙහි අපහසුකම් ඇති බව ඒකාන්තය. එමෙන්ම ආරම්භයේදී වැරදි සිදුවීමත් වැලැක්විය නොහැකි වනු ඇත. නමුත්, සමාජ විප්ලවයේ අන් ප්‍රශ්න සමග සසඳන කල සහ විශේෂයෙන්ම රාජ්‍ය ධනපති ක්‍රමය සංවර්ධනය කිරීමේ, එයට ඉඩ දීමේ සහ එය රෝපණය කිරීමේ දුෂ්කරතාවයන් සමග සසඳන කල, මෙම අපහසුකම් සුළුය.

ද්‍රව්‍ය බද්ද ආරම්භ කිරීම හා සම්බන්ධයෙන් සියලුම පක්ෂ සහ සෝවියට් කාරකවරුන් මුහුණ පා සිටින වැදගත් කර්තව්‍යය නම්, "අනුග්‍රහ දීමේ' ප්‍රතිපත්තියේ මූලධර්මයන් (එනම් "අනුග්‍රහ දීමේ" රාජ්‍ය ධනපති ක්‍රමයට සමාන ප්‍රතිපත්තියක්) ධනපති ක්‍රමයේ අනිකුත් ආකෘතිවලට, එනම්, සීමා නොකළ වෙළඳාම, ප්‍රාදේශීය හුවමාරුව, ආදියට ගැලපීමය.

සමුපකාර ගෙන බලමු. ද්‍රව්‍ය බද්ද පැනවීමේ ආඥාව නිසා, සමුපකාරවලට අදාළ රෙගුලාසි සංශෝධනය කිරීමක් හා ඒවායේ "නිදහස" සහ අයිතිවාසිකම් එක්තරා ආකාරයකින් පුළුල් කිරීමක් අවශ්‍ය වීම පුදුමයට කරුණක් නොවේ. සමුපකාරයන්ද රාජ්‍ය ධනපති ක්‍රමයේ එක් ආකෘතියකි. නමුත් එය අනුග්‍රහ දීම තරම් සරල නොවේ. එහි ආකෘතිය එතරම් පැහැදිලි නැත. එය වඩාත් පැටලිලි සහිතය. එනිසා එයින් අපගේ ආණ්ඩුවට ඇති වන ප්‍රායෝගික දුෂ්කරතාවයන් වැඩිය. සුළු වෙළඳ භාණ්ඩ නිෂ්පාදකයන්ගේ සමුපකාර (සුළු ගොවිජන රටක බහුලව පවතින සහ ඊට ගැලපෙන ආකෘතිය ලෙසට අප විසින් සාකච්ඡා කරනු ලබන්නේ මෙම සමුපකාර ගැන වන අතර කම්කරුවන්ගේ සමුපකාර ගැන නොවේ) අනිවාරණීය වශයෙන්ම සුළු ධනපති සම්බන්ධකම් උද්ගත කරයි; එම සම්බන්ධකම්වල සංවර්ධනයට අනුබල දෙයි; සුළු ධනපතියන් ඉදිරියට තල්ලු කර, ඔවුන්ට වැඩියෙන්ම වාසි සලසයි. සුළු නිෂ්පාදකයන් ඉතා බහුල නිසා සහ හුවමාරුව අවශ්‍ය වන හා විය හැකි නිසා ඊට වෙනස්ව කටයුතු සිදු විය හැකි නොවේ. රුසියාවේ වර්තමාන තත්ත්වයන් යටතේ සමුපකාරවලට නිදහස සහ අයිතිවාසිකම් දීමෙන් අදහස් වන්නේ ධනපති ක්‍රමයට නිදහස සහ අයිතිවාසිකම් දීමකි. මෙම පැහැදිලි සත්‍යයට ඇස් වසා ගැනීම මෝඩකමක්, නැතහොත්, අපරාධයක් වනු ඇත.

නමුත්, පෞද්ගලික ධනපති ක්‍රමය මෙන් නොව, සෝවියට් ක්‍රමය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යටතේ වන "සමුපකාර" ධනපති ක්‍රමය රාජ්‍ය ධනපති ක්‍රමයේ එක් විශේෂයකි. එනිසා වර්තමාන අවස්ථාවේදී එය අපට වාසිදයක සහ ප්‍රයෝජනවත් වන්නේය. නමුත් ඒ එක්තරා දුරකට පමණක් බව සැබෑය. ද්‍රව්‍ය බද්ද පැනවීමෙන් අතිරික්ත (බද්ද ලෙසට ගනු ලබන ධාන්‍යවලට වැඩිමනක්) ධාන්‍ය නිදහස් ලෙස අලෙවි කිරීමට ඉඩ ලැබෙන බව අදහස් වන හෙයින්, ධනපති ක්‍රමයේ මෙම සංවර්ධනය — නිදහස් වෙළඳ පොළ යනු ධනපති ක්‍රමයේ සංවර්ධනය වේ — සමුපකාර ධනපති ක්‍රමයේ සංවර්ධනය බවට හැරවීමට අපි සෑම ධෛර්යයක්ම යෙදිය යුත්තෙමු. ඒ අනුව ගිණුම් තැබීම, පාලනය, අධීක්ෂණය සහ රාජ්‍යයත් (මෙහිදී සෝවියට් රාජ්‍යය), ධනපතියාත් අතර කොන්ත්‍රාත් සම්බන්ධකම් ඇති කර ගැනීම පහසු වන හෙයින්, සමුපකාර ධනපති ක්‍රමය රාජ්‍ය ධනපති ක්‍රමයට සමානය. සමුපකාර වෙළඳාම පෞද්ගලික වෙළඳාමට වඩා වඩාත් වාසිදයක සහ ප්‍රයෝජනවත් වන්නේ ඉහත සඳහන් හේතු නිසාම පමණක් නොවේ. දශ ලක්ෂ ගණන් ජනතාව සහ කල්යාමේදී මුළු ජනගහනයම සමාගම් ගත කිරීමේ හා සංවිධානය කිරීමේ ඉඩ කඩ එයින් සැලසෙන නිසා, අනතුරුව රාජ්‍ය ධනපති ක්‍රමයේ සිට සමාජවාදී ක්‍රමයට පරිවර්තනය වීමේ ස්ථාවරයෙන්ද එය වාසිදයක වේ.

රාජ්‍ය ධනපති ක්‍රමයේ ආකෘති ලෙසට අනුග්‍රහ දීම සහ සමුපකාර යන දෙක සංසන්දනය කර බලමු. අනුග්‍රහ දීම කෙරෙන්නේ මහා පරිමාණ යන්ත්‍ර කර්මාන්තය පදනම් කර ගෙනය. සමුපකාර පදනම් වන්නේ කුඩා හස්ත කාර්මික සහ අර්ධ වශයෙන් පීතෘමූලික පවා වන කර්මාන්ත මතය. එක අනුග්‍රහ ගිවිසුමක් එක් ධනපතියෙක්, සමාගමක්, සම්මේලයක්, කාටලයක්, නැතහොත්, සංගත ව්‍යාපාරයක් කෙරෙහි බල පාන්නේය. සමුපකාර සමිති සුළු දේපළ හිමියන් දහස් ගණනින් සහ දශ ලක්ෂ ගණනින් පවා වැලඳ ගනිති. අනුග්‍රහ දීම අනුව කිසියම් නිශ්චිත කාල සීමාවක් සඳහා නිශ්චිත ගිවිසුමක් ඇති කර ගැනීමට ඉඩ ලැබේ. එයින් ඇති වන අදහසද එවැනි ගිවිසුමක් පිළිබඳ වූවකි. සමුපකාර සමිතිවලින් කාල සීමාව හෝ ගිවිසුම හෝ පිළිබඳ නිශ්චිතතාවයකට ඉඩ නොලැබේ. සමුපකාර ගැන නීතියක් අවලංගු කිරීම අනුග්‍රහ ගිවිසුමක් අවලංගු කරනවාට වඩා බොහෝ පහසුය. ගිවිසුමක් අවලංගු කිරීමෙන් අදහස් කෙරෙන්නේ ධනපතියා සමග ආර්ථික සන්ධානයේ, නැතහොත්, "සහපැවත්මේ" ප්‍රායෝගික සබඳතා හදිසියෙන්ම බිඳ දැමීමකි. එහෙත් සමුපකාර ගැන නීතියක් හෝ වෙනත් ඕනෑම නීතියක් අවලංගු කිරීමෙන් සෝවියට් බලය සහ සුළු ධනපතියන් අතර "සහපැවැත්ම" වහාම බිඳෙන්නේ නැත. එපමණක් නොව එමගින් සැබෑ ආර්ථික සම්බන්ධකම් අත්හැරීමට හැකි වන්නේද නැත. අනුග්‍රහ ලාභියෙක් වෙත "ඇස ගසා" ගෙන ඔහු ගැන පරීක්ෂාවෙන් සිටිය හැකි

නමුත්, සමුපකාරකයන් සම්බන්ධයෙන් එය කළ හැකි නොවේ. අනුග්‍රහ දීමේ සිට සමාජවාදයට පරිවර්තනය වීම මහා පරිමාණ නිෂ්පාදනයේ එක් ආකෘතියක සිට තවත් ආකෘතියකට පරිවර්තනය වීමකි. එහෙත්, සුළු නිෂ්පාදක සමුපකාරවල සිට සමාජවාදයට පරිවර්තනයවීම කුඩා පරිමාණ නිෂ්පාදනයේ සිට මහා පරිමාණ නිෂ්පාදනයට පරිවර්තනය වීමය. එය වඩාත් සංකීර්ණ වන අතර, එය සාර්ථක වුවහොත් වඩාත් පුළුල් ජනකායක් සම්බන්ධ කර ගැනීමටත්, දැඩි ලෙස "නවතාවයන්ට" ප්‍රතිරෝධය දක්වන පැරණි, පූර්ව-සමාජවාදී සහ පූර්ව-ධනපති ස්වභාවයේ පවා වන සම්බන්ධකම් පිළිබඳ වඩාත් ගැඹුරට විහිදුනු සහ වඩාත් ප්‍රත්‍යාතන්‍ය මුල් ඉවතට ඇද දැමීමටත් එම පරිවර්තනය සමත් වනු ඇත. අනුග්‍රහ ප්‍රතිපත්තිය සාර්ථක වුවහොත්, එයින් නවීන දියුණු ධනපති ක්‍රමයේ මට්ටමින් ගොඩ නැගුනු — අපගේ ව්‍යවසායයන් සමග සසඳන කල — ආදර්ශ මහා පරිමාණ ව්‍යවසායයන් කීපයක් අපට ලැබෙනු ඇත. දශක කීපයකින් පසුව, මෙම ව්‍යවසායයන් සම්පූර්ණයෙන්ම අපට ලැබෙනු ඇත. සමුපකාර ප්‍රතිපත්තිය සාර්ථක වුවහොත්, එහි ප්‍රතිඵලයක් වශයෙන්, සුළු ආර්ථිකය නගා සිටුවීමක් සහ අවිනිශ්චිත කාල සීමාවක් තුළදී ස්වේච්ඡා සමාගමය පදනම් කොට ගෙන එය මහා පරිමාණ නිෂ්පාදනයට පරිවර්තනය වීම පහසු කිරීමක් සිදු වනු ඇත.

රාජ්‍ය ධනපති ක්‍රමයේ තුන්වැනි ක්‍රමයක් ගෙන බලමු. වෙළෙන්දෙකු සේ සේවය සඳහා ධනපතියා යොදවා ගන්නා රාජ්‍යය, ස්වකීය භාණ්ඩ විකිණීම සහ සුළු නිෂ්පාදකයාගේ නිෂ්පාදිතයන් මිළට ගැනීම පිණිස ධනපතියාට කොමිස් මුදලක් දෙයි. හතරවැනි ආකෘතියකි: රාජ්‍යය ධනපති ව්‍යවසායිකයාට රජයේ කාර්මික ආයතනයක්, තෙල්බිම්, වනපෙත්, ඉඩම් ආදිය බදු දෙයි. මෙම බද්ද බොහෝ දුරට අනුග්‍රහ ගිවිසුමකට සමාන වේ. රාජ්‍ය ධනපති ක්‍රමයේ මෙම පසු කී ආකෘති ද්වය ගැන අප සඳහන් කරන්නේ වත්, සිතා බලන්නේ වත්, නැතහොත්, සැලකිල්ලක් දක්වන්නේ වත් නැත. එසේ වන්නේ අප ශක්තිමත් සහ දක්ෂ නිසා නොව, අප දුර්වල හා අඥාන නිසාය. "අසභ්‍ය සත්‍ය" දෙස එක එල්ලේ බැලීමට බිය වන අප නිතර "මනෝනන්දනීය වංචාවට"[73] යටත් වන්නෙමු. "අපි" ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට සංක්‍රමණය වෙමින් සිටින්නෙමුයි අපි නැවත නැවතත් කියන්නෙමු. නමුත්, මෙම "අපි" යන්න ගැන පැහැදිලි පින්තූරයක් ලබා ගැනීමට තරම් අපි කරදර නොවන්නෙමු. මෙම පින්තූරය පැහැදිලිව සිතෙහි තබා ගැනීම සඳහා, අපගේ ජාතික ආර්ථිකයේ — කිසිම විශේෂයක් නැතිව — සියලුම සංයුක්ත කොටස්ද, මගේ 1918 මැයි 5 දින ලිපියෙන් ගෙන හැර දැක්වූ එහි විවිධ ආකෘති සියල්ලමද ඇතුළත් ලැයිස්තුව නිතරම අපේ සිතෙහි දරා ගත යුත්තෙමු. නිර්ධන පංතියේ දියුණු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සේනාංකය වන "අපි" කෙළින්ම සමාජවාදයට සංක්‍රමණය වෙමින් සිටිමු. එහෙත්, දියුණු සේනාංකය නිර්ධන පංතියෙන් කුඩා කොටසක් පමණක් වන අතර, නිර්ධන පංතියද මුළු ජනගහනයෙන් කුඩා කොටසක් පමණක් වන්නේය. "අප" වහාම සමාජවාදයට පරිවර්තනය වීම පිළිබඳ අපගේ ප්‍රශ්නය සාර්ථක ලෙස විසඳා ගැනීමට නම්, අපි පූර්ව-ධනපති සම්බන්ධකම්වල සිට සමාජවාදයට පරිවර්තනය වීම පිණිස අපට අවශ්‍ය වන අන්තරස්ථ මාවත්, විධික්‍රම, මාධ්‍යයන් සහ උපකරණ මොනවාද යනු අවබෝධ කර ගත යුත්තෙමු. ප්‍රධාන කරුණ මෙයයි.

රු. ස. ඒ. සෝ. ස. සිතියම දෙස බලන්න. වොලොග්ද පෙදෙසට උතුරෙන්ද, දොන් නදී බඩ රොස්තොව් පෙදෙසට හා සරාතොව් පෙදෙසට ගිනිකොනින්ද, ඔරෙන්බූර්ග් සහ ඔම්ස්ක් පෙදෙස්වලට දකුණෙන්ද, තොම්ස්ක් පෙදෙසට උතුරෙන්ද පිහිටි මහා විශාල භූමි භාගයන්හි විශාල ශිෂ්ටාචාර ජාතීන් දුසිම් ගණනකට ඉඩ ඇත. එම ප්‍රදේශ පීතෘමූලික ක්‍රමයේ, අර්ධ ම්ලේච්ඡ භාවයේ සහ සම්පූර්ණයෙන්ම ම්ලේච්ඡ භාවයේ රජදහන් වෙති. අනිත් අතට මහ නගර, මහා පරිමාණ කර්මාන්තත්, ධනපති ක්‍රමය හා සංස්කෘතියත් අතර පවතින ද්‍රව්‍යමය සම්බන්ධය වන දුම්රිය මාර්ගවලින් ගම් වෙන් කරන වර්ස්ට් දුසිම් ගණන් දුර ගම්බද පාරවල් ඇති, නැතහොත්, පාරවල් රහිත භූමිභාගයන් ඇති රුසියාවේ අනෙකුත් පිටිසර පෙදෙස් ගැන කිව හැක්කේ කුමක්ද? එම පෙදෙස්ද පීතෘමූලික ක්‍රමය, ඔබ්ලොමව්වාදය[74] සහ අර්ධ ම්ලේච්ඡභාවය සම්පූර්ණයෙන්ම බල පවත්වන පෙදෙස් නොවේද?

රුසියාවේ පවත්නා මෙම තත්ත්වයේ සිට වහාම සමාජවාදයට පරිවර්තනය වීමක් ගැන සිතන්නට හැකිද? එසේය. එක්තරා දුරකට හැකිය. නමුත් ඒ එක කොන්දේසියකට යටත්වය. සපුරා සකස් කර තිබෙන ශ්‍රෙෂ්ට විද්‍යාත්මක කෘතියකට[75] ස්තුති වන්නට අපි එම කොන්දේසියෙහි නියම ස්වභාවය දනිමු. එම කොන්දේසිය නම් විද්‍යුතනකරණයයි. අපි දුසිම් ගණන් විදුලි බල ස්ථාන ගොඩ නගන්නෙමු නම් (මේවා ඉදි කළ හැක්කේ හා ඉදි කළ යුත්තේ කුමණ ස්ථානවලද යන්න දැන් අපි දනිමු) හා සෑම ගමකටම විදුලි බලය යවන්නෙමු නම්, අපි සෑහෙන තරම් විදුලි උපකරණ සහ වෙනත් උපකරණ ලබා ගන්නෙමු නම්, පීතෘමූලික ක්‍රමයේ සිට සමාජවාදී ක්‍රමය දක්වා පරිවර්තනය වීමේ සංක්‍රමනීය අවධි, නැත හොත්, අන්තරස්ථ පුරුක් කිසිවක් අපට අවශ්‍ය නොවනු ඇත. නැතහොත්, බොහෝ දුරට අවශ්‍ය නොවනු ඇත. එහෙත්, මෙම "එක" කොන්දේසියෙහි ප්‍රථම අදියර පමණක් සම්පූර්ණ කිරීමට යටත්පිරිසෙයින් අවුරුදු දහයක් වත් ගත වන බව අපි හොඳින්ම දන්නෙමු. මෙම කාල සීමාව අඩු කළ හැක්කේ

බ්‍රිතාන්‍ය, ජර්මනිය, ඇ. එ. ජ. වැනි රටවල නිර්ධන පංති විප්ලවය ජයග්‍රාහී වුවහොත් පමණකි.

පීතෘමූලික ක්‍රමයේ සහ සුළු නිෂ්පාදනයේ සිට සමාජවාදී ක්‍රමය දක්වා පරිවර්තනය වීමට උපස්තම්භක වන අන්තරස්ථ පුරුක් ගැන කල්පනා කිරීමට අපි මීළඟ වසර කීපය තුළදී උගත යුත්තෙමු. "ධනපති ක්‍රමය විනයක් සහ සමාජවාදී ක්‍රමය සම්පතක්" වන්නේ යයි "අපි" නොකඩවාම නැවත නැවතත් කියන්නෙමු. නමුත් එවැනි තර්කයක් සාවද්‍යය. මන්ද යත්, පවත්නා සමාජ -ආර්ථික ආකෘති සමෂ්ටිය සැලකිල්ලට ගැනීමට අපොහොසත් වන එය, එයින් ආකෘති දෙකක් පමණක් වෙන් කොට ගන්නා හෙයිනි.

සමාජවාදය හා සමග සසඳන කල ධනපති ක්‍රමය විනයකි. නමුත්, මධ්‍යතනවාදය, සුළු නිෂ්පාදනය සහ සුළු නිෂ්පාදකයන්ගේ විසාරිතාවය හා සම්බන්ධ වූ නිලධාරිවාදය සමග සසඳා බලන කල ධනපති ක්‍රමය සම්පතකි. සුළු නිෂ්පාදනයේ සිට කෙළින්ම සමාජවාදයට සංක්‍රමණය වීමට පුළුවන්කමක් අපට නැත. එනිසා, සුළු නිෂ්පාදනයේ සහ හුවමාරුවෙහි ස්වභාවික ප්‍රතිඵලයක් ලෙසට යම් තරමක් දුරට ධනපති ක්‍රමය ඇති වීම වැලැක්විය නොහැකිය. එනිසා අපි සුළු නිෂ්පාදනය සහ සමාජවාදය අතර පුරුක ලෙසට, නිෂ්පාදනීය බලවේගයන් වැඩි කිරීමේ මාධ්‍යයක්, මාවතක් සහ ක්‍රමයක් ලෙසට ධනපති ක්‍රමයෙන් (විශේෂයෙන්ම, එය රාජ්‍ය ධනපති ක්‍රමයේ මාර්ගවලට යොමු කිරීමෙන්) ප්‍රයෝජන ගත යුත්තෙමු.

නිලධාරිවාදය පිළිබඳ ප්‍රශ්නය ආර්ථික අතින් ගෙන බලන්න. 1918 මැයි 5 දින අපට ඒවා කිසිවක් දක්නට නොතිබින. ඔක්තෝබර් විප්ලවයෙන් හය මසකට පසුව, පැරණි නිලධාරිවාදී යන්ත්‍රය ඉහළ සිට පහළට සුන් කොට තිබියදී, එහි උවදුරු කිසිවක් අපට නොදැනුනි.

ඉන් අවුරුද්දකට පසුව - රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ අටවැනි සම්මේලනය (1919 මාර්තු 18-23) පක්ෂයේ අළුත් වැඩ පිළිවෙළක් සම්මත කළ අතර, අපි "සෝවියට් ක්‍රමය තුළ නිලධාරිවාදය යළිත් අර්ධ වශයෙන් පුනර්ජීවය ලැබීමක්" ගැන එහි එක එල්ලේම සඳහන් කෙළෙමු. එහිදී මෙම උවදුර පවතින බව පිළිගැනීමට අපි බිය නොවූයෙමු. අපට අවශ්‍ය වූයේ එය අනාවරණය කිරීමට, හෙළිදරව් කිරීමට හා පහරට ලක් කිරීමටත්, එයට විරුද්ධව සටන් කිරීම සඳහා කල්පනාව, අධිෂ්ඨානය, ධෛර්යය හා ක්‍රියාකාරිත්වය දිරිගැන්වීමටත්ය.

අවුරුදු දෙකකින් පසුව, නිලධාරිවාදයේ උවදුරු ගැන සාකච්ඡා කළ සෝවියට් සභාවල අටවැනි (1920 දෙසැම්බර්) සම්මේලනයෙන් පසුව සහ මෙම උවදුරු ගැන විශ්ලේෂණය කිරීම හා සමීප ලෙස සම්බන්ධ වූ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වාද විවාද ගැන සම්පිණ්ඩනයක් කළ රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ දහවැනි (1921 මාර්තු) සම්මේලනයෙන් පසුව, 1921 වසන්තයේදී, එම උවදුරු වඩාත් පැහැදිලි සහ නපුරු ස්වභාවයෙන් අපට දක්නට ලැබේ. ඒවායේ ආර්ථික මූලයන් මොනවාද? ඒවා බොහෝ විටම ද්විධ ස්වභාවයක් ගනිති. දියුණු ධනපති පංතියට එක් අතකින් කම්කරුවන්ගේ (සහ අර්ධ වශයෙන් ගොවි ජනතාවගේ) විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව පාවිච්චි කිරීම සඳහා නිලධාරිවාදී යන්ත්‍රයක්, මූලික වශයෙන් යුද්ධමය යන්ත්‍රයක් සහ ඊළඟට අධිකරණයක් ආදිය අවශ්‍ය වන්නේය. එය අපට නැති දෙයකි. අපට ඇත්තේ ධනපතියන්ට විරුද්ධව ඉලක්ක කර තිබෙන පංති උසාවිය. අපේ හමුදාව ධනපති විරෝධී පංතිමය හමුදාවකි. නිලධාරිවාදයේ උවදුරු යුද්ධ හමුදාව තුළ නැත. ඒවා ඇත්තේ යුද්ධ හමුදාවට සේවය කරන ආයතනවලය. අපගේ රටෙහි නිලධාරිවාදී ව්‍යවහාරයන්ට ඇති ආර්ථික මූලයන් විවිධය. ඒවා නම්, ක්ෂුද්‍ර ප්‍රමාණ තරමට බිඳී සහ විසිරී ගිය තත්ත්වයක සිටින සුළු නිෂ්පාදකයන් හා ඔවුන්ගේ දුප්පත්කමද, නූගත්කමද, අසංස්කෘතියද, මාර්ග පහසුවත්, කෘෂිකර්මාන්තය සහ කර්මාන්තය අතර හුවමාරුවත් නොමැතිකමද, කෘෂිකර්මාන්තය සහ කර්මාන්තය අතර සම්බන්ධය හා අන්තර්-සම්බන්ධය නොමැතිකමද වේ. මෙය බොහෝ දුරටම සිවිල් යුද්ධයේ ප්‍රතිඵලයකි. අපට එරෙහිව සම්බාධන පනවා තිබියදී, සෑම පැත්තෙන්ම අප වට කර, මුළු ලෝකයෙන්ම වෙන් කර, පසුව ධාන්‍ය ලැබෙන දකුණෙන්, සයිබීරියාවෙන් හා ගල් අඟුරු බිම්වලින්ද වෙන් කර තිබියදී කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීමේ හැකියාවක් අපට නොවීය. ''යුද්ධ කාලීන කොමියුනිස්ට් ක්‍රමය'' ක්‍රියාත්මක කිරීමේදී, නැතහොත්, ඉතාමත් අවදානම් සීමාන්තයන්ට යාමේදී පැකිලෙමින් සිටීමේ හැකියාවක් අපට නොවීය. කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ පාලනය ආරක්ෂා කර ගැනීම සඳහා අපට අර්ධ සාගත පැවැත්මක් සහ අර්ධ සාගතයට වඩා දරුණු පැවැත්මක් දරාගැනීමට සිදුවිය. එසේ පවතින අතර, අභූත පූර්ව විනාශයක් සහ ආර්ථික හුවමාරුව නොමැති තත්ත්වයක් තිබියදී, සෑම අමාරුකමක්ම විඳ දරා ගනිමින් බලය රැක ගැනීමට අපට සිදු විය. සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් මෙන් නොව (ඔවුන් ධනපතියන් පසුපස යාමට බොහෝ දුරට හේතු වූයේ ඔවුන්ගේ බිය පත් ස්වභාවයය) අප බිය පත් වීමට අපි ඉඩ නොදුන්නෙමු. එහෙත් සම්බාධනයට හසු කළ රටක, වටලන ලද බල කොටුවක ජයග්‍රහණයට හේතු වූ ඒ සාධකය, 1921 වසන්තය වන විට, අවසාන සුදු හමුදා බලකායයන් රු. ස. ඒ. සෝ. ස. භූමියෙන් පලවා හැරීමත් සමගම, එහි නරක පැත්ත අනාවරණය කළේය. වටලන ලද බල කොටුවක හුවමාරුව සම්පූර්ණයෙන්ම ''අගුලු ලා තැබීම'' කළ හැකි විය. එහි එය

නොකර බැරි විය. පොදු ජනතාව විස්මයජනක වීරත්වයක් පාමින් සිටියදී තුන් අවුරුද්දක් තිස්සේ මෙය කළ හැකි විය. ඉන් පසුව සුළු නිෂ්පාදකයාගේ විනාශය වැඩි විය; මහා පරිමාණ කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීම තවත් ප්‍රමාද විය. එය කල් තැබීමට සිදු විය. ''වැටලීමේ'' උරුමයක් වූත්, සුළු නිෂ්පාදකයාගේ තනිවූ හා පීඩිත ස්වභාවය මත ගොඩ නැගුනු උඩු ව්‍යුහය වූත් නිලධාරිවාදී ව්‍යවහාරයන් සම්පූර්ණයෙන්ම අනාවරණය විය.

උවදුරකට විරුද්ධව වඩාත් දැඩි ලෙස සටන් කරනු පිණිස, නැවත නැවතත් මුල සිටම පටන් ගනු පිණිස, එම උවදුර තිබෙන බව පිළිගැනීමට අපි බිය නොවිය යුත්තෙමු. අපගේ ක්‍රියාකාරිත්වයේ සෑම අංශයකදීම මෙය බොහෝ වරක් කිරීමට, ඉතිරි වූ දේ නිම කිරීමට සහ ප්‍රශ්නය වෙත සමීප වීමේ විවිධ මාර්ග සොයා ගැනීමට අපට සිදු වේ. මහා පරිමාණ කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීමේදී ඇති වී තිබෙන පැහැදිලි ප්‍රමාදය නිසා කර්මාන්තය හා කෘෂිකර්මාන්තය අතර හුවමාරුවට ''අගුලු වැටී තිබීම'' නොදැරිය හැකි දුෂ්කරතාවයක් බවට පත්ව ඇත. ඒ අනුව බලන කල, අපට කළ හැකි දේ කෙරෙහි, සුළු කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීම, ඒ අතින් කටයුතු දිරිගැන්වීම, යුද්ධය හා සම්බාධනය නිසා ව්‍යුහයේ අඩ වශයෙන් බිඳ වැටුනු ඒ පැත්තට රුකුල් දීම කෙරෙහි යොමු විය යුත්තෙමු. මොන අමාරුකමක් හෝ විඳ වෙළඳාම සංවර්ධනය කිරීමට අපට හැකි සියල්ලක්ම කළ යුත්තෙමු. ධනපති ක්‍රමයට අප දමා තිබෙන සීමාවන් (ආර්ථිකයේදී ඉඩම් හිමියන් සහ ධනපතියන් අසන්තක කිරීම සහ දේශපාලනයේදී කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ පාලනය) ප්‍රමාණවත් තරම් පටු හා ''මැදහත්'' වන හෙයින්, ධනපති ක්‍රමය ගැන නොබියව අපි වෙළඳාම සියළු ආකාරයකින්ම සංවර්ධනය කළ යුත්තෙමු. ද්‍රව්‍ය බද්දෙහි මූලික අදහස සහ ආර්ථික වැදගත්කම මෙයයි.

''සුළු'' මාධ්‍යයන් අනුසාරයෙන් වුව, කුඩා පරිමාණයෙන් වුව, ආර්ථික සංවර්ධනයෙහිදී — ගුබෙර්නියා ප්‍රදේශවල, ඊට වඩා උයෙස්ඩ් ප්‍රදේශවල හා ඊටත් වඩා වොලොස්ට් ප්‍රදේශවල හා ගම්වල — ප්‍රාදේශීය ක්‍රියාරම්භකත්වය ජනිත කිරීමට, ප්‍රාදේශීය සුළු කර්මාන්ත දියුණු කිරීමෙන් එයට ආධාර කිරීමට, පක්ෂ සහ සෝවියට් කාරකවරුන් සියලු දෙනාම ස්වකීය ප්‍රයත්නයන් යොමු කළ යුතුය. සැලකිලිමත් භාවයේ යොමු ලක්ෂය සහ ''ප්‍රමුඛ'' ප්‍රයත්නය විය යුත්තේ මෙය බව, ඒකාබද්ධ රාජ්‍ය සැලැස්මෙන් අපේක්ෂා කෙරේ. මෙහිදී පුළුල්තම සහ ගැඹුරුතම ''පදනම්වලට'' ඉතාමත් සමීපව කෙරෙන ඇතැම් වැඩි දියුණු කිරීම් නිසා, මහා පරිමාණ කර්මාන්තය වඩාත් ශක්තිමත් හා සාර්ථක ලෙස ප්‍රකෘතිමත් කිරීම වෙත සීඝ්‍ර ලෙස පරිවර්තනය වීමට ඉඩ සැලසෙනු ඇත.

මේ දක්වා ආහාර සම්පාදක කාරකවරයා දැන සිටියේ එකම මූලික

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උපදේශයකි: අත් කර ගත යුතු ධාන්‍ය සියයට 100 ක් එකතු කරනු. දැන් ඔහුට ක්‍රියාත්මක කිරීමට ඇතිතේ වෙනත් උපදේශයකි: අය බද්දෙන් සියයට 100 ක් හැකි කෙටිම කාලය තුළ භාණ්ඩ වෙනුවෙන් හුවමාරුවට තවත් සියයට 100 ක් එකතු කරනු.බද්දෙන් සියයට 75 ක් හා මහා පරිමාණ සහ සුළු කර්මාන්තයේ භාණ්ඩ වෙනුවෙන් හුවමාරු කිරීමෙන් (දෙවැනි සියයෙන්) සියයට 75 ක් එකතු කරන අය, බද්දෙන් සියයට 100 ක් හා හුවමාරුව මගින් (දෙවැනි සියයෙන්) සියයට 55 ක් එකතු කරන අයට වඩා ජාතික වැදගත්කමකින් යුත් වඩාත් ප්‍රයෝජනවත් මෙහෙයක් ඉටු කරන්නෝ වෙති. ආහාර සම්පාදක කාරකවරයාගේ කර්තව්‍යය දැන් වඩාත් සංකීර්ණ වන්නේය. එක් අතකින් එය රාජ්‍ය ආදයම් කර්තව්‍යයකි: හැකි තරම් ඉක්මණින් සහ හැකි තරම් කාර්යක්ෂම ලෙස බද්ද එකතු කරනු. අනිත් අතින් එය පොදු ආර්ථික කර්තව්‍යයකි: කෘෂිකර්මාන්තය සහ කර්මාන්තය අතර හුවමාරුව වැඩි කරන සහ එය ශක්තිමත් පදනමක් මත තබන පරිද්දෙන්, සමුපකාර මෙහෙයවීමට, සුළු කර්මාන්තයට ආධාර කිරීමට, ප්‍රාදේශීය ක්‍රියාරම්භකතාවය වර්ධනය කිරීමට උත්සාහ කරනු. අප මෙම කර්තව්‍යය හරි හැටි ඉටු නොකරන බව අපගේ නිලධාරිවාදී ව්‍යවහාරයෙන් ඔප්පු වේ. මේ හා සම්බන්ධයෙන් ධනපතියන්ගෙන් අප උගත යුතු හා අපට උගත හැකි බොහෝ දේ තවමත් තිබෙන බව පිළිගැනීමට අපි බිය නොවිය යුත්තෙමු. අපි විවිධ ගුබෙර්නියා, උයෙස්ඩ්, වොලොස්ට් සහ ගම් ප්‍රදේශවල ප්‍රායෝගික අත්දැකීම් සංසන්දනය කර බලන්නෙමු. ලොකු සහ කුඩා පෞද්ගලික ධනපතියන් මේ මේ තරම් උපයා ගෙන ඇත. දළ වශයෙන් ඔවුන්ගේ ලාභ එසේය. ''ශික්ෂණය'' සඳහා අප ඔවුන්ට ගෙවිය යුතු කප්පම, නැතහොත්, ගාස්තුව එයයි. අපට යමක් උගෙන ගන්නට ලැබෙන්නේ නම් ඒ සඳහා ගෙවීමට අප අකමැති නොවෙමු. සමුපකාරය මගින් අවට ප්‍රදේශවල එතරම් දියුණුවක් ඇති කර ගෙන තිබේ. සමුපකාර ලබා ගෙන තිබෙන ලාභ ඒවාය. තුන්වැනි තැනක හුදෙක්ම රාජ්‍ය සහ කොමියුනිස්ට් විධික්‍රම මගින් (දැනට මෙම තුන්වැනි තත්ත්වය දුර්ලභ විශේෂත්වයක් වනු ඇත) එම දියුණුව ලබා ගෙන ඇත.

ද්‍රව්‍ය බද්ද ගෙවීමෙන් පසු ඉතිරි වන අතිරික්ත තොග සඳහා ''හුවමාරුව'' පිළිබඳ විවිධ අත්හද බැලීම්, නැතහොත්, විධික්‍රම වහ වහා සංවිධානය කිරීම සෑම ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානයකට සහ ගුබෙර්නියා විධායක කාරක සභාවලට යටත් වූ ආර්ථික සාකච්ඡා සභාවකම[76] මූලික කර්තව්‍යය විය යුතුය. මාස කීපයකින් පසුව, සංසන්දනය කර බැලීම සහ අධ්‍යයනය සඳහා ප්‍රායෝගික ප්‍රතිඵල ගැන විස්තර ලබා ගත යුතුය. ප්‍රාදේශීය, නැතහොත්, ආනයනය කළ ලුණු, ආසන්නතම නගරයෙන් පැරපින් තෙල්; හස්තකාර්මික ලී වැඩ කර්මාන්තය; ප්‍රාදේශීය අමුද්‍රව්‍ය උපයෝගී කර ගනිමින්, ඇතැම් විට ඉතා වැදගත් නොවුවත්, ගොවි ජනයාට අවශ්‍ය හා ප්‍රයෝජනවත් වන සමහර භාණ්ඩ නිපදවන හස්ත කර්මාන්ත; ''කොළ පාට ගල් අඟුරු'' (විද්‍යුතනකරණය සඳහා කුඩා ප්‍රාදේශීය ජල සම්පත් උපයෝගී කර ගැනීම) සහ එවැනි අන් කටයුතු — යන මේ සියල්ල කුමන ආකාරයකින් හෝ කර්මාන්තය සහ කෘෂිකර්මාන්තය අතර හුවමාරුව පණ ගැන්වීම සඳහා යොදා ගත යුතුය. පෞද්ගලික ධනපති ක්‍රමය මගින් වුව, සමුපකාර නොමැතිව, නැතහොත්, ධනපති ක්‍රමය එක එල්ලේම රාජ්‍ය ධනපති ක්‍රමයට පරිවර්තනය කිරීමෙන් තොරව වුව, මෙම ක්ෂේත්‍රයෙහිදී හොඳම ප්‍රතිඵල ලබා ගන්නා අය, කොමියුනිස්ට්වාදයේ පිරිසිදුකම ගැන ''සිතමින්'' රාජ්‍ය ධනපති ක්‍රමය සහ සමුපකාර සඳහා රෙගුලාසි, නීති සහ උපදෙස් කෙටුම්පත් කරන, එහෙත් වෙළඳාම පණ ගැන්වීමට කිසිවක් නොකරන අයට වඩා, රුසියාවේ සමාජවාදය ගොඩ නැගීමේ සත් ව්‍යාපාරය සඳහා ආධාරකාරී වෙති.

පෞද්ගලික ප්‍රාග්ධනය සමාජවාදයට ආධාර කරන්නේ යයි කණපිට පෙරළූ අර්ථයක් නොවේද?

ඇත්තෙන්ම නැත. එය නම්, ප්‍රතික්ෂේප කළ නොහැකි ආර්ථික සත්‍යයකි. මෙය ප්‍රවාහනය අන්ත විසංධාන තත්ත්වයේ පවතින රටක් වන නිසා, ප්‍රවාහන ක්‍රමය සහ මහා පරිමාණ කර්මාන්තයේ පාලකයා බවට පත්ව සිටින නිර්ධන පංතියේ නායකත්වය යටතේ යුද්ධයෙන් හා සම්බාධනයෙන් මිදී ගොඩ එමින් තිබෙන රටක් වන නිසා, ප්‍රථමයෙන් ප්‍රාදේශීය හුවමාරුව මුල් පෙළේ වැදගත්කමක් දරන බවත්, දෙවැනිව පෞද්ගලික ධනපති ක්‍රමය මගින් සමාජවාදයට ආධාර කිරීමේ හැකියාවක් තිබෙන බවත් (රාජ්‍ය ධනපති ක්‍රමය ගැන කිවමනා නොවේ), අනිවාරණීය වශයෙන් අදහස් වේ.

අපි වචන ගැන තර්ක විතර්ක නතර කරමු. එවැනි දේ පමණට වැඩියෙන් කිරීමේ පුරුද්ද තවමත් අප වෙත ඇත. අපට වඩාත් විවධාකාර ප්‍රායෝගික අත්දැකීම් තිබෙන අතර ඒ ගැන වඩාත් පුළුල් අධ්‍යයනයක් කළ යුත්තෙමු. සමහර අවස්ථාවලදී ඉතාමත් කුඩා පරිමාණයකින් වුව ප්‍රාදේශීය වැඩ ආදර්ශමත් ලෙස සංවිධානය කිරීම මධ්‍යම රාජ්‍ය කටයුතුවල බොහෝ අංශවලට වඩා ජාතික වශයෙන් වැදගත් වන්නේය. පොදු වශයෙන් ගොවිජන ගොවිතැනෙහි සහ විශේෂයෙන්ම, කාර්මික භාණ්ඩ සඳහා කෘෂිකාර්මික නිෂ්පාදිතයන් හුවමාරු කිරීම සම්බන්ධයෙන් දැන් බල පවත්වන තත්ත්වයන් ඉඳුරාම මේවාය. තනි වොලොස්ට් ප්‍රදේශයක පවා මේ හා සම්බන්ධයෙන් කරන ආදර්ශමත් සංවිධානය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඕනෑම මහජන කොමිසාර් අංශයක මධ්‍යම ආයතන යන්ත්‍රය "ආදර්ශමත්" ලෙස සංවිධානය කරනවාට වඩා ජාතික වශයෙන් වැදගත්ය. පසුගිය අවුරුදු තුන හමාරක කාලය තිස්සේ අපගේ මධ්‍යම ආයතන යන්ත්‍රය කොතරම් දුරට ගොඩ නගා තිබේදයත්, යම් තරමකට හානිකර අනුබැඳියාවක් ඇති කර ගැනීමට පවා එය සමත් වී තිබේ. ඉක්මනින්ම එහි සැලකිය යුතු වැඩි දියුණුවක් ඇති කිරීමේ හැකියාව අපට නැත. එය කරන්නේ කෙසේද යන්න අපි නොදනිමු. එය මූලික වශයෙන් වැඩි දියුණු කිරීමේ වැඩට ආධාර කිරීම, නව බලවේගයන් අභ්‍යන්තරයට ගලා ඒමට සැලැස්වීම, නිලධාරිවාදී ව්‍යවහාරයන්ට විරුද්ධව සාර්ථක ලෙස සටන් කිරීම හා මෙම හානිකර අනුබැඳියාව මැඩ පැවැත්වීම මතු වී ආ යුත්තේ, කුඩා පරිමාණයෙන් වුව ආදර්ශමත් "සංකීර්ණයන්" සංවිධානය කිරීම සමගින් ප්‍රදේශ සහ පහළ පිරිස් තුළිනි. මා "සංකීර්ණය" යනුවෙන් සඳහන් කරන්නේ හුදෙක් එක ගොවි පළක්, එක කර්මාන්ත අංශයක්, නැතහොත්, එක පැක්ටරියක් අදහස් කිරීමට නොව, එක් කුඩා ප්‍රදේශයක වුව ආර්ථික සම්බන්ධතා සමස්තයක්, ආර්ථික හුවමාරු ක්‍රියා මාර්ග සමස්තයක් අදහස් කිරීමටය.

මධ්‍යස්ථානයේ වැඩ කිරීමේ ඉරණමට කැප වී සිටින අපි යන්ත්‍රය වැඩි දියුණු කිරීමට සහ නොමහත්, එහෙත්, වහාම කළ හැකි ප්‍රමාණයෙන් එහි නිලධාරිවාදී උවදුරුවලින් එය නිදහස් කිරීමට කටයුතු කරන්නෙමු. නමුත් මෙම කර්තව්‍යයේදී විශාලම කොටස ඉටු වන්නේ සහ ඉටු වනු ඇත්තේ ප්‍රදේශවලිනි. සාමාන්‍ය වශයෙන් කථා කරන විට මට පෙනෙන හැටියට නම්, මධ්‍යස්ථානයට වඩා හොඳ තත්ත්වයක් ප්‍රදේශවල ඇත. මෙය වටහා ගත හැකි දෙයකි. මන්දයත්, නිලධාරිවාදයේ උවදුරු සාමාන්‍ය වශයෙන්ම මධ්‍යස්ථානයට සංකේන්ද්‍රණය වී පවතින බැවිනි. මේ අතින් බලන කල, මොස්කව් නගරය මුළු සමූහාණ්ඩුවේම තිබෙන නරකම නගරය, පොදු වශයෙන් නරකම "ප්‍රදේශය" වීම නොවැලැක්විය හැකි දෙයකි. ප්‍රදේශවල සාමාන්‍ය තත්ත්වයෙන් හොඳ හා නරක අතට එහා මෙහා දිවෙන අවස්ථා දක්නට ඇත. ඉන් නරක අවස්ථා දක්නට ලැබෙන්නේ හොඳ අවස්ථාවලට වඩා අඩුවෙනි. නරක අතට යන අවස්ථා ඇති වන්නේ, කොමියුනිස්ට්වරුන් ඉව්වාවෙන් රවටමින් ගොවි ජනතාවට විරුද්ධව නින්දිත අපරාධ සහ දුෂ්ටකම් කිරීමෙහි යෙදෙන හිටපු ආණ්ඩු නිලධාරීන්, ඉඩම්හිමියන්, ධනපතියන් සහ වෙනත් නීචයන්ගේ විෂමාචාර හේතුවෙනි. මෙයට පිළිතුරු දිය යුත්තේ ත්‍රස්තවාදී ක්‍රම මගිනි ලඝු නඩු විභාගයෙන් හා කොන්දේසි විරහිත වෙඩි තැබීමෙනි. මාර්තවිලාට, චෙර්නොවිලාට සහ ඔවුන් වැනි පාක්ෂික නොවන අශිෂ්ටයන්ට, තමන්ගේ පපුවට ගසා ගනිමින්

මෙසේ මවිත ස්වරයෙන් කියන්නට ඉඩ හරිමු: "දෙවියනි, මා 'මොවුන්' මෙන් නොවීම සහ කලෙකත් ත්‍රස්තවාදය පිළිගෙන නොතිබීම ගැන ඔබ වහන්සේට ස්තුති කරමි." මෙම නෝන්ජලයෝ "ත්‍රස්තවාදය නොපිළිගනිති". එයට හේතුව ඔවුන් කම්කරුවන් හා ගොවීන් රැවටීම සඳහා සුදු හමුදා පිරිස්වල නිවට දසයන් වීමට තෝරා ගෙන තිබෙන හෙයිනි. සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් "සමාජවාදී" කොඩියට මුවා වී සිටිමින් පොදු ජනතාව සුදු හමුදා ත්‍රස්තවාදයේ අනුකම්පාව යටතට පත් කිරීමේ ස්වකීය කර්තව්‍යය ඉටු කරමින් සිටින හෙයින්, ඔවුහු "ත්‍රස්තවාදය නොපිළිගනිති." රුසියාවේ කෙරෙන්ස්කි හා කර්නිලව් කැරළි කුමන්ත්‍රණයෙන්ද,[77] සයිබීරියාවේ කොල්චාක් පාලනයෙන්ද, ජෝර්ජියාවේ මෙන්ෂෙවික්වාදයෙන්ද මෙය ඔප්පු විය. පින්ලන්තයේ, හංගේරියාවේ, ඕස්ත්‍රියාවේ, ජර්මනියේ, ඉතාලියේ, බ්‍රිතාන්‍යයේ ආදී රටවල දෙවැනි ජාත්‍යන්තරයේ සහ "දෙක හමාරේ" ජාත්‍යන්තරයේ වීරයන්ගෙන්ද මෙය ඔප්පු විය. සුදු හමුදා ත්‍රස්තවාදයේ මෙහෙකාර ආධාර කරුවා, ත්‍රස්තවාදය ප්‍රතික්ෂේප කිරීම නැමති ඔහුගේ මඩවලෙහි පෙරළී පෙරළී සිටියාවේ. අපි අම්හිරි, නමුත්, ඒකාන්ත සත්‍ය කථා කරන්නෙමු. 1914-1918 අධිරාජ්‍යවාදී යුද්ධයෙන් පසුව, පෙර නොවූ විරූ අර්බුදයකට හසුව තිබීමෙන්, පැරණි බැඳීම් බිඳ වැටීමෙන් සහ පංති අරගලය උග්‍ර වීමෙන් වියවුලට පත් රටවල, එනම්, ලෝකයේ සියලුම රටවල ත්‍රස්තවාදය ඉවත දැමිය නොහැකිව තිබේ. වංචාකරුවන් සහ වදන් හරඹ කරුවන් මොනවා කීවත් පවතින තත්ත්වය එයයි. එක්කෝ අමෙරිකානු, බ්‍රිතාන්‍ය (අයර්ලන්ත), ඉතාලියානු (පැසිස්ට්), ජර්මන්, හංගේරියානු සහ වෙනත් වර්ගවල සුදු හමුදා ධනපති ත්‍රස්තවාදයය. නැතහොත්, රතු, නිර්ධන පංති ත්‍රස්තවාදය ය. මැද මාවතක්, "තුන්වැනි" මාවතක් නොමැත. එවැන්නක් තිබිය හැක්කේද නැත.

හොඳ පැත්තට දිවෙන අවස්ථා පිළිබිඹු වන්නේ නිලධාරිවාදයේ උවදුරු මැඩ පැවැත්වීමේදී ලද ජයග්‍රහණවලත්, කම්කරුවන්ගේ සහ ගොවි ජනතාවගේ අවශ්‍යතාවයන්ට දක්වන ඉමහත් අවධානය සහ ආර්ථිකය සංවර්ධනය කිරීමේදීත්, ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීමේදීත්, කෘෂිකර්මාන්තය සහ කර්මාන්තය අතර ප්‍රාදේශීය හුවමාරුව පණ ගැන්වීමේදීය. හොඳ ආදර්ශයන් නරක ආදර්ශවලට වඩා සංඛ්‍යාවෙන් අධික නමුත් ඒවා දුලබය. එසේ වුවත් එම ආදර්ශයන් ඇත. සිවිල් යුද්ධයෙන් සහ අගහිඟ කම්වලින් පදම් වූ තරුණ, නව කොමියුනිස්ට් බලවේගයන් සෑම ප්‍රදේශයකම ඉදිරියට එමින් සිටිති. මෙම බලවේගයන් නිතිපතා පහළ සිට ඉහළ තනතුරුවලට උසස් කිරීමට අප කරන දේ තවමත් කිසිසේත් ප්‍රමාණවත් නොවේ. දැනට කෙරෙනවාට වඩා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිරතුරු ලෙස සහ වඩාත් පුළුල් පරිමාණයකින් මෙය කළ හැකිය. එය කළ යුතුය. කාරකවරුන් සමහර දෙනෙක් මධ්‍යස්ථානයේ කරන වැඩවලින් ප්‍රාදේශීය වැඩට මාරු කළ හැකිය. මාරු කළ යුතුය. උයෙස්ඩ් සහ වොලොස්ට් ප්‍රදේශවල නායකත්වය දරන පුද්ගලයන් මෙන් ක්‍රියා කරමින්, ආදර්ශමත් ක්‍රියාමාර්ගයක් අනුව සමස්තයක් වශයෙන් එහි ආර්ථික කටයුතු සංවිධානය කිරීමට ඔවුන්ට හැකිවන හෙයින්, මධ්‍යස්ථානයේ කිසියම් කාර්යයක් ඉටු කරනවාට වඩා ජාතික වශයෙන් බෙහෙවින් වැදගත් මෙහෙයක් ඔවුන් මෙනයින් ඉටු කරනු ඇත. වැඩ කටයුතු ආදර්ශමත් ලෙස සංවිධානය කිරීම නිසා නව කාරකවරුන් පුහුණු කිරීමට ආධාරයක් ලැබෙන අතරම, අන් දිස්ත්‍රික්කවලට සාපේක්ෂ වශයෙන් පහසුවෙන් අනුගමනය කළ හැකි ආදර්ශයන්ද එයින් ලැබෙනු ඇත. හොඳ ආදර්ශයන් අනුගමනය කරන සේ රටමුළුල්ලේම තිබෙන අන් දිස්ත්‍රික්කයන් උනන්දු කරවීමට සහ නියමයක් ලෙස එසේ කරන සේ ඒවා යොමු කිරීම සඳහා පවා, මධ්‍යස්ථානයේ සිටින අපට කළ හැකි කටයුතු බොහෝය.

කෘෂිකර්මාන්තය හා කර්මාන්තය අතර "හුවමාරුව", එනම්, කුඩා කර්මාන්තවල, ප්‍රධාන වශයෙන්ම හස්ත කර්මාන්තවල නිෂ්පාදනයන් වෙනුවට, බදු අයකිරීමෙන් පසු ඉතිරි වන අතිරික්තයන් හුවමාරුව ක්‍රියාත්මක කරවීමට ස්වාධීන, දක්ෂ සහ බුද්ධිමත් ප්‍රාදේශීය ක්‍රියාරම්භකතාවයක් අවශ්‍ය වේ. එම කාර්යයෙහි ස්වභාවයෙන්ම එම අවශ්‍යතාවය මතු වේ. උයෙස්ඩ් සහ වොලොස්ට් ප්‍රදේශවල කටයුතු ආදර්ශමත් ක්‍රියාමාර්ගයන් ඔස්සේ සංවිධානය කිරීම දැන් ජාතික ස්ථාවරයෙන් ඉතාමත් වැදගත් වන්නේ මේ නිසාය. නිදසුනක් ලෙසට පසුගිය පෝලන්ත යුද්ධයේදී යුද්ධමය කටයුතුවලදී, නිලධාරිවාදී ධුරාවලියෙන් බැහැර යාමට, සමූහාණ්ඩුවේ විප්ලවවාදී යුද්ධ මණ්ඩලයේ සාමාජිකයන් (මධ්‍යස්ථානයේ දරන තනතුරු දැරීමට ඔවුන්ට ඉඩ දෙන අතරම) "පහළ ශ්‍රේණියකට පත් කිරීමට", නැතහොත්, පහළ නිලයකට මාරු කිරීමට අපි බිය නොවූයෙමු. සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ සාමාජිකයන්, නැතහොත්, එහි මණ්ඩලවල සාමාජිකයන්, එසේත් නැතහොත්, උසස් තනතුරු දරන සහෝදරවරුන් කීප දෙනෙක් දැන් උයෙස්ඩ්, නැතහොත්, වොලොස්ට් ප්‍රදේශවල පවා වැඩට මාරු නොකළ යුතුද? එසේ කිරීම ගැන "ලජ්ජා වීමට" තරම් අපි ඇත්තෙන්ම "නිලධාරිවාදී වී" නැත්තෙමු. එපමණක් නොව එම පත්වීම භාර ගැනීමට සතුටු වනු ඇති කාරකවරු දුසිම් ගණන් මධ්‍යම මණ්ඩලවලින් අපට සොයා ගැනීමටද හැකිය. එයින් මුළු සමූහාණ්ඩුවේම ආර්ථික සංවර්ධනයට විශාල යහපතක් සිදු වනු ඇත. එමෙන්ම ආදර්ශමත් වොලොස්ට්, නැතහොත්, උයෙස්ඩ් ප්‍රදේශ ඉටු කරන කාර්ය කොටස ශ්‍රේෂ්ඨ පමණක් නොව නිශ්චිත වශයෙන්ම තීරණාත්මක සහ ඓතිහාසික එකක්ද වනු ඇත.

ලාභ ගැරීම මැඩ පැවැත්වීමේ ප්‍රශ්නය කෙරෙහි අප දක්වන ආකල්පයේ අවශ්‍ය වෙනස ඇති වීමට අදාළ වූ සුළු, එහෙත්, වැදගත් කරුණ අපි මෙහි ලා සටහන් කර ගත යුත්තෙමු. අපි "නියම" වෙළඳාම ඇති වීමට සැලැස්විය යුත්තෙමු. එය රජයේ පාලනය මඟ හරින වෙළඳාමක් නොවේ. එය සංවර්ධනය කිරීම අපගේ වාසියට හේතු වේ. නමුත් ලාභ ගැරීම, එහි දේශපාලන ආර්ථික අර්ථයෙන් ගත් කල, එය "නියම" වෙළඳාමෙන් වෙන් කොට හඳුනා ගැනීම අපහසුය. වෙළඳාම් කිරීමේ නිදහස යන ධනපති ක්‍රමය ය. ධනපති ක්‍රමය යනු ලාභ ගැරීමය. මෙය නොසලකා හැරීම මෝඩකමක් වනු ඇත.

එසේ නම් කුමක් කළ යුතුද? ලාභ ගැරීම මින් පසු දඬුවම් ලැබිය යුතු වරදක් නොවන බව අපි ප්‍රකාශ කළ යුත්තෙමුද?

නැත. අපි ලාභ ගැරීම ගැන නීති සියල්ලම සංශෝධනය සහ යළි කෙටුම්පත් කළ යුත්තෙමු. එසේම, සෑම ආකාරයේම සොරකමක් රජයේ පාලනය, අධීක්ෂණය සහ ගිණුම් තැබීම සෘජු, නැතහොත්, වක්‍ර ලෙස, විවෘත, නැතහොත්, ආවෘත ලෙස මඟ හැරීමත් දඬුවම් ලැබිය යුතු වැරදි බව අප ප්‍රකාශ කළ යුත්තෙමු. (ඇත්ත වශයෙන්ම තෙගුණ කළ තදබල ගතියකින් ඊට විරුද්ධව නඩු කටයුතු කළ යුත්තෙමු). බොහෝ දුරට අනිවාරණීය, එහෙත්, අවශ්‍ය වන ධනපති ක්‍රමයේ සංවර්ධනය රාජ්‍ය ධනපති ක්‍රමයේ මාර්ගයන්ට යොමු කිරීමේදී අපට සාර්ථකත්වය ලැබිය හැකි වන්නේ ප්‍රශ්නය මේ ආකාරයෙන් ඉදිරිපත් කළ විටය. (මහජන කොමිසාර් මණ්ඩලය ලාභ ගැරීමට විරුද්ධ නීති සංශෝධනය කිරීමේ කටයුතු දැනටමත් අරඹා ඇත. නැතහොත්, එම කටයුතු අරඹන ලෙස එය නියෝග කර ඇත.

දේශපාලන සම්පිණ්ඩනය සහ නිගමන

දේශපාලන තත්ත්වය සහ ඉහත කෙටියෙන් විස්තර කරන ලද ආර්ථික සිද්ධීන් හා සම්බන්ධයෙන් එය සකස් වූ සහ වෙනස් වූ ආකාරය ගැන සංක්ෂිප්ත වශයෙන් හෝ සඳහන් කිරීමට මට සිදු වේ.

1921 අපගේ ආර්ථිකයේ මූලික අංග ලක්ෂණ 1918 මෙන්ම වන බව මම දැනටමත් කියා ඇත්තෙමි. ප්‍රධාන වශයෙන් අස්වැන්න පාළුව සහ ගවයන් විනාශ වීම නිසා 1921 වසන්තයේදී ගොවි ජනතාවගේ තත්ත්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වයන් ඉතා බරපතල ලෙස පිරිහී ගියේය. යුද්ධය හා සම්බාධනය නිසා ඊට පෙරද ඔවුන්ගේ තත්ත්වය අයහපත්ව පැවතුනි. මෙහි ප්‍රතිඵලයක් ලෙසට දේශපාලන වැනෙනසුලුකම් ඇති විය. පොදු වශයෙන් ගත් කල එයින් ප්‍රකාශ වන්නේ සුළු නිෂ්පාදකයාගේ හුදු ''ස්වභාවය'' ය. ඔවුන්ගේ වැනෙනසුලුකම් ඉතාමත් පැහැදිලි ලෙස ප්‍රකාශිත වූ අවස්ථාව ක්‍රොන්ෂ්ටාඩ්ට් හමුද කුමන්ත්‍රණය විය.

ක්‍රොන්ෂ්ටාඩ්ට් සිදුවීම්වල ඉතාමත් ස්වභාව නිරූපී අංග ලක්ෂණය වූයේ සුළු ධනපති පිරිස්වල වැනෙනසුලු භාවයයි. එහිදී පැහැදිලි, නිශ්චිත සහ සම්පූර්ණයෙන් හැඩ ගැසුනු යමක් වී නම් ඒ ඉතා ස්වල්ප විය. ''නිදහස'', ''වෙළඳම් කිරීමේ නිදහස'', ''විමුක්තිය'', ''බොල්ෂෙවික්වරුන් නොමැතිව සෝවියට් සභා'', නැතහොත්, ''සෝවියට් සභාවලට නැවත තෝරා පත් කිරීම්'', එසේත් නැතහොත්, ''පක්ෂ ආඥාදායකත්වයෙන්'' සහනයක් ලැබීම යනාදිය ගැන වූ හිස් සටන් පාඨ අපට අසන්නට ලැබුණි. මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදීහු යන දෙපිරිසම ක්‍රොන්ෂ්ටාඩ්ට් ව්‍යාපාරය ''තමන්ගේම'' ව්‍යාපාරය ලෙස ප්‍රකාශයට පත් කළහ. වික්ටර් චෙර්නොව් ක්‍රොන්ෂ්ටාඩ්ට් බලා පණිවුඩකරුවෙක් යැව්වේය. පසුකී අයගේ යෝජනාව අනුව, ක්‍රොන්ෂ්ටාඩ්ට් නායකයන්ගෙන් කෙනෙක් වූ මෙන්ෂෙවික්වර වාල්ක් ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය සඳහා ඡන්දය දුන්නේය. නිමේෂයකින් මෙන්, විදුලි වේගයෙන් යයි කිව හැකි ආකාරයෙන් සුදු හමුද ''ක්‍රොන්ෂ්ටාඩ්ටයට පක්ෂව'' ඔවුන්ගේ බලවේගයන් සියල්ලම මෙහෙයවූහ. ක්‍රොන්ෂ්ටාඩ්ට්හි වූ ඔවුන්ගේ යුද්ධ විශේෂඥයන්, කස්ලොව්ස්කි පමණක් නොව, විශේෂඥයන් ගණනාවක්ම ඔරේනියන්බවුම්හි ගොඩ බෑසීම සඳහා සැලැස්මක් කෙටුම්පත් කළහ. වැනෙනසුලු මෙන්ෂෙවික්, සමාජවාදී-විප්ලවවාදී සහ පාක්ෂික නොවන පිරිස් සමූහයා මෙයින් බියට පත් වූහ. විදේශයෙහි පළ කෙරෙන රුසියානු සුදු හමුද පුවත් පත් පනහකට අධික සංඛ්‍යාවක් ''ක්‍රොන්ෂ්ටාඩ්ටයට පක්ෂව'' වියරු ව්‍යාපාරයක් ගෙන ගියහ. මහා බැංකුද, මූල්‍ය ප්‍රාග්ධනයේ සියලුම බලවේගයන්ද, ක්‍රොන්ෂ්ටාඩ්ටයට ආධාර කිරීම සඳහා මුදල් එකතු කළහ. ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය ගැන ඉක්මන් නොවිය යුතු බවත්, සෝවියට් බලයට — බොල්ෂෙවික්වරුන් පමණක් නැතිව — ආධාර කළ හැකි හා ආධාර කළ යුතු බවත් කියමින් ධනපතියන්ගේ සහ ඉඩම් හිමියන්ගේ ඒ බුද්ධිමත් නායකයා වූ කැඩෙට්වර මිල්යුකොව්, නිවට වික්ටර් චෙර්නොව්ට එක එල්ලේම (සහ ක්‍රොන්ෂ්ටාඩ්ට් සිද්ධීන් සම්බන්ධයෙන් පෙට්‍රොග්‍රෑඩයේ සිර ගතව සිටින මෙන්ෂෙවික්වරුන් වන ඩෑන්ට සහ

රෂ්කොව්ට වක්‍ර ආකාරයෙන්ද) ඉතාමත් ඉවසිලිමත් ලෙස පැහැදිලි කළේය.

නමුත්, සුළු ධනපති වදන් හරඹකරුවෙක් වන හිස උදුම්මා ගත් නිවට චෙර්නොව් වැනි, නැතහොත්, ''මාක්ස්වාදය ලෙසට'' පිළිගැන්වීම සඳහා වෙනස් කොටගත් නොසණ්ඩාල ප්‍රතිසංස්කරණවාදයේ වීරයා වන මාර්තව් වැනි අයට වඩා හපන්කමක් දක්වීම පහසු දෙයකි. නියම ලෙසින් කියතොත් මෙහි වැදගත් කම වන්නේ පුද්ගලයෙකු වශයෙන් මිල්යුකොව්ට වැඩි මොළයක් ඇති බව නොව, ලොකු ධනපතියන්ගේ පක්ෂ නායකයා හැටියට ඔහු දරන තත්ත්වය නිසා ඔහු, සුළු ධනපතියන්ගේ නායකයන් වන චෙර්නොව්ලාට හා මාර්තව්ලාට වඩා කරුණුවල පංති අර්ථය හා දේශපාලන අන්තර් ක්‍රියාකාරීත්වය දකින හා වටහා ගන්නා බවයි. මන්ද යත්, ඇත්ත වශයෙන්ම පංති බලවේගයක් වන ධනපතියන් අනිවාරණීය වශයෙන්ම ලෝක ධනපතියන්ගේ සහයෝගය ලබන අතර ඔවුන් ධනපති ක්‍රමය යටතේ රාජාණ්ඩුවත්, ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවත් යන දෙකෙහිදීම පාලකයන් වන හෙයිනි. නමුත්, සුළු ධනපතියන්, එනම්, දෙවැනි ජාත්‍යන්තරයේ සහ ''දෙක හමාරේ'' ජාත්‍යන්තරයේ වීරයන් සියලු දෙනාම, කරුණුවල ආර්ථික ස්වභාවය නිසාම පංති බෙලහීනත්වයේ පිළිබිඹුවක් මිස අන් යමක් විය නොහැකිය. එනිසා වැනෙනසුලු භාවය, වදන් හරඹය සහ අසරණ බව උද්ගත වන්නේය. 1789 දී සුළු ධනපතියන්ට මහා විප්ලවවාදීන් වීමේ හැකියාව තවමත් තිබුණි. 1848 දී ඔවුහු විකට සහ කණගාටුදායක තත්ත්වයක සිටියහ. 1917-1921 දී ඔවුන්ගේ නම් චෙර්නොව්, මාර්තව්ලා, කෞට්ස්කිලා, මැක්ඩොනල්ඩ්ලා, නැතහොත්, ඔබ කැමති වෙනත් කුමක් වූවත්, ඔවුන්ගේ නියම කාර්ය භාරය වී තිබෙන්නේ ප්‍රතිගාමීත්වයේ පිළිකුල් සහගත ඒජන්තවරුන් සහ අන්ත දසයන් සේ කටයුතු කිරීමය.

ක්‍රොන්ෂ්ටාඩ්ටය මෙන්ෂෙවික් සටන් පාඨ පිළිගත්තා පමණක් නොව, සුදු හමුදවල, ධනපතියන්ගේ සහ ඉඩම් හිමියන්ගේ උවමනාවන්ට සම්පූර්ණයෙන්ම උපයෝජනය නොවන බොල්ෂෙවික් විරෝධී ව්‍යාපාරයක් තිබිය හැකි යයි ඔප්පු කළ බවද, මාර්තව් ඔහුගේ බර්ලින් සඟරාවෙන්[78] ප්‍රකාශ කළ කල්හි, ඔහු තමා නොසණ්ඩාල නාසිසස්[79] කෙනෙක් මිස අන් කිසිවෙක් නොවන බව පෙන්නුම් කළේය. ඔහු කියන දෙයෙහි අර්ථය මෙසේය — නියම සුදු හමුද පුද්ගලයන් සියලු දෙනාම ක්‍රොන්ෂ්ටාඩ්ට් හමුද කැරළිකරුවන් ගැන මහත් සේ වර්ණනා කළ බවත්, ක්‍රොන්ෂ්ටාඩ්ටයට ආධාර කිරීම සඳහා බැංකු මගින් මුදල් එකතු කළ බවත් නොසලකා, ඒ ගැන ඇස් වසා ගනිමු! චෙර්නොව්ලා සහ මාර්තව්ලා සමග සංසන්දනය කරන කල, මිල්යු-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොව් නිවැරදිය. එසේ කියන්නේ, ධනපතියන්ගේ සහ ඉඩම් හිමියන්ගේ බලවේගය වන, නියම සුදු හමුදා බලවේගයේ නියම උපක්‍රම අනාවරණය කරන්නේ ඔහු වන හෙයිනි. ඔහු මෙසේ ප්‍රකාශ කරයි: ''බොල්ෂෙවික්වරු බලයෙන් නෙරපෙයි නම්, බලයෙහි වෙනසක් සිදුවෙයි නම්, අප ආධාර දෙන්නේ කාහට වුවද, අප ආධාර දෙන්නේ අරාජිකවාදීන්ට, නැතහොත්, කිසියම් ආකාරයක සෝවියට් ආණ්ඩුවකට වුවද කම් නැත. බලය බොල්ෂෙවික්වරුන්ගෙන් ඈත් වන තාක් කල්, එය වෙනස් වන්නේ දකුණටද, නැතහොත්, වමටද යනුත්, මෙන්ෂෙවිකවරුන් පැත්තටද, නැතහොත්, අරාජිකවාදීන් පැත්තටද යනුත් වැදගත් නොවේ. ඉතිරි හරිය ගැන කිව යුත්තේ මෙයයි. මිල්යුකොව්ලා වන ''අපි', ධනපතියන් හා ඉඩම් හිමියන් වන 'අප', ඉතිරි හරිය ගැන බලා ගන්නෙමු. සයිබීරියාවේ චෙර්නොව් සහ මයිස්කිටද, හංගේරියාවේදී එරවේ චෙර්නොව්ලාට සහ මාර්තව්ලාටද, ජර්මනියේ කෞට්ස්කිටද, වියානාවේ ෆ්‍රෙඩ්රික් ආඩ්ලර්ලා සහ සමාගමටද කළ පරිද්දෙන්ම, අපි අරාජිකවාදී අඟුටුමිට්ටන්ගේ, චෙර්නොව්ලාගේ සහ මාර්තව්ලගේ කන්සට පහරදී ඔවුන් බිම හෙළන්නෙමු''. මෙම නොසණ්ඩාල නාසිසස්ලා මෙන්ෂෙවික්වරු වුවත්, සමාජවාදී-විප්ලවවාදීන් වුවත්, නැතහොත්, පාක්ෂික නොවන අය වුවත්, නියම, එමෙන්ම දූඩි අදහස් ඇති ධනපතියෝ ඔවුන් සිය ගණනින් මෝඩයන් කොට සෑම රටවලම සෑම විප්ලවවලදීම වාර දූසිම් ගණනකදී ඔවුන් පළවා හැර ඇත්තාහ. ඉතිහාසය එය ඔප්පු කරයි. සත්‍ය කරුණුවලින් එය සනාථ වේ. නාසිසස්ලා කථා කරනු ඇත. මිල්යුකොව්ලා සහ සුදු හමුදා ක්‍රියා කරනු ඇත.

''බලය සෝවියට්වරුන්ගෙන් ඈත් වන සේ එහි වෙනසක් සිදු වේ නම්, එය මඳක් දකුණටද, නැතහොත්, මඳක් වමටද යන්න වැදගත් නොවේ. ඉතිරි හරිය ගැන අපි බලා ගන්නෙමු'' යි මිල්යුකොව් කියන විට ඔහු සම්පූර්ණයෙන්ම නිවැරදිය. මෙය පංති සත්‍යයකි. එය සියලුම රටවල විප්ලවවල ඉතිහාසයෙන් සහ මධ්‍යතන කාලයෙන් ඉක්බිති ශතවර්ෂාධික නවීන ඉතිහාසයෙන් සනාථ වී තිබේ. විසිරී සිටින සුළු නිෂ්පාදකයන්, නැතහොත්, ගොවි ජනතාව, ආර්ථික වශයෙන් හා දේශපාලන වශයෙන් සමගි කරනු ලබන්නේ එක්කෝ ධනපති පංතිය විසිනි (ධනපති ක්‍රමය යටතේ සියලුම රටවල, සියලුම නවීන විප්ලවවලදී නිතරම සිදු වූයේ සහ නිතරම සිදු වනු ඇත්තේ මෙයයි), නැතහොත්, නිර්ධන පංතිය විසිනි (නවීන ඉතිහාසයේ සමහර ශ්‍රේෂ්ඨ විප්ලවවල උච්ඡතම අවස්ථාවෙහි ඉතා කෙටි කාලසීමාවක් තුළ මෙහි ඉතාමත් ප්‍රාථමික ස්වරූපය දක්නට ලැබින; 1917-1921 කාලයේදී රුසියාවේ මෙය වඩාත් සංවර්ධිත ආකාරයෙන් සිදු විය). ''තුන්වැනි'' මාවතක් සහ ''තුන්වැනි බලවේගයක්'' ගැන කථා කරනු සහ සිහින මවනු ඇත්තේ නාසිසස්ලා පමණකි.

අති මහත් ආයාසයෙන් සහ දරුණු අරගල කරන අතරතුරදී බොල්ෂෙවික්වරු නිර්ධන පංතික පෙරමුණු බල ඇණියක් පුහුණු කර ගෙන සිටිති. ඔවුන් නිර්ධන පංති ආඥාදායකත්වයක් නිර්මාණය කර සහ සාර්ථක ලෙස එය ආරක්ෂා කර ඇත. සතර අවුරුද්දක ප්‍රයෝගික අත්දැකීම්වල පරීක්ෂාවට ලක්වීමෙන් පසුව, රුසියාවේ පංති බල තුලනය දහවල් එළිය මෙන් පැහැදිලි වී තිබේ. එම බලවේගයන් මෙසේය: එකම විප්ලවවාදී පංතියේ දූඩි වූ සහ පන්නරය ලැබූ පෙරමුණු බල ඇණිය, වැනෙනසුලු සුළු ධනපති පිරිස සහ ලෝක ධනපති පංතියේ ආධාරය ලබන සහ අවස්ථාව පැමිණෙන තෙක් විදේශගතව බලා සිටින මිල්යුකොව්ලා, ධනපතියන් හා ඉඩම් හිමියන්. කුමණ ආකාරයකින් හෝ ''බලය වෙනස් වීමෙන්'' වාසි ලබා ගැනීමෙහි සමත් වන්නේ සහ නිසැක වශයෙන්ම එසේ කරනු ඇත්තේ මෙහි පසු කී කොටස බව සක් සුදක් සේ පැහැදිලිය.

මා ඉහත උපුටා දක්වූ 1918 පොතෙහි මෙම කරුණ ඉතා පැහැදිලි ලෙස උපුටා දක්වා ඇත: ''ප්‍රධාන සතුරා'' වන්නේ ''සුළු ධනපති ගති ලක්ෂණයය''. ''එක්කෝ එය අපගේ පාලනයට සහ ගිණුම් තැබීමට යටත් කළ යුතුය. නැතහොත්, සුළු දේපළ හිමිකමේ මෙම භූමියෙන්ම පැන නැගුනු නැපෝලියන්ලා සහ කවෙනායාක්ලා විසින් විප්ලවය පෙරළා දමන ලද පරිද්දෙන්ම නිසැක ලෙස සහ අනිවාරණීය ලෙස එය කම්කරු බලය පෙරළා දමනු ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් අපට ඇති කර ගත හැකි එකම අදහස එයය''. (ඉහත සඳහන් 1918 මැයි 5 දින පොතෙනි*.)

අපගේ ශක්තිය රැඳී ඇත්තේ, රුසියානු සහ ජාත්‍යන්තර යන දෙවර්ගයේම පවත්නා පංති බලවේග සියල්ලම ගැන පැහැදිලිතාවයක් තිබීම සහ ඒවා ගැන බුද්ධිමත් ලෙස සැලකිලිමත් වීමත්, මෙයින් උද්ගත වන නොසිඳෙන ධෛර්යය, අයෝමය අධිෂ්ඨානය සහ අරගලයට කැපවීමත් තුළය. අපට සතුරන් බොහෝ දෙනෙක් ඇත. නමුත් ඔවුහු අසමගිව සිටිති. නැතහොත්, ඔවුහු ඔවුන්ටම උවමනා දේ නොදනිති. (සුළු ධනපතියන් සියලු දෙනාම, මාර්තව්ලා සහ චෙර්නොව්ලා සියලු දෙනාම සහ පාක්ෂික නොවන කොටස් සහ අරාජිකවාදීන් සියලු දෙනාම එසේය.) නමුත් අපි සමගිව සිටිමු. අප අතර නියමිත ලෙසත්, සියලුම රටවල නිර්ධනයන් සමග අනියමිත ලෙසත්, සමගිය ඇති කර ගෙන සිටිමු. අපට උවමනා දෙය අපි ඒකාන්ත ලෙසම දන්නෙමු. ලෝක පරිමාණ වශයෙන්

*8 වැනි වෙළුම බලන්න. — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අප අනභිභවනීය වන්නේ එහෙයිනි. නමුත් දීර්ඝ, නැතහොත්, කෙටි කාලයක් තිස්සේ තනි නිර්ධන පංති විප්ලව පරාජිත වීමේ හැකියාව ප්‍රතික්ෂේප කිරීමක් මෙයින් අදහස් නොවේ.

සුළු ධනපති ගති ලක්ෂණය, ගති ලක්ෂණයක් ලෙසින් හැඳින්වීම සහේතුකය. මන්දයත්, එය ඇත්තෙන්ම ඉතාමත් අනියත, අවිනිශ්චිත සහ අවිඥත වන බැවිනි. "සර්ව ජන ඡන්දයෙන්" ධනපති ක්‍රමය යටතේ සුළු නිෂ්පාදකයන්ගේ ස්වභාවය නැතිව යතැයි සුළු ධනපති නාසිසස්ලා සිතති. ඇත්ත වශයෙන්ම එයින් සිදු වන්නේ විසිරී සිටින සුළු නිෂ්පාදකයන් යටත් කිරීමට පල්ලිය, පුවත්පත්, ගුරුවරුන්, පොලීසිය, යුද්ධවාදීන් සහ දහසකුත් එකක් ආර්ථික පීඩාවන් මගින් ධනපතියන්ට ආධාර වීමය. විනාශය, අගහිඟකම් සහ ජීවිතයේ දුෂ්කර තත්ත්වයන් නිසා, දිනක ධනපතියන් දෙසමත්, තවත් දිනෙක නිර්ධන පංතිය දෙසටත් වැනීම උද්ගත වන්නේය. මෙම වැනෙනසුලු භාවයට ඔරොත්තු දෙන්නේ සහ එය මැඩ පවත්වා ගැනීමෙහි සමත් වන්නේ දැඩිවූ නිර්ධන පංති පෙරමුණු බල ඇණිය පමණකි.

සමාජවාදී-විප්ලවවාදීන් සහ මෙන්ෂෙවික්වරුන් ඉටු කරන කාර්ය කොටස 1921 වසන්තයේ සිදුවීම්වලින් නැවතත් අනාවරණය විය. වැනෙනසුලු සුළු ධනපති ගතිලක්ෂණය බොල්ෂෙවික්වරුන් කෙරෙන් විකර්ෂණය වනු පිණිස සහ ධනපතියන්ට හා ඉඩම් හිමියන්ට වාසි වන සේ "බලය වෙනස් වීමක්" ඇති කිරීමට ඔවුහු ආධාර දෙති. මෙන්ෂෙවික්වරු සහ සමාජවාදී-විප්ලවවාදී හු "පාක්ෂික නොවන" වේශය ආරූඪ කර ගැනීමට දැන් උගෙන ගෙන සිටිති. මෙය එක හෙළාම ඔප්පු කළ හැකිය. මෙය දැකීමෙහි සහ අප රැවටිල්ලට පත් වීමට ඉඩ නොතැබිය යුතු බව අවබෝධ කර ගැනීමෙහි අපොහොසත් වන්නේ මෝඩයන් පමණකි. පාක්ෂික නොවන සාකච්ඡා සභා යනු වංචාවක් නොවේ. ඒවා අගය සහිත වන්නේ උපේක්ෂා සහගත පොදු ජනතාව වෙත, එනම් දේශපාලනයෙන් බැහැර සිටින වැඩ කරන දශ ලක්ෂ ගණන් ජනතාව වෙත සමීප වීමට ඒවා අපට ආධාර වන්නේ නම් ය. ඒවායින් සිදු වන්නේ "පාක්ෂික නොවන" පුද්ගලයන් මෙන් පෙනී සිටින මෙන්ෂෙවික්වරුන්ට සහ සමාජවාදී-විප්ලවවාදීන්ට වේදිකාවක් සැපයීම නම්, ඒවා හානිකරය. ඔවුහු හමුදා කැරලිවලට සහ සුදු හමුදාවන්ට ආධාර කරති. පක්ෂපාත හෝ පාක්ෂික නොවන හෝ වේශයෙන් පෙනී සිටින මෙන්ෂෙවික්වරුන්ට සහ සමාජවාදී-විප්ලවවාදීන්ට සුදුසු තැන පාක්ෂික නොවන සාකච්ඡාවත් නොව, සිර ගෙයය. (නැතහොත් සුදු හමුදා සමග එක පෙළට සිටින පරිදි විදේශ සභරාවන්ය. මාර්තව්ට පිට රට යමට ඉඩ දීමට අපි සතුටු වෙමු.) පොදු ජනතාවගේ ඉරියව් පරීක්ෂා කිරීමට සහ

ඔවුන්ට සමීප වීමට අපට වෙනත් විධික්‍රම සොයා ගත හැකිය. අපි ඒවා සොයා ගත යුත්තෙමු. පාර්ලිමේන්තුව, ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය සහ පාක්ෂික නොවන සාකච්ඡා සභාව පිළිබඳ ක්‍රීඩාව කිරීමට කැමති අය විදේශයට යා යුතු යයි අපි යෝජනා කරමු. එහිදී මාර්තව් සමග පැත්තකින් වාඩි වී සිටිමින් "ප්‍රජාතන්ත්‍රවාදයේ" චමත්කාරය අත් හදා බැලීමට සහ ඒ ගැන වීරාංගල්ගේ සොල්දාදුවන්ගෙන් අසා ගැනීමට ඔවුනට පුළුවන. මෙම "විරුද්ධ පාර්ශවය" සහ "සාකච්ඡා සභා" ක්‍රීඩාව සඳහා අපට කාලයක් නොමැත. ලෝක ධනපතියෝ අප වට කර ගෙන සිටිති. "ඔවුන්ගේම මිනිසුන්" ආපසුගෙන ඒමේ අටියෙන් සහ ඉඩම් හිමියන් හා ධනපතියන් යළි ස්ථාපිත කිරීමේ අටියෙන් ඔවුහු වැනෙනසුලුකම පිළිබඳ සෑම සලකුණක්ම ගැන පරීක්ෂාවෙන් සිටිති. මෙන්ෂෙවික්වරුන් සහ සමාජවාදී-විප්ලවවාදීන් පක්ෂයක් ගත්, නැතහොත්, "පාක්ෂික නොවන" වේශය ගෙන සිටියත්, අපි ඔවුන් සිර ගෙයිම තබන්නෙමු.

දේශපාලනයට ඇදී නොආ වැඩ කරන පොදු ජනයා සමග සමීප සම්බන්ධකම් ඇති කර ගැනීමට අපි සෑම මාධ්‍යයක්ම උපයෝගි කර ගන්නෙමු. එහෙත්, මෙන්ෂෙවික්වරුන්ට සහ සමාජවාදී-විප්ලවවාදීන්ටත්, මිල්යුකොව්ට වාසි ගෙන දෙන වැනෙනසුලු භාවයටත් ඉඩ සලසන මාධ්‍යයන් යොදා නොගන්නෙමු. විශේෂයෙන්ම සෝවියට් සභා වැඩ කටයුතුවලට, මූලික වශයෙන්ම ආර්ථික කටයුතුවලට පාක්ෂික නොවන ජනයා, පොදු ජනයා අතර වන නියම වශයෙන්ම පක්ෂයකට නැති ජනයා, සාමාන්‍ය කම්කරුවන් හා ගොවීන් සිය ගණනින් අපි ඉතාමත් උනන්දුවෙන් සහභාගි කරවා ගන්නෙමු. නමුත් මිල්යුකොව්ගේ වාසියට බෙහෙවින් හේතු වන මෙන්ෂෙවික් සහ සමාජවාදී-විප්ලවවාදී උපදෙස් රිංගවීම පිණිස පාක්ෂික නොවන වර්ණ පැළඳගත් අය නම් සහභාගි කරවා නොගන්නෙමු. පාක්ෂික නොවන ජනයා සිය ගණන් හා දහස් ගණන් අප වෙනුවෙන් වැඩ කරති. ඉන් විසි-තිස් ගණනින් පිරිස් ඉතා වැදගත් සහ වගකිවයුතු තනතුරු දරති. ඔවුන් වැඩ කරන ආකාරය ගැන අපි වැඩි පරීක්ෂාවෙන් සිටිය යුත්තෙමු. සාමාන්‍ය කම්කරුවන් දහස් ගණනින් උසස් කිරීමට හා පරීක්ෂා කර බැලීමටත්, ඔවුන් ක්‍රමානුකූල ලෙස සහ නොකඩවාම උසස් තනතුරුවල වැඩට යොදා පරීක්ෂා කිරීමටත්, ඔවුන් එම තනතුරු පිරවීමෙහි පොහොසත් බව අත් දැකීමෙන් පෙනේ නම්, ඔවුන් සිය ගණනින් එම තනතුරුවලට පත් කිරීමටත් අපි තව තවත් කටයුතු කළ යුත්තෙමු.

අපගේ කොමියුනිස්ට්වරුන්ට භාර නියම පරිපාලන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් තරම් අවබෝධයක් ඔවුනට නැත. ඔවුන් "සියලු දේම තමන්ම" කිරීමට උත්සාහ කරමින් තමන් වෙහෙසට පත් වීමේ හා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සියල්ලක්ම කර ගත නොහැකි වීමේ ද, වැඩ විස්සක් භාර ගැනීමේ හා එකක්වත් නිම කර ගත නොහැකි වී මේ තත්ත්වයට පත් නොවිය යුතුය. ඔවුන් විසි-තිස් ගණන් සහ සිය ගණන් සහායකයන්ගේ වැඩ පරීක්ෂා කළ යුතුය; ඔවුන්ගේ වැඩ ගැන පහළින් කෙරෙන පරීක්ෂාව, එනම්, නියම පොදු ජනතාව විසින් කෙරෙන පරීක්ෂාව සඳහා පිළියෙළ යෙදිය යුතුය. ඔවුන් වැඩ කටයුතු මෙහෙයවීම කළ යුතු අතර දැනුම ඇති අයගෙන් (විශේෂඥයන්ගෙන්) සහ මහා පරිමාණ නිෂ්පාදනය සංවිධාන කිරීමේ අත්දැකීම් ඇති අයගෙන් (ධනපතියන්ගෙන්) උගත යුතුය. යුද්ධ විශේෂඥයන් දහයෙන් නම දෙනෙක්ම හැකි සෑම අවස්ථාවකදීම ද්‍රෝහී වීමෙහි සමත් නමුත්, බුද්ධිමත් කොමියුනිස්ට්වාදියා යුද්ධ විශේෂඥයාගෙන් උගෙන ගැනීමට බිය නොවනු ඇත. රතු හමුදාවෙහි සිටි ද්‍රෝහිකාර යුද්ධ විශේෂඥයන් අල්වා ගැනීමටත්, අවංක හා හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන අය ඉදිරියට ගැනීමටත් සමස්තයක් වශයෙන් දහස් ගණන් සහ දස දහස් ගණන් යුද්ධ විශේෂඥයන් උපයෝගී කර ගැනීමටත් අපි උගෙන නොගත්තෙමුද? අපි ඉන්ජිනේරුවරුන් සහ ගුරුවරුන් සමගද එයම (සම්ප්‍රදායික නොවන මගකින්) කිරීමට උගෙන ගන්නෙමු . නමුත් ඒ රතු හමුදාවෙහි දී කළ තරම් හොඳින් නොවේ. (එහිදී ඩෙනිකින් සහ කොල්චාක් අපගේ නිල පාගමින් වඩාත් ඉක්මනින්, උනන්දුවෙන් සහ බුද්ධිමත් ලෙස උගෙන ගන්නා සේ අපට බල කළහ.) කොමිසම් ඒජන්තවරුන්, රජය වෙනුවෙන් කටයුතු කරන මිළයට ගන්නන්, සුළු ධනපති සමූපකාරකයන්, අනුග්‍රහ ලාභී ව්‍යවසායිකයන්, ආදීන් සමගද, එයම (නැවතත් සම්ප්‍රදායික නොවන ආකාරයෙන් කිරීමට උගෙන ගන්නෙමු. කම්කරු සහ ගොවි පොදු ජනතාවගේ තත්ත්වය නිවැරදි මාර්ගය අනුව වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. පාක්ෂික නොවන බලවේගයන්ද ඇතුළුව නව බලවේගයන් ප්‍රයෝජනවත් වැඩට යෙදීමෙන් අපි මෙය ඉටු කර ගන්නෙමු. ද්‍රව්‍ය බද්ද සහ ඊට සම්බන්ධ පියවරයන් ගණනාවක් නිසා මෙය පහසු වනු ඇත. අපි සුළු නිෂ්පාදකයාගේ වැනෙනසුලු භාවයේ ආර්ථික මුල් එමගින් කපන්නෙමු. තවද, මිල්යුකොව්ට හැර අන් කිසිවෙකුට වාසිදායක නොවන දේශපාලන වැනෙනසුලු භාවයට විරුද්ධවද අපි නිර්දය ලෙස සටන් කරන්නෙමු. වැනෙන්නෝ බොහෝ දෙනෙකි. අපි ස්වල්ප දෙනෙක් වෙමු. වැනෙන්නෝ අසමගිව සිටිති. අපි සමගිව සිටිමු. වැනෙන්නෝ ආර්ථික වශයෙන් ස්වාධීන නොවෙති. නිර්ධන පංතිය ආර්ථික වශයෙන් ස්වාධීනය. වැනෙන්නෝ ඔවුන්ටම අවශ්‍ය දේ නොදනිති. කිසියම් දෙයක් කිරීමට ඔවුන්ට අතිශයින්ම උවමනා කර තිබේ, එහෙත් එයම බිය වේ. ඒ අතරම මිල්යුකොව් ඔවුන්ට ඉඩ දෙන්නේද නැත. අපි අපට අවශ්‍ය දේ දන්නෙමු.

අපට ජය අත්වනු ඇත්තේ එනිසාය.

අවසානය

මෙසේ සම්පිණ්ඩනය කරමු.

ද්‍රව්‍ය බද්ද යනු යුද්ධ කාලීන කොමියුනිස්ට් ක්‍රමයේ සිට නිෂ්පාදිතයන් හුවමාරුවෙහි නිත්‍ය සමාජවාදී ක්‍රමයට පරිවර්තනය වීමකි.

1920 අස්වනු පාළුව නිසා වඩාත් උග්‍රවූ අන්ත විනාශය හේතු කොට ගෙන සහ මහා පරිමාණ කර්මාන්තය සීඝ්‍ර ලෙස ප්‍රකෘතිමත් කිරීමේ කිසිම හැකියාවක් නොතිබුණු හෙයින්, ඉතාමත් හදිසි ලෙස මෙම පරිවර්තනය කිරීම අවශ්‍ය විය.

එනිසා ගොවි ජනතාවගේ තත්ත්වයන් වැඩි දියුණු කිරීම ප්‍රථම කර්තව්‍යය වන්නේය. ඒ සඳහා යොද ගත යුතු මාධ්‍යයන් නම්, ද්‍රව්‍ය බද්ද, කෘෂිකර්මාන්තය සහ කර්මාන්තය අතර හුවමාරුව දියුණු කිරීම සහ සුළු කර්මාන්ත සංවර්ධනය ය.

හුවමාරුව යනු වෙළඳාම් කිරීමේ නිදහසය. එය වූකලී ධනපති ක්‍රමය වන්නේය. සුළු නිෂ්පාදකයාගේ විසිරී සිටින ස්වභාවය ජය ගැනීමට සහ නිලධාරිවාදයේ උවදුරු මැඩ පැවැත්වීමට එය ආධාරක වන හෙයින් ඒතාක් දුරට එය අපට ප්‍රයෝජනවත් වන්නේය. කොතරම් දුරට එම කරුණු ඉටු කර ගත හැකිද යන්න ප්‍රායෝගික අත්දැකීම අනුව නිර්ණය වනු ඇත. නිර්ධන පංතිය තදින් බලය ග්‍රහණය කරගෙන සිටින තාක් සහ ප්‍රවාහණයේ හා මහා පරිමාණ කර්මාන්තයේ සම්පූර්ණ පාලනය එය සතුව තිබෙන තාක් කල් නිර්ධන පංති බලයට අනතුරක් නොවේ.

ලාභ ගැරීමට විරුද්ධව කරන සටන සොරකමට විරුද්ධ සහ රජයේ අධීක්ෂණය, ගිණුම් තැබීම සහ පාලනය මග හැරීමට විරුද්ධ සටනක් බවට පරිවර්තනය කළ යුතුය. එක්තරා දුරකට අනිවාරණීය හා අපට අවශ්‍ය වන ධනපති ක්‍රමය මෙම පාලනය මගින් රාජ්‍ය ධනපති ක්‍රමයේ මාර්ගයන්ට යොමු වන සේ අපි එය මෙහෙයවන්නෙමු.

කුමණ තත්ත්වය යටතේ වුව, ප්‍රාදේශීය ක්‍රියාරම්භකතාවය සහ ස්වාධීනත්වය කෘෂිකර්මාන්තය සහ කර්මාන්තය අතර හුවමාරුවත් උනන්දු කිරීමේ කටයුතු සංවර්ධනය වීමට සම්පූර්ණ අවකාශ දිය යුතුය. ලබා ගත් ප්‍රායෝගික අත්දැකීම් අධ්‍යයනය කළ යුතුය. එමෙන්ම, මෙම අත්දැකීම් හැකි තරම් විවිධාකාර කළ යුතුය.

ගොවි ජන ගොවිතැනට සේවා කරන සහ එය වැඩි දියුණු කිරීමට රුකුල් දෙන කුඩා කර්මාන්තවලට අපි ආධාර කළ යුත්තෙමු. එක්තරා ප්‍රමාණයකට මෙම ආධාරය, රාජ්‍ය තොගවලින් සපයන අමුද්‍රව්‍ය ස්වරූපයෙන් දීම සුදුසුය. මෙම අමුද්‍රව්‍ය පිරියත් නොකර තැබීම අපරාධයක් වන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙනත් ආකාරයකින් වුව අප යුද්ධ විශේෂඥයන්ගෙන් උගෙනුම ලැබූ සේම, කොමියුනිස්ට්වරු වෙළෙඳුන්, සුළු ධනපති සමූපකාරයන් සහ ධනපතියන් ද ඇතුළු ධනපති විශේෂඥයන්ගෙන් උගෙන ගැනීම ගැන අපි බිය නොවිය යුත්තෙමු. ''උගෙන ගැනීමෙහි'' ප්‍රතිඵල පරීක්ෂා කළ යුත්තේ ප්‍රායෝගික අත්දැකීමෙන් සහ ඔබ අසල සිටින ධනපති විශේෂඥයන්ට හොඳින් කටයුතු ඉටු කිරීමෙන් පමණකි. කෘෂිකර්මාන්තයෙහි සහ කර්මාන්තයෙහි වැඩි දියුණුවක් ඇති කිරීමටත්, ඒවා අතර හුවමාරුව දියුණු කිරීමටත් සෑම මාර්ගයකින්ම උත්සාහ කරන්න. අපි යමක් උගෙන ගන්නෙමු නම්, ඒ සඳහා කොතරම් ගෙව්වත් එය නොවැඩි හෙයින් ''ගුරු ගාස්තුව'' ගෙවීමට අදිමදි නොකරන්න.

වැඩ කරන පොදු ජනයාට ආධාර කිරීමට, ඔවුන්ට සමීප වීමට සහ ආර්ථික පරිපාලනයේ කටයුතු සඳහා එම පිරිස් අතරින් ලක්ෂ සංඛ්‍යාත පාක්ෂික නොවන ජනයා උසස් කිරීමට සියල්ලක්ම කරන්න. හැඩකාර ක්‍රොන්ෂ්ටාඩ්ට් කාලයේ පාක්ෂික නොවන ඇඳුම් ඇහලා ගනිමින් වෙස් මාරු කරගත්, හුදෙක්ම මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදීන් පමණක්ම වන ''පාක්ෂික නොවන'' අය සම්බන්ධයෙන් කළ යුත්තේ ඔවුන් ආරක්ෂා සහිතව සිර ගෙවල තැබීමය. නැතහොත්, පිරිසිදු ප්‍රජාතන්ත්‍රවාදයේ සියලු චමත්කාරයන් නිදහසේ භුක්ති විඳීමේදී සහ චෙර්නොව්, මිල්යුකොව් හා ජෝර්ජියානු මෙන්ෂෙවික්වරුන් සමග නිදහස් ලෙස අදහස් හුවමාරු කර ගැනීමේදී මාර්තව් සමග එකතු වීම පිණිස බර්ලිනයට පිටත් කර යැවීමය.

1921 අප්‍රේල් 21

පොතක් ලෙසින් 1921 මැයි මාසයේදී මොස්කව්හි පළ කරන ලදී.

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 43, පිටු 205-245

කැටිගත කරන ලද කථා

1921 අප්‍රේල් 25

1

පාක්ෂික නොවන අය හා සෝවියට් බලය

(ලෙනින් සහෝදරයාගේ කථාව)

කම්කරුවනි හා ගොවියනි, රට පාලනය කිරීම හා ආර්ථික වර්ධනය කිරීම සඳහා සෝවියට් බලය කෙරෙහි ඇප කැප වී සිටින, අවංක පක්ෂ සාමාජිකයන් නොවන පුද්ගලයින් අපට දෙන්න. පක්ෂ සාමාජිකයන් පමණක්ම ප්‍රමාණවත් නොවන නිසා සෝවියට් පාලනය සඳහා අවංක හා කැප වූ පක්ෂ සාමාජිකයින් නොවන්නෝද 400 අත්‍යවශ්‍යය ය. අවංකව හා කාර්යක්ෂම ලෙස කලමනාකරන කටයුතු හා ආර්ථික පාලන කටයුතු කළ හැකි දක්ෂ පුද්ගලයින් පක්ෂ සාමාජිකයින් නොවන කම්කරුවන් හා ගොවීන් අතර බොහෝ ගණනක් සිටිති. නිදර්ශනයක් වශයෙන් ගෘහකාර්මික ආයතන සංවිධානය කිරීම හා සමූපකාර ආයතන සංවිධානය කිරීමද ආහාර ද්‍රව්‍ය සාධාරන ලෙස බෙදහැරීම, භෝජනාගාර, නිවාස, මා ආහාර සැපයීම ආදී නොයෙක් ව්‍යාපාර වැඩි දියුණු කිරීමද ඔවුන්ට කළ හැකිය.

පරිපාලන හා මහජන ආර්ථිකය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සඳහා යොදවා නැති පක්ෂ සාමාජිකයින් නොවන කම්කරුවන් හා ගොවීන් සෑම ගුබේර්නියාවකම දහස් ගණන් ඇත. පක්ෂ හා සෝවියට් කාරක වරුන්ගේ සෘජු කර්තව්‍යයක් වන්නේ එවැනි පුද්ගලයන් හමුවී ඔවුන් පෙරමුණට කැඳවා ඔවුන්ට වැඩ භාරදී ඔවුන්ගේ හැකියාවන් පරීක්ෂා කර ඔවුන්ගේ දක්ෂකම් ප්‍රදර්ශනය කිරීමට හැකියාවක් ලබා දීම ය.

පක්ෂ සාමාජිකයන් නොවන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආධාරවලට අපි බිය නොවිය යුත්තෙමු. එයට ප්‍රතිවිරුද්ධ ලෙස ඔවුන්ගේ ආධාර අප බලාපොරොත්තු වන හා අවශ්‍ය දෙයක් ලෙස සැලකිය යුත්-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තෙමු. දැන් තමන් පාක්ෂික නොවේයයි හඳුන්වමින් ව්‍යවහාරයේදී සුදු හමුදාවේ හා ඉඩම් හිමියන්ගේ වාසිය සඳහා ද්‍රෝහී ලෙස කටයුතු කරන මෙන්ෂෙවික්වරුන් හා සමාජවාදී-විප්ලවවාදීන් කෙරෙහි පමණක් අපි සැලකිල්ලෙන් සිටිය යුත්තෙමු. සුදු හමුදාව හා ඉඩම් හිමියන් සියලු දෙනාම ක්‍රාන්ෂ්ටාඩ්ට් කැරැල්ලට ආධාර දීමට ඉදිරිපත් වූයේ අරමුණක් ඇතිවය. එම නිසා එවැනි මලකඩ කෑ පාක්ෂික නොවන පුද්ගලයන් සොයා බලා ඔවුන් සිරභාරයට ගත යුතුය. පක්ෂ සාමාජිකයින් නොවන අවංක කම්කරුවන් හා ගොවීන් සමස්තයක් ලෙස හා සියළු ආකාරයෙන්ම වැඩට යෙදවිය යුතුය.

ලෙනින් කෘති එකතුව XXXVII හි 1970 පළමුවෙන්ම මුද්‍රණය කරන ලදී. කෘති එකතුවේ ඇති ආකාරයට මුද්‍රණය කරන ලදී.

2

ද්‍රව්‍ය බද්ද හා අතිරික්ත ධාන්‍ය නිදහස් ලෙස හුවමාරු කිරීම

(ලෙනින් සහෝදරයාගේ කථාව)

සහෝදරවරුනි! ධාන්‍ය අතිරික්තය අත්පත් කර ගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්ද ආදේශ කිරීම නිසා සාමාන්‍ය අස්වැන්නක් ලැබෙන කන්නයකදී ධාන්‍ය පූද් කෝටි ගණනක අතිරික්තයක් ගොවීන් ළඟ ඉතිරි විය යුතුය. එම ධාන්‍ය අතිරික්තය, ස්වාධීනව ඔවුන්ගේ කැමත්ත අනුව තම ආහාර තත්ත්වය වැඩි දියුනු කර ගැනීම, සත්ව ආහාර පිළියෙළ කිරීම හා කාර්මික නිෂ්පාදන භාණ්ඩවලට හුවමාරු කරගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට නීත්‍යානුකූලවම ගොවීන්ට අයිතියක් තිබේ. අතිරික්ත ධාන්‍ය කාර්මික නිෂ්පාදන භාණ්ඩවලට නිදහස් ලෙස හුවමාරු කිරීමට ඇති ඉඩ කඩ නිසා තම ගොවිතැන් කටයුතු වැඩි දියුණු කිරීමට ගොවියාද පෙළඹෙනු ඇත. එසේම ගොවියාට අවශ්‍ය කර්මික භාණ්ඩ සපයන සියළුම කර්මාන්ත වැඩි දියුණු කිරීමේ මාර්ගයෙන්ද එම කර්යය ලිහිල් කළ හැකිය. මහා පරිමාණ කර්මාන්ත ශාලා හා පැක්ටරිද, දුම්රිය මාර්ග ප්‍රවාහනයද කඩිනමින් පුනරුත්ථාපනය කිරීමට හැකි නම් එවිට, ලුනු, භූමිතෙල්, රෙදිපිළි, පාවහන් හා ගොවි උපකරන හා පොහොර ආදී වඩාත් අත්‍යාවශ්‍ය කාර්මික නිෂ්පාදන ගොවීන්ට කඩිනමින් හා අඩු වියදමින් ලබා දිය හැකිය. එහෙත් මහා පරිමාණ කර්මාන්තය සීඝ්‍රයෙන් පුනරුත්ථාපනය කිරීම සඳහා ඉන්ධන හා ආහාර ද්‍රව්‍ය මහා අතිරික්තයක් නගරයට තිබිය යුතුය. එම අතිරික්තය කඩිනමින් සපයා ප්‍රවාහනය කිරීමට අපට ශක්තියක් නැත. එම නිසා ඒවා සැපයීමේ හා ප්‍රවාහනය කිරීමේ කටයුතු කරන අතරම සුළු කර්මාන්ත පුළුල් කිරීමේ හා සියලු ආකාරයෙන්ම වර්ධනය කිරීමේ වැඩ කටයුතුද අප්‍රමාදව ආරම්භ කළ යුතුය. ඒ මාර්ගයෙන් රජයේ අමුද්‍රව්‍ය, ඉන්ධන හා ආහාර ද්‍රව්‍ය අතිරික්තයන් වැඩි වැය කිරීමකින් තොරව ගොවියාගේ ජීවන තත්ත්වය හා ගොවිපොළ වැඩි දියුණු කළ හැකිය, කළ යුතුය. එම නිසා සියලුම පක්ෂ හා සෝවියට් කාරකවරයෙක්ම ඒ ගැන හරි අවබෝධයකින් යුතුව ගොවිතැන් කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන සුළු කර්මාන්ත වර්ධනය කිරීමට සහ ව්‍යාප්ත කිරීමට අදළ වන යුතුකම් කොටස නොපැකිලිව ඉටු කළ යුතුය.

පළමුවෙන්ම 1970 අප්‍රේල් මස 29 ද "ප්‍රාව්ද" අංක 119 මුද්‍රණය කරන ලදී. පත්‍රයේ පළවූ ආකාරයට මුද්‍රණය කරන ලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රු. කො. (බො.) පක්ෂයේ සමස්ත රුසියා දසවැනි සාකච්ඡා සභාව

1921 මැයි 26-28

සාකච්ඡා සභාව අවසන් කරමින් කළ කථාව

මැයි 28

සහෝදරවරුනි, මගේ කථාව ඉතා කෙටියෙන් කළ හැකි යයි මම අදහස් කරමි. ඔබ දන්නා පරිදි අප මෙම විශේෂ සාකච්ඡා සභාව කැඳවූයේ, ප්‍රධාන වශයෙන් මධ්‍යස්ථානය සහ ප්‍රදේශ අතරත්, පක්ෂය සහ සෝවියට් කාරකවරුන් සියලු දෙනාම අතරත් ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ඇති කරගැනීම පිණිසය. සාකච්ඡා සභාවෙන් මෙම අරමුණ සම්පූර්ණයෙන්ම ඉටු වී යයි මම අදහස් කරමි. දහවැනි සම්මේලනයේ සම්මත කරන ලද සහ අනතුරුව ආඥා හා නියෝග මගින් තහවුරු කරන ලද ප්‍රතිපත්තිය, පක්ෂය උනන්දුමත් ලෙස සහ දීර්ඝ කාලයක් තිස්සේ නිරනුමානව පිළිගත් එකකැයි යන්න ගැන වූ අපගේ සියලු සැකයන් දුරලිය යුත්තෙමු යි යනුවෙන් ඔසින්ස්කි සහෝදරයා කී විට ඔහු ප්‍රාදේශීය පක්ෂ කාරකවරුන් රාශියකගේ, සමහර විට, ඉන් බහුතරයෙහි අදහස නිවැරදි ලෙස ප්‍රකාශයට පත් කළ බැව් සමහර කථිකයෝ සඳහන් කළහ. සාකච්ඡා සභාව ඉතාමත් අවධාරණයෙන් යුතුව ප්‍රකාශ කළේ සහ කරුණු ගණනාවක් අනුව විස්තර කළේ මෙයයි. සහෝදරවරු ප්‍රදේශවලට ආපසු ගිය විට වැරදි අර්ථ නිරූපනය සඳහා කිසිම ඉඩක් ඉතිරි නොවනු ඇත. එහෙත්, අවුරුදු ගණනාවක් තිස්සේ අනුගමනය කිරීම සඳහා ප්‍රතිපත්තියක් සම්මත කිරීමේදී, ජාත්‍යන්තර විප්ලවයත්, එහි සංවර්ධන වේගයත්, ඊට සමගාමීව ඇති වන තත්ත්වයනුත් නිසා සියල්ලක්ම වෙනස් විය හැකි බව අපි මොහොතකට හෝ අමතක නොකරන්නෙමු. ප්‍රවර්තන ජාත්‍යන්තර තත්ත්වය කිසියම් ආකාරයක තාවකාලික සමතුලිතතාවයක් සහිතය. එය අස්ථාවර වුවද සමතුලිතතාවයකි. අධිරාජ්‍යවාදී බලවතුන් සෝවියට් රුසියාවට වෛර කළත්, ධනපති ලෝකයේ බිඳවැටීම නොනැවතම ඉදිරියට යාම, එහි සමගිය දිගටම පිරිහීම හා ඒ අතර සිය කෝටියකට අධික ජනගහනයක් ඇති පීඩිත යටත් විජිතවල ජනතාවන්ගේ බලවත් පහර අවුරුද්දෙන් අවුරුද්ද, මාසයෙන් මාසය සහ සතියෙන් සතිය පවා වැඩි වීම නිසා, ඇයට විරුද්ධව සටන් වැදීමට ඇති ඔවුන්ගේ ආශාව අත්හැර දැමීමට එම අධිරාජ්‍යවාදී බලවතුන්ට සිදු වූයේ මෙම ආකාර සමතුලිකතාවයක් යටතේය. එහෙත් අපට ඒගැන නිමිති බැලිය නොහැක. අප දැන් ජාත්‍යන්තර විප්ලවය කෙරෙහි පාන අපගේ බලය ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරන්නේ ආර්ථික ප්‍රතිපත්තිය මගිනි. කිසිම විශේෂත්වයකින් සහ අතිශයෝක්තියකින් තොරව සියලුම රටවල වැඩ කරන ජනතාව සෝවියට් රුසියානු සමූහාණ්ඩුව කෙරෙහි බලාපොරොත්තු රඳවති. එම තත්ත්වය ඇති කර තිබේ. කිසිම දෙයක් වසං කිරීමට හෝ සඟවා තැබීමට දැන් ධනපතියන්ට නොපුළුවන. ඔවුන් අපගේ සෑම ආර්ථික වරදකම සහ දුර්වලකමකම එතරම් තදින් එල්ලෙන්නේ එහෙයිනි. මෙම ක්ෂේත්‍රයෙහි කරන අරගලය සමස්ත ලෝක අරගලයක් වී තිබේ. අප මෙම ප්‍රශ්නය විසඳාලූ කල, අපි ඒකාන්ත වශයෙන් හා අවසාන වශයෙන් ජාත්‍යන්තර පරිමාණයෙන් ජයග්‍රහණය ලැබූවා වන්නෙමු. ආර්ථික සංවර්ධනයේ ප්‍රශ්න එතරම් අති විශේෂ පරම වැදගත් තත්ත්වයක ලා සැලකීමට අප යොමු වී තිබෙන්නේ එහෙයිනි. ක්‍රමික සහ අවශ්‍යයෙන්ම අඩුවේගී විය යුතු නොකඩ උද්ගමනයක් හා ප්‍රගතියක් මගින් අපි මෙම ක්ෂේත්‍රයෙහිදී ජයග්‍රහණය අත් පත් කරගත යුත්තෙමු. අපේ සාකච්ඡා සභාවේ වැඩ කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් අප නිසැකවම, කෙසේ වෙතත් මෙම අරමුණ ඉටු කර ගෙන ඇතැයි මම සිතමි. (අත්පොළසන්)

1921 ජූනි 2 දින ප්‍රාවද අංක 119 හි පළ කරන ලදී.

වී. අයි. ලෙනින්, සම්පූර්ණ කෘති, 5 වැනි මුද්‍රණය, වෙළුම 43, පිටු 340-341

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සංස්කාරකගේ සටහන්

1 සමස්ත ඉස්ලාම්වාදය — ආගමික-දේශපාලන දෘෂ්ටියකි. එය ඉස්ලාම් (මුස්ලිම් ආගම) අදහන සියළුම ජාතීන් එකම ඒකකයකට ඒකරාශී කිරීම දේශනා කරයි. දහනවවැනි ශතවර්ෂයේ අවසානයේදී පෙරදිග ලෝකයේ රටවල සූරාකන පංතිය අතර මෙම දෘෂ්ටිය පුළුල් ලෙස පැතිර ගියේය. "ආගම අදහන සියළුම දෙනාගේ හලීෆ්" ලෙස සමස්ත ලෝකයේම මුස්ලිම්වරු, තුර්කියේ සුල්තාන්වරයාට යටත් කරවීමේ අරමුණ ඇතිව මෙය තුර්කියෙහි යොදා ගන්නා ලදී. සමස්ත ඉස්ලාම්-වාදය ආධාරයෙන් මුස්ලිම් ජනතාවගේ පාලක පංතිය තම තත්ත්වය ශක්තිමත් කරගැනීම හා පෙරදිග ලෝකයේ වැඩකරන ජනතාවගේ විප්ලවවාදී ව්‍යාපාරයේ ගෙල මිරිකා දැමීම සඳහා උත්සාහ දරුවේය.

2 වර්සයිල් සාම ගිවිසුම — 1914-1918 අවුරුදුවල පැවති ප්‍රථම ලෝක යුද්ධය කෙළවර කළ මෙම ගිවිසුම, එක් අතකින් ඇමෙරිකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය, ප්‍රංශය, ඉතාලිය, ජපානය හා අනිකුත් මිත්‍ර රටවල්ද අනෙක් අතින් ජර්මනියද විසින් 1919 ජූනි 28 වැනි දින අත්සන් කෙරිණ. වර්සයිල් සාම ගිවිසුමේ, ඉලක්කය වූයේ ජයග්‍රහණය කළ රටවලට වාසිදායක වන අන්දමට ධනවාදී ලෝකය නැවත බෙදගැනීම සහ සෝවියට් රුසියාවේ ගෙල මිරිකා දැමීම හා ලෝක විප්ලවවාදී ව්‍යාපාරය විනාශ කිරීම සඳහා එම රටවල් අතර සම්බන්ධතා ක්‍රමයක් ඇති කිරීමය.

3 යුන්කර්වරු — ප්‍රුසියාවේ රදළ ඉඩම් හිමියෝ.

4 බ්‍රෙස්ට්-ලිතොව්ස්ක් සාම ගිවිසුම — සෝවියට් රුසියාවට ඉතාමත් දුෂ්කර වූ කොන්දේසි සහිතව සෝවියට් රුසියාව හා ජර්මන් කඳවුරට

අයත් රටවල් (ජර්මනිය, ඔස්ත්‍රෝ-හංගේරියාව, බල්ගේරියාව හා තුර්කිය) අතර 1918 මාර්තු 3 දින මෙම ගිවිසුම අත්සන් කරන ලදී. මෙම ගිවිසුම අත්සන් කරන ලද්දේ සාම ගිවිසුම අත්සන් කිරීමට විරුද්ධව ඉදිරිපත් වූ එල්. ඩී. ට්‍රොට්ස්කිට හා පක්ෂ විරෝධී "වාම කොමියුනිස්ට්වාදීන්ට" විරුද්ධව කරන ලද දැඩි සටනක් මධ්‍යයේය. වී. අයි. ලෙනින්ගේ දැඩිතම උත්සාහය නිසා ජර්මනිය සමග සාම ගිවිසුම අත්සන් කිරීමට හැකි විය. රාජාණ්ඩුව පෙරලා දැමූ ජර්මනි විප්ලවය ජයගැනීමෙන් පසු 1918 නොවැම්බර් 13 දින සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාව විසින් එම කොල්ලකාරී ගිවිසුම අවලංගු කරන ලදී.

5 ජාතීන්ගේ සංගමය — පළමුවැනි ලෝක යුද්ධයේ සිට දෙවැනි ලෝක යුද්ධය දක්වා පැවති ජාත්‍යන්තර සංවිධානයකි. පළමුවැනි ලෝක යුද්ධයේ ජයග්‍රාහක රාජ්‍යයන්ගේ පැරිස් සාම සම්මේලන සභාව විසින් එය 1919 දී ආරම්භ කරන ලදී.

1920-1934 කාලයේදී ජාතීන්ගේ සංගමය සෝවියට් රජයට සතුරු ආකල්පයක් දැක්වූවේය. එය, 1920-1921 අවුරුදුවලදී සෝවියට් දේශයට විරුද්ධව අධිරාජ්‍යවාදීන් ගෙන ගිය යුද්ධ ආක්‍රමණ සංවිධානය කළ මධ්‍යස්ථානය ලෙස එය කටයුතු කළේය.

1934 සැප්තැම්බර් 15 දින ප්‍රංශ රාජ්‍යතන්ත්‍රික අංශයේ මූලිකත්වයෙන් ජාතීන්ගේ සංගමයේ නියෝජිත රාජ්‍යයන් 34 ක් සෝවියට් රාජ්‍යයෙන් එම සංගමයට බැඳෙන ලෙස ඉල්ලා සිටියේය. සාමය සහතික කිරීමේ සටන අරබයා සෝවියට් සංගමය ජාතීන්ගේ සංගමයට බැඳුනේය. එහෙත් සාම පෙරමුණක් ගොඩ නැගීමට සෝවියට් සංගමය ගත් උත්සාහය බටහිර ප්‍රතිගාමී කොටස්වල විරුද්ධත්වය නිසා අසාර්ථක විය. ජාතීන්ගේ සංගමය 1946 අප්‍රේල් දක්වා පැවතිණ.

6 එන්ටෙන්ට් මිත්‍ර ගිවිසුම (ත්‍රිපාක්ෂික. ගිවිසුම) — බ්‍රිතාන්‍යයේ, ප්‍රංශයේ හා සාර්වාදී රුසියාවේ අධිරාජ්‍යවාදී කඳවුර. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී එම කඳවුරට ඇමෙරිකාව, ජපානය, ඉතාලිය හා වෙනත් රටවල්ද සම්බන්ධ විය.

7 1919 මාර්තු 21 වැනි දින හංගේරියාව සෝවියට් සමූහාණ්ඩුවක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. හංගේරියානු සමාජවාදී විප්ලවය සංසංදනීය ලෙස ගත් කල සාමකාමී ස්වරූපයක් ගත්තේය. විප්ලවවාදී ව්‍යාපාරය පාගා දැමීමට හා බාහිර අමාරුකම්වලට මුහුණ පෑමට අසමත් වූ හංගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රියානු ධනපති පංතිය විප්ලවය වර්ධනය වීමට බාධා කිරීමේ අරමුණ ඇතිව දක්ෂිණාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට රාජ්‍ය බලය පැවරීමට තීරණය කලේය. එහෙත් ඒ වන විට හංගේරියානු කොමියුනිස්ට් පක්ෂය මහජනතාව අතර කොතරම් ජනප්‍රියව තිබුණේද යත් හා කොමියුනිස්ට් පක්ෂය සමග සංධානයකට පැමිණීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාන්‍ය සාමාජිකයින්ගේ ඉල්ලීම කොතරම් තීරණාත්මක වූයේද යත්, එක්ව රජයක් පිහිටුවීම සඳහා සිරගතව සිටි කොමියුනිස්ට් පක්ෂ නායකයින්ගෙන් ඉල්ලා සිටීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයින්ට සිදු විය. සෝවියට් ආණ්ඩුවක් පිහිටුවීම, ධනපති පංතිය නිරායුධ කිරීම, රතු හමුදව හා මහජන මිලීෂියා හමුදවක් පිහිටුවීම, නින්දගම් රජය සතු කිරීම, කර්මාන්ත ජනසතු කිරීම සෝවියට් රුසියාව සමග සංධානයකට එළඹීම ආදී කොමියුනිස්ට් පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසිවලට එකඟවීමට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයින්ට සිදු විය. ඒ අතරම පක්ෂ දෙක එකතු කර හංගේරියානු සමාජවාදී පක්ෂය පිහිටුවීමේ ගිවිසුමකටද අත්සන් කරන ලදී. ප්‍රතිසංස්කරනවාදී කොටස් වෙන් කිරීමකින් තොරව යාන්ත්‍රික සංකලනයක් මාර්ගයෙන් පක්ෂ දෙක එකතු කිරීම වැනි වැරදි පක්ෂ සමගිය ඇති කිරීමේදී සිදු විය. ඒවා පසුව පක්ෂ වැඩ කටයුතුවලට බලපෑවේය.

බාහිර අධිරාජ්‍යවාදී ආක්‍රමණ හා අභ්‍යන්තර ප්‍රතිවිප්ලවවාදී කටයුතු මගින් 1919 අගෝස්තු 1 දින හංගේරියානු සෝවියට් පාලනය බිඳ දමන ලදී.

8 මෙහි සඳහන් වන්නේ කම්කරුවන් අතට බලය ලැබීමෙන් පසු 1918 ජනවාරි අගදී ප්‍රකාශයට පත් කරන ලද ෆින්ලන්ත සමාජවාදී සමූහාණ්ඩුව ගැනය. 1918 මාර්තු මස පළමුවැනි දින පෙට්‍රොග්‍රෑඩයේදී ෆින්ලන්ත සමාජවාදී සමූහාණ්ඩුව හා රු. සෝ. පෙ. ස. සමූහාණ්ඩුව ගිවිසුමක් අත්සන් කළහ. සම්පූර්ණ සමානාත්මතාවය හා රටවල් දෙකේම ස්වෛරීභාවයට ගරුකිරීම යන මූලධර්ම මත පදනම් වූ එම ගිවිසුම ඉතිහාසයේ සමාජවාදී රටවල් දෙකක් විසින් අත්සන් කරන ලද පළමුවැනි ගිවිසුම විය.

ජර්මන් හමුදවන්ගේ ආක්‍රමණය නිසා, දැඩි සිවිල් යුද්ධයකට පසු 1918 මැයි මස ෆින්ලන්ත විප්ලවය මැඩලන ලදී.

ජර්මන් ආක්‍රමණිකයින්ට හා ප්‍රතිවිප්ලවවාදී ආණ්ඩුවට විරුද්ධව ලත්වියන් නිර්ධන පංතිය හා ගොවිජනතාව ගෙන ගිය පොදුජන නැගීසිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1918 දෙසැම්බර් 17 දින රාජ්‍ය බලය සෝවියට් සභා වෙත පවරමින් ප්‍රකාශනයක් නිකුත් කළ තාවකාලික සෝවියට් ආණ්ඩුව පිහිටුවන ලදී. සෝවියට් බලය පිහිටුවීමේ සටනට හා ලත්වියන් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව ශක්තිමත් කිරීමට සෝවියට් රුසියාව සහෝදරාත්මක ලෙස ආධාර දුන්නේය.

1919 මාර්තු මාසයේදී ඇමෙරිකා එක්සත් ජනපදයේ හා එන්ටෙන්ට් මිත්‍ර රටවල්වල අධිරාජ්‍යවාදීන්ගේ (ආධාරය ඇතිව) ජර්මන් හමුද සහ සුදු හමුද සෝවියට් ලත්වියාවට පහරදීමට පටන් ගත්හ. මැයි මාසයේදී සෝවියට් ලත්වියාවේ අගනුවර වන රිගා නගරය ඔවුන් යටතට පත් විය. 1920 ජනවාරි වන විට මුළු ලත්වියාවම අධිරාජ්‍යවාදීන්ට යටත් විය.

10 ලෙනින් මෙහි අදහස් කරන්නේ, පළමුවැනි ලෝක යුද්ධයේ ආරම්භයත් සමගම විසිරී ගිය දෙවැනි ජාත්‍යන්තරය වෙනුවට, සමාජවාදී පක්ෂවල සාකච්ඡා සභාවේදී පිහිටුවන ලද දෙවැනි (බර්න්) ජාත්‍යන්තරය ය.

11 "කොමුනිස්තිචිස්කී ඉන්තෙර්නට්සියනාල්" සඟරාවේ අංක 12 හි 1920 ජූලි 20 දින පළ වූ යූ. මර්හ්ලෙව්ස්කිගේ "කෘෂිකාර්මික ප්‍රශ්න හා සාමකාමී විප්ලවය" නැමති ලිපිය ගැනය ලෙනින් මෙහි සඳහන් කරන්නේ. මුද්‍රණයෙන් පිටවීමට පෙරදීම එම ලිපිය ලෙනින් විසින් කියවන ලදී.

12 මේ සඳහන ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය හා බ්‍රිතාන්‍යයේ ස්වාධීන කම්කරු පක්ෂය ගැනය.

ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය — 1917 අප්‍රේල් මාසයේදී ගෝතාහි පැවති ව්‍යවස්ථා සම්පාදක සම්මේලනයේදී බිහිවූ මධ්‍යස්ථවාදී පක්ෂයකි. මධ්‍යස්ථවාදී සටන්පාඨවලට මුවාවී සමාජ-ජාතොන්මාදවාදීන් සමග සම්මුතියක් ගැන දේශනා කළ "ස්වාධීනවාදීහු" පංති සටනින් ඉවතට තල්ලුවී ගියහ. පක්ෂයේ ප්‍රධාන අරටුව වූයේ රෙයිහ්ස්ටාග් හි කෞට්ස්කිවාදී "ශ්‍රම සහයෝගීතා සංගමය" ය.

1920 ඔක්තෝබර් මස ගල්ල හි පැවති ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සම්මේලනයේදී එය භේද භින්න විය. ඉන්බහුතරය 1920 දෙසැම්බරයේ දී ජර්මන් කොමියුනිස්ට් පක්ෂයට බැඳුනහ. වෙනම පක්ෂයක් පිහිටවූ "ස්වාධීනවාදීන්ගේ" දක්ෂිණාංශික කොටස එයට ජර්මනියේ ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය යන පැරණි නාමයම දුන්හ. 1922 දක්වා පක්ෂය පැවතිණ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බ්‍රිතාන්‍ය ස්වාධීන කම්කරු පක්ෂය (Independent Labour Party) 1893 දී වැඩවර්ජන සටන් පැතිරයාමේ හා බ්‍රිතාන්‍ය කම්කරු පංතිය ධනපති පංතික පක්ෂවල බලපෑමෙන් නිදහස් කර ගැනීමේ ව්‍යාපාරය බලවත් වීමේ තත්ත්වයන් යටතේ පිහිටුවන ලද ප්‍රතිසංස්කරනවාදී සංවිධානය. පක්ෂයේ නායකයින් වූයේ කේර්-ගාර්ඩි හා අර්. මැක්ඩොනල්ඩ් ය.

ස්. ක. ප. එහි ආරම්භයේ සිටම පාර්ලිමේන්තු ආකාරයේ අරගලවලට සහ පාර්ලිමේන්තුව තුළ ලිබර්ල් පක්ෂය ගෙන යන සම්බන්ධතාවය සඳහා ප්‍රධාන ස්ථානයක් දුන් අතර ධනපති-ප්‍රතිසංස්කරනවාදී ප්‍රතිපත්තියක් ගෙනගියේය. ස්වාධීන කම්කරු පක්ෂය ගැන විග්‍රහයක් කළ ලෙනින් ''එය ව්‍යවහාරයේදී සැමදම ධනපති පංතියේ ආධාරකය මත පවතින අවස්ථාවාදී පක්ෂයකැයි'' ලියුවේය.

13 ලොන්ගේවාදීන් — ප්‍රංශ සමාජවාදී පක්ෂයේ මධ්‍යස්ථවාදී අල්පතරය. එය බිහිවූයේ 1915 දී ජාන් ලොන්ගේ ගේ ප්‍රධානත්වයෙනි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ඔවුහු සමාජ-සම්මුතිගාතවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළහ.පක්ෂයේ වාමාංශික පිළට ජයග්‍රහනය අත්වූ, 1920 දෙසැම්බර් මාසයේදී තුර් වල පැවති ප්‍රංශ සමාජවාදී පක්ෂ සම්මේලනයේදී ලොන්ගේවාදීහු විවෘත ප්‍රතිසංස්කරනවාදීන් සමග පක්ෂයෙන් කැඩී ගොස් ඊනියා දෙකහමාරේ ජාත්‍යන්තරයට ඇතුළු වූහ. එය විසිර යෑමෙන් පසු ඔවුහු ආපසු දෙවැනි ජාත්‍යන්තරයට බැඳුනහ.

14 කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ වැඩ පිළිවෙළ, උපක්‍රමීය හා සංවිධානාත්මක කටයුතු පිළිබඳ පදනම් දමන ලද කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනය 1920 ජූලි 19 සිට අගෝස්තු 7 දක්වා සෝවියට් රුසියාවේ පවත්වන ලදී. සාකච්ඡා සම්මේලන පෙට්‍රොග්‍රෑඩ්හි විවෘත කරන ලදුව ඊළඟ සාකච්ඡා වාරය ජූලි 23 දින සිට මොස්කව්හි පවත්වන ලදී. රටවල් 37 ක කම්කරු සංවිධාන 67 ක් නියෝජනය කළ පූර්ණ බලය හිමි නියෝජිතයෝ 169 ක්ද සාකච්ඡාවට සහභාගි විය හැකි නියෝජිතයෝ 49 ද, සම්මේලනයට සහභාගි වූහ. කොමියුනිස්ට් පක්ෂ හා සංවිධාන (රටවල් 31) හැරුනු විට, ජර්මන් ස්වාධීන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ, ප්‍රංශ හා ඉතාලි සමාජවාදී පක්ෂවල, ලෝක කාර්මික කම්කරුවන්ගේ (ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍යය, අයර්ලන්තය), ස්පාඤ්ඤ ජාතික ශ්‍රම පෙඩරල් සංගමය හා වෙනත් සංවිධානවලද නියෝජිතවරු සාකච්ඡා සම්මේලනයට සහභාගි වූහ.

ජාත්‍යන්තර තත්ත්වය හා කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ මූලික කර්තව්‍යයන් යන මැයෙන් සාකච්ඡා සම්මේලනයේ පළවැනි සභාවාරයේදී වී. අයි. ලෙනින් දේශනයක් කළේය. ඊළඟ සභාවාරවලදීද ඔහු කොමියුනිස්ට් පක්ෂය ගැන, ජාතික හා යටත්විජිත ප්‍රශ්නය ගැන, පාර්ලිමේන්තුවාදය හා වෙනත් ප්‍රශ්නද ගැන දේශන පැවැත්වූයේය. සාකච්ඡා සම්මේලනයේ කාරක සභා බොහෝ ගණනකම වැඩවලට ලෙනින් සහභාගි විය.

සාකච්ඡා සම්මේලනයේදී ගත් ප්‍රධාන තීරණයන්වලට පදනම් වූයේ ලෙනින් විසින් ලියන ලද වාමාංශික කොමියුනිස්ට්වාදය උදරු වලිප්පුවකි'' නැමැති ලිපිය ය. පළමුවැනි ප්‍රශ්නය හා සම්බන්ධව යෝජනාවක් වශයෙන් ලෙනින් විසින් ලියන ලද ''කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයේ ප්‍රධාන කර්තව්‍යයන් පිළිබඳ ප්‍රවාද'' නැමැති ලිපිය සම්මේලනය විසින් පිළිගන්නා ලදී. නිර්ධන පංතික විප්ලවයේදී කොමියුනිස්ට් පක්ෂයේ කාර්ය භාරය පිළිබඳද, කම්කරු පංතිය සමග පක්ෂය පවත්වන අන්‍යෝන්‍ය සහයෝගීතාවය පිළිබඳද ප්‍රශ්නය සම්මේලනයේදී සාකච්ඡාවට භාජනය වූ මූලික ප්‍රශ්නයන් විය. ලෙනින්ගේ සහභාගිත්වය ඇතිව පිළියෙළ කරන ලද ''නිර්ධන පංතික විප්ලවයේදී කොමියුනිස්ට් පක්ෂයේ කාර්ය භාරය'' පිළිබඳ සම්මත කරගන්නා ලද යෝජනාවෙහි, කම්කරු පංතියට විමුක්තිය ගෙනදීම ප්‍රධාන හා මූලික උපකරණය වන්නේ කොමියුනිස්ට් පක්ෂය බව සම්මේලනය සඳහන් කළේය. ජාතික-යටත්විජිත හා කෘෂිකාර්මික ප්‍රශ්න පිළිබඳ සම්මේලනයේ යෝජනා වශයෙන් ලෙනින්ගේ ප්‍රවාද පිළිගන්නා ලදී.

ලෙනින් විසින් පිළියෙළ කරන ලද කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ කොන්දේසි 21 ක් සම්මේලනය පිළිගත්තේය. ධනවාදී රටවල කම්කරු ව්‍යාපාරය තුළ නව ආකාරයක පක්ෂ පිහිටුවීමේදී හා ඒවා ශක්තිමත් කිරීමේදී මෙම කොන්දේසි වැදගත් ස්ථානයක් ගත්තේය.

15 ''ටයිම්ස්'' "The Times" — 1785 දී ලන්ඩන්හි පළකිරීම ආරම්භ කරන ලද දිනපතා පත්‍රය. මෙය බ්‍රිතාන්‍ය ධනපති පංතියේ එක් ප්‍රධාන කොන්සර්වටිව් පත්‍රවලින් එකකි.

16 ''රු. සෝ. පෙ. ස. සමූහාණ්ඩුවේ විදේශ කටයුතු භාර මහජන කොමිසාර් අංශයේ නිවේදන පත්‍රිකාව'' — විදේශ කටයුතු භාර කොමිසාර් අංශයේ නිල ප්‍රකාශනය වූ සඟරාවකි. 1919 ජූනි 20 සිට 1922 ජූනි දක්වා මොස්කව්වල පළ විය.

17 ''කරුණු දහතර'' — ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති විල්සන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

1918 ජනවාරි මාසයේදී ''සාම වැඩ පිළිවෙළ'' නමින් ඉදිරිපත් කළ කථාව.

18 මෙහි අදහස් වන්නේ, ඒ අවධියේදී විප්ලවවාදී පොදු ජනතාවගේ බලපෑම යටතේ දෙවැනි ජාත්‍යන්තරයෙන් පිට වූ මධ්‍යස්ථ සමාජවාදී පක්ෂ හා කණ්ඩායම් විසින් පිහිටුවන ලද අන්තර්ජාතික සංවිධානය ය. ''දෙකහමාරේ ජාත්‍යන්තරය'' නැතහොත් ''වියනා ජාත්‍යන්තරය'' (නිල නාමය — ''සමාජවාදී පක්ෂවල අන්තර්ජාතික සංගමය'') නමින් හැඳින්වුණු එම සංගමය 1921 පෙබරවාරි මාසයේ වියනා හිදී පැවැත්වූ සාකච්ඡා සභාවේදී පිහිටුවනලදී. දෙවැනි ජාත්‍යන්තරය විවේචනය කළ දෙකහමාරේ ජාත්‍යන්තරයේ නායකයෝ ඇත්ත වශයෙන්ම, නිර්ධන පංතික ව්‍යාපාරයේ වැදගත් ප්‍රශ්නවලදී, නිර්ධන පංතිය අතර අවස්ථාවාදී හා භේදකාරී ප්‍රතිපත්තියක් ගෙන ගියහ. ඒ අතරම, ඔවුහු, කම්කරු පංතිය අතර වර්ධනය වෙමින් පැවැති කොමියුනිස්ට්වරුන්ගේ බලය නැති කර දැමීම සඳහා එම සංගමය ප්‍රයෝජනයට ගැනීමට උත්සාහ කළහ.

1923 දී දෙවැනි හා දෙකහමාරේ ජාත්‍යන්තර සංවිධාන දෙක ඊනියා සමාජවාදී කම්කරු ජාත්‍යන්තර සංවිධානය නමින් ඒකාබද්ධ වූහ.

19 මෙන්ෂෙවික්වරු — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය තුළ වූ සුළු ධනපති අවස්ථාවාදී උපනතියකි. 1903 දී පැවති රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී පක්ෂයේ මධ්‍යම සංවිධානවලට ඡන්දය විමසන විට ලෙනින්ගේ නායකත්වයෙන් යුත් විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට ඡන්ද බහුතර සංඛ්‍යාවක්ද අවස්ථාවාදීන්ට ඡන්ද අල්පතර සංඛ්‍යාවක්ද ලැබුණේය. එතැන් සිට ලෙනින්වාදී පිළට බොල්ෂෙවික්වාදීන් (බහුතරය) හා අවස්ථාවාදී පිළට මෙන්ෂෙවික්වාදීන් (අල්පතරය) යන හැඳින්වීම් ලැබිණ.

මෙන්ෂෙවික්වරු විප්ලවයේදී නිර්ධන පංතියට ඇති නායක කාර්යභාරයට විරුද්ධවද, කම්කරු පංතිය හා ගොවි ජනතාව අතර සංධානයට විරුද්ධවද, ලිබරල් ධනපති පංතිය හා සමග සම්මුතියක් ඇති කර ගැනීම සඳහාද ඉදිරිපත් වූහ.

1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු මෙන්ෂෙවික්වරු ධනපති තාවකාලික ආණ්ඩුවට ඇතුළු වූහ. ඔවුන් තාවකාලික ආණ්ඩුවේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියට සහයෝගය දුන් අතර සූදනම් වෙමින් තිබූ සමාජවාදී විප්ලවයට විරුද්ධව සටන් කළහ.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව මෙන්ෂෙවික්වරු සෝවියට් බලය විනාශ කිරීම සඳහා කුමන්ත්‍රණ හා කැරැලි සංවිධානය කොට ඒවාට සහභාගී වූහ.

සමාජවාදී-විප්ලවවාදියෝ (එස්ආර්වරු) — 1901 අගදී හා 1902 මුලදී බිහිවූ රුසියාවේ සුළු ධනපති පක්ෂයකි.

1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු මෙන්ෂෙවික්වරු සමග එකතුව එස්ආර්වරු ධනපති තාවකාලික ආණ්ඩුවේ ප්‍රධානතම ආධාරකය ලෙස කටයුතු කළ අතර ඔවුන්ගේ නායකයෝ ආණ්ඩුවට ඇතුළු වූහ.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු එස්ආර්වරු ධනපති පංතිය, ඉඩම් හිමියන් හා ආක්‍රමණිකයින් සමග එකතුව සෝවියට් රජයට විරුද්ධව සටන් කළහ.

20 හත්වැනි සටහන බලන්න.

21 ''ශ්‍රෙනි'' සමාජවාදීන්, ''ශ්‍රෙනි සමාජවාදය'' — පළමුවැනි ලෝක යුද්ධයට ප්‍රථම බිහිවූ බ්‍රිතාන්‍ය වෘත්තීය සමිතිවල ප්‍රතිසංස්කරණවාදී උපනතියකි. ''ශ්‍රෙනි'' සමාජවාදියෝ රජයේ පංති ස්වරූපය ප්‍රතික්ෂේප කළ අතර පංති අරගලයකින් තොරව සූරාකෑමෙන් ගැලවී ගත හැකිය. යන මායා මත කම්කරුවන් අතර වැපිරූහ. එසේම ඔවුහු, පවතින වෘත්තීය සමිතිවල පදනම මත නිෂ්පාදකයින්ගේ (ඊනියා විශේෂ ''ශ්‍රෙනි'' සංගම්, ඊනියා ''ශ්‍රෙනි'' පිහිටුවිය හැකි බවද පෙඩරල් සංගමයකට ඒකාබද්ධ වන එම සංගම්වලට කර්මාන්තය කලමනාකරණය පැවරිය හැකි බවද දේශනා කළහ. ''ශ්‍රෙනි'' සමාජවාදියෝ මේ ආකාරයම සමාජවාදී සමාජයක් ගොඩනැගීමට අදහස් කළහ.

විශේෂයෙන්ම ඔවුහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු, පංති අරගලයට හා නිර්ධන පංතික ආඥාදායකත්වයට ප්‍රතිවිරුද්ධ ලෙස ''ශ්‍රෙනි සමාජවාදය'' ඉදිරිපත් කිරීම සඳහා ප්‍රචාරක කටයුතු ගෙන ගියහ. 1920 ගණන්වලදී බ්‍රිතාන්‍ය කම්කරු පංතිය කෙරෙහි ''ශ්‍රෙනි සමාජවාදයේ'' බලපෑම සම්පූර්ණයෙන්ම අහිමි විය.

22 ජාතික සහ යටත් විජිත ප්‍රශ්න පිළිබඳ කොමිසම පිහිටුවන ලද්දේ කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයේදීය. කොමිසමට සාමාජිකයින් විසි දෙනෙක් ඇතුලත් විය. ඔවුහු බ්‍රිතාන්‍යය, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, හංගේරියාව, ජර්මනිය, ඕලන්දය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, අයර්ලන්තය, චීනය, කොරියාව, මෙක්සිකෝ, රුසියාව, ඇමෙරිකාව, තුර්කිය, ප්‍රංශය, යුගොස්ලෝවියාව නියෝජනය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කළහ. කොමිසමේ වැඩවලට නායකත්වය දෙන ලද්දේ ලෙනින් විසිනි. 1920 ජූලි 25 දින කොමිසමේ වැඩ ආරම්භ වූ අතර ලෙනින් විසින් ලියන ලද ජාතික සහ යටත් විජිත ප්‍රශ්න පිළිබඳ ප්‍රවාද එහිදී සාකච්ඡාවට භාජනය විය. ජූලි 26 දින එම ප්‍රවාද සාකච්ඡා සම්මේලනයට ඉදිරිපත් කරන ලදී. ඒ හැරුනු විට එම්. එන්. රෝයි විසින් ඉදිරිපත් කරන ලද අතිරේක ප්‍රවාදද කොමිසමේදී හා එහි පූර්ණ රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය විය.

23 බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය (British Socialist Party) — සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වෙනත් සමාජවාදී කණ්ඩායම් හා සම්බන්ධ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1911 මැන්චෙස්ටර්හිදී පිහිටුවන ලදී. බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය මාක්ස්වාදී දෘෂ්ටියට එකහව ප්‍රචාරක කටයුතු ගෙනගිය අතර එය "ඇත්තෙන්ම ලිබරල්වාදීන්ගෙන් ස්වධීනව වැඩ කළ අවස්ථාවාදී පක්ෂයක්ද නොවීය" යි ලෙනින් සඳහන් කළේය.

බ්‍රි. ස. ප. ඔක්තෝබර් සමාජවාදී විප්ලවය පිළිගත්තේය. විදේශීය ආක්‍රමණිකයින්ගෙන් සෝවියට් රුසියාව ආරක්ෂා කිරීම සඳහා බ්‍රිතාන්‍ය වැඩ කරන ජනතාව ගෙනගිය සටනේදී බ්‍රි. ස. ප. ඉටු කළ කර්තව්‍යද අති විශාලය. 1919 දී පක්ෂ සංවිධානයේ බහුතරය (සියයට 98 පමණ) කොමියුනිස්ට් ජාත්‍යන්තරයට සහභාගී වීමට පක්ෂව ඉදිරිපත් වූහ. බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමේදී බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය ඒකාබද්ධ කොමියුනිස්ට් කණ්ඩායම සමග ප්‍රධාන කාර්ය කොටසක් ඉටු කළේය.

24 බාසල් ප්‍රකාශනය — 1912 නොවැම්බර් 24-25 දිනවලදී බාසල්හි පැවති අතිවිශේෂ අන්තර්ජාතික සමාජවාදී සාකච්ඡා සම්මේලනය විසින් සම්මත කර ගන්නා ලද යුද්ධය පිළිබඳ ප්‍රකාශනය. එම ප්‍රකාශනය මගින් ජනතාවට ළඟ ළඟම එන ලෝක යුද්ධ පිළිබඳ අනතුරු හැඟවූ අතර එම යුද්ධයේ කොල්ලකාරී අරමුණු හෙළිදරව් කළේය. එසේම. ප්‍රකාශනය මගින්, "ධනවාදී අධිරාජ්‍යවාදයට විරුද්ධව නිර්ධන පංතියේ අන්තර්ජාතික සමගි බලය" ඉදිරිපත් කර සාමය සඳහා නැගී සිටින-ලෙස සියලුම රටවල කම්කරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී. අධිරාජ්‍යවාදී යුද්ධයක් ඇති වුවහොත් එයින් පැන නගින ආර්ථික හා දේශපාලන අර්බුද සමාජවාදී විප්ලවය වෙනුවෙන් සටන සඳහා ප්‍රයෝජනයට ගත යුතු බව සඳහන් 1907 ෂ්ටුට්ගාර්ට් සම්මේලනයේ යෝජනාවකට ලෙනින් විසින් ඉදිරිපත් කළ ඡේදයක්ද බාසල් ප්‍රකාශනයට ඇතුළු කරන ලදී. අධිරාජ්‍යවාදී රාජ්‍යයන්ගේ බලකාමී ප්‍රතිපත්තිය බාසල් ප්‍රකාශනයෙන් නිර්ධන ලෙස විවේචනය කරන ලද අතර සුළු ජාතීන් සියලුම ආකාරයේ පීඩනයට පත් කිරීමට හා ජාත්‍යොන්මාදවාදය එළිදැකීමට විරුද්ධව සටන් කරන ලෙස සමාජවාදීන්ගෙන් ඉල්ලා සිටින ලදී.

25 ලෙනින් මෙහි අදහස් කරන්නේ ප්‍රොලෙත්කුල්ත් සංස්කෘතික-අධ්‍යාපනික සංවිධානයේ සාමාජිකයින් විසින් "නිර්ධන පංතික සංස්කෘතිය" නමින් ඉදිරිපත් කරන ලද මාක්ස්වාදයට පටහැනි දෘෂ්ටිය ය. 1917 සැප්තැම්බර් මාසයේදී බිහිවූ මෙම සංවිධානය ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසුවද තම "ස්වාධීනත්වය" ගෙන ගිය අතර ඒ මගින් නිර්ධන පංතියේ රජයට විරුද්ධ විය. පැරණි සංස්කෘතික උරුමය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ ප්‍රොලෙත්කුල්ත්වරු පොදුජන සංස්කෘතික අධ්‍යාපන කටයුතුවලට වැටකඩුළු බැඳීමට හා ජනදිවියෙන් ඈත්ව "පරීක්ෂණාගාර තුළ" විශේෂ "නිර්ධන පංතික සංස්කෘතියක්" බිහි කිරීමට ඉදිරිපත් වූහ. වචනයෙන් පමණක් මාක්ස්වාදය පිළිගත් ප්‍රොලෙත්කුල්ත් නායක ඒ. ඒ. බග්දනව් විශයමූල-විඥානවාදී මාහ්වාදී දර්ශනයක් දේශනා කළේය. 1919 දී ප්‍රොලෙත්කුල්ත් සංවිධානය ඉහළම හිණිපෙත්තට නැංගේය. 1920 අවුරුදුවල ආරම්භයේදී ඔවුන්ගේ වැටීම ආරම්භ විය. 1932 දී ප්‍රොලිත්කුල්ත් සංවිධානය දියවී ගියේය.

26 "නිර්ධන පංති සංස්කෘතිය ගැන." යෝජනා කෙටුම්පත — 1920 ඔක්තෝබර් 5 සිට 12 දක්වා මොස්කව්හි පැවති ප්‍රොලෙත්කුල්ත් පළමුවැනි සමස්ත රුසියානු සම්මේලන සම්බන්ධයෙන් ලෙනින් විසින් ලියන ලදී. 1920 ඔක්තෝබර් 9 දින හා 11 දින පැවති රු. කො. (බො.) පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ දේශපාලන බලමණ්ඩලයේ සභාවාරයන්හි ප්‍රොලෙත්කුල්ත් ගැන ප්‍රශ්නය සාකච්ඡා කිරීමේ පදනම වූයේ ලෙනින්ගේ කෙටුම්පත ය. ප්‍රොලෙත්කුල්ත් පළමුවැනි සම්මේලනයේ කොමියුනිස්ට් කණ්ඩායමට ප්‍රොලෙත්කුල්ත් සංවිධාන මධ්‍යස්ථානයේ මෙන්ම ඒ ඒ ස්ථානවලද අධ්‍යාපන කටයුතු පිළිබඳ මහජන කොමිසාර් අංශයේ ආයතනවලට යටත් කිරීම පිළිබඳ සංවිධානාත්මක ව්‍යවස්ථාවක් පිළිගන්නා ලෙස යෝජනා කරන ලදී. ලෙනින්ගේ උපදෙස් පරිදි පිළියෙළකරන ලද එම ව්‍යවස්ථාව ප්‍රොලෙත්කුල්ත් සම්මේලනය ඒකමතිකව සම්මත කළේය. එහෙත් සම්මේලනයට පසු සමහර ප්‍රොලෙත්කුල්ත් නායකයෝ සම්මේලනය විසින් පිළිගන්නා ලද එම ව්‍යවස්ථාවට එකඟ නොවන බව කීමට පටන් ගත්හ. රු. කො. (බො.) ප.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මධ්‍යම කාරක සභාව කම්කරුවන්ගේ කලාත්මක නිර්මාණ ක්ෂේත්‍රය සීමා කිරීමට යන බවත් ප්‍රොලෙත්කුල්ත් සංවිධාන විසුරුවා හැරීමට යන බවත් කියමින් ඔවුහු එහි සාමාන්‍ය සාමාජිකයින්ට ව්‍යවස්ථාව වැරැදි ලෙස හඳුන්වා දීමට ඉදිරිපත් වූහ. එම සාවද්‍ය වංචාකාරී ප්‍රකාශ-වලට රු. කො. (බො.) ප. මධ්‍යම කාරක සභාවේ ''ප්‍රොලෙත්කුල්ත් සංවිධාන ගැන'' නැමැති (1920 දෙසැම්බර් පළමුවැනි දින ''ප්‍රාව්ද'' අංක 270 හි මුද්‍රණය කරන ලද ලිපියෙන් පිළිතුරු සපයන ලදී. එහි ප්‍රොලෙත්කුල්ත්වරුන්ගේ වැරැදි විස්තරාත්මක ලෙස සාකච්ඡාවට භාජනයව තිබිණ.

27 ''සමූහාණ්ඩුවේ ප්‍රධාන දේශපාලන-අධ්‍යාපන කොමිටිය'' පිළිබඳ මහජන කොමිසාර් මණ්ඩලයේ ආඥාව වී. අයි. ලෙනින් විසින් 1920 නොවැම්බර් 12 දින අත්සන් කරන ලදී.

ප්‍රධාන දේශපාලන අධ්‍යාපන කොමිටිය සියලුම දේශපාලන-අධ්‍යා-පන හා උද්ඝෝෂන-ප්‍රචාරක වැඩ කටයුතු ඒකාබද්ධ කළ අතර කොමි-යුනිස්ට්වාදී වැඩිහිටි අධ්‍යාපනයද (නූගත්කම නැතිකිරීම, පාසල්, සමාජ ශාලා, පුස්තකාල, කියවීම් ශාලා) එසේම පක්ෂ අධ්‍යාපනයද (කොමියුනිස්ට් අධ්‍යාපන ආයතන, පක්ෂ පාසල්) පාලනය කළේය. ප්‍රධාන දේශපාලන අධ්‍යාපන කොමිටියේ ප්‍රධානියා වූයේ නදේෂ්ද ක්‍රෑප්ස්කයා ය. 1930 ජූනි මස ප්‍රධාන දේශපාලන අධ්‍යාපන කොමිටිය අධ්‍යාපන කටයුතු පිළිබඳ මහජන කොමිසාර් අංශයේ පොදුජන කට-යුතු දෙපාර්තමේන්තුවට ප්‍රතිසංවිධානය කරන ලදී.

28 <u>කේරෙන්ස්කි කල්ලිය</u> — ධනපති පංතියේ අවශ්‍යතාවයන්ට අනුකූල ප්‍රතිපත්තියක් ගෙන ගිය සමාජවාදී-විප්ලවවාදී පාක්ෂික කේරෙන්ස්-කිගේ ප්‍රධානත්වයෙන් තාවකාලික ආණ්ඩුව පැවති 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය හා ඔක්තෝබර් සමාජවාදී විප්ලවය අතර කාලය.

29 මෙම කෙටුම්පත, පදනම් වූයේ 1920 නොවැම්බර් 8 දින පස්වැනි සම-ස්ත රුසියානු වෘත්තීය සංගම් සාකච්ඡා සභාවේදී රු. කො. (බො.) ප. කණ්ඩායම විසින් සම්මත කරන ලදුව නොවැම්බර් 13 දින ''ප්‍රාව්ද'' පත්‍රයෙහි පළ කරන ලද වෘත්තීය සංගම් ව්‍යාපාරයේ කර්තව්‍යයන් පිළි-බඳ යෝජනාව.

පස්වැනි සමස්ත රුසියානු වෘත්තීය සංගම්වල සාකච්ඡා සභාව 1920 නොවැම්බර් 2-6 දිනවල (එය නිල වශයෙන් විවෘත කරන ලද්දේ නොවැම්බර් 3 දය) මොස්කව්හිදී පවත්වන ලදී. සාමකාමී සමාජවාදී ගොඩ නැගීම්වලට අනුකූලව, වෘත්තීය සංගම්වල වැඩ කටයුතු නැවත සකස්කිරීම පිළිබඳව, ඒවායේ සංවිධානයෙහි හා ක්‍රියාකාරීත්වයෙහි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම විකාශනය කිරීම පිළිබඳවද ප්‍රශ්නය එහිදී පැන නැංගේය. නව ක්‍රමයට පරිවර්තනය වීමට විරුද්ධව කොමියුනි-ස්ට් කණ්ඩායමේ රැස්වීමේදී නොවැම්බර් 3 දින ට්‍රොට්ස්කි කථා කළේය. වෘත්තීය සංගම් කල් නොගොස්ම රාජ්‍යමය කරන ලෙස ඉල්ලා සිට ඔහු ඒවා තුළ හමුදා ක්‍රමයේ අණදීම් හා පාලනයක් ගෙනයා යුතු යැයි කියා සිටියේය. පක්ෂය තුළ වාදයකට ආරම්භය වූ ට්‍රොට්ස්කිගේ කතාව සාකච්ඡා සභාවේ සාමාජිකයින් වූ කොමියුනිස්ට්වරුන්ගේ දැඩි විරෝ-ධයට භාජනය විය.

30 <u>ට්සෙක්ත්‍රාන්</u> — 1920 සැප්තැම්බර් 20 දින පිහිටුවන ලද දුම්රිය මාර්ග හා ජල මාර්ග ගමනාගමන සේවයේ ඒකාබද්ධ වෘත්තීය සංගමයේ මධ්‍යම කාරක සභාව. ගමනාගමන සේවයේ විනාශය නිසා රටේ ජනතා ආර්ථිකය අඩපණ වීමට ඉඩ තිබිණ. එම නිසා ගමනාගමන සේවය හැකි කඩිනමින් පුනරුත්ථාපනය කිරීමට යොමු වූ සියලුම කර්තව්‍ය-යන් ඉටු කිරීමට සමත් මධ්‍යගත කරන ලද නායකත්වයක අවශ්‍යතා-වය හේතු කොට ගෙන ගමනාගමන සේවයේ වෘත්තීය සංගම් දෙකක් ඒකාබද්ධ කිරීමට සිදු විය. ගමනාගමන සේවය පුනරුත්ථාපනය කිරීම සඳහා සෑහෙන වැඩ කොටසක් කළ ට්සෙක්ත්‍රාන් පසුව වෘත්තීය සංගම් පොදු කටයුතුවලින් ඉවත්ව නිලධාරීවාදී ආයතනයක් බවට පත් විය. ට්සෙක්ත්‍රාන් නායකත්වය තමන් සතු කරගත් ට්‍රොට්ස්කිවාදියෝ නිලධාරිවාදය, හෙළුවැලි පාලනය, පත්කිරීම්, වැඩකිරීමේ ප්‍රජාතන්ත්‍ර-වාදී ක්‍රමවලින් ඉවත්වීම ආදිය කරමින් කම්කරුවන් පක්ෂයට විරුද්-ධව පෙළඹවූහ, ගමනාගමන සේවයේ කාරකවරුන් කෙටවූහ. ඉහත කී එම ක්‍රම පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් සාකච්ඡාවට භාජනය කරන ලදී. 1920 නොවැම්බර් 8 — දෙසැම්බර් 7 පැවැති රු. කො. (බො.) ප. මධ්‍යම කාරක සභාවේ පූර්ණ රැස්වීම් වාරයේදී ට්සෙක්ත්‍රාන් වෙනත් සංගම්වලට ඇති සමාන අයිතිවාසිකම්වලින් යුතුව වෘත්තීය සංගම්වල සමස්ත සෝවියට් මධ්‍යම මණ්ඩලයේ ක්‍රියාකාරී ක්‍රමයට ඇතුලත් කිරීමට තීරණය කළ අතර වෘත්තීය සංගම් ප්‍රජාතන්ත්‍රවාදය පුළුල්වන අන්දමින් තමන් වැඩකරන ආකාරය වෙනස් කරන ලෙස නිර්දේශ කළේය. 1921 මාර්තු මස පක්ෂ මධ්‍යම කාරක සභාවේ තීරණය පරිදි කැඳවන ලද ගමනාගමන සේවකයින්ගේ පළමුවැනි සමස්ත රුසියානු සම්මේලනයේදී ට්සෙක්ත්‍රාන් නායකත්වයෙන් ට්‍රො-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ටස්කි අනුගාමිකයින් පන්නා දමන ලද අතර නව ක්‍රමයට එහි වැඩ ආරම්භ කරන ලදී.

31 සෝවියට් රුසියාවට විරුද්ධව ධනපති-ඉඩම්හිමි පෝලන්තය යුද්ධය සංවිධානය කරන ලද්දේ ඇමෙරිකා එක්සත් ජනපදය හා එන්ටෙන්ට් මිත්‍ර රටවල් විසිනි. අධිරාජ්‍යවාදීන්ගේ බලපෑම්වලට යටත්වූ පෝලන්තය, සෝවියට් ආණ්ඩුව ඉදිරිපත් කළ සාම යෝජනාව දැඩි ලෙස ප්‍රතික්ෂේප කළේය. 1920 අප්‍රේල් 25 වැනි ද යුද ප්‍රකාශයකින් තොරව පිල්සුද්ස්කි යටතේ පෝලන්ත හමුදව සෝවියට් රජ්‍ය සීමාවන් ආක්‍රමණය කළේය.

32 සම්පූර්ණ විනාශයෙන් ගැලවීම සඳහා ධනපතිඉඩම්හිමි පෝලන්තය 1920 ඔක්තෝබර් 12 දින යුධ විරාමයකට පැමිණීමේ ගිවිසුමකට අත්සන් තැබුවේය. පෝලන්තය, රු. සො. පෙ. ස. සමූහාණ්ඩුව හා උක්‍රේනියාව සමග අවසාන සාම ගිවිසුම 1921 මාර්තු 18 දින රිගාහිදී අත්සන් කළේය.

33 ලෙනින් මෙහි අදහස් කරන්නේ 1920 අගෝස්තු 10 දින වැරැන්ගල් "දකුණු රුසියානු ආණ්ඩුකාරයා" නිල වශයෙන් පිළිගත් ප්‍රංශ ආණ්ඩුව ය.

34 ලෙනින් මෙහි අදහස් කරන්නේ, එස්තෝනියාව සමගද (1920 පෙබරවාරි 2), ලත්වියාව සමගද (1920 අගෝස්තු 11), පිංලන්තය සමගද (1920 ඔක්තෝබර් 14) අත්සන් කරන ලද සාම ගිවිසුම්ය.

35 රුසියානු සෝවියට් පෙඩරල් සමාජවාදී සමූහාණ්ඩුව හා පර්සියාව (ඉරානය) අතර මිත්‍රත්ව ගිවිසුම 1921 පෙබරවාරි 26 වැනි දින මොස්කව්හිදී අත්සන් කරන ලදී. එම ගිවිසුම මගින් සාර්වාදී රුසියාවද, පර්සියාවද, තුන්වැනි රජයන්ද අතර අත්සන් කරන ලද, පර්සියානු ජනතාවගේ ස්වාධීනත්වයට බාධකරන සියලුම ගිවිසුම් අවලංගු කරන ලදී. සෝවියට් ආණ්ඩුව, ඉරානයට සාර්වාදී ආණ්ඩුව විසින් ඉඩ දෙන ලද ණය මුදල්ද පිළිබඳ සියලුම අයිතිවාසිකම්ද පර්සියාවේ භූමියට ඇති අනුග්‍රහයන්ද ප්‍රතික්ෂේප කළේය. රුසියාවට හෝ පර්සියාවට හෝ විරුද්ධව සටන් කිරීමේ අරමුණ ඇතිව තම රටවල් තුළ කණ්ඩායම් හෝ සංවිධාන පිහිටුවීම හෝ ඒවා රට තුළ සිටීම හෝ රටවල් දෙකම ඉඩ නොසලසන ලෙස බැඳෙන වගන්තිය එහි වැදගත් ස්ථානයක් ගත්-

තේය. එය පර්සියාව විසින් අත්සන් කරන ලද සමාන බලතල ඇති පළමුවැනි ගිවිසුම ය.

36 මෙහි සඳහන් කර ඇත්තේ, 1920 නොවැම්බර් 29 දින මහා බ්‍රිතාන්‍යයේ වෙළඳ ඇමති වයිස් විසින් ලන්ඩනයෙහි සෝවියට් වෙළඳ නියෝජිත කණ්ඩායමේ නායක එල්. බී. ක්‍රාසින් වෙත පිළිගන්වන ලද මහා බ්‍රිතාන්‍ය හා රු. සො. පෙ. ස. ස. වෙළඳ ගිවිසුම ගැනය. ආර්ථික හා දේශපාලන සබඳතාවයන් සාමාන්‍ය තත්ත්වයකට ගෙනඒමේ සාකච්ඡා 1920 මැයි මස අරඹන ලදී. බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ වරදින් එම සාකච්ඡා කල් ගිය අතර වෙළඳ ගිවිසුම අත්සන් කරන ලද්දේ 1921 මාර්තු 16 දින දීය.

37 "සටන් කොමිටි" ("සටන් මණ්ඩල") බ්‍රිතාන්‍ය කම්කරුවන් විසින් පිහිටුවන ලද්දේ බ්‍රිතාන්‍යය සෝවියට් රුසියාවට විරුද්ධව සටන් වැදීම වලක්වනු සඳහා ය. එම සංවිධාන 1920 අගෝස්තු මාසයේදී බිහිවීම ආරම්භ වූ අතර, අගෝස්තු අවසාන වන විට 150 ක් පමණ බිහිවී තිබුණේය. සැප්තැම්බර් අගදී සංවිධාන සංඛ්‍යාව දෙගුණයක් පමණ විය. "සටන් මණ්ඩල" සංවිධානය කිරීමේදී බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය විශාල කාර්ය කොටසක් ඉටු කළේය.

38 සමස්ත රුසියානු මධ්‍යම විධායක කාරක සභාව විසින් 1918 නොවැම්බර් 30 දින ආරක්ෂක මණ්ඩලය (කම්කරු හා ගොවි ආරක්ෂක මණ්ඩලය) පිහිටුවන ලදී. ආරක්ෂක කටයුතුවලට අවශ්‍ය වන සියලුම මාධ්‍යයන් ඒකරාශී කිරීමට එයට සියලුම බලතල පවරන ලදී. 1920 අප්‍රේල් මාසයේදී කම්කරු හා ගොවි ආරක්ෂක මණ්ඩලය ශ්‍රම හා ආරක්ෂක මණ්ඩලයට ප්‍රතිසංවිධානය කරන ලදී. සෝවියට් සභාවල අටවැනි සමස්ත රුසියානු සම්මේලනයේ ආඥාවක් පරිදි 1920 දෙසැම්බර් මස ශ්‍රම හා ආරක්ෂක මණ්ඩලය මහජන කොමිසාර් මණ්ඩලයේ බලතල ඇතිව ක්‍රියාත්මක වීමට පටන් ගත්තේය. එයට හිමි ප්‍රධානතම කාර්ය භාරය වූයේ ආර්ථිකය ගොඩනැගීම පිළිබඳ සියලුම දෙපාර්තමේන්තුවල වැඩකටයුතු ඒකාබද්ධ කිරීමය. මණ්ඩලය 1937 දක්වා පැවතිණ.

39 "ගොවිජන කෘෂිකාර්මික ආර්ථිකය ශක්තිමත් කිරීමට හා වර්ධනය කිරීමට අවශ්‍ය පියවරයන් පිළිබඳ" සෝවියට් සභාවල අටවැනි සමස්ත රුසියානු සම්මේලනය විසින් සම්මත කරගන්නා ලද ආඥා කෙටුම්පත ගැනය මෙහි සඳහන් වන්නේ.

https://liberationbase.wordpress.com

ආඥ කෙටුම්පත මගින් කෘෂිකර්මය රාජ්‍යමය ලෙස සමාකාර කිරීමට ගන්නා පියවරයන් තම ගොවිපොළේ ඵලදායකත්වය වැඩි කිරීමේදී ගොවීන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් සමග සංකලනය කිරීම සලකා බලන ලදී.

40 ගමනාගමන සේවය පුනරුත්ථාපනය කිරීම පිළිබඳ චක්‍රලේඛනය නො. 1042, ගමනාගමන සේවයේ ප්‍රධාන කාර්යාලය විසින් 1920 මැයි 22 බෙදා හරින ලදී. අවුරුදු $4^1/_2$ කාලයක් ඇතුලත (1920 ජුලි 1 සිට) අළුත්වැඩියා කිරීම් සඳහා නවතා ඇති දුම්රිය ඇංජින් සංඛ්‍යාව සියයට 60 සිට 20 දක්වා පහළ දැමිය යුතු බව එම චක්‍රලේඛනයෙන් අණ කරන ලදී.

41 මෙහි සඳහන් වන්නේ සෝවියට් සභාවල අටවැනි සමස්ත රුසියානු සම්මේලනය සඳහා එස්. අයි. ගුසියෙව් විසින් පළ කරන ලද "සමස්ත ආර්ථික වැඩ පිළිවෙළ හා සමස්ත ආර්ථික යන්ත්‍රය" නැමැති පොත් පිංච ගැනය. ඔහු විසින් "ආර්ථිකය ගොඩනැගීම පිළිබඳ හදිසි ප්‍රශ්න (රු. කො. ප. මධ්‍යම කාරක සභාවේ ප්‍රවාද ගැන)" නමින් ඊට පෙර ලියන ලද පොත් පිංච පක්ෂයේ නවවැනි සම්මේලනය සඳහා පළ කරන ලදී. පක්ෂයේ නවවැනි සම්මේලනයේදී 1920 මාර්තු මස 29 දින ලෙනින් එම පොත ගැන ගුණාත්මක විවේචනයක් කළේය.

42 රට විද්‍යුත්කරනය කිරීමේ සැලැස්ම සම්පාදනය කිරීම සඳහා විද්‍යා හා තාක්ෂනයේ ප්‍රධාන පෙළේ නියෝජිතයින් 200 ක් පමණ සහභාගි වූහ. සැලැස්මේ සම්පාදක කොමිසමේ සභාපති තනතුර ජී. එම්. ක්‍රිෂ්පනොව්ස්කි දැරූ අතර ගොඑල්රෝ කටයුතුවල නායකත්වය ලෙනින් විසින් දෙන ලදී.

43 සුහරෙව්කා — 1692 දී ගොඩ නගන ලද සුහරෙව් කුළුනා වටා පවත්වන ලද මොස්කව් වෙළඳ පොළ. "සුහරෙව්කා" නාමය වැඩි මිලට බඩු විකිනීමේ, "නිදහස්" පෞද්ගලික වෙළඳාමේ සංකේතයක් විය. 1920 දෙසැම්බර් 13 දින මොස්කව් සෝවියට් සභාවේ තීරණයක් පරිදි වෙළඳ පොළ වසා දමන ලදී.

44 වෘත්තීය සංගම්වල කාර්ය භාරය හා කර්තව්‍යයන් පිළිබඳ ප්‍රශ්නයේදී පක්ෂය තුළ පැන නැගුනු විවාදය හා සම්බන්ධයෙන් ලෙනින් විසින් මෙම පොත් පොඩිය ලියන ලදී. 1921 ජනවාරි 25 දින පොත ලියා අවසන් කළ ලෙනින් එදිනම එය මුද්‍රණය සඳහා භාර දුන්නේය. වෘත්තීය සංගම් පිළිබඳ සාකච්ඡාවලට සහභාගි වීමට ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට ගිය මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින්ට ජනවාරි 26 දින සවස බෙදා දෙන ලදී.

විවාදය හා පක්ෂ ප්‍රතිපත්තියට විරුද්ධ සටන ආරම්භ කළේ ට්‍රොට්ස්කි විසිනි. විවාදය වෘත්තීය සමිති රාමුවෙන්ද පිට වූ අතර ඇත්ත වශයෙන්ම සාකච්ඡාවට භාජනය වූයේ රුසියාවෙහි නිර්ධන පංතික ආඥදායකත්වය හා සමාජවාදය පිළිබඳවය.

ලෙනින් හා ලෙනින්ගේ අනුගාමිකයෝ විරුද්ධ පක්ෂයට විරුද්ධව තීරණාත්මක ලෙස සටන් අරඹා පක්ෂ විරෝධී කණ්ඩායම්වල ප්‍රධාන බලවේගය වූ ට්‍රොට්ස්කිවාදීන්ට විරුද්ධව ප්‍රධාන වශයෙන් එය එල්ල කළහ. විවාදයේදී "වෘත්තීය සංගම් ගැන, හදිසි අවධිය ගැන හා ට්‍රොට්ස්කිගේ වැරදි" යන මාතෘකාව යටතේ ලෙනින් තම පළමුවැනි කථාව කළේය. 1920 දෙසැම්බර් 30 දින පැවති අටවැනි සෝවියට් සභා සම්මේලනයේ නියෝජිතයින්ගේද, රු. කො. (බො.) ප. සාමාජිකයන් වූ, සමස්ත රුසියානු වෘත්තීය සංගම්වල මධ්‍යම මණ්ඩලයේ හා මොස්කව් නගරයේ වෘත්තීය සමිතිවල මධ්‍යම මණ්ඩලයේ සාමාජිකයන්ගේ ද ඒකාබද්ධ රැස්වීමේදී ඔහු එම කථාව කළේය. 1921 ජනවාරි 21 දින "ප්‍රාව්ද" පත්‍රයෙහි "පක්ෂ අර්බුදය" නමින් ලෙනින්ගේ ලිපියක් පළ විය. එම ලිපිය මගින් ලෙනින්, පක්ෂ විරෝධී කණ්ඩායම්වල කාණ්ඩ ගැසීමේ භේදකාරී ක්‍රියාකාරීත්වය හෙළිදරව් කළ අතර විවාදයේ හරය හා ප්‍රධාන අවධි විස්තර කළේය. 1921 ජනවාරි 23 දින පැවති පතල් කම්කරුවන්ගේ දෙවැනි සමස්ත රුසියානු සම්මේලනයේ කොමියුනිස්ට්වරුන්ගේ රැස්වීමේදී ලෙනින් "වෘත්තීය සංගම්වල කාර්ය කොටස හා කර්තව්‍යයන්" යන මාතෘකාව යටතේ කළ කථාව පක්ෂ විරෝධීන්ට විරුද්ධව පක්ෂය කරන අරගලයේදී ඉතා වැදගත් විය.

වෘත්තීය සංගම් විවාදයේදී ට්‍රොට්ස්කිවාදීහු හා වෙනත් සියලුම විරුද්ධවාදීහු පරාජයට පත් වූහ. පක්ෂ සංවිධාන ලෙනින් වටා සමගි වූ අතර "වෘත්තීය සමිතිවල කාර්ය කොටස හා කර්තව්‍යයන් පිළිබඳ ප්‍රශ්නය ගැන රු. කො. ප. දහවැනි සම්මේලනයේ කෙටුම්පත් ප්‍රකාශනයෙන්" ඉදිරිපත් කළ ලෙනින්වාදී වේදිකාවට ඒකරාශී වූහ. එම කෙටුම්පත තුළ කළමනාකරන පාසල්, ආර්ථික පාසල්, කොමියුනිස්ට්වාදී පාසල් මෙන්, වෘත්තීය සමගම්වලට අයිති කාර්ය කොටස නිර්ණය කර තිබූ අතර වෘත්තීය සමිතිවල කටයුතුවල ප්‍රධාන ආකාරය යුත්තේ සමිති අභ්‍යන්තරයෙහි නිර්ධන පංතික ප්‍රජාතන්ත්‍රවාදී ආකාරය මෙන් අවබෝධ කිරීමේ ක්‍රමය බව සඳහන්ව තිබුණි. එසේම, සමාජවාදය ගොඩනැගීම සඳහා කම්කරු පංතියේ සියලු දෙනාම සමගි කරවීමේ කර්තව්‍යයන්ද එයින් ඉදිරිපත් කරන ලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

45 මෙහි සඳහන් වන්නේ 1920-1921 අවුරුදුවලදී වෘත්තීය සමිති විවාදවලට සහභාගිවූ පක්ෂ විරෝධී කාණ්ඩවාදී කණ්ඩායම්වලින් එකක් වූ "බෆර් කණ්ඩායම" නැතහොත් "බෆර් කාණ්ඩය" ගැනය. එන්. අයි. බුහාරින් එහි නායකයා විය. ට්‍රොස්කිවාදය හා ලෙනින්වාදය සමගි කිරීමට උත්සාහ දැරූ නිසාත්, වේදිකා දෙක හැපෙන විට අතරමැදි බෆර්එකක් ලෙස ක්‍රියා කළ නිසාත් එය "බෆර් කණ්ඩයම" ලෙස හැඳින්විණි. එහෙත් ඇත්ත වශයෙන්ම ඔවුහු ට්‍රොට්ස්කිවාදීන් ආරක්ෂා කළ අතර ලෙනින්ට විරුද්ව හා පක්ෂ ප්‍රතිපත්තියට විරුද්ධව සටනේදී ඔවුන්ට සහයෝගය දක්වූහ. පසුව බුහාරින්වරු විවෘතවම ට්‍රොට්ස්කිට එකතු වූහ. වී. අයි. ලෙනින්, "බෆර් කණ්ඩායමේ" වේදිකාව, පක්ෂ නායකත්වය ප්‍රතික්ෂේප කිරීම කරා නැඹුරු වූ සින්ඩිකල්වාදයක් ලෙස ස්වභාව නිරූපණය කළ අතර එය "දෘෂ්ටිය අවපාට වීමේ අන්තිම සීමාව ලෙස හැඳින්වීය

46 ග්ලාව්පොලිත්පුත් (ගමනාගමනය පිළිබඳ මහජන කොමිසාර් අංශයේ ප්‍රධාන දේශපාලන දෙපාර්තමේන්තුව), 1919 පෙබරවාරි මාසයේදී, රු. කො. (බො.) ප. මධ්‍යම කාරක සභාවේ නායකත්වය යටතේ වැඩ කරන තාවකාලික දේශපාලන ආයතනයක් ලෙස ආරම්භ කරන ලදී. 1920 ජනවාරි මාසයේදී ගමනාගමනය පිළිබඳ මහජන කොමිසාර් අංශයේ ප්‍රධාන දේශපාලන ආයතනය ලෙස එය ප්‍රතිසංවිධානය කෙරිණ. ග්ලාව්පොලිත්පුත් ආරම්භ කරන ලද්දේ ප්‍රවාහන අංශය සම්පූර්ණයෙන්ම විනාශවීම නතර කිරීමට අතිවිශේෂ කටයුතු ක්‍රියාත්මක කරවීම සඳහාය. 1920 දෙසැම්බර් 7 දින රු. කො. (බො.) ප. මධ්‍යම කාරක සභාවේ තීරණයක් පරිදි ග්ලාව්පොලිත් විසුරුවා හරින ලදී.

47 මෙහි සඳහන් වන්නේ "දහයේ වේදිකාව" (වෘත්තීය සමිතිවල කාර්ය කොටස හා කර්තව්‍යයන් ගැන රු. කො. (බො.) ප. දහවැනි සම්මේලනයේ කෙටුම්පත් ප්‍රකාශනය") ගැනය. පක්ෂ සාමාජිකයින්ගේ බහුතරයේ සහයෝගය ලැබුණු "දහයේ වේදිකාව", වෘත්තීය සමිතිවල කාර්ය කොටස හා කර්තව්‍යයන් ගැන රු. කො. (බො.) ප. දහවැනි සම්මේලනයේ ප්‍රකාශනයට පදනම විය.

43 වී. අයි. සෝෆ්ජ් විසින් 1920 මැයි 3 දින පිට කරන ලද චක්‍රලේඛනය එම අවුරුද්දේම "මරින්ස්කි ප්‍රාදේශීය ජලමාර්ග ප්‍රවාහන සේවයේ පාලන බුලටිනයේ" අංක 5 කලාපයෙහි පළ විය. එම චක්‍රලේඛනය, ට්‍රොට්ස්කිවාදීන් විසින් වැලඳ ගෙන තිබූ පාලනය කිරීමේ හා නිලධාරිවාදයේ නිදර්ශනයක් විය. හමුද කොමිටිවල තත්ත්වයට සමාන මට්ටමකට පැමිණි වෘත්තීය සමිති චක්‍රලේඛන මාර්ගයෙන්, ජලමාර්ග ප්‍රවාහන සේවය නගාසිටුවීමේ වැඩකටයුතු වලින් ඈත් විය.

49 රබ්ක්‍රින් — කම්කරු-ගොවි පරීක්ෂණය පිළිබඳ මහජන කොමිසාර් අංශය ය.

50 පතල් කම්කරුවන්ගේ දෙවැනි සමස්ත රුසියානු සම්මේලනය 1921 ජනවාරි 25 සිට පෙබරවාරි 1 දක්වා පැවැත්විණ. සම්මේලනය විවෘත කිරීමට පෙර ජනවාරි 22-24 හතර වතාවක්ම කොමියුනිස්ට් කණ්ඩායම රැස්විය. එහිදී ජනවාරි 23 වැනි දින ලෙනින් වෘත්තීය සංගම්වල කාර්ය කොටස හා කර්තව්‍යයන් නමින් වාර්තාවක් ඉදිරිපත් කළේය. 24 වැනි දින වාර්තාව පිළිබඳව අවසාන දේශනය කළේය.

51 "කම්කරු විරුද්ධ පාර්ශ්වය — ඒ. ජී. ෂ්ලයාප්නිකොව්, සී. පී. මෙද්වියෙදියෙව්, ඒ. එම්. කොලොන්තායි ආදීන් විසින් නායකත්වය උසුලන ලද පක්ෂ විරෝධී අරාජික-සින්ඩිකල්වාදී කාණ්ඩවාදී කණ්ඩායම. එම අහංකාර නාමය ඇතිව කණ්ඩායම 1920 සැප්තැම්බර් මාසයේදී රු. කො. (බො.) ප. නවවැනි සමස්ත රුසියානු සාකච්ඡා සභාවේදී ඉදිරියට පැමිණියේය. 1920-1921 වෘත්තීය සමිති පිළිබඳ විවාදය පැවති කාලයේදී එය සම්පූර්ණ ලෙසම සංවිධානය විය. ඔවුන්ගේ අදහස් වලින් පක්ෂයේ අරාජිකවාදී-සින්ඩිකල්වාදී නැඹුරුවීම ප්‍රකාශ කෙරිණ. රු. කො. (බො.) ප. දහවැනි සම්මේලනය ආසන්නයේදී පළ කරන ලද කොලොන්තායිගේ "කම්කරු විරුද්ධපක්ෂය" නැමැති පොතෙහි එම අදහස් පැහැදිලිවම දක්නට ලැබිණ. මුළු ජනතා ආර්ථිකයේ කළමනාකරනය "නිෂ්පාදකයින්ගේ සමස්ත රුසියානු සම්මේලනයට" භාර දෙන ලෙස "කම්කරු විරුද්ධ පාර්ශ්වය" යෝජනා කළේය. එසේම, ජනතා ආර්ථිකයේ සියලුම කළමනාකරන ආයතන ඒවාහිම වෘත්තීය සමිති විසින් පමණක් තේරිය යුතු බවද, එසේ කිරීමේදී සමිති මගින් ඉදිරිපත් කරන අපේක්ෂකයින් පක්ෂ හා සොවියට් ආයතන විසින් ඉවත් නොකළ යුතුබවද ඉල්ලා සිටියේය. එම ඉල්ලීම්, සමාජවාදය ගොඩ නැගීමේ මූලික උපකරන මෙන් පක්ෂයේ නායක කාර්යභාරය හා නිර්ධන පංතික ආඥාදායකත්වය ප්‍රතික්ෂේප කිරීමක් විය. කම්කරු පංතියේ උසස්තම සංවිධානය විය යුත්තේ පක්ෂය නොව වෘත්තීය සංගම් යැයි සිතූ "කම්කරු විරුද්ධ පාර්ශ්වය", වෘත්තීය සංගම් සෝවියට් රජයට හා කොමියුනිස්ට් පක්ෂයට විරුද්ධව ඉදිරිපත් කළේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

''කම්කරු විරුද්ධ පාර්ශ්වය'' අදහස් ප්‍රචාරය කිරීමේ කටයුතු කොමියුනිස්ට් පක්ෂය සමග එක්ව තිබීමට ඉඩ නැබිය නොහැකි බව පක්ෂයේ දහවැනි සම්මේලනය තීරණය කළේය.

52 ''එකනමිචිස්කයා ෂිස්න්'' — 1918 නොවැම්බර් සිට 1937 නොවැම්බර් දක්වා පළවූ දිනපතා පුවත්පතකි. ආරම්භයේදී එය මහා ආර්ථික මණ්ඩලයේ සහ ආර්ථික කටයුතු පිළිබඳ මහජන කොමිසාර් අංශවල නිල පත්‍රය ලෙසද පසුව මුදල් කටයුතු පිළිබඳ මහජන කොමිසාර් අංශයේ හා රාජ්‍ය බැංකුවේ නිල පත්‍රය ලෙසද පළ විය.

මෙම සඳහන දේශපාලන අර්ථශාස්ත්‍රය පිළිබඳ ජර්මන් මහාචාර්යවරයෙකු වූ කාර්ල් බලෝද්ගේ Zukunftsstaat, Produktion und Konsum in Sozialstaat (''අනාගත රජය, සමාජවාදී රාජ්‍යයක් තුළ නිෂ්පාදනය හා පරිභෝජනය'') යන පොත ගැනය. පොත 1898 දී ජර්මනියෙහි පළ විය. 1919 දී සංස්කරණය කරන ලද දෙවැනි මුද්‍රණය පළ විය. 1920 දී පොත රුසියන් බසින් මොස්කව්හි පළ කරන ලදී.

54 ලෙනින් මෙහි උපුටා දක්වන්නේ, 1920 දෙසැම්බර් 29 පැවති සෝවියට් සභාවල සමස්ත රුසියානු අටවැනි සම්මේලනය විසින් සම්මත කරගන්නා ලද විද්‍යුතකරනය පිළිබඳ යෝජනාවේ කොටස්ය.

55 මෙහි හා පසුවද ලෙනින්, 1919 මාර්තු මස පැවති රු. කො. (බො.) ප. අටවැනි සම්මේලනය සම්මත කළ පක්ෂ වැඩ පිළිවෙළ උපුටා දක්වයි.

56 ටිට් ටිට්ච් — රුසියානු ගත් කතුවරයෙකු වූ ඒ. එන්. ඔස්ත්‍රොව්කිගේ ''අනුන්ගේ කරදර තමන්ගේ ඔළුව කඩා වැටීම'' නැමති නාඩගමේ එන ධනපති වෙළෙන්දෙකි. ලෙනින් ටිට් ටිට්ච් නමින් හඳුන්වන ලද්දේ ධනපති නායකයන් ය.

57 රු. කො. (බො.) ප. දහවැනි සම්මේලනය 1921 මාර්තු 8-16 දිනවල මොස්කව්හි පවත්වන ලදී. එහි වැඩවලට ලෙනින් නායකත්වය දුන්නේය. ඔහු සම්මේලනය විවෘත කිරීමේදී හා අවසාන කිරීමේදී, මධ්‍යම කාරක සභාවේ දේශපාලන වැඩ කටයුතු පිළබඳවද, ධාන්‍ය අතිරික්තය අත්පත් කරගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්ද ආදේශ කිරීම පිළිබඳවද පක්ෂ සමගිය හා අරාජික-සින්ඩිකල්වාදී උපනතිය ගැනද වෘත්තිය සංගම් හා ඉන්ධන පිළිබඳ ප්‍රශ්නය ගැනද වාර්තා ඉදිරිපත් කළේය. සම්මේලනයේ වැදගත්ම යෝජනා ලෙනින් විසින් පිළියෙල කරන ලදී.

58 සම්මේලනය විසින් සම්මත කරන ලද ධාන්‍ය අතිරික්තය අත්පත් කර ගැනීම වෙනුවට ද්‍රව්‍ය බද්ද ආදේශ කිරීම පිළිබඳ යෝජනාව තුළ ලෙනින්ගේ යෝජනා ඇතුළු විය.

59 මෙහි අදහස් වන්නේ 1920 සෝවියට් රුසියාවට පැමිණි බ්‍රිතාන්‍ය පිළිම අඹන්නියකු වන ක්ලෙර් ෂෙරිඩන් ගැනය. මෙහි එන වගන්තිය, සමහර විට වින්ස්ටන් චර්චිල් විසින් භාවිතා කරන ලද්දකි.

60 මධ්‍යම සංඛ්‍යා ලේඛන ආයතනයේ ප්‍රධානියා වූ පී. අයි. පපොව්ගේ ''සෝවියට් සමූහාණ්ඩුවේ හා එයම සම්බන්ධ අනෙක් සමූහාණ්ඩුවල ධාන්‍ය ආහාර ද්‍රව්‍ය'' නැමැති පොත පක්ෂයේ දහවැනි සම්මේලනයේ නියෝජිතයින් සඳහා පළ කරන ලදී.

61 සුදුහමුදව, එස්එර්වරු, අරාජිකවාදීන් හා අධිරාජ්‍යවාදී රටවල ඒජන්තවරුන් විසින් ක්‍රොන්ෂතාද්ත් වල සංවිධානය කරන ලද ප්‍රතිවිප්ලවවාදී කැරැල්ල ගැනය මෙම සඳහන. 1921 පෙබරවාරි 28 දින කැරැල්ල ආරම්භ විය. එම කැරැල්ලේදී, ''කොමියුනිස්ට්වරුන්ගෙන් තොර සෝවියට් සභා'' නැමති සටන්පාඨවලට මුවාවී ධනවාදය පුනරුත්ථාපනය කිරීමට වැර දැරූ පංති සතුරාගේ නව උපක්‍රම දක්නට ලැබිණි. ඉන් පොදු ජනතාව රවටීමට ඔවුහු උත්සාහ කළහ. සෝවියට් සභා වල නායකත්වයෙන් කොමියුනිස්ට්වරුන් ඉවත් කිරීමටද, ධනපති පංතියේ ආඥාදායකත්වය හා ධනපති ක්‍රමය පිහිටුවීමටත් ප්‍රතිවිප්ලවවාදීන්ට අවශ්‍ය විය. 1921 මාර්තු 18 දින කැරැල්ල මැඩ පවත්වන ලදී.

62 ''ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදයේ කණ්ඩායම — විරුද්ධවාදී කණ්ඩායමක් වූ මෙය පළමුවෙන්ම රු. කො. (බො.) ප. අටවැනි සම්මේලනයේදී ඉදිරියට පැමිණියේය. 1920-1921 පැවැති වෘත්තීය සමිති විවාදයේදී ''ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදී'' කණ්ඩායම තම කණ්ඩවාදී වේදිකාව ඉදිරිපත් කළේය. ඔවුහු, සෝවියට් සභා තුළ හා වෘත්තීය සමිති තුළ පක්ෂයේ නායකත්වය ප්‍රතික්ෂේප කළ අතර ව්‍යවසායයන්හි ඒකපුද්ගල නායකත්වයට හා පුද්ගලික වගකීමට විරුද්ධවද, සංවිධානය පිළිබඳ ප්‍රශ්නවලදී ලෙනින්වාදී මූලධර්මවලටද විරුද්ධව ඉදිරිපත් වූහ. ඔවුහු කණ්ඩායම් ගැසීමේ නිදහස ඉල්ලා සිටියහ. පක්ෂ සාමාජිකයින් අතර ඔවුන්ගේ බලපෑමක් නොවීය

1923 දී ''ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදී'' කණ්ඩායම දියවී ගියේය. එහි නායකයෝ ට්‍රොට්ස්කිවාදී කණ්ඩායම සමග කඳවුරු බැඳගත්හ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

63 මෙම සඳහන 1920 නොවැම්බර් මස හාර්කව්හි පැවැති පස්වැනි සමස්ත උක්‍රේනියානු පක්ෂ සාකච්ඡා සභාව ගැනය. සාකච්ඡා සභාවේදී ''කම්කරු විරුද්ධ පක්ෂයේ'' වේදිකාවක් සඳහා නියෝජිතයන් 316 ගෙන් 23, එනම් සියයට 7 ඡන්දය දුන්හ.

64 ''විවාද පත්‍රය'' — රු. කො. (බො.) ප. මධ්‍යම කාරක සභාවේ කළින් කළ පළවූ පත්‍රයක්. රු කො. (බො.) ප. නවවැනි සමස්ත රුසියානු සාකච්ඡා සභාවේ තීරණයක් පරිදි පළ කෙරිණ. දහවැනි සම්මේලනයට පෙර කලාප දෙකක් පළ විය. පළමුවැන්න 1921 ජනවාරියේද, දෙවැන්න පෙබරවාරියේද මුද්‍රණය විය. පසුව විවාදය කාලයේදීද, සම්මේලනවලට පෙරද පත්‍රය පළ විය.

65 මෙම සඳහන ''අප පක්ෂය තුළ සින්ඩිකල්වාදී හා අරාජිකවාදී උපනතිය පිළිබඳ'' යෝජනාව ගැනය.

66 ''වාම කොමියුනිස්ට්වාදීන්'' — ජර්මනිය සමග සාම ගිවිසුම අත්සන් කිරීම (බ්‍රෙස්ට් සාම ගිවිසුම) හා සම්බන්ධව 1918 ආරම්භයේදී බිහිවූ පක්ෂ විරෝධී කණ්ඩායමේ සාමාජිකයෝ. විප්ලවවාදී යුද්ධය නැමැති විප්ලවවාදී සටන් පාඨයම මුවා වූ ''වාම කොමියුනිස්ට්වාදීන්ගේ'' කණ්ඩායම, එවකට හමුදවක් නොතිබූ සෝවියට් රුසියාව අධිරාජ්‍යවාදී ජර්මනිය සමග යුදගැන්වීමේ විනාශකාරී ප්‍රතිපත්තියක් ගෙන ගිය අතර ඒ මගින් සෝවියට් බලය විනාශය කරා යන අනතුරකට එය භාජනය කළේය.

එසේම ''වාම කොමියුනිස්ට්වාදියෝ'' ඒකපුද්ගල නායකත්වයටද ශ්‍රම විනයටද, ධනපති විශේෂඥයින් කර්මාන්තයන්හි යෙදවීමටද විරුද්ධව නැගී සිටියහ. ලෙනින්ගේ නායකත්වයෙන් යුත් පක්ෂය ''වාම කොමියුනිස්ට්වාදීන්ගේ'' ප්‍රතිපත්තිවලට විරුද්ධ දැඩි පහරක් එල්ල කළේය.

67 වාමාංශික සමාජවාදී-විප්ලවවාදියෝ (වාමාංශික එස්ඒර්වරු) — 1917 නොවැම්බර් 19-28 (දෙසැම්බර් 2-11) දිනවල පවත්වන ලද තම සමස්ත රුසියානු පළමුවැනි සම්මේලනයේදී සංවිධානාත්මක ලෙස බිහි වූ වාමාංශික එස්ඒර්වරුන්ගේ පක්ෂය. ඊට පෙර වාමාංශික එස්ඒර්වරු සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ වාමාංශික කණ්ඩායමක් ලෙස ක්‍රියා කළහ. සෝවියට් සභාවල සමස්ත රුසියානු දෙවැනි සම්මේලනයේදී වැදගත් ප්‍රශ්නවලද වාමාංශික එස්ඒර්වරු බොල්ෂෙවික්වරුන් සමග

ඡන්දය දුන්හ. එහෙත් සෝවියට් ආණ්ඩුවට ඇතුළු වීම ඔවුහු ප්‍රතික්ෂේප කළහ. බොහෝ කල් වැනෙමින් සිටි වාමාංශික එස්ඒර්වරු ගොවි ජනතාව අතර තම බලපෑම ආරක්ෂා කර ගැනීම සඳහා බොල්ෂෙවික් පක්ෂය සමග සම්මුතියකට එළඹියහ. ඔවුන් මහජන කොමිසාර් අංශවලට ද පත්කරන ලදී. බොල්ෂෙවික්වරුන් සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට පටන් ගත් වාමාංශික එස්ඒර්වරු සමාජවාදය ඉදිකිරීමේ මූලික ප්‍රශ්න පිළිබඳව බොල්ෂෙවික්වරුන්ට වඩා වෙනස් මත දැරූ අතර නිර්ධන පංතික ආඥාදායකත්වයටද විරුද්ධ වූහ. 1918 ජනවාරි-පෙබරවාරි මාසවලදී වාමාංශික එස්ඒර් පක්ෂයේ මධ්‍යම කාරක සභාව බ්‍රෙස්ට් සාම ගිවිසුමට විරුද්ධව සටන ආරම්භ කළේය. එය අත්සන් කර 1918 මාර්තු මස සෝවියට් සභාවල හතරවැනි සම්මේලනයේදී සම්මත කළ පසු ඔවුහු මහජන කොමිසාර් මණ්ඩලයෙන් ඉවත් වූහ. එහෙත් කොමිසාර් අංශවල හා පළාත්බද රාජ්‍ය ආයතනවල ඔවුහු දිගටම වැඩ කළහ.

සමාජවාදී විප්ලවය ගම්බද පැතිර යාමත් සමගම වාමාංශික එස්ඒර්වරුන් අතර සෝවියට් විරෝධී මනෝභාවය වැඩෙන්නට විය. බ්‍රෙස්ට් සාම ගිවිසුම විනාශ කොට සෝවියට් දේශය සහ ජර්මනිය අතර යළිත් යුද්ධයක් ඇවිලවීම සඳහා 1918 ජූලි මාසයේදී වාමාංශික එස්ඒර් පක්ෂයේ මධ්‍යම කාරක සභාව මොස්කව්හි ජර්මන් තානාපතිවරයා මරා දැමීම සංවිධානය කළේය. එමෙන්ම සෝවියට් රජයට විරුද්ධව අවිගත් කැරැල්ලක් සංවිධානය කළේය. එම කැරැල්ල මැඩ පැවැත්වීමෙන් පසුව සෝවියට් සභාවල පස්වැනි සමස්ත රුසියානු සම්මේලනයේදී එම පක්ෂ නායකත්වයේ ආපදපන්න ක්‍රියාකලාපය පිළිගත් වාමාංශික එස්ඒර් සාමාජිකයන් සෝවියට් සභාවලින් නෙරපීමට තීරණය විය. මහජන ආධාර නැතිවී ගියෙන් වාමාංශික එස්ඒර්වරු සෝවියට් රජයට විරුද්ධව අවිගත් සටනක් ආරම්භ කළහ.

68 ''නෝවය ෂිස්න්'' හා ''වපිරියොද්'' — 1917-1918 අවුරුදුවල දී පළවූ මෙන්ෂෙවික්වාදී දිනපතා පුවත්පත්. ප්‍රතිවිප්ලවවාදී ක්‍රියා නිසා සෝවියට් රජය විසින් වසා දමන ලදී.

69 කාල් මාක්ස්. ''ගෝතා වැඩ පිළිවෙළ විවේචනය''.

70 ෆ්‍රෙඩ්රික් එංගල්ස් ''ප්‍රංශයේ හා ජර්මනියේ ගොවිජන ප්‍රශ්නය.''

71 ''මfජ්ලර් කාරයා'' — රුසියානු ලේඛකයෙකු වූ ඒ. පී. චෙහව් ලියූ එම නමින් යුත් නවකථාවේ එන ප්‍රධාන චරිතය. එය සියලු නවතාවයන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හා ක්‍රියාරම්භක-තාවයන් පිළිකුල් කරන පටු අදහස් දරන අමන යෙකුගේ පිළිබිඹුවකි.

72 ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයට තෝරා පත්කර ගැනීමේ මැතිවරණය පවත්වන ලද්දේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසුව, කලින් නියම කරගත් දිනදීය — 1917 නොවැම්බර් 12(25) එය පැවැත්වූයේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පෙර සකස් කරන ලද ඡන්ද ලැයිස්තුවලට අනුකූලව, තාවකාලික ආණ්ඩුව විසින් පිළිගත් කොන්දේසිවලට යටත්ව හා සමාජවාදී විප්ලවයේ වැදගත්කම පිළිබඳ නියම අවබෝධයක් ලබා ගැනීමට ජනතාවට හැකියාවක් නොතිබූ අවස්ථාවකය. එයින් ප්‍රයෝජන ගත් දක්ෂිණාංශික එස්ආර්වරු අගනුවරින් හා කාර්මික මධ්‍යස්ථානවලින් වෙන්වූ ගුබේර්නියාවල හා ප්‍රදේශවල ඡන්ද බහුතරයක් ලබා ගැනීමට සමත් වූහ. ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය සෝවියට් රජය විසින් කැඳවනු ලදුව 1918 ජනවාරි 5(18) දින පෙට්‍රොග්‍රෑඩ්වලදී විවෘත කරන ලදී. මධ්‍යම විධායක කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ "වැඩකරන සහ සූරාකෑමට භාජනය වූ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය" ද සාමය, ඉඩම්, සෝවියට් සභාවලට බලය පැවරීම පිළිබඳ පනත් ද පිළිගැනීම ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලයේ ප්‍රතිවිප්ලවීය බහුතරය විසින් ප්‍රතික්ෂේප කරන ලද නිසා මධ්‍යම විධායක කාරක සභාවේ පනතකින් 1918 ජනවාරි 6(19) දින ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය විසුරුවා හරින ලදී.

73 වී. අයි. ලෙනින් මෙහි රුසියානු මහා කවියෙකු වන ඒ. එස්. පූෂ්කින්ගේ "වීරයා" පද්‍ය රචනයෙන් වචන ගෙන හැර දක්වයි.

74 ඔබ්ලොමොව්ෂිනා — මෙම අවස්ථාවේදී පරපුටුභාවය, එකතැන කල්බැලීම, පහළ වැටීම, මන්දබුද්ධිය පෙන්වීමට මෙම වචනය පාවිච්චි කරයි. ඔබ්ලෝමොව්, රුසියානු ලේඛක අයි. ඒ. ගන්චරොව්ගේ එම නමින් යුත් නවකතාවේ එන ප්‍රධාන චරිතයයි.

75 මෙ සඳහන ගොළුල්රෝ වැඩ පිළිවෙළ ගැනය

76 ගුබේර්නියා ආර්ථික සාකච්ඡා සභාව — සෝවියට් සභාවල අටවැනි සමස්ත රුසියානු සම්මේලනය (1920 දෙසැම්බර්) "ප්‍රාදේශීය ආර්ථික ආයතන පිළිබඳ" නිකුත් කළ ආඥාවක් පරිදි පිහිටුවන ලද ශ්‍රම හා ආරක්ෂක මණ්ඩලවල ප්‍රාදේශීය ආයතන. ගුබේර්නියා ආර්ථික සාකච්ඡා සභා සංවිධානය කරන ලද්දේ, ආර්ථිකය පිළිබඳ මහජන කොමිසාර් අංශවල, ප්‍රාදේශිය ආයතනවල වැඩකටයුතු සමග එකඟත්වයකට පැමිණීමේ අරමුණ ඇතිව, සෝවියට් සභාවල ගුබේර්නියා විධායක කාරක සභා යටතේය.

77 කර්නිලව් කැරැල්ල — 1917 අගෝස්තුවේදි ධනපති පංතිය හා ඉඩම් හිමියන් විසින් සංවිධානය කරන ලද කැරැල්ලකි. එය මෙහෙයවන ලද්දේ යුධ හමුදවේ සේනාධිනායක සාර්වාදී ජෙනරාල් කර්නිලව් විසිනි. පෙට්‍රොග්‍රෑඩ් අල්ලා ගෙන බොල්ෂෙවික් පක්ෂය විනාශ කර සෝවියට් සභා විසුරුවා හැර මිලිටරි අඥාදයකත්වයක් පිහිටුවා රාජාණ්ඩුව පුනරුත්ථාපනය කිරීම ඔවුන්ගේ ඉලක්කය විය. බොල්ෂෙවික්වරුන්ගේ මෙහෙයවීම යටතේ කම්කරුවන් හා ගොවීන් විසින් කැරැල්ල මැඩ පවත්වන ලදී.

78 මෙහි සඳහන් වන්නේ විදේශයන්හි "සමාජවාදී සන්නිවේදන" නමින් පළ වූ මෙන්ෂෙවික්වාදී සඟරාව ගැනය. එය ආරම්භ කරන ලද්දේ එල්. මාර්තව් විසිනි. 1921 සිට බෙර්ලින්හිද, පසුව පැරිස්හිද, ඇමෙරිකා එක්සත් ජනපදයේද පළ විය.

79 නර්ත්සිස් — ග්‍රීක දේව පුරාණයේ කථාවකට අනුව, ජලය මත දිස්වූ තම ප්‍රතිබිම්බය දැක තමාටම ආලය කිරීමට පටන් ගත් තරුණයෙක්. මෙම වචනය පාවිච්චි කරන්නේ ස්වයංතෘප්තියට පත් පුද්ගලයින් හුවා දැක්වීම සඳහාය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නාමාවලිය

අද්ලර් (Adler) ෆ්‍රිද්රිහ් (1879-1960) — ඕස්ත්‍රියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයා ය. 1918 ඕස්ත්‍රියානු විප්ලවයට පසු ප්‍රතිවිප්ලවවාදීන්ගේ කඳවුරට මාරු විය. මධ්‍යස්ථවාදී දෙකහමාරේ ජාත්‍යන්තරය සංවිධානය කිරීමටද සහභාගි වූ ඔහු ඉක්බිතිව ඊනියා සමාජවාදී කම්කරු ජාත්‍යන්තරයේ එක් නායකයෙකු බවට පත්විය.

LIBERATIONBASE

අර්තෙම් (සෙර්ගේයෙව්, ෆියෝදර් අන්ද්‍රෙයෙවිච්)* (1883-1921) — 1901 සිට පක්ෂ සාමාජිකයෙකි. 1920-1921 අවුරුදුවලදී රු. කො. (බො) ප. මොස්කව් ශාඛාවේ ප්‍රධාන ලේකම් තනතුර දැරුවේය. 1921 සිට සමස්ත රුසියානු පතල් කම්කරුවන්ගේ සංගමයේ සභාපතිව සිටියේය. පක්ෂයේ දහවැනි සම්මේලනයේදී රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවට තේරී පත්විය.

ඔර්ලන්දෙ (Orlando), විතොරියො එමානුවෙල් (1860-1952)— ඉතාලියානු රාජ්‍ය පාලකයෙකි. 1917-1919 අවුරුදුවල ඉතාලියානු අගමැතිව සිටි ඔහු පැරිස්හි පැවති සාම සාකච්ඡා සභාවේ ඉතාලියානු නියෝජිත කණ්ඩායම මෙහෙයවීය. 1919-1920 අවුරුදු වලදී පාර්ලිමේන්තුවේ සභාපති ලෙස කටයුතු කළේය.

ඔසින්ස්කි, එන් (ඔබලෙන්ස්කි වලෙරියාන් වලෙරියානවිච්) (1887-1939) — 1907 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු රාජ්‍ය පක්ෂ හා පරිපාලන හා ආර්ථික

* සත්‍ය නාමය වරහන් තුළ දැක්වේ.

සේවයෙහි යෙදුනේය. 1920-1921 අවුරුදු වලදී පක්ෂවිරෝධී "ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය" කණ්ඩායමට ක්‍රියාකාරී ලෙස සහභාගි වූ ඔහු පසුව ට්‍රොට්ස්කිගේ විරුද්ධ පක්ෂයට එකතු විය.

කවෙන්‍යාක් (Cavaignac), ලුයී එෂෙන් (1802-1857) — ප්‍රංශ ජෙනරාල්වරයෙකි, ප්‍රතිගාමී දේශපාලනඥයෙකි.1848 ජූනි මස මිලිටරි ඒකාධිපති රජයේ නායකයා වූ මොහු ජූනි මස පැවැති පැරිස් කම්කරුවන්ගේ නැගී සිටීම කුරිරු ලෙස මර්ධනය කළේය.

කලීනින්, මිහයිල් ඉවානවිච් (1875-1946) සෝවියට් රජයේ හා කොමියුනිස්ට් පක්ෂයේ සම්භාවනීය නායකයෙකි. 1898 සිටම පක්ෂ සාමාජිකත්වය දැරුවේය. 1917 ඔක්තෝබර් මස පෙත්‍රොග්‍රෑඩ්වල සන්නද්ධ නැගී සිටීමට සහභාගි විය. 1919 මාර්තු සිට සමස්ත රුසියානු මධ්‍යම විධායක කාරක සභාවේ සභාපති ලෙසද 1922 දෙසැම්බර් මස සමස්ත සෝවියට් මධ්‍යම විධායක කාරක සභාවේ සභාපති ලෙසද කටයුතු කළේය. 1938 සිට සෝවියට් සංගමයේ උත්තරීතර සෝවියට් සභාවේ සභාපති (ජනාධිපති) තනතුර දැරුවේය.

කරේලින්, ව්ලදිමීර් අලෙක්සාන්ද්‍රවිච් (1891-1938) වාම විප්ලවවාදී-සමාජවාදී පක්ෂය සංවිධානය කිරීමට සහභාගි වූ මොහු එහි මධ්‍යම කාරක සභාවේද සාමාජිකයෙකුව සිටියේය. 1918 දී සිදුවූ වාම එස්ඒර් කැරැල්ලේ එක් නායකයෙකි. කැරැල්ල මැඩපැවැත්වීමෙන් පසු විදේශයට පැන ගියේය.

කර්නිලව්, ලාව්ර් ගියොර්ගියෙවිච් (1870-1918) සාර් හමුදවේ සේනාධිපති වරයෙක්, රාජාණ්ඩුවාදියෙකි. 1917 ජූලි — අගෝස්තු මාසවල රුසියානු හමුදවේ අග්‍ර සෙන්පතියා විය. අගෝස්තු මාසයේදී ප්‍රතිවිප්ලවවාදී කැරැල්ලක් මෙහෙයවීය. කැරැල්ල මැඩපැවැත්වීමෙන් පසු සිරභාරයට ගන්නා ලදී. පසුව දොන් ප්‍රදේශයට පැනගොස් "ස්වේච්ඡානුගත" ප්‍රතිවිප්ලවවාදී සුදු හමුදාව සංවිධානය කළේය. පසුව එහි අනදෙන ප්‍රධාන සෙනෙවියා බවට පත් විය. යෙව්කතිරිනදර් අසල සටනකදී මැරුම් කෑවේය.

කස්ලෝව්ස්කි ඒ. — සාර් හමුදවේ සේනාධිපතියෙකි. ඔහු ක්‍රොන්ෂ්තාද්ත්ස් කැරැල්ලටද සහභාගි විය. කැරැල්ල මැඩපැවැත්වීමෙන් පසු විදේශයට පැනගියේය.

https://liberationbase.wordpress.com

කාමිනෙව් (රොසෙන්ෆෙල්ඩ්), ලෙව් බරිසවිච් (1883-1936) — 1901 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු සමාජවාදී විප්ලවය පිළිබඳ ලෙනින්වාදී පිළිවෙතට විරුද්ධව නැගී සිටියේය. 1917 ඔක්තෝබර් මාසයේදී ඔහු තමන් වෙනුවෙන් සහ සිනොවියෙව් වෙනුවෙන්ද, පක්ෂ මධ්‍යම කාරක සභාව සම්මත කරගත් යෝජනාවට එකඟ නොවන බව පවසමින් අවිගත් නැගිටීමට විරුද්ධව, අර්ධ මෙන්ෂෙවික් පත්‍රයක් වූ "නෝවය ෂිස්න්" හි ලිපියක් පළ කළේය. එය පක්ෂයේ රහස් හෙළිදරව් කිරීමක් හා විප්ලවය පාවාදීමක් විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් සභා හා පක්ෂ කටයුතුවල යෙදුනේය. එහෙත් බොහෝවිට පක්ෂයේ ලෙනින්වාදී පිළිවෙතට විරුද්ධව කතා කළේය. පක්ෂ විරෝධී වැඩ නිසා පසුව පක්ෂයෙන් නෙරපන ලදී.

කිසිලෙව්, අලෙක්සෙයි සෙම්යොනවිච් (1879-1938) — 1898 සිට පක්ෂ සාමාජිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් සභාවල, ආර්ථික අංශයේ හා වෘත්තීය සංගම්වල පාලන කටයුතුවල යෙදුනේය. 1920 දී පතල් කම්කරුවන්ගේ සංගමයේ සභාපති තනතුරට පත් විය.

කුරායෙව්, වසිලි ව්ලදිමිරවිච් (1892-1938) 1914 සිට පක්ෂ සාමාජිකත්වය දැරුවේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු වගකිවයුතු තනතුරු කීපයක්ම දැරුවේය. 1920 සිට කෘෂිකර්මය පිළිබඳ මහජන කොමිසාර් මණ්ඩලයේද උසස් මහජන ආර්ථික මණ්ඩලයේ සභාපති මණ්ඩලයේද සාමාජික තනතුරු ඉසිලූ අතර පසුව සෝවියට් සංගමයේ රාජ්‍ය සැලසුම් අංශයේ පාලන තනතුරක් දැරුවේය.

කෙයින්ස් (Keynes), ජෝන් මෙයිනර්ඩ් (1883-1946) — බ්‍රිතාන්‍ය අර්ථශාස්ත්‍රඥයෙකු වූ මොහු රාජ්‍ය-ඒකාධිකාරී ධනවාදයේ ආරක්ෂකයෙකි. 1915 සිට බ්‍රිතාන්‍ය මුදල් අමාත්‍යාංශයේ උසස් නිලධාරි තනතුරක් දැරුවේය. 1919 දී සේවයෙන් අස් වූ ඔහු අධිරාජ්‍යවාදී වර්සෙයිල්ස් සාම ගිවිසුමේ ආර්ථික පදනමේ නුසුදුසු කම දැඩි විවේචනයට පත් කරන ලිපි ගණනාවක්ම ලිවේය. 1921 සිට බ්‍රිතාන්‍යයේ විශාල රක්ෂණ සමාගමක සභාපති ධුරය ඉසිලුවේය.

කෙරෙන්ස්කි, අලෙක්සාන්දර් ෆියොදරවිච් (1881-1970) — සමාජවාදී-විප්ලවවාදියෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට

පසු අධිකරන ඇමති ධුරයද, හමුද හා නාවික ඇමති ධුරයද දරු අතර අනතුරුව ධනපති තාවකාලික ආණ්ඩුවේ නායකයා බවට පත් විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට, සෝවියට් රජයට විරුද්ධව සටන් මෙහෙයවූ හෙතෙම 1918 දී විදේශයට පැනගියේය.

කොල්චාක්, අලෙක්සාන්දර් වසිල්යෙවිච් (1873-1920) — සාර්වාදී නාවික හමුදවේ ඇඩ්මිරල් වරයාය. රාජාණ්ඩුවාදියෙකි. 1918-1919 අවුරුදුවලදී රුසියාවේ ප්‍රතිවිප්ලවවාදී සංවිධානයේ නායකත්වය දැරුවේය. එන්ටේන්ට් අනුගාමිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ඇමෙරිකා එක්සත් ජනපදයේ, බ්‍රිතාන්‍යයේ හා ප්‍රංශයේ අධිරාජ්‍යවාදීන්ගේ ආධාරය යටතේ රුසියාවේ උත්තරීතර ආණ්ඩුකාරයා ලෙස හඳුන්වාගත් හෙතෙම උරල්වල, සයිබීරියාවේ හා ඈත පෙරදිග ධනපති-ඉඩම්හිමි ඒකාධිපතිත්වයේ නායකත්වය දැරුවේය. රතුහමුදවේ පහර ගැසීම් හා ගරිල්ලා හමුදවල බලය වැඩිවීම නිසා කොල්චාක්ගේ බලය විනාශ විය. කොල්චාක් සිරභාරයට ගන්නා ලදුව වෙඩිතබා මරණ දණ්ඩනයට පත් කරන ලදී.

ක්‍රාසින්, ලියොනිද් බරිසවිච් (1870-1926) — ප්‍රධාන පෙළේ සෝවියට් රාජ්‍ය සේවකයෙකි. 1890 ගණන්වල සිටම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ යෙදුනේය. රු. ස. ප්‍ර. ක. ප. දෙවැනි සම්මේලනයට (1903) පසු බොල්ෂෙවික්වරුන්ට එකතු විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු වගකිවයුතු තනතුරු කීපයක්ම ඉසිලුවේය. 1919 සිට තානාපති සේවයේ කටයුතු කළ අතර 1920 සිට විදේශීය වෙළඳ අංශයේ මහජන කොමිසාර් තනතුර දැරුවේය. පසුව 1924 සිට ප්‍රංශයේද 1925 සිට බ්‍රිතාන්‍යයේද සෝවියට් සංගමයේ සියලු බලතල හිමි නියෝජිත ධුරය ඉසිලුවේය.

ක්‍රිට්ස්මන්, ලෙව් නතනෝවිච් (1890-1938) — අර්ථ ශාස්ත්‍රඥයෙක්. 1918 සිට පක්ෂයේ සාමාජිකයෙක්. සෝවියට් රජයේ පළමුවැනි අවුරුදුවලදී ආර්ථිකය හා සම්බන්ධ වැඩකටයුතුවල නිරත විය. ඔහු විසින් ආර්ථික හා කෘෂිකර්ම ප්‍රශ්න පිළිබඳ පොත් ගණනාවක්ම ලියා ඇත.

ක්‍රෙස්තින්ස්කි, නිකලායි නිකලායෙවිච් (1883-1938) — 1903 සිට පක්ෂ සාමාජිකයෙකි. 1918-1921 අවුරුදුවලදී රු. සො. ෆෙ. ස. සමුහාණ්ඩුවේ මුදල් පිළිබඳ මහජන කොමිසාර් පදවියද රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවේ ලේකම් ධුරයද දැරුවේය. 1918 දී වාම කොමියු-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිස්ට්වාදීන් සමග එකතුව බ්‍රෙස්ට් සාම ගිවිසුමට විරුද්ධව නැගී සිටියේය. වෘත්තීය සංගම් විවාදය අවධියේදී (1920-1921) ට්‍රොට්ස්කිවාදී වේදිකාවට සහයෝගය දුන්නේය.

කෞට්ස්කි (Kautsky), කාර්ල් (1834-1938) — ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ එක් නායකයෙකි. ආරම්භයේදී මාක්ස්වාදියෙකි. පසුව මාක්ස්වාදයේ ද්‍රෝහියෙකු බවට පත්විය. අවස්ථාවාදයේ වඩාත්ම අහිතකාරී හා එසේම භයානක ප්‍රවනතාවය වන මධ්‍යස්ථවාදයේ (කෞට්ස්කිවාදය) න්‍යායාචාර්ය වරයාය. ඔක්තෝබර් සමාජවාදී ව්‍යාපාරයට පසු නිර්ධන පංතික විප්ලවය හා කම්කරු පංතියේ ආඥාදායකත්වයටද, බොල්ෂෙවික්වරුන්ගේ පක්ෂයට හා සෝවියට් රජයටද විරුද්ධව නැගී සිටියේය.

ක්ලෙමන්සො (Clemenceau), ජෝර්ජ් බෙන්ජමන් (1841-1929) — ප්‍රංශ රාජ්‍ය හා දේශපාලන නායකයෙකි. 1906-1909 හා 1917-1920 අවුරුදුවලදී ප්‍රංශ ආණ්ඩුවේ නායකයා විය. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී විවෘත ජාතෝන්මාදවාදියෙකි. සෝවියට් සමූහාණ්ඩුවට විරුද්ධව යුද්ධ ආක්‍රමණය කිරීම හා එයට අවහිර කිරීම සංවිධානය කළ අයගෙන්ද කෙනෙකි.

ක්වෙල්ච් (Quelch), තෝමස් (1886-1954) — බ්‍රිතාන්‍ය සමාජවාදියෙකි. පසුව කොමියුනිස්ට් වාදියෙකි. අධිරාජ්‍යවාදී පළමුවැනි ලෝක යුද්ධය අවධියේදී ජාත්‍යන්තර ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1919 සිට බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය ගොඩනැගීමට මහත් උනන්දුවෙන් කටයුතු කළේය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයට සහභාගි විය. 1920 දී බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයට බැඳුනු ඔහු 1923-1925 අවුරුදු වලදී එහි මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුවද සිටියේය. ජීවිතයේ අවසාන කාලයේදී ඔහු කොමියුනිස්ට් පක්ෂයෙන් ඉවත් විය.

ගුසෙව්, සෙර්ගෙයි ඉවානවිච් (ද්‍රාබ්කින්, වයි. ඩී.) (1874-1933) — වෘත්තීය විප්ලවවාදියෙකි, බොල්ෂෙවික්වාදියෙකි. 1918 සිට රතු හමුදාවේ දේශපාලන කටයුතුවල යෙදුනු අතර 1921-1933 අවුරුදුවලදී දේශපාලන ආයතන මණ්ඩලයේ නායක තනතුරද සමූහාණ්ඩුවේ විප්ලව යුද මණ්ඩලයේ සාමාජික තනතුරද දැරුවේය. පක්ෂ ඉතිහාසය, ආර්ථික හා යුද්ධ ප්‍රශ්න පිළිබඳවද පොත් ගණනාවක්ම ලිවේය.

ගේ, ඒ. යු. (විපත 1919) — රුසියානු අරාජිකවාදියෙකි, ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට පක්ෂපාතිත්වය දක්වූයේය. මධ්‍යම විධායක කාරක සභාවේ තුන්වැනි හා හතරවැනි සැසිවාරවල සාමාජිකයෙකුව සිටි අතර උතුරු කොකේසියානු සෝවියට් ආණ්ඩුව තුළද වැඩ කළේය.

වෙර්නොව්, වික්තර් මිහායිලවිච් (1876-1952) — සමාජවාදී-විප්ලවවාදී පක්ෂයේ නායකයින්ගෙන් හා න්‍යායාචාර්යවරුන්ගෙන් කෙනෙකි. 1917 මැයි-අගෝස්තු කාලයේදී ධනපති තාවකාලික ආණ්ඩුවේ ඉඩම් ඇමති ධුරය දැරුවේය. ඉඩම් හිමියන්ගේ ඉඩම් අල්ලාගත් ගොවීන් දූෂ්‍ය ලෙස පාගා දැමීමේ ප්‍රතිපත්තියක් ඔහු අනුගමනය කළේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් විරෝධී කැරැලි සංවිධානය කළේය. පසුව 1920 දී ඔහු විදේශයට පැන ගියේය.

ට්‍රොට්ස්කි (බ්‍රොන්ෂ්ටයින්), ලෙව් දවීදවිච් (1879-1940) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. මෙන්ෂෙවිකයෙකි. 1905-1907 විප්ලවය පරාජය වීමෙන් පසු ඇවරකාරයෙකු බවට පත්වූ ඔහු යුද්ධය, සාමය හා විප්ලවය යන ප්‍රශ්නවලදී ලෙනින්ට හා බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව සටන් මෙහෙයවූයේය. පළමුවැනි ලෝක යුද්ධය අවධියේදී ඔහු මධ්‍යස්ථවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1917 දී පක්ෂයට බඳවාගන්නා ලදී. එහෙත් ට්‍රොට්ස්කි බොල්ෂෙවික්වාදියෙකුගේ තත්ත්වයට පත් නොවීය. ඔහු රහසිගතවද විවෘතවවද ලෙනින්වාදයට හා පක්ෂයේ ප්‍රතිපත්තිවලට විරුද්ධව අරගලය මෙහෙය වීය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු වගකිවයුතු තනතුරු කීපයක්ම දැරූ අතර පක්ෂයේ ප්‍රධාන ක්‍රියාමාර්ගයට විරුද්ධවද සෝවියට් සංගමයේ සමාජවාදය ගොඩනැගීමේ වැඩ පිළිවෙළට විරුද්ධවද, අරගලය මෙහෙයවූයේය. 1927 දී ට්‍රොට්ස්කි පක්ෂයෙන් නෙරපන ලදී. සෝවියට් විරෝධී ක්‍රියා නිසා 1929 දීඔහු රටින් පිටුවාහල් කරන ලද අතර 1932 දී සෝවියට් පුරවැසිභාවයද අහිමිකරන ලදී.

ඩෙනිකින්, අන්තොන් ඉවානවිච් (1872-1947) — සාර්වාදී සේනාපතියෙකි. විදේශීය යුද ආක්‍රමණය හා සිවිල් යුද්ධය අවධියේදී (1918-1920) දකුණු රුසියාවේ සෝවියට් විරෝධී සුදු හමුදාවන්ගේ සේනාධිනායකයා විය. සෝවියට් රතු හමුදාව විසින් එම හමුද පරාජය කිරීමෙන් පසුව විදේශගත විය.

තොමා (Thomas), අල්බෙර් (1878-1932) — ප්‍රංශ දේශපාලනඥයෙකි, දක්ෂිණාංශික සමාජවාදියෙකි. අධිරාජ්‍යවාදී ලෝක යුද්ධය අවධියේදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජ-ජාත්‍යොන්මාදවාදී පිළිවෙතක් අනුගමනය කළේය. යුධායුද පිළිබඳ ඇමති ලෙස ප්‍රංශයේ ධනපති ආණ්ඩුවට ඇතුළු විය. යුද්ධය දිගටම කරගෙන යෑම සඳහා උද්ඝෝෂණ කටයුතු කිරීමට 1917 පෙබරවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු රුසියාවට පැමිණියේය. 1919 දී බර්න් (දෙවැනි) ජාත්‍යන්තරය සංවිධානය කිරීමට සහභාගි විය. 1919-1932 අවුරුදුවලදී, ජාතීන්ගේ සංගමය යටතේ පැවති ජාත්‍යන්තර ශ්‍රම බියුරෝසභාවට නායකත්වය දුන්නේය.

තොම්ස්කි, මිහයිල් පාව්ලවිච් (1880-1936) — 1904 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු මොස්කව් වෘත්තීය සමිති මණ්ඩලයේ සභාපති තනතුර දැරුවේය. 1919 සිට වෘත්තීය සංගම්වල සමස්ත සෝවියට් මධ්‍යම මණ්ඩලයේ සභාපති මඩුල්ලේ සභාපති ධුරයද දැරුවේය. රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවේ සාමාජික තනතුරද, එහි දේශපාලන බියුරෝ මණ්ඩලයේ සාමාජික තනතුරද ඔහු දැරුවේය. ඔහු පක්ෂයේ ලෙනින්වාදී ප්‍රතිපත්තිවලට විරුද්ධව කීපවතාවක්ම ඉදිරිපත් විය.

දන් (ගුර්විච්), ෆේපයෝදර් ඉල්යිච් (1871-1947) මෙන්ෂෙවික් නායකයෙකි. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් අනතුරුව පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවේ විධායක කාරක සභාවේද, මධ්‍යම විධායක කාරක සභාවේ සභාපති මණ්ඩලයේද සාමාජිකයෙකු විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව සටන් කළේය.

පළමුවැනි නැපෝලියන් (බොනපාට්) (1769-1821) — 1804-1814 හා 1815 අවුරුදුවල ප්‍රංශ අධිරාජයා.

පපොව්, පාවෙල් ඉල්යිච් (1872-1950) — සංඛ්‍යා ලේඛකයෙක්. 1918 සිට මධ්‍යම සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විය. සෝවියට් දේශයේ රාජ්‍ය සැලසුම් අංශයේ සභාපති මණ්ඩලයේද සිටියේය. ඔහු සංඛ්‍යා ලේඛන විද්‍යාව පිළිබඳ විද්‍යාත්මක පොත් ගණනාවක්ම ලිවේය.

පියතකොව්, ගියෝර්ගි ලියොනීදවිච් (1890-1937) රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, බොල්ෂෙවික් වරයෙකි.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු උක්‍රෙනියාවේ සෝවියට් ආණ්ඩුවට ඇතුළු විය. 1920 සිට ආර්ථික හා සෝවියට් අංශවල සේවයේ යෙදුනේය. පක්ෂයේ ලෙනින්වාදී පිළිවෙතට විරුද්ධව කීප වතාවක්ම නැගී සිටි නිසා පක්ෂයෙන් නෙරපන ලදී.

පෙත්ල්යූරා, සීමොන් වසීලියෙවිච් (1877-1926) උක්‍රෙනියානු ධනපති ජාතිකවාදීන්ගේ එක් නායකයෙකි. 1917 දී, ප්‍රතිවිප්ලවවාදී උක්‍රෙනියාවේ, මධ්‍යම රාදේ සභාවේ ප්‍රධාන ලේකම්ව සිටියේය විදේශීය හමුදා ආක්‍රමණය අවස්ථාවේ හා සිවිල් යුද්ධය අවස්ථාවේ උක්‍රෙනියාවේ ප්‍රතිවිප්ලවවාදී අළුගෝසුවා විය.

පෙත්රොව්ස්කි, ග්‍රිගෝරි ඉවානවිච් (1878-1958) — 1897 සිටම රු. ස. ප්‍ර. ක. ප. සාමාජිකයෙකි. බොල්ෂෙවික්වරයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු වගකිවයුතු පක්ෂ හා රාජ්‍ය සේවාවන්හි යෙදුනේය.

ප්‍රෙඔබ්රෂෙන්ස්කි, යෙව්ගේනි අලෙක්සේයවිච් (1886-1937) — 1903 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු පක්ෂ හා යුද්ධ-දේශපාලන කටයුතුවල යෙදුනේය. 1918 දී වාම කොමියුනිස්ට්වාදියෙකු බවට පෙරළුනේය. වෘත්තීය සංගම් විවාදය කාලයේදී (1920-1921) ට්‍රොට්ස්කිවාදී වේදිකාවට සහයෝගය දුන්නේය. 1923 සිට ට්‍රොට්ස්කිවාදී විරුද්ධ පක්ෂයේ ආධාර කරුවෙකු බවට පත්විය. පක්ෂ විරෝධී කටයුතු නිසා පසුව පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත්කරන ලදී.

ප්ලෙහානව්, ගියෝර්ගි වලෙන්තීනවිච් (1856-1918) — රුසියානු හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි රුසියාවෙහි පළමුවෙන්ම මාක්ස්වාදය ප්‍රචාරය කළේද ඔහු ය. රු. ස. ප්‍ර. ක. ප. දෙවැනි සම්මේලනයෙන් (1903) පසුව අවස්ථාවාදය කෙරෙහි සැනහුම් ප්‍රතිපත්තියක් අනුගමනය කළ ඔහු අවසානයේදී මෙන්ෂෙවික්වරුන්ගේ කඳවුරට එක්විය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට අනතුරුව මෙන්ෂෙවික්-ආරක්ෂකයින්ගේ අන්ත දක්ෂිණාංශික ''යෙදින්ස්ත්වො'' කණ්ඩායමට නායකත්වය දුන්නේය. රුසියාව සමාජවාදය සඳහා තවම මෝරා නැතැයි සිතූ ඔහු බොල්ෂෙවික්වරුන්ට හා සමාජවාදී විප්ලවයට විරුද්ධ විය. ඔහු ඔක්තෝබර් සමාජවාදී විප්ලවය කෙරෙහි ප්‍රතිවිරුද්ධ ආකල්පයක් දැක්වූ නමුත් සෝවියට් රජයට විරුද්ධ සටන්වලට සහභාගි නොවීය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බලොද් (Ballod), කාර්ල් (1869-1931) — ධනපති අර්ථ ශාස්ත්‍රඥයෙකි. ඔහු විසින් Der Zukunftsstaat (අනාගත රාජ්‍යය) නැමැති පොත ඇතුළුව ආර්ථික විද්‍යාව පිළිබඳ පොත් ගණනාවක්ම ලියා ඇත.

බගයෙව්ස්කි, මිත්‍රිපාන් පෙත්‍රොවිච් (1881-1918) — දොන් ප්‍රදේශයේ ප්‍රතිවිප්ලවවාදී කටයුතුවලට උද්යෝගයෙන් සහභාගි විය. ප්‍රතිවිප්ලවවාදී දොන් ආණ්ඩුවේ සාමාජිකයෙකි. පසුව ඔහු හිරභාරයට ගන්නා ලදී. සෝවියට් විරෝධී කටයුතු වලට උසාවියෙන් වැරැදිකරු බවට තීරණය කරන ලදුව වෙඩිතබා මරා දමන ලදී.

බුහාරින්, නිකලායි ඉවානවිච් (1888-1938) — සාහිත්‍යධරයෙකි, අර්ථ ශාස්ත්‍රඥයෙකි. 1906 සිට රු. ස. ප්‍ර. ක. ප. සාමාජිකයෙකි.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ප්‍රාව්දා පුවත් පතෙහි කර්තෘවරයෙකු ලෙස සේවය කළ ඔහු මධ්‍යම කාරක සභාවේ දේශපාලන බියුරෝ මණ්ඩලයේද, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ විධායක කාරක සභාවේද සාමාජිකයෙකු විය. පක්ෂයේ ලෙනින්වාදී ප්‍රතිපත්තියට විරුද්ධ වූ ඔහු 1918 දී පක්ෂ විරෝධී “වාම කොමියුනිස්ට්වරුන්ගේ” කණ්ඩායමට නායකත්වය දුන්නේය. වෘත්තීය සංගම් විවාදය අවධියේදී (1920-1921) ප්‍රථමයෙන් බෆර් තත්ත්වයක් ඉසිලූ අතර අනතුරුව ට්‍රොට්ස්කිගේ කණ්ඩායමට එකතු විය. 1928 සිට ඔහු පක්ෂයේ දක්ෂිණාංශික විරුද්ධ පිළට නායකත්වය දුන්නේය. පක්ෂ විරෝධී ක්‍රියා නිසා 1937 දී ඔහු පක්ෂයෙන් නෙරපන ලදී.

බ්‍රවුන්, එම්. අයි. — බ්‍රොන්ස්කි බලන්න.

බ්‍රොන්ස්කි, එම්, ජී. (බ්‍රවුන්, එම්, අයි.) (1882-1941) — පෝලන්ත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. පසුව බොල්ෂෙවික් පක්ෂයට බැඳුනේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු වෙළඳ හා කර්මාන්ත කටයුතු පිළිබඳ නියෝජ්‍ය මහජන කොමිසාර් ධුරය දැරුවේය. 1920 සිට ඔස්ත්‍රියාවෙහි සෝවියට් දේශපාලන හා වෙළඳ නියෝජිතයා ලෙස කටයුතු කළේය.

බෞවර් (Bauer), ඔතෝ (1882-1938) — ඔස්ත්‍රියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ එක් නායකයෙකි. විප්ලවවාදී මාක්ස්වාදයද නිර්ධන පංතියේ පංති සටනද ප්‍රතික්ෂේප කිරීම මාක්ස්වාදී වදන්පාඨවලින් මුවාකරන “ඔස්ත්‍රොමාක්ස්වාදයේ” න්‍යායාචාර්යවරයා ය.

මර්හ්ලෙව්ස්කි (Marchlewski), යුලියාන් (1866-1925) — පෝලන්ත හා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. පෝලන්ත-ලිත්වියානු රාජධානියේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය සංවිධානය කළ එහි එක් නායකයෙකි. 1905-1907 අවුරුදුවල විප්ලවයට ක්‍රියාකාරී ලෙස සහභාගි විය. 1909 සිට වැඩි ලෙසම ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙහි නිරත විය. “ස්පාටකස් සංගමය” හා කොමියුනිස්ට් ජාත්‍යන්තරය පිහිටුවීමට සහභාගි විය.

මහ්නො, නෝස්තර් ඉවානවිච් (1884-1934) — 1918-1920 අවුරුදුවලදී සෝවියට් රජයට විරුද්ධව සටන් කළ උක්‍රෙනියාවේ ප්‍රතිවිප්ලවවාදී අරාජික-කුලාක් හමුදවල අළුගෝසු නායකයා.

මායිස්කි, ඉවාන් මිහායිලවිච් (1884-1975) — සෝවියට් රාජ්‍යතන්ත්‍රිකයෙක් හා ඉතිහාසඥයෙක්. 1903 දී රු. ස. ප්‍ර. ක. ප. බැඳුනු ඔහු 191 වනතුරු මෙන්ෂෙවික්වරයෙකුව සිටියේය. මෙන්ෂෙවික්වාදයෙන් ඉවත්වූ ඔහු 1921 පෙබරවාරියේදී රු. කො. (බො) ප. බැඳුනේය. 192 සිට තානාපති සේවයෙහි යෙදුනේය.

මාරින්ග් (Maring), ගෙන්රික් (1873-1923) — ඕලන්ද සමාජ-ප්‍රජාතන්ත්‍රිකයෙකි. 1913-1919 කාලයේදී ජාවා දූපතෙහි වාසය කළ ඔහු එහිදී වාම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට එකතු විය. අනතුරුව ජාවා හා ඕලන් කොමියුනිස්ට් පක්ෂවල සාමාජිකත්වය ලබාගත්තේය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයට නියෝජිතයෙකු ලෙස සහභාගි විය.

මාර්තව්, එල් (ට්සේදෙර්බාවුම්), යූලි ඔසිපවිච් (1873-1923) — මෙන්ෂෙවික්වාදයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය අවධියේදී මධ්‍යස්ථවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට පසු පෙට්‍රොග්‍රෑඩ් කම්කරු හා සොල්දදු නියෝජිතයින්ගේ සෝවියට් සභාවේ විධායක කාරක සභාවට ඇතුළු විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව නැගීසිටියේය. 1920 දී ජර්මනියට විදේශගතවිය.

මැක්ඩොනල්ඩ් (MacDonald), ජේම්ස් රැම්සෙ (1866-1937) — බ්‍රිතාන්‍ය දේශපාලනඥයෙක්, ස්වාධීන කම්කරු පක්ෂය හා ලේයිබර් (කම්කරු) පක්ෂය සංවිධානය කළ එහි එක් නායකයෙකි. අන්ත අවස්ථාවාදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රතිපත්තියක් ගෙනගිය ඔහු පංති සහයෝගීතාවය හා ධනවාදය ක්‍රමයෙන් සමාජවාදය කරා වර්ධනය කරවීම පිළිබඳ න්‍යායක් දේශනා කළේය. සෝවියට් විරෝධී ආක්‍රමණයන්ට විරුද්ධව නැගී සිටි කම්කරුවන්ට බාධා කිරීමට ඔහු 1918-1920 අවුරුදුවලදී උත්සාහ කළේය. 1924 හා 1929-1931 අවුරුදුවලදී බ්‍රිතාන්‍ය අගමැති ධුරය දැරුවේය.

මිල්යුකොව්, පාවෙල් නිකලායෙවිච් (1859-1943) — කැඩෙට් පක්ෂය ආරම්භ කළ එහි එක් නායකයෙකි. 1917 දී ධනපති තාවකාලික රජයේ පළමුවැනි කැබිනට් මණ්ඩලයේ විදේශීය කටයුතු භාර ඇමති ධුරය දැරුවේය. "ජයග්‍රහනය දක්වා" අධිරාජ්‍යවාදී යුද්ධය කරගෙන යාමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 1917 අගෝස්තු මාසයේ පැවැති කර්නිලව් කැරැල්ල දිරිගැන්වූ අයගෙන් කෙනෙකි. ඔක්තෝබර් සමාජ-වාදී විප්ලවයට පසු ඔහු සෝවියට් රජයට විරුද්ධව විදේශීය යුධ ආක්‍ර-මණයන් සංවිධානය කළේය.

මිල්යුතින්, ව්ලදීමිර් පාව්ලවිච් (1884-1938) — සමාජ-ප්‍රජාතන්ත්‍රවාදි-යෙකි. ආරම්භයේදී ඔහු මෙන්ෂෙවික්වරුන්ට එකතුව සිටි නමුත් 1910 සිට බොල්ෂෙවික්වරයෙකු බවට පත් විය. සෝවියට් සභාවල දෙවැනි සමස්ත රුසියානු සම්මේලනයේදී කෘෂිකර්මය පිළිබඳ මහජන කොමි-සාර් ලෙස මහජන කොමිසාර් මණ්ඩලයට ඇතුළු විය. 1917 දී, මෙන්-ෂෙවික්වරුන් හා එස්ආර් වරුන් සමග සභාග ආණ්ඩුවක් පිහිටුවීමට යෝජනා කළ ඔහු පසුව පක්ෂයේ ප්‍රතිපත්ති සමග තම නොඑකඟත්-වය පළ කර පක්ෂයේ මධ්‍යම කාරක සභාවෙන්ද ආණ්ඩුවෙන්ද ඉවත් විය.

යුදෙනිච්, නිකලායි නිකලායෙවිච් (1862-1933) — සාර් හමුදාවේ සේනා-පතියෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව ප්‍රතිවිප්ලව-වාදී "වයඹදිග" ආණ්ඩුවේ සාමාජිකයෙකු වූ අතර වයඹ දිග යුද්ධ හමුදාවේ සේනාධි නායකයා විය. එන්ටේන්ට් මිත්‍ර ගිවිසුමේ අධිරාජ්‍ය-වාදීන්ගේ පුළුල් ආධාරය යුදෙනිච්ට ලැබිණ. රතු හමුදාව විසින් කඩා බිඳ දමන ලද ඔහුගේ හමුදාව 1919 නොවැම්බර් වලදී එස්තෝනියාවට පසු බැස්ස අතර අනතුරුව ඔහු එංගලන්තයට පැන ගියේය.

යෙමෂොව්, අලෙක්සාන්දර් ඉවානවිච් (1891-1941) — 1917 සිට පක්ෂ සාමාජිකත්වය දැරූ ඔහු දුම්රියමාර්ග ගමනාගමන සේවයෙහි වැඩ කළේය. 1920-1921 කාලයේදී ප්‍රවාහනය පිළිබඳ මහජන කොමිසාර් පදවිය දැරූ අතර පසුව ප්‍රවාහන කොමිසාර් මණ්ඩලයේ සේවය කළේය.

රෂ්කොව්, නිකලායි අලෙක්සාන්ද්‍රවිච් (1868-1927) — ඉතිහාසඥයෙක් හා සාහිත්‍යධරයෙකි, මෙන්ෂෙවිකයෙකි. ඔක්තෝබර් විප්ලවයට සතුරු ආකල්පයක් දැක්වූයේය. විදේශීය යුධ ආක්‍රමණය හා සිවිල් යුද්ධය අවධියේදී සෝවියට් රජයට විරුද්ධව සටන් කළේය. පසුව මෙන්ෂෙවික්වරුන්ගෙන් ඉවත් වූ ඔහු විද්‍යාත්මක-අධ්‍යාපන සේව-යෙහිද පරිපාලන සේවයෙහිද යෙදුනේය.

රිකොව්, අලෙක්සියෙයි ඉවානවිච් (1881-1938) 1899 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු වගකිවයුතු රාජ්‍ය තනතුරු ගණනාවක්ම දැරූ අතර මධ්‍යම කාරක සභාවේ දේශපාලන බියුරෝ මණ්ඩලයේද සිටියේය. බොහෝ විට පක්ෂයේ ලෙනින්වාදී ප්‍රතිපත්-තියට විරුද්ධව ඔහු නැගී සිටියේය. පක්ෂ විරෝධී වැඩකටයුතු නිසා 1937 දී ඔහු පක්ෂයෙන් නෙරපන ලදී.

රුද්සුතක්, යාන් එර්නෙස්තවිච් (1887-1938) — කොමියුනිස්ට් පක්ෂයේ කාරකවරයෙක් හා සෝවියට් රජයේ ප්‍රධාන පෙළේ සේවකයෙකි. 1905 සිට රු. ස. ප්‍ර. ක. ප. සාමාජිකත්වය දැරූ බොල්ෂෙවික්වරයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු වෘත්තීය සංගම් ව්‍යාපාරයේ නායක තනතුරු දැරුවේය. 1920 සිට රු. කො. (බො) ප. මධ්‍යම කාරක සභාවේ සාමාජිකත්වය දැරූ අතර වෘත්තීය සංගම්වල සමස්ත සෝවියට් මධ්‍යම මණ්ඩලයේ සභාපති ධුරයද දැරුවේය.

රෝයි, මනහෙන්ද්‍ර නාත් (1892-1948) — ඉන්දියානු දේශපාලනඥ-යෙකි. 1910-1915 අවුරුදුවලදී ඉන්දියාවේ බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන්ට විරුද්ධ විප්ලවවාදී ව්‍යාපාරයට සහභාගි විය. 1915 දී විදේශගත විය. 1920 දක්වා ඔහු මෙක්සිකෝවෙහි වාසය කළේය. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි, තුන්වැනි, හතරවැනි, හා පස්වැනි සාකච්ඡා සම්මේලන වලට සහභාගි වූවේය. 1922 සිට කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ විධායක කාරක සභාවේ අපේක්ෂක සාමාජිකයෙකුවද 1924 සිට එහි පූර්ණ සාමාජිකයෙකු ලෙසද කටයුතු කළේය.

ලපින්ස්කි, පාවෙල් ලුද්විගවිච් (ලෙවින්සොන්, වයි.) (1879-1937) පෝලන්ත කොමියුනිස්ට්වාදියෙකි, අර්ථ ශාස්ත්‍රඥයෙක් හා සාහිත්‍ය-ධරයෙකි.

https://liberationbase.wordpress.com

1920 ගණන් වල විදේශ කටයුතු භාර මහජන කොමිසාර් අංශයේ නිලධාරියෙකු ලෙස විදේශයෙහි සේවය කළේය.

ලාරින්, යූ. (ලුරේ, මිහයිල්) අලෙක්සාන්ද්‍රවිච් (1882-1932) — 1901 සිට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට සහභාගි වූ මෙන්ෂෙවික්වරයෙකි. 1917 අගෝස්තු මාසයේදී බොල්ෂෙවික් පක්ෂයට බඳවාගන්නා ලදී. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් හා ආර්ථික අංශයේ සංවිධානවල සේවය කළේය.

ලිසිස් (Lysis) [ලෙතයියර් (Letailleur), යෙව්ගෙනි] — ප්‍රංශ ධනපති අර්ථශාස්ත්‍රඥයෙකි. ඔහු විසින් මූල්‍ය හා දේශපාලන ප්‍රශ්න ගැන පොත් ගණනාවක්ම ලියා ඇත.

ලෂායෙව්, අන්තොන් මත්වේයවිච් (1870-1937) — සෝවියට් රාජ්‍ය සේවකයෙකු වූ මොහු 1904 සිට පක්ෂ සාමාජිකයෙකි. 1918-1920 අවුරුදුවලදී සම්ගම් මධ්‍යස්ථානයේ සභාපති ලෙසද, 1920 සිට 1925 දක්වා විදේශ වෙළඳාම පිළිබඳ නියෝජ්‍ය මහජන කොමිසාර් ලෙසද සේවය කළේය.

ලේවි (Levi), (ගර්ෂ්ටෙයින්), පාවුල් (1883-1930) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ ව්‍යවස්ථා සම්පාදක සම්මේලනයේදී ඔහු ජ. කො. ප. මධ්‍යම කාරක සභාවට තෝරාපත්කරගන්නා ලදී. කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දෙවැනි සාකච්ඡා සම්මේලනයට සහභාගි වූ නියෝජිතයෙකි. 1921 පෙබරවාරියේදී ඔහු ජ. කො. ප. මධ්‍යම කාරක සභාවෙන් ඉවත් විය. අප්‍රේල් මාසයේදී පක්ෂ විරෝධී කාණ්ඩවාදී ක්‍රියා නිසා කොමියුනිස්ට් පක්ෂයෙන් නෙරපන ලදී. පසුව ඔහු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ආපසු ගියේය.

ලොයිඩ් ජෝජ් (Lloyd George), ඩේවිඩ් (1863-1945) — බ්‍රිතාන්‍ය රාජ්‍ය නායකයෙක් හා රාජ්‍යතන්ත්‍රිකයෙකි. ලිබරල් පක්ෂයේ නායකයාය. 1916-1922 අවුරුදුවලදී අගමැති ධුරය දැරුවේය. රුසියාවේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු සෝවියට් රජයට විරුද්ධව ආක්‍රමණකාරී සටන් සංවිධානය කර ඒවා දිරිගැන්වූ අයගෙන්ද කෙනෙකි.

ලොසොව්ස්කි (ද්‍රිද්සො), සොලමොන් අම්රාමවිච් (1878-1952) — 1901 සිට රු. ස. ප්‍ර. ක. ප. සාමාජිකයෙකි. පළමුවැනි රුසියානු විප්ලවයටද

සහභාගි විය. 1920 ඔහු මොස්කව් ගුබේර්නියාවේ වෘත්තීය සංගම් මණ්ඩලයේ සභාපති තනතුරට පත්විය. 1921 සිට 1937 දක්වා වෘත්තීය සංගම් ජාත්‍යන්තරයේ ප්‍රධාන ලේකම් ධුරය දැරුවේය.

ලොන්ගේ (Longuet), ජාන් (1876-1938) ප්‍රංශ සමාජවාදී පක්ෂයේ හා දෙවැනි ජාත්‍යන්තරයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක යුද්ධය කාලයේදී ප්‍ර. ස. ප. මධ්‍යස්ථවාදී-සමාදනකාරී කණ්ඩායමේ නායකත්වය දැරුවේය. ප්‍ර. ස. ප. කොමියුනිස්ට් පක්ෂයට එකතුවී ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමට විරුද්ධ විය. ඔහු 1921 සිට දෙකහමාරේ ජාත්‍යන්තරයේ විධායක කාරක සභාවේ සාමාජිකත්වය දැරුවේය. 1923 සිට ඊනියා සමාජවාදී කම්කරු ජාත්‍යන්තරයේ නායකත්වය දැරූ අයගෙන්ද කෙනෙකි.

වල්ක් — මෙන්ෂෙවික්වරයෙකි. ක්‍රන්ෂ්තාද්ත් කැරැල්ල අවස්ථාවේ ඔහු ඊනියා තාවකාලික විප්ලවවාදී මණ්ඩලයට ඇතුළු විය. කැරැල්ල මැඩපැවැත්වීමෙන් පසු විදේශයට පැන ගියේය.

වන්ඩර්ලිප් (Vanderlip), වොෂින්ටොන්, බී. (උපත 1866) — ඉංජිනේරුවෙකි. කම්වාත්කවල තෙල් හා අඟුරු නිෂ්පාදනය පිළිබඳ ගිවිසුම අත්සන් කිරීමට පැමිණි, අමෙරිකානු ව්‍යාපාරිකයින්ගේ නියෝජිතයාය.

විල්සන් (Wilson), වුඩ්රෝ (1816-1924) — 1913-1921 අවුරුදුවලදී ඇමෙරිකානු ජනාධිපතිවරයා ය. ළදරු සෝවියට් රජයට විරුද්ධව අධිරාජ්‍යවාදී රටවල යුද්ධ ආක්‍රමණය සංවිධානය කළ එක් අයෙකි.

ව්රාන්ගෙල්, පියෝතර් නිකලායෙවිච් (1878-1928) — සාර් හමුදාවේ සේනාධිපතියෙකි. රදළයෙකි, රාජාණ්ඩුවාදියෙකි. විදේශ ආක්‍රමණය හා සිවිල් යුද්ධය කාලයේදී දක්ෂිණ රුසියාවේ ප්‍රතිවිප්ලවවාදී කටයුතු මෙහෙයවූයේය. 1920 අප්‍රේල් නොවැම්බර් මාසවලදී ''දක්ෂිණ රුසියාවේ යුධ හමුදාවේ'' ප්‍රධාන සේනාධිපති තනතුර දැරුවේය. රතු හමුදාව විසින් එය විනාශ කර දැමීමෙන් පසු ඔහු විදේශයට පැන ගියේය.

ෂෙයිදමාන් (Scheideman), fපිලිප් (1865-1939) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ අන්ත දක්ෂිණාංශික අවස්ථාවාදී පිළේ නායකයා ය. 1918 ජර්මනියේ නොවැම්බර් විප්ලවය කාලයේදී ඔහු, ධනපති පංතියේ අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කළ ඊනියා මහජන බලධාරී-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

න්ගේ මණ්ඩලයට අයත් විය. 1919 පෙබරවාරි-ජූනි මාසවලදී වෙයිමර් සමූහාණ්ඩුවේ සභාග රජයේ නායකයා විය. 1918-1921 අවුරුදුවලදී ජර්මන් කම්කරු පංතිය මෘග ලෙස මර්ධනය කිරීම සංවිධානය කළ කෙනෙකි.

ෂෙරිඩන් (Sheridan), ක්ලෙර් — බ්‍රිතාන්‍ය මූර්තිශිල්පියෙකි. 1920 දී මොස්කව්වලට පැමිණි ඔහු ලෙනින්ගේ පිළිමයක් ඇඹුවේය.

ෂ්ලියාප්නිකව්, අලෙක්සාන්දර් ගව්රිලවිච් (1885-1937) — 1901 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකුව සිටියේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු කම්කරු මහජන කොමිසාර් ලෙස මහජන කොමිසාර් මණ්ඩලයට ඇතුළු විය. අනතුරුව ආර්ථික හා වෘත්තීය සංගම් වැඩකටයුතුවල නියලුනේය. 1918-1919 අවුරුදුවලදී පක්ෂ විරෝධී "කම්කරු විරුද්ධ පාර්ෂවයේ සංවිධායකයා හා නායකයා විය.

සස්නොව්ස්කි, ලෙව් සෙමියෝනවිච් (1886-1937) — 1904 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. 1918-1924 අවුරුදුවලදී "බෙද්නතා," පත්‍රයෙහි කාර්තෘ තනතුර දැරුවේය. වෘත්තීය සංගම් විවාදය අවස්ථාවේදී (1920-1921) ට්‍රොට්ස්කි වේදිකාවට ආධාර කළේය. අනතුරුව පක්ෂ විරෝධී වැඩ නිසා පක්ෂයෙන් නෙරපා දමන ලදී.

සිනොවියෙව් (රදොමිසල්ස්කි), ග්‍රිගෝරි යෙව්සේයෙවිච් (1883-1936) — 1901 සිට බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවය සඳහා සූදනම් වූ හා එළඹී ක්‍රියාත්මක කළ කාලයේදී වැනෙන ගතියක් පෙන්වූයේය. අවිගත් නැගිටීමකට විරුද්ධව ඉදිරිපත් විය. කාමිනෙව් විසින් තමන් වෙනුවෙන් හා සිනෝවියෙව් වෙනුවෙන්ද, අවිගත් නැගිටීමකට පක්ෂ මධ්‍යම කාරක සභාව සම්මත කරගත් යොජනාවට එකඟ නොවන බව පවසමින් අර්ධ මෙන්ෂෙවික් පත්‍රයක් වූ "නෝවය ෂිස්න්" හි පළ කළ ලිපිය පක්ෂයේ රහස් හෙළිදරව් කිරීමක් හා විප්ලවය පාවාදීමක් විය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ඔහු රජයේ වගකිවයුතු තනතුරු ගණනාවක්ම දැරුවේය. පක්ෂයේ ලෙනින්වාදී ප්‍රතිපත්තියට විරුද්ධව බොහෝවිට නැගී සිටියේය: 1917 නොවැම්බර් මස, මෙන්ෂෙවික්වරුන්ගේ හා එස්ආර්වරුන්ගේ සහාය ඇතිව සභාග ආණ්ඩුවක් පිහිටුවීමට එකඟ විය; 1925 දී නව විරුද්ධ පාර්ශ්වය සංවිධානය කිරීමට සහභාගි විය; 1926 දී පක්ෂ විරෝධී ට්‍රොට්ස්කි-සිනෝවියෙව් කඳවුරේ නායකයෙකි. 1934 දී පක්ෂ විරෝධී කටයුතු නිසා පක්ෂයෙන් නෙරපන ලදී.

සුන් යත්-සෙන් (1886-1925) — සම්භාවනීය චීන විප්ලවවාදියෙක්, ප්‍රජාතන්ත්‍රවාදියෙක් හා රාජ්‍ය පාලකයෙකි.

සෙරෙබ්‍රියකොව්, ලෙයොනීද් පෙත්රොවිච් (1888-1937) — 1905 සිට පක්ෂ සාමාජිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු මොස්කව් ප්‍රාදේශීය පක්ෂ සංවිධාන කාරක සභාවේ සාමාජික තනතුරද, රු. කො. (බො.) ප. හා සමස්ත සෝවියට් මධ්‍යම විධායක කාරක සභාවේ ලේකම් තනතුරද ඉසිලුවේය. 1920-1921 අවුරුදුවලදී වෘත්තීය සංගම් විවාදය අවස්ථාවේදී ට්‍රොට්ස්කිවාදී වේදිකාවේ පැත්ත ගත්තේය.

සෝප්, විචිස්ලාව් ඉවානවිච් (1889-1940) — සෝවියට් හමුද හා රාජ්‍ය පාලකයෙකි. 1913 සිට පක්ෂ සාමාජිකත්වය දැරුවේය. සිවිල් යුද්ධයට සහභාගි විය. 1920 දී ජලමාර්ග ගමනාගමන අංශයේ මණ්ඩලීය සාමාජික තනතුරද පසුව එහි ප්‍රධාන දේශපාලන ආයතනයෙහි ප්‍රධන තරතුරද දැරුවේය.

LIBERATIONBASE

ස්විදෙර්ස්කි, අලෙක්සාන්දර් ඉවානවිච් (1878-1933) — සෝවියට් රාජ්‍ය පාලකයෙක් 1899 සිට පක්ෂ සාමාජිකයෙකු වූ මෙතෙම බොල්ෂෙවික්වාදියෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පසු ආහාර පිළිබඳ මහජන කොමිසාර් අංශයේ මාණ්ඩලික සාමාජික තනතුර හා කම්කරු ගොවි පාලන මණ්ඩලයේ සාමාජික තනතුර දැරුවේය.

ස්ටාලින් (ජුගෂ්විලි), ඉඔසිෆ් විසරියෝනවිච් (1879-1953) — 1898 සිට පක්ෂ සාමාජිකත්වය දැරුවේය. 1912 සිට රු. ස. ප්‍ර. ක. (බො.) ප. මධ්‍යම කාරක සභාවේ සාමාජික තනතුරද දැරුවේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට සූදනම් වූ හා එය ක්‍රියාත්මක කළ කාලයේදී පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් පිහිටුවන ලද, කැරැල්ල සූදනම් කිරීමෙ යුධ-විප්ලවවාදී මධ්‍යම මණ්ඩලයට ඇතුළු විය.

1917 නොවැම්බර් සිට 1923 ජූනි දක්වා ඔහු ජාතික ප්‍රශ්න පිළිබඳ මහජන කොමිසාර් ධුරය දැරුවේය. එසේම 1919 මාර්තු සිට රාජ්‍ය පාලනය පිළිබඳ මහජන කොමිසාර් පදවියද අනතුරුව කම්කරු-ගොවි පාලනය පිළිබඳ මහජන කොමිසාර් තනතුරද දැරුවේය. රු. කො. (බො.) ප. මධ්‍යම කාරක සභාවේ දේශපාලන බියුරෝ මණ්ඩලයේ

https://liberationbase.wordpress.com

සාමාජික තනතුරද ඔහු දැරුවේය. සිවිල් යුද්ධය කාලයේදී සමූහාණ්ඩුවේ විප්ලවවාදී යුද්ධ මණ්ඩලයේ හා යුධ පෙරමුණු ගණනාවකම විප්ලවවාදී යුද්ධ මණ්ඩලවල සාමාජික තුනතුරුද ඔහු විසින් දරන ලදී.

1922 දී පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන ලේකම් තනතුරට ඔහු පත්කරන ලදී. 1941 සිට මහජන කොමිසාර් මණ්ඩලයේ සභාපති ධූරය, පසුව සෝවියට් සංගමයේ ඇමති මණ්ඩලයේ සභාපති ධූරය ඔහු දැරුවේය.

පක්ෂයේ ප්‍රධාන ලේකම් ධූරයේ දීර්ඝ කාලයක් සිටි ස්ටාලින් පක්ෂයේ අනෙක් නායකයින්ද සමග සමාජවාදය ගොඩනැගීම සඳහා මහා සටනක් ගෙනගියේය. පක්ෂ විරෝධී උපනති විනාශ කිරීමෙදී, විශේෂයෙන්ම දක්ෂිණාංශික අවස්ථාවාදය හා ට්‍රොට්ස්කිවාදය පරාජය කිරීමෙදී ඔහු මහා කාර්ය කොටසක් ඉටු කළේය.

ඒ කෙසේ වුවද සෝවියට් සමාජ ජීවිතයෙහි ඒ අඳුරු සිදුවීම්ද ඔහුගේ නාමය හා සම්බන්ධය. එම සිද්ධීන් මාක්ස්-ලෙනින්වාදයට කිසිම සම්බන්ධයක් නැති පුද්ගලාභිවාදනය ලෙස කොමියුනිස්ට් පක්ෂය විසින් විග්‍රහ කරන ලදී.

<u>හේගල් (Hegel), ගියෝර්ග් විල්හෙල්ම් ෆ්‍රිදිරිහ්</u> (1770-1831) ඉතා උසස් ජර්මන් දර්ශනිකයෙකි. විෂයමූල විඥනවාදියෙකි. විඥනවාදී දයලෙක්තිකය ගැඹුරු ලෙසත් අංග සම්පූර්ණ ලෙස පිළියෙළ කිරීම හේගල්ගේ ඓතිහාසික සේවයකි. දයලෙක්තික භෞතික වාදයේ එක් මූලාශ්‍රයක් වූයේ හේගල්ගේ මේ දයලෙක්තික දර්ශනය ය.

පාඨකයින් වෙතටයි

මෙම පොතෙහි අඩංගු කරුණු, අනුවාදය හා මුද්‍රණය පිළිබඳ ඔබගේ අදහස් දන්වා එවීමෙන් ප්‍රගති ප්‍රකාශක මන්දිරයේ කෘතඥතාවය ඔබට හිමිවේ. ඔබගේ වෙනත් යෝජනා ඇතොත් අපි එය කරුණාවෙන් බාර ගනිමු.

අපේ ලිපිනය:

Progress Publishers,
17 Zubovsky Boulevard,
Moscow, USSR

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

- කෘතිය: ලෙනින් තෝරාගත් කෘති වෙළුම් දොළහ, වෙළුම 11
- කතෘ/පරිවර්තක: වී.අයි. ලෙනින්/උ. මු. අබයරත්න
- ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
- පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-22
- ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-22, V2:2019-05-29
- පිටු ගණන: 304
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com